# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2401/28 - 2024 සැප්තැම්බර් මස 13 වැනි සිකුරාදා - 2024.09.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2024 - 2029

**1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 12(1) වගන්තිය යටතේ සකස් කරන ලද ශ්‍රී ලංකා සංශෝධිත වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2024 - 2029**

2024 - 2029 ශ්‍රී ලංකා සංශෝධිත වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම 2024 අගෝස්තු 12 වැනි දින අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කරන ලද අතර සැලැස්ම *ගැසට් පත්‍රයේ* පළකරන දින සිට ක්‍රියාත්මක වන බව මෙයින් මහජනතාවට දන්වා සිටිමි.

ප්‍රසන්න රණතුංග,
නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍ය.

නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය,
"සෙත්සිරිපාය",
බත්තරමුල්ල.


1A - PG 6869 — 504 (2024/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## List of Acronyms and Abbreviation

| | |
|---|---|
| AD | Assistant Director |
| ADB | Asian Development Bank |
| AIA | Archaeological Impact Assessment |
| BC | Before Christ |
| BOD | Biochemical Oxygen Demand |
| BOI | Board of Investment |
| CBOs | Community-Based Organizations |
| CC&CRMAC | Coast Conservation and Coastal Resources Management Advisory Council |
| CC&CRMD | Coast Conservation and Coastal Resources Management Department |
| CCA | Coast Conservation Act |
| CCC | Community Coordination Committees |
| CCD | Coast Conservation Department |
| CEA | Central Environmental Authority |
| COD | Chemical Oxygen Demand |
| CRMP | Coastal Resources Management Project |
| CTB | Ceylon Tourist Board |
| CZ | Coastal Zone |
| CZ&CRMP. | Coastal Zone and Coastal Resource Management Plan |
| CZM | Coastal Zone Management |
| CZMP | Coastal Zone Management Plan |
| DANIDA | Danish International Development Agency |
| DCC | Director of Coast Conservation |
| DFC | Department of Forest Conservation |
| DI | Department of Irrigation |
| DFAR | Department of Fisheries and Aquatic Resources |
| DPL | Dune Protection Lines |
| DS | Divisional Secretaries |
| DSD | Divisional Secretary's Division |
| DWLC | Department of Wildlife Conservation |
| EEZ | Exclusive Economic Zone |
| EIA | Environmental Impact Assessment |
| ENSO | "El Nino" Southern Oscillation |
| EPC | Environmental Protection Committees |
| EPL | Environmental Pollution License |
| EPZ | Export Processing Zones |
| FAO | Food and Agriculture Organization |
| FD | Forest Department |
| FDPA | Forest Department Protected Areas |
| GBBOA | Glass-bottom Boat Owners Association |
| GCRMN | Globle Coral Reef Monitoring Network |
| GDP | Gross Domestic Product |
| GEF | Global Environmental Facility |
| GIS | Geographical Information System |
| GNP | Gross National Product |

| | |
|---|---|
| GOSL | Government of Sri Lanka |
| GSMB | Geological Survey and Mines Bureau |
| GTZ | German Technical Corporation |
| HICZMP | Hambantota Integrated Coastal Zone Management Project |
| IEC | Information Education and Communication |
| IEE | Initial Environmental Examination |
| IP | Industrial Parks |
| IPCC | International Panel on Climate Change |
| IRMP | Integrated Resources Management Programme |
| ITI | Industrial Technology Institute |
| IUCN | International Union for Conservation of Nature and Natural Resources |
| JBIC/ODA | Japanese Bank for International Cooperation/Oversea Development Administration |
| KEPZ | Katunayake Export Processing Zones |
| LAs | Local Authorities |
| LEI&CDP | Lunawa Environmental Improvement & Community Development Project |
| MOPS&A | Ministry of Ports, Shipping and Aviation |
| MOW&FRC | Ministry of Wildlife and Forest Resources Conservation |
| MOF | Ministry of Fisheries |
| MOT&L | Ministry of Tourism and Lands |
| MHWL | Mean High Water Line |
| MLWL | Mean Low Water Line |
| MOALF | Ministry of Agriculture, Land and Forestry |
| MOE | Ministry of Environment |
| MOFE | Ministry of Forestry and Environment |
| MOLGHC | Ministry of Local Government, Housing and Construction |
| MOTEWA | Ministry of Transport, Environment and Womens' Affairs |
| MPCEM | Master Plan for Coastal Erosion Management |
| MPH | Miles Per Hour |
| MPPA | Marine Pollution Prevention Authority |
| NAQDA | National Aquaculture Development Authority |
| NARA | National Aquatic Resources Research and Development Agency |
| NDC | Nationally Determined Contribution |
| NEA | National Environment Act |
| NGO | Non-Governmental Organization |
| NPPD | National Physical Planning Department |
| NPPP | National Physical Planning Policy |
| NWP | North Western Province |
| NWSDB | National Water Supply and Drainage Board |
| PIU | Project Implementation Unit |
| PRA | Participatory Rural Appraisal |
| RETA | Regional Technical Assistance for Coastal & Marine Resource Management & Poverty Reduction in South Asia |
| RLFCS | Rekawa Lagoon Fisheries Cooperative Society |
| RLFMC | Rekawa Lagoon Fisheries Management Committee |
| RUK | Rekawa, Ussangoda, Kalametiya |
| SAMP | Special Area Management Plan |

| | |
|---|---|
| SAREC | Swedish Agency for Research Cooperation with Developing Countries |
| SIDA | Swedish International Development Co-operation Agency |
| SLLRDC | Sri Lanka Land Reclamation and Development Corporation |
| SLR | Sri Lanka Rupees |
| SLTDA | Sri Lanka Tourism Development Authority |
| SM | Shoreline Management |
| SMA | Special Management Area |
| SMP | Shoreline Management Plan |
| STP | Sustainable Township Programme |
| TCP | Turtle Conservation Project |
| TOR | Terms of Reference |
| UDA | Urban Development Authority |
| USAID | United States Agency for International Development |
| WHO | World Health Organization |

## විධායක සාරාංශය

වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2024 යනු මීට පෙර 1990, 1997, 2004 හා 2018 වර්ෂ වල දී ඉදිරිපත් කරනු ලැබූ කළමනාකරණ සැලසුම්වලට පසුව සිව්වන කාල සීමාව සඳහා අදාළ වන සැලසුම වේ.

2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ (සංශෝධන) පනතේ නෛතික විධිවිධානවලට අනුකූලව, වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම සංශෝධනය හා යාවත්කාලීන කිරීමෙන් වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2024 පිළියෙළ කර තිබේ.

මෙම කළමනාකරණ සැලැස්ම පරිච්ඡේද හයකින් ඉදිරිපත් කෙරේ. වෙරළ කලාප කළමනාකරණයේ විෂයය පථය, 2018 වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මෙන් සිදුවී ඇති ප්‍රධාන අපගමනයන්, වෙරළ කලාපයේ ජෛව භෞතික ලක්ෂණ, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා ඒ සඳහා ලැබී ඇති නෛතික පැවරුම් බලය, මෙම සැලසුම සකස් කිරීමේ ක්‍රියාවලිය සහ සැලසුමේ අන්තර්ගතයේ සංක්ෂේපයක් මෙහි ආරම්භක පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ. ඉන්පසු පරිච්ඡේද එකින් එක ප්‍රධාන ගැටලු සඳහා එනම්, වෙරළතීර කළමනාකරණය, වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම, විශේෂ කළමනාකරණ ප්‍රදේශ හා නියාමන යාන්ත්‍රණය සඳහා අවධානය යොමු කෙරේ.

අදාළ ගැටලුව, එහි වර්තමාන ස්වභාවය හා වැදගත්කම පිළිබඳ හැඳින්වීම, ගැටලු සඳහා විසඳුම් සැපයීම සඳහා වන ප්‍රතිපත්ති, සැලසුම්, නීති සහ ආයතනික සැලසුම් සහ කළමනාකරණ අරමුණු, ප්‍රතිපත්ති හා යෝජිත ක්‍රියාමාර්ග හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කළයුතු මාර්ගෝපදේශ යන ආකාරයෙන් මෙම ගැටලු සම්බන්ධිත සෑම පරිච්ඡේදයක්ම සංවිධානය කර තිබේ.

බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය ඔස්සේ මෙම සැලසුම මූලික වශයෙන් ක්‍රියාත්මක වේ. බලපත්‍ර සඳහා වන අයදුම්පත් සලකා බැලීමේ කාර්යයේ දී අනුගමනය කරන මාර්ගෝපදේශ මෙන්ම ක්‍රමවේදය, යොමු කිරීමේ අනුදේශ, ප්‍රධාන ක්‍රමවේදයෙන් බැහැර කාර්යපටිපාටි යටතේ බලපත්‍ර ප්‍රදානය කිරීම ආදිය මෙම සැලසුමේ දී විස්තර කර තිබේ. සාමාන්‍ය ක්‍රියාවලිය යටතේ බලපත්‍ර නිකුත් කිරීමේ දී නිර්දේශ කළ නොහැකි විශේෂ වාතාවරණයන් විචල්‍ය හා අත්හැරීම් කාර්යපටිපාටිවලින් ආවරණය කෙරේ.

වෙරළ කලාපයේ සංවර්ධන කටයුතු, පරිසර හිතකාමී තිරසර ආකාරයෙන් එවැනි සංවර්ධන කාර්යයන් සැලසුම් කිරීම සඳහා අවශ්‍ය මූලික තොරතුරු සහ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍ර නිකුත් කිරීමේ දී නෛතිකමය වශයෙන් බලය පැවරී ඇති කාර්ය පටිපාටි පිළිබඳව පාර්ශවකරුවන් සහ යෝජනාකරුවන් වෙත තොරතුරු ලබාදීම මෙම සැලසුම මගින් අපේක්ෂිත අරමුණ වේ.

මෙහිදී විසඳුම් ඉදිරිපත් කෙරෙන ගැටලුවලින් බහුතරයක් තාක්ෂණික වශයෙන් සංකීර්ණ හා අභියෝගාත්මක නමුදු, මෙම සැලැස්ම තුළ දී එම ගැටලු සරල ආකාරයෙන් පැහැදිලි කිරීමට ප්‍රයත්න දරා තිබේ. එබැවින් සංවර්ධන ක්‍රියාකාරකම්වල යෝජනාකරුවන්ට වෙරළ කලාපයේ සංකීර්ණත්වය හා ගතික ස්වභාවය පිළිබඳව හා මෙම සැලසුම තුළින් යෝජිත කළමනාකරණ ක්‍රියාවලියේ තර්කානුකූල පදනම පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට හැකි වේ. මෙම සැලසුම සකස් කර ඇත්තේ මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම වෙනුවෙනි.

## 1 වැනි පරිච්ඡේදය - හැඳින්වීම

### 1.1 වෙරළ කලාපය හා වෙරළ සම්පත් කළමනාකරණයේ විෂය පථය

#### 1.1.1 සන්දර්භය හා සැකසුම

වෙරළබඩ කලාපයේ ජනගහනය වැඩිවීම සහ ආර්ථික කටයුතු වේගවත්වීම සමග ශ්‍රී ලංකාවේ ගතික සහ සම්පත්වලින් අනූන වෙරළබඩ කලාපය සංරක්ෂණය, සංවර්ධනය සහ තිරසාර භාවිතය ඉලක්ක කොටගත් සමෝධානික කළමනාකරණයක අවශ්‍යතාව බොහෝ කාලයක සිට හඳුනාගෙන තිබේ. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ විධිවිධාන අනුව පැවරී ඇති බලතල ප්‍රකාරව 1990 වර්ෂයේ දී සම්පාදනය කර ක්‍රියාත්මක කළ පළමු "වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම"ඔස්සේ විධිමත් කළමනාකරණ ප්‍රවේශයක් පළමුව යොදාගනු ලැබී ය. ඉන් අනතුරුව, "වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම" වශයෙන් මෙම "වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම"1997, 2004 හා 2018 වර්ෂවල දී සංශෝධනයට හා යාවත්කාලීන කිරීමට ලක් විය. ජාතික සංවර්ධන අභිමතාර්ථ සමග අනුකූලව වෙරළබඩ පරිසරය හා එහි සම්පත් දිගුකාලීන වශයෙන් තිරසර අයුරින් භාවිතා කිරීම සහතික කිරීම සඳහා 2018 වර්ෂයේ "වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම" සකස් කරන ලදී. මෙම සැලැස්මේ අඛණ්ඩතාවය පවත්වා ගනිමින් 2024 වර්ෂයේ වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මේ යාවත්කාලීන කිරීම ඔස්සේ පාරිසරික වෙනස්වීම් සඳහා ඔරොත්තු දීමේ හැකියාවට අදාළ අංශ ඇතුළත් කිරීමෙන් හා ජාත්‍යන්තර සම්මුතීන් හා සන්ධාන පත්‍ර සමග මනාව සංවිධිත කිරීමෙන් පෙර සැලැස්මේ විෂයය පථය පුළුල් කර තිබේ. මීට අමතරව, ක්‍රියාත්මක කිරීමේ පහසුව හා අර්ථ ව්‍යාකූලතාවයන් මග හරවා ගැනීම සඳහා 2018 වර්ෂයේ වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මේ ඇතුළත් නියාමන යාන්ත්‍රණය, විශේෂ කළමනාකරණ ප්‍රදේශ, වෙරළබඩ දූෂණය හා වෙරළබඩ වාසභූමි සංරක්ෂණයට අදාළ පරිච්ඡේදවල ඇතැම් කොටස් සංශෝධනය කර තිබේ. තව ද, ක්‍රියාත්මක කිරීමේ අත්දැකීම් හා වර්තමාන ජාතික සංවර්ධන අවශ්‍යතා මත පදනම්ව,වෙරළ සම්පත් තිරසර අන්දමින් කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා වැදගත් මාර්ගෝපදේශ කිහිපයක් ඇතුළත් කිරීම සහ/හෝ සංශෝධනය කිරීම සිදුකර තිබේ.

ප්‍රතිපත්තිමය අරමුණු, ක්‍රමෝපාය සහ ක්‍රියාමාර්ගවල බලපෑම් හා ප්‍රතිඵලවලට අදාළව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදුකළ සමාලෝචන හා ඇගයීම් පසුගිය වෙරළ කලාප කළමනාකරණ සැලසුම් මගින් හඳුනාගන්නා ලද ගැටලු මත ගැළපුම්කර සකස් කරන ලදී. අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කරගැනීමේ දී ඇතිවූ ඇතැම් අවහිරතා පසුගිය වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී අනාවරණය විය. නීතිමය වශයෙන් අර්ථකථනය කළ"වෙරළ කලාපය" ප්‍රමාණවත් නොවීම, විශේෂ කළමනාකරණ ප්‍රදේශ විධිමත් පරිදි සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ආයතනගත කිරීම සඳහා නෛතික විධිවිධාන නොමැතිවීම, නෛතිකව අර්ථකථනය කරන ලද වෙරළ කලාපයෙන් ඔබ්බට පැනනගින ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ හැකියාවක් නොමැතිවීම සහ සංරක්ෂණ ප්‍රදේශ සහ පොදු ප්‍රවේශ ආරක්ෂා කිරීම සඳහා නෛතික බලාධිකාරියක් සතු නොවීම ඇතුළු සාධක ගණනාවක් මීට හේතු වේ. නෛතික ක්ෂේත්‍රයට අදාළව පැවති නීතිමය බලය ප්‍රමාණවත් නොවීම් 2018 වර්ෂයේ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේ දී සිදුකළ නෛතික සංශෝධන ඔස්සේ සපුරාගන්නා ලදී. ඵලදායී වෙරළ සම්පත් කළමනාකරණයක් සඳහා පිළියම් ලෙස පියවර හඳුන්වා දෙනු ලැබුව ද, 2020-2021 කාලසීමාවේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය සහ ශ්‍රී ලංකා රජය විසින් මුහුණ දුන් සාර්ව ආර්ථික ගැටලු ඇතුළුව සාධක ගණනාවක් හේතුවෙන් ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා දැකගත හැකිවිය. එනිසා, වෙරළ කලාපය තුළ සංවර්ධන කටයුතු පාලනය කිරීම හැරුණු විට, 2018 වර්ෂයේ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලසුමෙ හි ප්‍රතිඵල සතුටුදායක මට්ටමකට නොපැවතිණි.

අවදානම් මට්ටම වෙනස්වීම අතරතුර ඇතැම් ප්‍රදේශවල සංවර්ධන කටයුතු උදෙසා වෙරළ ඉඩම්වලට ඉහළ ඉල්ලුමක් පැවතීම හේතුවෙන් ඉදිකිරීම් හා වෙරළ සීමාව අතර තබාගත යුතු අවම පරතරය සම්බන්ධිත පිරිවිතර ක්‍රියාත්මක කිරීමේ කටයුතු සැලසුම ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව තුළ අභියෝගයක් බවට පත්විය. එබැවින්, ඉදිකිරීම් හා වෙරළ සීමාව අතර තබාගත යුතු අවම ඉඩපරතරය හෙවත් පසසිටුව සම්බන්ධයෙන් අතීතයේ දී සිදුකළ ක්‍රියාත්මක කිරීම් සවිමත් ප්‍රයත්නයක් යටතේ නැවත සමාලෝචනය කළයුතු බව හඳුනාගෙන ඇති අතර ඒවා ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාකූලත්වයක් නොපැවතිය යුතු අතර පැහැදිලි කාර්ය පටිපාටියක් ද පැවතිය යුතු ය.

#### 1.1.2 වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2024 සහ මෙහි 2018 හි වෙරළ කලාප කළමනාකරණ සැලැස්මෙන් සිදුවී ඇති ප්‍රධාන අපගමනයන්

විශේෂයෙන්ම මෑත කාලීනව මුහුණ පෑමට සිදුවී ඇති ආර්ථික අර්බුද හමුවේ, වර්තමානයේ දී ලෝකයේ බොහෝ වෙනත් රටවල දී මෙන් ශ්‍රී ලංකාවේ ද වෙරළ සම්පත් කළමනාකරණය සුවිශේෂී අභියෝගවලට මුහුණ පා සිටී. රටෙහි පවතින සාර්ව ආර්ථික ගැටලු ආකාරයෙන් මෙම අර්බුද මතුවෙන අතර, මූල්‍ය සීමා හේතුවෙන් සැලසුම්කළ හා දැනට කෙරීගෙන යන සම්පත් කළමනාකරණ ප්‍රයත්නයන් කෙරෙහි සෘණාත්මකව බලපානු ලැබේ. එමගින් කළමනාකරණය සඳහා ධාරිතා ඉහළ නැංවීම සිදුකළ නොහැකිවන අතර ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවල වෙනසක් සිදු වේ. එබැවින්, 2018 වර්ෂයේ වෙරළ

සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මෙන් සිදුවී ඇති ප්‍රධාන අපගමනයන් පිළිබඳ අවධානය යොමු කිරීමට අපේක්ෂා නොකෙරේ.

වෙරළ කලාපයේ සමාජ, ආර්ථික හා ගතික පාරිසරික තත්ත්වය සමස්තයක් ලෙස සැලකීමේ දී, අනුකූල නොවන ප්‍රතිපත්ති, ක්‍රමෝපාය හා ක්‍රියාමාර්ග ඉවත් කරන අතර වර්තමාන හා අනාගත අවශ්‍යතා සමග අනුකූලවන නව මාර්ගෝපදේශ හා ප්‍රමිතීන් ද ඇතුළුව ප්‍රතිපත්ති, ක්‍රමෝපාය හා ක්‍රියාමාර්ග අන්තර්ගත කරමින් සංශෝධනය කිරීම් හා යාවත්කාලීන කිරීම් සිදුකිරීමට වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2024 ඔස්සේ ප්‍රයත්න දරා තිබේ. මීට අදාළව, කාලගුණික වෙනස්වීම් අවම කරගැනීම හා යාවත්කාලීන ජාතික වශයෙන් නිශ්චය කළ දායකත්වයන් ක්‍රියාත්මක කිරීම ක්‍රියාවට නංවමින් වෙරළ සම්පත් කෙරෙහි ආර්ථික අර්බුද හා දේශගුණික විපර්යාසවල ප්‍රතිඵල අතර සම්බන්ධතාවය හඳුනාගැනීමට විශේෂ අවධානය යොමුකර තිබේ.

2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ (සංශෝධන) පනතේ විධිවිධානවලට අනුකූලව, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම -2024 සංශෝධනය හා යාවත්කාලීන කිරීම සිදුකර තිබේ. ප්‍රායෝගික බව හා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ධාරිතාවය සැලකිල්ලට ගෙන 2024 වර්ෂයේ සැලැස්ම මගින් ද වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම -2018 ට සමාන ආකාරයෙන්ම ප්‍රධාන අංශ පහක් සම්බන්ධයෙන් එනම්, වෙරළතීර කළමනාකරණය, වෙරළබඩ දූෂණය කළමනාකරණය, වෙරළබඩ පරිසර පද්ධති කළමනාකරණය, විශේෂ කළමනාකරණ ප්‍රදේශ සහ නියාමන යාන්ත්‍රණ පිළිබඳව වෙන් වෙන් වශයෙන් පරිච්ඡේද වෙන් කර අවධානය යොමුකර තිබේ.

මීට පෙර සැලැස්මේ වෙරළබඩ ජල දූෂණය පාලනය කිරීම මැයෙන් වූ පරිච්ඡේදය වෙරළබඩ දූෂණය කළමනාකරණය කිරීම මැයෙන් වෙනස් කර ඇති අතර වෙරළබඩ ජල දූෂණයට පමණක් සීමා නොවී වෙරළබඩ අපද්‍රව්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වශයෙන් පුළුල් කර තිබේ. මීට අමතරව, විශේෂ වැදගත්කමකින් යුතු ස්ථාන සහ පොදු ප්‍රවේශවලට අදාළ ගැටලු 6 වැනි පරිච්ඡේදයේ දී අවධාරණය කර ඇති අතර යාවත්කාලීන කරන ලද වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2024 ඔස්සේ දේශගුණික විපර්යාස සඳහා ඔරොත්තු දීම පිළිබඳ කරුණු හා ජාත්‍යන්තර සම්මුති, සන්ධාන පත්‍ර, ඉලක්ක හා අභිමතාර්ථ සමග අනුකූල වීම් ද අන්තර්ගත කරමින් මීට පෙර කළමනාකරණ සැලැස්මේ විෂය පථය පුළුල් කර තිබේ.

## 1.2 වෙරළ කලාපයේ ලක්ෂණ

### 1.2.1 ජීව-භෞතික ගති ලක්ෂණ

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයෙහි උතුරු කොටසේ උතුරු අක්ෂාංශ $5^0$54'සහ $9^0$52' සහ නැගෙනහිර දේශාංශ $79^0$39.සහ $81^0$53' අතර පිහිටීම ශ්‍රී ලංකාවේ වෙරළබඩ පරිසරය කෙරෙහි බලපා තිබේ. මෙම දිවයින නිර්මාණය වීම සඳහා පදනම් වී ඇති අඩ තැනිතලා තුන අතරින් පහත්ම තැන්නෙ හි වෙරළබඩ ප්‍රදේශය ස්ථානගතව තිබෙන අතර වෙරළබඩ ප්‍රදේශ සාමාන්‍යයෙන් අඩි 100ට (මීටර් 30) වඩා උසින් අඩු පැතලි වෙරළබඩ තැනිතලා වලින් සමන්විත වේ (වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම - 2018). වෙරළබඩ තැනිතලා අන්තර්ගත වන පහළතම අඩතැන්න දිවයිනෙන් පිටතට මහද්වීපික තටකය ලෙස මුහුදට යටින් බොහෝ ප්‍රදේශවල දී සැතපුම් 5-25 (කි.මී 8-40 පමණ)දක්වා පළලට සහ සාමාන්‍යය ගැඹුර වශයෙන් මුහුදු මට්ටමින් පහළට අඩි 216 (මීටර් 65) ක් දක්වා විහිදේ. දිවයිනේ දකුණු දිග ප්‍රදේශයේ දී මහද්වීපික තටකය පටුවන නමුත් උතුරු දෙසට බොහෝ පළල් වී ඉන්දියාව වටා ඇති තටකය හා සම්බන්ධ වේ. කලපු හැර, බොකු සහ මුවදොර ඇතුළුව ආසන්න වශයෙන් කි.මී. 1,620 ක වෙරළ තීරයක් ශ්‍රී ලංකාව සතු වේ.

ගල් සහිත තුඩුවලින් දෙපසින්ම ආරක්ෂා වූ දර්ශනීය වැලි බොකු පෙළ නිරිත දිග සහ ඊසාන දිග පිහිටි තිරස් වෙරළ තීරයන්ගේ ලාක්ෂණික ලක්ෂණයකි; නිරිතදිග වෙරළ තීරයේ වක්‍රාකාර හැඩවලින් යුතු විල් හා කලපුවලින් යුතු සංකීර්ණ පද්ධති රාශියක් තිබේ (වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම - 2018). ඊසානදිග වෙරළ පිහිටි ත්‍රිකුණාමල බොක්ක"ඉන්දියන් සාගරයේ පරිපූර්ණතම ස්වභාවික වරාය"ලෙස සැලකෙන අතර එය සුවිශේෂී වැදගත්කමකින් යුක්තය. වයඹ සහ නිරිතදිග වෙරළ තීරයන් හි කලපු, වැලි බාධක, ඉවුරු සහ වැලි තුඩු දිස්වෙන අතර මේවා ඇතැම්විට කිලෝමීටර් ගණනාවක් දක්වා ව්‍යාප්ත වේ. හොඳින් සැකසී ඇති වැලිගල්පර හා ගල්පර මධ්‍යයේ වුව ද, නොගැඹුරු මුහුදින් යුතු දිවයින වටා පිහිටි මහාද්වීපික තටකය ඔස්සේ වෙරළ තීරය ඔස්සේ කොරල්පර වර්ධනය වීම සඳහා අවස්ථාව සලස්වයි. විශේෂයෙන් අම්බලන්ගොඩ සහ මාතර අතර විශේෂයෙන් ඒ අතුරින් අකුරළ ප්‍රමුඛතාවයට පත්වෙමින් වෙරළ කලාපයේ ගොඩබිමෙන් වටවූ මුහුදු ප්‍රදේශයේ ද කොරල්පර විශාල වශයෙන් තැන්පත්වීම් දක්නට ලැබේ. ගංගාවලින් වැලි ඉවත් කිරීම හා ආරක්ෂක හිරිගල්පර විනාශ කිරීම වැනි මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් නිරිතදිග වෙරළ තීරයේ ස්වාභාවික ඛාදන ක්‍රියා තවදුරටත් උග්‍රවී නිරිතදිග වෙරළ තීරය ඛාදනයට භාජනය වී තිබේ. අනෙක් අතට, වයඹ සහ ගිනිකොණ දිග ප්‍රදේශවල ඇතැම් වෙරළ තීරයන්ගේ වැලි තැන්පත් වීම හේතුවෙන් වෙරළ තීරය පුළුල් වීමක් සිදු වී තිබේ.

මුහුද, ගොඩබිම හා වායුගෝලය අතර ඉතා ගතික සංක්‍රාන්තික කලාපයක් වෙරළබඩ භූ දර්ශකයට ඇතුළත් වන අතර, ගොඩබිම ප්‍රදේශය වෙත පවතින මුහුදු හා වායුගෝලීය බලයේ සහ වෙරළ වෙත අවසාදිත සැපයීමේ ප්‍රතිඵලයක් ලෙස මෙය නිර්මාණය වී තිබේ. ශ්‍රී ලංකාවේ ගංගා 103ක් පමණ තිබෙන අතර ඒවායින් බහුතරයක් කඳුකරය කේන්ද්‍රකර ගනිමින් ආරම්භ වී වෙරළබඩ භූ දර්ශකයේ වැදගත් අංගයන් වන ගංමෝය නිර්මාණය කරමින් මුහුදට ගලා බසින අතර වාණිජ හා යැපුම් සඳහා භාවිතාවන විශේෂයන් සඳහා වැදගත් වාසස්ථාන සැපයීම සිදු කෙරේ. මෙම ගංගා ඔස්සේ වෙරළ පෝෂණයට අත්‍යවශ්‍ය වැලි, රොන්මඩ හා මැටි විශාල ප්‍රමාණයක් ප්‍රවාහනය කෙරෙන නමුදු වෙරළබඩ ජලයේ හා වාසස්ථානවල ගුණාත්මකබව පහත හෙළන දූෂක ද එමඟින් රැගෙන එනු ලැබේ. සමස්ත වෙරළ කලාපය මුළුල්ලේම විවිධාකාර වූ ගොඩබිම් වාසස්ථාන පවතින අතර මීට මුහුදු වෙරළ, බාධක වෙරළ, වැලි වැටි හා වැලි තුඩු, ගල් සහිත වෙරළ, කඩොලාන හා ලවණ වගුරු ඇතුළත් වේ. ඒ සමාන වැදගත්කමකින් යුතු දෑ වනුයේ කොරල්පර, කලපු, ගංමෝය හා වෙරළාශ්‍රිත ජලයේ වර්ධනය වන මුහුදු තෘණ වේ. මෙම පද්ධතිවලින් වැදගත් භෞතික ක්‍රියාවලි පවත්වාගෙන යෑම, පරිසර පද්ධතිවල සේවාවන් හා කාර්යයන් සපුරාලීම හා භූමිය, භාණ්ඩ හා සේවා සැපයීම සඳහා උපකාරී වේ.

ඉතා නොගැඹුරු මුහුද හා දූපත් පැවතීම හේතුවෙන් උතුරු පළාත් වෙරළ කලාපය ඊට අනන්‍ය ලක්ෂණවලින් යුතු ය. දූපත්වල ආවරණ බලපෑම හා මුහුදේ සීමාසහිත ගැඹුර හේතුවෙන් යාපනය අර්ධද්වීපයේ බටහිර ප්‍රදේශයේ රැළි තත්ත්වය ඉතා සුමට ස්වභාවයෙන් යුතු ය. වෙරළ තීරය සාමාන්‍යයෙන් ස්ථාවර ස්වභාවයෙන් පවතින අතර මසුන් ඇල්ලීම හා ජලජීවී වගා සඳහා වෙරළ තීරයට නුදුරු පුළුල් නොගැඹුරු කලාපය වඩාත් යෝග්‍ය ප්‍රදේශයක් බවට පත්වී තිබේ.

### 1.2.2 වෙරළාශ්‍රිත උපද්‍රවවලට නිරාවරණය වීම

පහත විස්තරාත්මකව දක්වා ඇති පරිද්දෙන් මෙරට වෙරළ ප්‍රදේශය බොහෝ ස්වභාවික හා මානව ක්‍රියාකාරීත්වයන් හේතුවෙන් හටගන්නා වෙරළබඩ උපද්‍රව වෙත මෑතකාලීනව වඩාත් නිරාවරණය වී තිබේ.

- **සුනාමි තත්ත්වයන්**

2004 වර්ෂයේ ඇති වූ ආසියානු සුනාමි සිදුවීමෙන් ලබාගත් අත්දැකීම් මත පදනම්ව, වෙරළබඩ උපද්‍රව අතුරින් වෙරළබඩ ප්‍රජාව සඳහා බලපාන ප්‍රධාන ගැටලුවක් වනුයේ සුනාමි තත්ත්වයයි. ශ්‍රී ලංකාවේ සුනාමි තත්ත්ව වඩා දුර්ලභ බැවින් ඒ පිළිබඳ ඓතිහාසික වාර්තා වඩාත් අවිනිශ්චිත ය. ඒවායින් බොහෝමයක් මුහුදු මට්ටම ඉහළ යෑම හේතුවෙන් ඇති වූ ක්ෂණික හා බලවත් ජලගැලීම් සම්බන්ධ ජනකතා ය. ශ්‍රී ලංකාවේ ගිණිකොණදිග වෙරළ තීරයේ කරගන් කලපුවෙන් ලබාගත් අවසාදිත හරයන් මත පාදකව, Jackson et al, (2014) විසින් ඇස්තමේන්තු කර ඇත්තේ වසර 434 $\pm$ 40 මධ්‍යයන පුනරාවර්තන අන්තරයක් සහිතව නැවත සුනාමි තත්ත්වයක් ඇති වනුයේ හෙලිකොන් කාලපරිච්ඡේදයේ දී වසර 181 - 517 සිට 1045 - 334 අතර කාල පරාසයකදී ය. අහම්බයක් ලෙසින්, ක්‍රාකටෝහි (Krakatoa) සිදුවී ඇති ගිනි කන්දක් පුපුරා යෑමේ සංසිද්ධියක් හේතුවෙන් වාර්තා වී ඇති පළමු සුනාමි තත්ත්වය 1883 අගෝස්තු 27 වැනි දින ශ්‍රී ලංකාවට බලපා තිබේ. මෙහි දී අසාමාන්‍ය අයුරින් ඉහළ ජල මට්ටම් සමග වෙරළ තීරය අඩුවී යෑමක් නිරීක්ෂණය වී තිබේ. එසේ වුව ද, ජල මට්ටමේ විචලනයන් දරුණු නොවූ අතර සුවිශේෂී ජල ගැලීම් හෝ හානිවීම් වාර්තා වී නොමැත. දෙවැනි හා අතිශය ව්‍යසනකාරී සුනාමි අත්දැකීම සිදුවූයේ 2004 දෙසැම්බර් 26 වැනි දින ඉන්දියන් සාගරයේ දී වන අතර එහිදී පුද්ගලයන් 38,000කගේ ජීවිත අහිමි වූ අතර සිදු වූ ආර්ථික පාඩුව ඇ.ඩො. බිලියන 01ක් ලෙසින් ඇස්තමේන්තුගත වී තිබේ. සිදු වූ ජීවිත හානිය හා විනාශයේ වපසරිය අනුව සැලකූ විට ශ්‍රී ලංකාවේ සිදුවූ වඩාත්ම හානිකර ස්වභාවික උපද්‍රවය වනුයේ මෙම සුනාමි ව්‍යසනය යි. රටෙහි සමස්ත ජනගහනයෙන් 5% ක් මෙයින් බලපෑමට ලක් වූ අතර වෙරළබඩ පරිසර පද්ධති හා වෙරළාශ්‍රිත යටිතල පහසුකම් විනාශයට ලක්විණි. මෙතුළින් දීර්ඝකාලීන බලපෑම් උද්ගත විය. භෞතික පරිසරය වෙත බරපතල ප්‍රතිඵල ඇතිවූ බලපෑම් අතුරින් සමහරක් වනුයේ පානීය ජල ප්‍රභව හා ගොවිබිම් වෙත ලවණ මිශ්‍රිත ජලය ගලායෑම, තෙත්බිම් වාසස්ථාන වෙත සිදුවූ හානි සහ කොරල්පර මත වැලි තැන්පත් වීමයි.

- **සුළි සුළං හා උදම් තත්ත්වයන්**

ඉන්දියන් සාගරයේ උතුරු කලාපයේ හටගන්නා වායුව අඩු පීඩන පද්ධති අතුරින් සීමිත සංඛ්‍යාවකින් පමණක් ශ්‍රී ලංකාවට බලපෑම් ඇති වේ. මීට හේතු වනුයේ ශ්‍රී ලංකාව සාපේක්ෂ වශයෙන් සමකයට ආසන්නව පිහිටීම හා බෙංගාල බොක්කේ හා අරාබි මුහුදේ සුළි සුළං කලාපයේ බාහිර මායිම්වල ස්ථානගත වී තිබීමයි. පසුගිය ශත වර්ෂයේ දී ශ්‍රී ලංකාව තුළ නායයෑම් සමග සුළි සුළං අවස්ථා 16ක් ඇති වී තිබේ. 1964 වර්ෂයේ දී, ශ්‍රී ලංකාවේ ජල ප්‍රදේශවල උද්ගත වී පැයට කි.මී 160ක උපරිම සුළං වේගයක් සහිතව පැවති සුළි සුළඟ හේතුවෙන් 1000කට අධික ජීවිත සංඛ්‍යාවක් විනාශ වී තිබේ. ජනතාව වෙතින් පැවත එන කතාන්දර ආශ්‍රිත සාක්ෂි සහ ආදර්ශ අධ්‍යයන අනුව, වයඹ වෙරළ තීරයේ ඇතැම් ස්ථානවල මීටර් 4ක් පමණ

උසින් යුතු රළ ඉපිලුම් ඇතිවී තිබේ (Murthy et.al 2004). මුළු දිවයිනටම ව්‍යසනකාරී බලපෑමක් ඇති කළ 1978 වර්ෂයේ දී සිදුවූ සුළි සුළං තත්ත්වය ගොඩබිමට ඇතුළු වී ඇත්තේ නැගෙනහිර වෙරළේ මඩකලපුව ආසන්නයෙනි. එම සුළි සුළං තත්ත්වයෙන් ජීවිත හානි 915ක් ද බොහෝ වාසස්ථාන හා අනෙකුත් යටිතල පහසුකම්වලට ද හානි සිදුකරන ලදී. වාර්තා වී ඇති උපරිම සුළං වේගය පැයට කිලෝ මීටර් 145කි. මඩකලපු ප්‍රදේශයේ දී සුළං හේතුවෙන් ඇති වූ උදම් රළෙහි උස මී 1.5 සිට 2 දක්වා පැවත තිබිණි. ගිණිකොණදිග වෙරළ තීරයේ 1992 වර්ෂයේ දී ඇති වූ තවත් සුළි සුළං තත්ත්වයකින් ජීවිත හානි 4ක් සහ නිවාස 29,000ක් විනාශ විය. 1978 වර්ෂයෙන් පසුව ශ්‍රී ලංකාවට බලපෑ ප්‍රබලතම නිවර්තන සුළි සුළං තත්ත්වය වූයේ 2000 වර්ෂයේ දී ඇති වූ සුළි සුළං තත්ත්වයයි. පැයට කිලෝ මීටර් 165ක උපරිම සුළං වේගයක් සහිත ශ්‍රී ලංකාවේ නැගෙනහිර ප්‍රදේශයෙන් ත්‍රිකුණාමලය ආසන්නයෙන් මෙය ගොඩබිම් ප්‍රදේශයට ඇතුළු වී තිබේ. එමගින් අවම වශයෙන් පුද්ගලයන් 9 දෙනෙකුගේ ජීවිත අහිමි වී ඇති අතර 500,000ක පමණ පිරිසකට නිවාස අහිමි වී තිබේ. 2003 වර්ෂයේ දී ඇති වූ සුළි සුළඟ දිවයින හරහා හමා නොගිය නමුදු නැගෙනහිර වෙරළ තීරයට සමාන්තරව දකුණ සිට උතුර දක්වා මඟක හමා ගොස් තිබෙන අතර දකුණු ඉන්දියාවෙන් ගොඩබිම් ප්‍රදේශයට ඇතුළු වී තිබේ. එසේ වුව ද, අධික වර්ෂාව, ගංවතුර, හා නාය යෑම් හේතුවෙන් 250 දෙනෙකුගේ පමණ ජීවිත අහිමි වී තිබේ (Srisangeerthanan S. et al., 2015).

- **සමුද්‍රීය අනතුරු හේතුවෙන් වෙරළබඩ දූෂණය**

නැගෙනහිර/ බටහිර නාවික මාර්ගයේ ප්‍රධානතම ස්ථානයක ශ්‍රී ලංකාව පිහිටා ඇති බැවින්, දෛනික වශයෙන් නැව් 200 සිට 300 දක්වා සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේ මුහුදු ප්‍රදේශය පසුකර යනු ලැබේ. පසුගිය දශක කිහිපය මුළුල්ලේම වෙරළ තීරයට තර්ජනයක් ඇති කරමින් තෙල් හා හානිකර ද්‍රව්‍ය කාන්දුවීම් සිදුවූ අවස්ථා ගණනාවකි. නයිට්‍රික් අම්ල මෙට්‍රික් ටොන් 25ක් ද ඇතුළුව රසායනික ද්‍රව්‍ය පුරවන ලද බහාලුම් 1,486ක් රැගත් බහාලුම් නෞකාවක් වන එම්වී - එක්ස්ප්‍රස් පර්ල් නෞකාව, බටහිර හා දකුණු වෙරළ තීරය ව්‍යසනයට බඳුන් කරමින් 2021 ජූලි මාසයේ දී කොළඹ වරායට ආසන්න මුහුදේ දී ගිනිබත් වී ගිලී ගොස් තිබුණි. 2020 සැප්තැම්බර් මාසයේ දී, මිලියන දෙකකට වැඩි බොරතෙල් රැගත් එම්ටී නිව් ඩයමන්ඩ් නෞකාව ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරයට ප්‍රවේශවන අවස්ථාවේ දී ගිනි ගැනීමකට ලක්විය. භාණ්ඩ තොග රැගත් ටැංකිවලට හානියක් නොවුව ද, නෞකාව වෙරළ තීරයෙන් ඉවතට ඇදගෙන යෑමේ දී මුහුදේ පාවෙන තෙල් තට්ටුවක් දැකගත හැකිවිය. 2009 අප්‍රේල් මාසයේ දී රසායනික ද්‍රව්‍ය රැගත් නෞකාවක් වන එම්ටී ග්‍රැම්බා නෞකාව සල්ෆියුරික් අම්ල ටොන් 6,250ක් සමග ගිලී යෑමට මත්තෙන් ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළෙන් නාවික සැතපුම් 60ක් පමණ ඔබ්බේ සිට ඇදගෙන යන ලදී (Kelley, 2009). 2006 වර්ෂයේ දී, දැව තොග දහස් ගණනක් රැගත් එම්වී අමනාත් නෞකාව ශ්‍රී ලංකාවේ නිරිතදිග වෙරළ තීරයේ දී ඉන්ධන මෙට්‍රික් ටොන් 176ක් සමගින් ගිලී ගිය අතර එමගින් ආසන්න වශයෙන් කිලෝ මීටර් 15ක පමණ වෙරළ තීරයක් දූෂණය විය. 1999 වර්ෂයේ දී, එම්වී මෙලික්ෂා නෞකාව ගිණිකොණදිග වෙරළ තීරයේ දී ගිලී යෑමට බඳුන් වූ අතර එම නෞකාවේ මෙට්‍රික් ටොන් 16,000කට අධික රසායනික පොහොර සහ ඉන්ධන මෙට්‍රික් ටොන් 200ක් පැවතිණි (කුලතිලක, 2018).

### 1.3 වෙරළ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණයේ දී වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වෙරළ කලාප කළමනාකරණ වැඩ සටහනෙ හි ආරම්භක අවස්ථාවේ සිටම, සංරක්ෂණ අරමුණු සහ රටෙහි සංවර්ධන අවශ්‍යතාවල තුලනයක් පවත්වා ගැනීමට ප්‍රයත්න දරා තිබේ. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පරිසරය ආරක්ෂා කිරීම සඳහා වගකිව යුතු අනෙකුත් රජයේ ආයතන විසින් ක්‍රියාත්මක කරන සංරක්ෂණය පිළිබඳ සම්ප්‍රදායික මතයෙන් යම්තාක් දුරකට බැහැර වේ. වෙරළ කලාපයේ ගතික ස්වභාවය, වෙරළ කලාප පරිසර පද්ධති සේවා හා කාර්යභාරය සහ වෙරළාශ්‍රිත පරිසරයෙන් ලබාගන්නා වාසි සැලකිල්ලට ගැනීමේ දී ලිඛිත ප්‍රතිපත්තිමය අරමුණුවලට සීමා නොවී පාර්ශවකරුවන්ගේ පුළුල් වශයෙන් වූ උපදේශකත්වය සමගින් සැලසුම්ගත කළමනාකරණය උදෙසා විශේෂ අවධානය යොමු කරන ලදී. වෙරළ සම්පත් කළමනාකරණ ක්‍රියාවලියේ දී, තරගකාරී භාවිතයන් උදෙසා අවහිරතාවයකින් තොරව වෙරළබඩ ප්‍රජාවගේ මූලික අවශ්‍යතා සම්පාදනය සහතික කිරීම සහ ජීවන තත්ත්වයේ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා විශේෂ වූ අවධානය යොමු කරන ලදී.

වෙරළ සම්පත් කළමනාකරණයේ දී යොදා ගන්නා විධාන සහ පාලන නෛතික පාලන ලේඛනවල සමාජීය පිරිවැය සහ වෙරළබඩ පරිසර පද්ධති සේවාවන්ගේ හඳුනානොගත් අගය සම්බන්ධයෙන් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සැලසුම් තීරණවල දී සැමවිටම සුපරීක්ෂාකාරී අවධානය යොමු කරනු ලැබේ. තව ද, හැකි සෑම අවස්ථාවකදී ම සම්පත් කළමනාකරණය උදෙසා පහළ සිට ඉහළට දිවෙන සහභාගිත්ව ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම හා යොදා ගැනීම සිදු කෙරේ.

*"ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික හා පාරිසරික ප්‍රශස්තකරණය සඳහා වෙරළ සම්පත් තිරසර අන්දමින් සංවර්ධනය කිරීම සහ වෙරළාශ්‍රිත ක්‍රියාවලි කළමනාකරණය කිරීම"*

**යන මෙහෙවර සාක්ෂාත් කරගැනීම සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රයත්න දරනු ලැබේ.**

**අපේක්ෂිත අරමුණු :**

යථෝක්ත මෙහෙවර සාක්ෂාත් කරගැනීම උදෙසා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මෙහෙයවන අරමුණු හතර වනුයේ :

- වෙරළබඩ පරිසරයේ තත්ත්වය වැඩිදියුණු කිරීම.
- වෙරළබඩ තීරය සංවර්ධනය කිරීම හා කළමනාකරණය කිරීම.
- වෙරළබඩ ප්‍රජාවගේ හා සම්පත් භාවිතා කරන්නන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම.
- වෙරළබඩ සම්පත් මත පදනම් ව ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීම.

**සාක්ෂාත් කරගත යුතු ප්‍රතිඵල වනුයේ**

- වෙරළබඩ භූමියේ සහ ජලයේ ගුණාත්මක වැඩිදියුණු වීම.
- ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම හා තිරසාර භාවිතය සහතික කිරීම.
- වෙරළබඩ භූමියේ ප්‍රශස්ත ආර්ථික විභවය අත්පත් කරගැනීම.
- නව ආර්ථික අවස්ථා නිර්මාණය කරගැනීම.
- වෙරළබඩ ප්‍රජාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක බව වැඩිදියුණු වීම.
- විනෝදාස්වාද භාවිතයන් සඳහා පහසුකම් සැපයීම.
- විද්‍යාත්මක/සොබාදර්ශන/ඓතිහාසික/පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික වශයෙන් වැදගත් ස්ථාන සංරක්ෂණය කිරීම.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පසුගිය දශක තුනක කැපීපෙනෙන ජයග්‍රහණයන් පහත දැක් වේ :

- වෙරළ ඛාදනයේ බලපෑම් සැලකිය යුතු මට්ටමකට අඩුකිරීම.
- නීති විරෝධී ආකාරයෙන් වෙරළේ වැලි කැණීම් කටයුතු සැහෙන මට්ටමකට අඩු කිරීම.
- හිරිගල් කැණීම් සම්පූර්ණයෙන් නතර කිරීම.
- වෙරළබඩ සංවර්ධන කටයුතුවල දී පාරිසරික බලපෑම් තක්සේරුව/මූලික පරිසර පරීක්ෂණය (EIA/IEE) යන ක්‍රියාවලි යොදාගැනීම සහතික කිරීම.
- බලපත්‍ර අනුකූලතාවය සහතික කිරීම.
- වෙරළබඩ ප්‍රවේශය සහතික කිරීම.
- පාසැල් සඳහා විෂයමාලා සංවර්ධනය ද ඇතුළුව වෙරළබඩ ගැටලු පිළිබඳ දැනුවත් බව වැඩිදියුණු කිරීම.
- වෙරළබඩ සම්පත් කළමනාකරණය පිළිබඳ ප්‍රජා දැනුවත් බව සහ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම.
- වෙරළබඩ සම්පත් කළමනාකරණයේ දී ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.
- ඒකාබද්ධ වෙරළ කළමනාකරණය සඳහා ඵලදායී අතිරේක මෙවලමක් වශයෙන් විශේෂ කළමනාකරණ ප්‍රදේශ හඳුන්වා දීම.
- වෙරළ සම්පත් කළමනාකරණ සහයෝගීතාවය සඳහා නෛතික රාමුවක් හඳුන්වා දීම.
- වෙරළබඩ හා සමුද්‍ර ඛාදනය අඩුකිරීමේ ප්‍රයත්න සම්බන්ධීකරණය කිරීම.

1.3.1 **විදේශීය තාක්ෂණික සහාය**

වෙරළබඩ කලාපයේ දිගුකාලීන ස්ථාවරත්වය සඳහා තර්ජනයක් වන්නා වූ වෙරළබඩ ගැටලුවලින් පැනනගින ප්‍රතිඵල වළක්වා ගැනීම හෝ අවම කරගැනීම සඳහා පසුගිය කාලසීමාව තුළ විදේශ තාක්ෂණික සහාය ලබාගැනීමට වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට හැකිවී තිබේ.ඩෙන්මාර්කයේ DANIDA නියෝජිතායතනයෙන් ප්‍රදාන ලද ව්‍යාපෘති දෙකක් ඇතුළත් වෙරළ ඛාදන කළමනාකරණ වැඩසටහන (1987-1989 සහ 1990-1992), NORAD නියෝජිතායතනයෙන් ප්‍රදානයන් ලද හම්බන්තොට ඒකාබද්ධ වෙරළ කලාප කළමනාකරණ ව්‍යාපෘතිය - HICZMP (1999-2001), GEF වෙතින් ප්‍රදානයන් ලද රැකව උස්සන්ගොඩ කලාමිටිය ජෛව විවිධත්ව සංරක්ෂණ වැඩසටහන (1994-1998) හා USAID වෙතින් ප්‍රදානයන් ලද වෙරළ සම්පත් කළමනාකරණ වැඩසටහන - I සහ II අදියර (1985-1998, 1991-1997), CCD/GTZ වෙතින් ප්‍රදාන ලද වෙරළ සංරක්ෂණ ව්‍යාපෘතිය (1988-1996), ADB-GoN ප්‍රදානයන් ලද වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (2001-2007) සහ GEF/IFAD වෙතින් ප්‍රදානයන් ලද නැගෙනහිර පළාතේ වෙරළ කලාප පිළිසකර කිරීමේ හා තිරසර අයුරින් කළමනාකරණය කිරීමේ සහභාගිත්ව ව්‍යාපෘතිය (2009-2016) මේ අතුරින් ප්‍රධාන වේ.

1.4 **වෙරළ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2024**

1.4.1 **2011 වර්ෂයේ සංශෝධිත වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනත ඔස්සේ හඳුන්වා දුන් නව නෛතික විධිවිධාන**

1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත 1983 ඔක්තෝබර් 01 වැනි දින සිට ක්‍රියාත්මක වූ අතර එකී පනතේ විධිවිධාන අනුව, වෙරළ කලාපය, එහි සම්පත් සහ වෙරළබඩ කලාපය තුළ සිදුකරන සංවර්ධන කටයුතු මූලික වශයෙන් කළමනාකරණය විය. සැලසුම්කරණය හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළ ප්‍රධාන පනතේ විධිවිධානවලට අදාළ රික්තකය තුළ සැලසුම් හා කළමනාකරණ නිමැවුම් හා ප්‍රතිඵල මත සෘණාත්මක බලපෑමක් ඇතිකරන බව අවබෝධ විය. ඒ අනුව, 1988 අංක 64 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත මගින් ප්‍රධාන පනත සඳහා සංශෝධනයක් ඇතුළත් කරන ලදී. හිරිගල් හා වැලි කැණීමේ කාර්යයන්, වෙරළ වෙත ප්‍රවේශ වීම සඳහා ඇති මහජන අයිතිය හා වෙරළ කලාපයේ හුණු පෝරණු කඩා ඉවත් කිරීම සම්බන්ධිත නියාමන බලතල වැඩිදියුණු කිරීම උදෙසා එම සංශෝධන ඔස්සේ ප්‍රධාන වශයෙන් අවධානය යොමුවී තිබේ.

කාලයත් සමග වෙරළ සම්පත් කළමනාකරණයේ විෂය පථය පුළුල්වීමත් මානව හා ස්වාභාවික සංසිද්ධි යන කරුණු ද්වයම හේතුවෙන් වෙරළබඩ ගැටලු වැඩිවීමත් හේතුවෙන්, නව නෛතික විධිවිධානවල අවශ්‍යතාවය අවධාරණය වී තිබේ. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ආයතනගත කිරීම, සහභාගිත්ව කළමනාකරණයේ දී ප්‍රජා සහභාගීත්වයේ නීත්‍යානුකූල බව, නෛතික වශයෙන් අර්ථ දක්වා ඇති වෙරළ කලාපය පුළුල් කිරීම, වෙරළ කලාපය කෙරෙහි සෘජු බලපෑමක් ඇති වෙරළ කලාපයෙන් පිටත මානව ක්‍රියාකාරකම් පාලනය කිරීම, මහජන ප්‍රවේශය කළමනාකරණය කිරීම හා විවෘත අවකාශ හා ප්‍රවේශ කළමනාකරණය යන ක්ෂේත්‍ර ආශ්‍රිතව නව නෛතික විධිවිධාන හඳුන්වා දීමේ අවශ්‍යතාවය පැනනැගී ඇත.

ඉහත කරුණු සැලකිල්ලට ගෙන, 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ සංශෝධන පනත මගින් ප්‍රධාන පනත සඳහා දෙවන සංශෝධනය රජය විසින් හඳුන්වා දී තිබේ. මෙම සංශෝධන සඳහා අවධානිත ක්ෂේත්‍ර වූයේ;

- වෙරළ කලාපය ඇතුළත මුහුදට සම්බන්ධිත ජල ස්කන්ධවල ඉවුරවල් පිහිටි ඉඩම් ඇතුළත් කරමින්"වෙරළ කලාපය" නැවත අර්ථ දැක්වීම
- "වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම" පිළියෙළ කිරීම.
- වෙරළ කලාපය ඇතුළත හෝ ඉන් ඔබ්බට පිහිටි බලපෑමට ලක්වන ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීම සඳහා වන විධිවිධාන.
- වෙරළ උද්‍යාන සහ සංරක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීම සඳහාවන විධිවිධාන.
- විශේෂ කළමනාකරණ ප්‍රදේශ නම් කිරීමේ හා ආයතනගත කිරීමේ විධිවිධාන.
- වෙරළබඩ ප්‍රවේශ සැලැස්ම සම්පාදනය කිරීම සඳහා විධිවිධාන.




රූපය 1- 1: **වෙරළ කලාපය - නව අර්ථ දැක්වීම (පැහැදිලි කිරීමකි)**
(2011 අංක 49 දරන පනතින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ කළමනාකරණ පනත ප්‍රකාරව)

### 1.4.2 ප්‍රාරම්භක ක්‍රියාවලිය

1988 අංක 64 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත හා 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ නෛතික විධිවිධානවලට අනුකූලව"වෙරළ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම -2024" සම්පාදනය කර තිබේ. වෙරළ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2024 සැලැස්ම පිළියෙළ කිරීමට හැකිවන පරිද්දෙන් වෙරළ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2018 සැලැස්ම සංශෝධනය කිරීම සහභාගිත්ව ක්‍රියාවලිය, ක්ෂේත්‍ර විමර්ශන, දෙපාර්තමේන්තු අභ්‍යන්තර ලේඛන හා ක්‍රියාවලි හරහා රැස්කර ගනු ලැබූ ප්‍රාථමික දත්ත හා තොරතුරු ඔස්සේ දියත් කර තිබේ. තොරතුරුවල විශ්වාසනීයත්වය හා තීරණ ගැනීමේ ක්‍රියාවලියේ සඵලතාවය සහතික කරගැනීම සඳහා, ඒක පුද්ගල සහභාගීත්වය සහිත උපදේශන ක්‍රියාවලිය හා කණ්ඩායම්ගත උපදේශන ක්‍රියාවලිය ඔස්සේ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙතින් ප්‍රමාණවත් මට්ටමක පසුපෙවුම් තොරතුරු ලබාගන්නා ලදී. සැලසුම් ක්‍රියාවලිය ඔස්සේ දියත් කළ දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විස්තීර්ණ කාර්ය සැසි තුළින් කළමනාකරණ ප්‍රතිපත්ති, ක්‍රමෝපාය, මාර්ගෝපදේශ හා ප්‍රමිතීන්වලට අදාළ ප්‍රායෝගික ගැටලු හා අවිනිශ්චිතතා හඳුනාගෙන විශ්ලේෂණය කරන ලදී. තව ද, වැඩමුළුවක් මාර්ගයෙන් අර්ථාන්විත උපදේශනයන් ලබාගැනීම හා ඒ සම්බන්ධයෙන් අනෙකුත් පාර්ශවකාර නියෝජිතායතන හා දේශපාලන අධිකාරිය දැනුවත් කිරීම ද සිදුකරන ලදී.

මෙවැනි සැලැස්මවල් මීට පෙර ක්‍රියාත්මක කිරීමෙන් ලද අත්දැකීම් හා වර්තමාන වාතාවරණය පිළිබඳ සුපරීක්ෂාකාරී අවධානය මත පදනම්ව සෑම පරිච්ඡේදයකටම අදාළ කළමනාකරණ ප්‍රතිපත්ති, ක්‍රමෝපාය, ප්‍රමිති හා මාර්ගෝපදේශවල සඵලදායී බව විධිමත් ආකාරයෙන් තක්සේරු කිරීම, වැඩිදියුණු කිරීම හා සම්පාදනය කිරීම සිදුකරන ලදී. මීට අමතරව, මෙම සැලැස්ම තුළ අන්තර්ගත කර ඇති කළමනාකරණ මාර්ගෝපදේශවලට අදාළවන ආයතනවලින් ප්‍රතිපෝෂණ ලබාගන්නා ලදී.

### 1.4.3 සැලසුමේ ව්‍යුහය හා අන්තර්ගතය

මෙම වෙරළ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2024 සැලැස්ම පරිච්ඡේද හයකට වෙන්කර තිබේ. 2-6 දක්වා ඇති පරිච්ඡේද ගැටලු පිළිබඳව සහ ඒකාබද්ධ වෙරළ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණය ඔස්සේ විසඳුම්

ලබාදෙන ප්‍රධාන ගැටලු සම්බන්ධයෙන් වෙන්කර තිබේ. අධ්‍යයන ඔස්සේ රැස්කළ ප්‍රාථමික හා ද්විතීක තොරතුරු, මීට පෙර සම්පාදිත වෙරළ කලාප කළමනාකරණ සැලැසුම් (1990, 1997, 2004, 2018) හා අනෙකුත් ද්විතීක මූලාශ්‍ර ආශ්‍රයෙන් වෙරළ තීර කළමනාකරණය (2වැනි පරිච්ඡේදය), වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම (3වැනි පරිච්ඡේදය), වෙරළබඩ දූෂණය පාලනය කිරීම (4වැනි පරිච්ඡේදය), විශේෂ කළමනාකරණ ප්‍රදේශ (5වැනි පරිච්ඡේදය) සහ නියාමන යාන්ත්‍රණ (6වැනි පරිච්ඡේදය) යන පරිච්ඡේද සකස් කර තිබේ. ගැටලු ආශ්‍රයෙන් සකස්කළ සෑම පරිච්ඡේදයකින්ම වෙරළබඩ සම්පත්වල තත්ත්වය හෝ කළමනාකරණ මැදිහත්වීම් අවශ්‍ය ගැටලු (අදාළ පරිද්දෙන්); විසඳිය යුතු ගැටලු; සහ දැනට පවතින සැලසුම්, ප්‍රතිපත්ති හා වැඩසටහන්, නීති, ආයතනික යාන්ත්‍රණ හා කළමනාකරණ මැදිහත්වීම් සඳහා බලපෑමක් ඇති කරන නීති බලාත්මක කිරීමේ පවත්නා ක්‍රමයන් පිළිබඳ විවරණයක් ලබාදේ. ගැටලු ආශ්‍රයෙන් සකස්කළ සෑම පරිච්ඡේදයකම කළමනාකරණ අරමුණු, සම්බන්ධිත ප්‍රතිපත්ති සහ කළමනාකරණය සඳහා යෝජිත ක්‍රියාමාර්ග ඇතුළත් වේ. මෙම සැලසුම තුළ සෑම අරමුණක්ම සකස්කර ඇත්තේ අපේක්ෂිත තත්ත්වය වශයෙන් වන අතර කළමනාකරණ මැදිහත්වීම් අවශ්‍ය කරන ප්‍රධාන වෙරළබඩ ගැටලුවක් ඊට අදාළ වේ. ප්‍රතිපත්ති ඔස්සේ පිළිබිඹු කෙරෙනුයේ සෑම අරමුණක්ම සාක්ෂාත් කරගැනීම සඳහා සහාය වන හා අනුගමනය කළ යුතු පුළුල් ක්‍රියාමාර්ගය වේ. ක්‍රමෝපායවලින් ප්‍රධාන ගැටලු ඉලක්කගත කරන අතර යම් නිශ්චිත අරමුණක් සාක්ෂාත් කරගැනීම සඳහා උපකාරීවන විවිධ මැදිහත්වීම් හෝ කාර්ය සැලසුම් යෝජනා වේ. යම් නිශ්චිත ක්‍රමෝපායයක් කරා යෑමට අවශ්‍ය නිශ්චිත පියවර යෝජිත ක්‍රියාමාර්ග තුළින් හඳුනාගැනේ.

## 2 වැනි පරිච්ඡේදය - වෙරළ තීර කළමනාකරණය

### 2.1 හැඳින්වීම

වෙරළ ඛාදනය සහ එයින් ප්‍රවේශයලත් වෙරළ තීර කළමනාකරණය වනාහී ශ්‍රී ලංකාවේ වෙරළ කලාප කළමනාකරණ වැඩසටහන ආරම්භ කිරීම සඳහා හේතු පාදක වූ ප්‍රධානතම ප්‍රේරක සාධකය ලෙස හඳුනාගත හැකි ය. මෙම වැඩසටහන වැඩිදියුණු කිරීම එහි විශාලත්වය, ආශ්‍රිත හේතු, මහජන මතය, ක්‍රියාවට නැංවූ කළමනාකරණ පියවර හා ප්‍රතිපත්තිමය ප්‍රතිචාර අනුව පැහැදිලි කාල සීමා තුනකට වෙන්කළ හැකි ය.

මුල් කාල සීමාව තුළ, දිවයිනේ දකුණු පළාත වෙරළ ඛාදන ගැටලුවට ප්‍රධාන වශයෙන් මුහුණ දුන් අතර එය සාමාන්‍ය සංසිද්ධියක් වශයෙන් සලකා ගැටලු පැන නැගි අවස්ථාවලදී ඒ ඒ අවස්ථාව අනුව ගැටලුව සම්බන්ධයෙන් කටයුතු කරන ලදී. වෙරළ ආරක්ෂාව සම්බන්ධයෙන් වගකීම දැරීම පැවරී ඇති තනි රාජ්‍ය ආයතනයක් නොපැවති අතර රජයේ වැඩ දෙපාර්තමේන්තුව, කොළඹ වරාය කොමිසම හා දුම්රිය දෙපාර්තමේන්තුව වැනි රජයේ ආයතන ගණනාවක් වෙරළ ඛාදනය වැළැක්වීම සඳහා "Hold the Line Approach" ලෙස හැඳින්වෙන ප්‍රවේශය වෙත අවධානය යොමුකරමින් වෙරළ ආරක්ෂණ කටයුතු සිදුකරන ලද අතර මෙහි දී වෙරළ ආරක්ෂණ කටයුතු පැති බැම්, සමුද්‍ර පවුරු, පනා බැම් වැනි ඉදිකිරීම් ව්‍යුහයන් වෙත සීමාවිය. එසේ වුව ද, වෙරළ ඛාදන ගැටලුව උග්‍ර තත්ත්වයකට පත් වූ අතර කාලයත් සමග එය ප්‍රධාන පාරිසරික හා සමාජ- ආර්ථික ගැටලුවක් ලෙසින් සැලකීම ආරම්භ විණි.

1970 දශකයට එළඹීමේ දී, වෙරළබඩ ඉඩම් හා දේපළ, මංමාවත් හා දුම්රිය මාර්ග වැනි යටිතල පහසුකම් සඳහා හානි සිදුවන ආකාරයේ සුවිශේෂී සමුච්චිත බලපෑමක් ලෙසින් වෙරළ ඛාදනය හඳුනා ගැණුනු අතර, වෙරළබඩ පරිසර පද්ධතිය වෙත සිදුවූ හානි ද ප්‍රත්‍යක්ෂ ලෙස හඳුනාගත හැකිවිය. මෙම අවධියේ දී සුවිශේෂී සමාජ- ආර්ථික සහ පාරිසරික ගැටලුවක් ලෙස වෙරළ ඛාදනය පිළිබඳ සැලකිල්ල යොමුවීම සිදුවූ අතර විධිමත් අයුරින් කළමනාකරණය කිරීම සඳහා මහජන ඉල්ලුමක් ඇති වීම දක්වා එම ගැටලුව වර්ධනය විය. 1978 වර්ෂයේ දී ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ වෙරළ සංරක්ෂණ අංශයක් ඇති කිරීම සමගින් අවශ්‍ය ආයතනික යාන්ත්‍රණය ස්ථාපනය කරන ලදී. ඉන් අනතුරුව, කළමනාකරණ වැඩසටහන මධ්‍යස්ථ මට්ටමකින් ආරම්භ විය. මෙම කාල වකවානුව තුළ, ඉංජිනේරු කාර්යයන් ක්‍රියාත්මක කිරීමට සමාන්තරව නෛතික රාමුවක් සම්පාදනය කිරීම මගින් ආයතනික ධාරිතාවය ද වැඩිදියුණු කරන ලදී.

මෙම කළමනාකරණ වැඩසටහන් ප්‍රවේශයේ තෙවන පැහැදිලි කාල සීමාව වශයෙන් 1986 වර්ෂයේ දී වෙරළ ඛාදනය කළමනාකරණය කිරීම සඳහා වූ ප්‍රධාන සැලසුමක් සම්පාදනය කිරීම සහ එහි ඉන් අනතුරුව සිදුකළ ක්‍රියාත්මක කිරීම් ලෙස 1987 වර්ෂයේ සිට DANIDA වැඩසටහන යටතේ අදියර 1 හා 2 වශයෙන් වූ ව්‍යාපෘති සහ 2001-2007 දක්වා ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රදාන යටතේ වූ වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (CRMP)හඳුනාගත හැකි ය. මෙම අදියරේ දී වැලි හා හිරිගල් කැණීම් පාලනය, වෙරළබඩ පරිසර පද්ධති ආරක්ෂා කිරීම, අක්‍රමවත් සංවර්ධන කටයුතු අවම කිරීම හා මහජන දැනුවත් බව හා අධ්‍යාපනය වැඩිදියුණු කිරීම වැනි අනෙකුත් කළමනාකරණ විකල්ප ක්‍රියාත්මක කිරීමට සමගාමීව, පවත්නා හොඳම තොරතුරු මත පදනම්ව සැලසුම්ගත ඉංජිනේරු වෙරළ ආරක්ෂණ කටයුතු සිදුකරන ලදී.

වෙරළ ඛාදනය පාලනය කිරීම සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නංවන ලද ඉහත කළමනාකරණ ප්‍රවේශය තුළින් සාධනීය ප්‍රතිඵල ඇතිවී තිබේ. කළමනාකරණ පියවර තුළින් අත්පත් කරගන්නා ලද සමස්ත සමාජ-ආර්ථික හා පාරිසරික ප්‍රතිලාභ ඒ වෙනුවෙන් දරන ලද පිරිවැය ඉක්මවා තිබේ. වෙරළබඩ කලාපය තුළ ඉඩම් හා දේපළ, යටිතල පහසුකම්, සංචාරක වාසස්ථාන, ධීවර යටිතල පහසුකම් ආරක්ෂාව සේම උත්පාදනය වී ඇති ජීවනෝපාය හා රැකියා යන ක්ෂේත්‍ර ඔස්සේ මෙම ප්‍රතිලාභ පිළිබිඹු වේ.

#### 2.1.1. වෙරළ ඛාදනය : ගැටලුවේ ස්වභාවය

වෙරළ ඛාදනය යනු විවිධ ප්‍රමාණයෙන් වෙනස්වීමට භාජනය වන ශ්‍රී ලංකාවේ වෙරළ තීරයේ සිදුවන සුවිශේෂී හා අඛණ්ඩ ගැටලුවක් වන අතර එමගින් සමාජ-ආර්ථික හා පාරිසරික අතුරු විපාක ද ප්‍රතිඵල වී තිබේ. ස්වාභාවික හේතු සහ මානව මැදිහත්වීම යන කරුණු දෙකම හේතුවෙන් ඛාදනය ඇතිවන අතර එමගින් පොදු හා පුද්ගලික පිරිවැයක් ඇති කෙරේ. වෙරළවල් අහිමි වීම, විනෝදාස්වාද හා සංචාරක ක්‍රියාකාරකම් සඳහා බාධා එල්ලවීම, පොදු, පුද්ගලික දේපළ හා යටිතල පහසුකම්වලට ඇති වන හානි මීට ඇතුළත් වේ. වෙරළ ආරක්ෂණ, හදිසි අවස්ථා හා ආපදා සහන කාර්යයන් සඳහා වූ සැලකිය යුතු වාර්ෂික වියදමක් ද මීට ඇතුළත් වේ. දැනට පවතින තොරතුරු අනුව, 1985-1999 කාල සීමාව තුළ දී වෙරළ ඛාදන කළමනාකරණය සඳහා රු. මිලියන 1,520ක් වැයවී තිබෙන අතර ආසියානු සංවර්ධන බැංකුව යටතේ අරමුදල් සම්පාදිත වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ 2001-2007 කාල සීමාව තුළ රු.බිලියන 3ක් වැයවී තිබේ. මීට අමතරව, සුනාමි බලපෑමට ලක් වූ ප්‍රදේශ ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන (TAARP) යටතේ වෙරළබඩ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ඇ.ඩො. මිලියන 1.4ක් වැය කර තිබෙන අතර 2014 සිට 2022 අතර කාලසීමාව තුළ රු.බිලියන 6.3ක් වැය වී තිබේ. ශ්‍රී ලංකා රජයේ අරමුදල් යටතේ 2012 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුව විසින් කෘත්‍රිම වෙරළ වැලි පෝෂණ ව්‍යාපෘති ආරම්භ

කරන ලදී. පසුගිය දශක කිහිපය තුළ, වෙරළ ආරක්ෂණය සඳහා වූ ආයෝජනවලින් බහුතරයක් දකුණ, බටහිර, වයඹ හා නැගෙනහිර වෙරළ තීරය ඔස්සේ සිදුකර තිබේ. එමෙන්ම, මේ දක්වා උතුර, ඊසාන හා වයඹ වෙරළ කොටස්වල වෙරළ ආරක්ෂණය සඳහා මැදිහත්වීම් සිදුවී ඇත්තේ අවම වශයෙනි.

වෙරළ තීරයන් වෙත සැපයෙන වැලි ප්‍රමාණය අඩුවීම වෙරළ ඛාදන ගැටලුවට පාදක වූ තීරණාත්මක සාධකයක් ලෙස හඳුනාගෙන ඇත. වෙරළ වෙත ඇදී යන සුළං සහ මුහුදු රළ මගින් හටගන්නා මුහුදු තරංග මගින් ප්‍රධාන වශයෙන් වෙරළ තීරයේ එක් ප්‍රදේශයක සිට වෙනත් ප්‍රදේශයකට වැලි ප්‍රවාහනය කෙරේ. මෙය අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර ප්‍රමාණවත් අඛණ්ඩ වැලි සැපයුමක් සහිත වෙරළ තීරයන්ගෙන් මුහුදුබඩ ප්‍රදේශය සමන්විත වේ නම් වෙරළ ඛාදනය සැලකිය යුතු මට්ටමකට සිදු නොවේ. වෙරළාශ්‍රිත ඉදිකිරීම් හේතුවෙන් වෙරළ අවහිර වී දිගු රැළි ප්‍රවාහ සඳහා ප්‍රමාණවත් තරම් වැලි සැපයුමක් වෙරළ තීරයේ නොමැතිනම්, එවිට ආසන්න වෙරළ තීරයේ වෙරළ ඛාදනය සිදුවීම වැළැක්විය නොහැකි වේ.

දැනට පවතින තොරතුරුවලට අනුව, 2000-2005 කාල සීමාව තුළ ලංසිගම - මහඔය වෙරළ ප්‍රදේශයේ ඉහළ ශීඝ්‍රතාවයක ඛාදනයක් වාර්තා වී තිබෙන අතර එය වර්තමානය වන විට වළක්වා තිබේ. ඉන් අනතුරුව, මහඔය මුවදොර හරහා ඍජුව දිවෙන වෙරළාශ්‍රිත ඛණ්ඩයක් ආවරණය වන පරිද්දෙන් තොඩුවාව දක්වා වෙරළ ඛාදනය අඛණ්ඩව වාර්තා විය. මෙම ඛණ්ඩයේ දිස්වූ ඛාදනය වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සාර්ථක අයුරින් අවම කරන ලදී. එසේ වුව ද, පුත්තලම දිස්ත්‍රික්කය තුළ වෙරළ ඛාදනයේ තර්ජනයට වඩාත්ම ලක්වී ඇත්තේ ඉරණවිල වෙරළ වේ. එමෙන්ම, 2010 වර්ෂයේ දී ඔලුවිල් වරායට ආසන්නතම උතුරින් දිවෙන වෙරළ තීරයේ සැලකිය යුතු වෙරළ ඛාදන වේගයක් වාර්තා වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඔලුවිල් වරායට කිලෝ මීටර් 16ක් උතුරින් ආසන්න වශයෙන් මීටර් 80 සිට මීටර් 100 දක්වා වෙරළබඩ ඉඩම් තීරුවක් අහිමි කරමින් සයිනමරන්දු දක්වා වෙරළ ඛාදනයේ දරුණු බලපෑමක් ඇතිවිය. 2017 වර්ෂයේ දී කළු ගඟෙහි ගංවතුර පාලනය කිරීම හේතුවෙන් කළුතර කැලිඩෝ වෙරළ තීරයේ බාධක වැලි පරයට හානි විය.ගංවතුර පාලනය කිරීමේ ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් ටැංජරින් බීච් හෝටලය හා රෝයල් පාම් බීච් හෝටලය පසු වීමෙන් අනතුරුව උතුරු වෙරළබඩ තීරුවේ කිලෝ මීටර් 3කට අධික සීමාවක් දක්වා ව්‍යාප්ත වෙමින් දරුණු ඛාදන තත්ත්වයක් උද්ගත විය. මීට අමතරව, ගං මෝය ඍජුවම දිවයින දෙසට මුහුණලා පවතින අයුරින් එකිනෙකට වෙනස් දිශානත වීම්වලින් ගංමෝයට ආසන්නව හරස් වැටි ඇතිවීමේ තත්ත්වයක් ද උද්ගත වී තිබේ. මෙම වාතාවරණය හේතුවෙන්, ඍජු රළ ප්‍රහාර හා ගංගා ජල ප්‍රවාහ දිවයින කෙරෙහි බලපා ඇති අතර දිවයිනේ වෙරළාසන්නව මීටර 100 ක පමණ පළලින් යුතු බිම් තීරුවක් ගසාගෙන ගොස් තිබේ. දකුණු වෙරළතීරයේ ඛාදනය සඳහා වැඩි නැඹුරුතාවයක් පවතින ස්ථාන අතුරින් එකක් වනුයේ ගාල්ල ප්‍රදේශය වන අතර දකුණු වෙරළෙහි ඛාදනය හඳුනාගත් ප්‍රදේශ අතුරින් වඩාත්ම අවදානමක් පවතිනුයේ හික්කඩුව හා හබරාදූව ප්‍රදේශවල ය. 2014 සිට 2022 දක්වා කාල සීමාව තුළ වාර්තා වූ හදිසි වෙරළ ඛාදන අවස්ථාවන් 2.1 වගුවෙහි දැක්වේ.

වෙරළ තීරය වර්ධනය වීම සැලකීමේ දී, ඒ සම්බන්ධයෙන් වාර්තා වූ ශීඝ්‍රතාවය වෙරළ ඛාදන ශීඝ්‍රතාවයට වඩා අඩු අතර ඉතා සීමිත ස්ථාන කිහිපයක දී පමණක් වෙරළ තීරය වර්ධනය වීම සිදු වේ. වෙරළ තීරය වර්ධනය වීම සිදුවන සැලකිය යුතු ස්ථාන වනුයේ ඔලුවිල් වරායට දකුණින් වන අතර එය සිදුවනුයේ වරායට උතුරින් සහ වයඹ වෙරළ තීරයේ කන්දකුලිය යන ප්‍රදේශවල මහා පරිමාණ වශයෙන් සිදුවන ඛාදනය මධ්‍යයේ ය. 2.1 වගුවෙහි දැක්වෙන පරිද්දෙන්, 2014 සිට 2022 දක්වා කාල සීමාව තුළ වාර්තා වූ හදිසි වෙරළ ඛාදන අවස්ථාවන් ඔස්සේ පිළිබිඹු වනුයේ ව්‍යුහාත්මක සහ ව්‍යුහාත්මක නොවන විසඳුම් හරහා ක්‍රියාවට නැංවූ කළමනාකරණ ක්‍රමෝපාය මධ්‍යයේ වුව ද, වෙරළ ඛාදනය යනු මෙරට තුළ අඛණ්ඩව සිදුවෙමින් පවතින ගැටලුවක් බවය. වෙරළ ඛාදනයට අමතරව, වෙරළ කලාපය තුළ ජල ස්කන්ධවල ඛාදනය ද ප්‍රත්‍යක්ෂ වේ. මහ ඔය, දැදුරු ඔය හා මල්වතු ඔය ආශ්‍රිතව ගං ඉවුරු ඛාදනය වාර්තා වේ.

**වගුව 2 - 1 2014-2022 කාල සීමාව තුළ හදිසි වෙරළ ඛාදන තත්ත්වයන් වාර්තාගත වී ඇති ස්ථාන**

| *ඛාදන ස්ථානය/ වෙරළබඩ තීරය* | *වෙරළෙ හි තත්ත්වය* | *හඳුනාගත් ගැටලුව* |
|---|---|---|
| ***පුත්තලම දිස්ත්‍රික්කය*** | | |
| කිරිමුන්දලම, උච්චමුනෙයි | ඉහළ ගතිකත්වයකින් යුතු අස්ථාවර වෙරළාශ්‍රිත දූපත් | ඍතුමය වෙනස්වීම, නිරන්තරයෙන් දූපත්වල හැඩයේ වෙනස්වීම |
| නොරොච්චෝලේ, ඉලන්තඩිය, ආලන්කුඩා | වැලි සහිත ඍජු වෙරළ, ඉහළ මට්ටමේ අවසාදිත ගමන් කිරීමේ වේගය, ධීවර සහ සංචාරක කටයුතු බහුලව සිදු වන වෙරළ තීරයකි. | මධ්‍යස්ථ මට්ටමේ ඛාදනය |

| *බාදන ස්ථානය/ වෙරළබඩ තීරය* | *වෙරළෙ හි තත්ත්වය* | *හඳුනාගත් ගැටලුව* |
|---|---|---|
| **පුත්තලම දිස්ත්‍රික්කය** | | |
| කප්පලාඩි | ඉහළ ගතිකත්වයකින් යුතු වැලි වෙරළ | මධ්‍යස්ථ මට්ටමේ බාදනය |
| මුතුපන්තිය - උඩප්පු | දැදුරු ඔයට උතුරින් පිහිටා ඇති ඉහළ ගතිකත්වයකින් යුතු වෙරළ | මධ්‍යස්ථ මට්ටමේ බාදනය |
| තොඩුවාව | වැලි සහිත සෘජු වෙරළ, ඉහළ මට්ටමේ අවසාදිත ගමන් කිරීමේ වේගය, ධීවර සහ නේවාසික කටයුතු බහුලව සිදුවන වෙරළ තීරයකි. | ඉහළ මට්ටමේ බාදනය |
| ඉරණවිල, අඹකන්ඩවිල | වැලි සහිත සෘජු වෙරළ, ඉහළ මට්ටමේ අවසාදිත ගමන් කිරීමේ වේගය, ධීවර සහ නේවාසික කටයුතු බහුලව සිදුවන වෙරළ තීරයකි. | ඉහළ මට්ටමේ බාදනය |
| බරුදැල්පොල-කුඩාමඩුවැල්ල | වැලි සහිත සෘජු වෙරළ, ඉහළ මට්ටමේ අවසාදිත ගමන් කිරීමේ වේගය, ධීවර සහ නේවාසික කටයුතු බහුලව සිදුවන වෙරළ තීරයකි. | ඉහළ මට්ටමේ බාදනය |
| තලවිල -උතුර | වැලි සහිත සෘජු වෙරළ, ඉහළ මට්ටමේ අවසාදිත ගමන් කිරීමේ වේගය, ධීවර සහ නේවාසික කටයුතු බහුලව සිදුවන වෙරළ තීරයකි. | මධ්‍යස්ථ මට්ටමේ බාදනය |
| **ගම්පහ දිස්ත්‍රික්කය** | | |
| පෝරුතොට | වැලිපෝෂිත වෙරළකි. | ඒකීය සංසිද්ධියකි. සෘතුමය වශයෙන් සිදුවන බාදනයකි. |
| කුට්ටිදූව | මීගමු කලපු මුවදොරට උතුරින් පිහිටා ඇති ඉහළ නේවාසික ඝනත්වයෙන් යුතු, ධීවර කටයුතු බහුලව සිදුවන සෘතුමය වෙනස්වීම් ඇති වෙරළකි. | මධ්‍යස්ථ මට්ටමේ බාදනය |
| මෝරවල පිටිපන | මීගමු කලපු මුවදොරට දකුණින් පිහිටා ඇති ඉහළ නේවාසික ඝනත්වයෙන් යුතු, ධීවර කටයුතු බහුලව සිදුවන සෘතුමය වෙනස්වීම් ඇති වෙරළකි. | මධ්‍යස්ථ මට්ටමේ බාදනය |
| අලුත්කුරුව | නිරාවරණය වූ අර්ධ වශයෙන් හානිවී ඇති ද්විතීක වැලිගල් පරය, කුඩා වැලි වැටි සහිත වෙරළ | මධ්‍යස්ථ මට්ටමේ බාදනය |
| දූන්ගල්පිටිය | නිරාවරණය වූ අර්ධ වශයෙන් හානිව ඇති ද්විතීක වැලිගල් පරය, බලපෑමට ලක් වූ කුඩා වැලි වැටි සහිත වෙරළ | මධ්‍යස්ථ මට්ටමේ බාදනය |
| උස්වැටකෙයියාව පරණ අම්බලම | නිරාවරණය වූ අර්ධ වශයෙන් හානිව ඇති ද්විතීක වැලිගල් පරය, බලපෑමට ලක් වූ කුඩා වැලි වැටි සහිත වෙරළ | මධ්‍යස්ථ මට්ටමේ බාදනය, වාරකන් සමයේ දී මුහුදු රළ ගොඩට ඒම. |

| *ඛාදන ස්ථානය/ වෙරළබඩ තීරය* | *වෙරළෙ හි තත්ත්වය* | *හඳුනාගත් ගැටලුව* |
|---|---|---|
| **පුත්තලම දිස්ත්‍රික්කය** | | |
| තල්දියවත්ත | නිරාවරණය වූ අර්ධ වශයෙන් හානිව ඇති ද්විතීක වැලිගල් පරය, වැලි නොමැති වෙරළ | ඉහළ මට්ටමේ ඛාදනය, වාරකන් සමයේ දී මුහුදු රළ ගොඩට ඒම. |
| **කොළඹ දිස්ත්‍රික්කය** | | |
| ලුනාව - මොරටුව | ආරක්ෂිත වෙරළ | මුහුදු රළ ගොඩට ඒම |
| මොරටුව - කොරලවැල්ල | ග්‍රොයින ශ්‍රේණියක් සහ රිවිට්මන්ට් බැමි මගින් ආරක්ෂා කර ඇත | 2022 වර්ෂයේ දී ඛාදනයක් නිරීක්ෂණය කළ නමුත් නැවත සිදු නොවීය |
| **කළුතර දිස්ත්‍රික්කය** | | |
| කැලිඩෝ වෙරළේ සිට (කළු ගඟ මුවදොරට උතුරින්) වාද්දුව දක්වා | කළු ගඟේ මුවදොරේ සිට උතුරු දෙසට ඍජු වෙරළ, ඉහළ ගතිකත්වයෙන් යුතු ඉහළ මට්ටමේ අවසාදිත ගමන් කිරීමේ වේගය | ඉහළ මට්ටමේ ඛාදනය |
| බේරුවල-මරදාන | සැලසුමකින් තොරව ඉදිකරන ලද වෙරළ ව්‍යුහ, ඒකීය සංසිද්ධියකි | පහළ මට්ටමේ ඛාදනය |
| **ගාල්ල දිස්ත්‍රික්කය** | | |
| අහංගම | අහංගම කන්ද - කබොක් දඹය, අහංගම නගර ප්‍රදේශය පටු වෙරළ, ගොඩනැගිලි හේතුවෙන් අවහිර වී ඇති අඛණ්ඩව නොදිවෙන ද්විතීක වැලිගල් පරය | මධ්‍යස්ථ මට්ටමේ දඹ ඛාදනය, අහංගම නගරය ආශ්‍රිත ඉහළ මට්ටමේ වෙරළ ඛාදනය |
| හබරාදූව - කොග්ගල | කොග්ගල වෙරළ ආශ්‍රිත ද්විතීක වැලි ගල් පරය, ධීවර කටයුතු බහුලව සිදුවේ. | ඉහළ මට්ටමේ ඛාදනය |
| දලවැල්ල - උණවටුන | ආරක්ෂා කර ඇති වෙරළ තීරයකි. බහුල වශයෙන් කබොක් දඹ පවතී.උණවටුන බොක්ක තුළ ඍතුමය වෙරළ වෙනස්වීම් | ඉහළ මට්ටමේ ඛාදනය, මුහුදු රළ ගොඩට ඒම, ස්ථායී උණවටුන බොක්ක |
| දෙවට | වෙරළ තීරුවට මායිම්ව අධික තදබදයක් සහිත වෙරළාශ්‍රිත ගොඩනැගිලි, පටු වෙරළ, දෙවට බොක්කට දකුණු දිශාවෙන් කබොක් දඹ පිහිටීම. | මධ්‍යස්ථ මට්ටමේ ඛාදනය |
| ගින්තොට -බූස්ස රත්ගම | වෙරළ ව්‍යුහ මගින් බහුතර ප්‍රදේශයක් ආරක්ෂා කර තිබේ. තදබදයක් සහිත පටු වෙරළ | මධ්‍යස්ථ මට්ටමේ ඛාදනය, මුහුදු රළ ගොඩට ඒම |
| හික්කඩුව, දොඩන්දූව | වෙරළ තීරුවට මායිම්ව අධික තදබදයක් සහිත වෙරළාශ්‍රිත ගොඩනැගිලි සහ වෙරළ ව්‍යුහ, ඍතුමය ඛාදනයක් සහිත වැලි වෙරළ | ඉහළ මට්ටමේ ඍතුමය ඛාදනය |

| *ඛාදන ස්ථානය/ වෙරළබඩ තීරය* | *වෙරළෙ හි තත්ත්වය* | *හඳුනාගත් ගැටලුව* |
|---|---|---|
| **පුත්තලම දිස්ත්‍රික්කය** | | |
| කහව | ප්‍රධාන මාර්ගයට යාබද ආරක්ෂා කර ඇති වැලි වෙරළ | මුහුදු රළ ගොඩට ඒම |
| | | |
| **මාතර දිස්ත්‍රික්කය** | | |
| කප්පරතොට<br>කලුකන්ද (Devil Face) | කබොක් දඹ සහිත වැලි රහිත වෙරළ තීරය | ඉහළ මට්ටමේ දඹ ඛාදනයක් සිදු වී ඇත. |
| මිරිස්ස | වැලි සහිත බොකු වෙරළ, ගිරාගල දූපත සහ මිරිස්ස බොක්කට ගිනිකොණ දෙසින් කබොක් දඹ පිහිටා ඇත. ධීවර කටයුතු බහුලව සිදු කෙරේ. | මධ්‍යස්ථ මට්ටමේ සෘතුමය වෙරළ ඛාදනය<br>ගිරිගල දූපත සහ බොක්කෙහි දකුණු පස ඉහළ මට්ටමේ දඹ ඛාදනය |
| කඹුරුගමුව | අඛණ්ඩව නොදිවෙන ද්විතීක කොරල් පර සහිත පටු වැලි වෙරළ, සංචාරක කටයුතු බහුලව සිදු කෙරේ. | මධ්‍යස්ථ මට්ටමේ සෘතුමය වෙරළ ඛාදනය |
| | | |
| මැඩිහ | අර්ධ වශයෙන් ආරක්ෂා කරන ලද වෙරළ සහ පටු වැලි වෙරළ තීරය, ද්විතීක වැලි ගල/ කොරල් පරය, සංචාරක කටයුතු බහුලව සිදු කෙරේ. | පහළ මට්ටමේ ඛාදනය, මුහුදු රළ ගොඩට ඒම. ඒකීය සංසිද්ධියකි. |
| කොටුවේගොඩ | පසු වාරකන් සමයෙන් පසුව ඇතිවන වැලි සහිත වෙරළ, ආරක්ෂා කරන ලද වෙරළ | පහළ මට්ටමේ ඛාදනය, ඒකීය සංසිද්ධියකි. |
| තලල්ල | වැලි සහිත බොකු වෙරළ | පහළ මට්ටමේ සෘතුමය වෙරළ ඛාදනය, බොහෝ දුරට ස්ථායි මට්ටමක පවතී. |
| දික්වැල්ල, බෙලිවත්ත | වැලි සහිත බොකු වෙරළ | පහළ මට්ටමේ සෘතුමය වෙරළ ඛාදනය, බොහෝ දුරට ස්ථායි මට්ටමක පවතී. |
| මැඩිල්ල | වෙරළ තීරය ඔස්සේ මාර්ග සහ යටිතල පහසුකම් සහිත, වැලි සහිත බොකු වෙරළ | ඉහළ මට්ටමේ ඛාදනය සහ ඉහළ මට්ටමකින් ශුද්ධ අවසාදිත හානිය |
| **හම්බන්තොට දිස්ත්‍රික්කය** | | |
| කලමැටිය ගුරුකන්ද | වැලි සහිත පුළුල් බොකු වෙරළ | මධ්‍යස්ථ මට්ටමේ ඛාදනය |
| | | |
| පල්ලිකුඩා | අර්ධ වශයෙන් ආරක්ෂා කරන ලද වැලි සහිත පුළුල් වෙරළ | මධ්‍යස්ථ මට්ටමේ ඛාදනය |

| *ඛාදන ස්ථානය/ වෙරළබඩ තීරය* | *වෙරළෙ හි තත්ත්වය* | *හඳුනාගත් ගැටලුව* |
|---|---|---|
| පුත්තලම දිස්ත්‍රික්කය | | |
| | | |
| මාවැල්ල | ධීවර නැංගුරම් තොටුපොළක් සහිත වැලි සහිත බොකු වෙරළ | ඉහළ මට්ටමේ ඛාදනය වෙරළ තීරයේ සැකැස්ම නැවත වෙනස්වී තිබේ. |
| අම්පාර දිස්ත්‍රික්කය | | |
| නින්දවූර් සිට සයින්දමරුදු දක්වා | සෘජු වෙරළ | ඉහළ මට්ටමේ වෙරළ ඛාදනය, පුළුල් වෙරළ තීරයක් ප්‍රබල වශයෙන් අහිමි වී තිබේ. |
| | | |
| අට්ටපලම් | වැලි සහිත සෘජු වෙරළ | ඉහළ මට්ටමේ ඛාදනය හා ලවණ ජලය ගොඩබිම වෙත ගලා යෑමෙන් වී වගා බිම් වෙත බලපා තිබේ. |
| ඔලුවිල් | ඔලුවිල් වරාය ඉදිකිරීමෙන් පසු දකුණු පෙදෙසෙ හි වැලි එකතු වීම, ධීවර කර්මාන්තය සහ නේවාසික බහුල | වරායෙන් උතුරු දෙසට ඉහළ මට්ටමේ වෙරළ ඛාදනය |
| තිරුක්කෝවිල් | වැලි සහිත සෘජු වෙරළ, පොල් වගාව සහ නේවාසික භාවිතය | ඉහළ මට්ටමේ ඛාදනය, කි.මී.8ක් දුරට මීටර් 15ක වෙරළක් සහ මීටර් 5ක ගොඩබිම ඛාදනය |
| විස්කි තුඩුව - කෝමාරි | වැලි වෙරළ | සෘතුමය ඛාදනය |
| අරුගම්බේ | වැලි වෙරළ, සංචාරක සහ ධීවර කටයුතු බහුල, වෙරළ තීරය ගොඩනැගිලි හේතුවෙන් තදබදයට ලක්ව ඇත. | සෘතුමය විචල්‍යතාවයක් සහිත අතර පහළ මට්ටමේ ඛාදනය |
| මඩකලපුව දිස්ත්‍රික්කය | | |
| කාත්තන්කුඩි | වැලි වෙරළ, ධීවර කටයුතු බහුල | මීටර 10 ක පළල වෙරළක් හානි වී ඇත. සෘතුමය විචල්‍යතාවයක් පවතින අතර පහළ මට්ටමේ ඛාදනය |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය | | |
| මුතූර් | වැලි වෙරළ | ඒකීය සංසිද්ධියකි, පහළ මට්ටමේ ඛාදනය |
| රල්කුලි - කින්යා (උප්පාරු) | වැලි වෙරළ | පහළ මට්ටමේ ඛාදනය |
| මන්නාරම් දිස්ත්‍රික්කය | | |
| අරිප්පු | සිහින් වැලි සහිත වෙරළ | මධ්‍යම මට්ටමේ ඛාදනය |
| යාපනය දිස්ත්‍රික්කය | | |

| *ඛාදන ස්ථානය/ වෙරළබඩ තීරය* | *වෙරළෙ හි තත්ත්වය* | *හඳුනාගත් ගැටලුව* |
|---|---|---|
| *පුත්තලම දිස්ත්‍රික්කය* | | |
| මණ්ඩතිවු | පටු වෙරළ, ධීවර කටයුතු බහුල | ඒකීය සංසිද්ධියකි, පහළ මට්ටමේ ඛාදනය, වෙරළ තීරයේ සැකැස්ම නැවත වෙනස්වී තිබේ |

*මූලාශ්‍රය: වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තා 2014-2022*

රළු මුහුද තත්ත්ව යටතේ දී රළ මගින් වෙරළ වෙත අවසාදිත ගෙන එනු ලබයි. බොහෝවිට මෙලෙස ප්‍රවාහනය වන අවසාදිත වලින් වැඩි කොටසක් නොගැඹුරු මුහුදු කලාපයේ තැන්පත්වන අතර මුහුද රළු නොවන කාලයේ දී රළ මගින් එම අවසාදිත නැවත වෙරළ වෙත ගෙන එනු ලැබේ. එබැවින්, මුහුද රළු කාලයේ වෙරළ ඛාදනයත් රළු නොවන කාලයේ වෙරළ තීරය වැඩිවීමත් ඍතුමය ලෙස සිදුවන අතර එය වෙරළේ ස්වාභාවික හැසිරීම ලෙස සැලකිය හැකිය.

ඉහත සංසිද්ධි අනුව හා විවිධ මානව ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන්, ස්වාභාවික ඛාදනය - වර්ධනය වීමේ හැසිරීම සඳහා ඉඩ සැලසීම සඳහා පවතිනුයේ සීමිත වෙරළ ප්‍රදේශයක් බැවින් වෙරළ ඛාදනයට සාර්ථකව මුහුණදීම සඳහා සහ වෙරළබඩ භූමිය සහ දේපළ ආරක්ෂා කිරීම සඳහා සාපේක්ෂ වශයෙන් වඩාත් වේගවත් විසඳුම වනුයේ දෘඪ වෙරළ ව්‍යුහයන් වේ. එසේ වුව ද, ඇතැම් අවස්ථාවන්හි දී, එවැනි වෙරළබඩ ව්‍යුහ හේතුවෙන් වෙරළ ඛාදනය ඊට ආසන්න වෙරළ තීරවලට බලපෑමක් සිදුකළ හැකි ය.

### 2.1.2 අතීත කළමනාකරණ ක්‍රියාකාරකම් හා මුල් කාලීන ප්‍රයත්නයන්ගේ ඵලදායිතාවය

වෙරළ ඛාදනය පාලනය කිරීම සඳහා 1970 වකවානුවට පෙර කාලසීමාවේ දියත් කරන ප්‍රයත්නයන් ඒ ඒ අවස්ථානුකූලව සිදුකළ කටයුතු නිසාවෙන් තාවකාලික විසඳුම් වශයෙන් හඳුනාගත හැකි ය. මානව ක්‍රියාකාරකම්, විශේෂයෙන් සම්පත් නිස්සාරණය කරගැනීමේ පරිචයන් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන වෙරළ ඛාදනය අතර සම්බන්ධතාවය හඳුනාගෙන නොතිබුණි. එම අවස්ථාවේ දී, ඉංජිනේරු විසඳුම්වලින් ප්‍රධාන වශයෙන් අවධානය යොමුකරන ලද්දේ වෙරළ ඛාදනය වැළැක්වීම සඳහා වන "Hold the Line Approach"මූලධර්මය කෙරෙහි වේ. මීට හේතු වූයේ යම් නිශ්චිත වෙරළ තීරයක් නාගරීකරණය වීම හේතුවෙන් ඒ ආශ්‍රිතව උද්ගතවන වෙරළ තීරයේ නම්‍යතාවය නැතිවී යාම යි. මෙම ක්‍රියාවලිය තුළ දී, වෙරළ ඛණ්ඩයේ සමස්ත තත්ත්වය හා ගතික ස්වභාවය මෙන්ම සිදුවන මානව ක්‍රියාකාරකම් අවධානයට ගෙන නොමැත. වෙරළ කලාපය තුළ සැලසුම් ගත යටිතල පහසුකම් සංවර්ධනයක් නොමැති වීම හේතුවෙන් මෝසම් කාල සීමාව තුළ වෙරළ ඛාදන සිද්ධි හේතුවෙන් වෙරළබඩ ප්‍රජාවගේ සමාජ හා ආර්ථික සුභ සිද්ධියට බාධා ඇති කරමින් මෙම යටිතල පහසුකම් මත ඍණාත්මක බලපෑමක් ඇති කරයි. එබැවින්, මුල් කාලීන වෙරළ සංරක්ෂණ ප්‍රයතයන්ගේ සඵලතාවය වර්ගීකරණය කළ හැක්කේ අඩු මට්ටමක් වශයෙන්වන අතර, වක්‍ර බලපෑම් මධ්‍යම ප්‍රමාණයේ මට්ටමකට පවත්වාගෙන තිබේ.

### 2.1.3 1980 දශකයේ මුල් භාගය තුළ සිදුකළ ප්‍රයත්නයන්

1978 වර්ෂයේ දී ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ වෙරළ සංරක්ෂණ අංශය ආරම්භ කිරීමත් සමග සැලසුම්ගත වෙරළ ආරක්ෂණ යෝජනා ක්‍රම ආරම්භ විය. ඉන්පසුව, ඉටුකිරීමට පැවරී ඇති කාර්යයයේ වැදගත්කම හා විශාලත්වය හඳුනා ගැනීමෙන් අනතුරුව රජයේ දෙපාර්තමේන්තුවක මට්ටමට මෙම අංශය 1984 ජනවාරි මාසයේ දී වැඩි දියුණු කරන ලදී. මෙම කාල සීමාව තුළ ක්‍රියාවට නංවන ලද සැලසුම් කළ වෙරළ ආරක්ෂණ කටයුතු බොහෝ දුරට පැති බැම්, පනාබැම් සහ ගේබියන් බැම් ආදියට සීමා විය. මීට අමතරව වෙරළ කලාපයේ හිරිගල් සහ වැලි හැරීම වැනි සම්පත් ඉවත් කරගැනීමේ කාර්යයන් පාලනය කිරීම සඳහා අනෙකුත් කළමනාකරණ පියවර ක්‍රියාත්මක කරන ලදී. එවැනි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලද වෙරළ ආරක්ෂණ පියවරවල ඵලදායිතාවය 1970 කාල වකවානුවට පෙර ක්‍රියාත්මක කරන ලද වෙරළ ආරක්ෂණ කටයුතුවලට වඩා ඉහළ මට්ටමක පැවතිණි. එසේ වුවද, වෙරළ ඛාදනය අවම කිරීම සඳහා යොදාගන්නා ලද දෘඪ වෙරළ ආරක්ෂණ පියවරවල ප්‍රතිඵලයක් ලෙස වෙරළේ සොබා දසුන් හා ඇතැම් විනෝදාත්මක කටයුතු මෙන්ම සිරස් හා පාර්ශ්වික මහජන ප්‍රවේශයන් සඳහා අවහිරතා ඇති විය.

**2.1.4 වෙරළ ඛාදන කළමනාකරණය සඳහා වන ප්‍රධාන සැලැස්ම (MPCEM) යටතේ ප්‍රයත්නයන්**

DANIDA විසින් ලබාදෙන ලද තාක්ෂණික ආධාර යටතේ දිගු කාලීන ප්‍රශස්ත පියවර සමගින් වෙරළ ඛාදන කළමනාකරණය සඳහා වන ප්‍රධාන සැලැස්ම 1986 අගෝස්තු මාසයේ දී සම්පාදනය කිරීමත් සමග වෙරළ ඛාදන කළමනාකරණය සඳහා යොදාගන්නා ලද සමස්ත ප්‍රවේශය වඩාත් ඵලදායී මාවතකට හැරිණි. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ ඩෙන්මාර්කයේ Danish Hydraulic Institute නැමති ආයතන දෙකෙහිම විශේෂඥවරුන්ගෙන් සමන්විත කණ්ඩායමක් විසින් සිදුකරන ලද සවිස්තරාත්මක තාක්ෂණික, පාරිසරික, ආර්ථික හා සමාජීය විශ්ලේෂණයක ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ වෙරළ ඛාදන ගැටලුව සීමිත තොරතුරු පැවතීම යන බාධකය තුළ පැහැදිලි කරන ලද අතර එම ප්‍රධාන සැලැස්ම ඔස්සේ වෙරළ ඛාදනය අවම කිරීම සඳහා වන ප්‍රශස්ත වශයෙන් සිදුකළ හැකි විභව්‍ය තාක්ෂණික ප්‍රවේශය නිර්දේශ කිරීම හා එවැනි ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය ප්‍රාග්ධන ආයෝජනය ද විස්තර කර තිබේ. 1986 වර්ෂයේ සිට වෙරළ ඛාදන කළමනාකරණය සඳහා වන ප්‍රධාන සැලැස්ම මූලික වශයෙන් පාදක කරගනිමින් DANIDA 1 වැනි අදියර (1987-1989), DANIDA 2වැනි අදියර (1990-1992), GTZ - German Technical Cooperation (1988-1996), සහ ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයන ලද වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම (2000-2007) ඔස්සේ වෙරළ ඛාදන කළමනාකරණ පියවර ක්‍රියාත්මක කරන ලදී. ප්‍රධාන ප්‍රදේශ සමග වෙරළ ඛණ්ඩ සහ වැලි පෝෂණය,පැති බැම් හා පනාබැම් සමග අක් වෙරළ දිය කඩන වැනි ව්‍යුහාත්මක විසඳුම්වලින් සමන්විත තනි සිද්ධි මත පාදකව වෙරළ ඛාදන කළමනාකරණය සඳහා වන ප්‍රධාන සැලැස්ම යටතේ වූ වෙරළ ආරක්ෂණ පියවර විශේෂයෙන් සම්පාදනය කිරීම හා වර්ගීකරණය සිදුවිය. වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය සහ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික අයවැය ප්‍රතිපාදන හරහා ද වෙරළ ආරක්ෂණ පියවර දියත් කරන ලදී. හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, කොළඹ දිස්ත්‍රික්ක හා ඉන් උතුරට පුත්තලම දක්වා ක්‍රියාත්මක කරන ලද ව්‍යුහමය සංරචක (දෘඪ විසඳුම්) මීට ඇතුළත් වේ.

මීට අමතරව, වෙරළබඩ සංවර්ධනයේ දී ඉදිකිරීම් හා වෙරළ සීමාව අතර තබාගත යුතු අවම ඉඩ පරතරය (පස සිටු සීමාව) සම්බන්ධිත ප්‍රමිතීන් උපයෝගී කරගැනීම, වැලි හා කොරල්පර කැණීම අවම කිරීම සඳහා නියාමන පියවර බලාත්මක කිරීම සහ මහජනතාව සම්බන්ධයෙන් අධ්‍යාපනය හා දැනුවත්බව වැඩි කිරීම වැනි අනෙකුත් කළමනාකරණ විසඳුම් ද ක්‍රියාත්මක කරන ලදී. වෙරළ ඛාදන කළමනාකරණය සඳහා වන ප්‍රධාන සැලැස්ම යටතේ දියත් කරන ලද සැලසුම් කළ වෙරළ ආරක්ෂණ කටයුතුවල ඵලදායිතාවය හා ප්‍රතිඵල ඔස්සේ මධ්‍යස්ථ මට්ටමක වක්‍ර ප්‍රතිඵල ද සමගින් ඉහළ මට්ටමක සාර්ථකත්වයක් පිළිබිඹු විය.

මේ වන තුරු ප්‍රමාණාත්මක වශයෙන් ගණනය කර නොමැති වුව ද, යථෝක්තව සඳහන් කළ පියවර ඔස්සේ සැලකිය යුතු මට්ටමක සමාජ, පාරිසරික හා ආර්ථික වාසි ලැබී ඇති බව පෙනී යයි. අතීතයේ දී ක්‍රියාත්මක කරන ලද වෙරළ ආරක්ෂණ පියවර මගින් ලබාගත් ප්‍රතිලාභ ප්‍රධාන වශයෙන් දැකිය හැකි වනුයේ ආරක්ෂා කරන ලද මහා මාර්ග හා දුම්රිය මාර්ග, පොදු හා පුද්ගලික වාසස්ථාන, ධීවර යටිතල පහසුකම්, සංචාරක හා විනෝදාස්වාද පහසුකම් තුළිනි. මීට අමතරව, වෙරළ ඛාදන කළමනාකරණය සඳහා වන ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව වෙරළ ආරක්ෂණ කටයුතු සඳහා පුද්ගලික ආයෝජනවල අවශ්‍යතාවය ද ප්‍රබල වශයෙන් අඩුවී තිබේ.

**2.1.5 වෙරළ පෝෂණ ව්‍යාපෘති**

වෙරළ පෝෂණය වනාහි වෙරළ තීරයට සමාන්තරව හෝ ආනතියකින් දිවෙන රැළි හේතුවෙන් හෝ ඛාදනය හේතුවෙන් ගසාගෙන යන අවසාදිත, එනම් සාමාන්‍යයෙන් වශයෙන් වැලි, වෙනත් වැලි ප්‍රභවයකින් ප්‍රතිස්ථාපනය කිරීමේ ක්‍රියාවලියකි. මෙම වෙරළ පෝෂණ ව්‍යාපෘති සාපේක්ෂ වශයෙන් මිල අධික වන නමුදු එහි පරිසර බලපෑම පහළ මට්ටමක පවතින අතර, ශ්‍රී ලංකාව විසින් මෙම ක්‍රමවේදය 1980 කාල වකවානුවේ සිට යොදාගනු ලැබේ. පළමු වෙරළ පෝෂණ ව්‍යාපෘතිය, ඩෙන්මාර්ක් අරමුදල් යටතේ (DANIDA ව්‍යාපෘතිය) 1988 වර්ෂයේ දී මීගමුවේ දී ක්‍රියාත්මක කරන ලදී. ඉන් අනතුරුව, වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය මගින් 2002 සිට 2007 දක්වා කාලසීමාව තුළ මහඔය ලන්සිගම, කාකදූපත, මොරටුව, වාද්දුව සහ පයාගල යන ප්‍රදේශවල වෙරළ පෝෂණ ව්‍යාපෘති පහක් ක්‍රියාත්මක කරන ලදී. එම විදේශ අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවලින් පසුව, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2012 සිට 2020 දක්වා කාලසීමාව තුළ වෙරළ පෝෂණ ව්‍යාපෘති පහක් දියත් කර තිබේ. වෙරළ පෝෂණ ව්‍යාපෘතිවල සමස්ත පිරිවැය රු.මිලියන 3,084කි. මෙම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද වැලි පෝෂණ ව්‍යාපෘතිවල විස්තර පහත දක්වා තිබේ (වගුව 2.2).

**වගුව 2- 2 2012 -2020 කාල සීමාව තුළ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් දියත් කළ වැලි පෝෂණ ව්‍යාපෘතිය**

| *වර්ෂය* | *වෙරළ තීරය* | *වැලි පෝෂණ කාර්යය වෙනුවෙන් යොදාගත් වැලි ප්‍රමාණය ($m^3$)* |
|---|---|---|
| 2012 | උස්වැටකෙයියාව | 300,000 |
| 2015 | උණවටුන | 200,000 |
| 2016 | මාරවිල 1 වැනි අදියර | 400,000 |
| 2017 | මාරවිල 2 වැනි අදියර | 400,000 |
| 2020 | කළුතර | 300,000 |
| | අඟුලාන | 350,000 |
| | ගල්කිස්ස | 150,000 |

වෙරළ ස්ථායි කිරීම, වෙරළ ඛාදනය අවම කිරීම හා සංචාරක, ධීවර හා යටිතල පහසුකම් සඳහා වෙරළ නිර්මාණය කිරීම උදෙසා ඉහත ව්‍යාපෘති සාර්ථකව නිමා කරන ලදී. ආරක්ෂා කිරීමේ කටයුතු සඳහා වසරකට දැරිය යුතු පිරිවැය පදනමින් සැලකූ විට සාපේක්ෂ වශයෙන් ඉහළ පිරිවැයක් පැවතිය ද, වෙරළ භාවිතා කරන බොහෝ පිරිස් විසින් වෙරළ පෝෂණය ඉහළ මට්ටමකින් අගය කරනු ලැබේ.

## 2.2 ගැටලු, තර්ජන හා අභියෝග

### 2.2.1 වෙරළ ඛාදනය සඳහා දායකවන ස්වාභාවික ක්‍රියාවලි සහ සිද්ධි

වෙරළ තීරයේ බොහෝ කොටස් එහි අඛණ්ඩව සිදුවන ඛාදනය සහ නිධිසාධනයට බඳුන් වේ. ඇතැම් වෙනස්වීම් ඍතුමය වශයෙන් සිදුවන අතර අනෙකුත් සිදුවීම් වඩාත් ස්ථිර ආකාරයෙන් සිදුවේ. වෙරළ ඛාදනය සඳහා දායක වන ස්වාභාවික ක්‍රියාවලි පහත ආකාරයෙන් වේ;

- ඇතැම් ගංගාවලින් වෙරළට සැපයෙන වැලි ප්‍රමාණයේ ස්වාභාවික විචලනයන්
- කුඩා වැලි වැටි කඩා වැටීම සහ සේදී යෑම හේතුවෙන් වැලි නැතිවී යෑම
- දැඩි රළ හා උදම් තත්ත්වයන් තුළ වෙරළින් ඔබ්බට මුහුදෙහි වැලි නැතිවී යෑම
- ගැඹුරු දොරු පැවතීම හේතුවෙන් වැලි නැතිවී යෑම
- වැලි තුඩු හා වැලි වැටිවල වැලි තැන්පත් වීම
- වෙරළබඩ ශාක විනාශ වීම
- සුනාමි, වාසුළි හා අනෙකුත් වරින්වර සිදුවිය හැකි සිද්ධීන්
- කේන්ද්‍රික ප්‍රදේශවලින් අවසාධිත නැතිවී යෑම
- මුහුදු මට්ටම ඉහළ යෑම

අනෙකුත් සාධක අතුරින් වෙරළාසන්න අවසාදිත සම්බන්ධයෙන් සැලකූ විට ශ්‍රී ලංකාවේ වෙරළ ඛාදනයට දායක වන වඩාත් වැදගත් සාධකය වනුයේ වෙරළ වෙත ලැබෙන හා ඉන් ඉවත්වන අවසාදිත ප්‍රමාණයේ අසමතුලිතතාවයයි. මෙම වෙරළාසන්න ප්‍රවාහය ජනනය වනුයේ ප්‍රධාන වශයෙන්ම වෙරළාසන්න අවසාදිත මත ක්‍රියාත්මක වන මෝසම් සුළං මගින් ඇති කරන කෙටි සුළං තරංග හා දිගු සුළං තරංග හේතුවෙනි. එබැවින්, රැලි, දියවැල් හා සුළං යන සාධකවල හැසිරීම ඔස්සේ සිදුවන වෙරළ ඛාදනය මගින් ඇතැම් ස්ථානවල අවසාදිත නැතිවී යෑමක් සිදු වේ. වෙරළ තීරයට සමාන්තරව සිදුවන ප්‍රවාහ ධාරිතාවය හේතුවෙන් වෙරළ වෙත අවසාදිත සැපයුම හා වෙරළ වෙතින් වැලි නැතිවී යෑම අතර සැලකිය යුතු විචලනයක් පවතී. නිරිතදිග වෙරළ තීරයේ සිදුවන ඛාදනය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වනුයේ වෙරළ වෙත ගංගාවලින් ලැබෙන වැලි සැපයුමට වඩා වෙරළාසන්නයෙන් වැලි ඉවතට යෑමේ ඉහළ ධාරිතාවයයි. මහ ඔයට උතුරින් පිහිටි වෙරළ තීරයෙන් වාර්තා වන ඛාදනය වඩාත් සංකීර්ණ කරවීමට හේතු වනුයේ වෙරළ තීරය ඍජුව පැවතීම සහ එය වඩාත් දරුණු වනුයේ මහ ඔය ආශ්‍රිතව වැලි ගොඩ දැමීම හා අනෙකුත් මානව ක්‍රියාකාරකම්වල බලපෑම හේතුවෙන් වෙරළාසන්න අවසාදිතවල පවතින ඉහළ මට්ටමක ඌනතාවයයි. දැනට පවතින තොරතුරු අනුව, දකුණු වෙරළ ඔස්සේ ද වැලි සැපයුම පහළ මට්ටමක පවතින නමුදු, වෙරළබඩ තීරය සාපේක්ෂ වශයෙන් ස්ථාවර මට්ටමක පවතී. මීට හේතු වනුයේ යම් ආවරණ බලපෑමක් ඇති කරන බොකු හා තුඩු යන ලක්ෂණය වේ. වර්තමානයේ දී මානව මැදිහත්වීම් වෙරළ තීරය අස්ථාවර කිරීමට හේතුවන අතර වෙරළ තීරයේ හැඩය වෙනස්කිරීමට ද හේතු වේ.

හරිතාගාර වායු විමෝචන මට්ටම ඉහළ යෑම හේතුවෙන් ග්‍රීන්ලන්තයේ හා ඇන්ටාක්ටිකාවේ අයිස් තට්ටු දියවීම යන කරුණු මත පදනම් වූ දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලයේ (IPCC) වසර මැද ඇස්තමේන්තුවලට අනුව 21 වැනි ශත වර්ෂයේ දී ගෝලීය මුහුදු මට්ටම සෙ.මී. 30-40 අතර ප්‍රමාණයකින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. එබැවින්, මුහුද මට්ටම ඉහළ යෑම හේතුවෙන් වෙරළ ඛාදනයේ විභව්‍ය ඉහළ යෑම නොසලකා හැරිය හැකි කරුණක් නොවේ. එසේ වුව ද, ගංගා මුවදොර, කලපු මුහුදු තුඩු ආසන්නයේ වෙරළ තීරයන් සැලකූ විට, එහි ඛාදන මට්ටම ප්‍රමාණාත්මක වශයෙන් ගණනය කිරීම වඩාත් සංකීර්ණ වේ. අධික වර්ෂාවෙන් යටවීම, දෝණි පිරීමේ බලපෑම් හා ලවණ ජලය ඇතුළුවීමේ බලපෑම වැනි අනෙකුත් සාධක මෙම ස්ථාන කෙරෙහි බලපානු ලැබේ. දේශගුණික විපර්යාස සහ මුහුදු මට්ටම ඉහළ යෑම හේතුවෙන් අනාගතයේ දී ජල ස්කන්ධ මත බලපෑම් වඩාත් තීව්‍ර වනු ඇත.

ස්වාභාවික වෙරළ ඛාදනය සඳහා බලපාන සාධක අතුරින් එකක් වනුයේ වෙරළ තීරයේ ශුද්ධ ප්‍රවාහන දිශාව වෙත සිදුවන අවසාදිත ප්‍රවාහන ශීඝ්‍රතාවය වැඩි වීම යි. ඇතැම් ස්ථානවලදී රළ තත්ත්වයේ වෙනස්වීම්, වෙනස් හැඩයන්ගෙන් යුතු වෙරළ තීරය, හෝ සුවිශේෂී ආගාධමිතික තත්ත්ව මීට හේතුවිය හැකි ය. ගොඩබිම මත විවර වීම් මගින් වැලි සේදී යාම, ඛාධක දූපත් ප්‍රමාණය ඉක්මවා සේදී යාම, දැඩි රළ හා කුණාටු තත්ත්වයන් යටතේ වෙරළට ඔබ්බෙන් මුහුද වෙත සුළං මගින් සිදුවන වැලි ප්‍රවාහන හානි ද සිදුවිය හැකි ය. උස් රළ මගින් වැලි වැටි මුහුද දෙසට තල්ලු වීම මෙන්ම ඉහළ රළ ඉපිලුම් තත්ත්වයක් යටතේ පැතිකඩෙහි ඇතිවන අසමතුලිතතාවයක් හේතුවෙන් වැලි වෙරළට ඔබ්බෙන් මුහුද වෙත ඇදී යාමක් සිදු වේ.

සේදී යන වැලි ගොඩගැසෙන වෙරළක් ඇති වනුයේ වැලි තුඩුවක මුදුනේ වන අතර වෙරළාශ්‍රිත ප්‍රදේශවලදී වැලි තුඩුවක සුළං මුවාව පැත්තෙන් බැහැරවන වැලි ගැඹුරු මුහුද දෙසට ඇදී යයි. මෙම ආකාරයෙන් වැලි බැහැරවීම මගින් වැලි ගොඩ ගැසෙන වෙරළ තීර සහ අවසාදන ප්‍රදේශවලදී දියයට වැලිපර ඇතිවීමත් සිදුවන නමුදු වෙරළබඩ ඉහළ ප්‍රදේශයන්හි වැලි හිඟයක් ඇති වේ.

ස්වාභාවික වෙරළ ඛාදනය සඳහා තවත් හේතුවක් වනුයේ මුහුදු රළ ආනත ප්‍රවේශයකින් වෙරළ තීරය වෙත ළඟා වීම යි. එවැනි වෙරළ තීරයන්හි, වෙරළ තීරයට සමාන්තරව වැලිතුඩු ස්වාභාවිකව නිර්මාණය වීමේ ප්‍රවණතාවයක් පවතී. මෙවැනි ස්ථානයන්හි වැලි රැස්වන අතර එසේ රැස්වන වැලි වෙරළට ඔබ්බෙන් මුහුද වෙත ගලා යාමක් සිදු වේ. එවැනි අවස්ථාවන්හිදී වෙරළ තීරයේ පහළ කොටස සඳහා වැලි සැපයුම හීන වීමෙන් පහළ කොටසේ ඇති වැලි වෙරළාසන්නයට ගසාගෙන යෑමක් සිදුවේ.

### 2.2.2 වෙරළ ආරක්ෂණ කටයුතු හා වෙරළ ඛාදනය කෙරෙහි 2004 වර්ෂයේ සිදු වූ සුනාමි ව්‍යසනයේ බලපෑම

2004 වසරේ දෙසැම්බර් මස 26 වන දින ඉන්දුනීසියාවේ භූ කම්පනය සිදුවී ඉන් පැය දෙකකට පසුව ආසියානු සුනාමිය උස් රළ පහරක් ලෙස ශ්‍රී ලංකා වෙරළ කලාපය මතට පතිත විය. මීටර් 1 සිට මීටර් 15 උසින් යුත් රළ පහර එකේ සිට තුන දක්වා ප්‍රමාණයක් එක් එක් ස්ථාන අනුව වාර්තා වී ඇත. අම්පාර දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර් වෙරළේ දී මීටර් 15 ක වැඩිම උසින් වූ රළ වාර්තා වූ අතර, කුරුකියුලාමඩම් සහ හම්බන්තොට නගරයේ දී උසින් මීටර් 12ක් බැගින් වූ සුනාමි රළ පහරවල් වාර්තා විය. මීටර් 10 ක උසින් යුත් සුනාමි රළ මාන්කර්නි, පොතුවිල්, පුන්නෙයිකුඩා (මඩකලපුව දිස්ත්‍රික්කය), කිරින්ද සහ රතුපස් ගොඩනැගිල්ලෙන් වාර්තා වූ අතර, මීටර් 8 ක උසින් වූ රළ කහදමෝදරින් සහ පැරලියෙන් වාර්තා විණි. සුනාමි රළ ප්‍රථමයෙන් නැගෙනහිර වෙරළ තීරය වෙත අවතීර්ණ වී ඉන් අනතුරුව ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රදේශ වෙත ද ව්‍යාප්ත වූ අතර වෙරළබඩ පරිපාලන දිස්ත්‍රික්ක 14 න් 12 ක් වෙතම එහි බලපෑම් සිදුවිය. භූ ලක්ෂණ සහ වෙරළබඩ ආරක්ෂණය අනුව දිවයිනේ නිරිතදිග වෙරළ ප්‍රදේශය සුනාමි රළ හේතුවෙන් විවිධ මට්ටමින් මුහුදු ජලයෙන් යටවිය. මීටර් කිහිපයක සිට කිලෝ මීටර් 3.5 ක් දක්වා වශයෙන් සැලකිය යුතු විචලනයකින් යුක්තව රට අභ්‍යන්තරයට මුහුදු ජලය ගලායාමක් සිදු විණි. ඉහළතම මට්ටම එනම් කිලෝ මීටර් 2 ක් දක්වා මුහුදු ජලයෙන් යටවීම වාර්තා වූයේ මඩකලපුව සහ ත්‍රිකුණාමලයේ කුච්චවේලි ප්‍රදේශවලිනි. පැරලිය ප්‍රදේශයේ දී මෙලෙස රට අභ්‍යන්තරය වෙත කිලෝ මීටර 2 ක් දක්වා මුහුදු ජලයෙන් යට වූ බවට වාර්තා වී ඇත. දකුණු වෙරළ තීරයේ කලපුවල දී මෙලෙස ජලයෙන් යට වූ සීමාව කිලෝ මීටර් 3.5 කි (දෙසැම්බර් 26 වන දිනැතිව ශ්‍රී ලංකාවේ දී ඉන්දියන් සාගරයේ සුනාමිය පිළිබඳ සමීක්ෂණය, ජේම්ස් ගොෆ්, ජාත්‍යන්තර සුනාමි සමීක්ෂණ කණ්ඩායම TST).

වැලි වැටි, කොරල් පර හා වෙරළබඩ වෘක්ෂලතාදිය ඉවත් කිරීම වැනි මානව ක්‍රියාකාරිත්වය මගින් උත්ප්‍රේරණය වූ පාරිසරික හානි යම් මට්ටමකට පැවති ස්ථානයන්හි දී වෙරළ කලාපයේ සුනාමි බලපෑම ඉතා උග්‍ර වී ඇත. නිරිත දිග වෙරළ තීරයේ වෙරළ ආරක්ෂක ව්‍යුහයන් රාශියකට හානි සිදුවී, ඇතැම් වෙරළ තීරයන් හා වැලි තුඩු දැඩිලෙස ඛාදනය වී ඇති බවට සුනාමි ව්‍යසනයෙන් අනතුරුව වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය මගින් සිදුකළ හානි පිළිබඳ තක්සේරුවකට අනුව අනාවරණය විය.

### 2.2.3 වෙරළ ඛාදනය වේගවත් කරන මානව ක්‍රියාකාරකම්

ඉහළ යන වෙරළ ඛාදනය හා වෙරළ කලාපය තුළ හා ඉන් පිටත සිදුවන මානව ක්‍රියාකාරකම් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් පවතින බව ගෙවීගිය කාල සීමාව තුළ ශ්‍රී ලංකාව තුළ සිදුකරන ලද වෙරළාශ්‍රිත ඉංජිනේරු සමීක්ෂණ මගින් පැහැදිලිව අනාවරණය වී තිබේ. මුහුදු කොරල්පර කැණීම, වෙරළ හා ගංගාවලින් වැලි හැරීම සහ ජල මාර්ග හරහා වේලි ඉදිකිරීම හා වෙරළාශ්‍රිත ව්‍යුහයන් ඉදිකිරීම වැනි මානව ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සිදුකළ සමාජ-ආර්ථික සමීක්ෂණ හා අධ්‍යයන මගින් ද මෙය තවදුරටත් සහතික වී තිබේ. මානව ක්‍රියාකාරකම් හා වෙරළ ඛාදනයට දායකවන එම මානව ක්‍රියාකාරකම්හි බලපෑම පිළිබඳ සාරාංශයක් වගුව 2-3 මගින් ඉදිරිපත් කෙරේ.

වගුව 2- 3 ශ්‍රී ලංකාවේ වෙරළබඩ ස්ථායිතාවය කෙරෙහි බලපෑමක් සහිත මානව ක්‍රියාකාරකම්

| *ක්‍රියාකාරකම* | *වර්තමාන තත්ත්වය* | *ප්‍රතිඵලය* | *වෙරළ කෙරෙහි බලපෑම* | *බලපෑමට ලක්වී ඇති ස්ථානවලට නිදසුන* |
|---|---|---|---|---|
| වෙරළින් වැලි ගොඩදැමීම | මධ්‍යස්ථ | වෙරළාසන්න ක්‍රියාවලි සඳහා පවතින වෙරළ වැලි පරිමාව අඩුවීම | වෙරළ ඛාදනය ප්‍රේරණය වීම | පානදුර, අහංගම, හබරාදූව, ලුනාව, අඟුලාන, |
| ගංගාවලින් වැලි ගොඩ දැමීම | ඉහළ | ගංගා මගින් වෙරළ වෙත සැපයෙන වැලි ප්‍රමාණය අඩුවීම. ගංගා වෙත ලුණු මිශ්‍රිත ලවණ ජලය ඇතුළුවීම | වෙරළබඩ හා ගංඉවුරුවල ඛාදනය ඉහළ යෑම | කැළණි, නිල්වලා, මහ ඔය, කළු ගඟ, ගිං ගඟ |
| වෙරළින් හා වෙරළ ඉමෙන් කොරල්පර රැස්කිරීම | පහළ | වෙරළ ද්‍රව්‍යවල පරිමාව අඩුවීම, කොරල් නැවත ඇතිවීම සඳහා ද්‍රව්‍ය අඩුවීම සහ ස්වාභාවික කොරල්පර නිර්මාණය වීම පහළ යෑම | වෙරළ වෙත ගසාගෙන එන ද්‍රව්‍ය අඩුවීම, වෙරළ ඛාදනය ප්‍රේරණය වීම | රැකව, අහංගම, හබරාදූව, හික්කඩුව |
| කොරල්පර, හුණුගල් පර හා වැලිගල්පර හානි වීම | පහළ | ස්වාභාවික බාධක වෙත හානි සිදුවීම, එම කොරල්පර, හුණුගල් පර හා වැලිගල්පර අතර හිඩැස් ඇතිවීම | වෙරළ කරා එන රළෙහි ශක්තිය වැඩිවීම සහ වෙරළ ඛාදනය ඉහළ යෑම | සීනිගම, රැකව, උස්වැටකෙයියාව, පිටිපන |
| වෙරළට ඉතාමත් ආසන්නව හා වැලි වැටි මත ගොඩනැගිලි හා අනෙකුත් ව්‍යුහයන් ඉදිකිරීම | ඉහළ | වෙරළ ස්ථායිතාවය අඩුවීම | ගොඩනැගිලි හා ව්‍යුහයන් වෙත හානි සිදුවීම වෙරළ හා වැටි ඛාදනය වේගවත් වීම | දෙවට, පොල්හේන, උණවටුන, හික්කඩුව, උස්වැටකෙයියාව |
| වරාය ද්‍රෝණිය හා ප්‍රවේශ ඇළ මාර්ගවල නඩත්තු කටයුතු සඳහා පස්, මඩ ආදිය ගොඩදැමීම | ඉහළ | වෙරළබඩ ප්‍රදේශයෙන් වැලි ඉවත්වීම | ආසන්න වෙරළවල වෙරළ ඛාදනය ප්‍රේරණය වීම | කොළඹ වරාය, ධීවර වරාය හා නැංගුරම් |

| *ක්‍රියාකාරකම* | *වර්තමාන තත්ත්වය* | *ප්‍රතිඵලය* | *වෙරළ කෙරෙහි බලපෑම* | *බලපෑමට ලක්වී ඇති ස්ථානවලට නිදසුන* |
|---|---|---|---|---|
| වෙරළබඩ වෘක්ෂලතාදිය ඉවත්වීම හා හානිවීම | මධ්‍යස්ථ | වෙරළබඩ ස්ථායිතාවය අඩුවීම, සුළං හා රළ සඳහා නිරාවරණය වූ ප්‍රදේශ ඇතිවීම | වැලි වැටි හා වෙරළබඩ ඛාදනය ප්‍රේරණය වීම | අවසාදිත තැන්පත් වී ඇති සියලු වෙරළ තීරයන්ගේ ඛාදනය අපේක්ෂා කළ හැකි ය. |
| සැලසුම් නොකළ හෝ දුර්වල ආකාරයෙන් සැලසුම් කළ දෘඪ වෙරළබඩ ව්‍යුහයන් ඉදිකිරීම | ඉහළ | ආසන්න වෙරළබඩ ප්‍රදේශයේ වෙරළබඩ ස්ථායිතාවය අඩුවීම | වෙරළබඩ ඛාදනය ප්‍රේරණය වීම හෝ ආසන්න වෙරළ තීරය විවර්ධනය වීම | ගාල්ල, මාතර, පල්ලියවත්ත, මීගමුව, ඔලුවිල් වරාය |
| ගංගාවල ජල ප්‍රවාහ පාලනය කිරීමේ ව්‍යුහයන් ඉදිකිරීම | ඉහළ | වෙරළ වෙත අවසාදිත සැපයුම අඩුවීම | වෙරළ ඛාදනය | මහ ඔය, දැදුරු ඔය, නිල්වලා ගඟ |
| ගංමෝය හා කලපු මෝයවල වැලි බාධක කඩතොළුවීම | ඉහළ | මෝයවල හැඩය වෙනස් වීම | ආසන්න වෙරළවල උග්‍ර වෙරළ ඛාදනය | කළුතර, ගිංතොට |

*මූලාශ්‍රය : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව 2023*

යථෝක්තව ලැයිස්තුගත කර ඇති මානව ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල වෙරළ ඛාදනය සඳහා සුවිශේෂී වශයෙන් දායකවන නමුදු වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නංවා ඇති කළමනාකරණ පියවරයන්ගේ සඵලතාවය මත එකී බලපෑමේ ප්‍රමාණය වෙනස් වේ.

බොහෝ විට පනාබැම්, දියකඩන, සමුද්‍ර පවුරු, වෙරළ හා ගංගා මුවදොරවල ඉදිකරනු ලබන දියකඩන වරායන් සහ මෝය ජැටි වැනි දෘඪ වෙරළාරක්ෂක නිර්මාණ මගින් වෙරළබඩ ද්‍රව්‍ය ප්‍රවාහනයට බාධා පමුණුවන අතර වෙරළ ඛාදනයටද දායක වේ. මෙවැනි ව්‍යුහ පැවතීම මගින් සමූහයක් ඇතිවන අතර ඒවායින් සමහරක් වනුයේ,

- වෙරළබඩ ප්‍රවාහයෙන් සැපයෙන වැලි වෙරළ ආරක්ෂක ව්‍යුහයන්ගේ ඉහළ කොටසෙහි රඳවාගනු ලබන බැවින්, ආසන්න වෙරළ තීරය ඔස්සේ , විශේෂයෙන් සුළං මුවාව පැත්තෙහි වෙරළ ඛාදනය සිදු වේ.
- රළ පරාවර්තනය හා විවර්තන රටාවේ වන වෙනස්වීම්, සහ ඒ සමග රළවල ශක්තිය විසිරීමේ හා අවසාදිත ප්‍රවාහන රටාවල සිදුවන වෙනස්වීම්.
- දැනට පවතින වෙරළබඩ දියවැල් රටා සහ උදම් සංචලනයේ සිදුවිය හැකි වෙනස්වීම්.
- වෙරළට ඔබ්බෙන් මුහුදේ වැලි හිඟ වීම.
- ද්‍රෝණිවල, ඇතුල්වීමේ මාර්ග හා පිටත, වරායන්හි ඇතුළත සහ ආසන්න වෙරළේ වැලි තැන්පත්වීම.

**2.2.4 වෙරළබඩ ස්ථායිතාවයට අහිතකර බලපෑම් ඇතිකරන සංවර්ධන කටයුතු**

දෘඪ සමුද්‍රීය ව්‍යුහයන් හැරුනවිට, අනෙකුත් සංවර්ධන ක්‍රියාකාරකම්, එනම් වෙරළේ ඉදිරිපසට ඉතා ආසන්නව පිහිටා ඇති සංචාරක, වාණිජ හා වාසස්ථානවලට අදාළව පවතින ගොඩනැගිලි හා අනෙකුත් ඉදිකිරීම් මගින් වෙරළබඩ ක්‍රියාවලියට බාධා ඇතිකරන අතර වෙරළ ඛාදනය ද වේගවත් කරයි. මීට අමතරව, ගංගාවල ඉහළ කොටසේ ඉදිකරන වාරිමාර්ග යෝජනා ක්‍රම, දොරටු, වේලි හා වැව් මගින් ද වෙරළ වෙත ඇදී යන වැලි සැපයුම අඩු කරමින් වෙරළ ස්ථායිතාව කෙරෙහි සෘණාත්මකව බලපානු ලැබේ. අතීතයේ දී සංවර්ධන නියාමන යාන්ත්‍රණ හා පාරිසරික බලපෑම් තක්සේරු කාර්ය පටිපාටි නොමැතිවීම හේතුවෙන් මෙම තත්ත්වය වඩාත් පැහැදිලි වේ. ජාතික පාරිසරික පනත සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත ක්‍රියාත්මක කිරීමට පෙර වෙරළ ස්ථායිතාව අහිතකර බලපෑම් මගහැරවීම සඳහා එවැනි සංවර්ධන කටයුතු මෙහෙය වීමට නෛතික සහ ආයතනික යාන්ත්‍රණය නොවීය.

**ගංගාවලින් වැලි හැරීම**

ගංගා පද්ධතිවලින් වැලි ඉවත් කිරීම ඔස්සේ වෙරළට සැපයෙන අවසාදිත ප්‍රමාණය ඍජුවම අඩුවන බැවින් එය ශ්‍රී ලංකාවේ වෙරළ ඛාදනයට හේතුවන ප්‍රධාන කරුණක් වශයෙන් හඳුනාගෙන තිබේ. 1970 දශකයේ අග භාගයේ සිට ඉදිකිරීම් කර්මාන්තයේ සිදුවූ වර්ධනයට සමගාමීව ජාතික වැලි අවශ්‍යතාවය ද අඛණ්ඩව ඉහළ ගොස් ඇති අතර රටෙහි උතුරු හා නැගෙනහිර පැවති ගැටුම්කාරී තත්ත්වය 2009 වසරේ දී අවසන් වීමෙන් පසු ඇති වූ සංවර්ධනය නිසාවෙන් මෙම වැලි අවශ්‍යතාවය සුවිශේෂී මට්ටමකට ළඟාවිය. 2018 වර්ෂයේ දී සමස්ත රටේම වාර්ෂික වැලි අවශ්‍යතාවය ආසන්න වශයෙන් කියුබික් මීටර් මිලියන 21 ක් ලෙස ඇස්තමේන්තු කරන ලද අතර එම අවශ්‍යතාවයෙන් බහුතර ප්‍රමාණයක් සැපයෙනුයේ ගංගා වැලිවලිනි.

බොහෝ පාලන ක්‍රියාමාර්ග පැවතිය ද, බහුතරයක් ඉදිකිරීම් කටයුතු සහ ප්‍රධානතම වෙරළ ඛාදන ගැටලු කේන්ද්‍ර වී ඇති වයඹ, බස්නාහිර හා දකුණු පළාත්වල දී ගංගාවලින් වැලි ගොඩ දැමීම ඉහළ මට්ටමකින් සිදු වේ. දැනට පවතින තොරතුරු අනුව, ගංගා 103න් 35කට වැඩි සංඛ්‍යාවක් නීති විරෝධී වැලි ගොඩ දැමීමේ කටයුතුවලට බඳුන්වෙන අතර ඉදිකිරීමේ ක්ෂේත්‍රය තුළ භාවිතා කරන වැලිවලින් 50%කට වැඩි ප්‍රමාණයක් ලබාගැනෙනුයේ නීතිවිරෝධී ආකාරයෙන් සිදුකරන වැලි කැණීමේ කටයුතුවලිනි (අබේරත්න. එච්.එස් 2023).

එසේ වුව ද, ඉල්ලුමේ ඇති වූ ප්‍රබල ඉහළ යෑම සහ ගංගාවලින් වැලි ගොඩ දැමීම සම්බන්ධයෙන් පනවා ඇති නියාමන සීමාවන් සමග ගංගා වැලි සඳහා වූ මිල සැලකිය යුතු මට්ටමකින් ඉහළ යන ලද අතරම වෙරළට ඔබ්බේ මුහුදෙහි හෝ ඉඩම් ආශ්‍රිත නිධි වැනි විකල්ප ප්‍රභව සම්බන්ධයෙන් වූ අවධානය ද ඉහළ යන ලදී. වර්තමානයේ දී, ගංගා වැලි සඳහා ප්‍රධානතම වැලි ගොඩදැමීමේ ප්‍රභවය වී ඇත්තේ මහවැලි ගංගාවයි (මනම්පිටිය සහ මහියංගණය); මීට අමතරව, කැළණි ගඟ, දැදුරු ඔය, මහ ඔය, කළු ගඟ සහ නිල්වලා ගඟ යන ගංගාවන් ද වැලි ගොඩ දැමීමේ ප්‍රධාන ප්‍රභව ලෙස සැලකේ.

ඉදිකිරීමේ කර්මාන්තයේ වර්තමාන අවශ්‍යතාවය සපුරාලීම සඳහා පෙර නොවූ විරූ වේගයකින් ගංගාවල සිදුවන සමස්ත වැලි ගොඩ දැමීම් ඔස්සේ තිරසර නොවන තත්ත්වය හා නොවැළැක්විය හැකි ආකාරයෙන් ගංගා පතුල් හායනයට පත්වීම මෙන්ම වෙරළ කරා වැලි සැපයුම පහළ යෑම ද පැහැදිලිව ආදර්ශනය කෙරේ.

රටෙහි ගොඩනැගිලි කර්මාන්තයේ වර්ධනයත් සමග වැලි සඳහා වූ ඉල්ලුම ඉහළ ගිය අතර, උතුරු හා නැගෙනහිර පළාත් හි පැවති ගැටුම්කාරී තත්ත්වය 2009 වර්ෂයේ දී නිමා වීමත් සමග මෙම තත්ත්වය විශේෂයෙන් ඇතිවිය. වාර්ෂිකව භාවිතාකරන සිමෙන්ති ප්‍රමාණය මත පාදකව, වාර්ෂික වැලි පාරිභෝජනය ඇස්තමේන්තුගත කර ඇති අතර එය වගුව 2-4 හි දැක්වෙන අතර භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව මත පාදකව ගංගාවලින් ගොඩදමන ලද වැලිවල ඇස්තමේන්තුගත පරිමාව වගුව 2-5හි දැක්වේ. එසේ වුව ද, ගංගා පද්ධතිය තුළින් නීති විරෝධී ආකාරයෙන් ගොඩදමනු ලබන වැලි ප්‍රමාණය මෙම සංඛ්‍යා දත්තවලින් පිළිබිඹු නොවේ.

ගංගාවලින් වැලි ගොඩදැමීම තිරසර භාවිතයක් නොවන බව සහ එය දිගු කාලයක සිට පැවත එන සමාජ-ආර්ථික ගැටලුවක් බව ද සඳහන් කළ යුතු ය. ගංගාවලින් වැලි ගොඩදැමීම හේතුවෙන් ඇතිවන බලපෑම් කෙටි කාලීන හා මධ්‍ය කාලීන වශයෙන් නැවත යථා තත්ත්වයට පත්කළ නොහැකි ය. එබැවින් බලපෑමට ලක්වී ඇති ගංගා කිහිපයෙන් වෙරළ කරා සිදුවන වැලි සැපයුම කෙටි කාලීන හා මධ්‍ය කාලීන වශයෙන් නැවත ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ප්‍රතික්‍රියාකාරී ප්‍රතිපත්තිමය ප්‍රතිචාර ඔස්සේ රුකුලක් නොලැබේ. දැනට පවතින තත්ත්වය සලකා, මෙහි දැක්වෙන කරුණු අන්තර්ගත බහු කළමනාකරණ ප්‍රවේශයක් යොදා ගැනීම කෙරෙහි ප්‍රතිපත්තිමය ප්‍රතිචාරවලදී අවධානය යොමුකළ යුතු ය (අ) දැනට පවතින තත්ත්වය තවදුරටත් උග්‍ර තත්ත්වයට පත්වීම වළක්වාලීම සඳහා ගංගාවලින් වැලි ගොඩ දැමීමේ කටයුතු වඩාත් ඵලදායි අන්දමින් නියාමනය කළ යුතු අතර අතීතයේ දී වඩාත් ප්‍රබලව වැලි ගොඩදැමීමේ ක්‍රියාවලියට බඳුන් වූ ගංගා නැවත යථා තත්ත්වයට පත්වීම සඳහා අවස්ථාව සැලසීම (ආ) සියලුම ගංගා පද්ධතිවලින් ප්‍රමාණය ඉක්මවා වැලි ගොඩදැමීම අවම කිරීම (ඇ) විකල්ප අනාවරණය කරගැනීම හා ප්‍රවර්ධනය කිරීමට සහ ඉවත් කළ හැකි තිරසර වැලි අස්වැන්න වඩාත් නිරවද්‍ය ආකාරයෙන් නිර්ණය කිරීම සඳහා තවදුරටත් වැලි පිළිබඳ ජාතික අධ්‍යයනයක් ආරම්භ කිරීම.

වාර්ෂිකව භාවිතාකරන සිමෙන්ති ප්‍රමාණය මත පාදකව, වාර්ෂික වැලි පාරිභෝජනය ඇස්තමේන්තුගත කර ඇති අතර එය වගුව 2-4 හි දැක්වේ. එසේ වුව ද, රට තුළ උද්ගත වූ අර්බුදකාරී ආර්ථික වාතාවරණය හා වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂයේ සිට ඉදිකිරීම් කටයුතු සීඝ්‍රලෙස පහළ බසින ලදී.

**වෙරළින් සහ වැලි වැටිවලින් වැලි ගොඩ දැමීම**

ඉහළ ගිය ඉල්ලුම හා අධික මිල ගණන්වලට අනුරූපීව, ඉදිකිරීම් කර්මාන්තය සඳහා අවශ්‍ය කරන යෝග්‍යතාවය හෝ ගුණාත්මකබව පිළිබඳ ප්‍රමිතීන් පිළිබඳ සැලකීමකින් තොරව වෙරළින් හා වැලි වැටිවලින් වැලි ගොඩ දැමීමේ කටයුතු මෑත කාලීනව ඉහළ ගොස් තිබේ. මෙරට ගංගාවලින් ගොඩ දමනු ලබන වැලි ප්‍රමාණය සමග සැලකීමේ දී, වෙරළවලින් වැලි ගොඩ දැමීම සැලකිය යුතු මට්ටමක නොපවතී. වාර්ෂිකව වෙරළ සහ වැලි වැටිවලින් ඉවත්කර ගන්නා වැලි ප්‍රමාණය අඩු වුව ද, ගංගාවලින් වැලි ඉවත්කර ගැනීමට වඩා වෙරළින් වැලි ගොඩ දැමීම වෙරළේ ස්ථායිතාවය කෙරෙහි වඩාත් හානිකර වේ. එසේ වනුයේ එමගින් වෙරළබඩ වැලි ප්‍රවාහයේ ඌනතාවය කෙරෙහි ක්ෂණික බලපෑමක් ඇතිකරන බැවිනි. එසේ වුව ද, රෙගුලාසි බලාත්මක කිරීම, මහජන අධ්‍යාපනය

හා දැනුවත්බව වැඩිදියුණු කිරීම හා අනෙකුත් නියෝජිතායතන සමග සහයෝගීතාවය ඔස්සේ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නංවන ලද කළමනාකරණ පියවරවල් හේතුවෙන් වෙරළවල් වලින් වැලි කැණීමේ කටයුතු වසර ගණනක් මුළුල්ලේ සැලකිය යුතු අන්දමින් අඩුවී තිබේ. ආගමික හා අනෙකුත් කාර්යයන් සඳහා වෙරළබඩ ප්‍රජාව වෙත අවශ්‍ය කරන සුළු ප්‍රමාණයේ වෙරළ වැලි අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන, පූර්ව වශයෙන් හඳුනාගනු ලැබූ ප්‍රදේශවලින් වැලි කියුබ් දෙක නොඉක්මවා යන ප්‍රමාණයක් ඉවත්කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් අවසර ලබාදේ. එසේ වුව ද, කිරින්ද, පෑරලිය, හික්කඩුව, හලාවත හා පානදුර ධීවර වරාය වැනි සීමිත ස්ථාන කිහිපයේ දී එම ස්ථානවල පැහැදිලිව දක්නට ලැබෙන වැලි අතිරික්තය සලකා වෙරළ වැලි ඉවත් කිරීමක් සිදු වේ. වෙරළ/ වරාය ව්‍යුහයන් හේතුවෙන් වෙරළබඩ වැල්ල ගසාගෙන යෑම වැළැක්වෙන හෙයින් එම ස්ථානවල වැලි එක්රැස්වීමක් සිදුවී වරාය ද්‍රෝණිය තුළ වැලි තැන්පත් වීමක්/ පිරීමක් සිදු වේ. මෙම හේතුවෙන් වෙරළ තීරය දිගේ පහළ ප්‍රදේශයේ අවසාදිත රඳවාගැනීමේ තුල්‍යතාවය පවත්වාගැනීම වැළැක්වී වෙරළ ඛාදනය සඳහා තුඩු දේ. තව ද, තැන්පත් වී ඇති වැලි පද්ධතියෙන් ඉවත්වීමෙන් වැලි ප්‍රමාණයේ සංතුලනයක් පවත්වාගැනීම කෙරෙහි සෘණාත්මකව බලපාන අතර ඇතැම් බලධාරීන් සේම වෙරළබඩ ප්‍රජාව විසින්ද මෙම ගැටලුව සම්බන්ධයෙන් ලබාදී තිබෙනුයේ සීමිත අවධානයකි. එසේ වුව ද, ධීවර වරායවලට ආසන්න වෙරළවල්වල හඳුනාගනු ලැබූ උග්‍ර ඛාදන තත්ත්වයන් හේතු කොටගෙන ධීවර වරායවල් තුළ වැලි කැණීම සඳහා ලබාදී තිබූ අවසරයන් තාවකාලිකව අත්හිටුවා තිබේ.

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ඵලදායි අන්දමින් ක්‍රියාත්මක කළ කළමනාකරණ පියවර මධ්‍යයේ වුව ද, ඉකුත් වූ කාල සීමාව තුළ වයඹ, නැගෙනහිර සහ උතුරු පළාත්වල වැලි වැටිවලින් වැලි ඉවත් කරගැනීම් සැලකිය යුතු ඉහළ අගයක පැවතිණි. නැගෙනහිර හා උතුරු වෙරළ ඛණ්ඩයේ වැලි වැටි පද්ධතියෙන් අනවසර ආකාරයෙන් වැලි ඉවත් කිරීම පාලනය කළ නොහැකි වූ අතර ඊට හේතු වූයේ පසුගිය ඉකුත් කාල සීමාව තුළ පැවති ගැටුම්කාරී වාතාවරණය යි. මෙහි දී ඇතැම් වටිනා වැලි වැටි සැලකිය යුතු මට්ටමකට විනාශ වී තිබුණි. එම බලපෑම් සැලකිල්ලට ගෙන මීට පෙර පැවති වෙරළ කලාප කළමනාකරණ ව්‍යාපෘතිය ඔස්සේ වැලිවැටි සංරක්ෂණය කිරීමේ කටයුතු වැඩිදුරටත් සවිමත් කරන ලදී. ඒ අනුව, දැඩිව බලපෑමට ලක් වූ වැලි වැටි සංරක්ෂණය කිරීම සඳහා ප්‍රයත්නයක් දරන ලදී.

**වගුව 2 - 4 වාර්ෂික වැලි පාරිභෝජනය 2012-2021**

| වර්ෂය | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021(1) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සිමෙන්ති පාරිභෝජනය(2) (x000) මෙට්‍රික් ටොන් | 5,880 | 6,033 | 6,247 | 6,379 | 7,994 | 8,495 | 7,955 | 8,121 | 7,189 | 7,128 |
| වැලි පාරිභෝජනය(3) (x000) ඝන මීටර් | 21,168 | 21,719 | 22,489 | 22,964 | 28,778 | 30,582 | 26,638 | 29,236 | 25,880 | 25,661 |

(1) තාවකාලික, (2) නිෂ්පාදනය+ආනයන, (3) සූත්‍රයක් මත පදනම්ව : වැලි ඝන මීටර් 3.6 $m^3$ = සිමෙන්ති ටොන් 1, Byrne G. et al. 2002, ගංගා වැලි සඳහා විකල්ප, වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ ප්‍රකාශයට පත් නොකළ වාර්තාව, 2002 (මූලාශ්‍රය : ජාතික නිමැවුම, වියදම් හා ආදායම, ශ්‍රී ලංකා මහ බැංකුව, 2022)

**වගුව 2- 5 වාර්ෂික වශයෙන් ගංගාවලින් ගොඩ දැමූ වැලි ප්‍රමාණය (භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව මත පාදකව ඇස්තමේන්තු කරන ලදී)**

| *වර්ෂය* | *ඉවත් කරන ලද වැලි ප්‍රමාණය(ඝන මීටර් මිලියන)* |
|---|---|
| 2015 | 0.74 |
| 2016 | 0.88 |
| 2017 | 0.77 |
| 2018 | 0.80 |
| 2019 | 0.61 |
| 2020 | 1.30 |
| 2021 | 1.28 |
| 2022 | 0.59 |

ගංගා, වෙරළ හා වැලි වැටිවලින් ඉවත් කරන වැලි හැරුන විට, මුහුද ගොඩ කිරීමේ ව්‍යාපෘති හා ඉදිකිරීම් කාර්යයන් සඳහා වෙරළට ඔබ්බෙන් ගැඹුරු මුහුදු ප්‍රදේශවලින් (බස්නාහිර වෙරළබඩ තීරය) ඉවත්කර ගන්නා වැලි විශාල ප්‍රමාණයන් පහත වගුව 2-6 පරිදි වේ : තව ද, සැලසුම්කර ඇති කොළඹ උතුර වරාය සංවර්ධන ව්‍යාපෘතිය සහ සමුද්‍ර නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වෙරළට ඔබ්බෙන් වූ මුහුදෙන් වැලි විශාල ප්‍රමාණයක් ගොඩ දැමීමට අපේක්ෂා කෙරේ.

**වගුව 2 - 6 1994-2022 කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ මුහුද ගොඩ කිරීමේ හා ඉදිකිරීමේ කර්මාන්තයේ අවශ්‍යතාවය සඳහා වෙරළට ඔබ්බෙන් මුහුදෙන් පොම්ප කරන ලද වැලි ප්‍රමාණය**

| *කාල සීමාව* | *පරිමාව/ප්‍රමාණය (ඝන මීටර් මිලියනවලින් )* |
|---|---|
| 1994-1995 | 4.55 |
| 2005-2007 | 3 |
| 2011-2013 | 3.8 |
| 2018-2019 | 4 |
| ආසන්න වශයෙන් 2016 | 40(වරාය නගර සංවර්ධනය සඳහා) ǂ |
| 2022-මේ දක්වා | 14.5 (කොළඹ වරායේ බටහිර ජාත්‍යන්තර පර්යන්තය ව්‍යාපෘතිය සඳහා) ǂ |

ඇස්තමේන්තු

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා ඉඩම ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ වාර්තා*

**හිරිගල්පර මත පවතින ඍජු මිනිස් බලපෑමේ පරිවර්තනය**

මෑතක් වන තුරුම ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය සඳහා අවශ්‍ය හුණු ලබාදෙන ප්‍රධාන මූලාශ්‍රය වනුයේ හිරිගල් වන අතර එමගින් හුණු අවශ්‍යතාවයෙන් ආසන්න වශයෙන් 90% ක් පමණ සැපයිණි. සැළකිය යුතු මට්ටමක වෙරළ ඛාදනයක් සිදුවෙමින්, ආසන්න මුහුදු වෙරළ තීරයන්ගෙන් හිරිගල්පර කැණීමේ කටයුතු බටහිර සහ දකුණු වෙරළ තීරවලින් සහ නැගෙනහිර වෙරළ තීරයේ ඇතැම් කොටස්වලින් වාර්තා වේ. වෙරළ තීරයේ ඇතැම් ස්ථානවල හිරිගල්පර කැණීමේ කටයුතු වසර හාරසියයක පමණ ඈත අතීතයේ සිට සිදු වුව ද, එය ඉතා සීමිත මට්ටමකට පමණක් සහ වැල්ලට ඔබ්බෙන් අවශේෂ වශයෙන් පවතින හිරිගල්පරවලින් පමණක් කැණීම් සිදුකිරීමට සීමා විය. 1970 දශකයේ අග භාගයේ සිට ඉදිකිරීමේ කර්මාන්තයේ සිදු වූ වර්ධනයත් සමග මුහුදු හිරිගල් කැණීමේ කටයුතු වේගවත් වූ අතර එමගින් වෙරළ ඛාදනය වැළැක්වීම සඳහා බාධකයක් ලෙස ක්‍රියාකරන ජීවී හිරිගල්පර ද විනාශ වීම සිදුවිය. දැනට පවතින වාර්තා අනුව බටහිර සහ දකුණු වෙරළ තීරයේ ගොඩබිම සහ මුහුදු ප්‍රදේශයන්ගෙන් ඉවත්කරන හිරිගල්පර ප්‍රමාණය 1984 වර්ෂයේ දී ටොන් 18,000 සිට 1998 වර්ෂය වනවිට ටොන් 30,500 දක්වා ඉහළ ගොස් තිබේ. වෙරළ කලාපය තුළ හිරිගල් පෝරණු පවත්වාගෙන යෑම, සන්තකය දැරීම, පිරිසැකසුම් කිරීම හා ප්‍රවාහනය කිරීම තහනම් කරමින් 1988 අංක 84 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත යටතේ දැඩි නියාමන ක්‍රියාමාර්ග බලාත්මක වීමත් සමග 1984 වර්ෂයේ දී ටොන් 7,660 ක් වූ මුහුදු හිරිගල් කැණීම 1994 වර්ෂයේ දී ටොන් 2,200 දක්වා අඩුවී තිබේ. මෙම වාතාවරණය තුළ, හිරිගල් කැණීම හා ඒ සම්බන්ධිත සමාජ-ආර්ථික හා පාරිසරික බලපෑම් වනාහී ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ වෙරළ සම්පත් කළමනාකරණයේ දී නිරතුරුවම ප්‍රධාන වශයෙන් සාකච්ඡාවට බඳුන්වන මාතෘකාවක් වේ. එබැවින් හිරිගල් කැණීම පාලනය කිරීම සඳහා 1978 වර්ෂයේ සිට වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් රෙගුලාසි, හිරිගල් පදනම් වූ හුණු සඳහා ආදේශක හඳුන්වාදීම හා ප්‍රවර්ධනය කිරීම, මහජනතාව සඳහා අධ්‍යාපනය හා දැනුවත්බව වැඩිදියුණු කිරීම, හිරිගල් කැණීමේ නියුතු පුද්ගලයන් සඳහා විකල්ප රැකියා සැපයීම ආදී අංගවලින් සමන්විත සවිස්තරාත්මක කළමනාකරණ උපායමාර්ගයක් ක්‍රියාවට නංවන ලදී. මෙම කළමනාකරණ පියවරවල ප්‍රතිඵලයක් වශයෙන්, 2004 වර්ෂය දක්වා මුහුදු හිරිගල් කැණීමේ කටයුතු පහළ මට්ටමකින් පවත්වාගෙන යන ලදී. එසේ වුව ද, 2004 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපය මුහුණ දුන් සුනාමි ආපදා තත්ත්වයත් සමග විශේෂයෙන් දකුණු පළාත තුළ මුහුදු හිරිගල් කැණීමේ කටයුතු ප්‍රබල වශයෙන් පහළ යෑම හෝ බොහෝදුරට නැවැත්වීම සිදුවී ඇත. මීට හේතුවී ඇත්තේ වෙරළබඩ ප්‍රජාවන් විසින් මෙම හිරිගල්පරවල පරිසර විද්‍යාත්මක හා පාරිසරික වැදගත්කම වෙරළබඩ ප්‍රජාවන්ට ස්වයං අවබෝධ වීමයි. මෑතකාලීනව හිරිගල්පර සැලකිය යුතු මට්ටමකින් කැණීම් වාර්තා වී නොමැත (වගුව 2-7).

**වගුව 2 - 7 ශ්‍රී ලංකාවේ වෙරළ කලාපයේ බටහිර හා දකුණු වෙරළ තීරවල පසුගිය කාල සීමාව තුළ සිදුවී ඇති හිරිගල්පර කැණීම්වල විස්තර (1992-2022)**

| *හිරිගල්පර වර්ගය* | *ප්‍රමාණය 1984 (ටොන්)* | *මුළු ප්‍රමාණයේ ප්‍රතිශතය* | *ප්‍රමාණය 1992 (ටොන්)* | *මුළු ප්‍රමාණයේ ප්‍රතිශතය* | *ප්‍රමාණය 1998 (ටොන්)* | *මුළු ප්‍රමාණයේ ප්‍රතිශතය* | *ප්‍රමාණය 2013-2022 (ටොන්)* |
|---|---|---|---|---|---|---|---|
| ගොඩබිම හිරිගල්පර | 10,400 | 58 | 15,800 | 80 | 28,300 | 93 | වාර්තා වී නොමැත |
| මුහුදු හිරිගල්පර | 7,660 | 42 | 4,020 | 20 | 2,200 | 7 | වාර්තා වී නොමැත |
| එකතුව | 18,060 | 100 | 19,820 | 100 | 30,500 | 100 | වාර්තාවී නොමැත |

*මූලාශ්‍රය : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව 2023*

**2.2.5 දේශගුණික විපර්යාසවල අනාගත බලපෑම්**

විශේෂයෙන් ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම ඔස්සේ සාගර උෂ්ණත්වය හා මුහුදු මට්ටම ඉහළ යෑම, නිවර්තන සුළි කුණාටු හා අනෙකුත් ආන්තික සිද්ධි සිදුවීමේ සංඛ්‍යාතය හා විශාලත්වය වැඩිවීම වැනි විභව්‍ය දේශගුණික විපර්යාස බලපෑම්වලින් වෙරළබඩ ක්‍රියාවලි, පරිසර පද්ධති හා මානව යහපැවැත්ම කෙරෙහි අහිතකර ප්‍රතිඵල ඇතිකරවයි. ගෝලීය මධ්‍යන්‍ය මුහුදු මට්ටම ඉහළ යෑම වැදගත් සාධකයක් වුව ද, වෙරළ වෙත සිදුවන බලපෑම් තීරණය වන ප්‍රධාන සාධකය වනුයේ සාපේක්ෂ මුහුදු මට්ටමේ ඉහළ යෑමයි. දේශගුණික විපර්යාස පිළිබඳ ජාත්‍යන්තර මඬුල්ල (IPCC) විසින් පුරෝකථනය කර ඇති මධ්‍ය ඇස්තමේන්තුවට අනුව, වසර 2010 සහ 2050 අතර කාල සීමාව තුළ ගෝලීය මුහුදු මට්ටම සෙන්ටිමීටර 0.2 සහ 0.5 අතර ප්‍රමාණයකින් ඉහළ යනු ඇත. මේ අනුව ඉහළ යා හැකි උෂ්ණත්වය හා සාපේක්ෂ මුහුදු මට්ටම අනුකූලව, වෙරළ තීරය ඛාදනය වීම, පහත් බිම් හා ප්‍රදේශ හා අවදානමට ලක්විය හැකි ප්‍රදේශ ජලයෙන් යටවීම, රට අභ්‍යන්තර ජලාශ වෙත ලවණ ජලය ගලා ඒම ඉහළ යෑම, අවසාදිත ප්‍රවාහනයේ හු රූපමය වෙනස්වීම් හා හිරිගල්පර වැනි වෙරළබඩ පරිසර පද්ධති විනාශවීම සිදුවෙතැයි අපේක්ෂා කෙරේ. මීට අමතරව, මුහුදු මට්ටම ඉහළයෑම ඔස්සේ ධීවර කටයුතු, සංචාරක හා අනෙකුත් වෙරළ පරිශීලකයන් වෙත සහ ඉහත සඳහන් බලපෑම් සඳහා ඔරොත්තු දිය හැකි ආකාරයෙන් සකස් කර නොමැති වෙරළ ආරක්ෂක හා අනෙකුත් ඉදිකිරීම් වෙත අහිතකර බලපෑම් ඇතිකරනු ඇත.

2011 වර්ෂයේ දී, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් සිදුකළ දේශගුණික විපර්යාස අවදානම් පිළිබඳ තක්සේරුවට අනුව, මුහුදු මට්ටම ඉහළ යෑමට නිරාවරණය වන නාගරික සංවර්ධන, මානව ජනාවාස, ආර්ථික යටිතල පහසුකම්, ජලය, කෘෂිකර්මය සහ වන සම්පත්, ජෛව විවිධත්වය හා පරිසර පද්ධති සේවා, පශු සම්පත් වැනි වැදගත් ක්ෂේත්‍රයන් පිළිබඳව විමර්ශනය කළ අතර ඉහළ අවදානමක් ඇති ප්‍රදේශ හඳුනාගන්නා ලදී. රූප සටහන 2.1 මගින් මුහුදු මට්ටම ඉහළ යෑමට නිරාවරණය වන ප්‍රදේශ පිළිබඳ සිතියම දක්වා තිබේ. දැනට ජල ස්කන්ධ ලෙස ආවරණය වී ඇති ප්‍රදේශ ද ඇතුළුව, දේශගුණික විපර්යාස පිළිබඳ ජාත්‍යන්තර මඬුල්ලේ (IPCC) පුරෝකතනවලට අනුව, පුරෝකථනය කළ මුහුදු මට්ටම ඉහළ යෑම හේතුවෙන් වසර 25, 50, 75 සහ 100 අවසානයේ දී ජලයෙන් යටවන ප්‍රදේශ පිළිබඳව වගුව 2-8 හි දක්වා ඇත.

වගුව 2- 8 ජල ස්කන්ධ ඇතුළුව/ ඇතුළත් නොවන පරිදි එක් එක් දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් ප්‍රක්ෂේපණය කළ ජලයෙන් යටවිය හැකි භූමි ප්‍රදේශය :

| *දිස්ත්‍රික්කය* | *ජල ස්කන්ධ ඇතුළුව ජලයෙන් යටවන මුළු භූමි ප්‍රමාණය (හෙක්ටයාර)* | | | | *ජල ස්කන්ධ නොඇතුළත්ව ජලයෙන් යටවන අතිරේක භූමි ප්‍රමාණය (හෙක්ටයාර)* | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | *වසර 25* | *වසර 50* | *වසර 75* | *වසර 100* | *වසර 25* | *වසර 50* | *වසර 75* | *වසර 100* |
| කොළඹ | 959 | 1133 | 1327 | 1534 | 201 | 375 | 569 | 776 |
| ගම්පහ | 3638 | 4154 | 4631 | 5073 | 459 | 976 | 1452 | 1894 |
| පුත්තලම | 11334 | 12583 | 13716 | 14809 | 1113 | 2362 | 3494 | 4587 |
| මන්නාරම | 8024 | 8262 | 8518 | 8758 | 248 | 486 | 741 | 981 |
| යාපනය | 10321 | 11164 | 12014 | 12891 | 864 | 1706 | 2557 | 3434 |
| මුලතිවු | 912 | 1004 | 1092 | 1180 | 88 | 180 | 268 | 355 |
| ත්‍රිකුණාමලය | 2315 | 2529 | 2791 | 3033 | 252 | 467 | 729 | 971 |
| මඩකලපුව | 2325 | 2443 | 2568 | 2702 | 130 | 247 | 372 | 507 |
| අම්පාර | 1880 | 2175 | 2479 | 2762 | 293 | 588 | 892 | 1175 |
| හම්බන්තොට | 4265 | 5553 | 6516 | 7322 | 885 | 2173 | 3136 | 3942 |
| මාතර | 1277 | 1634 | 1994 | 2401 | 384 | 741 | 1101 | 1508 |
| ගාල්ල | 5622 | 6462 | 7249 | 8014 | 776 | 1617 | 2403 | 3169 |
| කළුතර | 1956 | 2370 | 2790 | 3203 | 417 | 830 | 1251 | 1664 |

*මූලාශ්‍රය : වෙරළ තත්ත්ව වාර්තාව - 2014*




රූපය 2 - 1 : ශ්‍රී ලංකාවේ මුහුදු මට්ටම ඉහළ යෑමට නිරාවරණය වන ප්‍රදේශ දැක්වෙන සිතියම

*මූලාශ්‍රය : දේශගුණික විපර්යාස අවදානම් බව පිළිබඳ දත්ත ග්‍රන්ථය 2011*

මුහුදු මට්ටම ඉහළ යෑම හා සම්බන්ධිත සිදුවීමේ විභවයක් සහිත ගැටලුවල විශාලත්වය අනුව, සමස්ත වශයෙන් පිළිගත හැකි ප්‍රතිචාරය වනුයේ ඒ සඳහා නිසි පරිද්දෙන් අනුවර්තනය වීමයි. එබැවින්, පහත දැක්වෙන අනුවර්තන තාක්ෂණයන් පිළිබඳව සුපරීක්ෂාකාරී අවධානය යොමු කිරීම වැදගත් වේ ː

1. වෙරළබඩ සංවර්ධන කටයුතුවලදී ප්‍රමාණවත් පසසිටු සීමාවන් පැනවීම (බලපෑම් ප්‍රමාද කිරීම හෝ වැළැක්වීම සඳහා),
2. මුහුදු මට්ටම ඉහළ යා හැකි සාපේක්ෂ මට්ටම පිළිබඳ මනා අවධානය යොමු කර වෙරළබඩ ඉදිකිරීම් සඳහා සැලසුම් නිර්ණායක සැකසීම,
3. මෘදු ආරක්ෂණ යාන්ත්‍රණයක් ලෙස වැලි වැටි පුනරුත්ථාපනය/ ස්ථාවර කිරීම,
4. මෘදු ආරක්ෂණ යාන්ත්‍රණයක් ලෙස හිරිගල්පර ප්‍රතිෂ්ඨාපනය,
5. වෙරළ වැලි පෝෂණය.

මුහුදු මට්ටම ඉහළ යෑමට අමතරව, වෙරළ ඛාදන කළමනාකරණය සඳහා වැදගත් වන්නා වූ දේශගුණික විපර්යාස හේතුවෙන් ඇතිවන ප්‍රතිඵලවලට අදාළ අනෙකුත් ස්වාභාවික සංසිද්ධිය වනුයේ බෙංගාල බොක්ක ප්‍රදේශය තුළ නිරන්තරයෙන් ඇතිවන වාසුළි හා ප්‍රබල කුණාටු ය.

### 2.2.6 වෙරළ ඛාදන ප්‍රවණතා සහ අනුගමනය කරනු ලබන වෙරළ තීර කළමනාකරණ පියවර

කළුතර, කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්ක සඳහා සාමාන්‍ය වෙරළ ඛාදන වේගයන් පිළිවෙලින් (-1.21±0.04 m yr-1), (- 0.54±0.63 m yr-1)සහ (-0.7±0.58 m yr-1 ) බව බස්නාහිර හා වයඹ පළාත් කේන්ද්‍ර කරගනිමින් 2005-2019 කාල සීමාව ආවරණයවන පරිද්දෙන් අබේකෝන් සහ තවත් පිරිසක් (අබේකෝන් එල්.සී.කේ. සහ පිරිස, 2021) විසින් සිදුකළ වෙරළ ඛාදන ප්‍රවණතා විශ්ලේෂණයක දී අනාවරණය විය. පුත්තලම දිස්ත්‍රික්කය සඳහා සාමාන්‍ය ඛාදන වේගය (0.26±0.07 m yr-1) වශයෙන් පැවති අතර ඉහළතම ඛාදන වේගයක් වාර්තා වූයේ අඩු මානව බලපෑමක් සහිත ප්‍රදේශයක් වන විල්පත්තු ජාතික උද්‍යානයේ වෙරළබඩ කලාපයෙනි.

පසුගිය වසර 15 තුළ වෙරළ ඛාදන බලපෑම් අවම කිරීම සඳහා දෘඪ ව්‍යුහයන් යොදා ගැනීම ඉහළ ගොස් ඇති බව ද අධ්‍යයන ප්‍රතිඵලවලින් අනාවරණය විය. ඒ අනුව, 2019 වර්ෂය අවසාන වන විට, රට වටා මීටර් 23,554 දුරට පැති බැම් ප්‍රධාන වශයෙන් භාවිතා කර තිබුණි (මුළු අධ්‍යයන ප්‍රදේශයෙන් 9.05%කි). මින් මීටර් 18,960ක් බස්නාහිර පළාතට (7.29%) සහ මීටර් 4,594ක් වයඹ පළාතට (1.76%) අයත් විය. මෙගා සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් බස්නාහිර පළාත තුළ වයඹ පළාතට වඩා ඉහළ වේගයකින් දෘඪ ඉදිකිරීම් යොදාගෙන තිබුණි.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මෑතකාලීන විමර්ශන වාර්තාවලට අනුව, ගං මෝයට ආසන්නව කළුතර වෙරළ තීරයේ 2017-2023 දක්වා කාල සීමාව තුළ වෙරළ ඛාදනය ආසන්න වශයෙන් මීටර් 30ක සැලකිය යුතු ඉහළ යෑමක් බවට අනාවරණය විය.

2000 සිට 2022 දක්වා කාල සීමාව තුළ වාර්තා වී ඇති වෙරළ ඛාදන සිදුවීම් සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් වශයෙන් ආරක්ෂා කර ඇති වෙරළ තීරයේ දිග වගුව 2-10 මගින් නිරූපණය කෙරේ.

වගුව 2- 92008 - 2022 කාලසීමාව තුළ ක්‍රියාත්මක කරන ලද වෙරළතීර කළමනාකරණ පියවර

| *දිස්ත්‍රික්කය* | *2008 සිට 2022 කාලසීමාව තුළ ආරක්ෂාකර ඇති දුර ප්‍රමාණය (කි.මී)* |
|---|---|
| පුත්තලම | 4.1 |
| ගම්පහ | 1.05 |
| කොළඹ | 1.65 |
| කළුතර | 3.16 |
| ගාල්ල | 5.24 |
| මාතර | 3.81 |
| හම්බන්තොට | 1.47 |
| අම්පාර | 0.85 |
| මඩකලපුව | 0.1 |
| ත්‍රිකුණාමලය | 1.37 |
| මුලතිව් | 0 |
| කිලිනොච්චිය | 0 |
| යාපනය | 0.75 |
| මන්නාරම | 0 |

*මූලාශ්‍රය : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව 2023*

### 2.2.7 වෙරළබඩ ක්‍රියාවලිය/ ලක්ෂණ පිළිබඳ දත්ත හා තොරතුරු

වෙරළ ඛාදනය කළමනාකරණය සඳහා මූලික අවශ්‍යතාවයක් වනුයේ වෙරළබඩ ක්‍රියාවලි පිළිබඳ විශ්වාසනීය හා යාවත්කාලීන තොරතුරුවල අවශ්‍යතාවය හා වෙරළ ඛාදනය හා සම්බන්ධිත සමාජ, ආර්ථික, පරිසර විද්‍යාත්මක, පාරිසරික සාධකයි. පසුගිය දශක කිහිපය මුළුල්ලේ බස්නාහිර, නිරිත දිග, දකුණ හා වයඹ වෙරළ ඛණ්ඩවලට අදාළව වෙරළ ඛාදනය කළමනාකරණය සඳහා අවශ්‍යකරන දත්ත හා තොරතුරු වෙරළබඩ විමර්ශන හා අනෙකුත් පර්යේෂණ අධ්‍යයන මගින් රැස් කෙරුණ ද, 2009 වර්ෂය දක්වා දශක තුනකට අධික කාලයක් කලාපය තුළ පැවති අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත් සහ දූපත්වලට අදාළව දත්ත හා තොරතුරු නොපවතී. දේශගුණික විපර්යාසවල විපාකවලට මෙන්ම සුළිසුළං, කුණාටු හා සුනාමි තත්ත්වයන් ආන්තික ස්වාභාවික සිද්ධිමාලා සඳහා උතුරු හා නැගෙනහිර වෙරළබඩ පළාත් ද ඉහළින්ම අවදානමක් දරන බැවින් වෙරළ ඛාදනය කළමනාකරණයේ දී විශ්වාසනීය දත්ත හා තොරතුරු පැවතීම ඉතා වැදගත් අවශ්‍යතාවයකි. මීට අමතරව, ශ්‍රී ලංකා රජය විසින් උතුරු හා නැගෙනහිර පළාත්වල ආර්ථික සංවර්ධනය සඳහා රජය විසින් දරන ප්‍රයත්නවලදී ද, පාරිසරික බලපෑම් නිර්ණය කිරීම සඳහා වෙරළ ක්‍රියාවලි සහ රළ ගති ලක්ෂණ, දියවැල්, උදම් රළ, හා අවසාදිත ප්‍රවාහන රටා වැනි පරාමිතිකවල දත්ත හා තොරතුරු පැවතීම අත්‍යවශ්‍ය වේ. උතුරු හා නැගෙනහිර වෙරළ කලාපයේ වෙරළබඩ ක්‍රියාවලි/ ලක්ෂණ පිළිබඳ දත්ත හා තොරතුරු ලබාගැනීමේ ප්‍රයත්නයේ කොටසක් ලෙස වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේ දී ත්‍රිකුණාමලය හා මඩකලපුව දිස්ත්‍රික්කවලදී වෙරළ තීරයට සමාන්තරව හෝ ආනතියකින් අවසාදිත ප්‍රවාහනය පිළිබඳ ආදර්ශ අධ්‍යයන සිදුකරන ලදී. එමෙන්ම මඩකලපුව දිස්ත්‍රික්කයේ වෙරළ ප්‍රවේශ සිතියම්ගත කිරීම 2021 දී සිදුකරන ලද අතර මන්නාරම, කිලිනොච්චි, යාපනය සහ මුලතිව් දිස්ත්‍රික්කවල වෙරළ ප්‍රවේශ සිතියම්ගත කිරීම 2022 දී ආරම්භ කරන ලදී. මීට අමතරව, උතුරු කලාපයේ පේසාලෙයි, ගුරුනගර්, පේදුරු තුඩුව හා මුලතිව් යන ස්ථාන හතරක දී ද වෙරළ තීරයට සමාන්තරව හෝ ආනතියකින් අවසාදිත ප්‍රවාහනය පිළිබඳ ආදර්ශ අධ්‍යයනය 2016 වර්ෂයේ දී උතුරු පළාත් තිරසර ධීවර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් දියත් කරන ලදී.

ක්ෂේත්‍ර මිනුම්කරණ සීමිත වුව ද, විධිමත් දත්ත ලබාගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මකවන තුරු භාවිතා කළ හැකි ගෝලීය මට්ටමේ රළ, සුළං හා දියවැල් සමාකරණ හා පුරෝකතන වැඩසටහන් හා දිගුකාලීනව වෙරළ තීරය වෙනස්වීම ඇස්තමේන්තු කිරීම් පවතී. එසේ වුව ද, මෙම තොරතුරු අවශ්‍යතාවලට අනුකූලව සකස් කළ දත්ත සමුදායක් වෙත සම්පාදනය කිරීම හා සත්‍යාපනය කිරීම කළ යුතු අතර එවිට එකී තොරතුරු තීරණ ගැනීමේ මෙවලම් වශයෙන් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට සෘජුවම භාවිතා කළ හැකිවනු ඇත.

### 2.2.8 වෙරළ කලාපය තුළ නව සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අවස්ථාව සලස්වාදීම

රට තුළ පැවති ගැටුම්කාරී වාතාවරණය 2009 වර්ෂයේ දී නිමාවීමත් සමගම සමස්ත ආර්ථික සංවර්ධනයේ වර්ධනයක් ඇතිවී මෙරට පහළ ආදායම් රටක් ලෙස පැවති තත්ත්වයෙන් මැදි ආදායම් රටක තත්ත්වයට පත්විය. එසේ වුව ද, 2020 වර්ෂයේ සිට මුහුණදීමට සිදුවූ කොවිඩ් වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුදය හේතුවෙන් මුලින් ලබාගත් ජයග්‍රහණයන්ගේ සැලකිය යුතු ප්‍රතිශතයක් අහිමි විය. එනමුදු, ආර්ථිකය නුදුරු අනාගතයේ දී නැවත යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා රජයේ සංචාරක, සමුද්‍ර හා බලශක්ති යන ක්ෂේත්‍ර සංවර්ධනය කිරීමේ දිගු කාලීන සැලැස්ම මූලිකව කේන්ද්‍ර වී ඇත්තේ වෙරළබඩ කලාපය තුළය. මීට අමතරව, කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සහ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය ස්ථානගත වී ඇත්තේ නාගරික වෙරළබඩ ජල තීරයේ ය. වෙරළබඩ ප්‍රදේශය හරහා සංචාරක සංවර්ධන කලාප/ ස්ථාන කිහිපයක් ද සැලසුම් කර තිබේ. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කුච්චවේලි ප්‍රදේශයේ යෝජිත සංචාරක සංවර්ධන කලාපය සහ සංචාරක සංවර්ධනය සඳහා වන ප්‍රධාන සැලැස්ම තුළ බස්නාහිර හා දකුණු පළාත්වල මීගමුව සිට මිරිස්ස දක්වා හඳුනාගෙන ඇති ස්ථාන මීට ඇතුළත් වේ. මීට අමතරව, 2022 වර්ෂයේ දී වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් දියත් කළ අධ්‍යයනයක දී විවිධ ආකාරවල සංචාරක සංවර්ධන කටයුතු සඳහා යෝග්‍ය ස්ථාන රාශියක් වෙරළබඩ කලාපය හා වෙරළබඩ කලාපය තුළ පිහිටි දූපත් ආශ්‍රිතව හඳුනාගෙන තිබේ. එබැවින්, වෙරළබඩ සම්පත්වල තිරසාරබව සහතික කරන අතර යථෝක්තව සඳහන් කළ ආර්ථික අංශවලට අදාළ නව සංවර්ධන මැදිහත්වීම් ආකර්ෂණය කරගැනීම හා ඉඩ ප්‍රස්තාව සැලැස්වීම සඳහා මූලික අවශ්‍යතාවයක් වනුයේ සිදුවීම් මාලාවක් ලෙස සහ මුල්බැසගත් වෙරළබඩ උපද්‍රව සඳහා වෙරළබඩ කලාපයේ අවදානම අවම කිරීම ප්‍රමුඛතම අවශ්‍යතාවයකි. වෙරළබඩ කලාපය වෙත යොමුවී ඇති ආර්ථික සංවර්ධනයේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා වන විධිමත් සංවර්ධන තීරණ ගැනීමේ ක්‍රියාවලියක දී වෙරළ සම්පත්, ඒවායේ හැසිරීම හා කාර්යයන්ට අදාළ විද්‍යාත්මක හා ඉංජිනේරු දැනුම වෙරළ කලාපයේ සාමාජීය කරුණු සමගින් අවධානයට ගත යුතු ය.

## 2.3 ප්‍රතිපත්ති, සැලසුම්, නීති හා ආයතනික සැකසුම්

### 2.3.1 සැලසුම් සහ ප්‍රතිපත්ති

1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත සහ එහි සංශෝධිත පනත් වන 1988 අංක 64 දරන හා 2011 අංක 49 දරන පනත ඔස්සේ වෙරළ කලාපයේ කටයුතු නියාමනය කිරීම සඳහා නෛතික විධිවිධාන සලස්වන බැවින් වෙරළ ඛාදනය කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රධාන වශයෙන් පාලනය කරනු ලබන්නේ එකී පනත් මගිනි. වෙරළ කලාපයෙන් පිටත පවා සිදුවන ඇතැම් බලපෑම් සහිත කටයුතු පාලනය කිරීමේ අවශ්‍යතාව සලකා 2011 අංක 49 දරන සංශෝධන පනත මගින් නීතිමය අවකාශය ශක්තිමත් කරන ලදී. මීට අමතරව, 1990 වර්ෂයේ ප්‍රථම ජාතික වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම, 1997, 2004 සහ 2018 වර්ෂවල සංශෝධිත වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම සහ "Coastal 2000" - ශ්‍රී ලංකාවේ වෙරළ කලාපය සඳහා සම්පත් කළමනාකරණ ක්‍රමෝපාය මගින් ද වෙරළ ඛාදන ගැටලුව සම්බන්ධයෙන් අවධානය යොමුකර තිබේ. වෙරළ කලාප කළමනාකරණ සැලැස්මවල් සහ "Coastal 2000" පදනම් කරගෙන, 1986 වර්ෂයේ දී සකස්කළ වෙරළ ඛාදනය කළමනාකරණය සඳහා වූ ප්‍රධාන සැලැස්මට අනුකූලව සමස්ත වෙරළ ඛාදන කළමනාකරණ ක්‍රමෝපාය ක්‍රියාත්මක කරන ලදී.

නෛතික සහ ආයතනික විධිවිධාන ප්‍රකාරව, වෙරළ ඛාදනය පාලනය කිරීමේ වගකීම හා අභිමතය වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත පැවරී තිබේ. එබැවින්, වෙරළ කලාපය තුළ වෙරළ ස්ථාවර කිරීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී පාරිසරික බලපෑම තක්සේරු කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස්කොට තිබේ. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අරමුදල් සැපයෙන වෙරළ ආරක්ෂණ යෝජනා ක්‍රමවලදී මේ දක්වා ප්‍රතිපත්තියක් වශයෙන් ප්‍රමුඛතාවය ලබාදී ඇත්තේ පොදු යටිතල පහසුකම් ආරක්ෂා කිරීම (මහාමාර්ග/දුම්රිය මාර්ග සහ පාලම් වැනි දෑ) සඳහා වන අතර ඉන්පසුව පිළිවෙලින් පොදු උපයෝගීතා සහ ගොඩනැගිලි, වාසය කරන නිවාස, රජයේ ඉඩම් සහ පෞද්ගලික සහ වාණිජ ගොඩනැගිලි ආරක්ෂාව සිදුකෙරේ. වෙරළ ඛාදනය කළමනාකරණය සඳහා වූ ප්‍රධාන සැලැස්මේ දක්වා ඇති මාර්ගෝපදේශ හා නිර්ණායකවලට අනුකූල වේනම් පෞද්ගලික සහ රජයේ නියෝජිතායතනවලට වෙරළ ආරක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අවසර ලබාදෙනු ලැබේ. කළමනාකරණ ක්‍රියාමාර්ග සහ නෛතික යාන්ත්‍රණ ජාතික මට්ටමේදී ක්‍රියාත්මක වේ. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතට අනුකූලව, පුද්ගලික හා රජයේ නියෝජිතායතන යන දෙපාර්ශවය විසින් වෙරළ කලාපය තුළ දියත් කරන වෙරළ ආරක්ෂණ ඇතුළුව සංවර්ධන කටයුතු සඳහා

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි පාරිසරික බලපෑම් තක්සේරුවක් ඇතැම්විට අවශ්‍ය කෙරේ. වෙරළ කලාපයෙන් ඔබ්බට දිවෙන සංවර්ධන කටයුතුවලදී 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ 1988 අංක 56 දරන එහි සංශෝධිත පනතේ දක්වා ඇති පාරිසරික බලපෑම තක්සේරුවට අනුගතවීම අවශ්‍ය කෙරේ. නමුදු වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන විශේෂ අවධානිත කරුණු ද සැලකිල්ලට ගත යුතු ය. වෙරළ ස්ථායිතාවය කෙරෙහි ඍජුව හෝ ක්‍රම බලපෑම් ඇති කරන කැණීම්, ගොඩ කිරීම් සහ ජලපහරවල් හැරවීම වැනි කටයුතු පාලනය කිරීම සඳහා වැදගත්වන බොහෝ නියාමන යාන්ත්‍රණ සහ ආයතන පවතී.

### 2.3.2 ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන් (NDC) ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම (2021-2030)

දේශගුණික විපර්යාස මගින් වෙරළබඩ පරිසර පද්ධතිවල මනා පැවැත්ම සහ ආර්ථික වර්ධනය කෙරෙහි බරපතල තර්ජනයක් ඇති කරන අතර සංවර්ධනයේ ප්‍රතිලාභ අඩුකරවයි. ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාස සඳහා අනුගතවීමේ සූදානම අනුව 100 වැනි ස්ථානයේ ශ්‍රේණිගතවී සිටින අතර දේශගුණික විපර්යාස සඳහා අවදානම අනුව 60 වැනි ස්ථානයේ ශ්‍රේණිගත වී සිටියි (ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම 2021-2030). ක්ෂේත්‍ර නවයක් අතුරින් මෙම වෙනස්වීම්වලින් බලපෑමට ලක්වූ වඩාත් වැදගත් ක්ෂේත්‍රවලින් එකක් ලෙස වෙරළ හා සමුද්‍ර ක්ෂේත්‍රය හඳුනාගෙන තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම සෑම අවදානම් ක්ෂේත්‍රයකටම අදාළ රජයේ නියෝජිතායතන, විශේෂඥයන් හා අනෙකුත් පාර්ශවකරුවන් විසින් ක්‍රියාවට නැංවිය යුතු පියවර සඳහා ප්‍රමුඛතාවය ලබාදීම සඳහා වෙරළ හා සමුද්‍ර ක්ෂේත්‍රය ඇතුළුව මෙම ක්ෂේත්‍ර නවය, ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම තුළ හඳුනාගෙන තිබේ. ඒ අනුව, වෙරළ හා සමුද්‍ර ක්ෂේත්‍රය සඳහා ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම (2021-2030) යටතේ වගුව 2-11 දක්වා ඇති පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම්, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාළ නියෝජිතායතන විසින් 2021-2030 දක්වා කාලසීමාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගෙන තිබේ.

**වගුව 2- 10: වෙරළ හා සමුද්‍ර ක්ෂේත්‍රය සඳහා ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන්**

| |
|---|
| ▪ ශ්‍රී ලංකාව සඳහා මුහුදු මට්ටම ඉහළ යෑම නිරවද්‍ය අයුරින් පුරෝකථනය කිරීමේ පද්ධතියක් ස්ථාපනය කිරීම. |
| ▪ ශ්‍රී ලංකාවේ වෙරළබඩ තීරුව සඳහා යාවත්කාලීන කළ අවදානම් සහිත හා අවදානම් සිතියම් පිළියෙල කිරීම |
| ▪ ශ්‍රී ලංකාවේ දුම්රිය මාර්ගය ආශ්‍රිතව වඩාත් අවදානමක් දරන ප්‍රදේශවල වෙරළ ඛාදනය වැළැක්වීම සඳහා දෘඪ හා මෘදු ව්‍යුහමය විසඳුම්වල සංකලනයක් යොදාගනිමින් බලපෑමට ලක්වී ඇති වෙරළ තීරය ආවරණය වන පරිදි ප්‍රශස්ත වෙරළ තීර කළමනාකරණ කාර්ය/පියවර යොදාගැනීම. |
| ▪ දේශගුණික විපර්යාස බලපෑම් දරාගැනීමේ හැකියාව ගොඩනැංවීම සඳහා ඉහළ ප්‍රමුඛතාගත වෙරළබඩ හා සමුද්‍ර ස්වාභාවික ප්‍රදේශ හඳුනාගැනීම |

*මූලාශ්‍රය : පරිසර අමාත්‍යාංශය, ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම 2021-2030 (2023)*

### 2.3.3 වෙරළ ඛාදනය කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ගවල අනාගත ප්‍රවේශයන් සහ ප්‍රවණතා

වෙරළ ඛාදනය හා නිධිසාධනය ස්වාභාවික ක්‍රියාවලි වේ. එසේ වුව ද, මානව ක්‍රියාකාරකම් සහ ස්වාභාවික ආපදා හෝ වෙනස්වීම් හේතුවෙන් එම ස්වභාවික ක්‍රියාවලිය සඳහා බාධා ඇති වූ විට මෙම ස්වාභාවික සංසිද්ධිය ගැටලුවක් බවට පත්විය හැකි ය. මීට අමතරව, දුගීබව ව්‍යාප්තවීම සමගම සම්බන්ධ පවතින වෙරළ කලාපයේ වැඩිවන ජනගහනය සහ ඉහළ යන ආර්ථික වර්ධන වේගය ඔස්සේ ඉදිරි අනාගතයේ දී වෙරළ තීරය ඔස්සේ වෙරළ ඛාදනය කළමනාකරණය කිරීමේ දී ප්‍රධාන අභියෝග නිර්මාණය කරනු ඇත. එබැවින්, මෙරට වෙරළ ඛාදනය කළමනාකරණය කිරීමේ දී පහත කරුණු සම්බන්ධයෙන් සුපරීක්ෂාකාරී අවධානය යොමු කළ යුතු ය :

1. තවදුරටත් වෙරළ ඛාදනය සිදුවීමට ඉඩහැරිය නොහැකි වඩාත් වැදගත් ප්‍රදේශයන්හි දී පාදස්ථ වෙරළ ඉම පිහිටීමක් පවත්වා ගැනීම. සවිස්තරාත්මක අධ්‍යයනයක් ඔස්සේ පාදස්ථ වෙරළ ඉම පිහිටීමක් අවශ්‍ය කරන වෙරළ ඉම ඛණ්ඩ හඳුනාගත යුතු ය. ඍතුමය වශයෙන් වෙරළ ඉම විචලනයන් සඳහා ඉඩහැරීම සිදුකළ හැකි වුව ද අඛණ්ඩ ඛාදන තත්ත්වයන් වැලි පෝෂණය හෝ වෙනත් ආකාරවලින් කළමනාකරණය කළ යුතු ය.
2. දැනට පවතින වෙරළ ආරක්ෂණ පියවර මගින් සුවිශේෂී ආරක්ෂාවක් ලබාදෙන බව පවතින තොරතුරුවලින් අනාවරණය වේ.

3. වෙරළබඩ ප්‍රදේශවල වෘක්ෂලතාදිය පැවතීමෙන් බෑවුම් ස්ථායිතාවය වැඩිදියුණු වන අතර, අවසාදිත ඒකරාශී වීම හා වෙරළ වෙත ඇදී එන රළවල ශක්තිය හීන කරවීම හා වෙරළ තීරය ඛාදනයෙන් ආරක්ෂා කිරීම සිදුවන බවත් විද්‍යාත්මක සොයාගැනීම්වලින් අනාවරණය වේ.
4. වෙරළ ආරක්ෂණය සඳහා මෘදු විකල්ප කෙරෙහි පවතින ඉහළ ගිය නැඹුරුතාවය ප්‍රමුඛවෙමින් පවතින අතර එකී කරුණ වෙරළබඩ ක්‍රියාවලිය පිළිබඳ ඉහළ මට්ටමේ දැනුම සමග අනුකූල වේ.
5. යම්කිසි විකල්පයක කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සහ පාරිසරික හා ආර්ථික වශයෙන් පිළිගත හැකි වෙරළ ආරක්ෂණ පියවර ලබාදීම සඳහා ඇතැම්විට මෘදු හා දෘඪ යන විසඳුම් ද්විත්වයේම සංකලනයක් අවශ්‍ය වේ.
6. වෙරළ කලාපය තුළ ස්ථානගත වී ඇති ධීවර, සංචාරක හා අනෙකුත් ආර්ථික කටයුතු සඳහා දේශගුණික විපර්යාස සඳහා අනුකූලතාවයක් දක්වන තාක්ෂණයන් සහ සැලසුම් යොදාගැනීමේ අවශ්‍යතාවය.
7. 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ (සංශෝධන) පනත හරහා හඳුන්වා දී ඇති නෛතික විධිවිධාන ප්‍රකාරව, වෙරළ ඛාදනය පාලනය කිරීම සඳහා යෝග්‍ය පරිද්දෙන් බලපෑමට ලක්වූ ප්‍රදේශ සහ සංරක්ෂණ ප්‍රදේශ ප්‍රකාශයට පත්කළ යුතු ය.
8. විකල්පයක කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා සහ පාරිසරික හා ආර්ථික වශයෙන් පිළිගත හැකි වෙරළ සංරක්ෂණ පියවර සඳහා නව තාක්ෂණය (ජියෝ බෑග්) භාවිතා කිරීම ඇතැම් විට අවශ්‍ය වේ.
9. ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන් ක්‍රියාත්මක කිරීමේ සැලැස්මේ (2021-2030) නිශ්චිතව දක්වා ඇති වෙරළ හා සමුද්‍ර ක්ෂේත්‍රය යටතේ වන බැඳීම් ඉටු කිරීම සඳහා නිසි අවධානය යොමු කිරීම.

## 2.4 කළමනාකරණ අරමුණු, ප්‍රතිපත්ති, ක්‍රමෝපාය හා ක්‍රියාමාර්ග

**අරමුණ 1**
මෘදු විසඳුම්, මෘදු හා දෘඪ විසඳුම් ද්විත්වයේ සංකලනයක් හෝ දෘඪ විසඳුම්වලින් සමන්විත ප්‍රශස්ත වෙරළ තීර කළමනාකරණ කටයුතු/ පියවර ඔස්සේ වෙරළ ඛාදනය වැළැක්වීම සහතික කෙරේ.

**ප්‍රතිපත්තිය 1.1**

පෙර නිශ්චිත මට්ටමක වෙරළ තීරය පවත්වා ගැනීම (පාදස්ථ වෙරළඉම පිහිටීම -BSP)

**ක්‍රමෝපාය 1.1.1**

වෙරළඉම ඛාදනය වීම අවම කළයුතු ය.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. විද්‍යාත්මක අධ්‍යයනයක් ඔස්සේ වෙරළතීර කණ්ඩ ඉම සීමා ස්ථාපනය කිරීම.
2. වෙරළ ඉම සීමාකාලයත් සමග වෙනස් වන්නේ කෙසේ ද යන්න පිළිබඳ අධ්‍යයනයක් හරහා සෑම වෙරළ ඛණ්ඩ කොටසක් තුළම වෙරළ ඉම සීමා ස්ථාපනය කිරීම. වෙරළ ඛාදන බලපෑම් දරුණු වෙරළ ඛණ්ඩ සඳහා මෙය මුලින් සිදුකළ හැකි අතර ඉන් අනතුරුව අරමුදල් හා සම්පත් පවතින අවස්ථාවක දී අනෙකුත් ප්‍රදේශ සම්බන්ධයෙන් ද මෙය ඉටුකළ හැකි ය.
3. පූර්ව නිශ්චිත දිනයක දී පැවතීම අනුව නියමිත කාලාන්තරවලදී ඛාදනයට එරෙහිව සිදුකරන වෙරළ පෝෂණය වැනි යෝග්‍ය පියවර හරහා වෙරළෙහි ඛණ්ඩ සඳහා පාදස්ථ වෙරළඉම පිහිටීම ස්ථාපනය කිරීම.
4. ස්ථාපනය කරන ලද පාදස්ථ වෙරළඉම පිහිටීම පවත්වා ගැනීම සඳහා යෝග්‍ය පියවර ගැනීම.
5. නියමිත කාලාන්තරවල දි වෙරළ තීරයේ තත්ත්වය යාවත්කාලීන කිරීම වෙරළ ඛාදනය පාලනය කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා එමගින් රුකුලක් ලැබෙනු ඇත. පාදස්ථ වෙරළඉම පිහිටීම සඳහා ධාරණ පරාසයක් ඇති කිරීමෙන් සෘතුමය වෙරළතීර වෙනස්වීම් සඳහා අවස්ථාව සැලසේ.

**ක්‍රමෝපාය 1.1.2**

සංවර්ධන කාර්යයක් හේතුවෙන් වෙනස්වී ඇති වෙරළ තීරයක් නැවත සකස් කිරීම සංවර්ධකයාගේ වගකීම වේ.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. සංවර්ධන කාර්යයක් හේතුවෙන් ආසන්න වෙරළ තීරයේ වැලි ස්කන්ධය වෙනස් නොවන බවට සහතික කරගැනීම සඳහා යෝග්‍ය පියවර ගැනීම.

2. යෝජිත සංවර්ධන කාර්යය නිසා ස්වාභාවික වැලි සංසරණය කෙරෙහි බාධාවක් ඇතිවීමේ විභවයක් ඇති ස්ථානවල දී, පහළ වැලි ප්‍රමාණය වෙනස්වීමකින් තොරව පැවතීමට එකී සංවර්ධන සැලසුම සඳහා එම වැලි සංසරණය මාර්ගය මගහැර යා හැකි විකල්පයක් හෝ වෙනත් යෝග්‍ය යාන්ත්‍රණයක් ඇති බව සහතික කරගැනීම සඳහා යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

3. වෙරළ කලාපයේ සිදුකරන සංවර්ධන කටයුතුවල දී එකී කටයුතු නිම කිරීමෙන් අනතුරුව වෙරළ තීරයේ වෙනසක් තිබේදැයි සලකා බැලීම සඳහා සංවර්ධන කාර්යයන් සඳහා ඉඩ සලසන බලපත්‍ර ක්‍රමවේදයේ දී ඉදිකිරීම්/ ක්‍රියාත්මක කිරීම නිමා කරනු ලබන කාලසීමාවෙන් ඔබ්බට දීර්ඝ කරනු ලබන කාලසීමාවක් ආවරණය කළ යුතු ය. මෙය සමුද්‍ර ව්‍යුහ ඉදිකිරීම නිමා කිරීමෙන් පසුව එළඹෙන එකිනෙකට වෙනස් කාලගුණික ඍතු දෙකක් ආවරණය වන පරිදි වූ වසර දෙකක කාලසීමාවක් විය හැකි ය.

සංවර්ධන කාර්යය හේතුවෙන් වෙරළ තීරයේ සිදුවන වෙනස්වීම් අවම කිරීම සඳහා අවශ්‍යවන පියවර සංවර්ධකයා විසින් ලබාදෙන අරමුදල් භාවිතයෙන් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදුකළ යුතු ය.

**ක්‍රමෝපාය 1.1.3**

වෙරළබඩ සම්පත් ලබාගැනීමකින් අනතුරුව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සෑහීමකට පත්වන ආකාරයෙන් වෙරළ නැවත පෙර තිබූ තත්ත්වයට පත් කිරීම සහතික කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. ඛනිජ වැලි හා අනෙකුත් වෙරළ ද්‍රව්‍ය ඉවත් කිරීම අධීක්ෂණය හා නියාමනය කිරීම.
2. ඛනිජ හා අනෙකුත් සම්පත් ඉවත් කිරීමකින් අනතුරුව වෙරළ යථා තත්ත්වයට පත්වීම අධීක්ෂණය කිරීම.

**ප්‍රතිපත්තිය 1.2**

වෙරළ ඛාදන ප්‍රවණතා විශ්ලේෂණය කර හඳුනාගෙන සැලසුම්ගත ආකාරයෙන් වෙරළ ස්ථායිකරණය සිදුකරනු ලැබේ.

**ක්‍රමෝපාය 1.2.1**

වෙරළ ඛාදන ප්‍රවණතාවයන් හඳුනාගැනීම; පොදු හා පුද්ගලික දේපළ, ආර්ථික කටයුතු හා උපයෝගිතා සේම අවදානම් සහගත වාසස්ථාන සඳහා ඉහළ මට්ටම්වලින් පවතින ඛාදන හා තර්ජන මත පදනම්ව ආරක්ෂා කළ යුතු ප්‍රදේශ ප්‍රමුඛතාගත කිරීම; විධිමත් අධීක්ෂණ කාර්යපටිපාටි ක්‍රියාත්මක කිරීම සහ එක් එක් ස්ථාන සඳහා සුවිශේෂී වූ ආකාරයෙන් කළමනාකරණ මැදිහත්වීම් සම්පාදනය කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. ඉහළ ඛාදන මට්ටමකට බඳුන් වී ඇති හෝ බඳුන් වීමේ නැඹුරුතාවයක් ඇති උතුරු හා නැගෙනහිර වෙරළබඩ ඛණ්ඩය කෙරෙහි විශේෂ අවධානයක් යොමුකරමින් වෙරළ ඛාදන ප්‍රවණතා අධ්‍යයනය කිරීම හා හඳුනාගැනීම.
2. වෙරළබඩ තත්ත්වයන් පිළිබඳ තත්ත්ව වාර්තාවක් පිළියෙළ කිරීමට හැකිවන පරිද්දෙන් ප්‍රමුඛතා ප්‍රදේශ මත පදනම්ව අධීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ එය නියමිත කාලාන්තරවල දී යාවත්කාලීන කිරීම.
3. වෙරළ තීර කළමනාකරණ සැලසුම් යෝග්‍ය පරිද්දෙන් සැලසුම් කරන්නේ හා ක්‍රියාත්මක කරන්නේ කෙසේ ද යන්න පිළිබඳව මාර්ගෝපදේශ සකස් කිරීම.
4. නියමු ව්‍යාපෘති පදනමින් ප්‍රමුඛතා ස්ථාන සඳහා වෙරළ තීර කළමනාකරණ සැලසුම්කරණ ක්‍රියාවලි ආරම්භ කිරීම.
5. වෙරළ තීර කළමනාකරණ සැලසුම් සමග අනුකූලවන පරිදි වූ වෙරළ ආරක්ෂණ කටයුතු සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ හා පුද්ගලික ආයතනවලට අවසර දීම.
6. යම් ආකාරයක පාලන පියවර හඳුන්වා දී ඇති ප්‍රදේශවල නියමිත පරිදි සැලසුම් කරන ලද සැලැස්මක් පාදක කරගෙන දැනට පවතින වෙරළ ආරක්ෂණ නිර්මාණවල කාර්යය අධීක්ෂණය කිරීම හා එවැනි නිර්මාණ පවත්වාගෙන යෑම සඳහා පියවර ගැනීම.
7. වෙරළ තීර කළමනාකරණ සැලසුම් හරහා හඳුන්වා දී ඇති පොදු/විශේෂ මාර්ගෝපදේශ වෙරළ කලාපය තුළ ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාමාර්ග තුළ සුදුසු ස්ථානවලදී හඳුන්වා දීම.

**ප්‍රතිපත්තිය 1.3**

වෙරළ ඛාදනය පාලනය/ වෙරළ තීර කළමනාකරණය ප්‍රබල විද්‍යාත්මක/ ඉංජිනේරු තක්සේරුවක් පදනම් කරගෙන සිදුකෙරේ.

**ක්‍රමෝපාය 1.3.1**

ජාතික හා ජාත්‍යන්තර පර්යේෂණ නියෝජිතායතන හා විශ්වවිද්‍යාල සමග සහයෝගීතාවයෙන් වෙරළ ඛාදනය පාලනය හා කළමනාකරණය සඳහා අදාළ සියලුම විද්‍යාත්මක සහ සමාජ-ආර්ථික තොරතුරු එක්රැස් කිරීම, සංචය හා භාවිතා කිරීම සම්බන්ධයෙන් පහසුකම් සැලසීම සහ වෙරළ තීර කළමනාකරණය ප්‍රයත්නයන්වලදී එම තොරතුරුවලට පහසුවෙන් ප්‍රවේශවීම සඳහා දත්ත සමුදායක් සකස් කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. වෙරළ ඛාදනය ක්‍රමානුකූලව අධීක්ෂණය කිරීම සඳහා සහ අවසාදිත ශේෂයන් පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ අවසාදිත මූලාශ්‍ර පිළිබඳ තක්සේරු කිරීම, වෙරළබඩ ඛාදන ප්‍රවණතා සහ තත්ත්වය, නිවෙස් සඳහා තර්ජන, ඉඩම් පරිහරණය හා ඛාදනය සඳහා නැඹුරු තීරණාත්මක වාසස්ථාන, ජලමාන තත්ත්වයන් හා වෙරළබඩ කලාපයේ සමාජ-ආර්ථික ගති ලක්ෂණ පිළිබඳව විවිධ මූලාශ්‍රයන්ගෙන් ආශ්‍රිත දත්ත/ තොරතුරු රැස්කර ගැනීම සඳහා ජාතික වැඩසටහනක් ස්ථාපනය කිරීම (අදාළ පරිද්දෙන් විශ්වවිද්‍යාල සහ අනෙකුත් පර්යේෂණ නියෝජිතායතන සමග)

2. ක්‍රමානුකූල ආකාරයෙන් වෙරළ ඛාදනය අධීක්ෂණය කිරීම සිදුකරන සෑම ආයතනයකටම අදාළව කාර්යය, ස්ථාන, කාල ගණනය හා අනෙකුත් තොරතුරුවල ලැයිස්තුවක් සකස් කිරීම. වාර්ෂික අයවැය තුළ ඇතුළත් කිරීම හරහා අරමුදල් සුලබතාවය සහතික කිරීම සහ නියමිත කාලාන්තරවලදී අධීක්ෂණය කිරීම හරහා විධිමත් ක්‍රියාත්මක කිරීම සහතික කර ගැනීම.

3. ජලවිද්‍යාත්මක තත්ත්වයන්, ඉඩම් පරිහරණය, ඉතා වැදගත් වෙරළබඩ වාසස්ථාන පරිසර පද්ධති හා වෙරළබඩ කලාපයේ සමාජ-ආර්ථික ගති ලක්ෂණ පිළිබඳව ආයතනික අධීක්ෂණය හරහා සවිස්තරාත්මක දත්ත සමුදායක් ස්ථාපනය කිරීම හා පවත්වා ගැනීම.

4. (අ) වෙරළ ඛාදන කළමනාකරණය සඳහා අදාළ අන්තර්-ආයතනික දත්ත සමුදායක් (ආ) වෙරළ ඛාදනය හා ආරක්ෂණ තත්ත්වය පිළිබඳ සමීක්ෂණය ස්ථාපනය කිරීම. විධිමත් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා කවුරුන් විසින් කුමක් කරන්නේ ද, යන්න පිළිබඳ ලැයිස්තුවක් සකස් කිරීම.

5. මෙටා දත්ත සමුදාය වෙත ප්‍රවේශය සඳහා යෝග්‍ය යාන්ත්‍රණ (ඉහත සඳහන් කළ) සේම රජයේ හා පුද්ගලික නියෝජිතායතන හා පර්යේෂකයන් සඳහා ආයතනික දත්ත සමුදායන් සම්පාදනය කිරීම.

**ප්‍රතිපත්තිය 1.4**

නව සංවර්ධන අවස්ථාවන් සඳහා ඉඩ ප්‍රස්තා ඇතිවන පරිද්දෙන් හා වෙරළ තීරයේ ඉදිරිපස ප්‍රදේශයේ ආර්ථික විභවය වැඩිදියුණු කිරීම සඳහා දැනට පවතින වෙරළ සංරක්ෂණ පියවර යටතේ උග්‍ර වෙරළ ඛාදනයක් පවතින ඉහළ මට්ටමේ සංවර්ධනයක් හා හායනයක් සහිත ප්‍රදේශ සඳහා ගොඩකිරීමේ කටයුතු මගින් පිළියම් සෙවීම.

**ක්‍රමෝපාය 1.4.1**

ආර්ථික විභවය වැඩිදියුණු කිරීම සඳහා සංවර්ධන විභව්‍යයන්, වෙරළබඩ ආරක්ෂාව හා අවස්ථාව ලබාදීම සඳහා පාරිසරික වශයෙන් පිළිගත හැකි ගොඩකිරීමේ යෝජනා ක්‍රම, තෝරාගැනීමක් යටතේ හා ක්‍රියාවට නැංවීමේ ශක්‍යතාවයක් පවතින ස්ථානවල පමණක් ක්‍රියාත්මක කිරීම ඔස්සේ දැනට පවතින වෙරළ තීරයේ ඉදිරිපස ප්‍රදේශය පුළුල් කිරීමේ පියවර ප්‍රවර්ධනය කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. සංවර්ධන විභව්‍යයන් සහ අතිරේක ආරක්ෂණයක් සඳහා වෙරළ තීරයේ ඉදිරිපස ප්‍රදේශය ගොඩකිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම.

2. වෙරළ තීර නැවත සකස්වීමක් ප්‍රතිඵලවීම සීමාවීම සහ එම අරමුණ සමග අනුකූල සංවර්ධනය කිරීම් හරහා ආරක්ෂණ පිරිවැය යළි ලබාගත හැකි ස්ථාන සඳහා පමණක් ගොඩකිරීමේ කටයුතු සීමා කිරීම සහතික කිරීම සඳහා ගොඩකිරීමේ සැලසුම් සකස් කිරීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සැපයීම.

**ප්‍රතිපත්තිය 1.5**

වැලි ඉවත් කිරීම වළක්වාලමින් වැලි වැටිවල ස්ථායිතාවය වැඩිදියුණු කරන අතර වෙරළ ඛාදනය අවම කිරීම සඳහා වැලි වැටි මත පරිසරයට යෝග්‍ය/ ආවේණික වෘක්ෂලතාදිය වර්ධනය වීම ප්‍රවර්ධනය කිරීම.

**ක්‍රමෝපාය 1.5.1**

වැලි වැටි හා වැලි වැටි මත වැඩෙන වෘක්ෂලතාදිය මත අහිතකර ප්‍රතිඵල ඇතිකරන ක්‍රියාකාරකම් පාලනය කිරීම හා යම්කිසි ප්‍රදේශයක වැලි වැටිවල එම පරිසරයට ආවේණික වෘක්ෂලතාදිය හානිවී ඇත්නම් පාරිසරික වශයෙන් යෝග්‍ය/ ආවේණික වෘක්ෂලතාදිය එම වැලි වැටි මත නැවත වගාකිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. වැලි වැටි මතින් වැලි ඉවත් කිරීම තහනම් කිරීම, වැලි වැටි මත වැඩෙන වෘක්ෂලතාදියට හානි කෙරෙන ක්‍රියාකාරකම් පාලනය කිරීම.
2. වෘක්ෂලතාදිය විනාශ වී ඇති ස්ථානවලදී වැලි වැටි මත යෝග්‍ය වෘක්ෂලතාදිය නැවත වගා කිරීම.

**ප්‍රතිපත්තිය 1.6**

වෙරළ තීර කළමනාකරණ ක්‍රියාවලියේ දී ස්වාභාවික වෙරළ ගති ලක්ෂණවල ස්ථායිතාවය වැඩිදියුණු කෙරේ.

**ක්‍රමෝපාය 1.6.1**

වෙරළබඩ ස්වාභාවික ගති ලක්ෂණවල ස්ථායිතාවය වැඩිදියුණු කරන අතර වෙරළ ඛාදනයේ බලපෑම් අවම කිරීම සඳහා වෙරළ තීර කළමනාකරණ සැලසුම්/ වෙරළ ආරක්ෂණ යෝජනා ක්‍රම සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. වෙරළබඩ ස්වාභාවික ගති ලක්ෂණ කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් වෙරළ තීර කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය ප්‍රමුඛතා ප්‍රදේශ හඳුනාගැනීම.

**අරමුණ 2**

ස්වාභාවික වෙරළ තීරය සහ වෙරළබඩ ලක්ෂණ සංරක්ෂණය කිරීමට අනුකූලවන ලෙසින් වෙරළ කලාපය තුළ හා ඉන් පිටත සංවර්ධන කටයුතුවල ස්ථානය හා ආකාර සකස් කිරීම.

**ප්‍රතිපත්තිය 2.1**

ස්වාභාවික වෙරළබඩ ක්‍රියාවලින් සඳහා බාධාවක් ඇති නොවීම සහතිකවන පරිද්දෙන් වෙරළ කලාපය තුළ හා ඉන් පිටත සංවර්ධන කටයුතුවල සම්බන්ධීකරණය හා නියාමනය සිදුකරනු ලැබේ.

**ක්‍රමෝපාය 2.1.1**

වෙරළ කලාපය තුළ නියාමනය සිදුවන නව සංවර්ධන කටයුතු සඳහා පමණක් ඉදිකිරීම් හා වෙරළ සීමාව අතර තබාගත යුතු අවම ඉඩ පරතරය සම්බන්ධිත ප්‍රමිතීන්වලට අනුකූලව සහ ඛාදනය හා ගංවතුරට යටත් නොවන ප්‍රදේශ තුළ පමණක් අවසරය ලබාදීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. “අනුකූලතා අධීක්ෂණ සැලැස්මක්” සකස් කිරීම හා අවශ්‍යවන පරිද්දෙන් බලපත්‍ර අනුකූලතා අධීක්ෂණ සමාලෝචනයක් සිදුකර ඉදිකිරීම් හා වෙරළ සීමාව අතර තබාගත යුතු අවම ඉඩ පරතරය සම්බන්ධිත ප්‍රමිතීන්වලට අනුගතවීම බලාත්මක කිරීම.

2. වෙරළ ඛාදනය සහ ජල ගැලීම් සඳහා නැඹුරුතාවයක් ඇති ප්‍රදේශ හඳුනාගැනීම හා යෝග්‍ය මාර්ගෝපදේශ සම්පාදනය කිරීම.

3. ඉදිකිරීම් හා වෙරළ සීමාව අතර තබාගත යුතු අවම ඉඩ පරතරය පස සිටු සීමාව සම්බන්ධිත ප්‍රමිතීන්වලට අනුකූල නොවීම්වලට එරෙහිව අවශ්‍ය පරිද්දෙන් නෛතික ක්‍රියාමාර්ගවලට එළඹීම.

4. ඉදිකිරීම් හා වෙරළ සීමාව අතර තබාගත යුතු අවම ඉඩ පරතරය සම්බන්ධිත ප්‍රමිතීන්ට අදාළ රෙගුලාසි සම්බන්ධයෙන් ප්‍රාදේශික, ප්‍රාදේශීය හා පළාත් මට්ටමින් දැනුවත්බව වැඩි දියුණු කිරීම. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ඉහත සඳහන් කළ ප්‍රමිතීන්ට අදාළ විස්තර සහිත සමීප හා දුරස්ථ කර නිරීක්ෂණය කළ හැකි ආකාරයේ සිතියමක් ඇතුළත් කිරීම සඳහා වැඩසටහනක් දියත් කිරීම.

5. ඉදිකිරීම් හා වෙරළ සීමාව අතර තබාගත යුතු අවම ඉඩ පරතරය සම්බන්ධිත ප්‍රමිති, රෙගුලාසි හා මාර්ගෝපදේශවලින් සමන්විත සංවර්ධකයන් සඳහා වූ මාර්ගෝපදේශ අත්පොතක් සකස් කිරීම.

**ප්‍රතිපත්තිය 2.2**

වෙරළබඩ හා සමුද්‍රීය ඉදිකිරීම් මගින් වෙරළ කලාපය වෙත සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම සිදු කෙරේ.

**ක්‍රමෝපාය 2.2.1**

වෙරළබඩ හා සමුද්‍රීය ඉදිකිරීම් මගින් සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා පාරිසරික බලපෑම් තක්සේරුව/ මූලික පරිසර පරීක්ෂණ වාර්තාවල අධ්‍යයනයන්ට අනුව අවම කිරීමේ ක්‍රියාමාර්ග දියත් කිරීම (වෙරළ තීර කළමනාකරණ සැලසුම්වලට අනුකූලව සිදුකළ වෙරළතීර කළමනාකරණ ව්‍යුහ ඉදිකිරීම් හැර)

**යෝජිත ක්‍රියාමාර්ග**

වෙරළබඩ ඉදිකිරීම් හා වෙනත් යෝජනා ක්‍රමවලින් වෙරළ කලාපය වෙත ඇතිවන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා පාරිසරික බලපෑම් තක්සේරුව/මූලික පරිසර පරීක්ෂණ වාර්තාව හරහා නිර්දේශිත බලපෑම් අවම කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීම.

**ප්‍රතිපත්තිය 2.3**

වෙරළ කලාපයෙන් පිටතට සිදුකරන සංවර්ධන කටයුතුවල බලපෑම් විමර්ශනය කිරීම සහ "බලපෑමට ලක් වූ ප්‍රදේශ" ලෙස නම් කිරීමට යෝග්‍ය ස්ථාන නිර්ණය කිරීම.

**ක්‍රමෝපාය 2.3.1**

බලපෑමට ලක් වූ ප්‍රදේශ හඳුනාගැනීම සඳහා යෝග්‍ය නිර්ණායක සකස් කිරීම සහ පුළුල් ක්ෂේත්‍ර විමර්ශන සහ මහජන මත විමසුම් හරහා වෙරළ කලාපය තුළ හෝ ඊට ආසන්නව බලපෑමට ලක් වූ ප්‍රදේශ ලෙස නම් කිරීමට විභවයක් පවතින ප්‍රදේශවල ලැයිස්තුවක් සකස් කිරීම. අවශ්‍ය පරිදි එම "බලපෑමට ලක් වූ ප්‍රදේශ" ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත්කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. "බලපෑමට ලක් වූ ප්‍රදේශ" ලෙස ප්‍රකාශයට පත්කිරීම සඳහා යෝග්‍ය නිර්ණායක සහ එලෙස බලපෑමට ලක් වූ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කිරීම සඳහා යෝජිත ස්ථාන ලැයිස්තුවක් සකස් කිරීම.
2. "බලපෑමට ලක් වූ ප්‍රදේශ" පරිපාලනය සහ කළමනාකරණය සඳහා රෙගුලාසි සකස් කිරීම.

**ප්‍රතිපත්තිය 2.4**

අතිරේක ඉම පරතරයන්, ගොඩකිරීම් හා කෘත්‍රිම දූපත් ඇති කිරීම වෙරළ ඛාදනයට මුහුණදීම සඳහා යාන්ත්‍රණ ලෙස හඳුනා ගැනෙන අතර එමගින් වෙරළ කලාපයේ සංවර්ධනය කටයුතු මගින් ඇතිකරන පීඩනය අවම කෙරේ.

**ක්‍රමෝපාය 2.4.1**

අතිරේක ඉම පරතරයන්, දූපත් සහ ගොඩකිරීම් සිදුකිරීම සඳහා සුදුසු ප්‍රදේශ තීරණය කිරීම සඳහා තාක්ෂණික, පාරිසරික, සමාජ, ආර්ථික සහ දේශපාලන සාධක මත පදනම් වූ නිර්ණායක සකස් කිරීම.

1. අවසන් වශයෙන් සකස් කළ නිර්ණායක මත පදනම්ව, අතිරේක ඉම පරතරයන්, ගොඩකිරීම් සහ දූපත් සඳහා සුදුසු ස්ථාන ලැයිස්තුවක් සකස් කිරීම.
2. පාරිසරික, සමාජ, ආර්ථික බලපෑම් හා ඒවා අවම කිරීමේ ක්‍රියාමාර්ග හඳුනාගැනීම සඳහා පාරිසරික ඇගයීම් තක්සේරුව/ ක්‍රමෝපායික පාරිසරික ඇගයීම දියත් කිරීම.
3. දූපත් සහ අමතර ඉම පරතරයන් නිර්මාණය කිරීම සඳහා තාක්ෂණික මාර්ගෝපදේශ සකස් කිරීම.

**ප්‍රතිපත්තිය 2.5**

දූපත් වනාහි ඉතා හංගුර ආකාර භූගෝලීය සැකැසුම් වන හෙයින් ඒවායෙහි ස්වභාවික ගතික චර්යා රටාව පවත්වා ගැනීම.

**ක්‍රමෝපාය 2.5.1**

සංවර්ධන ක්‍රියාකාරකම් ඔස්සේ දූපත්වල ස්වභාවික ගතික චර්යා රටාව සම්බන්ධයෙන් බාධාවක් නොවන බවට සහතික කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. දූපත්වල වැලි සංචලනය සඳහා බාධා ඇති නොකරන ආකාරයේ සංවර්ධන කාර්යයන් සඳහා පමණක් අවසර ලබාදිය යුතු ය.

2. සමුද්‍රීය ව්‍යුහ/ ඉදිකිරීම් සැලසුම් කිරීමේ දී එම ව්‍යුහ පසුකර වැලි ගමන් කිරීමට ඉඩදෙන ආකාරයේ ව්‍යුහ/ ඉදිකිරීම් පමණක් සඳහා අවසර ලබාදීම/ ප්‍රවර්ධනය කිරීම සිදුකළ යුතු ය.
3. ගොඩනැගෙමින් පවතින හෝ විකාශනය වෙමින් පවතින දූපත්වල ස්ථාවරත්වය පිළිබඳ සවිස්තරාත්මක තක්සේරුවක් සිදුකිරීම.
4. ගොඩනැගෙමින් පවතින හෝ විකාශනය වෙමින් පවතින දූපත් කෙරෙහි සිදුවෙන බලපෑම් අවම කිරීම සඳහා යෝග්‍ය වෙරළ තීර කළමනාකරණ ක්‍රමෝපායක් සකස් කිරීම.

**අරමුණ 3**

වෙරළ කලාපය වෙත ලැබෙන හා ඉන් ඉවත්වන අවසාදිත ප්‍රමාණයේ සමතුලිතතාවයක් පවත්වාගැනීම ඔස්සේ වෙරළ ස්ථායිතාවය සහතික කෙරේ.

**ප්‍රතිපත්තිය 3.1**

ගංගා, ඇළ දොළ, වැව් ආදිය ඔස්සේ වෙරළ වෙත සිදුවන වැලි සැපයුමට බාධාවන ක්‍රියාකාරකම් නියාමනය කෙරේ.

**ක්‍රමෝපාය 3.1.1**

වෙන්කරනු ලබන කොටස්, වේලාවන් සහ ප්‍රදේශ සීමාවන් නිශ්චිතව දක්වන මාර්ගෝපදේශ ඔස්සේ ගංගා සහ ගංමෝයවල වැලි ගොඩදැමීමේ කටයුතු නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීමේ ක්‍රමානුකූල සැලැස්මවල් පැනවීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. අදාළ පාර්ශවකාර රජයේ ආයතන/ නියෝජිතායතන සමග සහයෝගීතාවයෙන් වෙරළ කලාපය තුළ මෙන්ම වෙරළ කලාපයෙන් ගොඩබිම දෙසට හා වෙරළ කලාපයෙන් මුහුද දෙසට (ගංගාවල ඉහළ ප්‍රදේශය ඇතුළුව) වැලිගොඩ දැමීම සම්බන්ධ මාර්ගෝපදේශ බලාත්මක කිරීම සඳහා ක්‍රමෝපායක් පිළියෙළ කිරීම.
2. යථෝක්තව සඳහන් කළ ක්‍රමෝපායට අනුව, නීති විරෝධි ආකාරවලින් සිදුකරන වැලි ගොඩදැමීම් අවම කිරීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් සමග සහයෝගීතාවයෙන් වෙරළ කලාපයේ හා රට අභ්‍යන්තර ගංගාවල වැලි ගොඩ දැමීමේ කටයුතු නියමිත කාලාන්තර තුළ පරීක්ෂා කිරීම සිදුකිරීම හෝ ඒ සඳහා පහසුකම් සැලැස්වීම.
3. බලපත්‍රලාභී වැලි කැණීමේ කටයුතුවල නියැලෙන පිරිස් විසින් මාර්ගෝපදේශවලට අනුගතවීම.
4. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වැනි අදාළ ආයතන සමග සහයෝගීතාවයෙන් මෙම ගැටලුව හා සම්බන්ධිත වර්තමාන වැදගත්කම හඳුනාගැනීම සඳහා වෙරළ කලාපය තුළ හා ඉන් පිටත වැලි ගොඩදැමීමට අදාළව සමීක්ෂණයක් සිදුකිරීම හා දත්ත රැස්කිරීම.
5. අදාළ රජයේ ආයතන, විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන සමග සහයෝගීතාවයෙන් තිරසර සීමා හා එක් එක් ස්ථාන සඳහා නිශ්චිත වූ වැලි තුලනයන් (දැනට සහතික කර ඇති අවසාදිත තුලනයන් භාවිතා කරමින්) අර්ථ දැක්වීම.

**ප්‍රතිපත්තිය 3.2**

ඉදිකිරීමේ කටයුතු සඳහා විකල්ප වැලි ප්‍රභව ප්‍රවර්ධනය කිරීම මගින් ගංගාවලින් වැලි ගොඩදැමීමේ කටයුතු අඩුවනු ඇත.

**ක්‍රමෝපාය 3.2.1**

ඉදිකිරීමේ කර්මාන්තයේ දී ගංගා වැලි වෙනුවට ප්‍රායෝගික විකල්ප වශයෙන් භාවිතා කළහැකි දෑ අනාවරණය කරගැනීම සඳහා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. ආයතන හා අදාළ පරිපාලන අංශ සමග සහයෝගීතාවයෙන් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වූ පර්යේෂණ දිරිමත් කිරීම සිදුකළ යුතු යː
   - ඉදිකිරීම් කටයුතු සඳහා වැලි භාවිතය අවම කිරීමේ නව තාක්ෂණ හඳුනාගැනීම.
   - ඉදිකිරීම් කර්මාන්තයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ගංගා වැලි වෙනුවට විකල්ප භාවිතා කිරීම වැඩි දියුණු කිරීම.

**ක්‍රමෝපාය 3.2.2**

ගංගා වැලි වෙනුවට විකල්පයක් ලෙස වෙරළට ඔබ්බෙන් ගැඹුරු මුහුදෙන් ලබාගන්නා වැලි භාවිතය ප්‍රවර්ධනය කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. විමර්ශනය කිරීම් ඔස්සේ වෙරළට ඔබ්බෙන් ගැඹුරු මුහුදෙහි ඇති යෝග්‍ය වැලි තැන්පතු සොයා ගැනීම.
2. පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල සහ පර්යේෂණ සඳහා අරමුදල් සපයන ජාතික ආයතන සමග සහයෝගයෙන් ඉදිකිරීම් කර්මාන්තයේ දී මුහුදු වැලි භාවිතය පිළිබඳ ශ්‍රී ලංකාවේ සහ වෙනත් ස්ථානවල පවතින සියලුම තොරතුරු සහ දත්ත රැස්කිරීම සහ මධ්‍යම දත්ත සමුදායක් සකස් කිරීම.
3. ඉදිකිරීම් කර්මාන්තයේ දී වෙරළට ඔබ්බෙන් ගැඹුරු මුහුදෙහි ඇති වැලි භාවිතා කිරීම සම්බන්ධයෙන් පිරිවැය වාසි අධ්‍යයනයක් සිදු කිරීම.
4. බලපෑම් පිළිබඳ තක්සේරුවලට අදාළව පවතින දත්ත හා ප්‍රතිඵල මත පදනම්ව, ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ රජයේ ආයතන, මාධ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සමග සහයෝගීතාවයෙන් ඉදිකිරීම් කර්මාන්තයට සහ වෙරළ වැලි පෝෂණය සඳහා වෙරළට ඔබ්බෙන් ගැඹුරු මුහුදෙහි පවතින වැලි භාවිතා කිරීමේ වාසි සම්බන්ධයෙන් දැනුවත් බවක් ඇති කිරීම.
5. මහජනතාව වෙත වැලි ලබා ගැනීමට පැවතීම සහතික කරගැනීම සඳහා වෙරළට ඔබ්බෙන් ගැඹුරු මුහුදෙහි පවතින වැලි ගොඩදැමීමේ හා ගබඩා කිරීමේ කටයුතුවල නියැලෙන අදාළ ආයතන සමග සම්බන්ධ වීම.
6. රැකියා මාර්ග අහිමිවන ගංගාවල වැලි ගොඩදැමීමේ කටයුතුවල නිරත වී සිටි තැනැත්තන් වෙනුවෙන් විකල්ප රැකියා සැපයීම සඳහා අන්තර් ආයතනික ප්‍රයත්නයන් සම්බන්ධීකරණය කිරීම.
7. රාජ්‍ය අංශයේ ඉදිකිරීම් කටයුතුවල දී වෙරළට ඔබ්බෙන් ගැඹුරු මුහුදෙහි වැලි භාවිතා කිරීම සඳහා රජයේ ආයතන දිරිමත් කිරීම.

**ප්‍රතිපත්තිය 3.3.**

මුහුදු හිරිගල්පර කැණීමේ කටයුතු තුරන් කිරීම ඔස්සේ වෙරළ ස්ථායිතාවය වැඩිදියුණු වේ.

**ක්‍රමෝපාය 3.3.1**

මුහුදු හිරිගල්පර කැණීමේ කටයුතු අඩු මට්ටමක පැවතීම හඳුනාගන්නා අතර, එකී කාර්යය සම්පූර්ණයෙන් නැවැත්වීම සහතික කරගැනීම සඳහා මුහුදු හිරිගල්පර කැණීමේ කටයුතු තහනම් කිරීම වඩාත් දැඩිව බලාත්මක කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. පොලීසිය සහ පළාත් පාලන ආයතන සමග සහයෝගීතාවයෙන් හිරිගල්පර කැණීම තහනම් කිරීම බලාත්මක කිරීම.
2. හිරිගල්පරවලින් ලබාගන්නා හුණු වෙනුවට විකල්ප ද්‍රව්‍ය හඳුනාගැනීම සහ එකී සම්පත් කැණීමේ කටයුතු සැලසුම් කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
3. හිරිගල්පරවලින් ලබාගන්නා හුණු වෙනුවට විකල්ප ද්‍රව්‍ය හඳුන්වාදීම ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ ආයතන සමග සහයෝගිතා යාන්ත්‍රණ සකස් කිරීම.

**ප්‍රතිපත්තිය 3.4**

අනාගත ඉල්ලුමට අනුකූලව ඉදිකිරීම් කටයුතු සහ අනෙකුත් කාර්යයන් සඳහා වෙරළට ඔබ්බෙන් ගැඹුරු මුහුදෙහි ඇති ප්‍රභව ඇතුළුව ප්‍රභවයන් පැවතීම සහ වැලි ප්‍රමාණය තීරණය කිරීම සඳහා ජාතික වැලි අධ්‍යයනයක් සිදුකිරීම ප්‍රවර්ධනය කිරීම.

**ක්‍රමෝපාය 3.4.1**

රට තුළ සිදුවෙමින් පවතින දැවැන්ත ආර්ථික සංවර්ධනය සහ ඉදිරි දස වසර සඳහා අපේක්ෂිත ආර්ථික සංවර්ධන ඉලක්ක අභිමුව ජාතික වැලි අධ්‍යයනයක් සිදුකිරීමේ වැදගත්කම පිළිබඳව වැඩසටහනක් දියත් කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. ජාතික වැලි අධ්‍යයනයක් හෝ වෙනත් අදාළ අධ්‍යයනයක් සිදු කිරීමේ අවශ්‍යතාවය අවධානයට යොමුකරමින් සංකල්ප පත්‍රිකාවක් සැකසීම.
2. ජාතික වැලි අධ්‍යයනයක් දියත් කිරීම හා එයින් සිදුකරන අනාවරණය කිරීම් ප්‍රතිපත්තිමය අවධානය සඳහා යොමු කිරීම.
3. භෞතික හා පාරිසරික බලපෑම් සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගැනීම සඳහා මීට පෙර වෙරළට ඔබ්බෙන් ගැඹුරු මුහුදු ප්‍රදේශයේ මහා පරිමාණ වශයෙන් වැලි කැණීමේ කටයුතු සිදුකළ ස්ථානවල තත්ත්වය අධීක්ෂණය කිරීම.

**අරමුණ 4**

වෙරළබඩ ලක්ෂණ, යටිතල පහසුකම් සහ වෙරළබඩ ප්‍රජාවන් මත වූ දේශගුණික විපර්යාසවල බලපෑම්වලට එරෙහිව ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම.

**ප්‍රතිපත්තිය 4.1**

වෙරළබඩ භූ ලක්ෂණ, යටිතල පහසුකම්, ජීවනෝපාය සහ වෙරළබඩ ප්‍රජාවන් කෙරෙහි දේශගුණික විපර්යාසවල බලපෑම අවම කිරීම සඳහා වන හදිසි සැලසුම් පවත්වා ගැනීම හා ඒවා නියමිත කාලයන් තුළ ක්‍රියාත්මක කිරීම.

**ක්‍රමෝපාය 4.1.1**

මුහුදු මට්ටම ඉහළ යාම, වෙරළ ඛාදනය, ගංවතුර, වෙරළබඩ ව්‍යුහයන් සහ අනෙකුත් වෙරළබඩ සංවර්ධනයන් මත වන දේශගුණික විපර්යාසවල බලපෑම් ප්‍රමාණනය කිරීම සහ අධීක්ෂණය කිරීම ඔස්සේ හදිසි සැලසුම් පියවර සකස් කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. මුහුදු දේශගුණික විපර්යාසවල වෙරළබඩ බලපෑම් පුරෝකථනය කිරීම සඳහා සුළං හා රළ ආකාර, වර්ෂාපතනය, මුහුදු මට්ටම ඉහළ යෑම ආදී වශයෙන් වූ දේශගුණික විපර්යාස පරාමිතීන් පිළිබඳ දත්ත අදාළ සියලුම ආයතනවලින් එක්රැස් කිරීම.
2. අදාළ රාජ්‍ය ආයතන සමග සහයෝගීතාවයෙන් වෙරළ කලාප කළමනාකරණයට අදාළ දේශගුණික විපර්යාස ලක්ෂණ පිළිබඳ දත්ත සමුදායක් ස්ථාපනය කිරීම.
3. දේශගුණික විපර්යාස, ඊට අදාළ විශේෂිත ලක්ෂණ සහ අවම කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ දත්ත සහ තොරතුරු ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර නියෝජිතායතන/ගෝලීය වැඩසටහන් සමග සම්බන්ධතා ඇති කර ගැනීම.
4. දේශගුණික විපර්යාසවල බලපෑම් විශ්ලේෂණය කිරීම සහ කාලෝචිත අනුවර්තන සහ අවම කිරීමේ ක්‍රියාමාර්ග සඳහා ක්‍රමයන් ස්ථාපිත කිරීම.
5. බලපෑම් අවම කිරීමට සහ කාර්යක්ෂම විසඳුම් ක්‍රියාමාර්ග සඳහා රුකුලක් වන පරිදි ස්වභාවික උපද්‍රවවල විද්‍යාත්මක හා සමාජීය පැතිකඩ සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන සමග සහයෝගීතාවයෙන් කටයුතු කිරීම සඳහා ඵලදායී යාන්ත්‍රණයක් සකස් කරගැනීම.
6. වෙරළ කලාපයේ ස්වභාවික උපද්‍රවවල බලපෑම් අවම කිරීමට සහ විසඳුම් ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය කෙරෙන අන්තර්-නියෝජිතායතන ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය කිරීම.
7. වෙරළ කලාපයේ ඛාදනය කළමනාකරණය සහ සංවර්ධනය කිරීමේදී මුහුදු මට්ටම ඉහළ යාම සහ අනෙකුත් දේශගුණික විපර්යාස බලපෑම් පිළිබඳ තථ්‍ය ඇස්තමේන්තු නියමිත පටිපාටියකට අනුකූලව සැලකිල්ලට ගන්නා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

**ප්‍රතිපත්තිය 4.2**

වෙරළ කලාපයේ දේශගුණික විපර්යාස බලපෑම්වලට අදාළව වියහැකි මුහුදු මට්ටම ඉහළ යෑම සහ සම්බන්ධ ප්‍රතිවිපාක සම්බන්ධ ගැටලු අවම කිරීම සඳහා දේශගුණික විපර්යාස අනුවර්තන පියවර ප්‍රවර්ධනය කිරීම.

**ක්‍රමෝපාය 4.2.1**

වෙරළ හා සමුද්‍ර ක්ෂේත්‍රය සඳහා ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම (2021-2030) යටතේ දක්වා ඇති දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීමේ ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. මුහුදු මට්ටම ඉහළ යෑමට අදාළව වඩාත් යථාර්ථය නිරූපිත මට්ටමක් ස්ථාපිත කිරීමට ප්‍රයත්න දැරීම.
2. මධ්‍ය ශතවර්ෂ සහ අග ශතවර්ෂ වශයෙන් වූ වෙරළ තීරයන් ස්ථාපනය කිරීම.
3. අදාළ නියෝජිතායතන සමග සහයෝගීතාවයෙන් වෙරළබඩ ධීවර කර්මාන්තය සහ ජලජීවී වගාව ඇතුළු වෙරළබඩ සංවර්ධනය සඳහා දේශගුණික විපර්යාසවලට අනුකූලවන මාර්ගෝපදේශ සැකසීම.
4. ජලයෙන් යටවීමේ අවදානම් සිතියම් හරහා මුහුදු මට්ටම ඉහළ යාම හේතුවෙන් වෙරළබඩ ජලයෙන් යටවන තත්ත්වයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම ඔස්සේ ඔවුන් එවැනි අවදානම් ප්‍රදේශවලට ගමන් කිරීම අධෛර්යමත් වීම සිදුවනු ඇත.

අරමුණ 5

ආන්තික වෙරළ උපද්‍රව හේතුවෙන් ඇතිවන බලපෑම් සහ වෙරළ ඛාදනය අවදානම අවම කිරීමේ දිගුකාලීන පියවරක් වශයෙන් වෙරළාශ්‍රිත ප්‍රජාවේ ඔරොත්තු දීමේ හැකියාව යොදාගැනීම.

ප්‍රතිපත්තිය 5.1

වෙරළබඩ උපද්‍රව සඳහා වැඩි නැඹුරුතාවයක් ඇති ප්‍රදේශ සම්බන්ධයෙන් ප්‍රජාව විසින් දැනුවත් බවට සහතික කරගැනීම තුළින් ඒ සඳහා සූදානම් බව සහතික වන අතර ආපදාවලින් නැවත යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය වේගවත් වීම.

ක්‍රමෝපාය 5.1.1

පෙර සිදුවීම් හා වෙරළබඩ අවදානම් දර්ශකය හරහා සිදුකරන පුරෝකථන මත පදනම්ව වෙරළබඩ කලාපයේ උපද්‍රව සඳහා නැඹුරුතාවයක් ඇති ප්‍රදේශ හඳුනාගැනීම සඳහා නිර්ණායක සකස් කිරීම.

යෝජිත ක්‍රියාමාර්ග

1. සම්පාදනය කළ නිර්ණායක මත පදනම්ව, වෙරළබඩ උපද්‍රව සඳහා නැඹුරුතාවයක් ඇති ප්‍රදේශ ලෙස නම්කළ යුතු ප්‍රදේශ හඳුනාගැනීම.
2. අවදානම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම.
3. අවදානම් අවම කිරීම හා අවදානම්වලින් නැවත යථා තත්ත්වයට පැමිණීම සඳහා අදාළ රාජ්‍ය ආයතනවල සහයෝගීතාවයෙන් එවැනි ප්‍රදේශවල වෙරළබඩ ප්‍රජාව අවදානම් සඳහා ඔරොත්තු දීම සඳහා වැඩසටහනක් ආරම්භකිරීම.
4. කඩාවැටිය හැකි වෙරළබඩ තද බැවුම්, චලනය වන භූමි කොටස් ආදී වශයෙන් අවදානම ඉතා ඉහළ මට්ටමක පවතින සහ ආපදාවලින් නැවත යථා තත්ත්වයට පැමිණීම අපහසු වශයෙන් සැලකෙන ස්ථානවල සංවර්ධන කටයුතු සිදුකිරීම අධෛර්යමත් කිරීම.

ආශ්‍රිත ග්‍රන්ථ


1. Abeyratne S.H (2023), Unregulated river sand mining in Sri Lanka' A way forward for sustainable river sand mining.
2. Byrne G. et al. 2002, Alternative for river sand, Unpublished report CRMP, 2002.
3. Byrne, G and Nanayakkara, A. 2002, Alternatives for River Sands, Final Report, unpublished, Coastal Resources Management Project.
4. Coast Conservation and Coastal Resources Management Department, 1986, Master Plan for Coastal Erosion Management.
5. Coast Conservation and Coastal Resources Management Department, 2004, Revised Coastal Zone Management Plan 2004.
6. Coast Conservation and Coastal Resources Management Department, 2014, Preparation of a Shoreline Status Report Covering Effectiveness of Structural and Non-structural Solutions Adopted by Coast Conservation Department since 2004.
7. Ministry of Environment (2021), Nationally Determined Contributions (2021-2030).
8. Ministry of Environment Sri Lanka, 2011, Climate Change Vulnerability Data Book.
9. Olsen et. al, 1992 “Coastal 2000" : A Resources Management Strategy for Sri Lanka's Coastal Region.
10. Oppenheimer, M., B. C. Glavovic J. Hinkel, R. van de Wal, A.K. Magnan, A. Abd- Elgawad, R. Cai, M. Cifuentes-Jara, R. M. DeConto, T. Ghosh, J. Hay, F. Isla, B. Marzeion, B. Meyssignac, and Z' Sebesvari, 2019 (Sea Level Rise and Implications for Low-Lying Islands, Coasts and Communities. In : IPCC Special Report on the Ocean and Cryosphere in a Changing Climate [H.-O. Pörtner, D. C. Roberts, V. Masson-Delmotte, P. Zhai, M. Tignor, E. Poloczanska, K. Mintenbeck, A. Alegría, M. Nicolai, A. Okem, J. Petzold, B. Rama, N.M. Weyer (eds.)] Cambridge University Press, Cambridge, UK and New York.
11. Sri Lanka Land Reclamation & Development Corporation' 2013' Quantity of offshore sand pumping for the requirement of construction industry of Sri Lanka from 2004 - 2013(Internal Records).

## 3 වැනි පරිච්ඡේදය - වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය සහ තිරසර කළමනාකරණය

### 3.1 වෙරළබඩ පරිසර පද්ධතීන්ගේ පාරිසරික, සමාජ හා ආර්ථික වැදගත්කම

විවිධත්වයෙන්යුතු පරාසයක දිවෙන වෙරළබඩ පරිසර පද්ධති ශ්‍රී ලංකාව සතු වන අතර, මීට ගං මෝය සහ කලපු (හෙක්ටයාර 214,522), කඩොලාන (හෙක්ටයාර 11,656), මුහුදු තෘණතලා (හෙක්ටයාර 37,137), ලවණ වගුරුබිම් (හෙක්ටයාර 27,520), හිරිගල්පර (නිශ්චය කර නොමැත) සහ බාධක වෙරළ ඇතුළත් විශාල වෙරළ තීරයන්, වැලි තුඩු (හෙක්ටයාර 5,731) සහ වැලි වැටි (හෙක්ටයාර 10,363) මීට ඇතුළත් වේ (භූගෝලීය තොරතුරු පද්ධතියේ දත්ත විශ්ලේෂණය මත පාදකවන දිස්ත්‍රික් වශයෙන් වෙන්වෙන් වශයෙන් මෙම පරිසර පද්ධතීන්ගේ වපසරිය වගුව 3.1 මගින් දැක්වේ).මෙම සෑම වෙරළබඩ පරිසර පද්ධතියක් සතුවම ජීවී විශේෂ සැලකිය යුතු සංඛ්‍යාවක් පවතින අතර මිනිසුන් සඳහා වැදගත් පරිසර පද්ධති සේවා රාශියක් සපයයි.මෙම පාරිසරික සේවාවන්ට අමතරව, වෙරළබඩ ප්‍රජාවන්ගේ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම හා සමාජ ඒකාග්‍රතාවය පවත්වා ගැනීම සඳහා මෙම පරිසර පද්ධති ඔස්සේ ඔවුන්ගේ ජීවනෝපාය සඳහා සුවිශේෂී ආකාරයෙන් සහාය වේ. ඉස්සන්, පොකිරිස්සන්, කකුළුවන්, මුහුදු කැකිරි, හක්ගෙඩි හා කවච හා අනෙකුත් මත්ස්‍ය නිෂ්පාදන අපනයනය මත පදනම්ව අපනයන කර්මාන්ත වැඩිදියුණු කිරීම සඳහා වෙරළබඩ පරිසර පද්ධති ආශ්‍රිත වෙරළබඩ හා වෙරළාසන්න සම්පත් රාශියක් මගින් රුකුලක් ලැබේ. මෙම ද්‍රව්‍ය අපනයන කිරීමෙන් 2015 වර්ෂයේ දී රු. මිලියන 24,716කට වැඩි ආදායමක් උපයා තිබේ (ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය, 2016).

මෙරට වෙරළබඩ සහ සමුද්‍ර ජෛව විවිධත්වයේ අනගි සංරචකයක් වශයෙන් වෙරළබඩ පරිසර පද්ධති ඇතුළත් වේ. දැනට පවතින තොරතුරු අනුව, සමුද්‍ර මත්ස්‍ය විශේෂ 1,800 කට අධික සංඛ්‍යාවක්, වෙරළ වෙත බිජුලෑම සඳහා පැමිණෙන කැස්බෑ විශේෂ 05ක්, මුහුදු ඌරන් ඇතුළුව නැතිවී යෑමේ තර්ජනයට මුහුණ පා සිටින හා දුර්ලභ සමුද්‍රීය ක්ෂීරපායි විශේෂ 38 ක් සහ තල්මසුන් වැනි මත්ස්‍ය විශේෂ 37ක් මෙම සමුද්‍ර හා වෙරළබඩ ජලයේ වාසය කරන හඳුනාගත් ජීවී විශේෂ යටතට ඇතුළත් වේ. මුහුදු නයි විශේෂ කිහිපයක් සහ කොරල්පර ආශ්‍රිත ජීවී විශේෂ විශාල සංඛ්‍යාවක් ද මෙම ප්‍රදේශවලින් හමු වේ. වෙරළබඩ පරිසර පද්ධතිය තුළ පවතින ජාන විවිධත්වය හා විභව්‍ය ආර්ථික වටිනාකම ද ඉහළ මට්ටමක පවතින බවට විශ්වාස කෙරේ. මීට අමතරව, වාණිජමය වටිනාකමක් සහිත විවිධ මත්ස්‍ය විශේෂ, ඉස්සන් හා කකුළුවන් වැනි කවචයින් හා මොලුස්කාවන් සඳහා අභිජනන සහ/හෝ වැඩෙන ස්ථාන වශයෙන් ද ගංමෝය සහ කලපු, හිරිගල්පර, කඩොලාන, මුහුදු තෘණතලා සහ ලවණ වගුරු ක්‍රියා කෙරේ.

හිරිගල්පර, කඩොලාන, ගංමෝය/ කලපු සහ වෙරළ තීරයන් වැනි වෙරළබඩ පරිසර පද්ධතිවල නිෂ්කර්ශනය කළ නොහැකි වටිනාකම (Non extractive value) ඉතා ඉහළ වන අතර සැලකිය යුතු ආර්ථික හා සෞන්දර්යාත්මක වටිනාකමක් ද පවතී. කුණාටු, ගංවතුර හා සුළිං සුළං වැනි කාලගුණික අවස්ථා සම්බන්ධ සංසිද්ධිවල දී රළ ක්‍රියාකාරීත්වය පසුබෑමට පත් කිරීම, ගංගා ඔස්සේ ගලා එන ජලය විසුරුවා හැරීම හා තාවකාලික ජලය ගබඩාකර ගැනීම වැනි කාර්ය ඔස්සේ ඒවායේ පූර්ණ බලය වළක්වාලමින් වෙරළබඩ ප්‍රජාවන් ආරක්ෂා කරමින් කලපු මහ ගං මෝය වැනි ජල ස්කන්ධ ආරක්ෂිත කලාප වශයෙන් ක්‍රියාත්මක වේ. නාගරික සහ කාර්මික අපජලය ඔස්සේ සහ අභ්‍යන්තර සහ වැසි ජලය සමග ගලා බසින දූෂක, අතිරික්ත පෝෂක සහ අවසාදිත ඇදගැනීම සඳහා විශාල පෙරහන් ලෙස කඩොලාන, මුහුදු තෘණතලා සහ ලවණ වගුරු වැනි පරිසර පද්ධති ක්‍රියා කරයි (මිත්තපාල, ශ්‍රියානි 2013). මෙම ස්ථාන කුඩා ධීවර යාත්‍රා රුඳවීම සඳහා හා වෙනත් බොහෝ ධීවර කර්මාන්තය ආශ්‍රිත කටයුතු සඳහා ද යොදා ගැනේ. දිවයින වටා පිහිටි වෙරළේ ආගමික, පුරාවිද්‍යාත්මක සහ ඓතිහාසික අගයකින් යුතු ස්ථාන පිහිටා ඇති අතර විශේෂයෙන් ධීවර ප්‍රජාව ද ඇතුළුව වෙරළබඩ ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් සඳහා නිවාස හා ගෙවතු සඳහා ඉඩ සලස්වයි.

වෙරළබඩ ප්‍රජාවන් සාම්ප්‍රදායිකව කඩොලාන වැනි වෙරළබඩ වෘක්ෂලතාදිය ආහාර පාන සැපයීම, නිවාස ඉදිකිරීමට සහ බෝට්ටු ඉදිකිරීම සඳහා දැව, දර, ධීවර උපාංග සැකසීමට අවශ්‍ය ද්‍රව්‍ය යනාදී වශයෙන් වූ විවිධ කාර්යය සඳහා භාවිතා කරයි. බොහෝ වෙරළබඩ පරිසර පද්ධති, විශේෂයෙන් හිරිගල් පර හා වැලි වැටි මගින් වෙරළ තීරය ස්ථාවර කිරීම සඳහා උපකාරි වේ. විශේෂයෙන් මෝසම් කාලයේ දී ප්‍රබල තත්ත්වයට පත්වන ඉහළ ශක්තියක් රැගත් රළ පහරෙහි ක්‍රියාකාරීත්වය විසුරුවා හරිමින් හිරිගල්පර වෙරළ ඛාදනය වැළැක්වීම සඳහා ස්වාභාවික බාධක ලෙස විශේෂයෙන් ක්‍රියාකරනු ලැබේ.

වගුව 3 - 1ः දිස්ත්‍රික්ක වශයෙන් වෙරළබඩ පරිසර පද්ධතිවල ව්‍යාප්තිය (හෙක්ටයාරවලිනි.)

| දිස්ත්‍රික්කය | කඩොලාන | ලවණ වගුරු | වැලි වැටි | වෙරළ බාධක, වෙරළ සහ වැලිකූඩු | කලපු සහ ගංමෝය | අනෙකුත් ජල ස්කන්ධ | මුහුදු තෘණ තලා |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | | - | - | - | - | 400 | - |
| කළුතර | 175 | - | - | 45 | 172 | 105 | - |
| ගාල්ල | 768 | 224 | - | 112 | 1,259 | 486 | - |
| මාතර | 66 | - | - | 338 | - | 101 | - |
| හම්බන්තොට | 793 | 1,270 | 1,623 | 325 | 1,346 | 2,213 | - |
| අම්පාර | 677 | 294 | 607 | 816 | - | - | - |
| මඩකලපුව | 2071 | 2781 | - | 1,093 | 44,132 | 2,273 | - |
| ත්‍රිකුණාමලය | 3369 | 1,365 | - | 337 | 18,100 | 1,192 | - |
| මුලතිවු | 824 | 722 | - | 717 | 5,377 | 352 | 2,054 |
| යාපනය | 2638 | 4,970 | 4,590 | 800 | 43,872 | 2,100 | 21,225 |
| කිලිනොච්චිය | 2226 | 5,943 | - | 872 | 8,123 | 76 | 509 |
| මන්නාරම | 1944 | 5,602 | 899 | 215.5 | 5,144 | 1,661 | 13,349 |
| පුත්තලම | 2784 | 1,557 | 2,644 | 328.6 | 83,581 | 3,003 | - |
| ගම්පහ | 713 | 1,274 | - | 36.7 | 3,416 | - | - |
| එකතුව | 19758 | 27,520 | 10,363 | 5,731.6 | 214,522 | 13,062 | 37,137 |

මූලාශ්‍රයः 1. Synthesis report on coastal habitats (2014) : 2. Premakantha K.T et al,. The Sri Lanka Forester, Vol. 41, 2022 01-12

### 3.1.1 වෙරළබඩ පරිසර පද්ධති

### හිරිගල්පර

*මත්ස්‍යයින්, අපෘෂ්ඨවංශිකයින් හා ඇල්ගේ ඇතුළු පරාසයක සමුද්‍ර ජීවීන් සඳහා සත්කාරකයක් වශයෙන් ක්‍රියාකරන්නා වූ හිරිගල්පර වනාහි මිහිමත පවතින වඩාත්ම විවිධත්වයෙන් හෙබි පරිසර පද්ධති අතුරින් එකකි. එමගින් විවිධ විශේෂ සඳහා වාසස්ථාන හා අභිජනන කටයුතු සඳහා භූමියක් සැපයෙන අතර විශේෂ අතුරින් බොහොමයක් ධීවර හා සංචාරක කටයුතු වලදී වාණිජමය වශයෙන් වැදගත් වේ. මෙම හිරිගල් පර ආරක්ෂා කිරීම ඔස්සේ ජෛව විවිධත්වය හා සමුද්‍රීය පරිසර පද්ධතියේ සමස්ථ යහ පැවැත්ම පවත්වා ගැනීම සඳහා රුකුලක් වේ.*

*රට තුළ හිරිගල් පර සංරක්ෂණය කිරීම පාරිසරික, ආර්ථික හා ප්‍රාදේශික ප්‍රජාවන්ගේ යහ පැවැත්ම සඳහා ඉතා වැදගත් වේ. මෙම පරිසර පද්ධතිවල තිරසර බව සහ ඒවායින් වත්මන් සහ අනාගත පරපුර වෙත හිමිවන්නා වූ ප්‍රතිලාභ සහතික කිරීම සඳහා සංරක්ෂණ ප්‍රයත්නයන් අත්‍යාවශ්‍ය වේ.*

ස්වාභාවික වාසභූමි ආකාර තුනකට ශ්‍රී ලංකාවේ හිරිගල්පර වර්ගීකරණය කර තිබේ. එනම් (අ) ජීවී කොරල් සේම කැල්සියම් කාබනේට් ද්‍රව්‍යවලින් සමන්විත සත්‍ය හිරිගල්පර (ආ) වැලිගල්පර සහ (ඇ) ගල් සහිත පර වශයෙනි. දෙවනුව හා තෙවනුව සඳහන් කර ඇති ආකාර ද්විත්වය ඇතැම්විට විවිධ මට්ටමින් හිරිගල්වලින් වැසී තිබිය හැකි ය. මෙම පරිසර පද්ධති ත්‍රිත්වය එකිනෙකින් වෙනස්වන නමුදු එකිනෙකට මිශ්‍රව ද දක්නට ලැබිය හැකි ය (රාජසූරිය සහ වයිට්, 1995). ශ්‍රී ලංකාව තුළ ගල් සහිත හිරිගල්පර විශේෂ 200කට අධික සංඛ්‍යාවක් සහ එම ගල්පර ආශ්‍රිතව මත්ස්‍ය විශේෂ 900කට අධික සංඛ්‍යාවක් ලේඛනගත වී ඇත. මීට අමතරව, පරිචිත වශයෙන් හුණුගල් පර තැනීමේ නිරතවන ප්‍රධාන ගණයන් නවයක් ද වාර්තා වී තිබේ. එසේම සමස්ත මුහුදු මත්ස්‍ය නිෂ්පාදනයෙන් 70% කට ආසන්න ප්‍රමාණයක් වෙරළබඩ ජලය හා ගල්පර වාසස්ථානවලින් ලැබෙන බව වාර්තා වේ (පෙරේරා එන්, 2019).

උපස්තර ආවරණය, විවිධත්වය හා හිරිගල්පර ජීවීන්ගේ සුලබතාවය සමග ප්‍රධාන වශයෙන් බද්ධ වී ඇති හිරිගල් පරයේ තත්ත්වය මගින් පෙන්නුම් කරනුයේ වෙරළට ඔබ්බෙන් මුහුදේ පවතින බාධක ආකාර හිරිගල්පර ආශ්‍රිතව වඩාත්ම හොඳ තත්ත්වයේ හිරිගල්පර පවතින බව යි. මෙවැනි හිරිගල් පර ප්‍රධාන වශයෙන් හමුවනුයේ වයඹ, ගිණිකොන හා නැගෙනහිර ප්‍රදේශවලිනි. ශ්‍රී ලංකාව තුළ වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇති හිරිගල්පර වනුයේ මන්නාරම් බොක්ක හා කල්පිටිය අර්ධද්වීපයේ බටහිර පෙදෙස තුළ හටගන්නා වයඹ වෙරළ හා වෙරළෙන් ඔබ්බට මුහුදේ පවතින කඩින් කඩ පවත්නා හිරිගල්පර ය. දිවයිනේ බස්නාහිර හා නැගෙනහිර වෙරළ ප්‍රදේශවලින් ද වෙරළේ සිට කිලෝමීටර් 15-20 දක්වා දුරින් සාමාන්‍ය වශයෙන් මීටර් 20ක් පමණ ගැඹුරින් මෙම කඩින් කඩ පවත්නා හිරිගල්පර වාර්තා වී තිබේ. නිරිතදිග, නැගෙනහිර හා උතුරු වෙරළ තීරයන්හි දී වෙරළට ආසන්නව මුහුදු පතුලේ සිට සාමාන්‍යයෙන් ගල්පරයක් මත වර්ධනය වන වෙරළාසන්න ගැටි හිරිගල්පර(Fringing Reef) පවතී. වෙරළ තීරයේ 2%ක පමණ ප්‍රදේශයක මෙම වෙරළාසන්න හිරිගල්පර පවතින බව ඇස්තමේන්තු කර තිබේ. දකුණු නිරිතදිග වෙරළ තීරයේ වෙරළාසන්න ගැටි හිරිගල්පර පවතින ප්‍රධාන ස්ථාන වනුයේ *හික්කඩුව, උණවටුන* සහ *රූමස්සල* ප්‍රදේශ වන අතර *පාසිකුඩා* ප්‍රදේශය නැගෙනහිර වෙරළ තීරයේ වෙරළාසන්න ගැටි හිරිගල්පර සම්බන්ධයෙන් ප්‍රසිද්ධ ස්ථාන අතුරින් එකකි. හිරිගල්පර යාපනය අර්ධද්වීපය අසල ප්‍රදේශයේ ද හටගන්නා අතර ඒවා ප්‍රධාන වශයෙන් පිහිටා ඇත්තේ වෙරළාශ්‍රිත කුඩා දූපත් වටා වන නමුදු මේවා හොඳින් වර්ධනය වී නොමැත. වෙරළට තරමක් දුරින් වෙරළට සමාන්තරව දිවෙන බාධක හිරිගල්පර සමන්විතවන අතර පුළුල් 'ගල්පර' කලපු නිර්මාණය වන බාධක හිරිගල්පර, ශ්‍රී ලංකාවේ දුර්ලභ වන නමුදු *වන්කලායි* හා *සිලාවතුර* ප්‍රදේශවල එවැනි ආකාර හිරිගල්පර හමු වේ. වැලිගල් පර වෙරළ තීරයේ බොහෝ තැන්වල ව්‍යාප්ත වී තිබේ. මේවායින් බොහොමයක් ස්ථානගත වී ඇත්තේ මහාද්වීපික තටකයේ මුහුදු පත්ලේ සමෝච්ච රේඛා (Bathymetric contours)සම-ගැඹුරු රේඛා ඔස්සේ ය. බටහිර වෙරළ තීරයේ කොළඹට දකුණින් සිට උතුරු නැගෙනහිර ප්‍රදේශයේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දකුණු ප්‍රදේශය දක්වා ගල් සහිත පර පවතී.

නැගෙනහිර හා උතුරු ප්‍රදේශවල පිහිටි හිරිගල් සමග සංසන්දනය කිරීමේ දී ප්‍රධාන වශයෙන්ම බාහිර බලපෑම් හේතුවෙන් දිවයිනේ දකුණු ප්‍රදේශයේ හිරිගල්පරවල හිරිගල් ප්‍රමාණය ඉතා අඩු මට්ටමක් පවතී. පතුලේ එලන දැල් භාවිතය වැනි හානිකර ධීවර ක්‍රම, කොරල්මත ඇවිදීම, ඩයිනමයිට් දැමීම, කොහු කර්මාන්තය, වීදුරු පතුල් සහිත බෝට්ටු සංචාරය, හානිකර ධීවර ක්‍රියාකාරීත්වයන් හා අවශ්‍ය මට්ටමට වැඩියෙන් අවසාදිත තැන්පත්වීම හා මිරිදිය ජලය ගලාඒම දකුණු වෙරළ කොටසේ හිරිගල්පර හායන තත්ත්වයට වගකිවයුතු වන ප්‍රධාන හේතු වේ (Synthesis Reporton Coastal Habitat 2014). එසේ වුව ද, *හික්කඩුව* ජාතික උද්‍යානයේ ජීවී හිරිගල් වැස්ම 2005 වර්ෂයේ පැවති 12% සිට 2007 වර්ෂයේ දී 26% දක්වා ඉහළ ගොස් ඇතිබව දැනට පවතින තොරතුරුවලින් අනාවරණය වී තිබේ. Pocillopora damicornis විශේෂයේ සීඝ්‍ර තැන්පත්වීම හා වර්ධනය මීට ප්‍රධාන හේතු වී ඇති අතර 2004 වර්ෂයේ දී ජීවී හිරිගල් වැස්මෙන් 6%ක් වූ මෙම විශේෂය, 2007 වර්ෂය වනවිට 35%ක් දක්වා වර්ධනය වී ඇත. එමෙන්ම, ඉහළ මට්ටමකින් අවසාදිත තැන්පත්වීම හේතුවෙන් Acropora ගණය මගින් ආවරණය වනුයේ 0.6%ක් පමණක් බවත් වාර්තා වේ (රාජසූරිය 2008). *කප්පරතොට* 2004 වර්ෂයේ දී 52%ක් වූ ජීවී හිරිගල් වැස්ම 2006 වර්ෂයේ දී 22% දක්වා අඩුවී තිබේ. කොහු කර්මාන්තය, විසිතුරු මසුන් රැස් කිරීම හා හිරිගල්පර මත ඇවිදීම වැනි මානව ක්‍රියාකාරීත්වයන් හේතුවෙන් පොල්හේන ප්‍රදේශයේ ජීවී හිරිගල් වැස්ම 21.2%කට සීමා වී අතර මඩිහ ප්‍රදේශයේ දී එය 6.45% කට සීමාවී ඇති බවද දැනට පවතින තොරතුරු අනුව වාර්තා වේ (Synthesis Report on Coastal Habitat 2014).

දකුණු පළාත සමග සන්සන්දනය කිරීමේ දී උතුරු හා නැගෙනහිර පළාත්වල හිරිගල්පර හොඳ තත්ත්වයක පවතින බව Synthesis Report on Coastal Habitat 2014 හි දැක්වේ. යාපනය අර්ධද්වීපයේ පුන්කුඩතිව් සහ මන්ඩතිව් දූපත්වලදී 29% ක හුනුගල් උපස්තරයක් සහිතවහිරිගල් වැස්ම 45%ක් ලෙස වාර්තා වී ඇත.(Synthesis Reporton Coastal Habitats 2014). ත්‍රිකුණාමලයේ ඕලන්ද බොක්ක ප්‍රදේශය හිරිගල්පරවල තත්ත්වය සාපේක්ෂව වශයෙන් හොඳ තත්ත්වයේ පවතින බවට වාර්තා වී ඇති අතර එය *Acropora* විශේෂ, *foliose Monitipora*, සහ *Echinpora lamellose* වලින් සමන්විත වේ. මීට පෙර සිදුකරන ලද අධීක්ෂණ වාර්තාවලට අනුව මෙම හිරිගල්පරවල ජීවී හිරිගල් වැස්ම 52%ක් සහ හිරිගල් කැබලි 20%ක් විය. 2004 වර්ෂයේ සුනාමි ව්‍යසනය ප්‍රතිඵලයක් වශයෙන්, මෙම හිරිගල්පරයට පුළුල් වශයෙන් හානි වූ අතර වර්තමානයේ සජීවි හිරිගල්පර 38.8% කින් සහ හිරිගල් කැබලි 40.23% කින් සමන්විත වේ. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පරෙවි දූපත ආසන්න නොගැඹුරු මුහුදේ හිරිගල් පරය ප්‍රධාන වශයෙන් සමන්විත වනුයේ අතු බෙදී ගිය *Acropora* විශේෂවලින් වන අතර 2004 සුනාමි ව්‍යවසනය හේතුවෙන් සිදුවූ හානි පිළිබඳ වාර්තා වී නොමැත. එබැවින් 2003 වර්ෂයේ දී 54.38%ක් සජීවි හිරිගල් වැස්ම 2005 වර්ෂය වනවිට 74.25%ක් දක්වා වර්ධනය වී තිබේ. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) විසින් සිදුකර ඇති අධීක්ෂණ අධ්‍යයනවලට අනුව, *කල්පිටිය* සමුද්‍ර උද්‍යානයේ සජීවි හිරිගල්පර වැස්ම 2004 වර්ෂයේ දී 40%ක් ව පැවත 2007 වර්ෂයේ මුල් භාගය වනවිට 70%ක් දක්වා වර්ධනය වී තිබේ. ජීවී හිරිගල්පරයෙන් 75%ක් පමණ සමන්විත වන Acropora Cytherea විශේෂයේ සීඝ්‍ර වර්ධනය මීට හේතු විය.

### මුහුදු තෘණතලා

*මුහුදු තෘණතලා නොගැඹුරු මුහුදු හා ගං මෝය ප්‍රදේශවල හොඳින් වැඩෙන මල්ඵල දරන ශාක වන අතර වසර මිලියන 65 - 100 ත් අතර කාල සීමාවකට පෙර නැවත සාගරය වෙත සංක්‍රමණය වී ඇති ගොඩබිම ශාක වලින් පැවතෙන ශාක වර්ගයකි. මෙම ශාකයන් ශාක පත්‍ර, කඳ, රයිසෝම සහ මුල් සහිත වේ. මුහුදු තෘණතලා බොහෝවිට හිරිගල්පර පරිසර පද්ධති හෝ ගං මෝය සහ කලපු සමග සංයුක්ත වී ඇති ආවරණය වූ ජල තලයන් තුළ බොහෝ විට දැකිය හැක.*

ශ්‍රී ලංකාවේ වෙරළබඩ ජලයෙහි මුහුදු තෘණතලා බහුලව ව්‍යාප්ත වී ඇති අතර ඒවා බොහෝවිට, හිරිගල්පර පරිසර පද්ධති හෝ ගං මෝය සහ කලපු ආශ්‍රිතව පවතී.මේවා විශේෂයෙන් පුත්තලම, මූන්දල, මීගමුව, මාවැල්ල, රැකව, කොග්ගල, කෝකිලායි, යාපනය සහ මඩකලපුව වැනි ගංගාධාර මෝය හා කලපු ආශ්‍රිතව දක්නට ලැබේ. ගණයන් 10කට අයත් මුහුදු තෘණ විශේෂ 16ක් පුත්තලම, මීගමුව, මූන්දල හා රැකව කලපුවලින් හමු වේ. ඕලන්ද බොක්කේ (කල්පිටිය) සිට යාපනය අර්ධද්වීපයේ

බටහිර කෙළවරට සහ මන්නාරමේ සිට පෝක් සන්ධිය හරහා වයඹ දෙසට ද ඉන්දියානු වෙරළේ රාමේස්වරම් දූපත් දක්වා ද මුහුදු තෘණතලා පුළුල් වශයෙන් ව්‍යාප්තව ඇතිබව වාර්තා වේ (සමරකෝන් සහ පින්තු 1988).එසේ වුව ද, ඊසානදිග සිට ගිනිකොණ දක්වා වෙරළ තීරයේ මුහුදු තෘණතලා ව්‍යාප්තිය සීමිත වන අතර ඒ සම්බන්ධයෙන් වාර්තා නොමැත.මේ අනුව, ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපයේ මුහුදු තෘණවල සමස්ත සංයුතිය සහ ව්‍යාප්තිය පිළිබඳ පැහැදිලි විස්තරයක් ලබා ගැනීම දුෂ්කර වී තිබේ.එසේ වුව ද, ශ්‍රී ලංකාවේ මුහුදු තෘණතලා ව්‍යාප්ත වී ඇති භූමි ප්‍රමාණය හෙක්ටයාර 23,819ක් ලෙස වාර්තා වී ඇත (ගුණතිලක සහ පිරිස 2008).

සමද්‍රිය ආවෘතබීජක මුහුදු තෘණ වනාහී ජලයේ ගිලී පවතින වඩාත් ඵලදායීතාවයෙන් යුතු පරිසර පද්ධති අතරෙහි ලා සැලකේ. මේවා සංකීර්ණ ආහාර ජාලයකට ශක්තිය සපයන මූලාශ්‍රයක් ලෙස ක්‍රියාකරන අතර, වඳ වීමේ තර්ජනයට මුහුණ දී ඇති මුහුදු ඌරන් සඳහා අපිශාකවලට ස්ථාවර වීමට අවසාදිත ඇතුළුව අනෙකුත් ජලජ ජීවින් සඳහා පරිසර පද්ධති සැපයෙන අතර, කාබනික ද්‍රව්‍ය නිෂ්පාදනය කෙරේ. තව ද මෙම මුහුදු තෘණතලා ජලජ ආහාර ජාලවල ද්‍රවණය වූ සහ අංශුමය කාබනික කාබන් මූලාශ්‍රයක් ද වේ. මීට අමතරව, මුහුදු තෘණතලා විශාල මත්ස්‍ය සංඛ්‍යාවකට, ඉස්සන් හා කකුළුවන් වැනි කවචයන්ට සහ මට්ටින්ට ස්වකීය වර්ගයා බෝකර ගැනීමේ ස්ථාන ලෙස ද ක්‍රියාකරන අතර බොහෝවිට ඔවුන්ගේ ජීවන චක්‍රයේ කීට අවධියේ දී එනම් විශේෂයෙන් ක්ෂණික පාරිසරික වෙනස්වීම්වලට සහ පරපෝෂිතයන්ගෙන් අන්තරායට ලක්විය හැකි අවධියේ දී මෙම පරිසර පද්ධති රැකවරණ ස්ථාන වශයෙන් ද ඔවුන් විසින් භාවිතා කරනු ලැබේ (සිල්වා ඊඅයිඑල් සහ පිරිස, 2013).ශ්‍රී ලංකාවේ රළු කෙඳි සහිත පණුවන් (Polychaetes) මුහුදු තෘණතලාවලින් ලබාගන්නා අතර එම පණුවන් ජලජීවී වගාවේ දී ආහාර වශයෙන් ලබාදෙයි. උෂ්ණත්වයට අමතරව ආලෝකය, පෝෂක, වැලි, මඩවලින් සමන්විත උපස්තරයක් සහිත ආවරණිත කලාපය මුහුදු තෘණතලා ඝනව වැඩීම සඳහා ඉතාමත් යෝග්‍ය අතර මෙම මුහුදු තෘණතලා විශේෂ විවිධත්වයෙන් යුතු ය. මුහුදු තෘණතලා මුහුදු ජලය සඳහා පෙරහන් ලෙස ක්‍රියාකරන අතර මුහුදු පතුල ස්ථායීකරණය ද සිදුකරයි. මීට අමතරව, මුහුදු තෘණතලා මගින් ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලියේ දී සාගරයෙන් කාබන්ඩයොක්සයිඩ් අවශෝෂණය කරගැනීම සිදු කරනු ලැබේ. (මිත්තපාලඑස්.2008)

විනාශකාරී ධීවර ආම්පන්න භාවිතයන්, අපෘෂ්ඨවංශීන් හෝ සිප්පි බෙල්ලන් රැස්කිරීම, භෞතික නිර්මාණ ඉදිකිරීම, උදම් රළ ගලා ඒම් වෙනස් කිරීම, කෘෂි රසායන ද්‍රව්‍ය ඇතුල්වීම, ඇල්ගී පිහිටීම, ජලය ඇතුළුවීම් පාලනය කිරීම,ඉස්සන් ගොවිපොළවලින් අපජලය සහ ඝන අපද්‍රව්‍ය මුදා හැරීම වැනි මානව ක්‍රියාකාරකම් හේතුකොට ගෙන මුහුදු තෘණතලා විවිධ තර්ජනයන්ට ලක් වී ඇත. ශ්‍රී ලංකාවේ විවිධ වෙරළබඩ ප්‍රදේශවල දක්නට ලැබෙන මුහුදු තෘණතලා විශේෂ 3.2 වගුව මගින් දැක්වේ.

**වගුව 3-2: ශ්‍රී ලංකාවේ විවිධ වෙරළබඩ ප්‍රදේශවල මුහුදු තෘණතලා විශේෂ**

| *විශේෂය* | *උතුර* | *දකුණ* | *බස්නාහිර* | *වයඹ* |
|---|---|---|---|---|
| *Cymodocea rotundata* | x | | | x |
| *Cymodocea serrulata* | x | | | x |
| *Enhalus acoroides* | x | | | x |
| *Halodule pinifolia* | x | | | |
| *Halodule uninervis* | x | | | x |
| *Halophila beccarii* | | | x | |
| *Halophila decipien* | | x | | x |
| *Halophila minor* | | | x | |
| *Halophila ovalis* | | x | x | x |
| *Halophila ovata* | x | x | | |
| *Potamogeton pectinatus* | | x | x | |
| *Naja marina* | | x | | |
| *Ruppia maritima* | x | x | x | |
| *Siringodium isoetifolium* | x | | x | x |
| *Thalassia hemprichii* | | | x | x |
| *Sostrea sp* | | x | | |
| එකතුව | 8 | 7 | 7 | 8 |

- ගං මෝය සහ කලපු

> ගංමෝය ලෙස හඳුන්වනුයේ මුහුද සහ ගංගා එක්වන ස්ථානයකි. කලපුවක් ලෙස හඳුන්වනුයේ බාධකයක් මගින් සාගරයෙන් වෙන් වූ නොගැඹුරු වෙරළබඩ ජල තලයකි. මෙම බාධක හිරිගල්පරයක්, බාධක දූපතක් වැලි වැටියක් විය හැකිය. උදම් මගින් ගෙන එනු ලබන මුහුදු ජලය ගංගා සහ ඇළ මාර්ග මගින් ගලා එන මිරිදිය සමග මිශ්‍ර වීම නිසා බොහෝවිට මෝය සහ කලපු ගතික පරිසර පද්ධති වේ.

ශ්‍රී ලංකාවේ වෙරළ තීරය ගං මෝය හා කලපු ගණනාවකින් යුතු වන අතර මේවා විවිධ වූ නිවර්තන තත්ත්වයන්, දැකුම්කලු දර්ශන, දුර්ලභ හා මෙරට ආවේණික විශේෂයන්ගෙන් පොහොසත්, ජලජ ජෛව විවිධත්වය සහ පරිසර පද්ධති ඵලදායීතාවයෙන් යුතු සංක්‍රාන්තික පරිසර පද්ධති වේ. ඒවා විවිධත්වයෙන් යුතු විශේෂ සහ කඩොලාන,ලවණ සහිත වගුරු බිම්,මුහුදු තෘණතලා සහ මඩ තට්ටු ඇතුළුව විවිධ වෙරළබඩ පරිසර පද්ධති අඩංගු සංකීර්ණ සමාජ-පාරිසරික පද්ධති වේ.කලපු සහ ගං මෝයවල විෂමජාතීය ස්වභාවය සහ සංකීර්ණත්වය මූලික වශයෙන් තීරණය වනුයේ භූ රූප විද්‍යාව, දේශගුණය සහ කාලගුණය, උදම් ප්‍රවාහ සහ ගංගා නිධි සහ ගොඩබිම පාදක කරගත් කටයුතු සමග ඒකාබද්ධ අන්තර්ක්‍රියා මගිනි (සිල්වා ඊ.අයි.එල් සහ පිරිස 2013). සමස්තයක් වශයෙන් ගත්කළ කලපු හා ගංමෝය මගින් සැපයෙන පරාසයක වූ පාරිසරික පද්ධති සේවා අඩු වශයෙන් තක්සේරු වී ඇති අතර ප්‍රතිපත්ති සම්පාදනයේ දී හා තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ මේවායේ බහුවිධ භාවිතය හා වාසි ප්‍රමාණවත් ආකාරයෙන් අවධානයට ලක්වී නොමැත. මූලික ලක්ෂණ හැරුන විට, කලපු සහ ගං මෝයවල පාරිසරික වැදගත්කම පිළිබඳ දැනුවත්බවද ඉතා සුළු වශයෙන් පවතී. කිලෝමීටර් 2,791ක මුහුදු තීරයක් (පරිමිතිය) සමග කලපු 82 ක් වෙරළ තීරයේ පිහිටා ඇති අතර මේවා ඉහළ ඵලදායිතාවයකින් යුතු බවට සැලකෙන අතර ජලජ හා අර්ධ-ජලජ වාසස්ථාන හා කඩොලාන ශාක ප්‍රජාව වැනි ජෛව නිෂ්පාදන ආශ්‍රිත ආර්ථික වටිනාකමක් ද අන්තර්ගත වේ. බාධකවලින් ගොඩනැගී ඇති ගං මෝය හා කලපු කළමනාකරණය සඳහා වන අර්ථවත් ප්‍රවේශයක් සඳහා ජෛව-භෞතික, සමාජ-ආර්ථික හා දේශපාලනික කරුණු ද එක්කළ යුතු ය. එනිසා, ගං මෝය හා කලපු සමාජ-පාරිසරික පද්ධති ලෙස සැලකේ (සමරකෝන් සහ පිරිස, 2012).

වගුව 3- 3: එක් එක් වෙරළ කලාපවල පිහිටි කලපු සංඛ්‍යාව

| *වෙරළබඩ කලාපය* | *කලපු ප්‍රදේශය (වර්ග කි.මී)* | *කලපු පරිමිතිය (කි.මී)* | *කලපු සංඛ්‍යාව* |
|---|---|---|---|
| උතුර | 804 | 1,221 | 17 |
| ඊසාන | 182 | 411 | 04 |
| නැගෙනහිර | 44 | 174 | 14 |
| ගිණිකොන | 29 | 149 | 16 |
| දකුණ | 23 | 109 | 10 |
| නිරිත දිග | 20 | 166 | 09 |
| බටහිර | 46 | 151 | 03 |
| වයඹ | 372 | 410 | 09 |
| එකතුව | 1,520 | 2,791 | 82 |

*මූලාශ්‍රය: සිල්වා ඊ.අයි.එල් සහ පිරිස 2013*

ආකාර දෙකක ගංමෝය පවතී; එනම් ගංගා ගංමෝය වලදී ගංගා හෝ ඇළ මාර්ගවල ජලය සාපේක්ෂ වශයෙන් පටු මාර්ගයක් ඔස්සේ කෙළින්ම මුහුද වෙත ගලා යන (කැලණි ගඟ, මහ ඔය, කළු ගඟ හා නිල්වලා ගඟ ගංමෝයවල්) අතර බාධක සහිත ද්‍රෝණි ගංමෝයවලදී මුලින් ගංගා හෝ ඇළ මාර්ගවල ජලය මුහුද වෙත ගලා යෑමට ප්‍රථමයෙන් සාපේක්ෂ වශයෙන් නොගැඹුරු ද්‍රෝණියකට ගලා එනු ලැබේ (උදා. පුත්තලම, මීගමුව, යාපනය, මඩකලපුව ගංමෝයන්). ඇතැම් ස්ථානවලදී, ගංගා ගංමෝය බොක්කක් වෙත විවෘත වන අතර එය මුහුද වෙත විවෘත වේ. (උදා. කලා ඔය ගංගා ගංමෝය ඕලන්ද බොක්කට විවෘතවීම, මහවැලි ගංමෝය කොඩ්ඩියාර් හා තඹලගම බොකු වෙත විවෘත වීම සහ පොලාතු මෝදර මෝය වැලිගම බොක්කට විවෘත වීම). සමස්තයක් වශයෙන්, ගං මෝය 45ක් පවතින අතර එයින් 28ක් ගංගා ගංමෝය ආකාර වන අතර 17 ද්‍රෝණි ආකාර වේ. රටෙහි ද්‍රෝණි ආකාර ගංමෝයවල මුළු වපසරිය හෙක්ටයාර 90,965ක් පමණ වන අතර

(ද්‍රෝණි ප්‍රදේශය පමණක්) ගංගා ගං මෝයවලින් හෙක්ටයාර 2,110ක් පමණ ආවරණය වේ. හෙක්ටයාර 3 සිට හෙක්ටයාර 7,589 දක්වා වපසරියකින් යුතු කලපු 82ක් පමණ පවතින අතර ඒවායින් 08කින් සෑම කලපුවකින්ම හෙක්ටයාර 1,000කට වැඩි ප්‍රමාණයක් ආවරණය වේ. කලපුවල සමස්ත ව්‍යාප්තිය හෙක්ටයාර 36,000ක් පමණ වේ. උතුර, දකුණ, ගිණිකොන හා නැගෙනහිර වෙරළවල කලපු වඩාත් සුලභව පිහිටා ඇති අතර සමුද්‍රීය රැළි හේතුවෙන් රැස්වෙන වැලිවලින් ගං මෝයවලදී බාධක හා වැලි තුඩු නිර්මාණය වීමට හේතුවන අතර ඒවා ඔස්සේ මිරිදිය ජලය ගලායෑම අඩු ය.

- ලවණ වගුරු

| |
|---|
| *එක්රැස්වන ලවණ ඉවත් කිරීම සඳහා ප්‍රමාණවත් මිරිදිය ජල සැපයුමක් නොමැතිවීම හේතුවෙන් පාංශු ලවණතාවය සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පවතින අන්තර් උදම් කලාපයේ ගොඩබිම් මායිමට ආසන්නතව ලවණ වගුරු දක්නට ලැබේ. ශුෂ්ක ප්‍රදේශවල වැලි සහිත හෝ උදම් මඩ සහිත තැනිතලාවල වර්ධනය වන පැළෑටි ආකාර, ලවණ ප්‍රතිරෝධී ශාකවලින් මෙම ලවණ වගුරු සමන්විත වන අතර ඒවා කලින් කල නිශ්චිත කාලවල දී මුහුදු ජලයෙන් යටවේ.* |

රට තුළ ලවණ වගුරු බිම් හෙක්ටයාර 27,520 ක් පමණ පවතින බව දැනට පවතින තොරතුරුවලින් අනාවරණය වේ (Synthesis Report on Coastal Habitats 2014). ව්‍යාප්තව පවතින ලවණ වගුරු බිම් මාන්තායි සිට වන්කාල දක්වා වූ වෙරළ තීරයේ මන්නාරම ප්‍රදේශයේ ද දක්නට ලැබේ. (උදම් රළ බලපෑමට හසුවන බිම්වල පවතින අතර වගුරු ශාක විශේෂ 56කින් පමණ සමන්විත වේ). හම්බන්තොට, පුත්තලම, කල්පිටිය හා මූන්දල වැනි අවසාදිත තැන්පත් වී ඇති කලපු/ ගංමෝය ප්‍රදේශවලද කඩින් කඩ ව්‍යාප්ත වී ඇති ලවණ වගුරු බිම් දක්නට ලැබේ.

- කඩොලාන

| |
|---|
| කඩොලාන යනු දැව ආකාර, බීජ දරන, ඉහළ මට්ටමකින් විශේෂණය වී ඇති පඳුරු සිට ඉතා උස ගස් දක්වා වූ පරාසයක විශාලත්වයකින් යුක්ත ශාක වේ. මෙම ශාක හා පඳුරු ලෝකයේ නිවර්තන කලාපීය සහ ඇතැම් උප - නිවර්තන කලාපීය රටවල අන්තර් උදම් කලාපයේ කලපු, ගංමෝය හා ආවරණය වූ බොකුවල වර්ධනය වීම සඳහා අනුවර්තනය වී තිබේ. බොකු, කලපු සහ ගමෝය ආශ්‍රිත අන්තර් උදම් කලාපයේ මඩ සහිත වෙරළෙහි අඛණ්ඩ ගලා යන ජල පහරවල්, වගුරු හා මිරිදියෙන් පෝෂිත නිශ්චල ජලය රැඳුන ස්ථාන හා ඒවායේ ශාක හා සත්ත්ව ජනගහනය ද ඇතුළුව ඉතා හොඳින් අනුවර්තනය වී ඇති ප්‍රධාන වශයෙන් දැව සහිත ලවණ ශාකවලින් කඩොලාන පරිසර පද්ධති සමන්විත වේ. |

කඩොලාන යනු කලපු ඇතුළුව වෙරළබඩ පරිසරවල අන්තර් උදම් කලාපවලට සීමා වී ඇති ඉහළ ඵලදායි එනමුත් අතිශයින් අවදානමට ලක්විය හැකි පරිසර පද්ධතියක් වේ. ප්‍රේමකාන්ත කේ.ටී. සහ පිරිස (2022)ට අනුව, ශ්‍රී ලංකාවේ කඩොලාන ප්‍රදේශය හෙක්ටයාර 19,758ක් පමණ වන අතර විශාලතම කඩොලාන කලාප හමුවනුයේ පුත්තලම කලපුව, කලා ඔය ද්‍රෝණිය හා ත්‍රිකුණාමලය ප්‍රදේශවලිනි (Sri Lanka Forester 2022).ශ්‍රී ලංකාවේ උදම්වල විචලනය අවම මට්ටමක පවතින අතර එය සෙන්ටිමීටර 75 ඉක්මවා යනුයේ ඉතාමත් කලාතුරකිනි. එබැවින් කඩොලාන කලපු, ගංමෝය හෝ ආශ්‍රිත දූපත්වල අන්තර් උදම් කලාපයේ පටු තීරයක් ලෙස සාමාන්‍යයෙන් පවතී.

එසේ වුව ද, කඩොලාන සියලුම අන්තර් උදම් කලාපවල නොපවතින අතර අඩු රළ ක්‍රියාකාරීත්වයක් ඇති ප්‍රදේශවලට සීමා වී පවතී. කඩොලාන මධ්‍ය අවම බාදිය මට්ටමින් කිලෝ මීටර 1 සීමාව ඉක්මවා ගොඩබිම දෙසට ව්‍යාප්ත වනුයේ කලාතුරකින් වන නමුත් ඇතැම් අවස්ථාවලදී ගංගාවලට කිවුල් දිය ඇතුළු වන ඉහළ සීමාව දක්වාත්, ඇතැම් ගංගාධර ගංමෝයවලදී කිලෝ මීටර් 20ක දුරක් දක්වාත් ව්‍යාප්තවී පවතී (උදා. කළුතර දිස්ත්‍රික්කයේ ගලතර). කඩොලානවල හැගෙන වටිනාකම් හා එමඟින් සිදුවන පාරිසරික සේවාවන්ට අමතරව, මත්ස්‍ය සම්පත්, ඉන්ධන වශයෙන් යොදා ගැනෙන දැව, ගොඩනැගිලි තැනීමේ ද්‍රව්‍ය සහ මාළු දැල් වර්ණ ගැන්වීම සඳහා ඩයි වර්ග ලබාදීම ඔස්සේ එමඟින් යැපෙන ප්‍රජාවන්ට රැකුලක් සපයයි(සිල්වා ඊ.අයි.එල් සහ පිරිස 2013).රට අභ්‍යන්තරයේ සිට වෙරළබඩ ප්‍රදේශයට ළඟා වන දූෂක ද්‍රව්‍ය ඉවත් කිරීමට සහ අවසාදිත රඳවා ගැනීමට පෙරහන් ලෙස ක්‍රියාකරන අතරම, ගංවතුර බලපෑම් අවම කිරීම ද කඩොලාන මගින් ඉටු වේ. එය වායුගෝලයෙන් කාබන් අවශෝෂණය කරගැනීමේදී ද වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන කඩොලාන ප්‍රදේශ යාපනය, වඩමාරච්චි (තොණ්ඩමනාර්) කලපු, කෝකිලායි, නයාරු, නන්තිකඩාල් කලපු, ත්‍රිකුණාමලය, කදිරවේලි, උප්පාරු කලපුව, වාලච්චේන, මඩකලපුව, පොතුවිල් (නැගෙනහිර වෙරළ), වැලිගම, ගින්තොට, බලපිටිය, බෙන්තොට (දකුණු වෙරළ), පානදුර ගංමෝය, මීගමුව සහ හලාවත කලපු, මුන්දල වැව, පුත්තලම කලපුව, ඕලන්ද බොක්ක, පෘතුගාල බොක්ක සහ මන්නාරම (බටහිර සහ වයඹ වෙරළ) ආශ්‍රිතව පිහිටා ඇත. සත්‍ය වශයෙන්ම පවතින කඩොලාන විශේෂ සම්බන්ධයෙන් පවතින වාර්තාවල පරස්පරතාවයක් පැවතිය ද, කඩොලාන විශේෂ 22ක් හඳුනාගෙන තිබේ. මෙම ප්‍රමාණය මගින් ලොව කඩොලාන විශේෂවලින් තුනෙන් එකක් පිළිබිඹු කරයි. හඳුනාගෙන පවතින විශේෂ අතුරින් ප්‍රධානතම විශේෂ වනුයේ *Avicennia marina" Lumnitzera racemosa" Rhizophora mucronata and Excoecaria agallocha* යන විශේෂයන් වේ.

- බාධක වෙරළ,වැලි තුඩු හා වැලි වැටි

බාධක වෙරළ යනු වෙරළ වෙත රළ මගින් රැගෙන එනු ලබන එකිනෙක බද්ධ නොවී පවතින අවසාදිත රාශියක් ජල ස්කන්ධයක් හරහා වැටී ඇති ස්වරූපයකට පත් වී එම ජල ස්කන්ධය මුහුදින් වෙන් කරන ආකාරයකි.

වැලි තුඩු යනු වෙරළෙහි සිට අවසාදිත ගසාගෙන යන ප්‍රමුඛ දිසාවට ඉදිරියට නෙරී පවතින එක් අන්තයක් නිදහස්ව පවතින මුල් අවස්ථාවේ පවතින බාධක වෙරළ වේ.

වැලි වැටි යනු සුළඟින් ගසාගෙන ගොස් එක්රැස්වන වැලි වන අතර මේවා ඊට ආසන්නව පවතින වෙරළ හා උදම් තලා වැනි භූරූප වලින් වෙනස් වනුයේ වැලි වැටි වලට උදම් රළෙන් බලපෑමක් ඇති නොවීම යන කරුණයි.

ශ්‍රී ලංකාවේ කිලෝමීටර් 1,620 ක් පමණ වූ වෙරළ තීරයේ පුළුල් හා වැලි සහිත වෙරළ තීරයන් ඒවායෙහි දර්ශනීයබව සඳහා ප්‍රසිද්ධ වී ඇති අතර විශේෂිත වෙරළාසන්න සත්ත්ව හා වෘක්ෂලතාවල පැවැත්මට රුකුලක් වේ. වෙරළ තීරයේ තැන්පත් වන අවසාදිත එක්රැස් වීමෙන් වෙරළවල් නිර්මාණය වී තිබේ. ඒවා අතුරින් ඒවායේ වෙනස් වන සුළු ස්වභාවය හේතුවෙන් වඩාත්ම සියුම් හා අවදානමට ලක්වනුයේ බාධක වෙරළ, වැලි තුඩු සහ වැලි වැටි ය.

- බාධක වෙරළ

කළපු හා වගුරු බිම් මුහුදෙන් වෙන් කරන බාධක වෙරළවල් දිවයින වටා පිහිටි වෙරළ ප්‍රදේශවල පවතී (උදා. රැකව, කොස්ගොඩ හා පානම පිහිටි වෙරළවල්). බාධක වෙරළවල් ප්‍රධාන වශයෙන් හමුවනුයේ නිරිත දිග වෙරළේ බෙන්තොට හා බලපිටිය අතර වේ. දකුණු වෙරළ තීරයේ වැලිගම බොක්ක අසල බාධක වෙරළක් පවතින අතර දෙවුන්දර හා අම්බලන්තොට අතර ද බාධක වෙරළවල් කිහිපයක් තිබේ. කොඩ්ඩියාර් බොක්කේ බටහිර දෙසට පිහිටි කලපුව කොටසේ වන තඹලගමුව බොක්ක සම්පූර්ණයෙන්ම බාධක වෙරළක් ලෙස වෙන්වී පවතින අතර, මෙය ඊසාන දිග මෝසම් සමයේ දී අර්ධ වශයෙන් බිඳී යයි. ඇතැම් බාධක වෙරළවල් දෙකෙළවරම නිදහස්ව පවතින අතර එමගින් දූපත් නිර්මාණය වේ (උදා. කාර්තිව්).

- වැලි තුඩු

දිවයිනේ බටහිර සහ නැගෙනහිර වෙරළ තීරයේ වැලි තුඩු බොහෝවිට නිරීක්ෂණය වන අතර ඒවා මෝය හා සම්බන්ධව පවතී.මීගමු මෝයේ කලින් කල ගොඩනැගෙන දිය යට වැලිපරය සහ කළු ගං මෝයේ පවත්නා වැලි තුඩුව මීට නිදසුන්වේ. කල්පිටියේ දක්නට ඇති ආකාරයට ඇතැම් බාධක වෙරළවල් සහ වැලි තුඩු ආශ්‍රිතව ව්‍යාප්තව පැතිරී ඇති වැලි වැටි පවතී. බොහෝ වැලි තුඩු අස්ථායි බවට දිස්වෙන අතර, විශේෂයෙන් මෝය දෙසට නෙරා ඇති වැලි තුඩු මෙසේ අස්ථායි වේ (උදා. කළුගඟ වැලි තුඩුව).ඒ නිසාවෙන්, මේවායේ පිහිටීම කලින් කලට වෙනස් වන අතර, එමගින් මුවදොරෙහි හැඩය හා නිශ්චිත ස්ථානයෙහි ද වෙනස් වීම් ඇතිවේ. නිදසුනක් වශයෙන් මඩකලපු ගං මෝයෙහි මුවදොර, එය වර්තමානයේ පවතින උතුරු දෙසට වීමට ස්ථානගතවී ඇත්තේ ඊට කිලෝමීටර් 5 ක් පමණ දකුණින් පෙර පිහිටි ස්ථානයක සිටය. ඇතැම් මෝයකටවල් ආශ්‍රිතව සමහර කාලවල දී පමණක් වැලි තුඩු නිර්මාණය වන අතර, එමගින් ස්වාභාවික ජලය ගලා යෑමේ රටාවන්වලට බාධා පමුණුවාලීමට ප්‍රයත්න දරන හෙයින් බොහෝවිට පහත් බිම් ජලයෙන් යටවීම ප්‍රතිඵල වේ. (උදා. කළු ගඟ සහ මහ ඔය මෝයවල).

- වැලි වැටි

වැලි වැටි යනු සාගරය සහ මහාද්වීපය අතර අන්තර් කලාපයේ පිහිටි සුවිශේෂී වූ ගොඩබිම් පරිසර පද්ධතියකි. මෙම පරිසර පද්ධති ස්වභාවයෙන්ම ගතික වන අතර, එබැවින් මේවා බොහෝ සෙයින් හානිවන සුළු අතර මානව ක්‍රියාකාරකම්වල බලපෑම්වල අවදානමට ලක්වේ.

රට තුළ හඳුනාගෙන ඇති වැලි වැටි ආකාර තුනකි. ඒවා වනුයේ:

- මීටර් 01ට වඩා උසින් අඩු පහත්, සමතලා ස්වරූපයේ සිට සුළු වශයෙන් උස් පහත් වීමක් සහිත, හුදකලා ස්වරූපයේ වැලි වලින් සෑදී ඇති වේදිකා (උදා. කොග්ගල, මාතර, අකුරල සහ උස්වැටකෙයියාව ප්‍රදේශවල පිහිටි මුල් අවස්ථාවේ පවතින වැලි වැටි)
- උස මීටර් 05 ඉක්මවා යන, ස්ථාවර වෙරළවල් ආශ්‍රිතව උස් පහත් වීමක් සහිත හරස්ව වැටුණු ඒකල වශයෙන් පිහිටි ප්‍රාථමික වැලි වැටි (උදා. මන්නාරම, පුනරීන්, කල්පිටිය හා ගිණිකොණ දිග වෙරළ දිගේ පවතින වැලි වැටි)
- සාමාන්‍යයෙන් උස මීටර් 03 ඉක්මවා යන සීමා අතික්‍රමණය වූ ද්විතීක වැලි වැටි (උදා. මන්නාරම, පුනරීන්, කල්පිටිය හා යාපනය ප්‍රදේශවල වැලි වැටි), මේවායින් බොහොමයක් අන්වායාම ලෙස පිහිටන අතර, ඇතැම් ඒවා පාරවලයික(Parabolic) හැඩය ගන්නා අතර සීමිත සංඛ්‍යාවක් හැඩයෙන් සංකීර්ණ වේ.

ශ්‍රී ලංකාවේ වඩාත් කැපී පෙනෙන වැලි වැටි ඊසාන දිග, වයඹ සහ ගිණිකොන දිග වෙරළ තීරය ඔස්සේ පිහිටා තිබේ. මේවා මන්නාරම දූපත හරහා මුලතිවු සහ පේදුරු තුඩුව, අලිමංකඩ සහ වාවකච්චේරි සිට කල්පිටිය හා අඹකන්දවිල දක්වා ව්‍යාප්ත වේ. ගිණිකොන දිග වෙරළ තීරයේ දී, හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට (ගොඩවාය) සිට අම්පාර දිස්ත්‍රික්කයේ සංගමන් කන්ද තුඩුව දක්වා විහිදේ. අවසාන වශයෙන් සඳහන් කරන ලද වෙරළ තීරයේ පිහිටි වැලි වැටි, සමකයට ආසන්නව ලොව පිහිටි දිගම වැලි වැටි තීරය ලෙස හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකාවේ වැලිවැටි වෙරළබඩ දර්ශනයේ සහ ජෛව විවිධත්වයේ අත්‍යවශ්‍ය අංගයන් වේ. මෙම වැලි වැටිවල පවතින ද්‍රව්‍ය මගින් ඊට පසුපසින් පිහිටි භූමිය කුණාටු හේතුවෙන් සිදුවෙන ඛාදනයෙන් හා සිදුවීමේ විභවයක් පවතින මුහුදුමට්ටම ඉහළ යෑමෙන් ආරක්ෂා කරනු ලබයි. වැලි වැටිවල පවතින වෘක්ෂලතා දී ශාකනය මගින් වැලි රඳවා ගන්නා අතර රට අභ්‍යන්තරයට ගසා ගෙන යාම වළක්වයි. උදම් රළ සහ කුණාටු අවස්ථාවන්හීදී රට අභ්‍යන්තර ප්‍රදේශ ජලයෙන් යටවීම වැලි වැටි මගින් වළක්වනු ලැබේ. දැනට පවතින තොරතුරු අනුව, 2004 වසරේ ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපයට බලපෑ සුනාමි රළට එරෙහිව වඩාත් ඵලදායි බාධකයක් ලෙස ක්‍රියාකර ඇත්තේ සම්පූර්ණ වශයෙන් පැවති වැලි වැටිය(බඹරදෙනිය සහ පිරිස,2006).

### 3.2 වෙරළබඩ පරිසර පද්ධතිවල වර්තමාන තත්ත්වය

මෙරට රජය, රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සංවිධාන විසින් ක්‍රියාත්මක කරන ලද කළමනාකරණ පියවර මධ්‍යයේ වුව ද, අතීතයේ දී ශ්‍රී ලංකාවේ වෙරළබඩ පරිසර පද්ධතිවලින් සැලකිය යුතු සංඛ්‍යාවක් විවිධ ස්ථානවලදී විවිධ මට්ටම්වලින් හායනයට පත්වී ඇති අතර සම්පත් ප්‍රමාණය මෙන්ම ඒවා පැතිර ඇති වපසරිය ද පෙර නොවූ විරූ වේගයකින් අඩුවීම මෙමගින් ප්‍රතිඵල වී තිබේ. පැහැදිලිව දෘශ්‍යමාන වන්නා වූ වෙරළබඩ පරිසර පද්ධති මෙලෙස හායනයට ලක්වීමට බලපාන ප්‍රධාන කරුණ වනුයේ මේවා බොහෝ සෙයින් හානිවන සුළු වීම සහ ස්වාභාවික හේතු සහ මානව මැදිහත්වීම් යන හේතු ද්විත්වයම නිසා ගොඩබිම හා සාගරයේ සිදුවන බොහෝ ගතික ක්‍රියාවලින්ට මේවා ගොදුරුවීම යි. මෙම සාධක කාණ්ඩ තුනකට වර්ග කළ හැකි ය. පළමුව, ආර්ථික, ප්‍රතිලාභ යන අරමුණ උදෙසා වෙරළබඩ ප්‍රදේශයන්හි ජනගහන වර්ධනයට සමගාමීව ප්‍රමාණය ඉක්මවා සම්පත් භාවිතා කිරීම හේතුකොට පරිසර පද්ධතිවල ගුණාත්මකභාවය සහ ප්‍රමාණය පහත වැටීම යි. දෙවනුව,වෙරළබඩ ඛාදනය, සුළි සුළං (1978), සුනාමි (2004) හා "එල්නිනෝ" බලපෑම (1998) වැනි ස්වාභාවිකව කාලයක් මුළුල්ලේ සිදුවන සහ නියමිත කාලාන්තරවලදී ඇතිවන වෙරළබඩ ව්‍යසනයන් මගින් වෙරළබඩ කලාපය තුළ පිහිටා ඇති බොහෝ වෙරළබඩ පරිසර පද්ධතීන් වෙත සෘජුවම අහිතකර බලපෑමක් කරන ලදී. තෙවනුව, 2009 වර්ෂය දක්වා රට තුළ වසර තිහක් පමණ පැවති ගැටුම්කාරී වාතාවරණය ඔස්සේ ඇතැම් පරිසර පද්ධති වෙත ඉහළ හානියක් සිදුවුණු අතර විශේෂයෙන් උතුරු සහ නැගෙනහිර වෙරළබඩ කලාපයේ මෙය ඇතිවිණි.

#### 3.2.1 ගැටලු සහ තර්ජන

- **හිරිගල්පරවලට හානිවීම හා විනාශ කිරීම**

සමාජයට ප්‍රතිලාභ ගෙනදෙන හිරිගල්පර මගින් සැපයෙන පාරිසරික සේවාවන් ඉතා වැදගත් වන අතර ශ්‍රී ලංකාවේ නොගැඹුරු මුහුදේ පවත්නා වටිනාම සාගර පරිසර පද්ධතිය ලෙස හිරිගල්පර හඳුනාගෙන ඇත. එසේ වුව ද, මෙම හිරිගල්පර වර්තමානයේ දී ස්වභාවික හේතු සහ මානව සහ බලපෑම් මත බොහෝ ස්ථානයන්හි දී හායනයට ලක්ව ඇත. මෙලෙස හායනයට ලක්වූ හිරිගල්පර පරිසර පද්ධති බස්නාහිර සහ දකුණු වෙරළ තීරයන්හි විශේෂයෙන් වෙරළට ආසන්න ප්‍රදේශවල දැකිය හැකි ය. 2004 වර්ෂයේ මුහුණ දීමට සිදුවූ සුනාමි ව්‍යසනයට පෙර හිරිගල්පර විනාශ වීමට බලපෑ මූලික හේතුව වූයේ හුණු කර්මාන්තය සඳහා මහා පරිමාණයෙන් හිරිගල්පර ඉවත් කිරීමයි. හිරිගල් කැණීම, එකතු කිරීම, ප්‍රවාහනය, පිරිසැකසුම් කිරීම සම්බන්ධයෙන් 1988 වර්ෂයේ දී පැනවූ තහනම මධ්‍යයේ වුව ද මෙම කටයුතු සිදුවිය. දැනට පවතින තොරතුරු අනුව, මුහුදු හිරිගල්පර කැණීමේ කටයුතුවල පැහැදිලි අඩුවීමක් 1984 සහ 1998 අතර කාලය තුළ සිදු වී ඇත. සුනාමි ව්‍යසනයෙන් අනතුරුව, දකුණු හා නිරිතදිග වෙරළ කලාපයේ හුණු කර්මාන්තය සඳහා හිරිගල්පර කැණීමේ කටයුතු සැලකිය හැකි මට්ටමකට විශාල වශයෙන් අඩුවී ඇත. නියාමන පියවර හැරුන විට, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද මහජන දැනුවත් කිරීම් හා අධීක්ෂණ කාර්ය පටිපාටි සේම වෙරළබඩ ප්‍රජාවන් තුළ හිරිගල්පරවල වැදගත්කම සම්බන්ධයෙන් ඇති වූ ස්වයං අවබෝධය මෙම තත්ත්වයට හේතු විය.

කාලයත් සමගින් හිරිගල්පර හායනය වීමේ ස්වභාවය හා ප්‍රධාන හේතු වෙනස් වී ඇති අතර, වර්තමානයේ දී හිරිගල්පර විනාශවීම සඳහා දායකවන ප්‍රධාන සාධක ලෙස වෙනත් සාධක ඉස්මතු වී තිබේ. මෙම සාධක අතරට, ඩයිනමයිට් දැමීම වැනි විනාශකාරී ආකාරවල මසුන් ඇල්ලීමේ ක්‍රම, සුරතල් මසුන් ඇල්ලීම සඳහා මොක්සි නෙට් භාවිතා කිරීම, පොකිරිස්සන් ඇල්ලීම සඳහා හිරිගල්පර මත පතුල් දැල් එලීම වැනි ක්‍රම වාර්තා වී තිබේ. එමෙන්ම, "සුරුක්කු" හා "ලයිලා" දැල් වැනි නීතිමය අවසරයක් නොමැති ධීවර ආම්පන්න භාවිතය හේතුවෙන් හිරිගල්පර මත වාසය කරන අවදානමට පත්වී ඇති සහ දුර්ලභ මත්ස්‍ය විශේෂ අඩුවී යයි. තවද, අවසාදිත තැන්පත්වීම, දූෂණය හා සංචාරක කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් හේතුවෙන් ද හිරිගල්පර විනාශ වේ.

වෙරළබඩ සංචාරක කර්මාන්තයේ වර්ධනය ද සෘජු සහ අනියම් ආකාරවලින් හිරිගල්පර සඳහා හානි සිදුකරන අතර මෙය වැඩි වශයෙන් බලපානුයේ දකුණු, වයඹ, හා නැගෙනහිර වෙරළ කලාපයේ ය. හිරිගල්පර මත ඇවිදීම, හිරිගල්පර පවතින ප්‍රදේශවල නැංගුරම්ලෑම, වීදුරු පතුල සහිත බෝට්ටු හිරිගල්පර මත හැප්පීම සහ සිහිවටන වශයෙන් හිරිගල්පර රැස් කිරීම වැනි කරුණු හේතුවෙන් සෘජුවම වාසස්ථාන නැතිවීම හෝ විනාශවීම පිළිබඳව මෙම ප්‍රදේශවලදී පැහැදිලිව දැකිය හැකි ය.

මානව මැදිහත්වීම් හැරුනවිට, 1988 වර්ෂයේ දී බොහෝ ප්‍රදේශවල උද්ගත වූ "එල්නිනෝ"("El Nino˜ Southern Oscillation)සංසිද්ධියේ බලපෑම ආශ්‍රිතව ඉහළ ගිය සාගර ජල උෂ්ණත්වය හේතුවෙන් මහා පරිමාණ වශයෙන් හිරිගල්පර විරංජනයවීම හේතුවෙන් වඩාත් නොගැඹුරු ප්‍රදේශවල හිරිගල්පර හානිවීම දක්නට ලැබිණි. මෑත වසරවල දී, එල්නිනෝ සංසිද්ධි වඩාත් බහුලව සිදුවීම ආරම්භ වූ අතර මෙම සංසිද්ධිය සිදුවීමේ කාලසීමාව වසර 12 සිට වසර 07 දක්වා අඩුවී තිබේ. එනමුත් මෙම ප්‍රවණතාවය සහතික කිරීම සඳහා කාල රාමුව ප්‍රමාණවත් නොවේ. දැනට පවතින තොරතුරු අනුව, 1998 සිදුවූ තරම් බරපතල මට්ටමක නොවුණ ද, 2000, 2002, 2003 හා 2005 වර්ෂවලදී දිවයිනේ විවිධ පළාත්වල සැලකිය යුතු මට්ටමේ විරංජනය සිදුවීමේ සිද්ධි වාර්තා විය (Synthesis Report 2014). එසේ වුව ද, 2002 වර්ෂයේ දී දකුණු පළාතේ සිදුවූ විංරජන සිද්ධියේ විශාලත්වය 1998 විරංජන සිදුවීමට සමාන ලෙස සැලකේ (Synthesis Report 2014). මීට අමතරව, පසැගිල්ලා (*Acanthaster planci*) වැනි හිරිගල්පර විලෝපීයන් වසංගත ආකාරයෙන් පුළුල් වශයෙන් පැතිරීයාම මගින් ද හිරිගල්පර විශාල වශයෙන් විනාශ විය. ප්‍රමාණය ඉක්මවා ධීවර කටයුතු සිදුවන සහ/හෝ ගොඩබිම ප්‍රදේශවලින් පෝෂක ගලායෑම ඉහළ බවට සාක්ෂි පවතින ඉහළ මට්ටමක ජනගහණයක් පවතින ප්‍රදේශවලට ආසන්නව මෙවැනි වසංගත තත්ත්වයන් වැඩි වශයෙන් වාර්තා විණි. විලෝපීය ගැස්ට්‍රො පොඩ් මොලුස්කාවෙකු වන *Drupella* විසින් හිරිගල් සඳහා සිදුකළ හානි සම්බන්ධයෙන් ද බොහෝ වාර්තා තිබේ. මෙවැනි විලෝපිකයන්ට අමතරව, ඇතැම් ප්‍රධාන හිරිගල්පර ආශ්‍රිතව බහුලව වැඩී ඇති ඇල්ගී වර්ධනයක් (*halimeda Sp*) ද නිරීක්ෂණය වේ. මෙම තත්ත්වය විශේෂයෙන් පරෙවි දූපත හා පොල්හේනේ හිරිගල්පර ආශ්‍රිතව දක්නට ලැබේ. මෙවැනි ආක්‍රමණශීලී විශේෂයන්ගේ පැතිරීම හිරිගල්පරවල පාරිසරික තුලනයට බලපාන ප්‍රධාන විභව්‍ය අවදානමක් ලෙස වර්තමානයේ දී හඳුනාගෙන තිබේ. මෙරට බටහිර පෙදෙසේ හිරිගල්පරවලට හානි සිදුකළ ආක්‍රමණික විශේෂ මෙරටට හඳුන්වාදී ඇත්තේ භාණ්ඩ නෞකා මගින් මුදාහරින ජලය හෝ නැව් කඳ හෝ නියමිත දැනුවත් කිරීමකින් තොරව මුදා හරින ජලජ නිදර්ශක මගින් බවට සැක කෙරේ (Synthesis Report on Coastal Habitats 2014). හිරිගල්පර හායනය සඳහා හේතුවන ප්‍රාදේශික සාධක හා වෙරළ කලාපයේ ජීවී කොරල් වැස්මේ ව්‍යාප්තිය වගුව 3-4 සහ 3-5 මගින් දැක්වේ.

**වගුව 3- 4: හිරිගල්පර විනාශවීම සඳහා හේතුවන ප්‍රාදේශික සාධක**

| *කලාපය* | *ප්‍රාදේශික සාධක* | *විනාශයේ විශාලත්වය* |
|---|---|---|
| *වයඹ කලාපය* | | |
| සිල්වතුරේ, අරිප්පු, වන්කාලයි හා මහා බාධක කොරල් පරය (බා රීෆ්) | විනාශකාරී මසුන් ඇල්ලීමේ ක්‍රම | ඉහළ/ ඉතා ඉහළ මට්ටම |
| | හිරිගල් පර මත දැල් දැමීම | ඉහළ මට්ටම |
| | අවසාදිත තැන්පත්වීම | පහළ මටට්ම |
| | අධික ලෙස මසුන් ඇල්ලීම | ඉතා ඉහළ මට්ටම |
| | මුහුදු කුඩැල්ලන්/ හක්ගෙඩි රැස් කිරීම | ඉතා ඉහළ මට්ටම |
| | | |
| | සංචාරක කර්මාන්තය/ විනෝදාස්වාද කටයුතු | පහළ මට්ටම |
| | දූෂණය | මධ්‍යස්ථ මට්ටම |
| *නැගෙනහිර කලාපය* | | |
| පාසිකුඩා, කල්කුඩා, පුන්නායිකුඩා, කායන්කර්නි, පරෙවි දූපත, කුච්චවේලි | විනාශකාරී මසුන් ඇල්ලීමේ ක්‍රම | මධ්‍යස්ථ මට්ටම |
| | හිරිගල් පර මත දැල් දැමීම | මධ්‍යස්ථ මට්ටම |
| | අවසාදිත තැන්පත්වීම | මධ්‍යස්ථ මට්ටම |
| | මසුන් ඇල්ලීම | මධ්‍යස්ථ මට්ටම |
| | මුහුදු කුඩැල්ලන්/ හක්ගෙඩි රැස් කිරීම | ඉහළ මට්ටම |
| | සංචාරක කර්මාන්තය/ විනෝදාස්වාද කටයුතු | ඉහළ මට්ටම |
| | දූෂණය | ඉහළ මට්ටම |
| *උතුරු කලාපය* | | |
| පේදුරුතුඩුව, ඉන්බාසිටි, තොණ්ඩමනාරු, වලිතුන්ඩාල්, කරෙයිනගර්, පුන්ගුඩතිවු, කයිට්ස්, ඩෙල්ෆ්ට් | | |
| | විනාශකාරී මසුන් ඇල්ලීමේ ක්‍රම | ඉහළ මට්ටම |
| | හිරිගල් පර මත දැල් දැමීම | මධ්‍යස්ථ මට්ටම |

| *කලාපය* | *ප්‍රාදේශික සාධක* | *විනාශයේ විශාලත්වය* |
|---|---|---|
| | අවසාදිත තැන්පත්වීම | පහළ මට්ටම |
| | මසුන් ඇල්ලීම | |
| | මුහුදු කුඩැල්ලන්/ හක්ගෙඩි රැස් කිරීම | ඉහළ මට්ටම |
| | සංචාරක කර්මාන්තය/ විනෝදාස්වාද කටයුතු | පහළ මට්ටම |
| | දූෂණය | පහළ මට්ටම |
| *දකුණු කලාපය* | | |
| හික්කඩුව, රුමස්සල, වැලිගම, මිරිස්ස, පොල්හේන | විනාශකාරී මසුන් ඇල්ලීමේ ක්‍රම | ඉහළ මට්ටම |
| | හිරිගල් පර මත දැල් දැමීම | මධ්‍යස්ථ මට්ටම |
| | අවසාදිත තැන්පත්වීම | ඉහළ මට්ටම |
| | මසුන් ඇල්ලීම | |
| | මුහුදු කුඩැල්ලන්/ හක්ගෙඩි රැස් කිරීම | පහළ මටට්ම |
| | සංචාරක කර්මාන්තය/ විනෝදාස්වාද කටයුතු | ඉහළ මට්ටම |
| | දූෂණය | ඉහළ මට්ටම |

*මූලාශ්‍රය : සංකල්ප පත්‍රිකාව, 1). Global Fund for Coral Reefs IUCN 2023 2). අරුලානන්දන් සහ පිරිස 2021 3). පෙරේරා එන්, 2019 මත පදනම් වේ.*

වගුව 3- 5: වෙරළ කලාපයේ ජීවී කොරල් වැස්මේ ව්‍යාප්තිය

| *වෙරළබඩ කලාපය* | *ස්ථානය* | *ජීවී හිරිගල් ආවරණය %* |
|---|---|---|
| දකුණු කලාපය(2014) | හික්කඩුව | 19.6 |
| | රුමස්සල | |
| | වැලිගම | 64% |
| | මිරිස්ස | 50% |
| | පොල්හේන | 21.5 |
| | | |
| නැගෙනහිර කලාපය (2020) | කායාන්කර්නි | 38% |
| | පාසිකුඩා | 21% |
| | පරෙවි දූපත | 59% |
| | අඩුක්කුපාරු | 12% |
| | ගිරාගල් පරය | 70% |
| | | |
| උතුරු කලාපය (2021) | පේදුරු තුඩුව | 55% |
| | ඉන්බර්සිටි | 45% |
| | තොණ්ඩමනාරු | 46% |
| | වාලිතුන්දාල් | 43% |
| | කරෙයිනගර් | 25% |
| | පුන්ගුඩතිවු | 40% |
| | කයිට්ස් | 25% |
| | ඩෙල්ෆ්ට් | 15% |

*මූලාශ්‍රය: 1. රාමවික්‍රම එන්.ඩබ් සහ පිරිස (2020) 2. අරුලානන්දන්.ජ් සහ පිරිස (2021)*

- **කලපු හා ගං මෝය පරිසර පද්ධති හායනයවීම**

කලපු සහ ගංමෝය යනු ශ්‍රී ලංකාවේ ඉතා වටිනා පරිසර පද්ධති වන අතර ධීවර ප්‍රජාව සඳහා ආදායම් ප්‍රභවයක් සැපයීමේ මූලාශ්‍ර සැපයීම, සරු ජෛව විවිධත්වයක් සහිතවීම සහ ධීවර යාත්‍රා සඳහා නැංගුරම් පහසුකම් සැපයීම මගින් ආර්ථික සාධක ලෙස ක්‍රියාත්මක වේ.නිදසුනක් ලෙස, වඩාත් ඵලදායී බාධක හරහා ගොඩනංවා ඇති මෝයන් තුනක් වන මීගමුව, පුත්තලම හා මඩකලපුවෙන් පමණක් ධීවර කටයුතුවලින් උත්පාදනය කරන වාර්ෂික ආදායම රු.බිලියන දෙක ඉක්මවයි (සමරකෝන් ජේ සහ පිරිස, 2012). එසේ වුව ද, වෙරළබඩ කලාපයේ ජනගහනය ඉහළ යෑම, අපද්‍රව්‍ය ගලා ඒම හේතුවෙන් ඇතිවන දූෂණය, පිළියම් නොකර බැහැර කරන කාර්මික අපද්‍රව්‍ය, නාගරික අපද්‍රව්‍ය හා දැවිතෙල්, ආක්‍රමණශීලී ශාක විශේෂ පැතිරීම සහ දේශගුණික විපර්යාස පසු විපාක හේතුවෙන් කලපු හා ගංමෝය හා ඒවායේ අන්තර්ගත ජෛව විවිධත්වය උග්‍ර පීඩනයකට හසුවී ඇති අතර දැඩි වෙනස්වීම්වලට ද මුහුණ දී සිටී. වයඹ දිග වෙරළ තීරයේ, කලපු හා ගංමෝය ප්‍රදේශ ඉස්සන් ගොවිපළවලින් බැහැර කරන අපද්‍රව්‍ය හේතුවෙන් දූෂණය වී ඇත. කොහු කර්මාන්තය සඳහා පොල්ලෙලි පල් කිරීම (උදා. මාදු ගඟ ගංමෝය, බොල්ගොඩ ගංමෝය), වැලි ගොඩ දැමීම සහ ධීවර යාත්‍රා නැංගුරම්ලෑම මගින් ඇතැම් කලපු/ ගංමෝය දූෂණය වී ඇත. අත්විඳීමට සිදුව ඇති සෙසු අහිතකර බලපෑම් වනුයේ වාරිමාර්ග යෝජනා ක්‍රම වැනි රට අභ්‍යන්තරයේ සිදුවන සංවර්ධන කටයුතු, කෘෂිකාර්මික කටයුතුවලින් පසට සිදුවන අවහිරතා, කැලෑ එළිපෙහෙළි කිරීම, කැණීම් සහ ඉදිකිරීම් ආදිය හේතුකොට ගෙන රොන්මඩ තැන්පත්වීම ඉහළ යෑමයි. වාරිමාර්ග යෝජනා ක්‍රම හේතුවෙන් ස්වාභාවික ජල ප්‍රවාහයේ සිදුවන වෙනස්වීම් කලපු/ ගංමෝය කිහිපයක ලවණතා මට්ටම කෙරෙහි බලපා තිබේ. මෙම තත්ත්වය ඇතැම්විට Najas marina iy Salviniamolesta වැනි ආක්‍රමණශීලී ශාක විශේෂවල වර්ධනය ඇතැම්විට ඉහළ නංවයි. වාණිජ වශයෙන් වැදගත් ජීවී විශේෂ අක්‍රමවත් ආකාරයෙන් නෙලා ගැනීම ද මෙම පරිසර පද්ධති කෙරෙහි බලපා තිබේ.

මෙම පරිසර පද්ධති හා බැඳුන අනෙක් ගැටලු වනුයේ අනවසර අත්පත්කර ගැනීම් සහ ඉඩම් ගොඩකිරීම් හේතුවෙන් කලපු සහ ගංමෝයන්හි සක්‍රීය ජල ප්‍රදේශ අඩු වී යෑම යි (උදා. බොල්ගොඩ හා මීගමුව මෝයන් සහ මාවැල්ල හා ලුනාව කලපු).එසේම ඇතැම් ගං මෝය සහ කලපුවල පාරිසරික ගුණය සහ සෞන්දර්යාත්මක අගය ද අඩුවී තිබේ. (උදා. බෙන්තොට, මීගමුව හා මාදුගඟ මෝය සහ බොල්ගොඩ කලපුව). මෙම සියලු අහිතකර බලපෑම් හේතුවෙන් ධීවර කටයුතු, සංචාරක කර්මාන්තය, විද්‍යාත්මක, පර්යේෂණ සහ අධ්‍යාපන කටයුතු සඳහා කලපු සහ ගං මෝය ප්‍රදේශ යොදා ගැනීමට බාධා එල්ල වී තිබේ. නිදසුනක් ලෙස, ශ්‍රී ලංකාවේ කලපු සහ මෝය ආශ්‍රිත ධීවර කටයුතුවල පූර්ණ සහ අර්ධකාලීන ධීවරයන් 30,000 ක් පමණ නියැලී සිටින බැවින් මෙය ගැටලුවක් වී තිබේ.

බොහෝවිට, ශ්‍රී ලංකාවේ බොහෝ කලපුවල සම්පත් සතුටුදායක, යම් ප්‍රමාණයකට හොඳ හෝ ඉතා හොඳ මට්ටමේ පවතී. මන්නාරම දිස්ත්‍රික්කයේ පවතින කලපු සම්පත් අනෙකුත් වෙරළබඩ දිස්ත්‍රික්කවල කලපුවලට වඩා හොඳ මට්ටමක පවතින බව වාර්තා වේ. එසේ වුව ද, හම්බන්තොට, කොළඹ සහ ගාල්ල දිස්ත්‍රික්කයන්හි කලපු සම්පත්"අසතුටුදායක" හා "ඉතා අසතුටුදායක" ලෙස වර්ගීකරණය කර ඇත. (සිල්වා ඊ.අයි.එල් සහ පිරිස, 2013).

- **මුහුදු තෘණතලා සහ මුහුදු පැලෑටිවලට හානි සිදුවීම**

ශ්‍රී ලංකාවේ මුහුදු තෘණතලාවල තත්ත්වය පිළිබඳව දැනට පවතින තොරතුරුවල යාවත්කාලීන කිරීමක් මෑත කාලීනව සිදුකර නොමැත. කෙසේ වුවත්, දැනට පවතින තොරතුරු අනුව කලපු සහ හිරිගල්පර ආශ්‍රිතව පවත්නා මුහුදු තෘණතලා බොහොමයක් විනාශකාරී ධීවර අස්වනු නෙලීමේ තාක්ෂණයන් හේතුවෙන් නිරන්තරයෙන් විනාශයට පත්වේ. මුහුදු තෘණ පැගීම හෝ එම තෘණ ඇවිස්සීම සිදුවන ආකාරයේ ධීවර උපකරණ භාවිතයෙන් ද මුහුදු තෘණතලාවලට හානි පැමිණේ.තල්ලු දැල් සහ අදින දැල් භාවිතය හේතුවෙන් වෙරළබඩ තෙත් බිම්වල ඇති මුහුදු තෘණතලා බිම්වලට විශාල ලෙස හානි සිදු වේ (මිත්‍රපාල. එස්, 2008).ශ්‍රී ලංකාවේ යාපනය සහ පුත්තලම අතර මුහුදු තීරයේ මුහුදු තෘණ මත වාණිජ මට්ටමින් යොදාගන්නා ට්‍රෝලර්යාත්‍රා භාවිතයෙන් දැල් දැමීම් සහ මාළු ඇල්ලීමට පා කර හරින දැල් සහ වෙරළ තීරයේ ඇතැම් ස්ථානවල භාවිතා කරන මාදැල් ද විශාල වශයෙන් මුහුදු තෘණවලට හානි පමුණුවයි. ඉන්දියානු ධීවරයින් විසින් මහා පරිමාණයෙන් උතුරු මුහුදේ අනවසරයෙන් කරනු ලබන වාර්තාගත වී ඇති ට්‍රෝලර්යාත්‍රා භාවිතයෙන් දැල් දමා මාළු ඇල්ලීම හේතුවෙන්ද දැඩි ලෙස මුහුදු තෘණවලට හානි සිදුව ඇත. ඇතැම් ප්‍රදේශවල, ඉස්සන් ඇති කරන ස්ථානවල එම සතුන්ට ආහාරදීම සඳහා පොලිකීට් පණුවන් වාණිජ මට්ටමින් නෙලා ගැනීමෙන් ද මුහුදු තෘණවලට විශාල හානියක් සිදු වේ (උදා. මීගමුව සහ හලාවත ගංමෝය). අනෙක් අහිතකර බලපෑම්වනුයේ වෙරළට ඔබ්බෙන් මුහුදේ වැලි කැණීමේ කටයුතුවලින් එන රොන්මඩවලින් ඇහිරීම, වාරිමාර්ග යෝජනා ක්‍රම හරහා රට අභ්‍යන්තරයේ ජල පෝෂකයන්ගේ වෙනස් වීම්වේ. ස්වාභාවික හේතු හෝ මානව ක්‍රියාකාරීත්වයන් හේතුවෙන් වැලි ඇවුරුම් නිර්මාණය වීම ඔස්සේ ද මුහුදු තෘණතලා හායනය විය හැකි ය. 2004 වර්ෂයේ සුනාමි ව්‍යසනය හේතුවෙන් ශ්‍රී ලංකාවේ සිදුවූ මුහුදු තෘණවලට වූ හානිය ඉතා අල්ප සිද්ධියක් ලෙස වාර්තා වී තිබේ (FAO 2007). මීට අමතරව, දේශගුණික විපර්යාසවලට අදාළව ජලයේ උෂ්ණත්වය වැඩිවීම මුහුදු තෘණතලාවල වර්ධනය, ප්‍රජනනය සහ සාමාන්‍ය පරිවෘත්තිය කෙරෙහි ඍජු බලපෑමක් ඇති කරයි (මිත්තපාල. එස්, 2008).

- කඩොලාන ප්‍රදේශ හානිවීම හා විනාශ කිරීම

විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් කඩොලාන පරිසර පද්ධති වර්තමානයේ දී ක්‍රමිකව තර්ජනයට ලක්වේ. කැලෑ කපා ඉවත් කිරීම, අනවසරයෙන් ප්‍රදේශ අල්ලා ගැනීම, කඩොලාන පරිසර පද්ධති මානව ජනාවාස බවට පරිවර්තනය කිරීම, ජලජ ශාක හා සතුන් වගාකිරීමේ ව්‍යාපෘති, ඉඩම් ගොඩකිරීම හා සංචාරක කටයුතු ආශ්‍රිත ව්‍යාපෘති මීට ඇතුළත් වේ.

මෑත කාලීනව, කඩොලාන ප්‍රදේශවලින් විශාල ප්‍රමාණයක් ඉස්සන් ගොවිපොළ සහ ලුණු ලේවා සඳහා පරිවර්තනය කිරීම හේතුවෙන්, විශේෂයෙන් මෙරට පිහිටි කඩොලාන වගුරුබිම්වලට විශාල හානියක් සිදුවිය. මීට අමතරව, පහත් බිම්වල කෘෂිකාර්මික කටයුතු, නිවාස ඉදිකිරීම, ජනාවාස පුළුල් කිරීම වැනි කටයුතු ද කඩොලාන බිම් විනාශ වීම සඳහා සැලකිය යුතු ආකාරයෙන් බලපා ඇත. මීගමුව කලපු පරිසරය ආශ්‍රිතව තිබූ කඩොලාන බිම් ප්‍රමාණය 2010 වර්ෂයේ දී හෙක්ටයාර 253 දක්වා අඩු වූ අතර, ඒ අනුව පසුගිය වසර 20 ක කාල සීමාවක් මුළුල්ලේ මානව කටයුතු හේතුවෙන් ආසන්න වශයෙන් හෙක්ටයාර 100ක කඩොලාන විනාශ වී තිබේ (Kasigeet at el 2012, EML). වයඹ පළාතේ කඩොලාන බිම් මූලික වශයෙන් විනාශ වී ඇත්තේ ඉස්සන් ගොවිපොළවල් පුළුල් වීම නිසා වන අතර මානව ජනාවාස හා කර්මාන්ත ව්‍යාප්තිය නිසා කඩොලාන බිම් සුළු පරිමාණ වශයෙන් පමණක් විනාශ වී තිබේ. සමස්තයක් ලෙස, 1986 සහ 2009 කාල සීමාව තුළ ප්‍රධාන වශයෙන් මානව මැදිහත්වීම් හේතුවෙන් කඩොලාන වැස්ම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවී ඇත. එමෙන්ම, කඩොලාන සම්පත් වැඩිපුර භාවිතා වීමක් ද දක්නට ඇත. නිදසුනක් වශයෙන්, ගෘහස්ථ කටයුතු සඳහා දැව හා දර වශයෙන් ද, මස් අතු (Brush Pile)යොදනු ලබන මත්ස්‍ය කර්මාන්තය සඳහා කුඩා රිකිලි වශයෙන් ද කඩොලාන භාවිතය තිරසාර මට්ටම් ඉක්මවා ගොස් තිබේ. ජල දූෂණය සහ රොන්මඩ තැන්පත් වීම හේතුවෙන් ද කඩොලාන පරිසර පද්ධති හායනය වේ. මානව ක්‍රියාකාරකම්වලට අතිරේකව සුනාමි වැනි ස්වභාවික හේතු හා ආක්‍රමණශීලී පැලෑටි විශේෂවල ව්‍යාප්තිය ද මෑත අතීතයේ දී කඩොලාන විනාශ වීමට බලපා ඇත. 2004 සුනාමි ව්‍යවසනයේ ප්‍රතිඵලයක් වශයෙන් වාලච්චේන, අක්කරෙයිපත්තුව, සල්ලිතිවු, වාකරේ සහ පානම වෙරළබඩ බණ්ඩවල පිහිටි විශාල කඩොලාන බිම් කැබලි විනාශ වී තිබේ. *Annona glabera Typha angustifolia Salvinia molesta Pistia stratiotis and Naja marina* වැනි ආක්‍රමණශීලී ආගන්තුක විශේෂ මගින් ද කඩොලාන පරිසර පද්ධති කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරන ලදී. Synthesis Report on Coastal Habitats, 2014).

වනජීවී දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ඇතුළුව රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් දීර්ඝ කාලයක් මුළුල්ලේ පුනරුත්ථාපන හා ප්‍රතිෂ්ඨාපනය කිරීමේ වැඩසටහන්වල නිරතව සිටින නමුදු, ශාක රෝපණ ප්‍රයත්නවලින් බහුතරයක් අසාර්ථක වී ඇති අතර පවත්නා කඩොලාන වනාන්තර ආරක්ෂා කිරීමට පොළඹවන ලදී. (Sri Lanka Forester 2022). ඒ අනුව, 2019 වර්ෂය වනවිට, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කඩොලාන වනාන්තර දාහතක් ද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කඩොලාන වනාන්තර දොළහක් ද ප්‍රකාශයට පත්කර තිබේ.

- ලවණ වගුරු විනාශ කිරීම

දිවයිනේ වියළි සෘතුව වැඩි කාලයක් පවතින උතුරු, වයඹ, ඊසානදිග සහ ගිනිකොණ දිග ප්‍රදේශවල ලවණ වගුරු ප්‍රධාන වශයෙන් පිහිටා ඇත. සංක්‍රමණික සහ නේවාසික පක්ෂීන් සඳහා විවේක ගන්නා ස්ථාන සහ ආහාර සපයන ස්ථාන ඇතුළුව වැදගත් පාරිසරික කාර්යයන් ලවණ වගුරු මගින් සැපයේ (Synthesis Report on Coastal Habitats 2014). පුත්තලම දිස්ත්‍රික්කයේ ලවණ වගුරු, ඉස්සන් ගොවිපොළවල් හා ලුණු ලේවායන් බවට පරිවර්තනය කිරීම හේතුවෙන් එම දිස්ත්‍රික්කයේ ලවණ වගුරු සැලකියයුතු මට්ටමකින් අඩුවී ඇත. 1986 සහ 2002 අතර කාලසීමාව තුළ එලෙස පරිවර්තනය කරන ලද ලවණ වගුරු බිම් ප්‍රමාණය ආසන්න වශයෙන් හෙක්ටයාර 2,960ක් පමණ වේ. දයාරත්න සහ පිරිස 1997 වර්ෂයේ දී වාර්තා කර ඇත්තේ වසර 10 ක කාල සීමාවක් තුළ (1981 - 1992) ප්‍රධාන වශයෙන් ඉස්සන් ගොවිපොළ හේතුවෙන් පුත්තලම කලපු ප්‍රදේශයේ ලවණ වගුරුවලින් 50% ක් අහිමි වී ඇති බව යි.

අපජලයෙන් සිදුවන දූෂණය, කෘෂිකාර්මික සහ කර්මාන්ත කටයුතුවලින් පිටවන රසායන ද්‍රව්‍ය, අපද්‍රව්‍ය හා ඝන අපද්‍රව්‍යවල බලපෑමට නැගෙනහිර පළාතේ පිහිටා ඇති ලවණ වගුරු බඳුන් වේ (Synthesis Report on Coastal Habitats 2014).පැවති ගැටුම්කාරී තත්ත්වයන් යටතේ වුව ද උතුරු කලාපයේ පිහිටි ලවණ වගුරු, විශේෂයෙන් මන්නාරම දිස්ත්‍රික්කයේ ලවණ වගුරු පසුගිය දශක තුන මුළුල්ලේ බලපෑම්වලට භාජනය නොවී තිබිණ. අනෙකුත් වෙරළබඩ පරිසර පද්ධති මෙන් නොව ලවණ වගුරු සම්බන්ධයෙන් විධිමත් පාරිසරික ඇගයීමක් සිදුකොට නොමැති වීම හේතුවෙන් ඒවායේ භාවිතය පිළිබඳ අපැහැදිලි තත්ත්වයක් නිර්මාණය වී ඇත.

- වැලි වැටි, බාධක වෙරළ හා වැලි තුඩු හායනයවීම

ශ්‍රී ලංකාවේ වැලි වැටි, බාධක වෙරළ හා වැලි තුඩු, වැලි වැටි සහ බාධක වෙරළ හායනයට ලක්වීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ වාසස්ථාන ඉදිකිරීම, මානව ජනාවාස පුළුල් කිරීම, හෝටල් හා අදාළ යටිතල පහසුකම් ස්ථාපනය කිරීම සඳහා භූමි අනවසරයෙන් අත්පත් කරගැනීම සහ පොල්, මිරිස්, ලූණු සහ අනෙකුත් භෝග වගාව සඳහා කෘෂිකාර්මික කටයුතු සඳහා

ඉඩම පරිවර්තනය කිරීම යි. ඒ නිසාවෙන්, සාමාන්‍යයෙන් ඝනව වැඩුනු කෙටි පඳුරු සහිත උසින් අඩු ගස්වලින් සමන්විත වෙරළාසන්න ලඳු කැලෑ කලාපය වර්තමානයේ දී බොහෝ ප්‍රදේශයන්හි දී බොහෝ වශයෙන් අඩුවී තිබේ. මෙම තත්ත්වය දකුණු සහ නැගෙනහිර වෙරළ තීරයන්හි ඇතැම් ප්‍රදේශවල ද දක්නට ලැබෙන අතර එහිදී ඇතැම් වෙරළවල් සහ වැලි තුඩු මෙන්ම කඩොලාන ද ගං වතුර, සුනාමි (2004), සුළි සුළං සහ වෙරළ ඛාදනය යන සාධකවල බලපෑම් හේතුවෙන් විනාශ වී ඇත.

මෙම ගැටලුව හිරිගල්පර ඉවත්කිරීම, විධිමත් ආකාරයකින් තොරව ස්ථාපනය කරන ලද වෙරළබඩ ව්‍යුහයන් සහ ගංගා සහ වෙරළවලින් වැලි ගොඩදැමීම මගින් තවදුරටත් තීව්‍ර වී තිබේ. තවත් ගැටලුවක් වී ඇත්තේ, විශේෂයෙන්ම නාගරික ප්‍රදේශයන්හි දී මුහුදු වෙරළ ඝනඅපද්‍රව්‍ය මුදා හැරීමේ ස්ථාන ලෙස භාවිතා කිරීම යි. බස්නාහිර හා දකුණු වෙරළ තීරයේ වාද්දුව සිට මිරිස්ස දක්වා ප්‍රදේශයෙන් වාර්තා වී ඇති අන්දමට නැව් පතුලේ රැඳෙන පල් වතුර වෙරළ වෙත ගසාගෙන විත් සෑදෙන තෙල් තාර කැටි වෙරළෙහි එක්රැස්වීම මගින් ද වෙරළ දූෂණයට ලක්වේ (හිරිගල්පර හා මුහුදු තෘණතලා වැනි අනෙකුත් වෙරළ පරිසර පද්ධති කෙරෙහිද මෙය අහිතකර අයුරින් බලපානු ලැබේ). ඇතැම් වෙරළ ප්‍රදේශවල දී(උදා. මඩකලපුව සහ හම්බන්තොට දිස්ත්‍රික්කය), වෙරළ හා වැටිවල ස්ථායීතාවය සඳහා විදේශීය ශාක විශේෂ හඳුන්වා දී ඇති අතර එකී ශාකවල අහිතකර බලපෑම් සම්බන්ධයෙන් ගැටලු මතුවී තිබේ.

දකුණු වෙරළ තීරයේ කොස්ගොඩ සිට පලටුපාන දක්වා,උතුරු වෙරළ තීරයේ පලයිතිවු දූපත් සහ නැගෙනහිර වෙරළ තීරයේ අරුගම්බොක්ක, බිජුලෑම සඳහා වෙරළ වෙත පැමිණෙන කැස්බෑවන් විශේෂ පහක් සඳහා බිජු ලෑමට පහසුකම් සපයයි. හෝටල් ඉදි කිරීම සඳහා අක්‍රමවත් ආකාරයෙන් ඉඩම් වෙන් කිරීම, පැල්පත් සහ මුඩුක්කු ජනාවාස සීඝ්‍රයෙන් වැඩිවීම, සංචාරක පහසුකම් නිරවද්‍ය නොවන ආකාරවලින් ස්ථානගත කිරීම හා මහමග දෙපස ගොඩනැගිලි ඉදිකිරීම වැනි කරුණු හේතුවෙන් මෙම පරිසර පද්ධති වේගවත් ආකාරයෙන් හායනයට පත්වේ.

**3.2.2 දේශගුණික විපර්යාස ප්‍රතිවිපාක සහ වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය කිරීමේ වැදගත්කම**

මානව ක්‍රියාකාරකම් සහ ස්වාභාවික හේතු නිසා මෙරට වෙරළබඩ පරිසර පද්ධති වෙන කවර කාලයකටත් වඩා ඉතා සීඝ්‍රයෙන් හා පුළුල් ආකාරයෙන් වෙනස් වෙමින් පවතී. වෙරළබඩ පරිසර පද්ධතිවල සංයුතිය, ජෛව විවිධත්වය සහ ගුණාත්මකභාවයේ වෙනස්වීම්වලට බලපාන ප්‍රධාන විභව්‍ය සාධක ලෙස දේශගුණික විපර්යාස හඳුනාගෙන ඇත. දැනට පවතින හිරිගල්පර සහ මුහුදු තෘණතලා වැනි සංවේදී හා විනාශවීම සඳහා වැඩි නැඹුරුතාවයක් පවතින පරිසර පද්ධතිවල ස්වභාවය හා වපසරිය ඔස්සේ දේශගුණික විපර්යාස සම්බන්ධ ගැටලුවල ප්‍රතිවිපාක හොඳින් නිරූපණය වේ.

දේශගුණික විපර්යාස හේතුවෙන් ඇතිවිය හැකි විභව්‍ය පීඩනය හැරුන විට, දේශගුණික විපර්යාස අභියෝගවලට මුහුණ දීම සඳහා හිරිගල්පර, මුහුදු තෘණතලා, කඩොලාන හා අනෙකුත් වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම හේතු කිහිපයක් මත වඩාත් වැදගත් වේ;

- **කාබන් අවශෝෂණය** : කඩොලාන සහ මුහුදු තෘණතලා වැනි වෙරළබඩ පරිසර පද්ධති වායුගෝලයෙන් කාබන් ඩයොක්සයිඩ් අවශෝෂණය කරගැනීමෙහිලා බොහෝ සෙයින් වැදගත් වේ. ඔවුන්ගේ ජෛවස්කන්ධ හා අවසාදිත තුළ කාබන් බොහෝ ප්‍රමාණයක් සංචිත කරගෙන සිටින අතර එමඟින් හරිතාගාර වායු සාන්ද්‍රණය අවම කරමින් දේශගුණික විපර්යාස අවම කිරීමට දායක වේ.

- **වෙරළ ආරක්ෂණය** : වෙරළ ඛාදනය හා උදම් රළ ඉපිලුම්වලට එරෙහිව හිරිගල්පර, කඩොලාන හා මුහුදු තෘණතලා ක්‍රියාකරයි. දේශගුණික විපර්යාස ආශ්‍රිත ආන්තික කාලගුණික සංසිද්ධීන්ගේ වැඩිවෙමින් පවතින වාර සංඛ්‍යාවෙන් හා ඒවායේ ප්‍රබලත්වයෙන් වෙරළබඩ ප්‍රජාවන් ආරක්ෂා කරගැනීම සඳහා මෙමගින් රැකුලක් සැපයේ.

- **ජෛව විවිධත්ව සුවිශේෂී ස්ථාන** : මෙම පරිසර පද්ධති පුළුල් පරාසයක ශාක හා සත්ත්ව විශේෂවලට වාසස්ථානය වේ. පරිසර පද්ධතිවල දරාගැනීමේ හැකියාව පවත්වා ගැනීම සඳහා සහ මානව ආහාර සුරක්ෂිතතාවය හා ජීවනෝපාය සඳහා අත්‍යවශ්‍ය විය හැකි ඇතැම් විශේෂ ද ඇතුළුව විශේෂ ගණනාවක් නොනැසී පවත්වා ගැනීම සඳහා ඔවුන්ගේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම අත්‍යවශ්‍ය වේ.

- **ධීවර කටයුතු හා ජීවනෝපාය** : මත්ස්‍යයින් හා අනෙකුත් සමුද්‍ර විශේෂ සඳහා අභිජනන ස්ථාන හා වාසස්ථාන සපයමින් වෙරළබඩ පරිසර පද්ධති ධීවර කටයුතු සඳහා උපකාරී වේ. බොහෝ වෙරළාශ්‍රිත ප්‍රජාවන් සිය ජීවනෝපාය හා පැවැත්ම සඳහා මෙම පරිසර පද්ධති මත යැපේ. මෙම වාසස්ථාන අඩුවීගෙන යෑම තුළින් මත්ස්‍ය තොග අඩුවීමට හා ධීවර ප්‍රජාවන් වෙත ආර්ථික අසීරුතා ඇතිකිරීමට ඉවහල් වේ.

- **සංචාරක හා විනෝදාස්වාද කටයුතු** : විශේෂයෙන්ම හිරිගල්පර, ලොවපුරා සංචාරකයන් ඒ වෙත ආකර්ෂණය කරනු ලැබේ. ආර්ථිකය සඳහා වැදගත් වන සංචාරක කර්මාන්තය සඳහා මොවුන් සුවිශේෂී අයුරින් දායක වේ. මෙම පරිසර

පද්ධති හායනය වීමත් සමග ඒ වෙත සංචාරක ආකර්ෂණය ද අඩුවන අතර එමගින් ආර්ථිකයට බලපෑම් ඇති කරයි.

- **ජලයේ ගුණාත්මකබව හා පෝෂක ද්‍රව්‍ය චක්‍රීකරණය :** දූෂක ද්‍රව්‍ය පෙරනය කරමින් හා අවසාදිත රඳවාගනිමින් කඩොලාන හා මුහුදු තෘණතලා ජලයේ ගුණාත්මකබව වැඩිදියුණු කිරීමට උපකාරී වේ.වෙරළාශ්‍රිත ජලයේ ගුණාත්මකබව පවත්වා ගැනීම සඳහා අත්‍යාවශ්‍ය පෝෂක ද්‍රව්‍ය චක්‍රීකරණයෙහිදී මොවුන් විසින් ද කාර්යභාරයක් සිදු කෙරේ.

- **මුහුදු මට්ටමේ ඉහළ යෑම සඳහා අනුගතවීම :** අවසාදිත තැන්පත්වීම හා මුල් වර්ධනය වීම ඔස්සේ තමාට අවශ්‍ය මට්ටමක් ගොඩනංවා ගැනීම තුළින් ඉහළ යන මුහුදු මට්ටමට අනුවර්තනය වීමට වෙරළබඩ පරිසර පද්ධතිවලට හැකි වේ. මුහුදු මට්ටම ඉහළ යෑමේ ප්‍රතිවිපාකවලට අනුවර්තනයවීම, වෙරළබඩ ප්‍රජාවන් හා යටිතල පහසුකම් ආරක්ෂා කරගැනීම සඳහා උපකාරීවීම සඳහා මොවුන් විසින් ස්වාභාවික පිළියම් ලබාදේ.

- **සාගර ආම්ලිකරණයවීම සඳහා ප්‍රතිරෝධීතාවය :** හිරිගල්පර සාගර ආම්ලිකරණයවීම සම්බන්ධයෙන් අවදානමක් දරන නමුදු අනිකුත් වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම ඔස්සේ ඇතිවන වැඩිදියුණු වූ ජලයේ ගුණාත්මකබව හා අඩුවූ පීඩනකාරී තත්ත්වයන්ගෙන් වාසි ලබාගැනේ. විචලනය වන සාගර තත්ත්වයන්ට ඔවුන්ගේ ඇති ප්‍රතිරෝධීතාවය මෙමගින් වැඩිදියුණු වේ.

- **විද්‍යාත්මක පර්යේෂණ :** මෙම පරිසර පද්ධති විද්‍යාත්මක පර්යේෂණ සඳහා අගනා ස්ථානවන අතර, සමුද්‍රීය පරිසර පද්ධති මත ඇතිවන දේශගුණික විපර්යාස බලපෑම් හා ඒවා අවම කිරීම සඳහා සිදුකළ හැකි ක්‍රමෝපාය සම්බන්ධයෙන් සූක්ෂම දැක්මක් ලබාදේ.

- **සංස්කෘතිකමය හා අධ්‍යාත්මික සුවිශේෂිතා :** මෙම පරිසර පද්ධති වෙත බොහෝ වෙරළබඩ ප්‍රජාවන් තුළ ගැඹුරු සංස්කෘතිකමය හා අධ්‍යාත්මික සම්බන්ධතා පවතී. මේවා සංරක්ෂණය කිරීම සංස්කෘතික උරුමයන් පවත්වා ගැනීම සඳහා සහ මෙම ප්‍රජාවන්ගේ මනා පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වේ.

**3.2.3 අඩුවෙන් තක්සේරුවී ඇති වෙරළබඩ පරිසර පද්ධති**

වෙරළබඩ පරිසර පද්ධතිවල සැබෑ ආර්ථික වටිනාකම තවමත් සවිස්තරාත්මක වශයෙන් ඇස්තමේන්තු කර නොමැත. එබැවින්, වෙරළබඩ කලාපය ඇතුළත සංවර්ධන ක්‍රියාකාරකම් සඳහන් කිරීමේ දී වෙරළබඩ පරිසර පද්ධතිවල සමස්ත ආර්ථික වටිනාකම අඩුවෙන් තක්සේරුවීමේ ප්‍රවණතාවයක් පවතී. මාර්ග සංවර්ධනය, වාණිජ හා ධීවර වරාය සංවර්ධනය, ඉඩම් ගොඩකිරීම හා දූපත් සංවර්ධනය සහ වෙරළාශ්‍රිත සංචාරක කර්මාන්තය යන අංශවලට අදාළව වෙරළබඩ කලාපය තුළ සිදුවන සීඝ්‍ර සංවර්ධනය සැලකීමේ දී, තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළට පාරිසරික තක්සේරුවක් ඇතුළත් කිරීම වැදගත් වේ.

**3.2.4 සංරක්ෂණය හා තිරසර සංවර්ධනය**

2004 සුනාමි ව්‍යසනයෙන් හා රට තුළ වසර තිහක් පුරා පැවති අර්බුදකාරී වාතාවරණයෙන් අනතුරුව, වඩාත් ප්‍රමුඛතම තත්ත්වය වූයේ ශීඝ්‍ර ආර්ථික වර්ධනයක අවශ්‍යතාවය හා ඒක පුද්ගල ආදායම් මට්ටම පුළුල් කිරීම යි. එබැවින්, ශ්‍රී ලංකා රජය විසින් ආර්ථික කේන්ද්‍රස්ථාන පහක් සංවර්ධනය කිරීම සැලසුම් කරන ලද අතර එහිදී කේන්ද්‍රස්ථාන 02ක් එනම් සමුද්‍රීය හා සංචාරක කේන්ද්‍රස්ථාන වෙරළ කලාපය තුළ ස්ථානගත වේ. ප්‍රධාන සංවර්ධන උපායමාර්ග වෙරළ කලාපය වෙත යොමුවීමේ දී වෙරළාශ්‍රිත වාසස්ථාන කෙරෙහි ඇතිවන නිෂේධනීය බලපෑම් වැළැක්විය නොහැකි ය. එනිසා, සමස්ත වෙරළබඩ පරිසර පද්ධතිවල ආර්ථික වටිනාකම අවධාරණය කරමින්, සංරක්ෂණ අවශ්‍යතා සහ ආර්ථික සංවර්ධන අවශ්‍යතාවල තුලනයක් ඇති කිරීම වඩාත් යථාර්ථවාදී ආකාරයකින් සිදුකළ යුතු ය. මධ්‍යම ආදායම් උගුලින් ඉවත්වීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් යොදාගනු ලබන ආර්ථික ප්‍රයත්නයන් සමග අනුකූල වෙමින් වෙරළබඩ ප්‍රදේශ සංවර්ධනයේ දී සංරක්ෂණ අවශ්‍යතා සහ බලපෑම් අවම කිරීමේ පියවර පිළිබඳව වඩාත් අවධාරණය කළ යුතු ය.

**3.3 පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම**

**3.3.1 ප්‍රතිපත්ති, සැලසුම්, නීති සහ ආයතනික සැකසුම්**

මෙරට වෙරළබඩ පරිසර පද්ධති ක්ෂයවීමේ සහ හායනයවීමේ දැනට පවතින ශීඝ්‍රතාවය තුළින් සංරක්ෂණය සහ අනුවර්තී කළමනාකරණය පිළිබඳ අවශ්‍යතාවය උද්දීපනය කෙරේ. 1990, 1997, 2014 හා 2018 වර්ෂවල වෙරළ කලාප කළමනාකරණ සැලසුම් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම ඔස්සේ පරිපූර්ණ හා සාකල්‍යවාදී ආකාරයකින් වෙරළබඩ පරිසර පද්ධති කළමනාකරණය කිරීම වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකාවේ වෙරළ කලාපය සඳහා සම්පත් කළමනාකරණ ක්‍රමෝපායක් සඳහා නිර්දේශ ලබාදෙමින් 1992 වර්ෂයේ දී සම්පාදිත "Coastal 2000: Recommendations for a Resource Management Strategy for Sri Lanka's Coastal Region"පරිසර

පද්ධති කළමනාකරණය කිරීමේ ප්‍රයත්න සඳහා ප්‍රතිපත්ති රාමුව තවදුරටත් ශක්තිමත් කරන ලදී.රෙගුලාසි, අධ්‍යාපනය සහ දැනුවත්බව ඇති කිරීම, සැලසුම්කරණය හා ප්‍රතිපත්ති සංවර්ධනය, අධීක්ෂණය, පර්යේෂණ හා සම්බන්ධීකරණය ආවරණය කෙරෙන කළමනාකරණ ක්‍රමෝපායන් කිහිපයක් සම්පාදනය කිරීමට හා ක්‍රියාත්මක කිරීමට මෙම ප්‍රයත්නයන් ඔස්සේ මඟ පෙන්වීමක් සිදුවිය. පරිසර සහ ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද ජාතික ජෛව විවිධත්ව සංරක්ෂණ ක්‍රියාකාරී සැලැස්ම ඔස්සේ ද වෙරළබඩ සහ සමුද්‍රීය පරිසර පද්ධති සහ ඒවායේ ජෛව විවිධත්වය සංරක්ෂණ කිරීම පිළිබඳව අවධානය යොමුකොට ඇත. 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ සහ එහි පසුකාලීන සංශෝධනයන් වන 1988 අංක 64 දරන පනතේ හා 2011 අංක 49 දරන පනතේ නෛතික විධිවිධාන මගින් ද නියාමන පියවර ඔස්සේ වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම ප්‍රවර්ධනය කෙරේ. වෙරළ සංරක්ෂණ පනත සඳහා 2011 වර්ෂයේ දී හඳුන්වා දුන් සංශෝධන සමග වෙරළ කලාපයේ සීමාවන් තුළට ජලතලයන්හි ඉවුරු දෙපස භූමියද ඇතුළත් කිරීම ඔස්සේ නෛතික වශයෙන් අර්ථ දක්වන ලද වෙරළ කලාපය පුළුල් කිරීමෙන්, නියාමන ක්‍රියාවලිය හරහා වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකොට තිබේ.

"අනාගතය සඳහා කඩොලාන" වැඩසටහනේ ජාතික මෙහෙයුම් කමිටුව සඳහා සොබාදහම සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සංගමයේ (IUCN) ශ්‍රී ලංකා කාර්යාලය මගින් ප්‍රකාශයට පත්කළ ජාතික ක්‍රමෝපාය හා ක්‍රියාකාරී සැලැස්ම ඔස්සේ, ශ්‍රී ලංකාව තුළ පරිසර පද්ධති මත පදනම්වූ ඒකාබද්ධ වෙරළ කළමනාකරණය, ශ්‍රී ලංකාව විසින් යෝජනා කෙරේ. මෙය ශ්‍රී ලංකාවේ වෙරළබඩ කළමනාකරණය පිළිබඳ වසර 30 ක වාර්තා ඇගයීමක් මත පදනම් වන අතර, "වඩාත් ක්‍රමානුකූල ප්‍රවේශයක් අත්‍යවශ්‍යබව ප්‍රත්‍යක්ෂ වී තිබේ" යන්න අවධාරණය කර ඇත. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ දැනට පවත්නා නෛතික බල අධිකාරිය තුළ ක්‍රියාත්මක කළ හැකි ඇතැම් නිර්දේශ මෙම සැලැස්ම තුළ අන්තර්ගත වුව ද, පරිසර පද්ධති මත පදනම් වන ඒකාබද්ධ වෙරළ කළමනාකරණයක් සඳහා වෙරළ සංරක්ෂණ පනත තුළ ප්‍රධාන යොමුගතවීමක් අවශ්‍ය කෙරෙන අතර, ප්‍රතිපත්ති සම්පාදනයේ ඉහළතම මට්ටමේ දී යෝජිත ක්‍රමෝපාය හා ක්‍රියාකාරී සැලැස්ම නිල වශයෙන් පිළිගැනීම මත මෙය රඳා පවතී.

**වගුව 3- 6: වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකරණ ක්‍රමෝපායන්**

| | |
|---|---|
| නියාමනය | ■ මුහුදු හිරිගල්පර කැණීමට අදාළ සියලු කටයුතු තහනම් කිරීම<br>■ වෙරළ කලාපය තුළ සිදුකරනු ලබන සියලු සංවර්ධන කටයුතු සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙතින් බලපත්‍ර ලබා ගැනීම අනිවාර්ය කිරීම<br>■ වෙරළබඩ ජලතලයන්හි දෙපස භූමිය ද ඇතුළත්වන පරිද්දෙන් වෙරළ කලාපය පුළුල් කිරීම<br>■ "සංරක්ෂණ ප්‍රදේශ"සහ "බලපෑමට ලක් වූ ප්‍රදේශ"ප්‍රකාශයට පත් කිරීම සඳහා නෛතික විධිවිධාන හඳුන්වා දීම |
| අධ්‍යාපනය හා දැනුවත් කිරීම් | ■ වෙරළබඩ පරිසර පද්ධතිවල වටිනාකම සහ ඒවා සම්බන්ධිත ගැටලු පිළිබඳව මුද්‍රිත ද්‍රව්‍ය ආශ්‍රයෙන් සන්නිවේදනය කිරීම<br>■ වෙරළබඩ පරිසර පද්ධති කෙරෙහි බලපාන ගැටලු පිළිබඳ කරුණු ද්විතීක පාසල් විෂය නිර්දේශයන්ට ඇතුළත් කිරීම<br>■ විවිධ වෙරළබඩ පරිසර පද්ධති පිළිබඳව පාසල් ළමුන්, ගුරුභවතුන් සහ ප්‍රධාන පාර්ශ්වකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම |
| සැලසුම්කරණය සහ ප්‍රතිපත්ති සංවර්ධනය | ■ තෝරාගත් ස්ථානවල විශේෂ කළමනාකරණ ප්‍රදේශ (SMA) සැලසුම් හරහා වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම<br>■ විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය ආයතනගත කිරීම |
| අධීක්ෂණය | ■ හිරිගල්පර හා වැලි කැණීම සම්බන්ධයෙන් අධීක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම |
| පර්යේෂණ | ■ හිරිගල්පර හා කඩොලාන පිළිබඳ පර්යේෂණ සඳහා සහායවීම |
| සම්බන්ධීකරණය | ■ ජාතික මට්ටමේ දී: වෙරළ සංරක්ෂණ උපදේශක සභාව<br>■ ප්‍රාදේශික මට්ටම: වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුව, අනෙකුත් ආයතනවල සහාය හරහා මෙහෙයුම් කමිටු සහ විශේෂ කළමනාකරණ ප්‍රදේශවල ප්‍රජා සම්බන්ධීකරණ කමිටු |

*මූලාශ්‍රය: වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව 2023*

### 3.3.2 ආයතනික යාන්ත්‍රණ හා ප්‍රධාන ප්‍රයත්නයන්

වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ වගකීම් දරන අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන ගණනාවක් පවතී. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා ආයතනය), මධ්‍යම පරිසර අධිකාරිය,සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය එකී ආයතන අතුරින් සමහරකි. මෙම සෑම ආයතනයකටම විවිධ වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණය කිරීමේ දී ඉටුකළ යුතු වන නිශ්චිත කාර්යභාරයක් පවතී. මීට අමතරව, සිය අදාළ පළාත් සභාවන් තුළ වෙරළබඩ පරිසර පද්ධති කළමනාකරණය සඳහා වෙරළ කලාපයන් අයත්වන පළාත් සභා විසින් ද ප්‍රධාන කාර්යභාරයක් ඉටුකළ යුතු ය. මීට අමතරව වෙරළබඩ පළාත් සභා, ප්‍රාදේශීය සභා හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ක්‍රියාකාරකම් සේම, වාරිමාර්ග හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල ක්‍රියාමාර්ග ද වෙරළබඩ පරිසර පද්ධති කෙරෙහි ප්‍රධාන බලපෑම් ඇතිකරනු ලැබේ.

### 3.3.3 කළමනාකරණ පරිචයන්හි අනාගත ප්‍රවණතා

වෙරළබඩ පරිසර පද්ධති කළමනාකරණය සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීම සඳහා අතීතයේ දී දරන ලද ප්‍රයත්නයන් මගින් පෙන්නුම් කරනුයේ විවිධ වෙරළබඩ සම්පත් කළමනාකරණය සඳහා බලාධිකාරිය සතු ආයතන අතර සමීප සම්බන්ධීකරණයක් පැවැතීමේ අවශ්‍යතාවයි. වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය සහ තාර්කික කළමනාකරණය සඳහා වූ ඉදිරි ක්‍රමෝපායන්වල දී අතීතයේ මුහුණ දුන් බාධකයන් පිළිබඳව මනා අවධානයක් යොමුකළ යුතු ය. වෙරළබඩ පරිසර පද්ධතිවලට අදාළව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව යොදාගන්නා ලද කළමනාකරණ පියවරවලදී නියාමන ප්‍රයත්නයන් මත බොහෝ දුරට රඳා පැවතිණි. ආයතනික ඒකාබද්ධතාවය සහ ප්‍රජා සහභාගීත්වය ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු ය. මීට හේතු වනුයේ වෙරළ කලාප කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී පවතින දුර්වල සම්බන්ධතා ලෙස එකී සාධක හඳුනාගෙන පවතින බැවිනි. විවිධ පරිසර පද්ධතිවලදී මුහුණ දෙන ඒවා භාවිතකරන පිරිස් අතර ඇතිවන ගැටුම් නිරාකරණය සඳහා ප්‍රජා සහභාගීත්වය ඉතා වැදගත්වන අතර විශේෂිත වෙරළබඩ පරිසර පද්ධති හා එම පද්ධති හා සම්බන්ධිත විවිධ ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී විශේෂ කළමනාකරණ ප්‍රදේශ යනුවෙන් හැඳින්වෙන ප්‍රයත්නය ද හැකි සෑම අවස්ථාවකදී ම ප්‍රජා සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීමේ මෙවලමක් ලෙස ක්‍රියාත්මක කළ යුතු ය.

නීතිය බලාත්මක කිරීමේ දී සහ වෙරළබඩ පරිසර පද්ධතිවලට අදාළ අනෙකුත් ක්‍රියාකාරී/ කළමනාකරණ සැලසුම්වල නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ දී (උදා. පරිසරය සමග කටයුතු කරන අමාත්‍යාංශය විසින් සකස් කරන ලද ජෛව විවිධත්ව සංරක්ෂණ ක්‍රියාකාරී සැලැස්ම) ඒකාබද්ධ ප්‍රවේශයක් ක්‍රියාවට නැංවීම අවශ්‍ය වේ. සියලුම වෙරළබඩ සම්පත් කළමනාකරණ සැලසුම් සකස් කිරීමේ දී ප්‍රමාණවත් ආයතනික සම්බන්ධීකරණයක් හා සහයෝගීතාවයක් ද පැවතිය යුතු ය. නිදසුනක් ලෙස, ඒකාබද්ධ වෙරළබඩ පරිසර පද්ධති කළමනාකරණයේ දී දිය බෙත්ම කළමනාකරණය සමග ද සමීප සබැඳියාවක් පවතින බැවින් එකී විෂයයට අදාළ සියලු නියෝජිතායතන කළමනාකරණ ක්‍රියාවලිය සඳහා සහභාගී විය යුතු ය. වෙරළබඩ දූෂණය යන ඉතා වැදගත් ගැටලුව සඳහා පිළියම් යෙදීමේ දී යෝග්‍ය කාර්යපටිපාටි හරහා සංවර්ධන ක්‍රියාකාරකම් නියාමනය වන බව සහතික කරගැනීම ඉතාමත් වැදගත් වේ. මහජන දැනුවත්බව ඇති කිරීම ද පරිසර පද්ධති සංරක්ෂණය සඳහා ඵලදායි මෙවලමක් ලෙස සැලකේ. එබැවින්, අනාගත කළමනාකරණ පරිචයන්වලදී මීට අදාළව ද ප්‍රමාණවත් අවධානයක් ලබාදිය යුතු වේ.

වෙරළබඩ පරිසර පද්ධති කළමනාකරණය සඳහා වන අනාගත ප්‍රවේශයන් භූගෝලීය වශයෙන් නිශ්චිත හා මානව ක්‍රියාකාරකම් සහ ස්වාභාවික පද්ධතීන් තුළ පවතින වෙනස්වීම පිළිබඳ මනාව පැහැදිලිව සබැඳියාවන් මත පදනම් විය යුතු ය. වෙරළබඩ පරිසර පද්ධතිවලට අදාළ ඉදිරි සමස්ත කළමනාකරණ අරමුණු වෙරළබඩ පරිසර පද්ධතිවල තිරසර කළමනාකරණය සහ ඒවායේ ස්වභාවික අංග සංරක්ෂණය සහ පෝෂණය සහතික කළ යුතු ය.මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා එක් එක් පරිසර පද්ධතියට අදාළ ගැටලු ඒවායේ විශේෂිත ලක්ෂණ සහ අවශ්‍යතා අනුව වෙන වෙනම සලකා බැලීම අවශ්‍ය කෙරේ. වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය සඳහා වන සියලුම ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග ජාතික භෞතික සංවර්ධන සැලැස්ම, ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම සහ ජාතික ජෛව විවිධත්ව සංරක්ෂණ ක්‍රියාකාරී සැලැස්ම සහ අනෙකුත් ජාතික සැලසුම් ප්‍රයත්නයන් සමග අනුකූල වන බවට සහතික වීම සම්බන්ධයෙන් අවධානය යොමුවිය යුතු ය. ඇතැම් පරිසර පද්ධති කඩිනම් අවධානය යොමු කළ යුතු දැඩි තර්ජනවලට මුහුණ දී ඇති හෙයින් වෙරළබඩ පරිසර පද්ධති කළමනාකරණය ප්‍රමුඛතා පදනමකින් ක්‍රියාත්මක කිරීම වැදගත් වේ. එසේ වුව ද, කළමනාකරණ ක්‍රියාමාර්ග සඳහා වෙරළබඩ පරිසර පද්ධති ප්‍රමුඛතාගත කිරීම සඳහා මෙම ලේඛනය තුළ ප්‍රයත්නයක් දරා නොමැති නමුදු, මෙය වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී අවධානය යොමුකළ යුතු කරුණකි. තනි තනි වාසස්ථාන සහ ඔවුන් රැඳී සිටින පරිසර පද්ධති ඒකකය අතර පවතින සබැඳියාව සැලකිල්ලට ගත් බවට සැලසුම් සකස් කිරීමේ දී, විශේෂයෙන් විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා සැලසුම් සකස් කිරීමේ දී අවධානයට ගත යුතු ය.

### 3.3.4 දේශගුණික විපර්යාස සඳහා අනුගත වීම - ජෛවවිවිධත්වය සංරක්ෂණය කිරීම

යාවත්කාලීන කරන ලද ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම 2021-2030 අනුව, ජෛව විවිධත්ව අංශය දේශගුණික විපර්යාස සඳහා අනුගතවිය යුතු ප්‍රධාන ක්ෂේත්‍රවලින් එකක් ලෙස හඳුනාගෙන තිබේ. භෞමික හා සමුද්‍රීය වාසස්ථාන යන ද්විත්වයේම අඩුවීම, කොටස්වලට කැඩී යාම සහ හායනය වීම; ජෛව සම්පත් අධික වශයෙන් උපයෝජනය කරගැනීම; සාම්ප්‍රදායික භෝග හා පශු සම්පත් විශේෂ හා වර්ග වඳවී යාම; දූෂණය; මිනිසුන් හා වන සතුන් අතර පවතින ගැටුම්; ආගන්තුක ආක්‍රමණශීලී විශේෂයන්ගේ සීඝ්‍ර පැතිරීයෑම; ඉහළ යමින් පවතින මානව ජනගහණ ඝනත්වය මෙහිදී ප්‍රධාන අවදානම් ලෙස හඳුනාගෙන තිබේ. තව ද, වනාන්තරවල භූමි භාවිතයේ ඇතිවී තිබෙන වෙනස්වීම්, තත්කාර්ය තෙත්බිම් ගොඩ කිරීම, වෙරළබඩ ප්‍රදේශ පාලනයකින් තොරව භාවිතා කිරීම, තෙත්බිම්වල කුණුකසල පිරවීම හා වනාන්තර විනාශ කිරීම යන කරුණු වාසස්ථාන අහිමිවීම සඳහා බලපාන ප්‍රධාන කරුණු වශයෙන් හඳුනාගෙන තිබේ. ඒ අනුව, ජෛව විවිධත්ව අංශය සඳහා ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන් ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට (2021-2030) අනුව, 2021-2030 කාලය තුළ ක්‍රියාත්මක කළ යුතු ප්‍රධාන ක්‍රියාකාරකම් වශයෙන් පහත ක්‍රියාකාරකම් ප්‍රධාන නියෝජිතායතනය හා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ද ඇතුළුව අනෙකුත් අදාළ නියෝජිතායතන විසින් හඳුනාගෙන තිබේ.

වගුව 3- 7 ජෛව විවිධත්ව අංශය සඳහා ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන්

| |
|---|
| ▪ දේශගුණික විපර්යාස සඳහා ඉහළ අවදානමක් දරන වාසස්ථාන සංරක්ෂණය කිරීම සඳහා දේශගුණික සංවේදී ප්‍රදේශ කළමනාකරණය හා සංරක්ෂිත ප්‍රදේශ ඇතුළත හා පිටත පිහිටි හායනයට ලක්වූ පෙදෙස් නැවත යථා තත්ත්වයට පත්කිරීම |
| ▪ වර්තමාන පුරෝකථනවලට අනුව දේශගුණික විපර්යාස හේතුවෙන් සිදුවන වෙනස්වීම්වලට බඳුන්වෙන කලාපවල සම්බන්ධතාවය හූ දර්ශක ප්‍රවේශ හරහා වැඩි කිරීම |
| ▪ සංරක්ෂිත ප්‍රදේශ දේශගුණික විපර්යාස සඳහා අනුගත ආරක්ෂිත කලාපයක් ලෙස ක්‍රියාත්මක වීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා එම සංරක්ෂිත ප්‍රදේශවල ප්‍රමාණය පුළුල් කිරීම. |
| ▪ දේශගුණික විපර්යාස සඳහා අවදානමක් දරන ප්‍රදේශ හා කලාප ආවරණය වන පරිද්දෙන් එම ස්ථානවලින් බැහැර සංරක්ෂණ වැඩසටහන් ද සවිමත් කිරීම |
| ▪ හිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන් උත්තේජනය වන ආක්‍රමණශීලී ආගන්තුක විශේෂවල පැතිරීම පාලනය කිරීමේ ඵලදායි කළමනාකරණය |

*මූලාශ්‍රය: පරිසර අමාත්‍යාංශය, ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම 2021-2030 (2023)*

අතීතයේ දී සිදුකළ මැදිහත්වීම්වල පවතින දුර්වලතා/ අඩුපාඩු මෙන්ම වර්තමාන කළමනාකරණ අවශ්‍යතා පිළිබඳ විශ්ලේෂණයකින් අනතුරුව, වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය කිරීමේ අනාගත අවශ්‍යතා පිළිබඳ අවධානය යොමු කිරීම සඳහා, පරාසයක විහිදී ගිය ක්‍රියාමාර්ග මෙම පරිච්ඡේදය තුළ හඳුනාගෙන තිබේ. එක් එක් පරිසර පද්ධතිය සඳහා අදාළ විශේෂිත සංරක්ෂණ ගැටලු හඳුනාගෙන ඇති අතර, මෙම තත්ත්වයන් නිවැරදී කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති, ක්‍රමෝපාය සහ ක්‍රියාමාර්ග ඒවායේ වර්තමාන තත්ත්වය සහ සම්බන්ධිත භාවිතයන් සැලකිල්ලට ගෙන ඒ අනුව ඉදිරිපත් කර තිබේ.

### 3.4 ජීවී නොවන වෙරළබඩ සම්පත්

මෙරට වෙරළබඩ කලාපය තුළ පාරිසරික හා ආර්ථිකමය වශයෙන් සුවිශේෂී වන විවිධත්වයෙන් යුක්ත ජීවී නොවන වෙරළ සම්පත් පවතී. වෙරළබඩ කලාපය ඔස්සේ හමුවන වැලි, ගල්, කඳු, ඛනිජ හා අනෙකුත් ද්‍රව්‍ය මෙම ජීවී නොවන වෙරළ සම්පත් ලෙස සැලකෙන අතර ඒවායෙහි සුවිශේෂී ව්‍යාප්තියක් හා ආර්ථිකමය වැදගත්කමක් පවතී.

මෙරට වෙරළ තීරය වැලි වෙරළවලින් බහුලවන අතර එමඟින් වැලි හා ගල් වඩාත් සුලභ ජීවී නොවන වෙරළ සම්පත් බවට පත්වී තිබේ. වෙරළට ආසන්න හා වෙරළින් ඔබ්බෙහි ප්‍රදේශ හැරුණවිට, වෙරළ කලාපය තුළ වැලි සම්පත වෙරළ, වැලි තුඩු, වැලි වැටි හා වෙනත් ස්වභාවයන්ගෙන් භෞතිකමය හා අවකාශීය ආකාරයෙන් පවතී. වෙරළ කලාපය තුළ පවතින වැලි ප්‍රමාණය ඔස්සේ වෙරළ ස්ථායීතාවය නිර්ණය වන අතර කැස්බෑවන් හා අනෙකුත් සමුද්‍ර ජීවීන් සඳහා වාසස්ථාන සපයනු ලැබේ. මීට අමතරව, වෙරළ කලාපයෙන් ගොඩදමන වැලි අතිරේක ආරක්ෂණ ව්‍යුහ ඇතිකිරීම, වෙරළ ගොඩ කිරීම, පිරවීම, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පනවා ඇති සීමාකිරීම් මධ්‍යයේ වුව ද කොන්ක්‍රීට් හා අනෙකුත් ඉදිකිරීම් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගැනේ.

අනෙකුත් ජීවී නොවන වෙරළ සම්පත් යටතට වැලි හැරුන විට, හුණුගල්, ග්‍රැනයිට් හා ඛනිජ වැලි වැනි විවිධ ස්වභාවයේ පාෂාණ හා ඛනිජ ද්‍රව්‍ය ඇතුළත් වේ. වෙරළ කලාපය තුළ පිහිටා ඇති වටිනා ඛනිජ වැලි නිධි යටතට ඉල්මනයිට්, මොනසයිට් සහ ගානට් ඇතුළත් වේ. මෙම ඛනිජවැලි කාර්මික කටයුතුවලට යොදා ගැනෙන අතර විශේෂයෙන් සෙරමික්, තීන්ත හා මිශ්‍ර ලෝහ නිපදවීම සඳහා යොදා ගැනේ.

මේවා ව්‍යාප්තවී ඇති ආකාරය සැලකීමේ දී, කෝකිලායි කලපුවේ සිට කිලෝ මීටර් 8 ක් පමණ දකුණට ගොඩබිම දෙසට වෙරළ තීරය ඔස්සේ අධික ලෙස ඛනිජවලින් පොහොසත් වෙරළ වැලි ව්‍යාප්ත වී තිබේ. ශ්‍රී ලංකාවේ ඊසාන දිග කලාපයේ කිලෝ මීටර් 72 ක් පමණ දිගට විහිදෙන වෙරළ තීරය, ලෝකයේ අධිකතම වශයෙන් ඛනිජ වැලි තැන්පත්වී ඇති වෙරළ ලෙස සැලකේ. පුල්මුඩේ වෙරළෙහි වැලි තැන්පත්වී ඇති ප්‍රදේශයේ ඛනිජ සංයුතිය අනුව, ඉල්මනයිට් ($FeTiO_2$) හා රූටයිල් ($TiO_2$) අධික සාන්ද්‍රණවලින් තැන්පත්වී තිබේ. තව ද, දිවයිනේ විවිධ ප්‍රදේශවල වෙරළ තීරයේ මොනසයිට්, සර්කෝන්, ගානට් හා ඉල්මනයිට් ඛනිජ වැලි නිධි හමු වේ.

පවතින තොරතුරුවලට අනුව, ශ්‍රී ලංකාවේ ඊසානදිග වෙරළ තීරයේ ඛනිජ වැලි නිධිවල ආශ්‍රිතව ලෝකයේ බැර ඛනිජ ඉහළතම සාන්ද්‍රණවලින් තැන්පත් වී ඇති නිධි පවතී.දැනට ඉල්මනයිට්, රූටයිල් සහ සර්කෝන් ප්‍රධාන වශයෙන් නිස්සාරණය කරනු ලබන්නේ ඊසානදිග වෙරළ තීරයේ වෙරළ වැලිවලිනි. මීට අමතරව, වාණිජමය වශයෙන් වැදගත් සිලිමනයිට්, මොනසයිට් හා ගානට් වෙරළ වැලිවල අන්තර්ගත වේ. බැර ලෝහ සංයුතියෙන් මොනසයිට් ප්‍රතිශතය 0.3ක් පමණ වේ. ඇතැම් ස්ථානවල දී, වැලි නිධිවල බැර ලෝහ සංයුතිය 90%ක් දක්වා ඉහළ මට්ටමකට පවතින අවස්ථා ද වාර්තා වේ. එමෙන්ම, සංයුතියෙන් 65%ක් ඉල්මනයිට්වලින් ද, 10%ක් රූටයිල්වලින් ද, 10%ක් සර්කෝන් ද පවතී. (ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්, 2013).

මොනසයිට් අඩංගු වන ඇලුවියම් ශ්‍රී ලංකාවේ නිරිතදිග කලාපයේ පවතින බව වාර්තා වේ. බෙන්තොට ගඟෙහි ජල ධාරාවේ අවසාදිත "ලොව තෝරියම් අධිකතම අවසාදිත අතුරින් එකක්" බවට විස්තර කර තිබේ (රූපසිංහ සහ පිරිස, 1983). වාණිජමය වශයෙන් සිදුකරන ක්‍රියාවලි වාර්තා නොවුන ද, බෙන්තොට ගඟ හරහා අනෙකුත් බැර ඛණිජ සමග මොනසයිට් සැලකිය යුතු ප්‍රමාණයක් ගලා ගොස් බේරුවල දකුණ සිට කයිකාවල දක්වා වන කිලෝමීටර් 12 ක දිගින් යුතු වෙරළ තීරයක සෘතුමය වෙරළ වැලි නිධිවල තැන්පත්වේ. ඉල්මනයිට් බහුල වැලි නිධි ශ්‍රී ලංකාවේ වයඹ දිග වෙරළ ඔස්සේ පවතී (මර්ෆි සහ ෆ්‍රික්, 2006). එසේ වුව ද, මෙම ඛනිජ වැලි නිධි සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් වූ විස්තර අවම වශයෙන් පවතී.

### 3.4.1 ජීවී නොවන වෙරළබඩ සම්පත් කළමනාකරණය

තිරසර වෙරළබඩ සංවර්ධනය හා වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය සඳහා ඛනිජ, වැලි හා යටිතල පහසුකම් වැනි ජීවී නොවන වෙරළබඩ සම්පත් කළමනාකරණය අත්‍යවශ්‍ය වේ. වෙරළබඩ කලාපයේ ගතික තත්ත්වය හා මෙරට ආර්ථික අවශ්‍යතාවලට අනුව, ජීවී නොවන සම්පත් වෙත කේන්ද්‍රීය වූ කළමනාකරණ ක්‍රමෝපාය සැලසුම් කළ යුතු වනුයේ වෙරළබඩ පරිසර පද්ධතිවල මනා පැවැත්ම සංරක්ෂණය කරන අතරතුර, එකී සම්පත්වල තිරසාර භාවිතය සහතික වන පරිද්දෙන් සුපරීක්ෂාකාරී අයුරිනි.

### 3.4.2 වෙරළබඩ සම්පත්වල පවතින තිරසර සංවර්ධන අවස්ථා

පරිසරය මෙන්ම ස්වකීය ජීවනෝපාය සඳහා වෙරළබඩ සම්පත් මත යැපෙන ජනතාව යන දෙපාර්ශවයෙහිම දිගුකාලීන මනා පැවැත්ම සහතික කිරීම සඳහා වෙරළබඩ සම්පත් තිරසර අයුරින් සංවර්ධනය කිරීම ඉතා වැදගත් වේ. මෙරට වෙරළ ප්‍රදේශ ජෛව විවිධත්වයෙන් පොහොසත් අතර ධීවර කටයුතු, සංචාරක, සහ වෙරළ ඛාදනයෙන් ආරක්ෂා කිරීම වැනි අත්‍යවශ්‍ය පරිසර පද්ධති සේවා ද ලබා දෙනු ලැබේ. එසේ වුව ද, සීමාව ඉක්මවා එකී සම්පත් උපයෝජනය කිරීම, දූෂණය, හා දේශගුණික විපර්යාස ඇතුළුව ස්වාභාවික මෙන්ම මානව කටයුතු හේතුවෙන් ප්‍රේරණය වී ඇති තර්ජනවලට ද මෙම සම්පත් විසින් අවදානමක් දරනු ලැබේ. රට තුළ වෙරළ සම්පත්වල තිරසර සංවර්ධනය සහතික කිරීම සඳහා ආර්ථික සංවර්ධනය සමගින් පාරිසරික සංරක්ෂණය සමබර තුලනයක් ඇතිකරන සාකල්‍යවාදී හා දිගුකාලීන ප්‍රවේශයක් අවශ්‍ය කෙරේ. මෙම අනගි ස්වාභාවික සම්පත්වල ආරක්ෂාව සහ වගකීමැති භාවිතය සහතික කිරීම සඳහා රජයේ නියෝජිතායතන, ප්‍රාදේශික ප්‍රජාවන්, රාජ්‍ය නොවන සංවිධාන හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ සක්‍රීය සහභාගීත්වය ද මේ සඳහා අවශ්‍ය කෙරේ. වෙරළබඩ සම්පත්වල තිරසර සංවර්ධනය සඳහා වූ ප්‍රධාන කළමනාකරණ ක්‍රමෝපාය හා අවධානය යොමුකළ යුතු වැදගත් කරුණු අනිවාර්යයෙන් රඳා පවතිනුයේ ආර්ථික සංවර්ධනය සමගින් වෙරළබඩ පරිසරය සංරක්ෂණය තුලනය වන්නා වූ ඒකාබද්ධ වෙරළ කළමනාකරණ ප්‍රවේශයකට අනුගතවීම තුළිනි. සමාජ, ආර්ථික හා පාරිසරික අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා වෙරළබඩ කලාපයේ භූමි හා ජල සම්පත්වල සමායෝජිත සැලසුම්කරණය හා කළමනාකරණය සඳහා මෙම ප්‍රවේශයේ දී අවධානය යොමුකළ යුතු ය.

මීට අමතරව, මත්ස්‍ය ගහණයේ දිගුකාලීන ශක්‍යතාවය සහතික කිරීම සඳහා මසුන් අධික වශයෙන් නෙළා ගැනීම සහ හානිකර මසුන් ඇල්ලීමේ ක්‍රම සීමා කිරීම, පංගු ක්‍රමයන්, විශාලත්ව සීමා ක්‍රියාත්මක කිරීම හා යම් කාලසීමාවන් තුළ භාවිතය වළක්වාලීම ඔස්සේ තිරසර ධීවර කළමනාකරණය සහතික කළ යුතු ය. තව ද, එළදායී කළමනාකරණය සහ ජෛව විවිධත්වය

ආරක්ෂා කිරීම, ධීවර කටයුතු වැඩිදියුණු කිරීම හා තිරසර සංචාරක කර්මාන්තය ප්‍රවර්ධන කිරීම සහතික කිරීම සඳහා විශේෂ කළමනාකරණ ප්‍රදේශ (SMAs) හා සමුද්‍රීය ආරක්ෂිත ප්‍රදේශ (MPAs) ස්ථාපනය කළ යුතු ය. සමුද්‍රීය පරිසර පද්ධති පිළිබඳ අධ්‍යයන කටයුතු සඳහා හා ඒවා ආරක්ෂා කිරීම සම්බන්ධිත ජීවී පර්යේෂණාගාර ලෙස සමුද්‍රීය ආරක්ෂිත ප්‍රදේශවලට ක්‍රියා කළ හැකිවනු ඇත.

කාර්මික, කෘෂිකාර්මික හා නාගරික මූලාශ්‍රවලින් ඇතිවන දූෂණය පාලනය කිරීම සඳහා දැඩි නියෝග ක්‍රියාත්මක කිරීම ද වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සඳහා වැදගත් වේ. ඉහළ යන මුහුදු මට්ටම, ඉහළ ගිය සුළං තීව්‍රතාවය සහ සාගර ජලය ආම්ලිකරණයවීම ඇතුළු දේශගුණික විපර්යාසවල බලපෑම්වලට අනුගත වන්නා වූ ක්‍රමෝපාය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම පරිසර පද්ධතිවල තිරසර කළමනාකරණය සහතික කිරීම සඳහා අවශ්‍ය වේ. ප්‍රතිරෝධී යටිතල පහසුකම්, අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් වෙනත් ස්ථානවල පදිංචි කරවීම, සහ තිරසර වෙරළාශ්‍රිත ඉංජිනේරු විසඳුම් ක්‍රියාත්මක කිරීම මීට ඇතුළත් වනු ඇත.

## 3.5 වෙරළ සම්පත් කළමනාකරණය සහ සම්බන්ධීකරණය

වෙරළ සම්පත් සම්බන්ධයෙන් කටයුතු කරන අදාළ රේඛීය නියෝජිතායතන (ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, පළාත් පාලන ආයතන ආදී වශයෙනි) විසින් වෙරළ සම්පත්වලට අදාළව ආයතනික වශයෙන් රීති, නියෝග, කළමනාකරණ හා සංරක්ෂණ මාර්ගෝපදේශ, නිර්දේශ හා ලේඛන සකස් කිරීමේ දී හෝ යාවත්කාලීන කිරීමේ දී වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනතේ රීති හා නියෝග, වෙරළ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මේ ඇතුළත් කළමනාකරණ මාර්ගෝපදේශ, කළමනාකරණ අරමුණු, ප්‍රතිපත්ති, ක්‍රමෝපාය, හා ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අවධානය යොමුකළ යුතු ය. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත මගින් ආරක්ෂා වී ඇති සම්පතක් නොවන්නේ නම්, අවශ්‍ය පියවර සමග එය යාවත්කාලීන කළ යුතු ය. යථෝක්තව සඳහන් කළ අවශ්‍යතා මෙම රේඛීය නියෝජිතායතනවල කළමනාකරණ සැලසුම් සහ සංරක්ෂණ ප්‍රතිපත්තිවලට අන්තර්ගත කර තිබේද යන්න නිශ්චය කිරීම සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පසු විපරම් විමර්ශන දියත් කළ යුතු අතර අතර එමඟින් කළමනාකරණය සඳහා ඵලදායි ආයතනික සම්බන්ධීකරණය සහතික වේ.

තව ද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආයතන ද ඇතුළුව විවිධ රේඛීය නියෝජිතායතන විසින් ඇතැම් වෙරළ සම්පත් කළමනාකරණය කරනු ලැබේ. ඇතැම් ක්‍රියාකාරකම් වෙරළ කලාපය ඉක්මවා ද ව්‍යාප්ත වේ නම්, එකී අදාළ ආයතන විසින් එම ක්‍රියාමාර්ග වෙරළ සම්පත් කෙරෙහි කෙසේ බලපායි ද යන්න සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු ය (උදාහරණයක් ලෙස ගඟ මුවදොරක පිහිටි ගං මෝය ප්‍රදේශය).

## 3.6 කළමනාකරණ අරමුණු, ප්‍රතිපත්ති, ක්‍රමෝපාය සහ පියවර

**අරමුණ 1**
ජෛව විවිධත්වය ඉහළ නැංවීම, නිෂ්කර්ශනය කළ නොහැකි වටිනාකම්, ඛාදනය, සුනාමි, රළ කුණාටු වැනි වෙරළබඩ උපද්‍රව්‍යයන්ට එරෙහි බාධාවක් ලෙස ක්‍රියා කිරීම, ජෛව සම්පත්වල තිරසාර භාවිතයට ඉඩ ප්‍රස්තාව සැලසීම සහ ධීවර සහ අනෙකුත් ආර්ථික කටයුතු සඳහා හිරිගල්පර සංරක්ෂණය කරනු ලැබේ.

**ප්‍රතිපත්තිය 1.1**
වෙරළ කලාපය තුළ සහ ඉන් පිටත මානව ක්‍රියාකාරකම් ඔස්සේ ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව හිරිගල්පර හායනය සහ විනාශවීම අවම කරනු ඇත.

**ක්‍රමෝපාය 1.1.1**
මානව ක්‍රියාකාරකම් ඔස්සේ හිරිගල්පර හානිවීම සහ විනාශ කිරීම අවම කිරීම/ තුරන් කිරීම සඳහා දැනට පවතින නීති හා රෙගුලාසි ඵලදායි අයුරින් බලාත්මක කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. හිරිගල්පර පරිසර පද්ධති හායනය වැළැක්වීම සඳහා දැනට පවතින නීති/රෙගුලාසි අඛණ්ඩව බලාත්මක කිරීම.

2. පවතින තත්ත්වය වඩාත් ඵලදායී ආකාරයෙන් වැඩිදියුණු කිරීම සඳහා හිරිගල්පර කැණීමට එරෙහිව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ විධිවිධාන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

3. ඇතුළු මුහුදේ හිරිගල්පර කැණීම පාලනය කිරීමට සහ සෘණාත්මක බලපෑම් අවම කිරීම සඳහා අදාළ අධිකාරීන් වෙත සහාය ලබා දීම.

4. හිරිගල්පර මත පදනම්ව හුණුගල් භාවිතා කරන පිරිස්, වෙරළබඩ පදිංචිකරුවන්, විසිතුරු මසුන් ඇති කරන පිරිස්, ධීවරයන්, සංචාරක මාර්ගෝපදේශකයන් සහ වීදුරු පතුල් සහිත බෝට්ටු ක්‍රියාකරුවන් වැනි හඳුනාගත් ඉලක්ක කණ්ඩායම් සඳහා හිරිගල්පර විනාශවීම වැළැක්වීමට අදාළ නීති/ රෙගුලාසි සම්බන්ධයෙන් වන දැනුවත්බව ඇතිකිරීමේ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

**ක්‍රමෝපාය 1.1.2**

ඉදිකිරීම් කර්මාන්තයේ හා කෘෂිකර්මාන්තයේ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය හුණු වෙනුවට විකල්ප ද්‍රව්‍ය භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. හිරිගල්පර සංරක්ෂණය කිරීමට හැකිවන පරිද්දෙන් හිරිගල් මත පදනම් වූ හුණු සඳහා වන විකල්ප ආදේශක හා ඉදිකිරීම් තාක්ෂණයන්ගේ භාවිතය පිළිබඳව ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදීම.

2. හිරිගල් මත පදනම් හුණු භාවිත කරන විවිධ කණ්ඩායම් අතර ඒ සඳහා වන ආදේශක භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙළෙඳපොළ මෙවලම් දිරිමත් කිරීම හා ඊට පක්ෂව කටයුතු කිරීම

3. රජයේ ඉදිකිරීම් කාර්යයන් සඳහා හිරිගල් මත පදනම් හුණු භාවිතය සීමා කිරීමේ ප්‍රතිපත්තිය තවදුරටත් ක්‍රියාත්මක කිරීම.

**ප්‍රතිපත්තිය 1.2**

හිරිගල්පර සම්බන්ධයෙන් කටයුතු කළමනාකරණය කිරීමේදී හැකි සෑම අවස්ථාවන්හිදී ම දේශගුණික විපර්යාස සහ අනෙකුත් ස්වාභාවික සංසිද්ධි සම්බන්ධයෙන් ප්‍රචලිත ප්‍රවණතාවයන් සැලකීම.

**ක්‍රමෝපාය 1.2.1**

හිරිගල්පර සඳහා දේශගුණික විපර්යාසයන්ට අනුගතවීම සම්බන්ධිත නිර්දේශිත ප්‍රතිපත්ති මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. හිරිගල්පරවල ගුණාත්මක බව පිළිබඳ තත්ත්වය සහ ප්‍රවණතාවයන් සම්බන්ධයෙන් ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය විසින් සිදු කරනු ලබන අධීක්ෂණ කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ සහාය වීම.

2. ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්ව සැලසුම (2021-2030) යටතේ අදාළවන හඳුනාගත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම.

3. හිරිගල්පර පරිසර පද්ධතීන් කඩිනමින් ප්‍රතිෂ්ඨාපනයවීම සඳහා පහසුකම් සැලසීම සඳහා සිද්ධීන්ගෙන් අනතුරුව පශ්චාත් වෙරළබඩ පරිසරය වැඩිදියුණු කිරීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගැනීම.

4. උපකෘත විකසනය හා වැඩි වශයෙන් උෂ්ණත්වය සඳහා ඔරොත්තු දෙන හිරිගල් විශේෂ වගා කිරීම වැනි හිරිගල්පර සඳහා වෙනස්වන පරිසරයට අනුවර්තනය වීම සඳහා රුකුලක් වන ක්‍රමෝපාය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

**ප්‍රතිපත්තිය 1.3**

තිරසර ධීවර කළමනාකරණ පරිචයන් වෙත අනුගතවීම හරහා හිරිගල්පරවල ජෛව විවිධත්වය සංරක්ෂණය/ වැඩිදියුණු වීම සිදු වේ.

**ක්‍රමෝපාය 1.3.1**

ජලජ මත්ස්‍යයන්, පොකිරිස්සන්, හක්ගෙඩි සහ මුහුදු කැකිරි වැනි ගල්පර ආශ්‍රිත මත්ස්‍යයින් වැඩි වශයෙන් අස්වැන්න ලෙස නෙලා ගැනීම යෝග්‍ය කළමනාකරණ පියවර ඔස්සේ වැළැක්වීම/ අවම කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. පොකිරිස්සන්, හක්ගෙඩි, විසිතුරු මසුන් සහ මුහුදු කැකිරි සම්බන්ධයෙන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව/ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය විසින් සිදුකළ මත්ස්‍ය ගහණය තක්සේරු කිරීමට අදාළ නිර්දේශ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම දිරිමත් කිරීම හා පහසුකම් සැලසීම.

2. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් මත්ස්‍ය ගහණය සම්බන්ධයෙන් බලාත්මක කර ඇති මාර්ගෝපදේශ සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ ඵලදායිතාවය අධීක්ෂණය කිරීම.

3. ජෛව විවිධත්වය සංරක්ෂණ ක්‍රියාකාරී සැලැස්ම මගින් යෝජනා කළ ක්‍රියාමාර්ග හිරිගල්පර ආශ්‍රිත ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සඳහා අදාළ ලෙස සලකා ක්‍රියාත්මක කිරීමට සහාය දැක්වීම.

**ප්‍රතිපත්තිය** 1.4

හිරිගල්පර ප්‍රතිෂ්ඨාපනය/ පුනරුත්ථාපනය සහ සංරක්ෂණය සඳහා අදාළ විද්‍යාත්මක පර්යේෂණ ඇතුළු කළමනාකරණ ප්‍රයත්නයන් ප්‍රවර්ධනය කෙරෙනු ඇත.

**ක්‍රමෝපාය** 1.4.1

හිරිගල්පර ආශ්‍රිත සමීක්ෂණ ප්‍රවර්ධනය කිරීම හා සහාය දැක්වීම මෙම පරිසර පද්ධති හා ඒවායේ සම්පත් ප්‍රතිෂ්ඨාපනය කිරීම සහයෝගීතා පර්යේෂණ හරහා සිදුකිරීම සහ තොරතුරු හවුලේ බෙදා ගැනීම/ කාර්යක්ෂම ව්‍යාප්තිය සඳහා වන පියවර ප්‍රවර්ධනය කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. ශ්‍රී ලංකාවේ වෙරළබඩ ජලය ආශ්‍රිත හිරිගල්පර පරිසර පද්ධතිවල තත්‍ය ව්‍යාප්තිය, තත්ත්වය හා ආර්ථික අගය නිර්ණය කිරීම සඳහා සමීක්ෂණ පැවැත්වීම.

2. හිරිගල්පර ප්‍රතිෂ්ඨාපනය සඳහා ප්‍රමුඛතාගත ස්ථාන හඳුනාගැනීම, එම හිරිගල්පර ප්‍රතිෂ්ඨාපනය කිරීමේ ක්‍රමවේද හා තාක්ෂණයට සම්බන්ධ තොරතුරු ව්‍යාප්ත කිරීම.

3. හිරිගල්පර දැඩි වශයෙන් විනාශවී තිබීම සම්බන්ධයෙන් සාක්ෂි පවතින ප්‍රදේශවල ප්‍රජා සහභාගිත්වයෙන් හිරිගල්පර නැවත වගා කිරීම සඳහා දේශීය/ විදේශීය අරමුදල් සපයන ආයතන හා පර්යේෂණ ආයතන/ විශ්වවිද්‍යාල සමග සහයෝගිතාවයෙන් වැඩසටහන් ආරම්භ කිරීම.

4. ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ඉවහල් වන්නා වූ හිරිගල්පර ජීවීන් පිළිබඳව වන සහයෝගිතා පර්යේෂණවල ධාරිතාවය ඉහළ නැංවීම හා ප්‍රවර්ධනය සඳහා වූ යාන්ත්‍රණයක් ආරම්භ කිරීම (උදාහරණ වශයෙන් සෞඛ්‍යමය වටිනාකමක් සහිත ජීවීන්).

5. පසැඟිල්ලන් (තාරකා මසුන්) ගහණය වර්ධනයවීම පිළිබඳ භූගෝලීය පදනමකින් වන විමර්ශන ප්‍රවර්ධනය කිරීම සහ පසගිල්ලන් මර්දනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

6. හිරිගල්පර සම්බන්ධයෙන් ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය විසින් සකස්කළ මෙටා දත්ත සමුදාය නියමිත කාලාන්තරවලදී යාවත්කාලීන කිරීම සඳහා එම ආයතනයට සහාය වීම සහ හිරිගල්පර සම්බන්ධයෙන් අන්තර් ආයතනික දත්ත සමුදායක් ස්ථාපනය කිරීම හා මෙම තොරතුරු වෙත ප්‍රවේශය ලබාදීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම.

7. හිරිගල්පර කැණීම හා අනෙකුත් භාවිතයන් කළමනාකරණය සඳහා පහසුකම් සැලසීම සඳහා හිරිගල්පර සම්පත් භාවිතයන් පිළිබඳව සමාජ ආර්ථික දත්ත එකතු කිරීම වැඩි දියුණු කිරීම.

**ප්‍රතිපත්තිය** 1.5

හිරිගල් පර ආශ්‍රිත සංචාරක කටයුතු, විනෝදාස්වාද කටයුතු හා අනෙකුත් සංවර්ධන ක්‍රියාකාරකම් කළමනාකරණය ඔස්සේ හිරිගල්පරවල මනා පැවැත්ම සහතික කළ යුතු ය.

**ක්‍රමෝපාය 1.5.1**

සහයෝගිතා පියවර ඔස්සේ හිරිගල්පර සහ ඒවායේ ඇති සම්පත් මත ඇතිකරන නිෂේධනාත්මක බලපෑම් අවම කිරීම සඳහා සංචාරක කටයුතු සහ අනෙකුත් සංවර්ධන ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. හිරිගල් සඳහා ඇතිවන භෞතික හානි අවම කිරීම සඳහා තිරසර හා වගකීම් සහගත සංචාරක පුරුදු ප්‍රවර්ධනය කිරීම සහ හිරිගල්පරවල වැදගත්කම පිළිබඳ සංචාරකයින් දැනුවත් කිරීම.

2. අදාළ සංචාරක සංවර්ධන ප්‍රදේශවල පවතින හිරිගල්පර කළමනාකරණය සඳහා අවශ්‍ය ප්‍රජා සහභාගිත්වය ද සහිතව පුද්ගලික ව්‍යවසායකයින්ගේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම.

3. අදාළ නියෝජිතායතන සමග සහයෝගීතාවයෙන් නියාමන පියවර ඔස්සේ සංවර්ධන කටයුතුවලින් සිදුකරන බැහැර කිරීම් හා අවසාදිත තැන්පත්වීම් පාලනය කිරීම (බලපත්‍ර, පරිසර ආරක්ෂණ බලපත්‍රය, පාරිසරික බලපෑම් තක්සේරුව/මූලික පරිසර පරීක්ෂණය).

4. පුද්ගලික අංශයේ මැදිහත්වීමෙන් සංචාරක ප්‍රදේශවලදී හිරිගල්පරවල නිෂ්කර්ශනය කළ නොහැකි වටිනාකම්වල භාවිතයන් ඔස්සේ වෙරළබඩ ප්‍රජාවන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම.

5. සංචාරක, විනෝදාස්වාද සහ ධීවර කටයුතුවලට අදාළව හිරිගල්පර කෙරෙහි ඇතිවන නිෂේධනාත්මක බලපෑම් අවම කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමග ප්‍රජා ආවේක්ෂණ වැඩසටහන් ආරම්භ කිරීම.

6. හිරිගල්පර නැරඹීම සඳහා විභවතාවයක් පවතින ප්‍රදේශවල දී සම්පත්වලින් ලබාගන්නා විනෝදාස්වාදය වැඩිකිරීමට සහ සංරක්ෂණය උදෙසා එම හෝටල්වලට භාෂණ පරිවර්තන පහසුකම් ලබාදීම සඳහා හෝටල්/සංචාරක මණ්ඩලය සමග සහයෝගීතා වැඩසටහන් ආරම්භ කිරීම.

7. සංචාරක මණ්ඩලය, හෝටල් සහ සංචාරක මාර්ගෝපදේශකයන්, රේගු සහ ගුවන් තොටුපළ අධිකාරීන් සමග වන සහයෝගීතා වැඩසටහන් ඔස්සේ හිරිගල්පරවල හා හිරිගල් ආශ්‍රිතව වාසය කරන ජීවීන්ගේ සංරක්ෂණ තත්ත්වය සම්බන්ධයෙන් සංචාරකයන්ගේ හා සංචාරක මාර්ගෝපදේශකයන්ගේ දැනුවත් බව ප්‍රවර්ධනය කිරීම.

8. අපනයන තහනම් කළ හිරිගල්පර ජීවීන් හඳුනාගැනීම සඳහා අදාළ රාජ්‍ය නිලධාරීන්ට සහාය වීම සඳහා එකී අවශ්‍යතානුකූලව සැකසූ පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම හා සහාය ලබාදීම හා සමුද්දේශ සැපයීම.

9. ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය, විශ්වවිද්‍යාල සහ ආශ්‍රිත ප්‍රජාවන්ගේ සහාය ඇතිව හිරිගල්පර හායනයට ලක්වූ ප්‍රදේශවල හිරිගල් ප්‍රතිරෝපණ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම.

**අරමුණ 2**

සම්පත්වල තිරසාරභාවය පවත්වා ගනිමින් පාරිසරික ක්‍රියාවලින් දරා සිටීමට හා වැඩිදියුණු කිරීමටත් සහ සමාජ - ආර්ථික කටයුතු ප්‍රවර්ධනය කිරීමත්, නිෂ්කර්ශනය කළ නොහැකි වටිනාකම් සඳහාත් කලපු සහ ගංමෝය සංරක්ෂණය කරනු ලැබේ.

**ප්‍රතිපත්තිය 2.1**

වෙරළ කලාපය තුළ මෙන්ම ඉන් පිටත මානව කටයුතු සහ සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් කලපු හා ගං මෝයවලට සිදුවන හායනය අවම කිරීම/ වැළැක්වීම සිදු කෙරේ.

**ක්‍රමෝපාය 2.1.1**

දැනට ක්‍රියාත්මක රෙගුලාසි සහ මාර්ගෝපදේශවලට අනුකූලතාව අධීක්ෂණය කිරීම සහ බලාත්මක කිරීම ඔස්සේ කලපු සහ ගංමෝයවලට පිරියම් නොකරන ලද අපද්‍රව්‍ය සහ මල ද්‍රව්‍ය බැහැර කිරීම අවම කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. කලපු හා ගංමෝයවලට මුදා හැරෙන කාර්මික අපද්‍රව්‍ය (ඉස්සන් ගොවිපොළ වෙතින් මුදා හැරෙන අපද්‍රව්‍ය ද ඇතුළුව) හා මල අපද්‍රව්‍යවලින් සිදුවන බලපෑම නිර්ණය කිරීම සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ දැනට ක්‍රියාත්මක මුහුදු ජලයේ ගුණාත්මක බව සුපරීක්ෂණය කිරීමේ වැඩසටහන කලපු සහ ගංමෝය ද ආවරණය වන පරිදි පුළුල් කිරීම.

2. කාර්මික දූෂණයේ හානිකර බලපෑම් අවම කිරීමේ පියවර සකස් කිරීම සඳහා සහ වාසස්ථානවලින් කලපු හා ගංමෝයවලට කෙළින්ම මල අපද්‍රව්‍ය බැහැර කිරීම අවම කිරීම සඳහා පළාත් පාලන ආයතන හා අනෙකුත් අදාළ නියෝජිතායතන සමග වැඩසටහන් ආරම්භ කර ක්‍රියාත්මක කිරීම හෝ දැනට ක්‍රියාත්මක වැඩසටහන් සඳහා සහාය ලබාදීම.

3. වෙරළ කලාපය තුළ පවතින සියලුම කර්මාන්ත සංවර්ධන බලපත්‍ර, පරිසර ආරක්ෂණ බලපත්‍ර, පාරිසරික බලපෑම් තක්සේරුව/මූලික පරිසර පරීක්ෂණය හරහා පනවා ඇති කොන්දේසි/ මාර්ගෝපදේශවලට අනුගතවී ඇති බව සහතික කරගැනීම සඳහා අනුකූලතා අධීක්ෂණ වැඩසටහනක් සම්පාදනය කිරීම.

4. කලපු වෙත දූෂිත ද්‍රව්‍ය බැහැර කිරීම් අවම කිරීම සඳහා දැනට පනවා ඇති නීතිවල පවතින විධිවිධාන ඵලදායි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම.

**ප්‍රතිපත්තිය 2.2**

ප්‍රබල විද්‍යාත්මක තොරතුරු මත පදනම්ව කලපු සහ ගංමෝය මුවදොරවල් හා ආසන්න ඉවුරු කළමනාකරණය කෙරෙනු ඇත.

**ක්‍රමෝපාය 2.1.2**

අනවසර අල්ලා ගැනීම්, ගොඩකිරීම්, වෘක්ෂලතාදිය ඉවත් කිරීම සහ වෙනත් සංවර්ධන කටයුතු මගින් කලපු සහ මෝයවල ක්‍රියාකාරී ජල ප්‍රදේශ අඩු වීම අවම කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. අදාළ නියෝජිතායතනවල සහාය ඇතිව කලපු හා මෝයවල සීමා සම්බන්ධයෙන් මිනුම් කටයුතු සිදුකර මායිම් වෙන් කිරීම.

2. වෙරළ කලාපය තුළ වෙරළබඩ ජලතලයන්හි දෙපස භූමිය සහ ජල ප්‍රදේශ ආවරණය වන පරිද්දෙන් සංවර්ධන කටයුතු පාලනය කිරීම සඳහා සංවර්ධන බලපත්‍ර ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.

3. කලපු සහ මෝය ආශ්‍රිත සංවර්ධන ක්‍රියාකාරකම් පාලනය කිරීම සඳහා වෙරළ සංරක්ෂණ පනතේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ සම්බන්ධයෙන් වන නෛතික විධිවිධාන ක්‍රියාත්මක කිරීම.

4. අනවසර අල්ලා ගැනීම් සහ ගොඩකිරීම්වලට එරෙහිව දැනට පවතින නියාමන පියවර බලාත්මක කිරීම.

**ප්‍රතිපත්තිය 2.3**

මෝය සහ කලපු හා සම්බන්ධිත ආර්ථික, පාරිසරික සහ සමාජීය අගයන් හඳුනාගැනීම සහ ඒවා වැඩි දියුණු කිරීම සිදුකරනු ඇත.

**ක්‍රමෝපාය 2.3.1**

පරිසර පද්ධති සේවාවන් තක්සේරු කිරීම සහ ප්‍රජා සහභාගීත්වය මගින් මෝය සහ කලපු ආශ්‍රිත සම්පත්වල තිරසාර කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. තෝරාගනු ලැබූ දේශපාලනික, ආර්ථික වැදගත්කමක් ඇති බාධක සහිත මෝයන්හි පරිසර පද්ධතියේ වටිනාකම තක්සේරුකිරීමේ ආදර්ශකයක් සැකසීම(මීගමුව හා පුත්තලම).

2. ධීවර උපකරණ, උපක්‍රම සහ කටයුතු පාලනය කිරීමෙන් මෝය/ කලපුවල ධීවර කටයුතු තිරසාර මට්ටමක පවත්නා බව සහතික කිරීම.

3. සම්පත්වල තිරසරබව පවත්වාගනිමින් මෝය/කලපුවල හා ඒවායේ ස්වාභාවික පරිසරවල පාරිසරික, සෞන්දර්යාත්මක හා විනෝදාස්වාද වටිනාකම් භාවිතා කිරීම ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් සම්පාදනය කිරීම.

4. පරිසර අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ජාතික ජෛව විවිධත්ව සංරක්ෂණ ක්‍රියාත්මක සැලැස්මේ අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දිරිමත් කිරීම සහ සහාය වීම.

5. තෝරා ගන්නා ලද මෝය/කලපුවල වැලිවැටි ඇවුරුම් නිර්මාණය වීමේ/ඉවත්වීමේ බලපෑම් අධ්‍යයනය කිරීම සහ අහිතකර ප්‍රතිඵල අවම කිරීමේ පියවර හඳුනාගැනීම.

**ක්‍රමෝපාය 2.3.2**

ජලය හැරවීම් සහ වාරිමාර්ග යෝජනා ක්‍රමවලින් ඇතිකරන අහිතකර ප්‍රතිඵලවලින් මෝය/කලපුවල පරිසරවල ඇතිවන වෙනස්වීම් සහයෝගිතා වැඩසටහන් හරහා අවම කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. වාරිමාර්ග කටයුතු ද ඇතුළුව ඉහළ ජල පෝෂක ප්‍රදේශවල සිදුවන සංවර්ධන කටයුතු හේතුවෙන් හටගන්නා දූෂණය/ අවසාදිත තැන්පත්වීම/ ලවණතාවය වෙනස්වීම අවම කිරීම සඳහා කලපු හා මෝය කළමනාකරණය සහ ජලපෝෂක කළමනාකරණය ඒකාබද්ධ කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම.

2. තෝරාගත් මෝය/කලපු ආශ්‍රිතව ජලය හැරවීම් සහ වාරිමාර්ග යෝජනා ක්‍රමවලින් ඇතිකරන බලපෑම් අධ්‍යයනය කිරීම සහ හානිකර බලපෑම් අවම කිරීම සඳහා පියවර හඳුනාගැනීම.

**අරමුණ 3**

පාරිසරික ක්‍රියාවලි සහ සමාජ-ආර්ථික අගයන් පවත්වා ගැනීම සඳහා මුහුදු තෘණතලා සංරක්ෂණය කරනු ලැබේ.

**ප්‍රතිපත්තිය 3.1**

මුහුදු තෘණතලාවලට සෘජුව සහ වක්‍රව හානි සිදුවන ක්‍රියාවන් අවම කරනු ඇත.

**ක්‍රමෝපාය 3.1.1**

අදාළ ආයතන සමග පවත්නා රෙගුලාසි යොදා ගැනීම ඔස්සේ මුහුදු තෘණතලාවලට හානිවන ක්‍රියාකාරකම්වල අහිතකර බලපෑම් අවම කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. මුහුදු තෘණතලා වලට හානි සිදුවන දූෂණය, වැලි කැණීම, හානිකර ධීවර ක්‍රමවේද හා අනෙකුත් ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා දැනට පවතින නියාමන පියවර බලාත්මක කිරීම.

2. වෙරළබඩ ජලයෙන් ද්‍රව්‍ය ගොඩ දැමීමේ සහ කැණීමේ කටයුතුවල විභව්‍ය අහිතකර බලපෑම් මඟහැරවීම සඳහා පාරිසරික බලපෑම් තක්සේරු/මූලික පරිසර පරීක්ෂණය ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම.

**ප්‍රතිපත්තිය 3.2**

ශ්‍රී ලංකාවේ මුහුදු ජලයේ පවතින මුහුදු තෘණතලා පිළිබඳ පර්යේෂණ හා ප්‍රජා දැනුවත් බව ප්‍රවර්ධනය කරනු ලැබේ.

**ක්‍රමෝපාය 3.2.1**

මුහුදු තෘණතලා කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ඉවහල් වන අන්තර් නියෝජිතායතන සහයෝගීතා පර්යේෂණ සහ අධීක්ෂණ හා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. මෙරට මුහුදු ජලයේ පවතින මුහුදු තෘණතලාවලින් තීරණාත්මක ලෙස තර්ජනයට ලක්වී ඇති මුහුදු තෘණ තලා සම්බන්ධයෙන් විධිමත් සිතියම්කරණයක් සිදුකිරීම සඳහා වැඩසටහන් දියත් කිරීම.

2. අවදානමට/ තර්ජනයට ලක්වී ඇති මුහුදු තෘණතලා සහිත ස්ථාන වෙරළ සංරක්ෂණ පනතේ විධිවිධාන යටතේ සංරක්ෂණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කිරීම.

3. ජල පෝෂක ප්‍රදේශවල භූ ජලය හා වැලි ඇවුරුම් නිර්මාණයවීම ආශ්‍රිතව මුහුදු තෘණතලා මත ඇතිවන අහිතකර බලපෑම් අධ්‍යයනය සඳහා වැඩසටහනක් ආරම්භ කිරීම හා කළමනාකරණ පියවර යෝජනා කිරීම.

4. මුහුදු තෘණතලා සංරක්ෂණය කිරීම හා ආශ්‍රිත වාසස්ථාන පරිසර පද්ධති පිළිබඳව ඉලක්කගත කණ්ඩායම් සඳහා ප්‍රජාවට සමීප වැඩසටහනක් දියත් කිරීම.

5. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය ඔස්සේ කලපුවල මුහුදු තෘණතලා සංරක්ෂණය කිරීමේ ගැටලුවට පිළියම් යෙදීම.

**අරමුණ 4**

ජෛව විවිධත්වය පවත්වා ගැනීම, පරිසර පද්ධති සේවා සහ සමාජ -ආර්ථික ක්‍රියාකාරකම් නොනැසී පවත්වා ගැනීම සඳහා කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණය සිදු කෙරේ.

**ප්‍රතිපත්තිය 4.1**

සැලසුමකින් තොර සංවර්ධන කටයුතු හේතුවෙන් කඩොලාන ක්ෂයවීම හා හායනය වීම වළක්වා ගැනේ/ අවම කෙරේ.

**ක්‍රමෝපාය 4.1.1**

කඩොලාන පද්ධති වෙත සිදුවන හානිය වළක්වා ගැනීම හෝ අවම කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. කළමනාකරණය කඩිනමින් අවශ්‍යවන සහ සංරක්ෂණය සඳහා ප්‍රමුඛතාගත කර ඇති අවදානමට මුහුණ දී ඇති කඩොලාන ප්‍රදේශ හඳුනාගැනීම.

2. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ප්‍රමුඛතා ලැයිස්තුව මත පදනම්ව සංරක්ෂණ ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීම.

3. ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්ව සැලසුම යටතේ කඩොලානවලට අදාළව හඳුනාගත් ක්‍රියාකාරකම් ක්‍රියත්මක කිරීම.

4. හඳුනාගත් හායනයට ලක්වූ කඩොලාන ප්‍රදේශ ප්‍රතිෂ්ඨාපනය සඳහා කඩොලාන නැවත රෝපණය කිරීමේ යෝජනා ක්‍රම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම.

5. පාරිසරික බලපෑම් තක්සේරු/මූලික පරිසර පරීක්ෂණය ක්‍රියාවලි හා බලපත්‍ර යටතේ කඩොලාන ප්‍රදේශවල නව සංවර්ධන කටයුතු නියාමනය කිරීම.

6. කඩොලාන පරිසර පද්ධති තුළ වර්තමාන සහ අනාගත සංවර්ධන කටයුතු හේතුවෙන් ඇතිවිය හැකි අහිතකර ප්‍රතිඵල හඳුනාගැනීම සඳහා අධීක්ෂණ යාන්ත්‍රණයක් හඳුන්වාදීම සහ යෝග්‍ය අවම කිරීමේ පියවර සම්පාදනය කිරීම.

7. කඩොලාන සම්පත් තිරසර ආකාරයෙන් නිෂ්කර්ශනය කළ හැකි යෝග්‍ය ස්ථාන හඳුනාගැනීම සහ එකී භාවිතයන් සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

**ප්‍රතිපත්තිය 4.2**

ආර්ථික ක්‍රියාකාරකම් සමග සම්බන්ධිත කඩොලාන සම්පත්වල තිරසර භාවිතය සඳහා සහාය ලබා දේ.

**ක්‍රමෝපාය 4.2.1**

ආයතනික සහයෝගීතාව සහ ප්‍රජා සහභාගීත්වය හරහා ආර්ථික කටයුතු සඳහා කඩොලාන තිරසරව කළමනාකරණය සඳහා සහාය සහ ප්‍රවර්ධනය කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. උචිත ස්ථානවල ප්‍රජා සහභාගීත්වයෙන් පරිසර හිතකාමී සංචාරක කටයුතු ඇරඹීම සඳහා පුද්ගලික අංශය දිරිමත් කළ යුතුය.

2. ප්‍රජා මට්ටමෙන් යොදාගත හැකි හානිකර නොවෙන කඩොලාන භාවිතයන් හඳුනාගෙන ඒ පිළිබඳ තොරතුරු පාර්ශවකරුවන් වෙත ප්‍රචාරණය කළ යුතුය.

3. තිරසර ලෙස කඩොලාන සම්පත් භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා අන්තර් ආයතනික සම්බන්ධීකරණය හා සහභාගිත්වය සහතික කරගැනීමේ යෝග්‍ය යාන්ත්‍රණයක් ස්ථාපනය කළ යුතු ය.

4. තිරසර ලෙස කඩොලාන භාවිතය සහතික කිරීම සඳහා විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය ඔස්සේ වැඩසටහන් සකස් කොට සහ ක්‍රියාත්මක කිරීම.

**ප්‍රතිපත්තිය 4.3**

දැනට පවත්නා නීති විධිවිධානවලට අනුකූලව වෙරළ කලාපය තුළ පවත්නා කඩොලාන ආරක්ෂා කිරීම.

**ක්‍රමෝපාය 4.3.1**

වෙරළ කලාපය තුළ පිහිටි කඩොලාන ආරක්ෂා කිරීම සඳහා නෛතික විධිවිධාන බලාත්මක කිරීම දිරිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. පාර්ශවකාර කණ්ඩායම් තුළ දැනට පවතින නෛතික විධිවිධාන පිළිබඳව අධ්‍යාපනයක් ලබාදීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

2. නීතිමය විධිවිධාන උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීම සඳහා ප්‍රජා සහභාගිත්වය දිරිමත් කිරීම.

**අරමුණ 5**

පාරිසරික ක්‍රියාවලි, සමාජ ආර්ථික හා සෞන්දර්යාත්මක අගයන් පවත්වා ගැනීම උදෙසා බාධක වෙරළවල්, වැලි තුඩු හා වැලි වැටි සංරක්ෂණය කෙරේ.

**ප්‍රතිපත්තිය 5.1**

බාධක වෙරළවල්, වැලි තුඩු හා වැලි වැටි හායනය කරන වෙරළ සංවර්ධන කටයුතු නියාමනය කෙරේ.

**ක්‍රමෝපාය 5.1.1**

නියාමන පියවර හා වැලි වැටි ඉම ස්ථාපනය කිරීමෙන් බාධක වෙරළවල්, වැලි තුඩු හා වැලි වැටි මත සංවර්ධන කටයුතුවලින් ඇතිකරන අහිතකර බලපෑම් අවම කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. වෙරළබඩ පහත් බිම් අභිමුඛව ඇති බාධක වෙරළ, තුඩු සහ වැලි වැටි අවදානම් කලාප ලෙස ප්‍රකාශයට පත්කිරීම හා එලෙස ප්‍රකාශයට පත්කළ ප්‍රදේශයන්ට හානිකර සියලු ක්‍රියාකාරකම් පාලනය කිරීම.

2. බාධක වෙරළ, වෙරළ, වැලි වැටි සහ තුඩුවලට ආසන්න ප්‍රදේශවල ස්ථානගත කිරීම යෝජිත නව සංවර්ධන කටයුතු සඳහා ස්ථානගත කිරීමේ නිර්ණායකයන් ප්‍රකාශයට පත්කර ක්‍රියාත්මක කිරීම.

3. බාධක වෙරළ, වැලි වැටි සහ තුඩු ආශ්‍රිතව හෝ ඊට ආසන්නතව පිහිටුවීමට නියමිත නව සංවර්ධන කටයුතු සඳහා පරිසර ඇගයීම් වාර්තාව අනිවාර්ය කිරීම හා වෙරළ කලාපයෙන් පිටත ස්ථාන සඳහා අවශ්‍ය නම් පමණකි.

4. බාධක වෙරළ, වැලි වැටි සහ තුඩු ආශ්‍රිතව හෝ ඊට ආසන්නතව පිහිටුවීමට නියමිත නව සංවර්ධන කටයුතුවලට අදාළ සියලුම රෙගුලාසිවලට අනුකූල බව සහතික කරගැනීම සඳහා අදාළ නියෝජිතායතන සමග සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම.

5. බාධක වෙරළ, වැලි වැටි සහ තුඩුවලට යාබදව පිහිටා ඇති රජයේ ඉඩම් සංවර්ධන කාර්යයන් සඳහා වෙන්කිරීම වැළැක්වීම සඳහා ඊට අදාළ වන ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

6. මෙම ලේඛනයේ දක්වා ඇති පසු සිටු ප්‍රමිති සැලකිල්ලට ගෙන සිදුකළ ඉඩම් මැනීමක් මත පදනම්ව වැදගත් වැලි වැටි ප්‍රදේශ ආශ්‍රිතව වැලි වැටි ඉම ස්ථාපනය කිරීම.

7. වැලි වැටි ඉම සීමාව තුළ සියලු නව සංවර්ධන කාර්යයන් සහ දැනට පවතින ව්‍යුහයන් තවදුරටත් පුළුල් කිරීමේ කටයුතු තහනම් කිරීම.

8. වැලි වැටි ඉම සීමා පවත්වා ගැනීමේ වැදගත්කම සම්බන්ධයෙන් ප්‍රධාන පාර්ශවකරුවන් සමග සාකච්ඡා කිරීම සඳහා ඵලදායි වැඩසටහන් සකස් කිරීම.

9. 1992 අංක 33 දරන පතල් සහ ඛනිජ ද්‍රව්‍ය පනතට අනුකූලව සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් විමසා බාධක වෙරළ, වැලි වැටි සහ වැලි තුඩුවලින් වාණිජමය වශයෙන් වටිනා ඛනිජ හෝ ඛනිජ වැලි ගවේෂණය/ නිස්සාරණය කිරීම කළමනාකරණය හා නියාමනය කිරීම සහ නීතිය කඩකරන්නන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග බලාත්මක කිරීම.

**ප්‍රතිපත්තිය 5.2**

සුනාමි සහ සුළි සුළං වැනි හදිසි වෙරළබඩ ආපදාවන්ගෙන් වන හානිය අවම කිරීම සඳහා වැලිවැටි ආරක්ෂා කරනු ලැබේ.

**ප්‍රතිපත්තිය 5.3**

වැලි වැටි බාධක, වෙරළ සහ තුඩු හායනයට ලක් කරන වෙරළබඩ දූෂණය අවම කිරීම/ වැළැක්වීම සිදුකිරීම.

**ක්‍රමෝපාය 5.3.1**

බාධක වෙරළ, වෙරළ, වැලි වැටි සහ වැලි තුඩු ප්‍රදේශවල ඝන අපද්‍රව්‍ය හා පස්, මඩ ආදී ගොඩදමන ද්‍රව්‍ය බැහැර කිරීම අවම කිරීම සඳහා පළාත් පාලන ආයතන හා පාර්ශවකරුවන් සංවිධානය කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. බාධක වෙරළ, වෙරළ, වැලි වැටි සහ වැලි තුඩු ප්‍රදේශවල දැනට පිහිටා ඇති ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථාන වෙනත් ස්ථානවල ස්ථානගත කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත සහාය ලබාදීම සහ ඔවුන් දිරිමත් කිරීම.
2. සියලු පාර්ශවකරුවන්ගේ හා පළාත් පාලන ආයතනවල සහභාගීත්වයෙන් වෙරළ පිරිසිදු කිරීමේ මෙහෙයුම් ආරම්භ කිරීම.
3. වෙරළ ප්‍රදේශවල පදිංචිකරුවන් අතර කළමනාකරණ කණ්ඩායම් ඇතිකිරීම සහ බාධක වෙරළ, වෙරළ, වැලි වැටි සහ වැලි තුඩු පවත්වාගෙන යෑම සඳහා හවුලේ මාර්ගෝපදේශ පිළියෙළ කිරීම හා එම ප්‍රදේශවල දූෂණය වැළැක්වීම සහ මාර්ගෝපදේශ සඳහා අනුගත වීම සහතික කරගැනීම.

**ප්‍රතිපත්තිය 5.4**

බාධක වෙරළ, වෙරළ, වැලි වැටි සහ වැලි තුඩුවල ජෛව විවිධත්වය හායනය වීම ප්‍රවර්ධනය වන්නා වූ ක්‍රියාකාරකම් අවම කිරීම.

**ක්‍රමෝපාය 5.4.1**

අන්තර් නියෝජිතායතනවල සහයෝගයෙන් ජෛව විද්‍යාත්මක විවිධත්වය අඩුකිරීම සඳහා තුඩුදෙන මානව ක්‍රියාකාරකම් අවම කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. බාධක වෙරළ, වැලි තුඩු සහ වැලි වැටිවල වන සතුන් සහ වෘක්ෂලතා ඉවත් කිරීම සහ විනාශ කිරීම තහනම් කිරීම.

2. හානියට පත් ප්‍රදේශවල සුදුසු දේශීය ශාක වර්ග සිටුවීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමග සහයෝගයෙන් වැඩසටහනක් ප්‍රවර්ධනය කිරීම හා දියත් කිරීම.

3. මුහුදු කැස්බෑවුන් සඳහා බිජුලන ස්ථාන ලෙස වැදගත්වන ස්ථාන හඳුනාගැනීම සහ එම ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා සහයෝගාත්මක පියවර ගැනීම

4. Prosopis juliflora වැනි ආක්‍රමණශීලි විශේෂවලින් ඇතිවන ගැටලු වළක්වා ගැනීම සහ අවම කරගැනීම සඳහා අවශ්‍ය සහයෝගාත්මක පියවර ගැනීම

**අරමුණ 6**

පාරිසරික කර්තව්‍යන් හා සමාජ-ආර්ථික වටිනාකම් පවත්වා ගැනීම සඳහා ලවණ වගුරු බිම් සංරක්ෂණය කරනු ලැබේ.

**ප්‍රතිපත්තිය 6.1**

ලවණ වගුරු ප්‍රදේශ හායනයට ලක්වන වෙරළබඩ සංවර්ධන කටයුතු අවම කිරීම/ වැළැක්වීම.

**ක්‍රමෝපාය 6.1.1**

අදාළ ආයතන අතර සම්බන්ධීකරණ කාර්යයන් සවිමත් කිරීම ඔස්සේ නව සංවර්ධන කටයුතු මාර්ගෝපදේශ/ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම

**යෝජිත ක්‍රියාමාර්ග**

1. ලවණ වගුරුබිම් ප්‍රදේශවල පාරිසරික හා සමාජ-ආර්ථික අවදානම් බව සහ වැදගත්කම හඳුනාගැනීම සහ ඒවායෙහි සැලසුම් සහ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම.

2. ලවණ වගුරුබිම් ප්‍රදේශවල ධාරිතාවය/ විභවය නිර්ණය කිරීම සහ අදාළ නියෝජිතායතන හා ප්‍රජාවන් සමග ඒකාබද්ධව එම ප්‍රදේශවල විභව්‍ය සංවර්ධනය සඳහා යෝග්‍ය සවිස්තරාත්මක කලාපීය සැලැස්මවල් සකස් කිරීම.

3. ලවණ වගුරුබිම් ප්‍රදේශවල නව කාර්යයන් හා පුළුල් කිරීම් (උදා. ලුණු ලේවායන්, ඉස්සන් පොකුණු සඳහා) දැනට පවතින නීති, රෙගුලාසි හා බලපත්‍රවලට අනුකූලව නියාමනය කිරීම.

4. ලවණ වගුරුබිම් ප්‍රදේශ තුළ හා ඒ අවට සංවර්ධන ක්‍රියාකාරකම් අදාළ නියෝජිතායතන විසින් සම්බන්ධීකරණය කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම.

**ප්‍රතිපත්තිය 6.2**

වෙරළ කලාපය තුළ හා ඉන් පිටත ලවණ වගුරුබිම් සංරක්ෂණය කිරීම සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව අනෙකුත් ආයතන සමග සම්බන්ධීකරණය කළ යුතු ය.

**ක්‍රමෝපාය 6.1.2**

අදාළ පාර්ශ්වකරුවන් සමග සැලසුම්ගත සන්නිවේදනය ඔස්සේ ලවණ වගුරු බිම්වල තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. සංරක්ෂණය සඳහා වූ කැපවීම වැඩිදියුණු කිරීම සඳහා ලුණු වගුරු බිම් සහ ඒවායේ වටිනාකම් පිළිබඳව ප්‍රධාන පාර්ශවකරුවන්ට සන්නිවේදනය කිරීම සඳහා එකී කාර්යය සඳහාම විශේෂ වූ වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම.
2. වෙරළ කලාපය තුළ සෘණාත්මක බලපෑම් සිදුකරන කර්මාන්ත වෙත දූෂණ පාලනය හා පිරිපහදු ක්‍රම ලබාදෙන තාක්ෂණය සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු ලබාදීම.

**අරමුණ 7**

වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය කරමින් ජීවී නොවන වෙරළබඩ සම්පත්වල ආර්ථික වැදගත්කම වැඩිදියුණු කිරීම සඳහා එකී සම්පත් තිරසරව කළමනාකරණය කිරීම.

**ප්‍රතිපත්තිය 7.1**

පරිසර පද්ධතිවල ආර්ථික ඒකාබද්ධතාවය පවත්වාගනිමින්, ආර්ථික වාසි වැඩි කරගැනීම සඳහා ඛණිජ වැලි ද ඇතුළුව ජීවී නොවන වෙරළබඩ සම්පත්වල පරිසර හිතකාමී නිස්සාරණ භාවිතයන් ප්‍රවර්ධනය කරනු ලැබේ.

**ක්‍රමෝපාය 7.1.1**

පාරිසරික ඒකාබද්ධතාවය වෙරළබඩ පරිසර පද්ධති සහ ප්‍රජාවන්ගේ දිගු කාලීන මනා පැවැත්ම සහතික කිරීම සඳහා රජයේ ආයතන, ප්‍රාදේශික ප්‍රජාවන්, ව්‍යාපාර හා පරිසර සංවිධානවල සහභාගිත්වයෙන් බහුවිධ ප්‍රවේශයක් ක්‍රියාවට නැංවීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. ප්‍රමාණය ඉක්මවා සම්පත් උපයෝජනය වැළැක්වීම සඳහා නිස්සාරණ ශීඝ්‍රතාවයන් හා ප්‍රමාණ සම්බන්ධයෙන් තිරසර මට්ටමේ සීමා පැනවීම.
2. සම්පත් නිස්සාරණ හා සංරක්ෂණය සඳහා නව්‍ය තාක්ෂණ හා භාවිතයන් ප්‍රවර්ධනය කිරීම.
3. වගකීමැතිව කැණීම් කටයුතුවල නියැලීම, වාසස්ථාන නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේ තාක්ෂණ ඇතුළුව සම්පත් ප්‍රතිෂ්ඨාපනය සඳහා ප්‍රශස්ත භාවිතයන් යොදාගැනීම ප්‍රවර්ධනය කිරීම.
4. නීති විරෝධී සම්පත් නිස්සාරණය හෝ වෙරළබඩ පරිසර පද්ධති වෙත සිදුකරන හානි වළක්වාලීම සඳහා අදාළ නීතිවලට අනුකූල නොවීමේ සිද්ධි සම්බන්ධයෙන් දඩ මුදල් අයකිරීම ක්‍රියාත්මක කිරීම.
5. රෙගුලාසි හා මාර්ගෝපදේශ අනුගමනය කරන බව සහතික කරගැනීම සඳහා බලාත්මක කිරීමේ යාන්ත්‍රණ සවිමත් කිරීම.

**අරමුණ 7**

පරිසර කාර්යයන් හෝ වටිනා වෙරළබඩ පරිසර පද්ධති වෙත සංවර්ධන ක්‍රියාකාරකම් ඔස්සේ අනපේක්ෂිත අයුරින් සිදුවන හානිවලට අදාළව වැඩිදියුණු සමස්ත පාරිසරික ගුණාත්මකභාවය සඳහා ඉවහල් වෙන වාසස්ථාන නිර්මාණය, ප්‍රතිෂ්ඨාපනය, වැඩිදියුණු කිරීම හෝ සංරක්ෂණය ඔස්සේ හානිපූරණය කිරීම සිදුකරනු ලැබේ.

**ප්‍රතිපත්තිය 7.1**

ආර්ථික සංවර්ධනය හා සංරක්ෂණ අවශ්‍යතා අතර තුලනයක් පවත්වා ගැනීම සඳහා හානියට ලක් වූ පරිසර පද්ධති නැවත යථා තත්ත්වයට පත්කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා පාරිසරික හානිපූරණය ක්‍රියාවට නංවනු ලැබේ.

**ක්‍රමෝපාය 7.1.1**

සංවර්ධන බලපත්‍ර ක්‍රමවේදය හරහා පාරිසරික හානිපූරණය හඳුන්වාදීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. වෙරළ කලාපයේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය බලපත්‍ර කොන්දේසිය හරහා පාරිසරික හානිපූරණ අවශ්‍යතාවය හඳුන්වාදීම.
2. සංවර්ධන කටයුතු හා සම්බන්ධිත බලපත්‍ර අවශ්‍යතාවයන්ට අනුකූලතාවය අධීක්ෂණය කිරීමේ වැඩසටහන හරහා බලපෑමට ලක්වී ඇති පරිසර පද්ධති හඳුනාගැනීම.
3. පාරිසරික හානි පූරණ සැලැස්ම සම්පාදනය කිරීම හා වෙරළබඩ සංවර්ධකයන් හරහා එය ක්‍රියාත්මක කිරීම.

**අරමුණ 8**

පුද්ගලික ආයතන සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව අතර ඵලදායි හවුල් වගකීම ඔස්සේ පාරිසරික තත්ත්වය හා මහජන ආරක්ෂාව පවත්වා ගනිමින් වෙරළ උද්‍යාන හා විනෝදාස්වාද ප්‍රදේශ ස්ථාපනය කිරීම ඔස්සේ වෙරළබඩ පරිසර පද්ධති තිරසාරව කළමනාකරණය කිරීම.

**ප්‍රතිපත්තිය 8.1**

යෝග්‍ය ස්ථානවල වෙරළ උද්‍යාන හා විනෝදාස්වාද ප්‍රදේශ ස්ථාපිත කිරීම හරහා පුද්ගලික ආයතනවල සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ඵලදායි හවුල් වගකීම ඔස්සේ පරිසර පද්ධති කළමනාකරණය කිරීම සඳහා වන දායකත්වය හා අදාළ කාර්යයන් ඉටුකිරීම හඳුනාගැනීම හා ප්‍රවර්ධනය.

**ක්‍රමෝපාය 8.1.1**

ඵලදායි මූල්‍ය යාන්ත්‍රණයක් හරහා වෙරළ උද්‍යාන හා තෝරාගත් විනෝදාස්වාද ප්‍රදේශ තිරසර ආකාරයෙන් කළමනාකරණය කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. පවතින අවස්ථා පිළිබඳ දැනුවත් කිරීමට පුද්ගලික ආයතන සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම.
2. ආදායම් උත්පාදනය සඳහා තිරසර මූල්‍ය යාන්ත්‍රණයක් සම්පාදනය කිරීම.
3. හවුල් වගකීම භාරදීම සම්බන්ධයෙන් මෙහෙයුම් මාර්ගෝපදේශ සකස් කිරීම.
4. වෙරළ උද්‍යාන හා විනෝදාස්වාද ප්‍රදේශ ස්ථාපනය කිරීම සඳහා යෝග්‍ය ස්ථාන හඳුනාගැනීම.

**අරමුණ 9**

තොරතුරු සම්පාදනය කර ආයෝජන සඳහා යොමු කිරීමෙන් වෙරළ කලාපය තුළ සංරක්ෂණ කටයුතු හා සැලසුම්ගත සංවර්ධනය සුසංගත කිරීම සිදුකෙරේ.

**ප්‍රතිපත්තිය 9.1**

යෝග්‍ය ස්ථාන සම්බන්ධයෙන් යාවත්කාලීන කළ ජෛව-භෞතික තොරතුරු ලබා දීම ඔස්සේ වෙරළබඩ පරිසරය හා සම්පත් මත පදනම් වන සංවර්ධන කටයුතුවල ආයෝජනය සඳහා පහසුකම් සලස්වනු ලැබේ.

**ක්‍රමෝපාය 9.1.1**

සංචාරක, පුනර්ජනනීය බලශක්ති, ජල ජීවී වගා සහ ඛනිජ නිස්සාරණය (වැලි හැර) සඳහා කේන්ද්‍රීය ප්‍රදේශ/ ස්ථාන පිළිබඳ තොරතුරු තනි තොරතුරු අත්පොතක් හරහා ව්‍යාප්ත කෙරේ.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. යාවත්කාලීන කර ඇති කේන්ද්‍රිය ස්ථාන සඳහා වන ජාතික භෞතික සැලැස්ම හා සංචාරක සැලැස්ම සමග අනුකූලවන පරිද්දෙන් පහත කාර්යය සඳහා තනි තොරතුරු අත්පොතක් සකස් කිරීම;
   - සංචාරක කර්මාන්තය: ජල ව්‍යුහයන්, ජල බංගලා, භූමිය පදනම් කරගත්, ජලතල පදනම් කරගත් විනෝදාස්වාද කටයුතු සඳහා ස්ථාන ස්ථාපනය කිරීම.
   - ජලජ/ සමුද්‍රීය; මුහුදු පැලෑටි, මුහුදු කැකිරි, කකුළු පැටවුන් වගාකිරීම, සමුද්‍රීය වගා
   - පුනර්ජනනීය බලශක්තිය; සූර්ය බලය, සුළං බලය හා සාගර තාප ශක්තිය
   - වෙරළ උද්‍යාන හා විනෝදාස්වාද ප්‍රදේශ

**ආශ්‍රිත ග්‍රන්ථ:**


1. Coast Conservation and Coastal Resource Management Department" (2014 &) ; Updating and preparation of a synthesis report on Coastal Coral Reefs" Sea grass Beds" Salt Marshes" Lagoons and Estuaries and Barrier Beaches within the coastal region of Sri Lanka'

2. Coast Conservation and Coastal Resource Management Department (2004 &) Revised Coastal Zone Management Plan 2004'

3. Government of Sri Lanka" Coast Conservation and Coastal Resources Management Act No'57 of 1981.

4. Ministry of Environment and Natural Resources" 2009" National Action Plan for Haritha Lanka Programme

5. Miththapala S (2008) Mangroves" Coastal Ecosystem Series Volume 2 P1-28 + iii", Colombo Sri Lanka¦; Ecosystem and Livelihood Group Asia" IUCN.

6. Miththapala' S. (2008) Sea grases and Sand dunes, Coastal ecosystem Series Volume 3" Colombo Sri Lanka¦ ecosystem and Livelihood Group Asia" IUCN

7. Miththapala S, (2013,) Lagoons and Estuaries' Coastal ecosystems Series (Vol 4&) vi + 73 pp' IUCN Sri Lanka Country Office, Colombo.

8. N Perera (2019) A Preliminary Report on the Status of Kayankerni Coral Reef, Sri Lanka

9. Silva E.I.L. Katupotha J Amarasinghe O Manthrithilake; H, Ariyaratne R 2013. Lagoons of Sri Lanka: from the origins to the present' Colombo Sri Lanka, International Water Management Institute (IWMI).

10. Ramawickrama N.W et al (2020) & Diversity and the Current Status of Coral Reefs in Eastern Coast of Sri Lanka" Proceedings of the International Research Conference of Uva Wellassa University.

11. Samarakoon, Jayampthy; Saman Samarawickrama (2012) An appraisal of challenges in the sustainable management of the Micro tidal Barrier built estuaries and lagoons in Sri Lanka IUCN" Sri Lanka Country Office, Colombo.

12. Van Gosen B.S. Fey D.L Shah A.K.Verplanck P.L. and Hoefen T.M. 2014, Deposit model for heavy-mineral sands in coastal environments ( U.S. Geological Survey Scientific Investigations Report 2010-5070-L, 51p http://dx.doi.org/10.3133/sir20105070L.

13. Arulananthan, A; et al (2021) The Status of the Coral Reefs of the Jaffna Peninsula (Northern Sri Lanka), with 36 Coral Species New to Sri Lanka Confirmed by DNA Bar-Coding' Oceans 2021.2.509-529. https://doi.org/ 10.3390/oceans2030029

14. Department of Forest Conservation (2022) The Sri Lanka Forester Volume 41 (New Series) Special Issue on Mangroves
*Web sites used : http://www.fao.org/docrep/010/ai000e/AI000E07.htm*
*https://nexttravelsrilanka.com/corals-sri*

## 4 වැනි පරිච්ඡේදය - වෙරළබඩ දූෂණය පාලනය කිරීම

### 4.1 හැඳින්වීම

මානව ක්‍රියාකාරකම් නිසා ඇති වන විවිධ දූෂක ද්‍රව්‍ය හේතුවෙන් වෙරළබඩ ජලය, වෙරළ හා ආසන්න පරිසර පද්ධති දූෂණය වීමෙන් වෙරළබඩ දූෂණය ඇති වේ. සමුද්‍රීය ශාඛ හා සත්ත්වයින්, මානව සෞඛ්‍ය සහ වෙරළබඩ පරිසරවල සමස්ත යහ පැවැත්ම කෙරෙහි මෙම දූෂක මගින් අනර්ථදායී ප්‍රතිඵල ඇති කෙරේ.

මෙම වෙරළබඩ දූෂණය වළක්වා ගැනීම සඳහා නියාමන පියවර, තිරසර භාවිතයන්, මහජන අධ්‍යාපන හා දැනුවත් කිරීමේ ප්‍රයත්නයන්වල සංයෝජනයක් අත්‍යවශ්‍ය වේ. දැඩි පරිසර රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, අපජලය පිරිපහදු කිරීම වැඩිදියුණු කිරීම, තිරසර කෘෂිකර්මාන්තය හා ක්‍රමවත් ධීවර භාවිතයන් ප්‍රවර්ධනය කිරීම, අපද්‍රව්‍ය බැහැර කිරීම නැවැත්වීම, ප්ලාස්ටික් භාවිතය අවම කිරීම හා එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය ප්‍රවර්ධනය සහ වෙරළ කලාප කළමනාකරණය හා ආරක්ෂා කිරීම වැඩිදියුණු කිරීම ආදිය වෙරළබඩ දූෂණය වැළැක්වීම සඳහා යොදා ගැනෙන ක්‍රමෝපායන් අතරට ඇතුළත් වේ.

වෙරළ කලාපය සංවර්ධනය කිරීමේ ප්‍රවණතාවය ඉහළ යාම සහ විනෝදාස්වාද/ සංචාරක කටයුතු, ධීවර, සහ මුහුදු මත්ස්‍ය වගාව වැනි විවිධ කාර්යයන් සඳහා වෙරළබඩ ජලය, වෙරළ සහ ආසන්න ප්‍රදේශ භාවිතා කිරීම හේතුවෙන් වෙරළබඩ කලාප දූෂණය ප්‍රධාන ගැටළුවක් බවට පත්වී තිබේ.

ගැටලුවේ වැදගත්කම, වෙරළබඩ දූෂණයේ ස්වභාවය, දූෂක වර්ග සහ ඒවායේ ප්‍රභවයන්, වෙරළබඩ ජලයේ ගුණාත්මක බව සහ වෙරළ ප්‍රදේශ පිළිබඳ වර්තමාන තත්ත්වය, වෙරළ ප්‍රදේශවල සහ අදාළ ගැටළු විසඳීම සඳහා වන සැලසුම්, ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපායන් පිළිබඳ විස්තර මෙම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ.

#### 4.1.1 ගැටළුවේ වැදගත්කම

1980 අංක 40 දරන ජාතික පරිසර පනතෙහි දූෂණය අර්ථ දක්වා ඇත්තේ මෙසේය. දූෂණය යන්නෙන් "පරිසරය වැඩදායී ලෙස උපයෝගී කරගැනීමට අහිතකර ලෙස හෝ මහජන සෞඛ්‍යයට, ආරක්ෂාවට හෝ සුබසාධනයට නැතහොත් සත්ත්වයන්ට, කුරුල්ලන්ට, වන සතුන්ට, ජලජ ජීවිතයට හෝ සෑම වර්ගයකම ශාකවලට උපද්‍රවකාරී හෝ සම්භාව්‍ය උපද්‍රවකාරී තත්ත්වයක් ඇතිවන ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීමෙන්, පිට කිරීමෙන් හෝ බහා තැබීමෙන් පරිසරයේ යම් කොටසකට භෞතික, තාපජ, රසායනික, ජෛවී හෝ විකිරණශීලී පදාර්ථයක් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් වෙනස් කිරීම අදහස් වේ."

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මෑත කාලීනව සිදුකළ අධීක්ෂණ අධ්‍යයනවලින් හෙළිවූ කරුණු අනුව, ආර්ථික වශයෙන් සංවේදී වෙරළබඩ ප්‍රදේශවල වෙරළබඩ ජලයේ ගුණාත්මක බව පිරිහී ඇති බව පෙන්නුම් කෙරේ. මීට අමතරව, ප්‍රධාන වෙරළ තීරයන් හි සැලකිය යුතු කොටසක් ඝන අපද්‍රව්‍ය හේතුවෙන් දැඩි වශයෙන් දූෂණයට ලක්වී ඇති බවද තහවුරු වී ඇත.

වෙරළ කලාප තුළ "වෙරළබඩ දූෂණ තත්ත්වය" සංචාරක කර්මාන්තය හා අනෙකුත් වැදගත් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා පවතින සුවිශේෂී ආකර්ෂණය හේතුවෙන්, වෙරළබඩ දූෂණ තත්ත්වය සමීපව අධීක්ෂණය කර ඵලදායීව කළමනාකරණය කළ යුතුය.

ඉහළ යන ජනගහන පීඩනය හේතුවෙන් වෙරළ කලාපය තුළ නාගරීකරණය සහ සංවර්ධන කටයුතුවල ප්‍රතිඵලයක් ලෙස වෙරළබඩ ජල දූෂණය යන ගැටළුව පසුගිය දශක කිහිපය මුළුල්ලේ වැඩි වෙමින් පවතී. 2019 වර්ෂයේ දී, වෙරළබඩ දිස්ත්‍රික්කයන්හි ජනගහනය 12,319,000 ලෙසට ඇස්තමේන්තු කර තිබේ. කොළඹ නාගරික ප්‍රදේශය ඉහළතම නාගරීකරණය අගයක් වාර්තා කරමින් 1981 වර්ෂයේ දී මිලියන 3.9ක් වූ ජනගහනය 2012 දී වර්ෂයේ දී මිලියන 5.648 දක්වා වැඩි වී ඇත. සාගර ජලය, වෙරළබඩ මතුපිට ජලය සහිත ගංගා, ඇළ දොළ, මෝය සහ කලපු හා වෙරළබඩ ප්‍රදේශවල භූගත ජලය වෙත වෙරළබඩ කලාපයේ සහ ඉන් පිටත පිහිටි නියාමනයකින් තොර කර්මාන්තශාලා, සංවර්ධන ක්‍රියාකාරකම් සහ මිනිස් ජනාවාසවලින් සැලකිය යුතු මට්ටමක දූෂණ ද්‍රව්‍ය එකතු වේ.මෙරට පවතින සියලුම කර්මාන්තශාලා සැලකූ විට (කුඩා, මධ්‍යම, විශාල පරිමාණ) එයින් 61.6% ක් වූ කර්මාන්ත ඒකක සංඛ්‍යාවක් වෙරළබඩ කලපයේ ස්ථානගත වී ඇති අතර එම ඒකකවලින් සැලකිය යුතු සංඛ්‍යාවක් විසින් අවම වශයෙන් පිරිපහදු කළ හෝ පිරිපහදු නොකළ ගලා යන අප ජලය සාගර ජලයට බැහැර කරනු ලැබේ. සමස්තයක් ලෙස සැලකූ විට, ධීවර, සංචාරක සහ අනෙකුත් කර්මාන්ත හා ප්‍රදේශයේ ජීවත්වන ප්‍රජාවන්ගේ ජීවනෝපායවල තිරසරභාවය ප්‍රධාන වශයෙන් රඳා පවතිනුයේ මෙම ප්‍රදේශය තුළ පවතින විවිධ පරිසර පද්ධති හා සම්පත්වල සාරවත් පැවැත්ම මත ය. විශේෂයෙන් වෙරළ ආසන්නයේ ඇති නොගැඹුරු මුහුදු ජල ප්‍රදේශය ධීවර කටයුතු, මුහුදු මත්ස්‍ය වගාව හා විනෝදාස්වාද ආදී කටයුතුවලට පුළුල් වශයෙන් යොදාගන්නා අතර එම කටයුතු සඳහා විවිධ මට්ටම්වලින් ජලයේ ගුණාත්මක බව හා සෞන්දර්යාත්මක මන බඳින පරිසරයන් හි පැවැත්ම අවශ්‍ය වනු ඇත.

වෙරළබඩ දූෂණය මගින් වෙරළබඩ හා සමුද්‍රීය පරිසර පද්ධති වෙත එල්ලවන බලපෑම් සහ එමගින් හට ගැනෙන ජීව විද්‍යාත්මක සේම සමාජ-ආර්ථික ප්‍රතිඵල රාශියක් පවතින අතර ඒවා විවිධ ස්වභාවයන්ගෙන් පවතී. ශ්‍රී ලංකාවේ වෙරළබඩ ජල දූෂණය හේතුවෙන් සිදුවන හානිය වැඩිවෙමින් යන ප්‍රවණතාවයකින් යුතු බව දැනට පවතින තොරතුරුවලින් අනාවරණය වේ. නිදසුනක් ලෙස, වෙරළබඩ ජල දූෂණය හේතුවෙන් මානව සෞඛ්‍ය පිරිවැය කොළඹ නාගරික බල ප්‍රදේශය තුළ 1992 වර්ෂයේ දී පැවති රු.මි.2 සිට 1997 වර්ෂය වන විට මිලියන 4 දක්වා ද, 2002 වර්ෂයේ දී රු.මි. 14ක් දක්වා ද ඉහළ ගොස් තිබේ. (වෙරළ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2018). අපගමනය වෙමින් පවතින ජෛව විවිධත්වය, සෞන්දර්යාත්මක, විනෝදාත්මක, සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක වටිනාකම් අඩුවීම, ඉඩම් මිල පහළ යාම, සංචාරක, ධීවර හා අනෙකුත් සංවර්ධන කටයුතුවලින් ලැබෙන ආදායම අඩුවීම ආදී වශයෙන් විවිධ ක්ෂේත්‍රයන්ට සම්බන්ධ පාඩු පවතී. දූෂණ මට්ටම් ඉහළ යාම සහ වෙරළබඩ ඉඩම්වල වටිනාකම පහළ යාම හා ධීවර කටයුතුවල ඵලදායිතාවය නැතිවීම අතර ප්‍රබල සබැඳියාවන් පවතී. නිදසුනක් ලෙස, මොරටුව ලුනාව කලපුව ප්‍රතිසංස්කරණය කිරීමට පෙර දූෂණය වී තිබීම හේතුවෙන් මත්ස්‍ය විකිණීම්වලින් ලැබූ ආදායමේ ඇස්තමේන්තුගත වාර්ෂික පාඩුව ආසන්න වශයෙන් රු.මි. 1,963 ක් වූ අතර ඉඩම්වල වටිනාකම පහළ බැසීම රු.මි. 712ක් ලෙස ඇස්තමේන්තු කර තිබේ. මීට අමතරව, ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය මගින් ලුනාව පාරිසරික පද්ධතිය වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ ලුනාව කලපුව ප්‍රතිසංස්කරණය සඳහා 2004-2007 කාලසීමාව තුළ වැය වූ සමස්ත සෘජු පිරිවැය ආසන්න වශයෙන් ඇ.ඩො.මි. 95කි. එබැවින්, වෙරළබඩ දූෂණය කළමනාකරණයෙන් අපේක්ෂිත වාසි ඉතා ඉහළ අතර වෙරළ කලාපයේ දූෂණය අවම කිරීම ඉතා වැදගත් කරුණකි.

***භූගත ජලය දූෂණය වීම***

*කෘෂිකාර්මික කටයුතු හේතුවෙන් සිදුවන වෙරළබඩ ජල දූෂණය පිළිබඳව නිවේද්‍ය ඇස්තමේන්තුවක් මෙතෙක් සිදුකර නොමැති නමුත්, මෙම කරුණු දෙක අතර පවතින සබඳතාවය ඇතැම් අධ්‍යයනයන් මගින් පෙන්නුම් කර ඇත. අධික පාරගම්‍ය පාංශු තත්ත්වයක් සහ නොගැඹුරු භූගත ජල මට්ටමක් පවතින බවට ප්‍රචලිත කල්පිටිය අර්ධද්වීපයේ බහුල වශයෙන් වගා කටයුතු ව්‍යාප්තව පවතින ප්‍රදේශවල ඇති වාරි ළිං ජලය අධික නයිට්‍රේට් සාන්ද්‍රණයකින් යුක්ත වන අතර (එනම් ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශවල දක්වා ඇති ලීටරයකට මි.ග්‍රෑ. 10 මට්ටම ඉක්මවා යන) ක්ලෝරයිඩ් සාන්ද්‍රණයේ මට්ටම ලීටරයට මි.ග්‍රෑ. 50-200 අතර පරාසයක පවතී. මේ සමග සැසඳීමේ දී, මෙම ප්‍රදේශවලින් බැහැර පවතින ගෘහස්ථ ළිංවල ජලයේ නයිට්‍රේට් සාන්ද්‍රණය ලීටරයට මි.ග්‍රෑ. 2 ට වඩා අඩුවෙන් පවතින අතර ක්ලෝරයිඩ් සාන්ද්‍රණය ලීටරයට මි.ග්‍රෑ. 100 ට වඩා අඩු මට්ටමක පවතී. කෘෂිකාර්මික කටයුතු ආශ්‍රිතව මතුපිට ජලය ගලායාම සහ වළ වැසිකිළි තිබීම හේතුවෙන් යාපනය අර්ධද්වීපයේ භූගත ජල දූෂණය පුළුල් වශයෙන් ව්‍යාප්ත වී ඇත. යාපනය අර්ධද්වීපයේ භූගත ජලයේ නයිට්‍රේට් ඉහළ සාන්ද්‍රණයකින් වාර්තා වන අතර මෙහි ප්‍රතිඵලයක් වශයෙන් එම අපවිත්‍ර වී ඇති ජලය භාවිතා කරන පිරිස අතර "methaemoglobinaemia" නැමති රෝගී තත්ත්වය ඇති වී තිබේ (වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2018)*

**වෙරළබඩ ජලය පරිසර දූෂණයේ වාහකය ලෙස**

ඇතැම් වෙරළබඩ ප්‍රදේශවල වෙරළට ආසන්න ජලය වෙත ගොඩබිම පාදක කටයුතුවලින් අපද්‍රව්‍ය, කාර්මික, කෘෂිකාර්මික හා ගෘහස්ත අප ජලය, අවසාදිත හා ඝන ද්‍රව්‍ය ආකාරයෙන් සැලකිය යුතු දූෂක ද්‍රව්‍ය ප්‍රමාණයක් එකතු වේ. මේවා සාගරය වෙත සෘජුව මුදා හැරීම හෝ ගංගා, මෝය හා කලපු ඔස්සේ සාගරයට එකතු වීම සිදු වේ. වෙරළාසන්න ජලයෙ හි නම් කරන ලද භාවිතයන් එම ජලයේ ගුණාත්මක බවෙහි නිශ්චිත අගයන් මත රඳා පවතින බැවින් මෙම තත්ත්වය විශේෂයෙන් සැලකිල්ලට භාජනය විය යුතු කරුණකි.

මෝය ආශ්‍රිත ප්‍රදේශවල සහ කලපුවල ඇති වෙරළබඩ ජලය වෙත දූෂක ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ඇදී එන නමුදු, ගංගා ජල ප්‍රවාහ හෝ උදම් රළ ක්‍රියාකාරීත්වය මගින් තනුකකරණය හෝ ගසාගෙන යෑම හේතුවෙන් ඒවායේ දූෂක ද්‍රව්‍ය පවතින මට්ටම වෙනස්වීමට බඳුන් වේ. මෝය ආශ්‍රිත ප්‍රදේශවල හා කලපු ජලය දූෂණය වීම ඒවා ආශ්‍රිත වැදගත් පරිසර පද්ධතිවල සහ ඒවා තුළ පවතින විවිධ වූ සහ ආර්ථික වශයෙන් වැදගත් සත්ත්ව හා ශාකවල මනා පැවැත්ම කෙරෙහි බලපෑමක් ඇති කෙරේ.

මධ්‍යම කඳුකරයෙන් ආරම්භ වී සාගරය වෙත ගලා බසින ගංගා 103 ක් ශ්‍රී ලංකාව සතු ය. මෙම ගංගාවන් විවිධාකාර ජල දූෂණ තත්ත්වයන් මගින් ඇතිවන බලපෑමට යටත් වේ. ඇතැම් ගංගාවලට කාබනික හා අකාබනික දූෂක, මල අපද්‍රව්‍ය, ඉවතලන තෙල් හා දෘශ්‍ය ආකාරයේ දූෂක ආදියෙන් සමන්විත දූෂණ ද්‍රව්‍ය රාශියක් එකතු වේ. මෙම ගංගා වෙත විවිධ ස්ථානවලදී ඇතුළුවන දූෂක ද්‍රව්‍ය ප්‍රමාණය කාලානුරූපීය වශයෙන් මෙන්ම ස්ථානීය වශයෙන් ද සැලකිය යුතු ආකාරයකට වෙනස් වන බැවින් එකී ගංගාවල දූෂණ මට්ටම් ඒ අනුව වෙනස් වේ.

භූගත ජලය ප්‍රධාන වශයෙන් ව්‍යුත්පන්න වනුයේ පොළොවට කාන්දුවන වැසිජලය හා ඇලදොළ හා ජලාශ වැනි මතුපිට ජලස්තරයන්ගේ ලැබෙන ජලයෙනි. මෙරට ඇස්තමේන්තුගත භූගත ජලය පවතින ප්‍රමාණය ආසන්න වශයෙන් කියුබික් මීටර මිලියන 7,250කි. ශ්‍රී ලංකාවේ භූගත ජලයෙන් පොහොසත්ම මූලාශ්‍රය වනුයේ පුත්තලම හා මන්නාරම් දිස්ත්‍රික්කවල සිට යාපනය අර්ධද්වීපය දක්වා

විහිදෙන හුණුගල් පාෂාණ තට්ටුව වේ. වසර ගණනාවක් මුළුල්ලේ නොගැඹුරු ලෙස කණින ලද මෙන්ම ගැඹුරු නළ ළිං ඔස්සේ මෙම භූගත ජලය ගෘහස්ත, කෘෂිකාර්මික සහ කාර්මික කාර්යයන් සඳහා ලබාගැනීම වැඩිවෙමින් පවතී.

නයිට්‍රේට් හා බැක්ටීරියා එකතු වීම මගින් අපවිත්‍රවීම හේතුවෙන් බොහෝ වෙරළබඩ ප්‍රදේශවල භූගත ජලය කෙරෙහි දැඩි තර්ජන එල්ලවී ඇති බව නිරීක්ෂණය වේ. වෙරළබඩ ප්‍රදේශවල භූගත ජලය වෙත පවතින ප්‍රධාන දූෂණ ගැටළු වනුයේ පොහොර කාන්දුවීමෙන් ඇතිවන නයිට්‍රේට් දූෂණය; මල අපද්‍රව්‍ය කාන්දු වීම සහ කාර්මික කලාපවලදී බැර ලෝහ කාන්දු වීම යි. භූගත ජලය පිරිපහදු කිරීම සඳහා අධික පිරිවැයක් වැයවන හෙයින් දූෂණය වීම වැළැක්වීම ඉතා වැදගත් වේ. මෙහි තවත් ගැටළුවක් වනුයේ වෙරළබඩ ප්‍රදේශවල තිරසර මට්ටමට වඩා වැඩි ප්‍රමාණයකින් ජලය ලබාගැනීම හේතුවෙන් කිවුල් ජලය ළිං වෙත ගලා ඒම යි. ළිං ජලය බහුල වශයෙන් කෘෂිකර්මාන්තය සඳහා යොදාගන්නා උතුරු හා වයඹ වෙරළ කලාපයේ මෙය බහුලව සිදු වේ. (වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම -2018).

## 4.2 වෙරළබඩ ජල දූෂණයේ ස්වභාවය

### 4.2.1 වෙරළබඩ ජල දූෂණයට බලපාන ප්‍රධාන සාධක

වෙරළ කලාපයේ ජල දූෂණයට බලපාන ප්‍රධාන සාධකය වනුයේ වැඩිවන ජනගහනය හේතුවෙන් පාරිසරිකව ඇතිවන පීඩනය වන අතර කාර්මික, කෘෂිකාර්මික, ධීවර සහ සංචාරක කටයුතු ආශ්‍රිත ක්‍රියාකාරකම් ප්‍රමුඛ වශයෙන් සිදුවන ප්‍රදේශවල මෙය බහුල වේ. ඒ අනුව අපද්‍රව්‍ය හා ඝන අපද්‍රව්‍ය, කාර්මික අපද්‍රව්‍ය, සංචාරක, බලශක්ති, ධීවර හා ජලජීවී වගා කටයුතුවලින් ඇති වන දූෂක ද්‍රව්‍ය, තෙල් ඉහිරීම්, බැර ලෝහ හා ප්ලාස්ටික් හේතුවෙන් වෙරළබඩ ජලය දූෂණය වේ. මෙසේ නිසි කළමනාකාරීත්වයකින් තොර මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් වෙරළබඩ ජලය දූෂණය සිදුවී එමඟින් වෙරළබඩ කලාපය තර්ජනයකට මුහුණ පා සිටී.

වෙරළබඩ දිස්ත්‍රික්ක වන කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර හා යාපනය යන දිස්ත්‍රික්කවල ඉහළතම ජන ඝනත්වයක් වාර්තා වේ. වෙරළ කලාපය මූලික කරගනිමින්, ප්‍රධාන සමාජ හා ආර්ථික සංවර්ධන කටයුතු අඛණ්ඩව සිදුවන හෙයින් වෙරළබඩ දූෂණය ආශ්‍රිත ගැටළු විධිමත්ව කළමනාකරණය නොකළහොත් අනාගතයේ දී එම ගැටළු තවදුරටත් තීව්‍ර වනු ඇත. මෙහිදී ශ්‍රී ලංකාවේ ජාතික භෞතික සැලැස්ම -2030 යටතේ උතුරු, උතුරු මැද, නැගෙනහිර, දකුණු හා බස්නාහිර කලාප සඳහා යෝජිත නාගරික කලාප පහ වෙත විශේෂ අවධානය යොමුකළ යුතු ය. මීට අමතරව, මන්නාරම, යාපනය, කුච්චිවේලි සහ කල්පිටිය යන වෙරළ තීරයන් නව සංචාරක සංවර්ධන ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරීමට යෝජිත ය.

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මීගමුව සිට මිරිස්ස දක්වා වෙරළ තීරය ඔස්සේ සංචාරක කර්මාන්ත සංවර්ධනය සඳහා පුළුල් සැලැස්මක් පිළියෙල කර තිබේ. එමෙන්ම, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ දී සිදුකළ අධ්‍යයනයකින් වෙරළ කලාපය ඔස්සේ විවිධ ආකාරවල සංචාරක සංවර්ධන කටයුතු සඳහා යෝග්‍ය ස්ථාන ද හඳුනාගෙන තිබේ. එබැවින්, ඉදිරි කාල සීමාවේ දී එම ප්‍රදේශවල සංචාරක කර්මාන්තයේ සංවර්ධන කටයුතු සමග වෙරළ දූෂණය ඇතිවීමේ ඉහළ ප්‍රවණතාවයක් අපේක්ෂා කළ යුතු ය.

### 4.2.2 දූෂක වර්ග හා ඒවායේ මූලාශ්‍රයන්

වෙරළබඩ ජලයේ දූෂණ මට්ටම මෙතෙක් පූර්ණ වශයෙන් අධ්‍යයනය කර නොමැති වුව ද, කර්මාන්ත, සංචාරක නිකේතන හා ඉස්සන් ගොවිපොළවලින් පිරිපහදු නොකරන ලද හෝ අර්ධ වශයෙන් පිරිපහදු කළ අපජලය හා විෂ සහිත ද්‍රව්‍ය මුදා හැරීම, ඝන අපද්‍රව්‍ය වෙරළබඩ ප්‍රදේශවලට බැහැර කිරීම, නාගරික ප්‍රදේශවලින් මල අපද්‍රව්‍ය බැහැර කිරීම, ධීවර යාත්‍රා හා නැව් මගින් ද වෙරළ කලාපයේ සේවා ස්ථානවලින් මුදාහරින තෙල් හා තෙල් විසිරීම් ආදී කරුණු හේතුවෙන් ප්‍රධාන වශයෙන් වෙරළබඩ ජලය දූෂණය වන බව දැනට පවතින අධ්‍යයන තොරතුරුවලින් අනාවරණය වේ. කෘෂිකාර්මික ප්‍රදේශවලින් ගලා එන පොහොර හා කෘෂි රසායන මිශ්‍ර ජලය සහ අනවසර පදිංචිකරුවන් හා වෙනත් ගෘහස්ත ප්‍රභවයන්ගෙන් මුදාහැරෙන අපද්‍රව්‍ය ද මෙම ජලය වෙත එකතු වේ. අසූචි ද්‍රව්‍ය, පාවෙන හෝ අවසාදිත වශයෙන් පවතින දෘශ්‍ය දූෂක ද්‍රව්‍ය, නයිට්‍රජන් සහ/හෝ පොස්පරස් අධික පෝෂක ද්‍රව්‍ය, විෂ සහිත හා විෂ රහිත කාබනික ද්‍රව්‍ය හා බැර ලෝහ, දැවි තෙල්, තාප විසර්ජන බැහැර කිරීම් යනාදී වශයෙන් මෙම වෙරළබඩ ජලය වෙත ගලාඑන දූෂක ද්‍රව්‍ය විවිධ වේ (වගුව 4.1). මෙම දූෂක ද්‍රව්‍ය කර්මාන්තශාලා, අපද්‍රව්‍ය වහනය සඳහා වූ කානු හෝ අපද්‍රව්‍ය පිරිපහදු කිරීමේ ස්ථාන හෝ පොල්ලෙලි පල් කරන ස්ථාන වැනි නිශ්චිත ප්‍රභවයන්ගෙන් බැහැර වී (අ) ගංගා, ඇල මාර්ග හා ගංමෝය වැනි වෙරළබඩ ජල මාර්ග ඔස්සේ ප්‍රවාහනය වීම හෝ (ආ) සෘජු කාන්දුවීම් හෝ උරාගැනීම් සිදුවිය හැකි ය. මේවා කෘෂිකාර්මික ඉඩම්, සංවර්ධනය වූ ප්‍රදේශවලින් බැහැරවන මල අපද්‍රව්‍ය, පතල් වැනි නිශ්චිත ස්ථානයක් නොමැතිව ද බැහැරවන අතර ඒවා පාලනය කිරීම දුෂ්කර වේ.

වගුව 4- 1 දූෂක වර්ගය, ප්‍රභවයන් හා ප්‍රධාන අහිතකර බලපෑම්

| *දූෂණ ආකාරය* | *ප්‍රධාන මූලාශ්‍ර* | *අහිතකර බලපෑම්* |
|---|---|---|
| මල ද්‍රව්‍ය | නාගරික අපද්‍රව්‍ය<br>කර්මාන්ත<br>සංචාරක අංශය<br>ජලජීවී වගා කටයුතු<br>අනවසර ජනාවාස | ජලය ආශ්‍රිත රෝග<br>සමුද්‍රීය ශාකවල හා සත්ත්වයින්ගේ වර්ධනය කෙරෙහි බලපෑම<br>අප්‍රසන්න දුර්ගන්ධය<br>සෞන්දර්යාත්මක දර්ශනයට බාධා වීම<br>නිර්වායු පරිසර තත්ත්වයන්ට හේතුවීම |
| දෘශ්‍ය ස්වභාවයේ දූෂක ද්‍රව්‍ය | කර්මාන්ත<br>සංචාරක අංශය<br>කෘෂිකාර්මික සහ ජලජීවී වගා කටයුතු<br>අනවසර ජනාවාස<br>නාගරික හා ගෘහස්ත ඝන අපද්‍රව්‍ය | සෞන්දර්යාත්මක දර්ශනයට බාධා වීම<br>ජීවීන්ගේ වාසස්ථාන සහ අභිජනන ස්ථාන කෙරෙහි බලපෑම<br>ආලෝකය විනිවිද යාම අඩුවීමෙන් මුහුදු තෘණ වැනි සමුද්‍රීය වෘක්ෂලතා ගහණය වර්ධනයට බලපෑම |
| නයිට්‍රජන් හා පොස්පරස් වැනි පෝෂක ද්‍රව්‍යවලින් සාරවත් වී ඇති | නාගරික ඝන අපද්‍රව්‍ය<br>කර්මාන්ත<br>සංචාරක අංශය<br>කෘෂිකාර්මික සහ ජලජීවී වගා කටයුතු<br>අනවසර ජනාවාස<br>නාගරික හා ගෘහස්ථ ඝන අපද්‍රව්‍ය | ඇල්ගී වර්ධනය උත්තේජනය කිරීම<br>ජෛව විවිධත්වය වෙනස් වීම හෝ අඩුවීම<br>ජලයේ ගුණාත්මකබව වෙනස්වීම |
| කාබනික (විෂ රහිත හා විෂ සහිත) සහ බැර ලෝහ දූෂක | කර්මාන්ත<br>සංචාරක කර්මාන්ත අංශය<br>කෘෂිකර්මාන්තය හා ජලජීවී වගාව<br>අනවසර පදිංචිකරුවන්<br>නාගරික හා ගෘහස්ත ඝන අපද්‍රව්‍ය | පිළිකාකාරකවීම හෝ සමුද්‍රීය සෞඛ්‍ය උපද්‍රව ඇති කරන ජෛව ඒකරාශිවීම්<br>ජෛව විවිධත්වය අඩුවීම<br>සමුද්‍රීය හෝ වෙරළබඩ පරිසරවල මෙම ද්‍රව්‍ය දිගු කාලයක් නොනැසී පවතීම<br>සමුද්‍රීය ශාකවල වර්ධනය හා ප්‍රජනනය කෙරෙහි බලපෑම |
| තෙල් වර්ග | කර්මාන්ත, බෝට්ටු, නැව්, තෙල් පිටාර ගැලීම සහ සේවා ස්ථාන | සෞන්දර්යාත්මක දර්ශනයට බාධා වීම, සමුද්‍රීය ශාක හා සත්ත්වයින් විනාශ වීම, තෙල් තැන්පත්වීම හේතුවෙන් හා තාර බෝල නිසා මුහුදු පතුලේ සතුන් හා ශාක විනාශ වීම. |
| තාපය ආශ්‍රිත දූෂණය | බලශක්ති අංශය, කර්මාන්ත | සත්ත්වයින්ගේ සංක්‍රමණික රටා කෙරෙහි බලපෑම<br>සමුද්‍රීය ශාකවල හා සත්ත්වයින්ගේ වර්ධනය කෙරෙහි බලපෑම<br>පරිසර පද්ධතිවල වෙනස්කම් ඇති කිරීම<br>ඇල්ගී වර්ධනය උත්තේජනය කිරීම |

මූලාශ්‍රයඃ වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම 2018

### 4.2.3 තෝරාගත් වෙරළ බණ්ඩවල වෙරළබඩ ජල දූෂණයේ ස්ථානීය ලක්ෂණ

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයේ දී මීගමුව සිට මිරිස්ස දක්වා එකිනෙක වෙනස් පරිසර තත්ත්වවල වෙනස් ස්ථානවල වෙරළ තීර අටක දී සිදුකළ අධ්‍යයනයක දී අනාවරණය වූ කරුණු අනුව වෙරළබඩ දූෂණයේ අනතුරුදායක තත්ත්වය වෙරළබඩ දූෂණය පාලනය කිරීම සඳහා වන අනතුරු ඇඟවීම හා වෙරළබඩ දූෂණයේ සමාජ හා ආර්ථික පිරිවැය මගහැරවීම සඳහා ඵලදායි කළමනාකරණයක අවශ්‍යතාවය පැහැදිලි විය (වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව - 2020)

මහඔය මෝය සිට මිරිස්ස දක්වා වෙරළ බණ්ඩ අටක දී සිදුකළ අධ්‍යයනයේ ප්‍රතිඵල පහත සාරාංශ කර තිබේ.

1 වැනි බණ්ඩය - මහඔය මෝය සිට කුට්ටි දූව දක්වා

පෝරුතොට වෙරළ හැරුන විට, සියලුම ස්ථානවලින් ලබාගත් නියැදිවල මල අපද්‍රව්‍ය බැක්ටීරියාව (total and feacal coliform) පැවති අතර, රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) සම්මත ප්‍රමිත ඉක්මවා තිබුණි.

2 වැනි බණ්ඩය - තලාහේන සිට කැළණි ගඟේ මුවදොර දක්වා

සියලුම ස්ථානවලින් ලබාගත් නියැදිවල රසායනික ඔක්සිජන් ඉල්ලුම සම්මත ප්‍රමිත ඉක්මවා තිබුණු අතර ඉහළතම total feacal coliform බැක්ටීරියා ගහණය හා රසායනික ඔක්සිජන් ඉල්ලුම කැළණි ගං මෝය ආශ්‍රිතව වාර්තා විය.

3 වැනි බණ්ඩය - වැල්ලවත්ත ඇළෙහි සිට ගල්කිස්ස දක්වා

ගල්කිස්ස වෙරළ හැර, අනෙකුත් සියලුම නියැදි ලබාගත් ස්ථාන කෝලිෆෝම් බැක්ටීරියාවෙන් (total and feacal coliform) දූෂණය වී පැවතිණි. දෙහිවල මාළු වෙළඳපොළ ආසන්නයෙන් ලබාගත් ජලයෙහි ඉහළ තෙල් සාන්ද්‍රණයක් වාර්තාවිය (14.32 mg/L) අතර ඉහළතම රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) ගල්කිස්ස වෙරළෙන් වාර්තා විය.

4 වැනි බණ්ඩය- තල්පිටිය ඇළෙහි මෝය සිට කළුතර කැලිඩෝ වෙරළ දක්වා

ප්‍රතිඵලවලින් පෙන්නුම් කරනුයේ සියලුම නියැදි ලබාගත් ස්ථාන මල අපද්‍රව්‍ය බැක්ටීරියාවෙන් (total and feacal coliform) දූෂණය වී පැවතීම සහ රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) සම්මත ප්‍රමිත ඉක්මවා තිබීමත් ය.

5 වැනි බණ්ඩය - කෙච්චිමලේ මුස්ලිම් දේවස්ථානයේ සිට කළුවාමෝදර (බෙන්තොට ගංමෝය දක්වා)

ප්‍රතිඵලවලින් පෙන්නුම් කරනුයේ බෙන්තොට වෙරළ හැර, අනෙකුත් සියලුම නියැදි ලබාගත් ස්ථාන මල අපද්‍රව්‍ය බැක්ටීරියාවෙන් (total and feacal coliform) දූෂණය වී පැවති බවයි. බේරුවල වරාය ආශ්‍රිතව ඉහළතම රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) (4622.64 mg/L) සහ තෙල් සාන්ද්‍රණය (19.87 mg/L) වාර්තාවී ඇත.

6 වැනි බණ්ඩය- හික්කඩුව(තුඩුවේගොඩ ඇළ පිටවීමේ මග සිට කුමාරකන්ද දක්වා)

ප්‍රතිඵලවලින් පෙන්නුම් කරනුයේ නියැදි ස්ථාන දෙකක් හැරුනවිට, අනෙකුත් සියලුම නියැදි ලබාගත් ස්ථාන මල අපද්‍රව්‍ය බැක්ටීරියාවෙන් (total and feacal coliform) දූෂණය වී පැවති බවයි. රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) සම්මත ප්‍රමිත ඉක්මවා තිබුණු අතර ඉහළතම අගය හික්කඩුව කලපුවේ මෝය ආශ්‍රිතව වාර්තා විය (3475.31 mg/L).

7 වැනි බණ්ඩය- උණවටුන (යක්දෙහිමුල්ල සිට කොග්ගල කලපුව මුවදොර දක්වා)

උණවටුන වෙරළ හා කොග්ගල මෝය අසල හැර, අනෙකුත් සියලුම නියැදි ලබාගත් ස්ථාන මල අපද්‍රව්‍ය බැක්ටීරියාවෙන් (total and feacal coliform) දූෂණය වී පැවතුණු අතර ඉහළතම රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) (4800.45 mg/L) දෙවොල් දේවාලය ඇළෙන් වාර්තා වූ අතර දෙවැනියට ඉහළතම අගය (4622.64 mg/L) කොග්ගල මෝය අසලින් වාර්තා විය.

8 වැනි බණ්ඩය- මිරිස්ස (කප්පරතොට සිට බත්තරමුල්ල)

ප්‍රතිඵලවලින් පෙන්නුම් කරනුයේ සියලුම නියැදි ලබාගත් ස්ථාන මල අපද්‍රව්‍ය බැක්ටීරියාවෙන් (total and feacal coliform) දූෂණය වී පැවති බවත් නියැදි ලබාගත් කප්පරතොට, බණ්ඩාරමුල්ල වෙරළ හා මිරිස්ස වරාය යන ස්ථානවල ඉහළ අපද්‍රව්‍ය ප්‍රමාණයක් වාර්තා වී තිබේ. රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) සම්මත ප්‍රමිත ඉක්මවා තිබුණු අතර ඉහළතම අගය පොල්අතුමෝදර නියැදි පරීක්ෂා ස්ථානයෙන් වාර්තා විය (5,770 mg/L).

මේ හැරුන විට, මීගමුව සිට මිරිස්ස දක්වා එම වෙරළ කලාපය තුළම වෙරළ බණ්ඩ 11ක් සහ නියැදි ලබාගන්නා ස්ථාන 65 ක් ආවරණය වන පරිදි අධ්‍යයනයක් 2022 වර්ෂයේ දී සිදුකරන ලද අතර එහි ප්‍රතිඵලවලින් ද වෙරළ දූෂණයට අදාළව ඉහත තත්ත්වයට සමාන තත්ත්වයක් අනාවරණය විය. දැනට පවත්නා මුහුදු ජල උෂ්ණත්වය හා PH අගය, විද්‍යුත් සන්නායකතාවය (EC), ද්‍රවණය වී ඇති ඔක්සිජන් ප්‍රමාණය (DO), නයිට්‍රයිට්, ඇමෝනියා, මුළු පොස්පරස් (TP), රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) අධ්‍යයනයෙන් අනාවරණය වූ කරුණු අතර පැවතිණි සියලුම වෙරළබඩ ජල ප්‍රවාහවල පැවති මල අපද්‍රව්‍ය බැක්ටීරියාව හේතුවෙන් එම ජලය මල අපද්‍රව්‍යවලින් දූෂණය වී ඇති බව පෙන්නුම් කෙරිනි. රෝග කාරක සැල්මොනෙල්ලා විශේෂය දෙහිවල ඇලෙන් හා රත්මලාන යන නියැදි ස්ථානවලින් හමුවී තිබූ අතර මෙය අතිරේක අවධානය යොමු කළ යුතු කරුණක් විය. මානව ක්‍රියාකාරකම් හේතුවෙන් අධ්‍යයනය සිදුකළ ප්‍රදේශය අඩුවී ඇති බවට ද නිගමනය වී තිබූ අතර සිදුවෙමින් පැවති සංවර්ධන කටයුතු හේතුවෙන් පරිසර හිතකාමී බව සම්බන්ධයෙන් අවධානය අඩුවී තිබුණි (මානගේ පී, සහ තවත් පිරිස 2022).

## 4.3 ගැටළු සහ තර්ජන

### 4.3.1 නාගරික ප්‍රදේශවල මල අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ප්‍රමාණවත් නොවීම

මීට ඉහත කොටසේ දී විස්තර කළ පරිදි, පිරිපහදු නොකරන ලද නාගරික මල අපද්‍රව්‍ය ගොඩබිම ඉඩම්, ජලමාර්ග සහ මුහුද වෙත ඍජුවම මුදා හැරීම හේතු කොටගෙන ඇතැම් වෙරළබඩ ජල ප්‍රදේශවල මළ අපද්‍රව්‍ය නිසා ඇතිවන දූෂණය ප්‍රධාන ගැටළුවක් වී තිබේ. ශ්‍රී ලංකාවේ මල අපවහන පද්ධතියක් ස්ථාපනය කර ඇති සීමිත නගර කිහිපය අතුරින් එකක් වනුයේ කොළඹ නගරය යි. මෙම මළ අපවහන පද්ධතියේ කොටසක් කොළඹ වරායට උතුරින් මෝදර ප්‍රදේශයේ පිහිටි දිගු නළ මාර්ගයක් ඔස්සේ මුහුද වෙත ගලා යන අතර ඉතිරි කොටස එවැනි තවත් දිගු නළ මාර්ගයක් ඔස්සේ වැල්ලවත්ත ප්‍රදේශයේ දී මුහුදට මුදා හැරේ. මෙම පද්ධතිය වසර 100කට වඩා පැරණි හෙයින් සමස්ථ කොළඹ නගරයම ආවරණය කිරීම සඳහා එකී පද්ධතියේ ධාරිතාවය ප්‍රමාණවත් නොවන අතර නිරන්තර අළුත්වැඩියා කටයුතු ද සිදුකළ යුතුව තිබේ. තවත් ගැටළුවක් වනුයේ නීති විරෝධී ආකාරයෙන් අපවහන මාර්ගවලට සම්බන්ධක යා කිරීම් හා වැසිජලය ගලායෑමේ පද්ධතිවලට අපවහන මාර්ග ද සම්බන්ධ කිරීම ද වේ.

දැනට පවතින ඇස්තමේන්තුවලට අනුව, වෙරළබඩ ප්‍රදේශවල දෛනික අපජල උත්පාදනය ආසන්න වශයෙන් 1,822,864 $m^3$ වන අතර ගෘහස්තව උත්පාදනය වන අපජලයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ඇල මාර්ග, කාණු හා පයිප්ප ඔස්සේ වෙරළබඩ කලාපයට මුදා හැරේ. 2001 වර්ෂයේ දී වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය විසින් සිදුකළ අධ්‍යයනයකට අනුව, මහ කොළඹ ප්‍රදේශයේ දෛනිකව උත්පාදනය වන 370, 000 $m^3$ක් අපජල ප්‍රමාණයෙන් මුහුදු නළ මාර්ග ඔස්සේ බැහැර වී ඇත්තේ 90,000 $m^3$ක් පමණි. ඉතිරි 280,000$m^3$ ක පරිමාවක් නැවත අපජලය ලෙස පරිසරයට ඇතුළු වේ. මුහුදු නළ මාර්ග ඔස්සේ බැහැර වන ජලයේ ඉහළ කාබනික සංයුතියක්, ඉහළ පෝෂක සංයුතියක් හා වැඩි මළ අපද්‍රව්‍ය සංයුතියක් අන්තර්ගත වේ.

***මහ කොළඹ ප්‍රදේශයේ මළ අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම්***

*කොළඹ මහනගර සභාවට අයත් වැල්ලවත්ත හා මෝදර ප්‍රදේශවල පිහිටි පිටාර මුවවල්වලදී ඉහළ ඝනත්වයේ පොලිඑතිලින් (HDPE) පයිප්ප ඔස්සේ අපජලය ඔස්සේ අපජලය මුහුද වෙත මුදාහැරේ. මළ අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයෙන් බැහැර කිරීම සඳහා දිගු මුහුදු පිටාර මුවවල් සඳහා grit removal ක්‍රමවේදය යොදා ගන්නා නමුදු මෙහි දී වැඩිදුරටත් පිරිපහදු ක්‍රියාවලියක් භාවිතා නොවේ. පසුගිය වසර කිහිපය මුළුල්ලේ, ජලය ආශ්‍රිත චර්ම රෝග වැල්ලවත්ත වෙරළ ප්‍රදේශයෙන් වාර්තාව වන අතර පිටාර මුවවල්වලින් ඉවත්වන ද්‍රව්‍යවල ප්‍රතිඵලයක් ලෙස ඇතැම් විට මෙය සිදුවන්නට ඇත. (Compendium on Coastal Pollution, 2014).*

### 4.3.2 අඩු වරප්‍රසාදිත ජනාවාසවල අපද්‍රව්‍ය මුදා හැරීම සඳහා පවතින පහසුකම් ප්‍රමාණවත් නොවීම

*ඉහළ ජනගහනයකින් යුක්ත වෙරළබඩ පහත්බිම් බොහොමයක නොගැඹුරු භූ ජල මට්ටමක් පවතින අතර ගංවතුර තත්ත්වයන් සඳහා ඉහළ අවදානමක් පවතී. මෙම ප්‍රදේශයන්ගේ ජලය බැසයෑමේ පහසුකම් ප්‍රමාණවත් නොවීම හා අවිධිමත් සංවර්ධන කටයුතු හේතුවෙන් ගංවතුර අවදානම සහිත වෙරළබඩ පහත්බිම්වල යෝග්‍ය ආකාරයෙන් නොපවතින මල අපවහන බැහැර කිරීම කටයුතුවල බලපෑම් තවදුරටත් තීව්‍රකර තිබේ. මේ හේතුවෙන් අභ්‍යන්තර හා වෙරළට ආසන්න ජලය දැඩි වශයෙන් මල අපද්‍රව්‍ය වලින් සිදුවන දූෂණයට බඳුන් වේ.*

කොළඹ නගරයේ දුගී ජනතාව සඳහා නාගරික යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම කොළඹ නගරයේ මළ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටළුව තවදුරටත් සංකීර්ණ තත්ත්වයට පමුණුවාලයි. පසුගිය ශතවර්ෂය නිමාවීමේ දී නගරය තුළ පැල්පත් ජනාවාස 1,500ක් පමණ පැවති අතර ඒවායෙහි පවුල් 66,000ක් පමණ වාසය කරතිබේ. මෙය නගරයේ සමස්ත ජනගහනයෙන් 51% කි. සනීපාරක්ෂාව, පිරිසිදු පානීය ජලය හා නිසි අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් අනුව සැලකීමේ දී මෙම ජනාවාස අඩු වරප්‍රසාදිත වශයෙන් සැලකේ. මෙම

මූලාශ්‍රයන්ගෙන් ඇතිවන දූෂණය හේතුවෙන් ඇල මාර්ග හා දියපහරවල්වල ජලයේ ද්‍රාවණය වී ඇති ඔක්සිජන් ප්‍රමාණය පහත හෙළන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඔක්සිජන් ඌන පරිසරයක් හා අප්‍රසන්න දුර්ගන්ධයක් හටගන්නා අතර මෙය මිනිස් සෞඛ්‍යයට හා ජලජ ජීවීන්ට හානිකර වේ.

### 4.3.3 කාර්මික අපද්‍රව්‍ය/අපජලය

*ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන අපනයන සැකසුම් කලාප (EPZ) නවයක් (09) ද, කර්මාන්ත උද්‍යාන (IP) තුනක් (03) සහ එක් අපනයන සැකසුම් උද්‍යානයක් (EPP) ඇත. මේවා අතුරින්, අපනයන සැකසුම් කලාප දෙකක් (කටුනායක සහ කොග්ගල) සහ කර්මාන්ත උද්‍යාන එකක් (මිරිජ්ජවිල හෙක්ටයාර 20 ක්) වෙරළ කලාපයේ පිහිටා ඇත.*

*මීට අමතරව, කර්මාන්ත අමාත්‍යාංශය විසින් මෙහෙයවන තවත් කර්මාන්ත උද්‍යාන දාහතක් (17) පවතී. ඉන් උද්‍යාන තුනක් - බටඅත, රත්මලාන හා උඩුකාව වෙරළබඩ කලාපයේ පිහිටා ඇත. තවත් කර්මාන්ත උද්‍යාන හතරක් එනම් පානදුර, වැලිගම, ඒකල සහ ශාන් මාටින් වත්ත, හලාවත පිහිටි උද්‍යාන ද වෙරළබඩ කලාපයේ පිහිටා ඇත. (වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2018)*

- හම්බන්තොට ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා - චීන කාර්ය සම්පාදන හා කර්මාන්ත කලාපය චීන ආයෝජකයන් විසින් මූලික වශයෙන් සංවර්ධනය කරනු ලබන අතර ඒ සඳහා ඩොලර් බිලියන 5 ක ආයෝජන අපේක්ෂා කෙරේ.
- හොරණ පිහිටි කර්මාන්ත උද්‍යානය
- කළුතර, මිල්ලණිය
- පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය සඳහා සුදුසු ස්ථාන වශයෙන් ත්‍රිකුණාමලය හා කිලිනොච්චිය හඳුනාගෙන ඇති අතර පරාසයක දිවෙන තොරතුරු තාක්ෂණ භාණ්ඩ සඳහා මහනුවර, ගාල්ල හා යාපනය සලකා ඇත.

සුළු හෝ කිසිදු පිරිපහදු කිරීමකට ලක්නොවූ කාර්මික අපද්‍රව්‍ය නිරන්තරයෙන් ගලා යෑමෙන්, කාන්දුවීමෙන් හෝ වැස්සීමෙන් වෙරළට ආසන්න ජලය, කලපු හා මෝය වෙත ඇතුළු වේ. වෙරළ කලාපයේ පිහිටා ඇති කර්මාන්තශාලා බහුතරයක් මධ්‍යම හෝ පහළ දූෂණ මට්ටමකින් යුතු කාණ්ඩයට අයත් වේ. 2016 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ වෙරළ කලාපයේ ඉහළ හෝ මධ්‍යම මට්ටමේ දූෂණ විභවයකින් යුතු කර්මාන්තශාලා 5,253 ක් පැවතිණි (මධ්‍යම පරිසර අධිකාරිය 2016) ජල දූෂණය සඳහා වඩාත් දායකවන කර්මාන්ත වනුයේ රෙදිපිළි, කඩදාසි, සම් පදම් කිරීම, ලෝහ සැකසුම සහ ඉංජිනේරු, තීන්ත, රසායන ද්‍රව්‍ය, සිමෙන්ති ආහාර සහ පාන වර්ග හා ස්කාගාර යන කර්මාන්ත වේ. පොල් ලෙලි පල් කිරීම හා සම්බන්ධ කුඩා පරිමාණ කර්මාන්තවලින් ද ස්ථානීය වශයෙන් ඉතා ඉහළ බලපෑමක් ඇති කරනු ලබන අතර මීට හේතු වනුයේ ඉහළ ජෛව ඔක්සිජන් ඉල්ලුමක් (BOD) හා ඉහළ රසායන ඔක්සිජන් ඉල්ලුමක්(COD) එමගින් ප්‍රතිඵල වන බැවිනි.

අපද්‍රව්‍ය පිරිපහදු කිරීම සඳහා අවශ්‍ය කරන මූලික යටිතල පහසුකම් මෙම කර්මාන්තශාලාවලින් බහුතරයක් විසින් මේ වන තෙක් පූර්ණ වශයෙන් සම්පාදනය කරගෙන නොමැති අතර, එවැනි අපද්‍රව්‍ය පිරිපහදු කිරීමේ පහසුකම් පවතින කර්මාන්තශාලා වුව ද, පවතින පහසුකම් භාවිතා කිරීමේ දී දැරිය යුතු අධික පිරිවැය හේතුවෙන් ඒවා භාවිතය දැඩිව සීමාකර තිබේ. අපජලය මුදා හැරීමට පූර්වයෙන් ඒවා පිරිපහදු කිරීමේ මධ්‍ය පහසුකමක් පවතිනුයේ කටුනායක හා බියගම පිහිටි අපනයන සැකසුම් කලාප සඳහා පමණි. පසුගිය වසර කිහිපය මුළුල්ලේම පිරිපහදු නොකළ කර්මාන්ත අප ජලය මුදා හැරීම හේතුවෙන් ජලයේ ගුණාත්මක බව පිළිබඳ ගැටළු උද්ගතවිය. කර්මාන්තවලින් මුදා හරින අප ජලයෙහි කාලයත් සමග ක්ෂය නොවන දිගු කාලීන වශයෙන් පවතින කාබනික දූෂක (POP) සහ බැර ලෝහ අන්තර්ගත වේ. පිරිපහදු කිරීමේ ක්‍රම සඳහා දැරිය යුතු ඉහළ පිරිවැය හේතුවෙන්, බොහෝ කර්මාන්තශාලා විසින් මෙම දිගුකාලීන වශයෙන් පවතින කාබනික දූෂක (POP) සහ බැර ලෝහ ඉවත් කිරීම සඳහා අවශ්‍ය පිරිපහදු කිරීමේ කටයුතු උපයෝගී කරගනු නොලැබේ. මේ සම්බන්ධයෙන් සැලකීමේ දී, සැලකිය යුතු දූෂක මූලයන් අතුරින් එකක් වනුයේ සම් පදම් කිරීමේ කර්මාන්තශාලා ය.

**වගුව 4.2** මගින් වෙරළබඩ ප්‍රදේශයන්ට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පිහිටුවා ඇති ඉහළ/ මධ්‍යම මට්ටම්වලින් දූෂක ද්‍රව්‍ය මුදාහරින කර්මාන්තශාලා සංඛ්‍යාව දක්වා තිබේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ස්ථාපිත කර ඇති කර්මාන්තශාලා ද මීට ඇතුළත් වේ. මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2022 ජනවාරි 27 දිනැති අංක 2264/17 දරන *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති සමුද්‍රීය ජලයට මුදාහරින අපජලය හෝ අපසන්දන සඳහා වන ධාරණ සීමා **වගුව 4.3** මගින් දක්වා ඇති අතර වෙරළාසන්න ජලයට මුදාහරින අපජලය හෝ අපසන්දන සඳහා වන ධාරණ සීමා **වගුව 4.4** මගින් දැක්වේ.

වගුව 4- 2 ආයෝජන මණ්ඩලය විසින් අනුමත කර්මාන්තශාලා ද ඇතුළුව ඉහළ/ මධ්‍යම මට්ටම්වලින් දූෂක ද්‍රව්‍ය මුදාහරින කර්මාන්තශාලාවල ව්‍යාප්තිය

| *වෙරළබඩ දිස්ත්‍රික්කවල පිහිටි ප්‍රා.ලේ. කො.* | *A කාණ්ඩය* | *B කාණ්ඩය* | *BOI* | *එකතුව* |
|---|---|---|---|---|
| කොළඹ | 122 | 70 | 14 | 206 |
| ගම්පහ | 638 | 358 | 138 | 1134 |
| කළුතර | 272 | 183 | 53 | 508 |
| ගාල්ල | 182 | 319 | 17 | 518 |
| මාතර | 176 | 246 | 13 | 435 |
| හම්බන්තොට | 150 | 95 | 17 | 262 |
| ත්‍රිකුණාමලය | 148 | 163 | 17 | 328 |
| අම්පාර | 99 | 149 | 7 | 255 |
| මඩකලපුව | 116 | 240 | 5 | 361 |
| මුලතිවු | 23 | 47 | 0 | 70 |
| යාපනය | 301 | 284 | 3 | 588 |
| මන්නාරම | 88 | 115 | 3 | 206 |
| පුත්තලම | 128 | 240 | 14 | 382 |
| **එකතුව** | **2,443** | **2,509** | **301** | **5,253** |

*මූලාශ්‍රය : මධ්‍යම පරිසර අධිකාරිය (2016)*

වගුව 4 - 3 : සමුද්‍රීය ජලයට මුදා හරින අපජලය හෝ අපසන්දන සඳහා වන ධාරණ සීමා

| *අංකය* | *නිර්ණකයන්* | *ඒකක හා සීමා* | *පිටවුම් නළයක් මගින් වෙරළාසන්න සමුද්‍රීය කලාපයට බැහැරලීම සඳහා වන ධාරණ සීමා* | *කෙටි දුර සමුද්‍රීය පිටවුම් නළයක් මගින් බැහැරලීම සඳහා වන ධාරණ සීමා* | *දුරස්ථ සමුද්‍රීය පිටවුම් නළයක් මගින් බැහැරලීම සඳහා වන ධාරණ සීමා* |
|---|---|---|---|---|---|
| 1. | අවලම්භිත මුළු ඝන ද්‍රව්‍ය ප්‍රමාණය | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 30 | 50 | 250 |
| 2. | ද්‍රවණය වූ මුළු ඝන ද්‍රව්‍ය ප්‍රමාණය | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 2100 | - | - |
| 3. | පරිසර උෂ්ණත්වයේ දී pH අගය | - | 6.0-8.5 | 5.5-9.0 | 5.5-9.0 |
| 4. | ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම ($20^0$C හිදී දින 5ක් තුළ - $BOD_5$) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම | 15 | 75 | 400 |

| අංකය | නිර්ණකයන් | ඒකක හා සීමා | පිටවුම් නළයක් මගින් වෙරළාසන්න සමුද්‍රීය කලාපයට බැහැරලීම සඳහා වන ධාරණ සීමා | කෙටි දුර සමුද්‍රීය පිටවුම් නළයක් මගින් බැහැරලීම සඳහා වන ධාරණ සීමා | දුරස්ථ සමුද්‍රීය පිටවුම් නළයක් මගින් බැහැරලීම සඳහා වන ධාරණ සීමා |
|---|---|---|---|---|---|
| 5. | මුදාහරින අවස්ථාවේ දී උෂ්ණත්වය | $^{0}C$, උපරිම | සංසරණ ජල උෂ්ණත්වය අංශක +/- 5 හෝ 35 යන අගයන්ගෙන් වඩා අඩු අගය | සංසරණ ජල උෂ්ණත්වය අංශක +/- 5 හෝ 35 යන අගයන්ගෙන් වඩා අඩු අගය | සංසරණ ජල උෂ්ණත්වය අංශක +/- 5හෝ 35 යන අගයන්ගෙන් වඩා අඩු අගය |
| 6. | තෙල් හා ග්‍රීස් වර්ග | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 5 | 12 | 15 |
| 7. | පීනෝලික සංයෝග ($C_6H_5OH$ ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 1 | 1 | 5 |
| 8. | රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 50 | 400 | 800 |
| 9. | ද්‍රවණය වූ පොස්පේට් (P ලෙස) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම. | 1 | 5 | 10 |
| 10. | ඇමෝනීය නයිට්‍රජන් (N ලෙස) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම. | 15 | 50 | 150 |
| 11. | සයනයිඩ (CN ලෙස) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම | 0.1 | 0.2 | 0.4 |
| 12. | සම්පූර්ණ ශේෂ ක්ලෝරීන් ($Cl_2$ලෙස) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම | 0.5 | 0.5 | 1.0 |
| 13. | ෆ්ලෝරයිඩ (F ලෙස) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම | 2 | 2 | 5 |
| 14. | සල්ෆයිඩ (S ලෙස) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම | 2 | 2 | 5 |
| 15. | ආසනික්, සම්පූර්ණ (As ලෙස) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම | 0.08 | 0.1 | 0.2 |
| 16. | කැඩ්මියම්, සම්පූර්ණ (Cd ලෙස) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම | 0.02 | 0.05 | 0.10 |
| 17. | ක්‍රෝමියම්, සම්පූර්ණ (Cr ලෙස) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම | 0.05 | 0.05 | 0.10 |
| 18. | ක්‍රෝමියම්, ෂඩ් සංයුජ($Cr^{6+}$ ලෙස) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම | 0.01 | 0.01 | 0.05 |
| 19. | තඹ, සම්පූර්ණ (Cu ලෙස) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම | 1.0 | 1.0 | 1.0 |
| 20. | ඊයම්, සම්පූර්ණ (Pb ලෙස) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම | 0.05 | 0.10 | 0.10 |
| 21. | රසදිය, සම්පූර්ණ (Hg ලෙස) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම | 0.001 | 0.002 | 0.01 |
| 22. | නිකල්, සම්පූර්ණ (Ni ලෙස) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම | 0.1 | 0.2 | 1.0 |
| 23. | සෙලිනියම්, සම්පූර්ණ (Se ලෙස) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම | 0.01 | 0.05 | 0.10 |
| 24. | සින්ක්, සම්පූර්ණ (Zn ලෙස) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම | 3 | 3 | 5 |
| 25. | රිදී, සම්පූර්ණ (Ag ලෙස) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම | 0.005 | 0.035 | 0.35 |
| 26. | පලිබෝධනාශක (සම්පූර්ණ) | | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 0.005 | 0.005 |
| 27. | ක්ෂාලක (සම්පූර්ණ) | මි.ග්‍රෑ/ලීටර්,උපරිම | 1 | 5 | 10 |

| අංකය | නිර්ණායකයන් | ඒකක හා සීමා | පිටවුම් නළයක් මගින් වෙරළාසන්න සමුද්‍රීය කලාපයට බැහැරලීම සඳහා වන ධාරණ සීමා | කෙටි දුර සමුද්‍රීය පිටවුම් නළයක් මගින් බැහැරලීම සඳහා වන ධාරණ සීමා | දුරස්ථ සමුද්‍රීය පිටවුම් නළයක් මගින් බැහැරලීම සඳහා වන ධාරණ සීමා |
|---|---|---|---|---|---|
| 28. | මල අපද්‍රව්‍ය බැක්ටීරියා | ඉතා ආසන්න සංඛ්‍යාව /ඩෙසි ලීටර්, උපරිම | 150 | 1500 | 1077 |
| 29. | විකිරණශීලිතාවය/ ඇල්ෆා සක්‍රියතාවය+ | බෙකරල්/ ලීටර්, උපරිම | 0.5 | 0.5 | 0.5 |
| 30. | විකිරණශීලිතාවය/ බීටා සක්‍රියතාවය+ | බෙකරල්/ ලීටර්, උපරිම | 1.0 | 1.0 | 1.0 |

1(ආ) ලැයිස්තුව

**වර්ණ පරාමිතීන්**

| අංකය | පරාමිතීන් | ඒකක, සීමා | පිටවුම් නලයක් මගින් වෙරළාසන්න සමුද්‍රීය කලාපයට බැහැරලීම සඳහා වන ධාරණ සීමා |
|---|---|---|---|
| | වර්ණය | | උපරිම වර්ණාවලි අවශෝෂක සංගුණකය |
| 1. | නැනෝ මීටර් 400-499 (කහ වර්ණ පරාසය) | m-1 | 7 උපරිම |
| 2. | නැනෝ මීටර් 500-599 - (රතු වර්ණ පරාසය) | m-1 | 5 උපරිම |
| 3. | නැනෝ මීටර් 600-750 (නිල් වර්ණ පරාසය) | m-1 | 3 උපරිම |

*මූලාශ්‍රය : 2022 ජනවාරි 27 දිනැති අංක 2264/17 දරන ගැසට් පත්‍රය*

**වගුව 4- 4 වෙරළාසන්න ජලයට මුදා හරින අපජලය හෝ අපසන්දන සඳහා වන ධාරණ සීමා**

| අංකය | පරාමිතිය | ඒකක හා සීමා | වෙරළාසන්න ජලයට බැහැරලීම සඳහා වන ධාරණ සීමා |
|---|---|---|---|
| 1. | අවලම්භිත මුළු ඝන ද්‍රව්‍ය ප්‍රමාණය | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 50 |
| 2. | ද්‍රවණය වූ මුළු ඝන ද්‍රව්‍ය ප්‍රමාණය | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 1000 |
| 3. | පරිසර උෂ්ණත්වයේ දී pH අගය | - | 6.0-8.5 |
| 4. | ජෛව රසායනික ඔක්සිජන ඉල්ලුම ($20^0C$ හිදී දින 5ක් තුළ - $BOD_5$) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 30 |
| 5. | මුදාහරින අවස්ථාවේ දී උෂ්ණත්වය | $^0C$, උපරිම | සංසරණ ජල උෂ්ණත්වය අංශක +/- 5 හෝ 40 යන අගයන්ගෙන් වඩා අඩු අගය |
| 6. | තෙල් හා ග්‍රීස් වර්ග | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 10 |

| අංකය | පරාමිතිය | ඒකක හා සීමා | වෙරළාසන්න ජලයට බැහැරලීම සඳහා වන ධාරණ සීමා |
|---|---|---|---|
| 7. | පීනෝලික සංයෝග ($C_6H_5OH$ ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 1 |
| 8. | රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 250 |
| 9. | ද්‍රවණය වූ පොස්පේට් (P ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 5 |
| 10. | සම්පූර්ණ ජෙල්ඩාල් නයිට්‍රජන් (N ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 150 |
| 11. | ඇමෝනීය නයිට්‍රජන් (N ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 50 |
| 12. | සයනයිඩ (CN ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 0.05 |
| 13. | සම්පූර්ණ ශේෂ ක්ලෝරීන් ($Cl_2$ ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 0.5 |
| 14. | ක්ලෝරයිඩ (Cl ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | උදම් චක්‍රයේ ඕනෑම අවස්ථාවක දී සංසරණ තත්ත්ව අගයට වඩා 20%ක වෙනසක් නොවිය යුතු ය. |
| 15. | ෆ්ලෝරයිඩ (F ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 2.0 |
| 16. | සල්ෆයිඩ (S ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 2.0 |
| 17. | ආසනික්, සම්පූර්ණ (As ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 0.05 |
| 18. | කැඩ්මියම්, සම්පූර්ණ (Cd ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 0.05 |
| 19. | ක්‍රෝමියම්, සම්පූර්ණ (Cr ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 0.05 |
| 20. | ක්‍රෝමියම්, ෂඩ් සංයුජ (Cr6+ ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 0.01 |
| 21. | තඹ, සම්පූර්ණ (Cu ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 0.05 |
| 22. | ඊයම්, සම්පූර්ණ (Pb ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 0.05 |
| 23. | රසදිය, සම්පූර්ණ (Hg ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 0.001 |
| 24. | නිකල්, සම්පූර්ණ (Ni ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 0.2 |
| 25. | සෙලිනියම්, සම්පූර්ණ (Se ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 0.05 |
| 26. | සින්ක්, සම්පූර්ණ (Zn ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 1.0 |
| 27. | රිදී, සම්පූර්ණ (Ag ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 0.035 |
| 28. | පලිබෝධනාශක (සම්පූර්ණ) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 0.005 |
| 29. | ක්ෂාලක (සම්පූර්ණ) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 5.0 |
| 30. | සල්ෆේට් (S ලෙස) | මි.ග්‍රෑ/ලීටර්, උපරිම | 250 |
| 31. | මල අපද්‍රව්‍ය බැක්ටීරියා | ඉතා ආසන්න සංඛ්‍යාව /ඩෙසි ලීටර්, උපරිම | 150 |
| | | | |
| 32. | විකිරණශීලීතාවය/ බීටා සක්‍රියතාවය+ | බෙකරල්/ ලීටර්, උපරිම | 0.5 |
| 33. | විකිරණශීලීතාවය/ බීටා සක්‍රියතාවය+ | බෙකරල්/ ලීටර්, උපරිම | 1.0 |

(II ආ ලැයිස්තුව) වර්ණ පරාමිතීන්

| අංකය | පරාමිතිය | ඒකක, සීමා | වෙරළාසන්න ජලයට බැහැරලීම සඳහා වන ධාරණ සීමා |
|---|---|---|---|
| | වර්ණය | | උපරිම වර්ණාවලි අවශෝෂක සංගුණකය |
| 1. | නැනෝ මීටර් 400-499<br>(කහ වර්ණය සඳහා පරාසය) | m-1 | 7 උපරිම |
| 2. | නැනෝ මීටර් 500-599 - (රතු වර්ණය සඳහා පරාසය) | m-1 | 5 උපරිම |
| 3. | නැනෝ මීටර් 600-750 (නිල් වර්ණය සඳහා පරාසය) | m-1 | 3 උපරිම |

*1 වන සටහන : අප්‍රසන්න ගන්ධය හැකිතාක් දුරට ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතු යි.*

*2 වන සටහන : වෙරළාසන්න ජලය සඳහා වන තනුකකරණ පරිමාව අවම වශයෙන් 1:8 ක අගයකින් තිබිය හැකිය යන පූර්ව නිගමනය මත මෙම සීමා අගයන් පදනම් වේ. තනුකකරණ පරිමාව ඊට වඩා අඩු අගයක් ගනු ලබන අවස්ථාවකදී,වඩා දැඩි සීමා අගයන් ඇති කිරීමේ අරමුණින් ලැයිස්තුවේ ඇති සීමා අගයන්, සමානුපාතික පදනමකින් සකස්කරනු ලැබිය යුතුය.*

*3 වන සටහන : විකිරණශීලී ද්‍රව්‍ය සඳහා වන ධාරණ සීමාවන් ඉක්මවා යන අවස්ථාවක දී ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් නියම කර ඇති ප්‍රමිතීන් අදාළ කර ගනු ලැබිය යුතුය.*

#### 4.3.4 සංචාරක ආයතන/ මධ්‍යස්ථානවලින් සිදුවන දූෂණය

*දැනට ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගෙන් 74.4% (හෝ බහුතරය) පැමිණෙනුයේ විනෝදාස්වාදය සඳහාය. මෙවැනි සංචාරක කටයුතු වැඩි වශයෙන් රඳා පවතින්නේ පරිසරයේ ගුණාත්මකභාවය මත වන අතර, විශේෂයෙන් සංචාරකයන් විසින් ඔවුන්ගේ සංචාරක ගමනාන්තවල පරිසර දූෂණය හෝ පාරිසරික හායනය සම්බන්ධයෙන් ඉහළ සංවේදී බවක් දක්වනු ලැබේ. වෙරළ කලාපය තුළ සංචාරක කර්මාන්තයේ තිරසාරභාවය රැක ගැනීම උදෙසා ඒ කෙරෙහි ඇතිවන අහිතකර බලපෑම් වැළැක්වීම සඳහා වෙරළබඩ දූෂණය පාලනය කළ යුතු ය.*

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) සමග ලියාපදිංචි වී ඇති සංචාරක හෝටල්වලින් වැඩි ප්‍රතිශතයක් වෙරළබඩ කලාපයේ පිහිටා ඇතිබව වර්තමාන තොරතුරුවලින් අනාවරණය වේ. 2013 වර්ෂයේ දී, ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව මාසික වශයෙන් සැලකූ විට ආසන්න වශයෙන් 100,000ක් වන අතර මාසයක් තුළ නිපදවෙන අප ජල ප්‍රමාණය 19,000 m3 ක් ලෙස ඇස්තමේන්තු කර තිබේ. හෝටල් 276 ක් සම්බන්ධයෙන් කළ අධ්‍යයනයක දී, විශාල පරිමාණ හෝටල්වලින් 92% ක අප ජලය පිරිපහදු කිරීමේ ඒකක පවතින බවත් කුඩා හා මධ්‍ය පරිමාණ හෝටල්වලින් 17% ක පමණක් එවැනි ඒකක පවතින බවත් අනාවරණය විය. 2013 සිට 2018 දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකාවට සංචාරකයන් පැමිණීමේ සුවිශේෂී වර්ධනයක් වාර්තා වුව ද, ඉන් අනතුරු 2019 අප්‍රේල් මාසයේ සිදු වූ පාස්කු බෝම්බ ප්‍රහාරය හා ඉන් අනතුරුව පැවති කොවිඩ් වසංගත තත්ත්වය මෙම කර්මාන්තය කෙරෙහි සැලකිය යුතු ඍණාත්මක බලපෑමක් ඇතිකරන ලදී. මෙරට සංචාරක ක්ෂේත්‍රය යළි නඟා සිටුවීම සහ පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) විසින් Sri Lanka Tourism 2022-2025 නමින් සංචාරක ව්‍යාපෘතිය සඳහා උපායමාර්ගික සැලැස්මක් පිළියෙළ කරන ලදී. එසේ වුව ද, සංචාරකයන් පැමිණීමේ උච්චතම අවධිය ආරම්භ වීමත් සමගින් පාලනයකින් තොරව අදාළ කටයුතු පුළුල් කිරීමේ අහිතකර පැතිකඩවල් පොකුරු වශයෙන් පිහිටි වෙරළබඩ අවන්හල් හා සංචාරක නිකේතන මෙන්ම ප්‍රධාන සංචාරක මධ්‍යස්ථානවලින් ද පැහැදිලිව දක්නට ලැබිණ. මුළුතැන්ගෙවල් හා ලොන්ඩ්‍රිවලින් බැහැරවන අපජලය හා ප්ලාස්ටික් ඇතුළු ඝන අපද්‍රව්‍ය ආකාරයෙන් පිරිපහදු නොකළ අපද්‍රව්‍ය හා මඩ වෙරළාසන්න ජලයට එකතු විය. දකුණ, නිරිත හා නැගෙනහිර වෙරළ තීරය ඔස්සේ පිහිටා ඇති ප්‍රධාන සංචාරක මධ්‍යස්ථාන බහුතරයක් තුළින් පැහැදිලිව දිස්වූ පරිදි මෙමගින් වෙරළ කලාප දූෂණ ගැටලු හටගන්නා ලදී. හික්කඩුව, බේරුවල, උණවටුන හා අරුගම්බේ ප්‍රදේශවල සිදුකළ සංචාරක කටයුතු පුළුල් කිරීම් හේතුවෙන් ජලයේ ගුණාත්මකබව අඩුවීම මෙන්ම වෙරළ හා වෙරළාසන්න ජලය ආශ්‍රිතව දෘශ්‍ය දූෂණය ද ඇතිවී තිබේ. අපද්‍රව්‍ය මුදාහැරීම් හේතුකොටගෙන සංචාරක මධ්‍යස්ථානවලට යාබද වෙරළබඩ ජලයේ ගුණාත්මක බව සැලකිය යුතු ආකාරයෙන් පිරිහී ඇති බව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් දැනට සිදුකරගෙන යමින් පවතින වෙරළබඩ ජලයේ ගුණාත්මකබව පරීක්ෂා කිරීමේ

අධ්‍යයනවලට අනුව පැහැදිලිව පෙනී ගොස් තිබේ.මුළුතැන්ගෙය ආශ්‍රිතව, ස්නාන ජලය හා සේදුම් මගින් ඉවත් කෙරෙන ජලය බැහැර කිරීම පිළිබඳ ගැටලුව විශාල පරිමාණ හෝටල් ආශ්‍රිත ගැටලුවක් ලෙස සැලකේ. සංචාරක කර්මාන්තය හා සම්බන්ධිත අනවසර ජනාවාස ද ගැටලුවක් වනුයේ එය මල අපද්‍රව්‍ය ආශ්‍රිත දූෂණයට හේතුවන බැවින් වන අතර, මෙය වෙරළාසන්න ජලයේ පිහිනුම් කටයුතු හා ජල ක්‍රීඩා වැනි සංචාරක විනෝදාස්වාද ක්‍රියාකාරකම් කෙරෙහි දැඩි තර්ජනයක් වී තිබේ.

### 4.3.5. බලශක්ති නිෂ්පාදන අංශය මගින් සිදුවන දූෂණය

ශ්‍රී ලංකාවේ බලශක්ති අවශ්‍යතාවය එකිනෙකට වෙනස් සම්පත් ආකාර හයකින් සපුරා ගනු ලැබේ. මෑත කාලීන සංඛ්‍යාලේඛන මගින් දැක්වෙනුයේ 2019 වර්ෂයේ දී මුළු බලශක්ති අවශ්‍යතාවයෙන් ඉන්ධන දහනය මගින් සිදුකෙරෙන තාප බලාගාර (30.2% කට), ගල් අඟුරු දහනය මගින් සිදුකෙරෙන තාප බලාගාර (35.3% කට) දායක වී තිබේ. මෙම ආකාර ද්විත්වයම විදුලිබල උත්පාදනයෙන් 22.7% ක් වන ජලවිදුලි බලයේ දායකත්වය ඉක්මවා ගොස් තිබේ (ශ්‍රී ලංකාවේ බලශක්ති සංතුලනය 2019, බලශක්ති අංශයේ කාර්යසාධනය පිළිබඳ විශ්ලේෂණය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය). තාප බලාගාර ප්‍රධාන වශයෙන් වෙරළබඩ කලාපයේ පිහිටා ඇත. මෙම බලාගාර කෙරවලපිටිය, නොරොච්චෝලේ සහ පුත්තලම යන ප්‍රදේශවල පිහිටා තිබේ. කෙරවලපිටිය සහ පුත්තලම පිහිටි බලාගාර සඳහා බලශක්ති මූලය ලෙස ඉන්ධන තෙල් භාවිතා කරන අතර නොරොච්චෝලේ බලාගාරය සඳහා ගල් අඟුරු බලශක්ති මූලය ලෙස යොදා ගැනේ. ස්ථාපිත මුළු ධාරිතාවයෙන් ප්‍රධාන ප්‍රතිශතයක් උත්පාදනය සඳහා ජලබලය දායක වුව ද, වාර්ෂික බලශක්ති උත්පාදනය සඳහා එහි දායකත්වය ක්‍රමයෙන් අඩු වෙමින් පවතී. බලශක්ති ඉල්ලුම සහ පවතින ජලවිදුලිබල උත්පාදනය අතර හිඟය පෙට්‍රෝලියම්, ගල් අඟුරු හා ස්වාභාවික වායු භාවිතයෙන් ජනනය කරන තාප විදුලියෙන් සම්පූර්ණ කෙරේ. වෙරළබඩ කලාපය තුළ මෙම තාප බලාගාර පිහිටුවීමෙන් වෙරළබඩ ජලය තාප දූෂණයට ලක්වීම සිදුවේ. මෙම තාප බලාගාර මගින් වෙරළබඩ ජලයේ ගුණාත්මකබව කෙරෙහි ඇතිකරන ප්‍රධාන තර්ජනය වනුයේ උණු ජලය හා ලවණ ඉවත් කළ ජලය එකී ජලය වෙත මුදා හැරීම යි.

### 4.3.6. ධීවර අංශය මගින් සිදුවන දූෂණය

දැව් තෙල් හා යාත්‍රා පතුලේ පල්වූ ජලය අවිධිමත් ආකාරයෙන් ධීවර වරායවල්හි ජලයට මුදා හැරීමෙන් වෙරළබඩ කලාපයේ පිහිටා ඇති ක්‍රියාත්මක වෙමින් පවතින ධීවර වරාය 21 ක්, නැංගුරම් ස්ථාන 42ක් සහ ගොඩබෑස්සවීමේ ස්ථාන 883 ක් වෙරළබඩ ජල දූෂණයට දායක වේ. මීට අමතරව, මසුන්ගේ බඩවැල් ආදී කොටස් ඉවත් කිරීම මගින් සැලකිය යුතු වශයෙන් රැස්වන කාබනික අපද්‍රව්‍ය, වෙළඳපොළ පොළොව මත රැඳෙන ජලය ගලායෑමට සැලැස්වීම, පිරිසිදු කිරීම් හා අපද්‍රව්‍ය ඉවතලෑම වැනි අවිධිමත් ක්‍රියාවන් මගින් දූෂණයට ලක්වන වෙරළබඩ ජලයේ රසායනික ඔක්සිජන් ඉල්ලුමේ (COD) මට්ටම ඉහළ යයි. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC) විසින් වරායවල් තුළ දැවිතෙල් එක්රැස් කිරීමේ පහසුකම් සපයා තිබුණ ද, අපවිත්‍ර තෙල් වරාය තටාකයට මුදාහැරීම අඛණ්ඩව සිදුවීම තුළින් පාරිසරික තර්ජන ඇති වේ. මෑතක දී දකුණු සහ නිරිත දිග වෙරළ කලාපයේ ප්‍රධාන ධීවර වරාය 4ක් වන බේරුවල, ගාල්ල, පුරාණවැල්ල, සහ කුඩාවැල්ල ධීවර වරායවල් ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයන සිදුකළ අතර එහිදී වැඩිදියුණු කළ තාක්ෂණික අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේද ක්‍රියාවට නැංවිය යුතු ය.

### 4.3.7. ඝන අපද්‍රව්‍ය අපිරිසිදු ලෙස බැහැර කිරීම

*අත්ලන්තික් සාගර, පැසිෆික් සාගර, ඉන්දියන් සාගරය, කළු මුහුද සහ මධ්‍යධරණීය මුහුදට මායිම්ව වාසය කරන පුද්ගලයන් ඇතුළත්ව රටවල් 192 කට අදාළව සිදුකළ අධ්‍යයනයක දී, සමුද්‍රීය අපද්‍රව්‍ය මගින් සාගර දූෂණය කර ප්‍රධානතම රටවල් විස්ස අතුරින් ශ්‍රී ලංකාව 5 වැනි ස්ථානයට හඳුනාගෙන තිබුණි. වෙරළබඩ තීරය ඔස්සේ වෙරළ තීර 22 ක සිදුකළ අධ්‍යයනයේ දී වෙරළෙහි වර්ග මීටරයකට විශාල අපද්‍රව්‍ය 4.1 (> මි.මී. 25) සහ කුඩා අපද්‍රව්‍ය 158 (මි.මී 5-25) පැවතිණි. භාවිතය අනුව වර්ගීකරණය කිරීමේදී පාරිභෝගික ද්‍රව්‍ය (25%) අතුරින් ඇසුරුම් ද්‍රව්‍ය (55%) ප්‍රධාන වූ අතර ධීවර උපාංග ද (20%) පැවතිණි. දූෂණයට දායක වී ඇති ද්‍රව්‍ය අතුරින් වැඩිම දායකත්වය ප්ලාස්ටික් (93%) වලිනි. ගංගා මුවදොරකට, නගරයකට හෝ බාධකයකට ආසන්න වෙරළවල අපද්‍රව්‍ය වැඩිවශයෙන් එක්රැස්වී තිබුණි. (Yong Chang Jang et al -2018)*

ඝන අපද්‍රව්‍ය යනු වෙරළබඩ දූෂණය සඳහා හේතුවන ප්‍රධාන මූලාශ්‍ර අතුරින් එකකි. පසුගිය දශක කිහිපය මුළුල්ලේ ශ්‍රී ලංකාව තුළ ඝන අපද්‍රව්‍ය ආශ්‍රිත සෞඛ්‍ය හා පාරිසරික ගැටලු වර්ධනය වෙමින් පවතින අතර, එය තවදුරටත් වර්ධනය වෙමින් පවතින ගැටලුවක් වී ඇත. නිවෙස්වලින් බැහැර කරන ඝන අපද්‍රව්‍ය, විනෝදාස්වාද ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන අපද්‍රව්‍ය, සංචාරක කටයුතු හා අනෙකුත් කර්මාන්ත මත පදනම් ව උපදවන අපද්‍රව්‍ය, දුම්පානයට අදාළ අපද්‍රව්‍ය, සහ වෛද්‍යමය කටයුතු ආශ්‍රිත අපද්‍රව්‍ය යනාදියෙන් වෙරළබඩ පරිසරවල පවතින ඝන අපද්‍රව්‍ය සමන්විත වේ. වෙරළබඩ පරිසරවල පවතින ඝන අපද්‍රව්‍යවල මූලාශ්‍ර වනුයේ ගොඩබිම අභ්‍යන්තර ක්‍රියාකාරකම්, වෙරළබඩ ප්‍රදේශ මත පදනම් වූ සහ සමුද්‍රය ආශ්‍රිත ප්‍රභවයන් වේ.වෙරළබඩ කලාපයේ විශේෂයෙන්, වෙරළවල් ආශ්‍රිතව එක්රැස්වන ඝන අපද්‍රව්‍ය ඒ වෙත රැස්වනුයේ ගංගා, ඇළදොළ, සහ අනෙකුත් ජල මාර්ග ඔස්සේ රට අභ්‍යන්තරයේ ජලය

සමග ගලා ඒම නිසාය. මීට අමතරව, වෙරළබඩ ව වාසය කරන ජනතාව, වෙරළ භාවිතා කරන පිරිස්, සංචාරක කර්මාන්තය ආශ්‍රිත ආයතන හා ධීවර කටයුතුවල දී හා ඒ ආශ්‍රිත(යටිතල පහසුකම්) අක්‍රමවත් ආකාරයෙන් ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම මෙම ගැටළුව තවදුරටත් තීව්‍ර කිරීමට දායක වී ඇත.

Yong Chang Jang (2018)ට අනුව, වෙරළෙහි වර්ග මීටරයක කොටසක විශාල අපද්‍රව්‍ය 4.1 (>මි.මී.25) සහ කුඩා අපද්‍රව්‍ය 158 (මි.මී.5-25) පැවතිණි. භාවිතය අනුව වර්ගීකරණය කිරීමේ දී ඇසුරුම් ද්‍රව්‍ය (55%) ප්‍රධාන වූ අතර පාරිභෝගික ද්‍රව්‍ය (25%) ධීවර උපාංග ද (20%) පැවතිණි. දූෂණයට දායකවී ඇති ද්‍රව්‍ය අතුරින් වැඩිම දායකත්වය ප්ලාස්ටික් (93%) වලිනි. ගංගා මෝය ආශ්‍රිතව, නගරයකට හෝ බාධක ව්‍යුහයකට ආසන්න වෙරළවල අපද්‍රව්‍ය වැඩිවශයෙන් එක්රැස්වී තිබුණි.

ශ්‍රී ලංකාවේ වෙරළබඩ පරිසරවල අපද්‍රව්‍ය හා අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ තත්ත්වය ඇගයීම සඳහා 2021 වර්ෂයේ දී සිදුකළ අධ්‍යයනයක දී (හිටිගේ සහ සමරකොන්, 2021), ශ්‍රී ලංකාවේ වෙරළබඩ පරිසර 15ක් නියැදි ස්ථාන වශයෙන් තෝරාගෙන තිබුණි. විවිධ ඝන අපද්‍රව්‍ය ආකාර, ඒකීය ප්‍රදේශයක පවතින එම එක් එක් වර්ගයේ ඝන අපද්‍රව්‍යවල සංයුතිය විශ්ලේෂණය කිරීම මෙම අධ්‍යයනයේ දී යොදාගත් ක්‍රමවේදයට ඇතුළත් විය. සමුද්‍රයට එක්ව ඇති අපද්‍රව්‍ය කෙරෙහි බලපාන ඝන අපද්‍රව්‍ය මූලාශ්‍ර මෙහි දී හඳුනාගන්නා ලදී. වෙරළේ වර්ග මීටරයක වපසරියක් තුළ සාමාන්‍ය වශයෙන් බර කි.ග්‍රෑ. 4.2 ක් සහ කැබලි 50ක් වන අපද්‍රව්‍ය කොටස් පවතින බව අධ්‍යයනය මගින් අනාවරණය විය. නගර සීමාවලින් බැහැරව ඇති සංචාරක වෙරළවල්වල ඝන අපද්‍රව්‍යවල වැඩිම ඝනත්වය ද, දෙවනුවට වැඩිම ඝනත්වය වෙරළබඩ පරිසරවල ගංමෝය ආශ්‍රිතව ද පවතින බව ද මෙයින් අනාවරණය විය. වෙරළබඩ පරිසරයේ සමුද්‍රීය අපද්‍රව්‍ය අතර ප්‍රධානතම ද්‍රව්‍ය වශයෙන් ප්ලාස්ටික් හඳුනාගන්නා ලදී. විධිමත් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා රටෙහි යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, අක්‍රමවත් හා නීතිවිරෝධී ආකාරවලින් අපද්‍රව්‍ය බැහැර කිරීම, විධිමත් අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ පද්ධති නොමැති වීම හා මෙම ගැටලුව සම්බන්ධයෙන් පවතින දැනුවත්භාවයේ මඳ බව මෙසේ වෙරළබඩ පරිසරවල ඝන අපද්‍රව්‍ය රැස්වීමට හේතුවන අතර අවසානයේ දී එය සමුද්‍රීය අපද්‍රව්‍ය වශයෙන් අවසන්වන බව මෙම අධ්‍යයනයෙන් පෙන්වා දී ඇත. පවතින යටිතල පහසුකම් ඵලදායි ආකාරයෙන් භාවිතා කරමින් වෙරළබඩ පරිසරයේ විධිමත් ව අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා යොදා ගැනීමේ අවශ්‍යතාවය අධ්‍යයනය තුළින් නිර්දේශ විය. එසේම ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය කිරීමේ අවශ්‍යතාවය සහ සමුද්‍රීය අපද්‍රව්‍ය මත ඝන අපද්‍රව්‍යවල බලපෑම සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම ද වඩාත් අවශ්‍ය බව තහවුරු විය. පවතින පහසුකම් යටතේ ඵලදායි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ විධි වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකාවේ වෙරළබඩ පරිසර පද්ධති ආරක්ෂා කරගැනීම සම්බන්ධයෙන් ප්‍රජාව දිරිමත් කිරීම සඳහා ප්‍රජා මෙවලමක් ලෙස ජංගම යෙදවුමක් මෙම අධ්‍යයනය ඔස්සේ හඳුන්වා දී තිබුණි.

ඉහත සඳහන් කළ අධ්‍යයනයට අනුව, වෙරළ තීරයේ ඇති ඝන අපද්‍රව්‍යවල සමන්විත වන ප්‍රධාන ද්‍රව්‍ය ආකාර වනුයේ ප්ලාස්ටික්, වීදුරු, ලෝහ, දැවමය කොටස්, කඩදාසි, පොලිතීන් සහ වෙනත් පාවෙන ද්‍රව්‍ය බව ද අනාවරණය විය. වෙරළවල්වල පවතින ඝන අපද්‍රව්‍යවල ස්වභාවය හා සංයුතිය වගුව 4.5 මගින් දැක්වේ.

වගුව 4- 5: නියැදි ස්ථානවල ඒකීය ප්‍රදේශයකින් රැස්කර ගනු ලැබූ සෑම ආකාරයකම ඝන අපද්‍රව්‍ය ඒවායේ ප්‍රතිශතාත්මක අගය අනුව

| *ද්‍රව්‍යය* | *බර අනුව ප්‍රතිශතය* | *සංඛ්‍යාව අනුව ප්‍රතිශතය* |
|---|---|---|
| ප්ලාස්ටික් | 48% | 41% |
| වීදුරු | 39% | 8% |
| ලෝහ | 9% | 10% |
| දැවමය කොටස් | 1% | 3% |
| කඩදාසි සහ පොලිතීන් | 1% | 19% |
| අනෙකුත් | 2% | 20% |

මූලාශ්‍රය : එල්.වයි හිටිගේ සහ පිරිස (2021) International Journal of Environment, Agriculture and Biotechnology Vol-6, Issue-5; Sep-Oct, 2021

Jambeck et al. (2015) විසින් ඇස්තමේන්තු කර තිබෙන ආකාරයට ගෝලීය වශයෙන් සැලකීමේ දී සාමාන්‍ය ඒක පුද්ගල දෛනික ප්ලාස්ටික් පරිභෝජනය කි.ග්‍රෑ. 0.2ක් වන අතර ප්ලාස්ටික් පරිභෝජනය අතුරින් ශ්‍රී ලංකාව (කි.ග්‍රෑ. 5) එහි ඉහළින් ම වාර්තා වනවිට ඇමරිකා එක්සත් ජනපදය(කි.ග්‍රෑ. 2.59) හා දකුණු අප්‍රිකාව (කි.ග්‍රෑ. 2.0) පිළිවෙළින් දෙවන හා තෙවන ඉහළ අගයන් වාර්තා කරයි.

දැනට පවතින ඇස්තමේන්තු අනුව, වෙරළබඩ පළාත්වල දෛනික වශයෙන් ජනනය වන අපද්‍රව්‍ය ප්‍රමාණය ආසන්න වශයෙන් ටොන් 7,145ක් වන අතර එයින් දෛනිකව ආපසු එකතු කරනු ලබනුයේ ටොන් 2,769ක් (39%) ක් පමණක් වන අතර මේවා අවසන් වශයෙන් අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථාන 213කට බැහැර කෙරේ (මර්වින් ලාල් සහ පිරිස, 2020). දිවයින පුරා පිහිටි පළාත් පාලන ආයතන විසින් රැස්කරන අපද්‍රව්‍ය ප්‍රමාණය දිනකට ටොන් 2,769ක් බව මේ වනවිට ඇස්තමේන්තු කර ඇති නමුත් කසල බැහැර කිරීමේ ගැටලුව ප්‍රධාන වශයෙන් පවතිනුයේ නාගරික ප්‍රදේශ ආශ්‍රිතව ය. අපද්‍රව්‍යවලින් වැඩිම ප්‍රතිශතයක් ජනනය වනුයේ බස්නාහිර පළාතෙනි.

මධ්‍යම පරිසර අධිකාරිය මගින් කරන ලද අධ්‍යයනයකට අනුව, අපද්‍රව්‍ය බැහැර කිරීමේ ප්‍රධාන ස්ථාන 46ක් හඳුනාගෙන ඇති අතර මෙයින් 80% කට වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තේ උතුරු සහ නැගෙනහිර පළාත්වලය. මෙම අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානවලින් 95% ක්ම නියමිත පාරිසරික අනුමැතින් රහිතව පවත්වාගෙන යයි. බහුතරයක් වූ අපද්‍රව්‍ය බැහැර කරන ස්ථාන විවෘත අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථාන වන අතර අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානවලින් 04%ක් ඒ සඳහා මුඩුබිම් හෝ වෙරළ කලාපයට සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වී ඇති තෙත් බිම් හෝ වගුරු බිම් වැනි වෙනත් ස්ථාන භාවිතා කරනු ලැබේ. වෙරළබඩ අනවසර ජනාවාස සහ සංචාරක මධ්‍යස්ථානයන්ට ආසන්නව ඇති වෙරළ තීරයන්හි කැලිකසළ ගොඩගසා තිබීමේ සහ අවිධිමත් ලෙස ඝන අපද්‍රව්‍ය වෙරළ ප්‍රදේශයන්හි මුදා හැරීමේ ගැටලුව ද පවතී. වෙරළවල ඝන අපද්‍රව්‍ය ඒකරාශිවීම හේතුවෙන් ජලයේ ගුණාත්මක බව පිරිහීම සහ වෙරළ තීරයේ පවතින හා ජලයේ පාවෙන දෘශ්‍යමය දූෂක ද්‍රව්‍ය දිස්වීම සිදුවේ. පාරිසරික වශයෙන් සුරක්ෂිත අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථාන නොමැතිවීම බොහෝ පළාත් පාලන ආයතන මුහුණ දෙන ප්‍රධානතම ගැටලුවකි.වගුව 4.6 මගින් වෙරළබඩ පළාත්වල පළාත් පාලන ආයතන මගින් දෛනිකව රැස්කරන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය දැක්වේ.

වගුව 4- 6 වෙරළබඩ පළාත්වල පළාත් පාලන ආයතන මගින් දෛනිකව රැස්කරන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය

| *වෙරළබඩ පළාත* | *දෛනික වශයෙන් ජනනය වන ප්‍රමාණය (ටොන්වලින්)* | *දෛනික වශයෙන් රැස්කරන ප්‍රමාණය (ටොන්වලින්)* | *රැස්කරන ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන්* | *අවසාන වශයෙන් අපද්‍රව්‍ය බැහැර කරන ස්ථාන සංඛ්‍යාත්මක වශයෙන්* |
|---|---|---|---|---|
| බස්නාහිර | 3502 | 1793 | 52% | 52 |
| දකුණ | 1158 | 264 | 8% | 60 |
| වයඹ | 1134 | 187 | 5% | 45 |
| නැගෙනහිර | 785 | 347 | 10% | 40 |
| උතුර | 566 | 178 | 5% | 16 |
| එකතුව | 7145 | 2769 | 38% | 214 |

*මූලාශ්‍රය : Mervin Lal et al. (2020) සමාජ විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකාවේ ජර්නලය 09(01):72-85*

**4.3.8 කෘෂිකාර්මික කටයුතු හා ජලජීවී වගා කටයුතුවලින් සිදුවන දූෂණය**

**කෘෂිකර්මාන්තය**

කෘෂිකාර්මික කටයුතුවලදී රසායනික පලිබෝධනාශක, වල්නාශක සහ දිලීරනාශක භාවිතා කිරීම සැලකිය යුතු ඉහළ මට්ටමක පවතින බවත් ඇතැම් ද්‍රව්‍ය භාවිතයෙන් පසු ද නොනැසී දීර්ඝ කාලයක් පවතින බවත් දැනට පවතින තොරතුරුවලින් අනාවරණය වී ඇත. ගලාගෙන යන ජලයේ ඇති දූෂක ද්‍රව්‍ය පස මගින් උරා ගන්නා හෙයින් මෙම රසායනික ද්‍රව්‍ය මගින් පාංශු හායනය සිදුවේ. එමගින් භූගත ජල දූෂණය වැඩි වේ. මෙම දූෂිත භූගත ජලය කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගන්නා අතර එයින් ප්‍රතිඵල වන කෘෂිකාර්මික ඉඩම්වලින් ගලා යන ජලය වෙරළබඩ ජල සම්පත දූෂණයට ලක් වේ. මීට අමතරව, පොහොර නියමිත ප්‍රමාණ ඉක්මවා භාවිතා කිරීමෙන් වෙරළබඩ ප්‍රදේශවල නයිට්‍රේට් මගින් ඇතිවන දූෂණය සිදුවේ. පවතින තොරතුරු අනුව, 2012 වර්ෂයේ දී කෘෂිකාර්මික කටයුතු සඳහා යූරියා (Urea) මෙ.ටො. 396,888.8 ක්, මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) මෙ.ටො. 144,776ක් සහ ට්‍රිපල් සුපර් පොස්පේට් (TSP) මෙ.ටො. 109,708 ක් ලංකාවට ආනයනය කර තිබේ. ජාතික නිෂ්පාදිතය, වියදම සහ ආදායම (2021)ට අනුව, 2018 වර්ෂයේ දී තේ, රබර්, පොල්

හා වී යන ප්‍රධාන බෝග සඳහා තොග වශයෙන් නිකුත් කර ඇති පොහොර ප්‍රමාණය පිළිවෙලින් මෙ.ටො.166,000,මෙ.ටො. 8,582,000, මෙ.ටො. 53,076,000 සහ මෙ.ටො.111,000 ක් වේ. මෙලෙස භාවිතා වන පොහොර මගින් රට තුළ අරීය වශයෙන් විහිදී යන ගංගා ජාලය ඔස්සේ කෘෂිකාර්මික අංශයේ දූෂක වැඩි ප්‍රමාණයක් වෙරළබඩ ප්‍රදේශ වෙත පැමිණේ. තේ වතුවල සිට මතුපිට ජලවහනය ඔස්සේ පොහොර හා පලිබෝධනාශක විශාලතම වශයෙන් වෙරළ ප්‍රදේශය වෙත ප්‍රවාහනය කරනුයේ කැළණි ගංගාව මගිනි. එසේම, මහවැලි "එච්" කලාපය ඔස්සේ ගලා එන කෘෂි රසායන හේතුවෙන් මහවැලි ගංමෝය ද දූෂණය වී ඇති බව වාර්තා වේ.

*ජල දූෂණය කෙරෙහි කෘෂිකාර්මික කටයුතුවල බලපෑම*

*හරිත විප්ලවයේ අනර්ථකාරී බලපෑම් වනුයේ කෘෂිකර්මාන්තයේ ඉහළ අස්වැන්නක් ලැබෙන නව ප්‍රභේද විවිධ පලිබෝධකයන් හා රෝග තත්ත්වවලට පහසුවෙන් ගොදුරුවන හෙයින් කෘෂි රසායනික ද්‍රව්‍ය වැඩි වශයෙන් භාවිතා කිරීමට සි. වී. සහ එම ශාකවල පෝෂණ අවශ්‍යතා ඉහළ ගොස් තිබීමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් කෘත්‍රිම පොහොර ආනයනය හා භාවිතය ශ්‍රී ලංකාව තුළ සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගොස් තිබේ. 2012 වර්ෂයේ දත්තවලට අනුව, යූරියා (Urea) මෙ.ටො. 396,88.8 ක්, මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) ම. ටෙ. 144,776 ක් සහ ත්‍රිපල් සුපර් පොස්පේට් (TSP) මෙ.ටො. 109,708 ක් ආනයනය කර තිබේ. ජාතික නිෂ්පාදිතය, වියදම සහ ආදායම (2021) ට අනුව, 2018 වර්ෂයේ දී තේ, රබර්, පොල් හා වී යන ප්‍රධාන බෝග සඳහා තොග වශයෙන් නිකුත්කර ඇති පොහොර ප්‍රමාණය පිළිවෙලින් මෙ. ටො. 16,000, මෙ.ටො. 8,582,000, මෙ.ටො. 53,076,000 සහ මෙ.ටො. 111,000 ක් වේ. මෙම දත්ත තුළින් රට තුළ රසායනික පොහොර භාවිතා වීමේ ඉහළ පරිමාණ හා වෙරළබඩ ජල දූෂණය කෙරෙහි එහි පවතින භව්‍යතාවය පෙන්නුම් කෙරේ.*

**ජලජීවි වගා කටයුතු**

*ඕලන්ද ඇළ වෙත ගලා එන ඉස්සන් ගොවිපොළවලින් මුදා හැරෙන අපසන්දනවල මුළු ඝන අවලම්භිත ප්‍රමාණය ඉහළ මට්ටමක පවතින අතර ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුමේ මට්ටම ද ඉහළ අගයක් ගනී (60 - 80 mg/l). මෙම අපසන්දන හේතුවෙන් ඇළ තුළ ඉහළ මට්ටමින් රොන්මඩ තැන්පත්වීම සිදු වී ජලයේ බොර වූ ස්වාභාවය වැඩි වේ. මෙම ජලයේ ඉහළ සල්ෆයිඩ් හා ඇමෝනියා මට්ටම්වලට ද හේතු වී ඇත්තේ ඉස්සන් ගොවිපොළවලින් මුදා හැරෙන අපසන්දනවල බලපෑම වේ.*

අවිධිමත් ආකාරයෙන් සංවර්ධනය කළ ඉස්සන් වගාව හේතුවෙන් එම පොකුණුවලින් අපසන්දන ඉහළ ප්‍රමාණවලින් බැහැර වීම වයඹ පළාතේ වෙරළබඩ දූෂණයට බොහෝ සෙයින් දායක වී තිබේ. ඕලන්ද ඇල සහ ඒ අවට වෙරළබඩ ප්‍රදේශවල සැලකිය යුතු මට්ටමේ දූෂණයක් මෙමගින් සිදුවී තිබේ. අපසන්දන අධිකව ඕලන්ද ඇලට මුදා හැරීම රෝග ව්‍යාප්තිය සඳහා මුල්වී ඇති අතර, වයඹ පළාතේ ඉස්සන් කර්මාන්තය බිඳ වැටීමට ද හේතු වී තිබේ. ඉස්සන් ගොවිපොළවලින් වෙරළබඩ ජලයට මුදා හැරෙන ඉහළ මට්ටමකින් පවතින නයිට්‍රේට් හා පොස්පේට් මගින් කලාපයේ ආසන්න ජල මාර්ගවල ක්ෂුද්‍ර ජීවී වර්ධනය සඳහා සුපෝෂණ තත්ත්වයක් ඇතිවීමට හා භූගත ජලය දූෂණය වීමට හේතු වී තිබේ. ඕලන්ද ඇළෙහි දූෂණ මට්ටම සම්පූර්ණයෙන් තුරන් කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගනු ලැබූ රජයට එහි ප්‍රතිසංස්කරණ වෙනුවෙන් ආසන්න වශයෙන් රු. මිලියන 130ක් වැය කිරීමට සිදුවී තිබේ. වගුව 4.7 මගින් පොකුණුවල අවසන් අස්වැන්න නෙලන අවස්ථාවේ ජලයේ තත්ත්වය පෙන්නුම් කෙරේ.

රට අභ්‍යන්තරයේ මෙන්ම වෙරළට ආසන්නව හෝ කලපු ජල ස්කන්ධවල ජලජීවී වගා සංවර්ධන කටයුතු රාශියක් උතුරු හා නැගෙනහිර පළාත්වල සැලසුම් කර තිබෙන අතර, මෙහිදී විධිමත් අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ පියවරවලට අනුගත නොවුනහොත් සැලකිය යුතු වෙරළබඩ ජල දූෂණයක් ඇතිවිය හැකි ය.

**වගුව 4 - 7: ජලජීවි පොකුණුවල අවසන් අස්වැන්න නෙලන අවස්ථාවේ ගොවිපොළ අපසන්දනවල ජලයේ තත්ත්වය**

| | කුඩා පරිමාණ ගොවිපොළවල් | මධ්‍යම පරිමාණ ගොවිපොළවල් |
|---|---|---|
| ලවණතාවය (ppt) | 07- 45 | 08-43 |
| PH අගය | 8.1-9.6 | 7.9- 9.5 |
| මුළු ඇමෝනියා (ppm) | 0.628->3.5 | 0.52->3.5 |
| නයිට්‍රයිට් (ppm) | 0.624-4.92 | 0.65-5.78 |

| | කුඩා පරිමාණ ගොවිපොළවල් | මධ්‍යම පරිමාණ ගොවිපොළවල් |
|---|---|---|
| නයිට්‍රේට් (ppm) | 2.6- 5.2 | 2.5- 4.8 |
| පොස්පේට් (ppm) | 2.9-3.3 | 2.5- 3.6 |
| සල්ෆයිඩ් (ppm) | 5.6- 7.2 | 4.4- 6.8 |
| ද්‍රාව්‍ය ඔක්සිජන් (ppm) | 1.6- 2.6 | 1.8- 2.4 |
| මුළු අවලම්භිත ඝන (PPM) | 522- 1380 | 496- 1240 |
| | | |

මූලාශ්‍රය : *COREA-ASLE 2009 Pollution from Oil Spills and Other Discharges*

**4.3.9 තෙල් ඉහිරුම්, අනෙකුත් මුදාහැරීම් සහ ධීවර වරායවලින් සිදුවන දූෂණය**

අහඹු ආකාරයෙන් තෙල් නිකුත් වීම සිදුවීම මගින් දිවයින වටා පිහිටා ඇති ප්‍රධාන වාණිජ වරායන් හය වෙරළබඩ ජලය දූෂණය වීම කෙරෙහි දායක වී තිබේ. ඉවත දමන තෙල්, නැව් පතුලට යොදන ද්‍රව්‍ය, නැව් පතුලේ රැඳෙන පල් වූ ජලය ආදිය එක්රැස් කිරීම හා බැහැර කිරීම සඳහා පවතින අවම පහසුකම් හේතුවෙන් සිදුවන අවධිමත් බැහැර කිරීම් මගින් වරායවල්හි ජලය දූෂණය වේ. ජල දූෂණය අවම වරායවල් පැවතීම සහතික කිරීම සඳහා එවැනි පහසුකම් මෙන්ම, දූෂණය අවම කිරීමේ සැලසුම් ද වැදගත් අවශ්‍යතා වේ.

ශ්‍රී ලංකාව සතුව දිවයින වටා පිහිටි වාණිජ වරාය හයක් පවතින අතර ඒවායෙහි තෙල් දූෂණය හඳුනාගෙන ඇති පොදු තත්ත්වයකි. තෙල් නැව්වලින් අපද්‍රව්‍ය තෙල් ඉවත දැමීම, නැව් පතුලේ රැඳෙන පල්වූ ජලය බැහැර කිරීම ඉන්ධන ටැංකි පිරිසිදු කිරීම, වරායවල් හා ධීවර වරායවල් ආශ්‍රිතව මෝටර්වලින් ක්‍රියාත්මක වන ධීවර යාත්‍රා සහ නැව්වල නඩත්තු කටයුතු සිදු කිරීම තුළින් සුළු වශයෙන් තෙල් බැහැරවීම් සහ කුඩා තෙල් ස්ථර තත්ත්ව ඇති වේ. ගාල්ල හා කොළඹ වරාය ප්‍රදේශවල ජලයේ තත්ත්වය සම්බන්ධයෙන් සිදුකළ අධ්‍යයනයන් කිහිපයකට අනුව, ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම (BOD), රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD), නයිට්‍රජන් හා මල අපද්‍රව්‍ය බැක්ටීරියා (feacal coliform) වල පැවති මට්ටම ස්වාභාවික තත්ත්වයන් යටතේ පැවතිය යුතු සම්මත මට්ටමට වඩා වැඩිය (Compendiumon Coastal Pollution, 2014).සුළු වශයෙන් තෙල් බැහැරවීම් සහ කුඩා තෙල් ස්ථර තත්ත්ව තුළින් බරපතල ප්‍රතිඵල ඇති නොකරන මුත්, එමගින් දෘශ්‍ය දූෂණය ප්‍රතිඵල වෙමින් විනෝදාස්වාද කටයුතු සඳහා වෙරළවල් හි පැවතිය යුතු දර්ශනීය හා ගුණාත්මක බව අඩුකරයි. ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ජලය තුළ මධ්‍යස්ථ ප්‍රමාණයෙන් දැවිතෙල් කාන්දුවීමේ සිද්ධීන් හතරක් සිදුවී ඇති අතර තාරබෝල වශයෙන් ඒවා වෙරළට ගසාවිත් තැන්පත් වීම සිදුව ඇත. මෙමගින් වෙරළබඩ ජීවී වාසස්ථාන හා ජීවීන් විශේෂ වෙත අවදානමක් ඇතිකරන හෙයින්, තෙල් ඉහිරුම් වැළැක්වීමේ සැලසුම් අවශ්‍ය වේ. රට අභ්‍යන්තරික සේවා ස්ථානවලින් මුදා හැරෙන අපද්‍රව්‍ය තෙල් ද අවසානයේ වෙරළ කලාපය ආශ්‍රිත ජලය වෙත ගලා ඒම තුළින් අවධාරණය කරනුයේ එම සේවා ස්ථාන විසින් තෙල් බැහැර කිරීම් අවම කිරීමේ ක්‍රමවේදයක අවශ්‍යතාවයයි. වර්තමානයේ දී බොහෝ ස්ථානවල මෙවැනි උපාංග හෝ පහසුකම් නොමැති අතර එසේ පැවතිය ද බොහෝවිට ඒවා දෝෂ සහිත වේ. කොළඹ වරාය වෙත භාණ්ඩ පැටවීම හෝ ගොඩබෑම සඳහා පැමිණෙන නැව්වලින් අපද්‍රව්‍ය තෙල් බැහැර කිරීම සඳහා විශේෂ විධිවිධාන පවතී. තෙල් අපද්‍රව්‍ය රැස් කිරීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සමග පුද්ගලික සමාගම් 36ක් පමණ ලියාපදිංචි වී සිටින අතර එහිදී නැව්වලින් කෙළින්ම බවුසර් වෙත තෙල් අපද්‍රව්‍ය පොම්ප කෙරේ. කොළඹ වරායේ තෙල් අපද්‍රව්‍ය රැස් කිරීමේ නියුතු පිරිස් විසින් පසුගිය වසර 6ක් මුළුල්ලේ රැස්කර ඇති තෙල් අපද්‍රව්‍ය ප්‍රමාණය වගුව 4.8 මගින් පෙන්නුම් කෙරේ. එසේ වුව ද අවසාන වශයෙන් මෙම තෙල් මුදාහැරීම සම්බන්ධයෙන් කිසිදු නියාමන අධිකාරියක් විසින් අධීක්ෂණය කර ඇති බවට සාධක නොමැත.

**වගුව 4- 8: කොළඹ වරායෙහි රැස්කළ හෝ ඉවත්කළ අපද්‍රව්‍ය ප්‍රමාණය**

| වර්ෂය | ප්‍රමාණය |
|---|---|
| 2016 | $22871m^3$ |
| 2017 | $26382m^3$ |
| 2018 | $23835m^3$ |
| 2019 | $27145m^3$ |
| 2020 | $29598m^3$ |
| 2021 | $29889m^3$ |

මූලාශ්‍රය : සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය 2022 වසරේ නිකුත් කළ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ සේවා බලපත්‍ර මත පදනම් වේ.

ලංකා ධීවර නීතිගත සංස්ථාව විසින් හරිත වරාය සංකල්පය ප්‍රචලිත කළ ද, බහුතරයක් ධීවර වරායවල්වල ජලයේ තත්ත්වය හානිවී ඇති අතර අධික තෙල් දූෂණය, කාබනික දූෂණය හා මල අපද්‍රව්‍ය වලින් ඇතිවන දූෂණයට නිරාවරණය වී තිබේ. තව ද, දැවිතෙල්, ධීවර යාත්‍රා පතුල්වල රැඳෙන පල්වූ ජලය බැහැර කිරීම්, මසුන් පිරිසිදු කිරීමේ දී ඔවුන්ගෙන් ඉවතලන ද්‍රව්‍ය බැහැර කිරීම්, යාත්‍රාවලට තෙල් පිරවීමේ දී අහඹු ලෙස තෙල් ඉහිරුම් හා බෝට්ටු අලුත්වැඩියා කිරීමේ දී ඝන අපද්‍රව්‍ය බැහැර වීම ද දූෂණ මට්ටම ඉහළ යෑමට බලපා ඇති ප්‍රධාන මූලාශ්‍ර හා ක්‍රියාකාරකම් වේ (නිරෝෂා සහ පිරිස, 2013).

### 4.3.10 සමුද්‍රීය, බලශක්ති හා සංචාරක කේන්ද්‍රස්ථාන සංවර්ධනය කිරීම සහ ඒතුළින් දූෂණය කෙරෙහි ඇතිවිය හැකි තර්ජනය

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව, වෙරළ කලාපය තුළ ප්‍රධාන ආර්ථික කේන්ද්‍රස්ථාන තුනක්, එනම් සංචාරක, සමුද්‍රීය හා බලශක්ති කේන්ද්‍රස්ථාන ස්ථානගත විය යුතු ය. 2018 වර්ෂය දක්වා සංචාරකයින්ගේ පැමිණීම ඉහළ යෑමත් සමග සංචාරක ක්ෂේත්‍රයේ සැලකිය යුතු වර්ධනයක් සිදුවිය. එයින් අනතුරුව 2019 අප්‍රේල් මස සිදුවූ පාස්කු බෝම්බ ප්‍රහාරය සහ ඉන් අනතුරුව පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සංචාරක අංශය ප්‍රබල පසුබෑමකට ලක්විය (රූපය 4.1). ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2022-2025 දක්වා කාල සීමාව ඉලක්කකර ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රය නැවත යථා තත්ත්වයට පත්කිරීම හා පුළුල් කිරීම සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කර තිබේ. සමුද්‍රීය කේන්ද්‍රස්ථානයක් වශයෙන් අප රට සංවර්ධනය කිරීමට අදාළ කටයුතු ප්‍රධාන වශයෙන් සම්බන්ධ වනුයේ මහා පරිමාණ වශයෙන් වාණිජ වරාය හා ඊට සම්බන්ධිත පහසුකම් සංවර්ධනය කිරීම මගින් වේ. මීට අදාළව කොළඹ, හම්බන්තොට, ත්‍රිකුණාමලය හා ගාල්ල වැනි දැනට පවතින වාණිජ වරායන් සංවර්ධනය කෙරේ. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගාල්ල වරාය කලාපීය විනෝදාස්වාද හා වාණිජ වරායක් ලෙස වැඩිදියුණු කර සංවර්ධනය කිරීම සඳහා සැලසුම් සකස්කර තිබේ. මෙම සංවර්ධන කටයුතුවලින් වරායන් තුළ හා ආසන්න වෙරළ කලාපයන් කෙරෙහි ඇතිවිය හැකි වෙරළබඩ දූෂණ තත්ත්වය නොසලකා හැරිය නොහැකි ය. එබැවින්, සැලසුම් අවධියේ දී දූෂණය අවම කිරීමේ විධිමත් පියවර ඇතුළත් කිරීම අවශ්‍ය අතර, ඒ ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් ද පුළුල්ව අවධානය යොමුකළ යුතු ය.

රූපය 4 - 1: ශ්‍රී ලංකාවට පැමිණ ඇති සංචාරකයන් සංඛ්‍යාව (2001-2020)




*මූලාශ්‍රය : වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව 2020 ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

### 4.3.11 තෝරාගන්නා ලද වෙරළ තීරයන් හි වෙරළබඩ ජලයේ වර්තමාන තත්ත්වය

වෙරළබඩ ජලය සම්බන්ධ නිර්ණායකවලට අදාළව ස්ථානීය වශයෙන් නිශ්චිත වූ දත්ත අඛණ්ඩව නොපැවතිය ද, 2014 වර්ෂයේ දී වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදුකළ අධ්‍යයනයක් සඳහා ලංකා හයිඩ්‍රොලික් ආයතනය (LHI) විසින් විවිධ මූලාශ්‍රවලින් රැස්කරගත් දත්ත ආශ්‍රයෙන් නොරොච්චෝලේ සිට නිලාවේලි දක්වා නියැදි ස්ථාන 25ක ජලයේ තත්ත්වය නිර්ණය කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. එම නියැදි ස්ථාන පිළිබඳ විස්තරයක් වගුව 4.9 හි දැක්වේ.

වගුව 4 - 9 : නියැදි ස්ථාන පිළිබඳ විස්තරය

| *ස්ථානය* | *විස්තරය* |
|---|---|
| නොරොච්චෝලේ | ගල් අඟුරු බලාගාරයට ආසන්නව |
| හලාවත වෙරළ | ප්‍රසිද්ධ නාන ස්ථානයකි |
| අඹකඳවිල | ඉස්සන් අභිජනන ස්ථාන සඳහා ජලය ලබාගැනීම |
| මාරවිල | නාන ස්ථාන,සංචාරක කටයුතු,කර්මාන්ත, අභිජනන ස්ථාන |
| මීගමුව වෙරළ | නාන ස්ථානය,සංචාරක කටයුතු |
| කැළණි ගංමෝය | ගං මෝය |
| මෝදර | අප ජලය මුහුදට බැහැරවන ස්ථානය |
| කොළඹ | වාණිජ වරාය |
| වැල්ලවත්ත | අප ජලය මුහුදට බැහැරවන ස්ථානය |
| ගල්කිස්ස | නාන ස්ථානය,සංචාරක කටයුතු |
| වාද්දුව | නාන ස්ථානය,සංචාරක කටයුතු |
| කළුතර-මොරගල්ල | නාන ස්ථානය,සංචාරක කටයුතු |
| බේරුවල | නාන ස්ථානය,සංචාරක කටයුතු |
| බෙන්තොට | නාන ස්ථානය,සංචාරක කටයුතු |
| හික්කඩුව | නාන ස්ථානය,සංචාරක කටයුතු |
| ගාල්ල | වාණිජ වරාය |
| උණවටුන | නාන ස්ථානය,සංචාරක කටයුතු |
| කොග්ගල | කර්මාන්ත,සංචාරක කටයුතු |
| වැලිගම | සංචාරක කටයුතු, ධීවර කටයුතු |
| පොල්හේන | නාන ස්ථානය,සංචාරක කටයුතු |
| බටඅත | කර්මාන්ත |
| තංගල්ල | නාන ස්ථානය,සංචාරක කටයුතු |
| මිරිජ්ජවිල | කර්මාන්ත,සංචාරක කටයුතු |
| අරුගම්බේ | නාන ස්ථානය,සංචාරක කටයුතු |
| නිලාවේලි | නාන ස්ථානය,සංචාරක කටයුතු |

*මූලාශ්‍රය : වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව 2014*

ජලයේ තත්ත්වය පිළිබඳ දත්ත විශ්ලේෂණයේ දී, pH අගය, ද්‍රවණය වූ ඔක්සිජන් (DO),ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම (BOD), රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD), සම්පූර්ණ නයිට්‍රජන් (TN), මුළු බැක්ටීරියා (TC), මල අපද්‍රව්‍ය බැක්ටීරියා (FC) සහ තෙල් හා ග්‍රීස් වර්ග ආදී වශයෙන් වූ නිර්ණායක විශ්ලේෂණය කිරීම සඳහා අධ්‍යයන කණ්ඩායමේ අවධානය යොමුවිය. ඒ අනුව, pH මට්ටම 7.8 සිට 8.4 අතර දක්වා පරාසයක පැවතීමෙන් නියැදි ස්ථානවල pH මට්ටම ස්වාභාවික වෙරළබඩ ජලයේ ගුණාත්මක ලක්ෂණ පෙන්නුම් කරන බව අනාවරණය විය. කොළඹින් ලබාගත් නියැදි හැරුනවිට අනෙකුත් නියැදි ස්ථානවල ද්‍රවණය වූ ඔක්සිජන් (DO) මට්ටම සම්මත ප්‍රමිතියට අනුකූල මට්ටමක පැවතීමක් පෙන්නුම් කරන ලදී. ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම (BOD) සැලකීමේ දී, මෝදර,

වැල්ලවත්ත සහ ගාල්ල ස්ථානවල දී මධ්‍යම පරිසර අධිකාරිය මගින් ප්‍රකාශිත පාරිභෝජනය සඳහා නොවන ජලයේ ප්‍රමිතීන්ට පමණක් අනුකූල වූ අතර අනෙකුත් සියලුම නියැදි ස්ථානවල නෑම සඳහා සහ පාරිභෝජනය සඳහා නොවන ප්‍රමිතීන් දෙකටම අනුකූල නොවිණි. මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රකාශිත ප්‍රමිතින්ට අනුව, නෑම සඳහා නිර්දේශිත රසායනික ඔක්සිජන් ඉල්ලුම මට්ටම ලීටරයට මි.ග්‍රෑ20ට අඩුවිය යුතු ය. මෝදර හා කැළණි මුවදොර මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රකාශිත නෑම සඳහා නිර්දේශිත ප්‍රමිත සපුරාලූ අතර අනෙකුත් සියලුම ස්ථානවල COD අගය ප්‍රමිත දෙකම සමග අනුකූල නොවීය. පිළිගත හැකි පරාසය වනුයේ ලීටරයට මි.ග්‍රෑ. 2 mg සිට මි.ග්‍රෑ.6 දක්වාය. විශ්ලේෂණයට අනුව, කැළණි මුවදොර, මෝදර කොළඹ හා වැල්ලවත්ත ස්ථානවලදී මිනුම්ගත කළ සම්පූර්ණ නයිට්‍රජන් (TN) සම්බන්ධ අගය පිළිගත හැකි පරාසය තුළ නොපැවතිණි. මෙම තත්ත්වයට හේතුවිය හැකි වනුයේ පිරිපහදු නොකළ මල අපවහන මුදාහැරීම හා පොහොර ජලය සමග මිශ්‍රවීම විය හැකි ය. මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රකාශිත නෑම සඳහා නිර්දේශිත ප්‍රමිත අනුව මුළු බැක්ටීරියා (TC) සාන්ද්‍රණය 1000 MPN/100 ml මට්ටමට වඩා අඩුවිය යුතු අතර පාරිභෝජනය සඳහා නොවන භාවිතයන් සඳහා එම අගය 2000 MPN/100 mlට වඩා අඩුවිය යුතු ය. පාරිභෝජනය සඳහා නොවන ප්‍රමිතිය යටතේ මුළු බැක්ටීරියා (TC) සාන්ද්‍රණයේ අගය සියලුම නියැදි ස්ථානවල අදාළ සම්මත සීමාව තුළ හොඳින් පැවතිණි. නමුත් ගල්කිස්ස, කළුතර, උණවටුන, බෙන්තොට සහ පොල්හේන වැනි ප්‍රසිද්ධ නාන ස්ථානවල ජලය සෘජුව ගැටීම සඳහා ආරක්ෂාකාරී නොවන මට්ටමක පැවතිණි. මල අපද්‍රව්‍ය සාන්ද්‍රණය සම්බන්ධයෙන් විමසා බැලීමේ දී දියනෑම සඳහා තිබිය යුතු ප්‍රමිතිය වනුයේ 50 MPN/100mlට වඩා අඩු මට්ටමක් සහ පාරිභෝජනය නොවන භාවිත සඳහා 600MPN/100mlට වඩා අඩු මට්ටමක් වශයෙනි. විශ්ලේෂණය මගින් පෙන්වා දෙන ආකාරයට බේරුවල, මිරිජ්ජවිල සහ ගාල්ල යන නියැදි ස්ථාන හැර අනෙකුත් සියලුම ස්ථානයන්හි මල අපද්‍රව්‍ය සාන්ද්‍රණය නෑම සඳහා වූ සම්මත ප්‍රමිතියට වඩා ඉහළ අගයක් ගනී. තවද නොරොච්චෝල, හලාවත, මෝදර, වාද්දුව, බෙන්තොට,කොග්ගල, උණවටුන සහ වැලිගම යන නියැදි ස්ථානයන්හි මල අපද්‍රව්‍ය සාන්ද්‍රණ අගය පාරිභෝජනය සඳහා නොවන භාවිතයන් සඳහා වූ ප්‍රමිතීන් සපුරාලයි. සියලූ නියැදි ස්ථානයන්හි තෙල් සහ ග්‍රීස් ප්‍රමාණයන් මෝසම් කාලයේ දී වැඩි සාන්ද්‍රණයක් පෙන්වයි. කෙසේවුවත් එම ප්‍රමාණය ලීටරයට මි.ග්‍රෑ. 200ට අඩුව පැවැතිය යුතුය.

**4.4 සැලසුම්, ප්‍රතිපත්ති හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය**

වෙරළබඩ දූෂණය, වෙරළ කලාපයේ ප්‍රධානතම පාරිසරික ගැටලුවලින් එකක් වුව ද, 1990 පළමු වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම තුළ ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි. එසේ වුව ද, වැදගත්කම හා ප්‍රමුඛත්වය සලකා, 1997, 2004 වර්ෂවල සංශෝධිත වෙරළ කලාප කළමනාකරණ සැලසුම් හා 2018 වර්ෂයේ වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම තුළ අවධානය යොමුකර තිබුණි. වෙරළ කලාප කළමනාකරණ සැලසුම් හා වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම තුළින් හඳුන්වාදුන් ප්‍රතිපත්ති, ක්‍රමෝපාය හා ක්‍රියාමාර්ග හැරුන විට, වෙරළබඩ ජල දූෂණය ද ඇතුළුව දූෂණ පාලනය සඳහා සබැඳියාවක් දරන ක්‍රියාත්මක වෙන වෙනත් බොහෝ ප්‍රතිපත්ති, නීති හා වැඩසටහන් තිබේ. නිදසුනක් ලෙස, වෙරළ කලාපය තුළ සිදු කෙරෙන ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති (ධීවර කටයුතු හැරුන විට) පාරිසරික බලපෑම් තක්සේරුවට (EIA) අදාළ ක්‍රියාමාර්ගවලට යටත් වේ. 1988 අංක 56 දරන ජාතික පරිසර පනතේ ලැයිස්තුගත කර ඇති නිර්දේශිත ව්‍යාපෘති මීට ඇතුළත් වන අතර මෙහිදී වෙරළ කලාපය තුළ (ව්‍යාපෘති අනුමත කිරීමේ නියෝජිතායතනය) වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වන අතර වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වෙරළ කලාපය තුළ හඳුනාගන්නා වෙනත් ව්‍යාපෘති ද පාරිසරික බලපෑම් තක්සේරුවට (EIA) යටත් කිරීම සිදු කළ හැක.

අපද්‍රව්‍ය කළමනාකරණයේ නියැලීම සඳහා සියලුම පුරවැසියන් හා ආයතන නෛතික වශයෙන් වගකිවයුතු වීම, අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වගකිවයුතු වීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් පුරවැසියන්, ආයතන, අපද්‍රව්‍ය කළමනාකරුවන් සහ සේවා සැපයුම්කරුවන් අඛණ්ඩව දැනුවත් කිරීම, අපජලය පිරිපහදු කිරීම හා අවසන් වශයෙන් බැහැර කිරීම සඳහා පහසුකම් හා යටිතල පහසුකම් පැවතීම සහතික කිරීම, ජීවන චක්‍රය පුරා සම්පත් උපයෝජනයේ අගය රඳවා ගනිමින් අපද්‍රව්‍ය වශයෙන් අවසන් බැහැර කිරීම් අවම කිරීම, දැනට පවතින අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති/ භාවිතයන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වැඩිදියුණු කිරීම, යෝග්‍ය තාක්ෂණය හා භාවිතයන් සමග අපද්‍රව්‍ය වැළැක්වීම සහ/හෝ අවම කිරීම සඳහා නව ක්‍රමවේද ප්‍රවර්ධනය කිරීම, පවතින යෝග්‍ය පහසුකම්වල කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වැඩිදියුණු කිරීම, යෝග්‍ය නව්‍ය තාක්ෂණ හා හවුල්කාරිත්වයන් සමග නව වෙළඳපොළවල්වල ප්‍රවර්ධනය, මහජන සෞඛ්‍ය, පරිසරය, සහ පරිසර පද්ධති සඳහා අවධානම අඩු කිරීම, අපද්‍රව්‍ය හසුරුවාලන පිරිස්වල වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය වැඩිදියුණු කිරීම, අනුකූලතාවයෙන් ඔබ්බට ගොස් අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීමේදී ඵලදායි හවුල්කාරිත්වයන් වැඩිදියුණු කිරීම සඳහා වන අරමුණුවලින් යුක්තව 2020 වර්ෂයේ දී පරිසර අමාත්‍යාංශය විසින් ජාතික අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය හඳුන්වා දෙන ලදී.

වෙරළබඩ ජලය ආශ්‍රිතව කාර්මික දූෂණය යම් මට්ටමකට හෝ අවම කිරීම සඳහා පවතින වැදගත් මෙවලම් වනුයේ පාරිසරික බලපෑම් තක්සේරු (EIA/IEE) කාර්ය පටිපාටි ක්‍රියාත්මක කිරීම සහ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රමවේදය (EPL) වේ. 2000 නොවැම්බර් 22 දිනැති අංක 1159/22 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* යටතේ නියම කර ඇති ක්‍රියාකාරකම් සඳහා මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීම අනිවාර්ය වේ. මෙම බලපත්‍රය මධ්‍යම පරිසර අධිකාරිය, ආයෝජන මණ්ඩලය හෝ පළාත් පාලන ආයතනයක් වෙතින්

ලබාගත හැකි අතර වසර තුනක කාලසීමාවක් සඳහා වලංගු වේ. එසේ වුව ද, වෙරළබඩ ජල දූෂණය පාලනය කිරීම් බලාත්මක කිරීමේ පවතින අඩුපාඩු සහ බොහෝ කර්මාන්තශාලාවල දූෂණය වැළැක්වීම සඳහා පවතින දුර්වල තාක්ෂණයන් හේතුවෙන් කර්මාන්ත මූලාශ්‍රවලින් සිදුවන වෙරළබඩ ජල දූෂණය ප්‍රතිඵල වේ.

මධ්‍යම පරිසර අධිකාරිය, පළාත් පාලන ආයතන, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වැනි අනෙකුත් ආයතන විසින් පරිසර දූෂණ වැළැක්වීමේ කටයුතු ප්‍රමුඛව ක්‍රියාත්මක කළ ද, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ද වෙරළ කලාපය තුළ ජල දූෂණය පාලනය හෝ අවම කිරීම සඳහා වන විවිධ නිවැරදි කිරීමේ හා වැළැක්වීමේ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වූ කටයුතුවල වර්තමානයේ දී නියැලේ. අනෙකුත් ආයතන සහ නියෝජිතායතන සමග ඵලදායී සම්බන්ධීකරණයක් හා සහයෝගීතාවයක් සඳහා වන යාන්ත්‍රණ මෙම බොහෝ ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය කෙරේ. නිදසුනක් වශයෙන්, ජාතික මට්ටමේ දී ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ සඳහා මනා ගුණාත්මක ජලය හා ප්‍රමාණවත් සනීපාරක්ෂක කටයුතු සම්පාදනයෙහිලා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වගකිව යුතු ය. කොළඹ දිස්ත්‍රික්කයේ අඩු වරප්‍රසාද සහිත ජනාවාසවල ප්‍රමාණවත් නොවන සනීපාරක්ෂක තත්ත්වය සම්බන්ධිත ගැටලුව පිළිබඳව තවත් බොහෝ ආයතන ද කටයුතු කරනු ලැබේ.

වෙරළබඩ ජලයේ දූෂණය අවම කිරීම සඳහා ජලයේ ගුණාත්මකබව පරීක්ෂා කිරීම පූර්ව අවශ්‍යතාවයක් වුවද, මේ දක්වා වෙරළ කලාපයේ වෙරළාසන්න ජලය, කලපු හා මෝය, හා අභ්‍යන්තර ප්‍රදේශවල ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ නිරන්තර අධීක්ෂණය සඳහා නෛතික වගකීම පවරා ඇති තනි ආයතනයක් නොමැත. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත සමුද්‍ර ජලයේ දූෂණය පාලනය කිරීම සඳහා බලය පැවරී තිබුණ ද, ඊට අදාළ නීතිරීති ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වනුයේ වෙරළෙන් ඔබ්බට මුහුදු ප්‍රදේශයේ දී ය. ආයෝජන මණ්ඩලය, මධ්‍යම පරිසර අධිකාරිය, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වැනි ආයතන කිහිපයකට වෙරළ කලාපයේ ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා සහ සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් මුදාහැරෙන ද්‍රව්‍ය නියාමනය කිරීමේ බලය ඇත. මීට අමතරව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සංස්ථාව, කාර්මික තාක්ෂණික ආයතනය සහ විශ්වවිද්‍යාල සහ වෙනත් පර්යේෂණ ආයතන වැනි රේඛීය නියෝජිතායතන විසින් කලින් කලට වෙරළබඩ තත්ත්ව අධීක්ෂණ හා පර්යේෂණ කටයුතුවල නියැලේ.

වෙරළබඩ ජලයේ විවිධ භාවිතයන් සඳහා ශ්‍රී ලංකාව විසින් මේ දක්වා පරිසර ජල තත්ත්ව ප්‍රමිතීන් සකස් කර නොමැත. මධ්‍යම පරිසර අධිකාරිය විසින් වෙරළබඩ ජලයේ විවිධ භාවිතයන් සඳහා ප්‍රමිතීන් යෝජනා කර ඇති නමුත්, ඍතුමය බලපෑම් හේතුවෙන් ජල තත්ත්වයේ සිදුවන වෙනස්වීම සවිස්තරාත්මකව සමාලෝචනය කළ යුතු අතර ඒ සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළඹීමට පෙර ප්‍රමාණවත් පරිදි විශ්ලේෂණය කර බැලිය යුතු ය. අභ්‍යන්තර ජල ස්කන්ධ සඳහා වන ජල ප්‍රමිතීන් (වෙරළබඩ ජල සීමාව දක්වා විහිදෙන භූමියේ නිශ්චල හෝ ගලායන ජලය) 2019 නොවැම්බර් 05 දිනැති අංක 2148/20 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර තිබේ. කාර්මික කලාප වැඩි වශයෙන් ස්ථාපනය කිරීම සඳහා වන රජයේ තීරණය ක්‍රියාත්මක කිරීමේදී දූෂණ තත්ත්වයන් අවම කිරීම සඳහා පහසුකම් සැපයීම වනාහී වෙරළබඩ ජලයේ දූෂණ තත්ත්ව අඩු කිරීමේ ප්‍රධාන පියවරකි. ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නියාමන ද සමග රජය විසින් ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමෝපායක් ද සකස් කර තිබේ. 1996 වර්ෂයේ දී අන්තරාය සහිත ද්‍රව්‍ය රැස්කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය හා බැහැර කිරීම සඳහා රෙගුලාසි ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත්කර තිබේ. පරිසර අමාත්‍යාංශය විසින් 2008 අංක 1 දරන ජාතික පාරිසරික (ආරක්ෂණ හා තත්ත්ව) නියෝග මගින් බලපත්‍ර යෝජනා ක්‍රමයක් හරහා අන්තරාය අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් හඳුන්වා දී තිබේ. තව ද, කෘෂි රසායන ද්‍රව්‍යවලින් ඇතිවන දූෂණය ඇතුළුව නිශ්චිත ස්ථානීය ප්‍රභවයක් නොමැති මූලාශ්‍ර සම්බන්ධයෙන් කටයුතු කිරීම අසීරු වනුයේ එවැනි ගැටලු විසඳීම සඳහා නිශ්චිත ප්‍රතිපත්ති හා ඵලදායීව ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයක් නොමැති වීම යි.

**4.5 වෙරළබඩ දූෂණය කළමනාකරණය සඳහා අනාගත මඟ පෙන්වීම**

වෙරළ කලාපය සඳහා අදාළවන ආර්ථික සංවර්ධනයේ තිරසරබව සහතික කිරීම සඳහා, ප්‍රමාණවත් ක්‍රමෝපාය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම මගින් වෙරළබඩ දූෂණය කළමනාකරණය කිරීම අවශ්‍ය වේ. අනුකූලතාවය කේන්ද්‍රකරගත් නියාමන පියවර හැරුන විට දී, සමාජීය දැනුවත්බව ඇතිකිරීම, යටිතල පහසුකම් සංවර්ධනය, පර්යේෂණ සිදු කිරීම, නිශ්චිත ස්ථානීය ප්‍රභවය සහිත හා රහිත මූලාශ්‍ර අධීක්ෂණය කිරීම මගින් නියාමනය සහ ජල භාවිත කලාපීයකරණ වශයෙන් වූ යෝජනා ක්‍රම ඉලක්ක කරගත් සවිස්තරාත්මක හා ඵලදායී වැඩසටහන් ක්‍රියාවට නැංවීම ද අවශ්‍ය කෙරේ.

ජල ප්‍රදේශ, වෙරළ හා වෙරළබඩ භූමි ඇතුළත් වෙරළබඩ දූෂණ ගැටලුව වනාහී වෙරළබඩ සම්පත් කළමනාකරණය කිරීමේ දී විසඳිය යුතු ප්‍රධාන ගැටලුවක් වුව ද,වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට මෙම ගැටලුව තනිව විසඳිය හැකි නොවේ. වෙරළබඩ දූෂණය පාලනය කිරීමේ දී යම් භූමිකාවක් ඉටු කරන ආයතන හා නියෝජිතායතන විශාල සංඛ්‍යාව සැළකිල්ලට ගැනීමේ දී, සහයෝගිතාවය මත පදනම් වූ ඒකාබද්ධ වෙරළ කලාප කළමනාකරණයක් අවශ්‍ය වේ. පළාත් නියෝජිතායතන හා

පළාත් පාලන ආයතන විසින් වෙරළබඩ ජල ස්කන්ධ අධීක්ෂණය කිරීම හා ස්වකීය බලාධිකාරිය තුළ අනුකූලතාවයන් පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් ඵලදායි භූමිකාවක් ඉටුකිරීම සඳහා එම ආයතනවල හැකියාවන් සැලකිය යුතු මට්ටමකින් ශක්තිමත් කිරීම ද මෙහි දී අවශ්‍ය කෙරේ. නිශ්චිතව නිර්ණය කළ ස්ථානවල දී ස්ථානීය හා කාලානුරූප වශයෙන් ජලයේ තත්ත්වය අධීක්ෂණය කිරීම් සඳහා සෑම පළාත් නියෝජිතායතනය/පළාත් පාලන ආයතනයක් විසින් වෙරළබඩ දූෂණය අධීක්ෂණය කිරීම සඳහා අයවැය ප්‍රතිපාදන වෙන්කිරීම අවශ්‍ය කෙරේ. වෙරළබඩ ජල සම්පත් ශ්‍රේණිගත කිරීම සඳහා ජලයේ තත්ත්වය නිර්ණය කිරීමේ යෝග්‍ය දර්ශක ද සකස් කළ යුතු අතර පහළ ගුණාත්මක බවකින් යුතු වෙරළබඩ ජල ස්කන්ධ පිරිසිදු තත්ත්වයකට ගෙන ඒමට සුදුසු මැදිහත්වීම් ද අවශ්‍ය කෙරේ.

ප්‍රධාන දූෂණ ප්‍රභවයන් පාලනය කිරීම සඳහා නීති හා රෙගුලාසි මෙන්ම දැනුවත්භාවය ඇති කිරීම් ද සවිමත් කළ යුතු අතර එමගින් වෙරළබඩ ජලය වෙත ඇදී යන දූෂක ද්‍රව්‍යය ප්‍රමාණය අඩුකර ගත හැකිවනු ඇත. වෙරළබඩ ජලයේ සිදුවන ප්‍රධාන දූෂණ සංසිද්ධීන් සිදුවන වාර ගණන හා ඒවායේ ප්‍රබලතාවය අවම කිරීම සඳහා වඩාත් දැඩි බලාත්මක කිරීමේ යාන්ත්‍රණ ක්‍රියාත්මකව පැවතිය යුතු ය. මීට අමතරව, වෙරළ කලාපය තුළ පුළුල් වෙමින් පවතින සංවේදී ආර්ථික ක්‍රියාකාරකම්වලට අනුකූල වන්නා වූ වෙරළබඩ ජලය කලාපීයකරණ කිරීමේ යෝජනා ක්‍රම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සුපරීක්ෂාකාරී අවධානය යොමුව පැවතිය යුතු ය.

### 4.5.1. වෙරළබඩ ජලය භාවිතා කිරීම කලාපීයකරණය කිරීමේ අවශ්‍යතාවය සහ විශ්ලේෂණය කළ නිර්ණායක

වෙරළබඩ ජල දූෂණයට අදාළ ගැටලු අවම කිරීම සඳහා සහ වෙරළ කලාපයේ ආර්ථික ක්‍රියාකාරකම්වල තිරසරභාවය සුරක්ෂිත කිරීම සඳහා මනා සමාජ-ආර්ථික හා පාරිසරික තොරතුරු මත පදනම්ව ජල භාවිතය කලාපීයකරණය හඳුන්වාදිය යුතු ය. යම් ප්‍රදේශයක පාරිසරික බාධාවන් සහ සමාජ-ආර්ථික අරමුණු සැලකිල්ලට ගනිමින් එම ප්‍රදේශයේ සංවර්ධනය සඳහා වඩාත් හිතකර හා වාසිදායක වන්නා වූ සංවර්ධන/භාවිත ක්‍රමවේදය සම්බන්ධයෙන් මඟ පෙන්වීම සහ මෙහෙයවීම සඳහා ඉඩම් සහ ජල භාවිතය සැලසුම් කිරීමේ සහ නියාමනය කිරීමේ මෙවලමක් ලෙස කලාපකරණය බහුල වශයෙන් භාවිතා කරනු ලැබේ. පරිසරය මත ඇතිවන සෘණාත්මක බලපෑම් අවම වන පරිද්දෙන් හා එමගින් ප්‍රතිලාභ උපරිමයෙන් ලබාගැනීමේ අරමුණින් විවිධ සංවර්ධන ක්‍රියාකාරකම් තිරසර මට්ටමකින් පවත්වා ගැනීම සහතික කිරීමක් ජල කලාපීයකරණ යෝජනා ක්‍රමයකින් සිදුකළ හැකි ය. මීට අමතරව, වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය කරමින් එකිනෙකට අනුකූල නොවන්නා වූ භාවිතයන් වෙන් කිරීම සහ භාවිතාකරන පිරිස් අතර ගැටුම් අවම කිරීම සඳහා ද මෙය යොදා ගත හැකි වේ.

**ජල කලාපීයකරණ යෝජනා ක්‍රමයක් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යතා**

(i) නෛතික බලය සහ ප්‍රමාණවත් නීතිමය ප්‍රතිපාදන පැවතීම
(ii) ඉලක්කගත පරිසරය සම්බන්ධයෙන් මනා පාරිසරික හා සමාජ-ආර්ථික තොරතුරු
(iii) බලාත්මක කිරීමේදී අදාළ ප්‍රාදේශික නියෝජනය සහ සහභාගීත්වය
(iv) හවුල්කාරීත්වය සහ පොදු යහපාලනය
(v) තිරසර මූල්‍ය යාන්ත්‍රණයක් සහතික කිරීම
(vi) කලාපීයකරණ සැලසුම් ක්‍රියාවලිය සඳහා සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය
(vii) සැලසුම්කරණ ක්‍රියවලියේ මුල් අවස්ථාවේදී ම සමුද්‍රීය හා වෙරළබඩ කලාපවල බහුවිධ භාවිතයන් හඳුනාගැනීම
(viii) මෙම කලාප සම්බන්ධයෙන් නීති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන දැනුවත් කිරීම

වෙරළබඩ ජල ස්කන්ධයන් හි සංවේදී ස්ථානවල දූෂණය වැළැක්වීම සඳහා, වගුව 4.10 හි දක්වා ඇති පරිදි එය විවිධ කලාපවලට වර්ගීකරණය කිරීම අවශ්‍ය වේ.

වෙරළ කලාපය තුළ වර්තමාන ආර්ථික සංවර්ධන කටයුතුවලින් එල්ලවන පීඩනය හා සීඝ්‍ර ජනගහන වර්ධන වේගය සැළකිල්ලට ගෙන නුදුරු අනාගතයේ දී වෙරළබඩ ජල කලාපීයකරණ යෝජනා ක්‍රමය ක්‍රියාවට නැංවීම සඳහා සුපරීක්ෂාකාරීව අවධානය යොමුකළ යුතු ය. එබැවින්, වෙරළබඩ ජල කලාපීයකරණ යෝජනා ක්‍රමයක් සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා මෙම සැලසුම තුළින් ප්‍රයත්න දරනු ලැබේ. එම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන තුරු, එකී යෝජනා ක්‍රමයෙන් අපේක්ෂිත ආකාරයේ සමාන අරමුණු යම්කිසි මට්ටමකට ඉටුකරගැනීම සඳහා 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත ඔස්සේ "බලපෑමට ලක්වූ ප්‍රදේශ" සහ "සංරක්ෂණ ප්‍රදේශ" සඳහා හඳුන්වා දුන් නෛතික විධිවිධාන උපයෝගී කරගත යුතු ය.

වගුව 4 - 10 : වෙරළබඩ ජල භාවිතය කලාපීයකරණය සඳහා යෝජිත වර්ගීකරණය

| *විස්තරය* | *භාවිතය* |
|---|---|
| විනෝදාස්වාදය | 1. ජලය සමග ස්පර්ශය සිදුවන විනෝදාස්වාද කටයුතු<br>2. ජලය සමග ස්පර්ශය සිදු නොවන විනෝදාස්වාද කටයුතු |
| පරිසර සංරක්ෂණය | 1. පරිසර පද්ධති සංරක්ෂණය<br>2. විද්‍යාව හා අධ්‍යාපන කටයුතු<br>3. සෞන්දර්යාත්මක වින්දනය |
| කවච සහිත මත්ස්‍යයින් හා සම්බන්ධිත ධීවර කටයුතු | 1. කවච සහිත මත්ස්‍යයින්ට අදාළ ධීවර කටයුතු (මොලුස්කා)<br>2. ලවණ ජලය ආශ්‍රිත කවච සහිත මත්ස්‍ය ජලජීවී වගාව (මොලුස්කා)<br>3. විසිතුරු මසුන් නිෂ්පාදනය |
| වරල් සහිත මත්ස්‍යයින් හා සම්බන්ධිත ධීවර කටයුතු | 1. වරල් සහිත මත්ස්‍යයින්ට අදාළ ධීවර කටයුතු<br>2. වරල් සහිත මත්ස්‍යයින්ට අදාළ ජලජීවී වගාව<br>3. මොලුස්කා වංශයට අයිති නොවන අපෘෂ්ඨවංශී මසුන් හා සම්බන්ධිත ධීවර කටයුතු<br>4. මොලුස්කා වංශයට අයිති නොවන අපෘෂ්ඨවංශී මසුන් හා සම්බන්ධිත ජලජීවී වගා කටයුතු |
| පාරිභෝගික නොවන භාවිතයන් | 1. ජලය සමග ස්පර්ශය සිදු නොවන විනෝදාස්වාද කටයුතු<br>2. නාවික කටයුතු<br>3. වරාය කටයුතු<br>4. වැලි කැණීම්<br>5. ඛනිජ නිස්සාරණය |
| පාරිභෝගික භාවිතයන් | 1. පානය සඳහා (ලවණහරණයෙන් පසුව)<br>2. ගෘහස්ත කාර්යයන් සඳහා |

**4.6 කළමනාකරණ අරමුණු, ප්‍රතිපත්ති, ක්‍රමෝපාය හා ක්‍රියාමාර්ග**

**අරමුණ** 1

සංවර්ධන කටයුතු මගින් වෙරළබඩ සහ සමුද්‍රීය ජලය වෙත බැහැර කෙරෙන පිරිපහදු නොකළ හෝ/සහ අර්ධ වශයෙන් පිරිපහදු කළ අපද්‍රව්‍ය සම්බන්ධයෙන් පනවා ඇති රෙගුලාසි/ මාර්ගෝපදේශවලට අනුකූලව නිශ්චිත භාවිතයන් සඳහා පිළිගත හැකි මට්ටමින් ජලයේ ගුණාත්මකබව පවත්වා ගැනීම.

**ප්‍රතිපත්තිය** 1.1

මධ්‍යම පරිසර අධිකාරියේ විමෝචන ප්‍රමිත හෝ ජාතික පාරිසරික (ආරක්ෂණ හා තත්ත්ව) නියෝග මගින් ප්‍රකාශිත ජලයේ ගුණාත්මක තත්ත්වයට අනුකූලව දැනට කෙරීගෙන යන සියලුම සංවර්ධන කාර්යයන් කළමනාකරණය කරනු ලැබේ.

**ක්‍රමෝපාය 1.1.1**

වෙරළබඩ ජලයේ තත්ත්වය පිළිබඳව නියමිත කාලාන්තරවල සිදුකරන අධීක්ෂණ තුළින් වෙරළ කලාපයේ දැනට කෙරීගෙන යන සියලුම සංවර්ධන කාර්යයන් මධ්‍යම පරිසර අධිකාරියේ අපසන්දන විමෝචන ප්‍රමිතවලට අනුකූලබවට සහතික කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. වෙරළබඩ පරිසරයේ ජලයේ ගුණාත්මකබව බව පරීක්ෂා කරමින් ඉහළ මට්ටමින් දූෂණ තත්ත්ව ඇතිවීමේ සිද්ධි හඳුනාගැනීමට සහ දූෂණයට හේතුවන සංවර්ධන ක්‍රියාකාරකම් හඳුනාගැනීම සඳහා දැනට ක්‍රියාත්මක ජලයේ ගුණාත්මක තත්ත්වය අධීක්ෂණය කිරීමේ වැඩසටහන් පුළුල් කිරීම, සවිමත් කිරීම හා අඛණ්ඩව පවත්වා ගැනීම.
2. අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධීක්ෂණ අධ්‍යයන තුළින් අනාවරණය වන කරුණු අදාළ නියාමන ආයතන වෙත යොමු කිරීම.
3. වෙරළ කලාපය තුළ පහළ සහ ඉහළ මට්ටමේ දූෂණ තත්ත්වයන් ඇතිකරන සංවර්ධන ක්‍රියාකාරකම් හඳුනාගැනීම සහ මධ්‍යම පරිසර අධිකාරිය සමග සහයෝගීතාවයෙන් දත්ත පද්ධතියක් සකස් කිරීම.
4. වෙරළ කලාපය සහ වෙරළබඩ ජලය දූෂණය වීම සඳහා ප්‍රවණතාවයක් ඇති සංවර්ධන කාර්යයන් මධ්‍යම පරිසර අධිකාරියේ අපසන්දන බැහැර කිරීමේ ප්‍රමිතවලට අනුකූල බවට සහතික කිරීම සඳහා අවශ්‍ය සහ යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
5. අපසන්දන බැහැර කිරීමේ ප්‍රමිත නොමැති සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අදාළ අධිකාරීන් සමග සහයෝගීතාවයෙන් අපසන්දන බැහැර කිරීමේ ප්‍රමිත සම්පාදනය කිරීම සඳහා කටයුතු කිරීම (උදා. ජලජීවී වගා, ලවණහරණ කර්මාන්තවලින් බැහැර කරන ජලය)

**ප්‍රතිපත්තිය 1.2**

වෙරළ කලාපයේ ජලයේ ගුණාත්මකබව හායනය නොවන බව සහතික කරගැනීම සඳහා අධික දූෂණයක් සිදුකරන කර්මාන්ත පරීක්ෂා කිරීම.

**ක්‍රමෝපාය 1.2.1**

අධික දූෂණයක් සිදුකරන කර්මාන්ත හඳුනාගැනීම සහ වෙරළ කලාපයේ ජලයේ ගුණාත්මකබව හායනයට ලක්කරන අපසන්දන විමෝචනය පාලනය කිරීමේ තාක්ෂණය වෙත ප්‍රවේශවීම සඳහා එම කර්මාන්තවලට පහසුකම් සැලසීම සහ එවැනි කර්මාන්ත පරීක්ෂා කිරීම සඳහා වගකීම දරන අදාළ අධිකාරීන්ට නියමිත කාලාන්තරවල පරීක්ෂණ කාර්යය සිදුකිරීම දිරිමත් කිරීම හා සහාය ලබාදීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. වෙරළ කලාපයේ නියමිත කාලාන්තර තුළ සිදුකරන අධීක්ෂණ ඔස්සේ අධික දූෂණයක් සිදුකරන කර්මාන්ත පිළිබඳ අවශ්‍ය තොරතුරු ලබාදීමෙන් අදාළ අධිකාරීන් හා පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය.
2. වෙරළ කලාපය වෙත බලපෑමක් ඇතිකරන කර්මාන්ත සඳහා දූෂණය අවම කිරීමේ තාක්ෂණ සැපයුම්කරුවන් පිළිබඳව හා පිරිසිදු නිෂ්පාදන තාක්ෂණයන් පිළිබඳ තොරතුරු වෙත ප්‍රවේශවීම සඳහා පහසුකම් සැලසීම.
3. දූෂණය අවම කිරීමේ වඩාත් හොඳ තාක්ෂණයන් ලබාගැනීම සඳහා කර්මාන්ත වෙත ලබාදිය හැකි මූල්‍ය සහායන් සඳහා අදාළ නියෝජිතායතනවලට සහාය දීම.
4. දූෂණ තත්ත්වවලින් තොර වෙරළ කලාපයක් පවත්වා ගැනීමේ වැදගත්කම සම්බන්ධයෙන් අධික දූෂණයක් සිදුකරන කර්මාන්ත අතර දැනුවත්බව ඇතිකිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**ප්‍රතිපත්තිය 1.3**

පාරිසරික සංවේදී ප්‍රදේශ/සංරක්ෂිත ප්‍රදේශ වශයෙන් නම්කර ඇති ප්‍රදේශවලට අපසන්දන/ අපජලය බැහැර විය හැකි සංවර්ධන ක්‍රියාකාරකම් (ජලයේ ගුණාත්මක බව සම්බන්ධිත විශේෂ කොන්දේසිවලට දැඩි ලෙස අනුගතව,පමණක්) ක්‍රියාත්මක කිරීම මගින් කළමනාකරණය කරනු ලැබේ.

**ක්‍රමෝපාය 1.3.1**

විවිධ වූ නිශ්චිත භාවිතයන් සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව/මධ්‍යම පරිසර අධිකාරිය විසින් පිළියෙළ කළ මාර්ගෝපදේශවල වෙරළබඩ අවට ජලයේ ගුණාත්මකභාවයට අදාළව දක්වා ඇති ප්‍රමිති/නිර්ණායකවල උපරිම/අවම සීමාවන් ඉක්මවා නොයන පරිදි අදාළ ස්ථානවල නව සංවර්ධන කාර්යයන් සඳහා ඉඩදිය හැකි ද යන්න නිර්ණය කිරීම සඳහා වෙරළ කලාපයේ තෝරාගත් ස්ථානවල නිශ්චිත කාලාන්තර තුළ සිදුකරන අධීක්ෂණ දියත් කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. වෙරළ කලාපයේ සුවිශේෂී ආර්ථික/පාරිසරික වැදගත්කමක් ඇති ස්ථාන තෝරා ගැනීම සහ ඒ සෑම ස්ථානයක් සඳහාම ස්ථානීය හා කාලානුරූප ආකාරයෙන් ජල තත්ත්වය අධීක්ෂණය කර අවට ජලයේ ගුණාත්මකබව පිළිබඳ සහතික කිරීම.

   අනෙකුත් අදාළ අධිකාරීන්/පාර්ශවකරුවන් සමග සාකච්ඡා කර සංරක්ෂිත ප්‍රදේශ හා බලපෑමට ලක් වූ ප්‍රදේශ වශයෙන් 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතේ විවිධිධාන යටතේ ප්‍රකාශයට පත්කිරීමට ඇති ප්‍රදේශවල විභව්‍ය නිශ්චිත භාවිතය/භාවිතයන් හඳුනාගැනීම සහ අනෙකුත් භාවිතයන්/සංවර්ධන කාර්යයන් පාලනය සඳහා රෙගුලාසි සෑදීම.

2. යම් ස්ථානයක නිශ්චය කරන ලද භාවිතය/භාවිතයන් සහ අවට ජලයේ ගුණාත්මකබව මත පදනම්ව, නව සංවර්ධන කටයුතු සඳහා අවසරදිය හැකි ස්ථාන හඳුනාගැනීම.

3. වෙරළ කලාපයේ අවට ජලයේ ගුණාත්මක තත්ත්වය නිශ්චිත භාවිතය/භාවිතයන් සඳහා නොගැලපෙන අවදානම් ස්ථාන/ සංරක්ෂිත ස්ථානවලට බලපෑමක් ඇතිවීමේ සම්භාවිතාවයක් සහිත දූෂණ ප්‍රභව හඳුනාගැනීම සඳහා අධ්‍යයනයක් කිරීම සහ වැඩිදුර සංවර්ධන කාර්යයන් සිදුකළ හැකි පරිදි දූෂණය අවම කිරීම සඳහා යෝග්‍ය ක්‍රමෝපායන් යෝජනා කිරීම.

**අරමුණ 2**

දූෂණය ඇතිකරන ප්‍රභවයන් කළමනාකරණය කිරීමෙන් වෙරළ කලාපයේ වෙරළබඩ හා සමුද්‍රීය ජලයේ ගුණාත්මකබව වැඩිදියුණු කෙරේ.

**ප්‍රතිපත්තිය 2.1**

වෙරළ කලාපයේ ජලයේ ගුණාත්මකබව කෙරෙහි හානිදායක අන්දමින් බලපෑම වැළැක්වෙන පරිද්දෙන් වෙරළ කලාපය තුළට සෘජුවම බැහැර කරන හෝ වෙනත් ස්ථානයකට බැහැර කරන නමුත් එහි බලපෑමක් වෙරළ කලාපය තුළ ඇතිවන ඕනෑම ආකාරයක අපද්‍රව්‍ය හෝ ආගන්තුක ද්‍රව්‍ය බැහැර කිරීම කළමනාකරණය කෙරේ.

**ක්‍රමෝපාය 2.1.1**

වෙරළ කලාපය තුළ ජල දූෂණයේ අහිතකර බලපෑම් අවම කිරීම සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ සැලැසුම් සකස් කිරීම සඳහා අදාළ අධිකාරීන් දිරිමත් කිරීම සහ ඒ වෙනුවෙන් යෙදවීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. පළාත් පාලන ආයතන විසින් වෙරළ කලාපය තුළ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම පාලනය කිරීම සඳහා යෝග්‍ය මට්ටම්වලදී (ප්‍රාදේශීය/කලාපීය/ජාතික) සැලසුම් සකස් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
2. ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම් පිළිබඳ සැලසුම් කඩිනමින් අවශ්‍ය කෙරෙන නාගරික මධ්‍යස්ථාන, කර්මාන්ත, වෙරළබඩ සංචාරක මධ්‍යස්ථාන, ධීවර වරාය හා ඝන අපද්‍රව්‍ය බැහැර කරන අනෙකුත් ප්‍රදේශ හඳුනාගැනීම.
3. වෙරළ කලාපය තුළ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථාන ප්‍රතිස්ථානගත කිරීම සඳහා විකල්ප, පාරිසරික අවදානම අඩු ස්ථාන හඳුනාගැනීම සඳහා පළාත් පාලන ආයතන වෙත සහාය ලබාදීම.
4. වෙරළ කලාපය තුළ පිහිටි ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම මගින් බලපෑමට ලක්වී ඇති ස්ථානවල පරිසර හායනය අධීක්ෂණය කිරීම.
5. කොම්පෝස්ට් නිෂ්පාදනය, ජීව වායු ජනනය වැනි ආකාරවල ව්‍යාපෘති හරහා පරිසරයට හිතකර ආකාරයෙන් අපද්‍රව්‍ය අවම කිරීමේ ක්‍රම ( වෙරළ කලාපය තුළ ඝන අපද්‍රව්‍ය හානිකර අයුරින් බැහැර කිරීමට විකල්පයක් වශයෙන්) ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ පළාත් පාලන ආයතන දිරිමත් කිරීම හා සහාය ලබාදීම.
6. නම්කර ඇති "සංරක්ෂිත ප්‍රදේශ","බලපෑමට ලක්වූ ප්‍රදේශ"සහ ප්‍රකාශයට පත්කර ඇති "විශේෂ කළමනාකරණ ප්‍රදේශ" තුළට ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම අවම කිරීම සඳහා රෙගුලාසි සකස් කිරීම.

**ප්‍රතිපත්තිය 2.2**

පළාත් පාලන ආයතන හා අනෙකුත් නියෝජිතායතන සමග සහයෝගීතාවයෙන් වෙරළ කලාපය තුළ මල/අසූචි මගින් සිදුවන වෙරළබඩ හා සමුද්‍රීය ජල දූෂණය කළමනාකරණය කරනු ලැබේ.

**ක්‍රමෝපාය 2.2.1**

නියම කරන ලද භාවිතයන් සඳහා නිශ්චිත කර ඇති මට්ටම් ඉක්මවා යන පරිදි මල/අසූචි මගින් සිදුවන දූෂණය සිදුවී ඇති වෙරළ කලාපයේ වෙරළබඩ ජල/ස්ථාන හඳුනාගැනීම සහ එම ගැටලුව පළාත් පාලන ආයතන සමග සහයෝගීතාවයෙන් විසඳා ගැනීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. තෝරාගැනීමේ නිර්ණායක භාවිතා කරමින් වෙරළ කලාපය තුළ මල/අසූචි මගින් සිදුවන දූෂණය අවම කළ යුතු අවදානම් ස්ථාන තීරණය කිරීම.
2. ස්පර්ශය වැනි දෑ සිදුවන විවිධ නියම කරන ලද භාවිතයන් සඳහා බහුල වශයෙන් යොදාගන්නා එවැනි ස්ථාන අධීක්ෂණය කිරීම.
3. මෙම ගැටලුව හා එම ස්ථාන පිළිබඳව පළාත් පාලන ආයතන දැනුවත් කිරීම හා මල/අසූචි ආශ්‍රිතව සිදුවන දූෂණය අවම කිරීමට සහාය ලබාදීම.
4. වෙරළ කලාපයේ අදාළ ස්ථානයන්හි ජලයේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් සිදුකරන අධ්‍යයනයන්ගේ ප්‍රතිඵල අදාළ පරිද්දෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, හෝටල්කරුවන් හා සිවිල් සංගම් වෙත ලබාදීම තුළින් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා ඔවුන්ගේ සහාය ද ලබා ගැනීම.

**ප්‍රතිපත්තිය 2.3**

වෙරළ සම්පත් හායනයවීම අවම කිරීම සඳහා වෙරළ කලාපය තුළ තෙල් ඉහිරී යෑම් කළමනාකරණය කරනු ලැබේ.

**ක්‍රමෝපාය 2.3.1**

වෙරළ කලාපය තුළට තෙල් බැහැර වීමේ ප්‍රධාන මූලාශ්‍ර හඳුනාගැනීම සහ අදාළ ආයතන සමග සහයෝගීතාවයෙන් ප්‍රතිකර්ම/ වැළැක්වීමේ ක්‍රියාමාර්ග සකස් කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. වෙරළ කලාපය වෙත තෙල් බැහැර කිරීමේ මූලාශ්‍ර හඳුනාගැනීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සමග සම්බන්ධීකරණය කිරීම.
2. විශේෂයෙන් වරාය හා විශේෂ කළමනාකරණ ප්‍රදේශ ඇතුළුව, වෙරළ කලාපය තුළට තෙල් බැහැර වීම අවම කිරීම හෝ වළකා ගැනීම සඳහා අදාළ ආයතන සමග වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම
3. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් හරිත වරාය සංකල්පය ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය සඳහා සහාය ලබාදීම.
4. තෙල් මගින් සිදුවන දූෂණය අවම කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සමග දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

**ප්‍රතිපත්තිය 2.4**

වෙරළ කලාපය තුළ වෙරළබඩ හා සමුද්‍රීය ජලය ලවණීකරණයවීමේ ක්‍රියාවලිය අවට ජලයේ ගුණාත්මකභාවයට අහිතකර බලපෑම් ඇති නොවන පරිදි කළමනාකරණය කරනු ලැබේ.

**ක්‍රමෝපාය 2.4.1**

නයිට්‍රේට් දූෂණය සිදුකරන ප්‍රධාන මූලාශ්‍ර සහ ඉහළ ලවණීකරණයට හේතුවන සාධක හඳුනාගැනීම හා එය වැළැක්වීමේ සාමූහික ක්‍රියාමාර්ග දියත් කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. අරමුණුගත නිර්ණායක පදනම්කරගෙන ඉහළ නයිට්‍රේට් දූෂණය සහ ලවණීකරණය පැවතිය හැකි ප්‍රදේශ හඳුනාගැනීම.
2. බලපෑමට හසුවී ඇති ස්ථාන අධීක්ෂණය කිරීම හා ඉහත සඳහන් කළ දූෂණය අවම කිරීම සඳහා අදාළ ආයතන සමග සහයෝගීතාවයෙන් කටයුතු කිරීම
3. ගැටලුව සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන දැනුවත් කිරීම සහ ඉහළ දූෂණයක් පවතින බවට හඳුනාගත් ස්ථාන, ඉහළ ආර්ථික වටිනාකමක් සහිත ස්ථාන, වැදගත් පරිසර පද්ධති පවතින ස්ථාන, ස්වාභාවික සුන්දරත්වය ඇති ස්ථාන හෝ පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතිකමය වටිනාකමක් ඇති ස්ථානවල මල/අසූචි මගින් සිදුවන දූෂණය අඩු කිරීමට සහාය වීම.

**අරමුණ 3**

වෙරළබඩ කලාපයේ වෙරළබඩ හා සමුද්‍රීය ජලය වෙත ඇතුළුවන දූෂක ප්‍රමාණය නියමිත කාලාන්තර තුළ අධීක්ෂණය, පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාමාර්ග මගින් ඇස්තමේන්තු කරනු ලැබේ.

**ප්‍රතිපත්තිය 3.1**

වෙරළ කලාපයට ඇතුළු වන ප්‍රධාන මතුපිට ජල ස්කන්ධවල පවතින දූෂක ප්‍රමාණ හඳුනාගැනීම හා අදාළ නියෝජිතායතන සමග සහයෝගීතාවයෙන් ජලයේ ගුණාත්මකබව වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම.

**ක්‍රමෝපාය 3.1.1**

වෙරළ කලාපයට ඇතුළු වන ප්‍රධාන මතුපිට ජල ස්කන්ධවල පවතින දූෂක ප්‍රමාණ හඳුනාගැනීම හා අදාළ නියෝජිතායතන සමග සහයෝගීතාවයෙන් ජලයේ ගුණාත්මකබව වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. වෙරළබඩ හා සමුද්‍රීය ජලය වෙත දූෂක රැගෙන එන මතුපිට ජල ස්කන්ධ හඳුනාගැනීම සහ වියළි හා තෙත් කාලගුණික සමයන් තුළ ප්‍රවාහයේ දූෂක ප්‍රමාණ ඇස්තමේන්තු කිරීම.
2. ඉහළ දූෂක ප්‍රමාණයන් අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීමට හැකිවෙන පරිදි අවශ්‍ය තොරතුරු ලබාදීම ඔස්සේ පළාත් පාලන ආයතන/මධ්‍යම පරිසර අධිකාරිය සහ අනෙකුත් අදාළ ආයතන වෙත සහාය දීම.
3. එවැනි ජල ස්කන්ධවල ජලයේ ගුණාත්මකබව වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් සිදුකළ හැකි පර්යේෂණ පිළිබඳව ඒ සම්බන්ධ ප්‍රවීණතාවයෙන් හෙබි නියෝජිතායතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

**ප්‍රතිපත්තිය 3.2**

වෙරළබඩ භූගත ජලයේ දූෂණය අවම කිරීම සඳහා සහයෝගිතා ක්‍රියාමාර්ග සිදුකරනු ලැබේ.

**ක්‍රමෝපාය 3.2.1**

සිදුවිය හැකි වෙනස්වීම් නිශ්චය කරගැනීම සඳහා වෙරළබඩ කලාපයේ භූගත ජල ප්‍රමාණය හා එහි ගුණාත්මකබව පරීක්ෂා කිරීම හා නිරීක්ෂණයට භාජනය කිරීමට අදාළව සහයෝගී ක්‍රියාකාරකම් සිදුකරනු ලැබේ.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. වෙරළ කලාපයේ ඉහළ ආර්ථික වටිනාකමකින් හෙබි අවදානම් ස්ථාන තෝරාගැනීම සහ නියම කරන ලද භාවිතයන් සඳහා එකී ස්ථානවල භූගත ජලයේ ගුණාත්මක තත්ත්වය අධීක්ෂණය කිරීම.
2. වෙරළබඩ භූගත ජල දූෂණය වැළැක්වීම සඳහා අදාළ අධිකාරීන් වෙත සහාය දීම.

**අරමුණ 4**

අධ්‍යාපනය තුළින් හා උපාය මාර්ගික සන්නිවේදන ක්‍රම භාවිතයෙන් තොරතුරු ව්‍යාප්ත කිරීම හා හුවමාරු කරගැනීම තුළින් වෙරළබඩ කලාපයේ වෙරළබඩ හා සමුද්‍රීය ජල දූෂණය කළමනාකරණය කෙරේ.

**ප්‍රතිපත්තිය 4.1**

පරිසර දූෂණ ප්‍රභව, ආචරණ හා බලපෑම්, සහ පාලනය කිරීමේ යාන්ත්‍රණ සම්බන්ධයෙන් පාර්ශවකරුවන් දැනුවත් කිරීම සඳහා අදාළ නියෝජිතායතන/රාජ්‍ය නොවන සංවිධාන සමග සහයෝගීතා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

**ක්‍රමෝපාය 4.1.1**

වෙරළ කලාපයේ ජලයේ තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා පුහුණු හා කුසලතා සංවර්ධනය වෙනුවෙන් ඒ පිළිබඳ නිපුණත්වයෙන් හෙබි නියෝජිතායතන සමග සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. ඉලක්කගත කණ්ඩායම් සහ විසඳිය යුතු සුවිශේෂී ගැටලු හා අවශ්‍යතා හඳුනාගැනීම සඳහා අවශ්‍යතා විශ්ලේෂණයක් සිදුකිරීම.
2. පුහුණු කිරීමේ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ඵලදායීව සිදුකිරීම සඳහා ඒ පිළිබඳව උනන්දුවක් දක්වන කණ්ඩායම් සහ සන්නිවේදන සජීවිකාරකයින් හඳුනාගැනීම සහ ඔවුන් හා එක්ව සහයෝගීතා වැඩසටහන් සකස් කිරීම.
3. ජල දූෂණය සහ දූෂණ ප්‍රභව/ දූෂණ ආකාර, දූෂණ මට්ටම්, වැළැක්වීමේ ක්‍රමවේද සම්බන්ධයෙන් දැනුවත් බවක් ලබාදීම සඳහා ඉලක්ක කණ්ඩායම්වලින් නියෝජිත පුද්ගලයන් පුහුණු කිරීම හා ඔවුන්ගේ වෘත්තිමය කුසලතාවයන් වර්ධනය කිරීම.

**ප්‍රතිපත්තිය 4.2**

දූෂක ද්‍රව්‍ය විමෝචනය සඳහා සෘජුව හෝ වක්‍රව සම්බන්ධවන ඉලක්ක කණ්ඩායම් හඳුනාගනු ලබන අතර වෙරළබඩ හා සමුද්‍රීය ජල දූෂණයේ හානිකර බලපෑම් හා දූෂණය අවම කිරීමේ යාන්ත්‍රණ පිළිබඳව ඔවුන් දැනුවත් කරනු ලැබේ.

**ක්‍රමෝපාය 4.2.1**

වෙරළබඩ දූෂණය කළමනාකරණය සඳහා සම්බන්ධ කර ගත හැකි ඉලක්ක කණ්ඩායම් (පාසල් සිසුන්, පරිසරය දූෂණය කරන පුද්ගලයන්, පළාත් පාලන ආයතන, ප්‍රතිපත්ති සම්පාදකයන් ආදීන්) වෙත දැනුම ලබාදීම සඳහා අදාළ හවුල්කාර සංවිධාන/ සන්නිවේදන සජීවිකාරකයින් සමග සහයෝගීතාවයෙන් යෝග්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. සන්නිවේදන පාර්ශවකරුවන්/අදාළ ආයතන සමග එක්ව ඉලක්ක කණ්ඩායම් සහ දැනුවත් කිරීම්/සන්නිවේදන ක්‍රියා අවශ්‍ය සුවිශේෂී ගැටලු සම්බන්ධයෙන් නිශ්චය කරගැනීම සඳහා අවශ්‍යතා විශ්ලේෂණයක් සිදුකිරීම.
2. සන්නිවේදන අවශ්‍යතා මත පදනම්ව තෝරාගත් ඉලක්ක කණ්ඩායම් සඳහා අදාළ අවශ්‍යතානුකූලව සකස් කළ පුහුණු/දැනුවත් කිරීමේ වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
3. වෙරළබඩ කලාපයේ දූෂණ තත්ත්වයන් අවම කිරීම සඳහා පාසල් සිසුන් සඳහා වැඩමුළු හා ප්‍රචාරණය මෙහෙයුම් සංවිධානය කිරීම.
4. වෙරළබඩ දූෂණය පාලනය කිරීමේ ප්‍රයත්නයන් සම්බන්ධයෙන් මහජන සහභාගිත්වය ඇති කිරීම සඳහා දැන්වීම් පුවරු සවි කිරීම හා පත්‍රිකා බෙදාහැරීම.

**අරමුණ 5**

බහුවිධ සහයෝගීත්ව කළමනාකරණ ප්‍රවේශයක් හරහා ඝන අපද්‍රව්‍ය හා සමුද්‍රීය කැළිකසළ හේතුවෙන් ඇතිවන වෙරළබඩ දූෂණය අවම කෙරේ.

**ප්‍රතිපත්තිය 5.1**

වෙරළබඩ කලාපය තුළ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සහ සමුද්‍රීය කැළිකසළ වෙරළ කලාපයට මුදා හැරීම හේතුවෙන් ඇතිවන වෙරළබඩ දූෂණය යනු බහුවිධ කළමනාකරණ මැදිහත්වීම් අවශ්‍ය ඉහළ ප්‍රමුඛතාවයක් ලබාදිය යුතු කළමනාකරණ ගැටලුවක් ලෙස හඳුනාගැනේ.

**ක්‍රමෝපාය 5.1.1**

බලපෑම් මාර්ග (අපද්‍රව්‍ය උත්පාදන මාර්ග නිරීක්ෂුම) හා වෙරළ කලාපය තුළට ඝන අපද්‍රව්‍ය හා සමුද්‍රීය කැළිකසළ/ක්ෂුද්‍ර ප්ලාස්ටික් මුදාහැරීමේ/බැහැර කිරීමේ සමාජ, පාරිසරික, සහ ආර්ථික බලපෑම්වල මට්ටම තක්සේරු කිරීම

**ක්‍රමෝපාය 5.1.2**

වෙරළ කලාපයේ ඝන අපද්‍රව්‍ය හේතුකොට සිදුවන දූෂණය කළමනාකරණය සඳහා සහයෝගීතාවය පාදක කොටගත් ඵලදායී ආයතනික යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. වෙරළ කලාපයේ ඝන අපද්‍රව්‍ය හේතු කොට සිදුවන දූෂණය අවම කිරීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය සහ පළාත් පාලන ආයතනයන් හි සක්‍රීය දායකත්වයෙන් සහභාගීත්ව කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම.

2. පෞද්ගලික අංශයේ දායකත්වයෙන් වෙරළ කලාපයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ නියැලෙන පිරිස් හා පළාත් පාලන සේවකයින් සඳහා විශේෂිත දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයක් ස්ථාපිත කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. වෙරළබඩ කලාපය තුළ ඝන අපද්‍රව්‍ය/ක්ෂුද්‍ර ප්ලාස්ටික් පැවතීමේ ස්වභාවය, ප්‍රභව හා ව්‍යාප්තවී ඇති ස්වභාවය/ලක්ෂණ නිර්ණය කිරීම සඳහා අධ්‍යයනයන් සිදුකිරීම.

2. සමුද්‍රීය අපද්‍රව්‍ය දූෂණ කළමනාකරණ සැලසුම් සම්පාදනය සඳහා සුවිශේෂී වැදගත්කමක් දරන ස්ථාන හඳුනාගැනීම.

**ප්‍රතිපත්තිය 5.2**

ප්ලාස්ටික් මගින් සිදුවන දූෂණය අවම කිරීම සඳහා උපකාරී වන ආකාරයෙන් පුද්ගල චර්යා මත බලපෑමක් ඇති කරන පුද්ගලයින්ගේ සමාජයීය රුචිකත්වයන් සහ/හෝ සංජානන සීමා උපයෝගීවන චර්යාත්මක විධි ප්‍රවර්ධනය කිරීම

**ක්‍රමෝපාය 5.2.1**

වෙරළබඩ පරිසරය තුළට ප්ලාස්ටික් කැළිකසළ බැහැර කිරීම අවම කිරීම සඳහා තොරතුරු සන්නිවේදනය, අවධානය යොමුකරවීමේ සදාචාරාත්මක පෙළඹවීම් ඇතුළත් චර්යාත්මක මැදිහත්වීම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම

**යෝජිත ක්‍රියාමාර්ග**

1. පරිභෝජන හා බැහැර කිරීමේ චර්යාවල පූර්ණ ආකල්පමය වෙනසක් ඇති කිරීමට හැකිවන පරිද්දෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා පළාත් පාලන ආයතන මෙන්ම සිවිල් සංවිධාන ශක්තිමත් කිරීම.
2. සංචාරක හෝටල්, වෙරළබඩ පදිංචිකරුවන් සහ ධීවර ප්‍රජාව සඳහා දොරින් දොරට යන ආකාරයේ තොරතුරු ප්‍රචාරණ මෙහෙයුමක් සිවිල් සමාජ සංවිධානවල සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කිරීම.
3. වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් සඳහා ආයතනික අනුග්‍රහයන් ප්‍රවර්ධනය කිරීම

**ප්‍රතිපත්තිය 5.3**

වෙරළ කලාපයට සෘජුව හෝ වක්‍රාකාරයෙන් අපද්‍රව්‍ය ඇතුළු වන්නා වූ ජල මාර්ගවලට එකතුවන ඝන අපද්‍රව්‍ය එම ජල මාර්ගවල ඉහළ කොටසේ දීම කළමනාකරණය කිරීම ප්‍රවර්ධනය කිරීම.

**ක්‍රමෝපාය 5.3.1**

ජල මාර්ගවලට ඝන අපද්‍රව්‍ය ඇතුළුවීම වැළැක්වීම සඳහා ප්‍රජා කණ්ඩායම් (ගංගා සහ ඇලමාර්ග දෙපස පදිංචිකරුවන්), වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ පළාත් පාලන ආයතනයන්ගෙන් සමන්විත සහභාගීත්ව ආයතනික යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා සම්බන්ධීකරණය වීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. වෙරළ කලාපයට සම්බන්ධිත ජලමාර්ගවල ඉහළ ප්‍රදේශයන්ට ඇතුළුවන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණයන් හා ඒවායේ අහිතකරතාවය තක්සේරු කිරීම.
2. ගංගා සහ ඇල මාර්ග දෙපස ජීවත් වන පදිංචිකරුවන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම.
3. අදාළ ආයතනයන්ගේ සහභාගීත්වයෙන් අපද්‍රව්‍ය බාධක (waste traps) ස්ථාපිත කිරීම.

**ප්‍රතිපත්තිය 5.4**

ඵලදායී කළමනාකරණ උපාය මාර්ග සහ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමට හැකිවන ලෙස වෙරළ දූෂණය පිළිබඳ පර්යේෂණ, ඇගයීම් සහ සංවර්ධන කටයුතු මගින් එක්රැස්කරන ලද දත්ත සහ තොරතුරු හුවමාරු කරගැනීම ප්‍රවර්ධනය කිරීම.

**ක්‍රමෝපාය 5.4.1**

වෙරළබඩ දූෂණය පිළිබඳ දත්ත සහ තොරතුරු හුවමාරු කරගැනීම හා සහභාගීත්ව භාවිතය සඳහා ආයතනික ජාලයක් දියුණු කිරීම (ප්‍රජාව සම්බන්ධ කරගැනීම සහ නව තාක්ෂණය භාවිතය සඳහා ජාත්‍යන්තර සහයෝගය ලබා ගැනීම)

**යෝජිත ක්‍රියාකාරකම්**

1. වෙරළබඩ දූෂණය හා අදාළ දත්ත සහ තොරතුරු හුවමාරු කොට භාවිතයට ගත හැකි වන පරිදි මධ්‍යගත දත්ත ගබඩාවක් නිර්මාණය කිරීම.
2. වෙරළබඩ දූෂණය හා සම්බන්ධ පර්යේෂණ, අධීක්ෂණ, නියාමන, සංවර්ධන සහ දැනුවත්කිරීම් කරනු ලබන ආයතනයන්ගෙන් සමන්විත ආයතනික ජාලයක් ස්ථාපිත කිරීම.

3. වෙරළ දූෂණය පිළිබඳ සංවේදී නොවන දත්ත සහ තොරතුරු සඳහා බාධාවකින් තොරව මහජනතාවට, පර්යේෂකයන්ට ලබාගත හැකි පොදු දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම.

4. වෙරළ දූෂණය පිළිබඳ ප්‍රාදේශීක දත්ත විශ්ලේෂණය කිරීමට සහ පෙන්වාදීමට භූගෝලීය තොරතුරු පද්ධති (GIS) භාවිතය

5. වෙරළබඩ දූෂණය පාලනය කිරීම සඳහා දත්ත හුවමාරු කරගැනීමේ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් ආයතන අතර ක්‍රියාත්මක කිරීම.

6. වෙරළබඩ දූෂණය පිළිබඳ දත්ත වගවීමෙන් භාවිතා කිරීම තහවුරු කිරීම හා එම දත්ත ඵලදායීව හා විනිවිදභාවයකින් යුතුව තීරණ ගැනීමට හැකිවන පරිදි භාවිතය සඳහා සාරධර්ම යොමු රීති මාලාවක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

ආශ්‍රිත ග්‍රන්ථ


1. Arjuna's Atlas of Sri Lanka, ed. T. Somasekaram, M.P. Perera, and H. Godellawatta, Dehiwala (Arjuna Consulting Co. Ltd., 1997.
2. Bandarathilake, K. G. d. 1999. Hazardous Waste Management in Sri Lanka. Paper presented at Sub Regional Training Seminar for the Implementation of the Basel Convention on the Control of Transboundary Movements of Hazardous Waste and their disposal.Mar. 15-19, 1999. Colombo.
3. Central Bank of Sri Lanka, 2001. Annual Report of 2000. Colombo (Central Bank of Sri Lanka, Sri Lanka).
4. Central Bank of Sri Lanka, 2002. Annual Report of 2001. Colombo (Central Bank of Sri Lanka, Sri Lanka).
5. Central Environmental Authority (2016), Directory of Prescribed Activities in Sri Lanka (Industrial Database).
6. Central Environmental Authority, 2005, Database of Municipal Solid Waste Management.
7. Coast Conservation Department,2014,Information Compendiumon Coastal Pollution, (Unpublished report).
8. Coast Conservation Department, Revised Coastal Zone Management Plan, 2004.
9. Corea ASCE, 2009, Trends in Water Quality changes in Main Water Sources for Shrimp Culture and the need for Standards for Shrimp Farms Effluents.
10. Corea, A.S.L.F., J. M. P. K. Jayasinghe, S. U. K. Ekaratne and S. D. Johnston, 1995.Environmental impact of prawn farming on Dutch canal (the main water source for the prawn culture industry in Sri Lanka, AMBIO (24)( 423-427)
11. Department of Census and Statistics, 2001.Census of Population and Housing 2001(preliminary release. Colombo Department of Census and Statistics.
12. Department of Government Printing,1992,*Gazette Extra Ordinary* 595/16 of 02.02.92
13. Department of Government Printing, 2008 *Gazette Extra Ordinary* 1534/18 Dated 01.02.2008.o.
14. Jayaweera, M. 1999. Environmental Improvement Study, Port of Colombo. Unpubl. Sri Lanka Ports Authority.
15. Manage, P., Liyanage, G., Abinaiyan, I., Madusanka, D., & Bandara, K. (2022). Pollution levels in Sri Lanka.s west-south coastal waters( Making progress toward a cleaner environment. Regional Studies in Marine Science, 51, 102193. https://doi.org/10.1016/j.rsma.2022.102193
16. Manchanayake, E.P. and C. M. Madduma Bandara, 1999. Water Resources of Sri Lanka. Colombo (National Science Foundation).
17. Marine Pollution Prevention Authority, 2002. Database on accidental spills in Sri Lankan waters.
18. Ministry of Environment (2020) National Waste management Policy.
19. MOENR.2002.State of the Environment in Sri Lanka (a Report for SAARC, compiled and ed.J D S Dela. Colombo (Ministry of Environment and Natural Resources).

20. MOFE (1999). Database of Municipal Waste in Sri Lanka. Colombo (Ministry of Forestry and Environment).

21. MOFE,2000.The National Strategy for Solid Waste Management.Colombo (Ministry of Forestry and Environment, Sri Lanka).

22. MOFE, 2001. State of the Environment. Sri Lanka. Colombo (Ministry of Forestry and Environment).

23. Mubarak, A.M. 2000. Water Pollution. In Natural Resources of Sri Lanka 2000.Colombo (National Science Foundation).

24. P.M. Manage et al. (2022) &, Pollution levels in Sri Lanka.s West-South coastal waters (Making progress toward a cleaner environment)

25. Status of Solid Wastes and its Management in the Coastal Environments of Sri Lanka LY Hitige1, TMWRMB Samarakoon International Journal of Environment, Agriculture and Biotechnology Vol-6, Issue-5; Sep-Oct, 2021

26. UDA,1994b.Colombo Environmental Improvement Project,Colombo Urban Development Authority, 1994;

27. UDA, 1994a. Environmental Management Strategy for Colombo Urban Area - (III) (Colombo,Urban Development Authority).

28. University of Moratuwa,2001.Feasibility study report for establishment of a central wastewater treatment plan for Ratmalana/Moratuwa industrial/residential areas,Unpublished.University of Moratuwa.

29. Yong Chang Jang Etal.(2018) — Composition and abundance of marine debris stranded in beaches of Sri Lanka.

30. Ms. Johanna Doerpinghaus, Mr. Amarnath Munnolimath and Ms. Jana Hack - adelphi, Germany, Mr. Samantha Kumarasena and Ms. Nisansala Ranundeniya - National Cleaner Production Centre (NCPC), Sri Lanka POLICY BRIEF (Input Paper)( Prevention of Marine Litter in Sri Lanka-(2021))

31. F. Alpizara,b, et al. , (2020) A framework for selecting and designing policies to reduce marine plastic pollution in developing countries

32. K.H.H. Niroshana1*, H.B. Asanthi2 and P.B.T.P.Kumara (2013), An assessment of water quality and pollution in Puranawella Fishery Harbour, Dewinuwara, Sri Lanka.

## 5 වැනි පරිච්ඡේදය - විශේෂ කළමනාකරණ ප්‍රදේශ (SMA)

### 5.1 හැඳින්වීම

*විශේෂ කළමනාකරණ ප්‍රදේශයක් යනු වෙරළ සම්පත් කළමනාකරණය සඳහා ඉතා වැදගත් ප්‍රවේශයක් වන අතර එමගින් නිශ්චිත වෙරළබඩ ප්‍රදේශයක් සඳහා අනන්‍ය වූ ලක්ෂණ සහ අවදානම් හඳුනාගැනේ. පුළුල් ආකාරයකින් සංරක්ෂණය, තිරසර සංවර්ධනය සහ සම්පත් කළමනාකරණය ඒකාබද්ධ කිරීම සඳහා මෙයින් අවධානය යොමු කෙරේ. වෙරළ සම්පත් කළමනාකරණයේ දී විශේෂ කළමනාකරණ ප්‍රදේශවල වැදගත්කම ප්‍රධාන කරුණු කිහිපයක් මත රඳා පවතී. ඒකාබද්ධ කළමනාකරණ ප්‍රවේශය, වෙරළබඩ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම, තිරසර ආකාරයෙන් වෙරළබඩ උපයෝජනය, දේශගුණික වෙනස්වීම් සඳහා අනුවර්තනය, දූෂණය පාලනය කිරීම, දරා ගැනීමේ හැකියාව සහ ආපදා අවදානම් අඩු කිරීම සහ පාර්ශවකරුවන්ගේ නිරතවීම හා ප්‍රජා සහභාගීත්වයයි.*

#### 5.1.1 සංකල්පය

ආර්ථික සංවර්ධනය, වේගවත්ව ඉහළ යන ජනගහනය, ශ්‍රී ලංකාවේ වෙරළ කලාපයේ පවතින දුගීබව හේතුවෙන් වෙරළ සම්පත් වැඩිවෙමින් පවතින පීඩනයකට නතු වී පවතින අවස්ථාවක දී මීට පෙර විශේෂ ප්‍රදේශ කළමනාකරණය (SAM) යනුවෙන් ද හැඳින්වූ විශේෂ කළමනාකරණ ප්‍රදේශ (SMA) සංකල්පය ඒකාබද්ධ වෙරළබඩ සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයට (ICRM) අදාළ ඉතා වැදගත් කළමනාකරණ මෙවලමක් ලෙස හඳුනාගෙන ඇත. මීට අමතරව, වෙරළබඩ සම්පත් භාවිතා කරන්නන්ගේ සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ සමාජ ආර්ථික අවශ්‍යතාවයන්ට විශේෂිත අවධානය සහිත ඒකාබද්ධ සහයෝගිතා කළමනාකරණ ප්‍රවේශයක් සඳහා නව ප්‍රතිපත්තියක අවශ්‍යතාවය ද මෙම සංකල්පය සඳහා හේතු විය. මීට අමතරව, අනෙකුත් ජාතික වෙරළ කලාප කළමනාකරණ ප්‍රතිපත්තීන්ගේ ප්‍රමාණවත් නොවූ ප්‍රතිඵල හේතුවෙන් වෙරළ සම්පත් පාර්ශවකරුවන්ගේ ස්ථාන-නිශ්චිත පදනමකින් වන සක්‍රීය සහභාගිත්වයේ අවශ්‍යතාවය ද ඇතැම් පිරිස් විසින් මතුකර දක්වන ලදී. එබැවින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම වෙරළබඩ සම්පත් කළමනාකරණය සඳහා "පහළ සිට ඉහළට දිවෙන" ප්‍රවේශයක් ලෙස පරිකල්පනය කරන ලද අතර වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් එහි ආරම්භයේ සිට අනුගමනය කළ "ඉහළ සිට පහළට දිවෙන" නියාමන ප්‍රවේශයට මෙය අනුපූරකයක් විය. සහභාගිත්ව කළමනාකරණ මූලධර්ම මත පදනම්ව මෙම විශේෂ කළමනාකරණ ප්‍රදේශ සංකල්පය විකසනය වී ඇති අතර නිශ්චිතව දක්වා ඇති භූගෝලීය ප්‍රදේශයක් තුළ තිරසර සම්පත් කළමනාකරණය සඳහා සහයෝගීත්ව, අනුවර්තනීය හා නම්‍යශීලී ප්‍රවේශයක් මීට අදාළ වේ. ජාතික වෙරළබඩ කලාප කළමනාකරණ සැලැස්ම - 1997 හරහා වෙරළ කලාප කළමනාකරණයේ ආධාරක ප්‍රතිපත්තියක් ලෙස මෙය විධිමත්ව හඳුන්වා දෙන ලදී. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීමේ දී "පහළ සිට ඉහළට දිවෙන" ප්‍රවේශය දැඩිව ක්‍රියාත්මක කිරීම වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම තුළින් අවධාරණය කෙරේ.

මෙය විධිමත් අයුරින් ක්‍රියාවට නැංවීමට පෙර, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිතායතනයේ (USAID) මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක වූ වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ 1992 වර්ෂයේ දී හික්කඩුව හා රැකව යන නියමු ව්‍යාපෘති ස්ථාන දෙකක දී මෙම සංකල්පය බිම් මට්ටමේ දී පරීක්ෂා කරන ලදී. එම නියමු ව්‍යාපෘතිවල ප්‍රතිඵල මගින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ සංකල්පය වෙරළ කලාප කළමනාකරණය සඳහා සහභාගීත්ව පදනම මත ඵලදායී ලෙස යොදාගැනීමේ හැකියාව සහ අවස්ථාවන් විදහා දැක්විණි. මෙම නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් ලද අත්දැකීම් මත පදනම්ව "වෙරළ 2000; ශ්‍රී ලංකාවේ වෙරළ කලාපය සඳහා සම්පත් කළමනාකරණ ක්‍රමෝපාය" මැයෙන් වූ වාර්තාව මගින් ද විශේෂ පාරිසරික හා ආර්ථික වැදගත්කමක් සහිත නිශ්චිත වෙරළබඩ ප්‍රදේශ සඳහා විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම නිර්දේශ කර තිබේ. ජාතික වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම - 1997 මගින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණය පරීක්ෂා කර විධිමත්ව ක්‍රියාවට නැංවීම සිදුකළ ද, 2011 අංක 49 දරන පනතින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත හරහා නව නීතිමය විධිවිධාන හඳුන්වා දෙන තුරු විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් විධිමත් අයුරින් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම සඳහා නීතිමය විධිවිධාන නොපැවතිණි. එබැවින්, මෙම ක්‍රියාවලියේ ආරම්භක අවධියේ දී, ප්‍රජාව, ප්‍රාදේශීය සභා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, වැනි ප්‍රාදේශික සභාය ආයතන, බාහිර ප්‍රතිලාභීන්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා බාහිර පාර්ශවකරුවන් ඇතුළත් පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික වැඩපිළිවෙළක් යොදන ලදී. දැනුවත්භාවය ඇති කිරීම, අධ්‍යාපන හා පර්යේෂණ සම්පාදනය ඔස්සේ 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතට අනුකූලව පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවය අපේක්ෂා කරනු ලැබේ.

#### 5.1.2 විකසනය සහ ක්‍රියාත්මක කිරීමේ අත්දැකීම්

1990 දී පිළියෙල කරන ලද වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙන් ලද අත්දැකීම් අනුව වෙරළබඩ සම්පත් කළමනාකරණය සඳහා ප්‍රාදේශීය මට්ටමේ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වය පිළිබඳව වඩාත් පුළුල්ව අවධාරණය කරන ලදී. මෙම අවශ්‍යතාවය ප්‍රධාන වශයෙන්ම පැනනැගී ඇත්තේ වෙරළබඩ සම්පත් සහ එම සම්පත් භාවිතා කරන්නන් අතර පවතින දැඩි

සබඳතාවය හේතුකොට ගෙනය. වෙරළබඩ සම්පත් භාවිතය සඳහා පවතින විවෘත ප්‍රවේශයේ (Open Access) ස්වභාවය හේතුවෙන් පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයේ අවශ්‍යතාවය තවදුරටත් ඉස්මතු විය. එබැවින්, වෙරළ සම්පත් කළමනාකරණයේ දී ක්‍රියාවට නංවන ලද වැඩි අවධාරණයක් ලබාදෙන ලද විධාන සහ පාලන පියවරවලට අනුපූරකයක් ලෙස, විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සම්පත් භාවිතා කරන්නන්ගේ සහභාගිත්වයෙන්, ඔවුන්ගේ සමාජ හා ආර්ථික අවශ්‍යතා සැලකිල්ලට ගෙන ක්‍රියාවට නංවන ලදී.

විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීමේ මූලික අදියර ක්‍රියාත්මක වීමට පූර්වයෙන් 1992 වර්ෂයේ දී රැකව කලපුව හා හික්කඩුව සමුද්‍රීය අභය භූමිය ආශ්‍රිතව නියාමන ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක විය. මෙම මුල් පියවර වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන ලද්දේ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිතායතනයේ (USAID) මගින් සපයන ලද මූල්‍යාධාර හා තාක්ෂණික ආධාර මත ක්‍රියාත්මක වූ වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය මගිනි.මෙම විශේෂ කළමනාකරණ ප්‍රදේශ සංකල්පයේ ශක්‍යතාවය මෙම ස්ථාන දෙකෙහිදීම පරීක්ෂාවට ලක්විය. මෙම ප්‍රයත්නය තුළින් ලබාගත් ආකර්ෂණීය ප්‍රතිඵල හා නව අත්දැකීම් මත පාදකව, 1997 වර්ෂයේ වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම තුළින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය අනුමත කරන ලද අතර තෝරාගත් වෙරළ ස්ථාන 23ක් සඳහා මෙම විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කරන ලදී.මීට අමතරව, වෙරළ 2000; ශ්‍රී ලංකාවේ වෙරළ කලාපය සඳහා සම්පත් කළමනාකරණ ක්‍රමෝපාය" මගින් ද මෙම විශේෂ කළමනාකරණ ප්‍රදේශ සංකල්පය යොදා ගැනීමට නිර්දේශ කරන ලදී. එහිදී විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා ස්ථාන තෝරා ගැනීම පහත සඳහන් නිර්ණායක මත පදනම් විය:

අ) අදාළ ස්ථානවල පවතින සමාජ, ආර්ථික සහ පාරිසරික ගැටලුවල උග්‍රතාවය,

ආ) වෙරළබඩ පරිසර පද්ධතිවල සාපේක්ෂ සාරවත්බව හා බහුලත්වය,

ඇ) ප්‍රදේශයේ ප්‍රමාණය, ස්ථානය, නෛතික හා ආයතනික සාධක මත පදනම්ව කළමනාකරණ ශක්‍යතාවය,

ඈ) ආර්ථික සංවර්ධනය සඳහා එම ප්‍රදේශය තුළ පවතින හෝ විභව වටිනාකම.

ස්ථාන තෝරා ගැනීමේ නිර්ණායකවලට අමතරව, සැලසුම්කරණ ක්‍රියාවලිය තුළ අනුගමනය කළයුතු සැලසුම් පියවර වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම - 1997 හි දක්වා ඇත. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ වූ ගෝලීය පරිසර පහසුකම (GEF) මගින් සැපයූ මූල්‍ය සහයෝගය යටතේ, 2005 වර්ෂයේ දී වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ සොබාදහම සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සංගමය (IUCN) විසින් වෙරළබඩ ග්‍රාම නිලධාරී කොට්ඨාස 20ක් ආවරණය වන පරිදි රැකව, උස්සන්ගොඩ, කලමැටිය (GEF- RUK) වෙරළබඩ පරිසර පද්ධතිය සඳහා විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලැස්මක් සම්පාදනය කර ක්‍රියාත්මක කරන ලදී. මෙම විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලැස්මේ අරමුණ වූයේ රැකව, උස්සන්ගොඩ, කලමැටිය වෙරළබඩ පරිසර පද්ධතියේ ස්වභාවික සම්පත්වල තිරසරභාවය සහතික කරමින් මෙම විශේෂ කළමනාකරණ ප්‍රදේශය තුළ වාසය කරන ප්‍රජාවගේ සමාජ යහ පැවැත්ම නඟා සිටුවීමයි.

ඉන් අනතුරුව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ආසියානු සංවර්ධන බැංකුව සහ නෙදර්ලන්ත රජය මගින් සැපයූ මූල්‍යාධාර මත ක්‍රියාත්මක වූ වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය 2000-2007 යටතේ පූර්ණ වශයෙන් වැඩි දියුණු කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ දෙවන අදියර වශයෙන් ස්ථාන ගණනාවක්, එනම් කල්පිටිය බාධක කොරල් පරය, මීගමුව මෝය/ මුතුරාජවෙල වගුරු බිම්, ලුනාව කලපුව, මාදු ගං මෝය, හික්කඩුව ස්වභාවික සංරක්ෂිතය, උණවටුන බොක්ක ඇතුළුව කොග්ගල මෝය, මාවැල්ල හා කලමැටිය කලපුව සහ හම්බන්තොට වෙරළ තීරය යන ස්ථානයන්හි ක්‍රියාත්මක කරන ලදී.

වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම - 1997 ට අනුකූලව විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට අමතරව, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මෙම සංකල්පය සහ අදාළ ක්‍රියාකාරකම් දිස්ත්‍රික් මට්ටමේ ව්‍යාපෘතිවලට ද හඳුන්වා දෙන ලදී. සංවර්ධන සහයෝගීතාවය සඳහා වන නෝර්වීජියානු නියෝජිතායතනයේ (NORAD) මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක කළ හම්බන්තොට ඒකාබද්ධ වෙරළ කලාප කළමනාකරණ ව්‍යාපෘතිය (HICZMP) තුළට ද විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණ කටයුතු එක්කරන ලද අතර එහි දී විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ කටයුතු හම්බන්තොට වැලි වැටි සහ මාවැල්ල කලපුව - කුඩාවැල්ල හුම්මානය වෙරළ ප්‍රදේශය වෙත යොමුවන ලදී. මෙහිදී මෙම සංකල්පය යොදා ගැනීමේ දී පැවති ප්‍රධාන වෙනස වූයේ මූලික මූලධර්ම සමාන වුව ද, මෙහෙයුම් හා පරිපාලන කාර්ය පටිපාටි අත්‍යවශ්‍යයෙන්ම සමාන නොවූ බවයි. තවත් ප්‍රමුඛ ලක්ෂණයක් වූයේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය තුළ හඳුනාගත් ඇතැම් ක්‍රියාකාරකම් සැලසුම්කරණ අවධියේ දී ක්‍රියාත්මක කිරීම යි.

**5.2 උගත් පාඩම් සහ දුර්වලතා**

සමස්තයක් ලෙස, ශ්‍රී ලංකාවේ වෙරළ සම්පත් කළමනාකරණය හා සම්බන්ධව විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීම රාජ්‍ය අංශයේ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානත්වයෙන් මෙහෙයවනු ලැබිණි. 1992 වර්ෂයේ සිට වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් විදේශ මූල්‍යාධාර ලැබූ ව්‍යාපෘති හතරක් යටතේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් 12ක් සැලසුම් කර ක්‍රියාත්මක කර තිබේ. පසුගිය දශක දෙක තුළ, ශ්‍රී ලංකාවේ

විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ලොව්රි කේ සහ පිරිස (1997), ඉන්ජිජර්ඩ් ලැන්ඩ්ස්ටෝම් (2006) ද සිල්වා සන්ජීව් සහ පිරිස (2012), වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව(2014) විසින් කරන ලද ඇගයීම්/ සමාලෝචනයන් ද මීට අමතරව, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් සතු අත්දැකීම් සහ උගත් පාඩම් මගින් හඳුනාගන්නා ලද අඩුපාඩු හා බාධක, නෛතික සහ ආයතනික, බලපෑම් හා සඵලතාවයන්, තිරසරභාවය සහ අභියෝග යන ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ පෙන්වා දිය හැකි ය.

### 5.2.1 නෛතික සහ ආයතනික

විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය හා සම්බන්ධිත නෛතික හා ආයතනික අංශ ගත් කල, පහත දැක්වෙන පාඩම් සහ දුර්වලතා අතීතයේ දී අත්විඳ ඇති අතර ඒවා පහත සඳහන් පරිදි සාරාංශගත කළ හැක;

- විධිමත් නීතිමය රාමුවක් නොමැතිව සහභාගීත්ව හෝ පරිපාලන වැඩපිළිවෙළක් යටතේ පමණක් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාත්මක කිරීම ඵලදායී නොවන බව සකස් කර ක්‍රියාත්මක කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්වල දී පැහැදිලි සාක්ෂියක් ලෙස පෙන්නුම් කර තිබේ.
- විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී එය අධීක්ෂණය පැවරී ඇති ප්‍රජා සම්බන්ධීකරණ කමිටු, වෙරළ සංරක්ෂණ පනත හෝ වෙනත් කිසිදු නීතියක් මගින් නෛතික වශයෙන් හඳුනාගෙන/ පිළිගෙන නොතිබුණි. ප්‍රජා සම්බන්ධීකරණ කමිටු නෛතික වශයෙන් හෝ පරිපාලන වශයෙන් හෝ පිළිගැනීමට අපොහොසත්වී තිබීම ඔස්සේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා එකී කමිටුවලට ඇති බල අධිකාරිය දුර්වල කරනු ලැබේ.
- විශේෂ කළමනාකරණ ප්‍රදේශ වැඩසටහන් යටතේ ස්ථාපිත කරන ලද ප්‍රජා සම්බන්ධීකරණ කමිටුවල ක්‍රියාකාරීත්වය මූල්‍යාධාර සැපයූ ව්‍යාපෘතිවල අවසානයත් සමග මූල්‍ය සම්පත් හා තාක්ෂණික සම්පත්වල පැවති හිඟකම මත අක්‍රීය වී ඇත.
- මුල් අවස්ථාවල දී සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ දී ප්‍රාදේශීය ලේකම්වරුන් ඉටුකරන ලද වැදගත් භූමිකා, එකී භූමිකා පශ්චාත් ව්‍යාපෘති ක්‍රියාදාමයේ දී නෛතිකව සහ ආයතනිකව හඳුනාගැනීමක් නොමැති වීම නිසා වියැකී ගොස් ඇත. මෙයට අමතරව, ව්‍යාපෘතිය අවසානයේ දී ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් විසින් ඉටුකළ යුතු අපේක්ෂිත කාර්යයන් සහ ඔවුන්ගේ ධාරිතාව, සම්පත් සහ හැඩගැසීම සමග ගැළපීමක් නොතිබිණි.
- විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යෑම සහතික කිරීම සඳහා නව රාජ්‍ය නොවන සංවිධාන ස්ථාපනය කිරීම සහ දැනට ක්‍රියාත්මක රාජ්‍ය නොවන සංවිධාන ශක්තිමත් කිරීම මගින් ස්ථාපිත කරන ලද උපකාරක ආයතනික වැඩපිළිවෙළ බොහෝ අවස්ථාවලදී අසාර්ථක වී තිබේ.
- ව්‍යාපෘති අදියර අවසන්වීමෙන් අනතුරුව, පසු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා බාහිර ආධාර මත සම්පූර්ණයෙන් රැඳීමට ප්‍රජා සම්බන්ධීකරණ කමිටු වෙත සිදු වේ. මෙය බොහෝදුරට විශාල පරිමාණයේ ක්‍රියාකාරකම් පිළිබඳ වලංගු වේ. සම්පූර්ණයෙන් මූල්‍ය ආධාර මත යැපීම් තත්ත්වයේ සිට නිතතින් පූර්ණ වශයෙන් ස්වාධීන තත්ත්වයකට මාරුවීමේ දී ආයතනික ධාරිතාවයන් වැඩිකර ගැනීම සඳහාත් ක්‍රියාවලි ඒකරාශී කර ගැනීම සඳහාත් අතරමැදි කාල පරාසයක් ලබා දී නොමැත.
- ප්‍රජාව සඳහා නෛතික අධිකාරිය, පිළිගැනීම මෙන්ම පුද්ගලික ප්‍රතිලාභ නොමැතිවීම හෝ ප්‍රමාණවත් නොවීම තුළින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සඳහා ප්‍රජා සහභාගීත්වය කෙරෙහි නිෂේධනාත්මක බලපෑමක් ඇතිකර තිබේ.
- ප්‍රාදේශීය ආයතනවල ව්‍යුහයේ හා ක්‍රියාකාරීත්වයේ විනිවිදභාවයක් නොමැති වීම තීරණ ගැනීමේ ක්‍රියාවලිය හා ප්‍රතිලාභ බෙදාහැරීම කෙරෙහි නිෂේධනාත්මක අයුරින් බලපෑමක් ඇතිකර තිබේ.
- ප්‍රජාවගේ බලපෑම ඇගයීමට අපොහොසත් වී තිබීම සහ සහභාගිත්ව හා එකඟතා මත පදනම් වූ සම්පත් පාලනයක් සඳහා කණ්ඩායම් අතර විෂමජාතීය ස්වභාවයක් පැවතීම.
- විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ දී බහුවිධ පාර්ශවකාර කණ්ඩායම් සමග එකඟතා ඇතිකර ගැනීමේ ක්‍රියාවලිය තුළ සහභාගිත්ව සහ එකඟතාවයන් ගොඩනැංවීමේදී පුළුල් පරාසයක එකිනෙකට වෙනස් වූ සාධක බලපෑම් ඇතිකරන බව විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණය පිළිබඳ අතීත අත්දැකීම්වලින් අනාවරණය වේ.

විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණයේ දී ප්‍රාදේශීය මට්ටමේ සහභාගිත්ව කළමනාකරණ ක්‍රියාවලියක් සඳහා මඟ පෙන්වීමක් ජාතික ප්‍රතිපත්ති ලේඛන මගින් ලබාදී තිබුණ ද, තීරණ ගැනීමේ ක්‍රියාවලිය මධ්‍යම රජයේ ආයතන සතුව පැවතීම සහ ප්‍රමාණවත් ආයතනික පසුවිපරමක් සහ ඵලදායි සමාජ සජීවීකරණයක් නොපැවතීම තුළ ප්‍රබල ප්‍රාදේශීය සංවිධාන ඉස්මතුවීමක් සිදු නොවීය.

5.2.2 සඵලතාවය සහ බලපෑම්

- දිගු කාලීන තිරසරබව හා සඵලතාවය සහතික කිරීම සඳහා, විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සමස්ත ජාතික මට්ටමේ වෙරළ සම්පත් කළමනාකරණ සැලසුම්කරණය හා කළමනාකරණ ප්‍රයත්නයේ කොටසක් විය යුතු බව අතීත අත්දැකීම්වලින් අනාවරණය වේ.
- විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ සමස්ත තත්ත්වය විමර්ශනය කිරීමේ දී වැඩි ස්ථාන සංඛ්‍යාවක දී ආසන්න වශයෙන් 50%ක සඵලතාවයක් පෙන්නුම් කර ඇත.(ශ්‍රී ලංකාවේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ වැඩසටහන ඇගයීම -2014).
- විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් ලෙස අනෙකුත් ආයතන විසින් ගන්නා ලද සංරක්ෂණ පිළියම්වල තත්ත්වය වැඩිදියුණුවී තිබේ. (ශ්‍රී ලංකාවේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ වැඩසටහන ඇගයීම -2014).
- වෙරළ සම්පත් කළමනාකරණයේ වැදගත්කම පිළිබඳව පවතින සමස්ත දැනුවත්භාවය පාර්ශවකරුවන් අතර සැලකිය යුතු ආකාරයෙන් ඉහළ ගොස් තිබේ.
- පාර්ශවකරුවන් සහ පරිසර උද්යෝගී ප්‍රජාව අතර සම්පත්වල හිමිකාරීත්වය පිළිබඳ හැඟීම විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය තුළින් ඇති විය.
- තිරසාරත්වය පිළිබඳ ඉස්මතු වූ ගැටලු හේතුකොට ප්‍රජාවන්ගේ සමාජ හා ආර්ථික යහ පැවැත්ම සහතික කිරීම සඳහා විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය යටතේ දියත් කළ ජීවනෝපාය සංවර්ධන ප්‍රයත්නයන්ගේ බලපෑම ඉතා අඩු මට්ටමක විය.
- තිරසරබව සහතික කරන අතර, පාර්ශවකරුවන් අතර පොදුවේ හෝ පුද්ගලික වශයෙන් ඉලක්ක කොට ක්‍රියාත්මක කළ ක්‍රියාකාරකම් මගින් විශාල බලපෑමක් ජනිත කොට ඇත.
- විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් සහ අත්කරගන්නා සත්‍ය ප්‍රතිඵල සැලකීමේ දී, විමර්ශනයට බඳුන්කළ විශේෂ කළමනාකරණ ප්‍රදේශවලින් බහුතර ස්ථාන සංඛ්‍යාවක් ආරම්භක අරමුණු අත්කරගෙන ඇතිබව අනාවරණය විය(ශ්‍රී ලංකාවේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ වැඩසටහන ඇගයීම -2014).

5.2.3 තිරසාරත්වය සහ අභියෝග :

තෝරාගත් විශේෂ කළමනාකරණ ප්‍රදේශ පිළිබඳව 2014 වර්ෂයේ දී සිදුකරන ලද ඇගයීම් අධ්‍යයනයට අනුව, පහත නිර්ණායක භාවිතා කරමින් තිරසාරත්වය මිනුම් කරන ලදී;

1. ව්‍යාපෘති කාලසීමාවෙන් පසුව ප්‍රජා සම්බන්ධීකරණ කමිටුවල ක්‍රියාකාරිත්වය
2. ව්‍යාපෘතිය මගින් ස්ථාපිත කළ ආයතනික යාන්ත්‍රණයේ අඛණ්ඩ පැවැත්ම
3. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා වූ අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලැබෙන මූල්‍යාධාරවල අඛණ්ඩ පැවැත්ම
4. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය මගින් හඳුන්වා දුන් ව්‍යාපෘති හා වැඩසටහන්වල ඉදිරි පැවැත්ම
5. ව්‍යාපෘතියෙන් පසු වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නියැලීම

- ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආයතනය කුමක් වුව ද, ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත කරන ලද ප්‍රජා සම්බන්ධීකරණ කමිටු ව්‍යාපෘතියෙන් පසු අක්‍රිය වී ඇත.
- අවස්ථා කිහිපයක දී හැර, විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සඳහා මූල්‍ය උපකාරයන් ව්‍යාපෘතියෙන් පසු අවධියේ නතර වී ඇත.
- අවස්ථා කිහිපයක දී හැර, ව්‍යාපෘති හා වැඩසටහන් ව්‍යාපෘති කාලසීමාවෙන් පසු කාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි වී ඇත.

ඉහත කරුණුවලට අමතරව පහත සඳහන් දුර්වලතා ද අතීතයේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ තිරසාරත්වය දුර්වල වීමට බලපාන ලදී.

- සංරක්ෂණ පිළියම් යෙදීමේ දී භාවිතා කරන ලද තාක්ෂණික විසඳුම්වල නොගැළපීම නිසා අහිතකර බලපෑම් ඇතිවීම.
- අනෙකුත් ක්ෂේත්‍රවලට අදාළ ප්‍රතිපත්තිවල බලපෑම් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ තිරසාරත්වයට තර්ජන ඇති කරමින් අහිතකර ආකාරයෙන් බලපා තිබේ.

- විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සමග සක්‍රීය ආකාරයෙන් සම්බන්ධ වූ ප්‍රජා මූල සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධානයන්ගේ පැවති සීමාවන් ප්‍රධාන අරමුණු සාක්ෂාත් කරගැනීම වැළැක්වීය.
- පාරිසරික තක්සේරු ඇගයීම ප්‍රමාණවත් පරිදි භාවිතා නොකිරීම හේතුකොටගෙන විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සඳහා නව ආර්ථික ප්‍රතිපත්ති ගැළපීමට විශාල අභියෝගයක් වීම.
- දැනට පවතින නෛතික විධිවිධානවලට අනුකූලව ආයතනික යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ තිරසරබව සහතික කිරීම සඳහා ප්‍රබල අභියෝගයක් වනු ඇත.

**5.3 සහයෝගීතාවය සඳහා ඉඩ සැලැස්වීම: විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා නව නෛතික විධිවිධාන**

විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය වෙරළ සම්පත් කළමනාකරණය සඳහා ප්‍රබල සහයෝගීතා ප්‍රතිපත්තියක් ලෙස හඳුනාගෙන තිබෙන අතර එමගින් ප්‍රතිපත්ති හා නෛතික රාමුව ශක්තිමත් කිරීම ඔස්සේ පුළුල් සහභාගීත්වයක් සහ සහයෝගිතාවයක් සඳහා පහසුකම් සලස්වයි. 2011 වර්ෂයේ දී ප්‍රතිපත්ති හා නෛතික රාමුව ශක්තිමත් කළ ද, රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හා රාජ්‍ය නොවන සංවිධාන හා ආධාර ප්‍රදාන නියෝජිතායතනවල කැපවීම හා නියැලීම අඩු මට්ටමක පැවතීම හේතුවෙන් මෑතකාලීනව ක්‍රියාත්මක වීමේ තත්ත්වයේ දුර්වල කාර්යසාධනයක් පෙන්නුම් කෙරේ.

2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතේ IIIඇ කොටස හරහා අවශ්‍ය විධිවිධාන සලස්වා ඇති හෙයින් ශ්‍රී ලංකාවේ වෙරළ සම්පත් කළමනාකරණය සඳහා තිරසර සහ ඵලදායි අතිරේක සැලසුම්කරණ මෙවලමක් ලෙස විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා නව අවස්ථාවන් එමගින් ඇතිකර තිබේ. එමෙන්ම, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මඟ පෙන්වීම යටතේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණයේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී රාජ්‍ය නොවන සංවිධාන හා ආධාර ප්‍රදාන නියෝජිතායතන වැනි අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශවයන් සෘජු කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

පනතේ නව විධිවිධාන (22ඉ. (1) වගන්තිය) යටතේ, වෙරළ කලාපය ඇතුළත වූ හෝ වෙරළ කලාපයට යාබදව හෝ වෙරළ කලාපය සහ යාබද ඉඩම් ප්‍රදේශ යන දෙකෙන්ම සමන්විත වූ ප්‍රදේශයක් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින් විශේෂ කළමනාකරණ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලැබිය හැකිය. අර්ථකථනය කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශයන්හි සම්පත් කළමනාකරණය සහ සැලසුම් කිරීමට සහයෝගීතා ප්‍රවේශයක් යොදා ගැනීමට ද නව නෛතික විධිවිධාන මගින් හඳුනාගෙන තිබේ. එමෙන්ම නව නෛතික විධිවිධාන අනුව විශේෂ කළමනාකරණ ප්‍රදේශ ප්‍රකාශයට පැමිණවීමට හැක්කේ එම ස්ථාන සංශෝධිත පනතේ විධිවිධාන යටතේ පිළියෙල කරන ලද වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මට ඇතුළත් කර ඇත්නම් පමණි.

විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණය හා කළමනාකරණය සඳහා ඵලදායි ආයතනික ව්‍යුහයක් සම්පාදනය කිරීම සඳහා නව රෙගුලාසි, 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතේ IIIඇ කොටසේ, 22ඉ (2) උපවගන්තිය යටතේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව පිළියෙළ කළ යුතුය. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා, රෙගුලාසි සම්පාදනය කොට පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය. යම් විශේෂ කළමනාකරණ ප්‍රදේශයක් පරිපාලනය කළයුතු ආකාරය හා ක්‍රමය, හා එය කළ යුතු තැනැත්තන් ද, ඒ ප්‍රදේශවලට ප්‍රවේශයට හිමිකම ඇති තැනැත්තන් සහ ඒ ප්‍රදේශ ඇතුළත කළහැකි කටයුතු ද නිශ්චය කරමින් නව නියෝග සකස් කළ යුතු ය (22ඉ (2) වගන්තිය).

ඒ අනුව, විශේෂ කළමනාකරණ ප්‍රදේශයට අදාළ ප්‍රජාව සහ එම ක්‍රියාවලියට සෘජුවම සම්බන්ධ තැනැත්තන්, රජයේ මෙන්ම රජයේ නොවන ප්‍රාදේශීය ආයතන, බාහිර ප්‍රතිලාභීන් සහ මධ්‍යම රජයේ ආයතන ඇතුළු පාර්ශවකරුවන්ගේ ඵලදායි සහභාගීත්වය සමගින් දැනට පවත්නා නෛතික විධිවිධාන විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත යුතුය.

**5.4 විශේෂ කළමනාකරණ ප්‍රදේශ ශක්තිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම කළ යුත්තේ ඇයි ද යන්න**

ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ වෙරළ සම්පත් කළමනාකරණය සඳහා වඩාත් ඵලදායී සහ සාධ්‍ය ප්‍රවේශය ලෙස සහභාගීත්ව කළමනාකරණ මූලධර්ම මත පදනම් වූ විශේෂ කළමනාකරණ ප්‍රදේශ සංකල්පය සලකනු ලබයි. අනෙකුත් ප්‍රවේශයන් සමග සංසන්දනය කිරීමේදී, මෙම සංකල්පය මගින් වෙරළබඩ පරිසර පද්ධති සහ වෙරළ හා සමුද්‍රීය භාවිතයන් සමග ඇති සංකීර්ණ සබඳතාවය නිසි පරිදි පිළිගනු ලැබේ. ස්වභාවධර්මයේ භෞතික ක්‍රියාවලීන් සහ විවිධ ආකාරවල වෙරළබඩ ක්‍රියාකාරකම් අතර සබැදියාව සහ සුසංයෝජනය විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය මගින් ප්‍රවර්ධනය කෙරේ. මානව පද්ධති මෙන්ම වෙරළබඩ සම්පත් පද්ධති යන දෙකම පිළිබඳව නම්‍ය වූ කළමනාකරණය මගින් නිසි අවධානය යොමු කරවයි. ඒකාබද්ධ වෙරළ සම්පත් කළමනාකරණය සඳහා අතිරේක මෙවලමක් ලෙස විශේෂ කළමනාකරණ ප්‍රදේශ යොදාගැනීමේ ප්‍රධාන බලපෑම් සාධක පහත සඳහන් පරිදි සාරාංශගත කෙරේ;

නිශ්චිත භූගෝලීය ප්‍රදේශයක් තුළ වෙරළ සම්පත්වල තිරසර කළමනාකරණය ප්‍රවර්ධනය කිරීමේ ඵලදායි මෙවලමක් ලෙස විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සැලකිය හැකි අතර එමඟින් වඩාත් සංකීර්ණ කළමනාකරණ ගැටලු වඩාත් පුළුල් හා කාර්යක්ෂම ආකාරයෙන් විසඳිය හැකිවනු ඇත.

- 1980 දශකයේ අග භාගයේ පමණ සිට අනුගමනය කළ විමධ්‍යගත කිරීමේ ප්‍රතිපත්ති සහයෝගාත්මක කළමනාකරණය ක්‍රියාත්මක කිරීම සඳහා සාධනීය අයුරින් දායක විය.
- වෙරළබඩ සම්පත් හායනය, ප්‍රමාණය ඉක්මවා උපයෝජනය කිරීම හා භාවිතාකරුවන් අතර ගැටලු අවම කිරීම සඳහා මෙරටට ආවේණික හා පාරම්පරික තිරසර සම්පත් කළමනාකරණ පරිචයන් නෛතික සහ පුළුල් පාලන රාමුව තුළ විධිමත් කිරීමේ අවශ්‍යතාවය පිළිගැනීම.
- පොදු හෝ රජයේ අයිතිය යටතේ පවත්නා වෙරළබඩ සම්පත්වල ගති ලක්ෂණ සහ ඒවා වෙත ඇති විවෘත පිවිසුමේ වත්මන් තත්ත්වය වෙරළබඩ සම්පත් කළමනාකරණය සඳහා දැඩි අභියෝගයන් ඉදිරිපත් කරයි.
- මානව ක්‍රියාකාරකම් මෙන්ම ස්වාභාවික සංසිද්ධි හේතුවෙන් පරිසර පද්ධති ශීඝ්‍රයෙන් හායනයට ලක්වන අතර ඒ සඳහා භාවිතාකරුවන් කේන්ද්‍ර කොටගත් කළමනාකරණ ප්‍රවේශයන් ඉතා වැදගත් වේ.
- සමුද්‍රීය හා වෙරළබඩ සම්පත් ප්‍රමාණය ඉක්මවා භාවිතා කිරීම සහ දුගීබව ව්‍යාප්ත වීමට එරෙහිව විධිමත් සහ ඵලදායි ප්‍රවේශයක අවශ්‍යතාවය.
- ප්‍රාදේශීය මට්ටමේ කළමනාකරණ මැදිහත්වීම් සඳහා පහසුකම් සැපයීම සහ ජාතික මට්ටමේ වෙරළබඩ සම්පත් කළමනාකරණ ප්‍රතිපත්ති සහ රෙගුලාසි සමග අනුකූලතාවය හා සංසත බව පවත්වාගෙන යාම.
- සම්පත් කළමනාකරණ තීරණ ගැනීමේ දී නීත්‍යානුකූලභාවය හා විනිවිදබව කෙරෙහි ප්‍රජාවේ පවතින ඉල්ලුම.
- වෙරළ කලාපය තුළ සිදුවෙමින් පවතින නව සංවර්ධන ක්‍රියාකාරකම්වලට සමගාමීව ඉහළ යමින් පවත්නා භාවිතාකරුවන් අතර පවතින ගැටුම් අවම කිරීම.
- වෙරළ සම්පත් තිරසර ආකාරයෙන් කළමනාකරණය කිරීමට හැකිවන පරිදි සිවිල් සමාජය, ප්‍රජාව හා ප්‍රජාමූල සංවිධාන සවිබලගැන්වීමේ සහ හිමිකාරීත්වය පිළිබඳ හැඟීමක් ගොඩනැංවීමේ අවශ්‍යතාවය.
- වෙරළබඩ සම්පත් භාවිතයට අදාළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් අවධානය යොමුකිරීම.
- ස්ථාන නිශ්චිත වෙරළබඩ පරිසර ගැටලු විසඳීම සඳහා තිරසර ජීවනෝපාය සංවර්ධන උපනතීන් බද්ධ කිරීම.
- ස්වභාවික විපත්වලට එරෙහිව වෙරළබඩ ප්‍රජාවගේ දරා ගැනීමේ හැකියාව බලනැංවීම හා අන්තරායන් අවම කිරීම.
- දේශපාලන හා පරිපාලන ක්ෂේත්‍රය තුළ මෑතක දී අනුගමනය කළ විමධ්‍යගත ප්‍රතිපත්ති පිළිබඳව ප්‍රජාව තුළ ධනාත්මක දැක්මක් ඇතිකිරීම සහ විශේෂ කළමනාකරණ ප්‍රදේශ ප්‍රවේශය හරහා ඵලදායි හා තිරසර වෙරළබඩ සම්පත් කළමනාකරණයට හිතකර පරිසරයක් ඇති කිරීම.

### 5.5 ව්‍යාපෘතිපාදක ප්‍රවේශයෙන් වඩාත් වැඩසටහන් අභිමුඛ ප්‍රවේශයකට විස්ථාපනය වීමේ අවශ්‍යතාවය

ශ්‍රී ලංකාවේ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ අනෙකුත් නියෝජිතායතන මගින් දශක දෙක හමාරකට අධික කාලයක් මුළුල්ලේ දියත් කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීම සම්පූර්ණයෙන්ම ව්‍යාපෘති පදනමක් මත සිදු කෙරෙණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල සහ එහි දිගු කාලීන තිරසරභාවය ගැටලුකාරී විය. මෙම තත්ත්වය විධිමත් නෛතික හා ආයතනික රාමුවක් නොමැතිවීම හේතුකොටගෙන තවදුරටත් සංකීර්ණ විය. ඒතුළින්, මෙම ව්‍යාපෘති ක්‍රියාත්මකවීම අවසන්වීමෙන් පසු පහසුකම් සපයනු ලබන ප්‍රධාන ආයතනයන්ගේ දිගුකාලීන කැපවීම ද නතරවී තිබේ. එමෙන්ම, මෙම ක්‍රියාවලිය තුළ නියැලෙන රාජ්‍ය නොවන සංවිධාන වැනි ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාවලියට සහභාගී වූ ආයතනවලට ද මූල්‍ය දුෂ්කරතා සහ අධිකාරි බලය, ධාරිතාවයන් නොමැති වීම මෙන්ම නෛතික හා පරිපාලන වශයෙන් පිළිගැනීම නොමැතිවීම හේතුකොටගෙන එම කටයුතු අඛණ්ඩව ඉදිරියට ගෙනයාමට අපහසු විය.

ක්‍රියාත්මක කිරීමේ අත්දැකීම් අනුව ව්‍යාපෘති අවසන් වීමෙන් පසුව පසුවිපරම් ක්‍රියාවලීන්, සංරක්ෂණ සහ ජීවනෝපාය ඉහළ නැංවීම වැනි පශ්චාත් ව්‍යාපෘති කටයුතු එකවර නැවතී ඇති බව පෙනී ගොස් ඇත. එබැවින් නව නීතී පදනම් කොට යෝජිත රෙගුලාසි උපයෝගී කරගනිමින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ප්‍රවේශයට අදාළ සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම වඩාත් වැඩසටහන් මත පදනම් වූ ප්‍රවේශයක් වෙත සහභාගීත්ව කළමනාකරණ මූලධර්මයන් සහ මාර්ගෝපදේශයන් යොදාගනිමින් ස්ථාපිත විය යුතුය. මෙහිදී නෛතික වශයෙන් ප්‍රකාශයට පත්කළ විශේෂ කළමනාකරණ ප්‍රදේශවල සංරක්ෂණ අරමුණු සහ සංවර්ධන අවශ්‍යතා තුලනය කළ යුතු ය. ඉහත කරුණු සලකා බැලීමේ දී ස්ථානයේ සිටින ප්‍රජාවගේ සක්‍රීය සහභාගීත්වය හඳුනාගනිමින් වැඩසටහන් ප්‍රවේශයක් යොදා ගත යුතුය. ඒ අනුව ඵලදායී ප්‍රතිඵල අපේක්ෂා කරමින් විශේෂ කළමනාකරණ වැඩසටහන පවත්නා නෛතික විධිවිධානවලට අනුකූලව පහත සඳහන් යොමු රීතී සහ යෝජිත රෙගුලාසි අනුව සම්පාදනය වනු ඇත.

අ) වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව තුළ අධ්‍යක්ෂ/ වෙරළ සම්පත් කළමනාකරණ යටතේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ සම්බන්ධයෙන් වෙනම ඒකකයක් ස්ථාපනය කිරීම.

ආ) විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් සම්පාදනයට හා ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම රජයෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන ලැබීම සහතික කරගැනීම සඳහා වෙනම වැය ශීර්ෂයක් ස්ථාපිත කර ගැනීම.

ඇ) නම් කරන ලද ස්ථානයන්හි ප්‍රජාවට තීරණ ගැනීමේ අධිකාරිය ලබාදීමටත් ප්‍රජා සහභාගීත්වයේ නීත්‍යානුකූලභාවය තහවුරු කිරීමටත් නව රෙගුලාසි සකසනු ඇත.

ඈ) විශේෂ කළමනාකරණ ප්‍රදේශ කමිටු සඳහා නියෝජිතයන් තෝරාගැනීමේ දී විශේෂ කළමනාකරණ කමිටු සහ බිම් මට්ටමේ ක්‍රියාදාමය සඳහා නෛතික පිළිගැනීම ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය පිළිගනු ඇත.

ඉ) විශේෂ කළමනාකරණ ප්‍රදේශ කමිටු සඳහා නව රෙගුලාසි යටතේ මෙහෙයුම් රීති හෝ ආචාර ධර්ම සංග්‍රහයක් සම්පාදනය කරනු ඇත.

ඊ) විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම සඳහා කලාපීය රටවල් සමග සහභාගීත්ව කළමනාකරණයේ අත්දැකීම් බෙදාගැනීම සඳහා වැඩපිළිවෙලක් යොදනු ඇත.

උ) හඳුන්වා දුන් නව නිර්ණායක මත පදනම්ව විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලැයිස්තුවක් සකස් කොට එය මෙම වෙරළ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම තුළට ඇතුළත් කිරීම.

කොරෝනා වසංගත තත්ත්වය සහ ඒ හේතුවෙන් දිගු කාලසීමා සඳහා ක්‍රියාත්මක වූ රට අගුල් දැමීමේ ක්‍රියාවලිය ඇතුළු කරුණු රාශියක් හේතුවෙන් සහ සැලසුම ක්‍රියාක්මක කිරීමේ අවසාන කාල සීමාවේදී මුහුණ දුන් සාර්ව ආර්ථික ගැටලු හේතුවෙන්, 2018 සැලැස්මේ සැලසුම්ගත ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ ඉහත නිර්දේශ ක්‍රියාත්මක කිරීම සාර්ථක කරගැනීමට නොහැකි විණි.

ඉහත නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නොහැකි වුව ද, ඵලදායි ප්‍රතිඵල සඳහා මෙම සැලැස්ම ක්‍රියාත්මක කරන කාලසීමාව තුළ වුව ද එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වලංගුතාවය හා අවශ්‍යතාවය තවමත් පවතී.

## 5.6 විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා සඵලතාවය වැඩිදියුණු කිරීම

විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සැලසුම්කරණය, ක්‍රියාත්මක කිරීම හා අඛණ්ඩව පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් යම් බාධක හා අඩුපාඩු පැවතිය ද, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන අදියර 02ක් යටතේ ක්‍රියාත්මක කළ විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය ඔස්සේ ඒකාබද්ධ වෙරළ කළමනාකරණ ක්‍රමවේදයක් ලෙස එහි ඵලදායීතාවය සහ ගැළපීම හඳුනාගෙන තිබේ. එමෙන්ම, ලබාගත් අත්දැකීම් අනුව විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් තුළින් වඩා යහපත් ප්‍රතිඵල ලබාගැනීම සඳහා සිදුකළ යුතු වෙනස්කම් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබේ. සංකීර්ණ පාරිසරික තත්ත්වයන් තුළ වෙරළ සම්පත් හා ඒවායේ පරිසරය කළමනාකරණය සඳහා ඵලදායි ප්‍රවේශයක් ලෙස පැහැදිලිව මෙය හඳුනාගෙන තිබුණ ද, මෙම පරිච්ඡේදයේ ඉහතින් දක්වන ලද ආකාරයට පවතින විවිධ දුර්වලතා හා බාධක හේතුවෙන් මෙම කළමනාකරණ ක්‍රියාවලියෙන් උපරිම ප්‍රතිලාභ අත්පත් කරගැනීමට දුෂ්කර වී තිබේ. මීට අමතරව, විශේෂ කළමනාකරණ ප්‍රදේශ ප්‍රවේශයේ තිරසරභාවය සංකීර්ණ තත්ත්වයකට පත්වන ලදී.

ව්‍යාපෘති සඳහා වන බාහිර මූල්‍යාධාර (USAID,ADB - GON) යටතේ මූලික වට දෙකක් තුළ දී ව්‍යාපෘති පදනම මත දියත් කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ස්ථාන 12ක දී සිදුකරන ලදී. අනෙකුත් විශේෂ කළමනාකරණ වැඩසටහන් හම්බන්තොට ඒකාබද්ධ වෙරළ කලාප කළමනාකරණ ව්‍යාපෘතිය (HICZMP) සහ (UNDP/GEF) ව්‍යාපෘතිය මගින් අනෙකුත් නම් කරන ලද ස්ථානයන්හි විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන ලද අතර ඒවායේ වටිනා අත්දැකීම් මෙම ප්‍රවේශය ශක්තිමත් කිරීම සඳහා ලබා දී ඇත. තවද, විශේෂ කළමනාකරණ ප්‍රදේශ සංකල්පය සහ ශ්‍රී ලංකාව තුළ එය සැලසුම්කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව විද්වතුන් විසින් කරන ලද සවිස්තරාත්මක විමර්ශනයක් සහ ඇගයීම් ද නව මාර්ගෝපදේශ සහ කාර්යපටිපාටි සම්පාදනය සඳහා ප්‍රයෝජනවත් විය. ඊට අමතරව වඩාත් වැදගත් වනුයේ, විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ සඵලතාවය ඉහළ නැංවීම සඳහා 2011 අංක 49 දරන වෙරළ කළමනාකරණ (සංශෝධන) පනත මගින් හඳුන්වාදී ඇති නව නෛතික විධිවිධානයන්ය.

ලෝක පරිසර සංරක්ෂණ සංගමය (IUCN) කොළඹ කාර්යාලය මගින් 2009 දී ශ්‍රී ලංකාවේ කඩොලාන පිළිබඳ අනාගතය (MFF) වැඩසටහනේ ජාතික මෙහෙයුම් කමිටුව සඳහා සම්පාදනය කරන ලද ජාතික ක්‍රමෝපාය සහ ක්‍රියාකාරී සැලැස්ම මගින් පරිසර පද්ධති මත පදනම් වූ ඒකාබද්ධ වෙරළ සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තියක් යොදාගැනීම නිර්දේශ කොට ඇත. මෙවැනි වෙනසක් කළ හැක්කේ ප්‍රතිපත්තිමය වශයෙන් මෙම නිර්දේශයන් ඉහළම මට්ටමින් පිළිගැනීමක් වෙරළ සංරක්ෂණ පනත ඒ ආකාරයට ගැළපෙන ලෙස වෙනස් කිරීමක් මගිනි. මේ පිළිබඳව අවධානය ඉදිරි වසර කිහිපය තුළ මෙම සැලැස්ම යාවත්කාලීන කරනු ලබන අවස්ථාවේ දී සැලකිල්ලට භාජනය කළ හැක.

විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණයේ මූලික අවශ්‍යතා පිළිබඳ අවබෝධයක් මත පදනම්ව ප්‍රධාන ගැටලු කිහිපයක් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම, විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණයේ සඵලතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය කෙරේ:

- පූර්ව - සැලසුම් අදියර

1. රටෙහි සමස්ත විශේෂ කළමනාකරණ ප්‍රදේශ වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ව්‍යාපෘති පාදක ප්‍රවේශයේ සිට වැඩසටහන් පාදක ප්‍රවේශය වෙත විතැන් වීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු ය.
2. 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතෙහි අන්තර්ගත නව නෛතික විධිවිධාන අනුව, නව නිර්ණායකයන් පදනම් කොට විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා යෝග්‍ය ස්ථාන ලැයිස්තුවක් සකස්කොට එය මෙම සැලැස්මට ඇතුළත් කළ යුතු ය.
3. ප්‍රමුඛතාවයන් හඳුනාගැනීම සඳහාත් විශේෂ කළමනාකරණ ප්‍රදේශයේ නෛතික සීමාවන් නිර්ණය කිරීම සඳහාත් එක් එක් ස්ථානයක් සඳහාම මූලික තත්ත්ව විශ්ලේෂණ වාර්තාවක් සකස් කළ යුතු ය.
4. වඩාත් පුළුල් පාර්ශකරුවන්ගේ උපදේශනත්වය සහිතව නව නීතිරීතිවලට අනුකූලව විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා නව නියෝග සකස් කළ යුතු අතර *ගැසට්* කිරීම සඳහා අනුමැතිය ලබාගත යුතු ය.
5. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යභාරය පවරා ගත යුතු අතර විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකුගේ ප්‍රධානත්වයෙන් වෙනම අංශයක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපනය කර වෙනම වැය ශීර්ෂයක් පවත්වා ගත යුතු වේ.
6. වෙරළ කලාපයේ දැනට පවතින හා ඉදිරි සමාජ පාරිසරික සහ ආර්ථික ප්‍රවණතා සැලකිල්ලට ගෙන නව නෛතික විධිවිධාන සහ රෙගුලාසි මත පදනම්ව විශේෂ කළමනාකරණ ප්‍රදේශ පිළිබඳ මාර්ගෝපදේශ ඇතුළත් අත්පොතක් සකස් කළ යුතු ය.

- සැලසුම්කරණය අදියර

1. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා නිශ්චිත සැලැස්මක් නොමැති අතර සෑම ස්ථානයක්ම එකිනෙකින් වෙනස් නිශ්චිත ඒකාබද්ධ ක්‍රමවේදයක් යොදා ගැනීම අවශ්‍ය සුවිශේෂී බවකින් සැලකිය යුතු ය; එක් එක් ස්ථානය සඳහා නිශ්චිත වූ ගැටලු, ආවරණය විය යුතු ප්‍රදේශය යනාදිය මත පදනම්ව සැලසුම්කරණය සිදුකළ යුතු ය.
2. තත්ත්ව විශ්ලේෂණය සිදුකිරීමේ දී සමාජ හා ආයතනික පැතිකඩ කෙරෙහි සමාන අවස්ථා අවධාරණය කළ යුතු ය.
3. ව්‍යාපෘති ප්‍රදේශයේ ප්‍රමාණය කුඩා වන තරමට සාර්ථකත්වයේ හැකියාව ඉහළ මට්ටමක පවතී. එබැවින්, විශේෂ කළමනාකරණ ප්‍රදේශයක් ලෙස යම් ප්‍රදේශයක් *ගැසට් පත්‍රය* මඟින් ප්‍රකාශයට පත්කිරීමට පූර්වයෙන් මූලික තත්ත්ව විශ්ලේෂණය මගින් ලැබෙන තොරතුරු අනෙකුත් පාර්ශවකරුවන් සමග උපදේශකත්වයෙන් ලැබෙන තොරතුරු මත පදනම්ව විශේෂ කළමනාකරණ ප්‍රදේශයේ නෛතික සීමාවන් විශේෂ කළමනාකරණ ප්‍රදේශ කමිටුව විසින් නිර්ණය කළ යුතු ය. එසේ වුව ද, විශේෂ කළමනාකරණ ප්‍රදේශ ස්ථානය හා එය පිහිටන පරිසර පද්ධතිය අතර ඇති සබඳතා පැහැදිලිව හඳුනාගත යුතු ය.
4. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා පවතින නව රෙගුලාසිවලට අනුකූලව විශේෂ කළමනාකරණ ප්‍රදේශ කමිටුව ස්ථාපනය කළ යුතු අතර කමිටු සඳහා නියෝජිතයන් තෝරා ගැනීමේ දී බිම් මට්ටමේ ස්වාධීන තේරීමේ ක්‍රියාවලියක් අනුගමනය කිරීම මගින් ප්‍රාදේශීය අභිලාෂයන් ආරක්ෂා කිරීම තහවුරු කළ යුතුය.
5. රෙගුලාසිවලට අනුකූලව විශේෂ කළමනාකරණ ප්‍රදේශ කමිටු සඳහා මෙහෙයුම් නීතී මාලාවක් සහ චර්යා සංග්‍රහයක් සකස් කිරීම, ගැටලු හඳුනාගැනීම, තීරණ ගැනීම, අරමුදල් කළමනාකරණය, පළාත් සභා සහ මධ්‍යම රජයේ නියෝජිතායතන සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවලින් සහාය ලබාගැනීම ආදිය පිළිබඳව මෙම මෙහෙයුම් නීති අනුගමනය කළ යුතුය.
6. විශේෂ කළමනාකරණ ප්‍රදේශ කමිටු රැස්වීම් තීරණ, සාකච්ඡා සටහන්, තීරණ ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධ තොරතුරු සටහන් සියල්ල ප්‍රාදේශීය භාෂාවන්ගෙන් (සිංහල හෝ දෙමළ) පිළියෙළ කළ යුතුය.
7. සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළ ගන්නා සියලුම තීරණ පැහැදිලි විය යුතු අතර නිසි පරිදි ලේඛනගත විය යුතු ය; බැඳුනු සියලුම තීරණ එකී ක්‍රියාවලිය තුළ සහභාගීත්වය දරන සියලුම පාර්ශවයන් වෙත පැහැදිලිව සන්නිවේදනය විය යුතු අතර සියලු දෙනා විසින් එම තීරණ පිළිපැදීමෙන් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියට බාධාවන අවිශ්වාසය ඉවත් කළ හැකිය.

- ක්‍රියාත්මක කිරීමේ අදියර

1. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සහ පසුවිපරම් කිරීමේ භූමිකාව ඉටුකරන නියෝජිතායතන සහ රාජ්‍ය නොවන සංවිධාන ඔවුන්ගේ එකී කාර්යය භාරය කිරීමටත්, අදාළ ක්‍රියාකාරකම් ඔවුන්ගේ වාර්ෂික වැඩසටහන්වලට ඇතුළත් කිරීමටත් අනුග්‍රහයක් දැක්විය යුතුය.

2. ප්‍රාදේශීය සංවිධාන, ඒවායේ සංවිධාන ව්‍යුහය හා ඒවායේ මෙහෙයුම් නීති ශක්තිමත් කිරීමට උත්සහ කළ යුතු අතර එමගින් විනිවිදභාවය, නායකත්වය, සාමාජිකත්වය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම අපේක්ෂා කරනු ලබයි.

3. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීමේ සෘජු සාර්ථකත්වය රඳාපවතින්නේ සියලු අදියරයේ දී සියලු නියෝජිත පාර්ශ්වකරුවන්ගේ සක්‍රීය සහභාගීත්වය මතය. මෙය අහිතකර බලපෑම් සඳහා ප්‍රතික්‍රියාකාරීත්වය දැක්වීම සඳහා ද ඉතා වැදගත් වේ.

4. සැලසුම් අදියරේ දී ප්‍රාදේශික මට්ටමේ ආයතනික සංවර්ධනය ආරම්භ කිරීමේ දී අලුතින් ආරම්භකළ/ දැනට පවතින සංවිධාන සහ ප්‍රාදේශීය/ මධ්‍යම රජයේ නියෝජිතායතන අතර තිරස් හා සිරස් සබඳතා යන දෙවර්ගයම ඇති කර ගැනීම/ ශක්තිමත් කරගැනීම සඳහා අවධානය යොමුකළ යුතු ය.

5. සම්පත් සහ ජීවනෝපාය ආශ්‍රීතව ප්‍රාදේශීය සංවිධාන/ ආයතන ස්ථාපනය කිරීම වෙනුවට ප්‍රජා මූලයන් ප්‍රවර්ධනය කළ යුතු ය.

6. ස්වාභාවික සම්පත් කළමනාකරණය සඳහා ප්‍රාදේශීය ප්‍රජාවන් සක්‍රීය කිරීමට විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ ආරම්භයේ සිටම ඔවුන්ට දැනෙන ප්‍රතිලාභ අත්කර ගැනීමට අවස්ථාවක් තිබිය යුතුය.

7. සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා සංවිධාන ධාරිතාවලින් ශක්තිමත් කිරීමට අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික ආධාර ලබාදීමෙන් විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් ක්‍රියාවලියේ ආරම්භක අදියරේ දී ප්‍රජාවට උපකාරී විය යුතුය. ඔවුන්ගේ ප්‍රදේශයේ සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා දිගුකාලීන මූල්‍යාධාර අවශ්‍ය විය හැකි ය.

8. බාහිර සහාය මත රඳා පැවතීම අවම කිරීම සඳහා ස්වශක්තීන් ප්‍රවර්ධනය කිරීම සඳහා යාන්ත්‍රණයක් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියට ඇතුළත් කළ යුතුය.

9. සහයෝගීතාවය හා ජාතික හා කලාපීය සංවර්ධන සැලසුම් සමග අනුකූලතාවය සඳහා හැකි සෑම අවස්ථාවකදී ම විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය දිස්ත්‍රික්, පළාත් සහා සංවර්ධන සැලසුම්වලට හෝ ප්‍රාදේශීය සැලසුම්වලට අන්තර්ගත කළ යුතු ය.

10. සහභාගිත්ව සුපරීක්ෂණය සහ පසු විපරම් පද්ධතියක් ඇතුළත් කිරීමේ යාන්ත්‍රණයක් සියලු විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්වල තිබිය යුතුය. මෙම පසු විපරම් සඳහා දර්ශකයන් ව්‍යාපෘති සැලසුම් අදියරයේ දී හඳුනාගත යුතුය. මෙමගින් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කළ හැකි අතර ප්‍රතිඵල දැනෙන අයුරින් සකස් කර ගත හැක.

### 5.7 විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම සඳහා යාන්ත්‍රණ

- **විශේෂ කළමනාකරණ ප්‍රදේශ ස්ථාන හඳුනාගැනීම හා ඒ සම්බන්ධ එකඟතාවය සඳහාः 1997, 2004 හා 2018 වර්ෂවලදී සංශෝධනය වූ වෙරළ කලාප කළමනාකරණ සැලැසුම් මගින් ලබාගන්නා ලද අත්දැකීම්**

ඒකාබද්ධ වෙරළ කළමනාකරණය පිළිබඳ අතිරේක ක්‍රමවේදයක් ලෙස විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය පිළිගැනීමෙන් සහ විධිමත් කිරීමෙන් අනතුරුව 1997 වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම මගින් විශේෂිත සංකීර්ණ ගැටලු විසඳීමට ඇති විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස ස්ථාන 23ක් හඳුනාගන්නා ලදී. එම එක් එක් ස්ථාන විශේෂ කළමනාකරණ ප්‍රදේශ ස්ථාන ලෙස හඳුනාගැනීමෙන් අනතුරුව, ඒ සෑම ස්ථානයක්ම නිර්ණායකයන් 04ක් යොදාගනිමින් ශ්‍රේණිගත කරන ලදී. වැඩිම මුළු ලකුණු ලබාග න්නා ස්ථාන ප්‍රමුඛතාවය අනුව පෙළගස්වා ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ කරන ලදී. පහත දැක්වෙන පරිදි විශේෂ කළමනාකරණ ප්‍රදේශ ස්ථාන ශ්‍රේණිගත කිරීම සඳහා අතිරේක නිර්ණායකයන් පහක් ද යොදාගන්නා ලදී.

*විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාත්මක කිරීමේ දී විභව ස්ථාන ශ්‍රේණිගත කිරීම සඳහා යොදා ගන්නා නිර්ණායකයන්*

*අ) ස්ථානයේ පවතින සමාජ, ආර්ථික හා පාරිසරික ගැටලුවල උග්‍රබව*
*ආ) වෙරළබඩ පරිසර පද්ධතිවල ශාක හා සත්ත්ව ගහණයේ සාපේක්ෂ සාරවත්බව හා විවිධත්වය*
*ඇ) විශාලත්වය, ස්ථානය, නෛතික හා ආයතනික සාධක මත පදනම්ව කළමනාකරණය සඳහා වූ ශක්‍යතාවය*
*ඈ) ප්‍රදේශයේ පවත්නා හෝ තිබිය හැකි ආර්ථික සංවර්ධන වටිනාකම*
*ඉ) දේශගුණික විපර්යාසවල බලපෑමට නිරාවරණය වීම/අවදානම පිළිබඳ මට්ටම*
*ඊ) ඍතුමය වශයෙන් ඇතිවන හෝ කාලයක් මුළුල්ලේ පවතින වෙරළබඩ උපද්‍රව සඳහා අන්තරාය*
*උ) ස්ථානයෙහි පුරාවිද්‍යාත්මක සහ ඓතිහාසික වටිනාකමේ වැදගත්කම*
*ඌ) සංක්‍රමණික ජීවී විශේෂයන් පැවතීම*
*ඔ) ජීවී විශේෂවල ජාතික සහ ගෝලීය සංරක්ෂණ මට්ටම*

1997 වර්ෂයේ දී පිළියෙල කළ විශේෂ කළමනාකරණ විභව ස්ථාන පිළිබඳ ලැයිස්තුව අසම්පූර්ණ ලැයිස්තුවක් ලෙස සැලකෙන අතර මෙරට උතුරු හා නැගෙනහිර වෙරළ කලාපයේ පිහිටා ඇති ස්ථාන එහි ප්‍රමාණවත් අයුරින් නියෝජනය නොවීය. එවකට පැවති යුදමය වාතාවරණය හේතුවෙන් බිම් මට්ටමේ පැවති දුෂ්කර තත්ත්වය මත එවැනි ස්ථාන සඳහා ප්‍රවේශය, මහජන අදහස් විමසීම හෝ ස්ථාන හඳුනාගැනීම සිදුකළ නොහැකි විය. මෙම කලාපවල ප්‍රවේශ විය හැකි ස්ථානවල වුව ද අවශ්‍ය තොරතුරුවල අල්ප බව මෙම තත්ත්වය තවත් සංකීර්ණ කරන ලදී.

- **2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ(සංශෝධන)පනතේ නෛතික විධිවිධාන අනුව විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම**

1997 සහ 2004 සංශෝධිත වෙරළ කලාප කළමනාකරණ සැලසුම් මගින් හඳුනාගන්නා ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශ ඇතුළු දෙවන (II) මට්ටමේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා නෛතික පිළිගැනීමක් නොවූ අතර එම ස්ථාන ද සැලකිල්ලට ගෙන විශේෂ කළමනාකරණ ප්‍රදේශ නම් කළ හැකි ය. එබැවින්, විවිධ ව්‍යාපෘති යටතේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කොට ඇති ස්ථාන සහ යෝග්‍ය දෙවන (II) මට්ටමේ ස්ථාන ද ඇතුළුව සියලු විභව ස්ථාන මෙම සැලසුම තුළ ඇතුළත් කර 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනතේ III කොටසේ 22 ඉ වගන්තියේ විධිවිධාන යටතේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ යනුවෙන් නම් කර ප්‍රකාශයට පත්කළ හැකිය. මේ සම්බන්ධයෙන් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පහත කාර්ය පටිපාටි/ ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබේ.

- **ව්‍යාපෘති පාදක ප්‍රවේශය මගින් දැනටමත් ක්‍රියාත්මක කර ඇති විශේෂ කළමනාකරණ ප්‍රදේශ නැවත නම් කිරීම හා පුනර්ජීවනයඃ**

**විශේෂ කළමනාකරණ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම**

පහත වගුව 5.1 සහ වගුව 5.2 දැක්වෙන පරිදි, සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වී ඇති විශේෂ කළමනාකරණ ප්‍රදේශ නැවත වරක් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස ලැයිස්තු ගත කර 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ සංශෝධිත පනතේ නෛතික විධිවිධානවලට අනුකූලව රජයේ *ගැසට් පත්‍රයේ* පළකරන නිවේදනයක් මගින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට ක්‍රියාමාර්ග ගනු ඇත.

**නෛතික සීමා ස්ථාපනය කිරීම**

විශේෂ කළමනාකරණ ප්‍රදේශවල නෛතික සීමාවන් පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන නැවත සීමාවන් නිර්ණය කරනු ඇත;

- වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණ පිළිබඳ තත්ත්වය
- පැවති ගැටලු අනුව මීට පෙර ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්වල සාපේක්ෂ තත්ත්වය
- ස්ථානයේ සමාජ හා ආර්ථික පැතිකඩ
- ආර්ථික අවශ්‍යතා සමග සංරක්ෂණ අරමුණු තුලනය කිරීම
- දේශගුණික විපර්යාස බලපෑම් සඳහා නිරාවරණය වීම හා අන්තරායට ලක්වීම

**විශේෂ කළමනාකරණ ප්‍රදේශ සම්බන්ධීකරණ කමිටු ස්ථාපනය කිරීම (SMACC)**

2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතින් සංශෝධන කරන ලද 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත යටතේ සාදනු ලබන නව නියෝගවලට අනුව, පෙර පැවති ප්‍රජා සම්බන්ධීකරණ කමිටු වෙනුවට විශේෂ කළමනාකරණ ප්‍රදේශ සම්බන්ධීකරණ කමිටු පත්කරනු ඇත. මධ්‍යම රජයේ සහ පළාත් පාලන නියෝජිතායතන, ප්‍රාදේශීය මට්ටමේ සංවිධාන සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් මෙම විශේෂ කළමනාකරණ ප්‍රදේශ සම්බන්ධීකරණ කමිටු තුළ නියෝජනය වනු ඇත. නව රෙගුලාසිවල දක්වන පරිදි ප්‍රාදේශීය මට්ටමේ සංවිධානවල නියෝජිතයන් බිම් මට්ටමේ තේරීමේ ක්‍රියාවලියක් තුළින් තෝරාගනු ලැබේ. මෙම විශේෂ කළමනාකරණ ප්‍රදේශ සම්බන්ධීකරණ කමිටුවල සම සභාපතිත්වය දරනු ලබන්නේ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ එම දෙපාර්තමේන්තුව විසින් පත් කරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු සහ ප්‍රාදේශීය ලේකම් විසිනි. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා වන නව රෙගුලාසි ප්‍රකාරව සම්පාදනය කරන ආචාර ධර්ම සංග්‍රහයකට අනුකූලව විශේෂ කළමනාකරණ ප්‍රදේශ සම්බන්ධීකරණ කමිටු ක්‍රියාත්මක වනු ඇත.

**දැනට පවතින විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම**

නැවත නම් කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශ ස්ථානවල සංරක්ෂණ අරමුණු හා සංවර්ධන අවශ්‍යතාවලට අනුගතව, විශේෂ කළමනාකරණ ප්‍රදේශ සම්බන්ධීකරණ කමිටුව විසින් දැනට පවතින විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම සිදුකරනු ඇත. මෙම ක්‍රියාවලියේ දී, විශේෂ කළමනාකරණ ප්‍රදේශ සම්බන්ධීකරණ කමිටුව වෙතින් විමසා සහ එහි මාර්ගෝපදේශකත්වය යටතේ තත්ත්ව විශ්ලේෂණ වාර්තාව යෝග්‍ය පරිද්දෙන් සකස් කළ යුතු ය.

**තිරසර මූල්‍ය යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම**

විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ දිගු කාලීන තිරසාරත්වය සහතික කිරීම සඳහා, විශේෂ කළමනාකරණ ප්‍රදේශ සම්බන්ධීකරණ කමිටුව විසින් අනෙකුත් පාර්ශවකරුවන්ගේ ද අදහස් විමසා තිරසර මූල්‍ය යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු ය. මේ සඳහා, මධ්‍යම රජයේ ආයතන, පළාත් පාලන ආයතන මෙන්ම අදාළ පළාත් සභාවලින් ද දායකත්වයන් අපේක්ෂා කෙරේ.

**සුපරීක්ෂණය සහ බලපෑම් විශ්ලේෂණය**

විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ ප්‍රතිඵල සහ බලපෑම් තක්සේරු කිරීම හා ඇගයීම සඳහා, විශේෂ කළමනාකරණ ප්‍රදේශ සම්බන්ධීකරණ කමිටුව විසින් සුපරීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු ය. මෙම ක්‍රියාවලියේ දී සුපරීක්ෂණ ක්‍රියාවලිය, නිමැවුම් හා ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

**වගුව 5- 1: ව්‍යාපෘති පාදක ප්‍රවේශය ඔස්සේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය ආරම්භ කරන ලද ස්ථාන**

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘතිය | ස්ථානය |
|---|---|---|
| කොළඹ | වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (CRMP) II | ලුනාව කලපුව |
| ගාල්ල | වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (CRMP) II | මාදු ගඟ |
| | වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (CRMP) I/II | හික්කඩුව සමුද්‍ර උද්‍යානය |
| | වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (CRMP) Il | උණවටුන බොක්ක සහ කොග්ගල මෝය |
| හම්බන්තොට | හම්බන්තොට වෙරළ කලාප කළමනාකරණ ව්‍යාපෘතිය (HICZMP) | හම්බන්තොට වැලිවැටි තීරය |
| | හම්බන්තොට වෙරළ කලාප කළමනාකරණ ව්‍යාපෘතිය (HICZMP)/වෙ.සම්.කළ. ව්‍යාපෘතිය (CRMP) I | මාවැල්ල කලපුව හා කුඩාවැල්ල හුම්මානය |
| | ආසියානු සංවර්ධන බැංකුව (ADB)/<br>වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (CRMP) II | කලමැටිය කලපුව |
| | එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (USAID)/වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (CRMP)I | රැකව කලපුව |
| | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)/<br>ගෝලීය පරිසර පහසුකම් (GEF - RUK) | රැකව, උස්සන්ගොඩ හා කලමැටිය |
| ගම්පහ | වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (CRMP) II | මීගමුව මෝය/මුතුරාජවෙල වගුර |
| පුත්තලම | වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය II<br>BMZ, IUCN, FAO-UNDP | කල්පිටිය බාධක කොරල්පරය<br>පුත්තලම කලපුව |
| මඩකලපුව | පශ්චාත් සුනාමි නැගෙනහිර පළාත් වෙරළ කලාප ප්‍රතිෂ්ඨාපනය සහ තිරසාර කළමනාකරණ ව්‍යාපෘතිය GEF | මඩකලපුව කලපුව<br>වාකරෙයි කලපුව |
| අම්පාර | පශ්චාත් සුනාමි නැගෙනහිර පළාත් වෙරළ කලාප ප්‍රතිෂ්ඨාපනය සහ තිරසාර කළමනාකරණ ව්‍යාපෘතිය GEF | පානම වැලි වැටි |
| ත්‍රිකුණාමලය | පශ්චාත් සුනාමි නැගෙනහිර පළාත් වෙරළ කලාප ප්‍රතිෂ්ඨාපනය සහ තිරසාර කළමනාකරණ ව්‍යාපෘතිය GEF | පරෙවි දූපත |

වගුව 5- 2: වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ නෛතික විධිවිධාන අනුව විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පැමිණ වීමට යෝජිත ස්ථාන ලැයිස්තුව

| දිස්ත්‍රික්කය | ස්ථානය |
|---|---|
| කොළඹ | ■ ලුනාව කලපුව<br>■ බොල්ගොඩ වැව<br>■ දෙහිවල - ගල්කිස්ස වෙරළ තීරය |
| කළුතර | ■ කළුගඟ මෝය ප්‍රදේශය |
| ගාල්ල | ■ දොඩන්දූව මෝය,රත්ගම වැව<br>■ මාදු ගඟ<br>■ මාදම්පේ වැව<br>■ හික්කඩුව සමුද්‍ර උද්‍යානය හා ආශ්‍රිත පරිසරය<br>■ උණවටුන බොක්ක සහ කොග්ගල කලපුව |
| මාතර | ■ වැලිගම බොක්ක<br>■ හිරිකැටිය සහ ආශ්‍රිත වෙරළ ප්‍රදේශය<br>■ පොල්හේන වෙරළ තීරය |
| හම්බන්තොට | ■ රැකව කලපුව<br>■ රැකව - උස්සන්ගොඩ- කලමැටිය-පොකුරු පෙදෙස<br>■ කලමැටිය -ලුනාව කලපු සංකීර්ණය<br>■ මාවැල්ල කලපුව සහ කුඩාවැල්ල හුම්මානය |
| අම්පාර | ■ ආරුගම් බොක්ක සහ ආරුගම් බොක්ක කලපුව<br>■ කෝමාරි කලපුව<br>■ පෙරියකලපුව - කෝරායිකලපුව<br>■ පානම වැලි වැටි |
| මඩකලපුව | ■ මඩකලපුව මෝය<br>■ කායන්කර්නි හිරිගල්පර සහ ආශ්‍රිත ගොඩබිම් ප්‍රදේශය<br>■ තෙන්නාඩි බොක්ක - වාලච්චේන මෝය<br>■ කල්කුඩා- පාසිකුඩා බොකු<br>■ උප්පාර් - පනිච්චන්කර්නි මෝය<br>■ පුන්නායිකුඩා, කළුවන්කර්නි බොකු<br>■ සල්ලිතිවු දූපත හා ආශ්‍රිත වෙරළබඩ ප්‍රදේශය |
| ත්‍රිකුණාමලය | ■ කුච්චවේලි -පුඩුවකට්ටු(පයිරේට් බොක්ක ඇතුළුව) වෙරළ ප්‍රදේශය<br>■ ත්‍රිකුණාමල බොක්ක<br>■ කෝකිලායි කලපුව<br>■ නිලාවැලි වෙරළ තීරය - පරවි දූපත, පෙරිය කරච්චි සහ සින්න කරච්චි මෝය |
| මුලතිවු | ■ නන්දිකඩාල් කලපුව<br>■ නායි ආරු මෝය |

| දිස්ත්‍රික්කය | ස්ථානය |
|---|---|
| යාපනය | ■ මනාල්කාඩු වැලි වැටි පද්ධතිය<br>■ යාපනය මෝය ප්‍රදේශය(නගර ප්‍රදේශය)<br>■ කන්කසන්තුරේ සහ කීරමලෙයි වෙරළ තීරය<br>■ තොන්ඩමනාරු කලපුව<br>■ නාවෙලි වෙරළ ප්‍රදේශය<br>■ මණ්ඩතිවු, වේලනෙයි, නාගදීප ඩෙල්ෆ්ට් දූපත්<br>■ කරෙයිනගර් වෙරළ තීරය ( කැෂුරිනා වෙරළ ද ඇතුළත්ව) |
| මන්නාරම | ■ මන්නාරම් බොක්ක, දකුණු පරය, වාන්කලයි වෙරළ ප්‍රදේශය<br>■ තලේමන්නාරම වෙරළ ප්‍රදේශය<br>■ වෙඩිතල්තිවු හිරිගල්පරය සහ ආශ්‍රිත පරිසර පද්ධති<br>■ සිලාවතුර, අරිප්පු සහ අරුවි ආරු වෙරළ තීරය සහ කොණ්ඩච්චි බොක්ක |
| පුත්තලම | ■ හලාවත මෝය<br>■ පුත්තලම මෝය<br>■ ඕලන්ද බොක්ක, කලා ඔය ගං මෝය, ගඟේ වාඩිය ආශ්‍රිත පරිසර පද්ධති<br>■ මුන්දලම කලපුව සහ පුත්තලම ඇළ මාර්ගය |

**5.8 විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සඳහා මාර්ගෝපදේශ**

දැනට කෙරීගෙන යමින් පවතින හෝ දැනටමත් ආරම්භ කර ඇති විශේෂ කළමනාකරණ ප්‍රදේශ යළි සකස් කිරීමේ කාර්යය (Re formulate) සඳහා මෙහි මින් පෙර කොටසේ විස්තර කර ඇති විශේෂ මාර්ගෝපදේශවලට අමතරව, නව ස්ථානවල විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම සඳහා පහත දැක්වෙන පොදු මාර්ගෝපදේශ ඉදිරිපත් කරනු ලැබේ. 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතින් සංශෝධන කරන ලද 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ වූ විශේෂ කළමනාකරණ ප්‍රදේශ හඳුන්වාදුන් නව නෛතික විධිවිධාන පාදක කරගෙන පෙර අත්දැකීම් ද අවධානයට යොමුකර මෙම මාර්ගෝපදේශ සකස් කරනු ලැබේ. එසේ වුව ද, ඒ ඒ ස්ථානවල පවතින අවශ්‍යතාවයන්ට අනුකූලව මෙම මාර්ගෝපදේශ යොදාගත යුතු ය.

**1. ස්ථානයක් තෝරා ගැනීම හා ප්‍රකාශයට පත්කිරීම**

නව නෛතික විධිවිධාන ප්‍රකාරව, වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2024 හි ලැයිස්තුගත කර ඇති විශේෂ කළමනාකරණ ප්‍රදේශ පමණක් සහභාගීත්ව සම්පත් කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර *ගැසට් පත්‍රයේ* පළ කිරීමට වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට තෝරා ගත හැකි ය. මීට අමතරව, පරිසර පද්ධතියක සමස්තය සලකා ඵලදායී කළමනාකරණය සඳහා ඇතැම් ස්ථාන ක්ෂුද්‍ර වෙරළබඩ භූ දර්ශන ප්‍රදේශයක් (Mini-coastal landscape)ලෙස ඒකාබද්ධ කළ හැකිය.

**2. නෛතික මායිම් ස්ථාපිත කිරීම**

පනතේ විධිවිධාන සහ එකී විධිවිධාන යටතේ සාදනු ලැබූ නියෝගවලට අනුකූලව, විශේෂ කළමනාකරණ ප්‍රදේශයක නෛතික මායිම් නිර්ණය කළ යුතු ය. මෙහිදී වෙරළ කලාපය ඇතුළත සහ ආසන්න ප්‍රදේශයේ පිහිටි භූමිය යන දෙකම අවශ්‍යතාවය අනුව සැලකිල්ලට ගෙන තීරණය කළ හැකිය.

3. විශේෂ කළමනාකරණ ප්‍රදේශ කමිටුවක් ස්ථාපනය කිරීම

4. හඳුනාගත් ගැටලු ප්‍රමුඛතාගත කිරීම සහ පාරිසරික පැතිකඩක් හෝ තත්ත්ව/ ස්ථානීය වාර්තා සකස් කිරීම

5. පාර්ශවකරුවන්ගේ විශ්ලේෂණයක් සිදුකිරීම

6. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුමක දළ කෙටුම්පතක් පිළියෙළ කිරීම

7. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලැස්ම පිළිගැනීම (Adoption)

8. සැලසුම් ක්‍රියාවලිය සමග සමගාමීව තෝරාගත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම

9. තිරසර මූල්‍ය යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම

10. සැලැස්ම ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා ඇගයීම

**5.9 කළමනාකරණ අරමුණු, ප්‍රතිපත්ති, ක්‍රමෝපාය හා ක්‍රියාමාර්ග**

**අරමුණ 1**

යෝග්‍ය කළමනාකරණ මෙවලම් භාවිතා කරමින් නම්කරන ලද ප්‍රදේශයන් හි ජීවනෝපායයන් වැඩිදියුණු කිරීමටත් පරිසර පද්ධතිවල ස්වභාවික අංගයන් නොකඩවා වැඩිකිරීම සඳහා විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය භාවිතා කරනු ඇත.

**ප්‍රතිපත්තිය 1.1**

හඳුනාගත් පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවයෙන් දිස්ත්‍රික්/ ප්‍රාදේශීය/ පළාත් පාලන මට්ටමින් ගොඩබිම සහ ඒ ආශ්‍රිත වෙරළබඩ ජල ප්‍රදේශ ඇතුළත්ව විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාත්මක කරනු ලැබේ.

**ක්‍රමෝපාය 1.1.1**

ප්‍රාදේශීය ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන සහ රජයේ ආයතනවල සහයෝගීතාවයෙන් සහ ඵලදායි සහභාගිත්වයෙන් යුතුව හඳුනාගත් ප්‍රමුඛතා ස්ථාන සඳහා 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතින් සංශෝධන කරන ලද 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව සවිස්තරාත්මක විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් පිළියෙළ කරනු ඇත.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ස්ථාන ලෙස කළමනාකරණය කළ යුතු ස්ථාන තෝරා ගැනීම.
2. නෛතික මායිම් ස්ථාපනය කිරීම සහ එවැනි ස්ථාන විශේෂ කළමනාකරණ ප්‍රදේශ ස්ථාන ලෙස ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කිරීම.
3. දේශීය සහයෝගීතාවයෙන් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2024 හි දක්වා ඇති මාර්ගෝපදේශවලට අනුකූලව ආයතනික යාන්ත්‍රණ ස්ථාපනය කිරීම සහ ප්‍රාදේශීය/ දිස්ත්‍රික්/කලාපීය මට්ටමේ දී ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම.
4. තිරසර මූල්‍ය යාන්ත්‍රණ ස්ථාපනය කිරීම.
5. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ ප්‍රගතිය හා බලපෑම් තක්සේරු කිරීම සඳහා සහභාගිත්ව අධීක්ෂණ සැලසුම් සකස් කිරීම.

**ක්‍රමෝපාය 1.1.2**

විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණය, ක්‍රියාත්මක කිරීමේ සහ පශ්චාත්- ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සඳහා ප්‍රාදේශීය සහයෝගීතාවය සහ සහභාගිත්වය වැඩිදියුණු කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. මෙම ක්‍රියාවලිය තුළ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය සහ සහයෝගීතාවය සඳහා උපකාරී වන හෝ වළක්වන සාධක හඳුනාගැනීම හා නිර්ණය කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ විශ්ලේෂණයක් අදාළ ස්ථානවල තුළ සිදුකිරීම.
2. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය තුළ සියලුම පාර්ශවකරුවන්ගේ සක්‍රීය සහභාගීත්වය සහ සහයෝගීතාවය තහවුරු කරගැනීම සඳහා සන්නිවේදන සැලසුමක් සකස් කිරීම.

3. මධ්‍යම රජය/ ප්‍රාදේශීය, පළාත් පාලන ආයතන, විශේෂ කළමනාකරණ ප්‍රදේශ සම්බන්ධීකරණ කමිටු සහ පාර්ශවකාර කණ්ඩායම් අතර සිරස් සහ තිරස් සබඳතා ස්ථාපනය කිරීම.
4. ප්‍රජාවන් වෙත ස්පෘශ්‍ය ප්‍රතිලාභ සහතික කිරීම සඳහා ප්‍රාදේශීය සහභාගිත්වය සහ සහයෝගිතාවය දිරිමත් කිරීම සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමයක් සකස් කිරීම.

**ප්‍රතිපත්තිය 1.2**

පසුගිය කාලය තුළ ව්‍යාපෘති පදනම මත ක්‍රියාත්මක කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශ ස්ථාන නැවත ප්‍රකාශයට පමුණුවා පුනර්ජීවනය කිරීම.

**ක්‍රමෝපාය 1.2.1**

ක්‍රියාත්මක කිරීමේ දී ලද අත්දැකීම් අනුව පවත්නා දුබලතාවයන් මඟ හැර ගැනීම සඳහා ව්‍යාපෘති පදනම මත සැලසුම්කොට ක්‍රියාත්මක කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශ ගැසට් නිවේදනයක් මගින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස නැවත ප්‍රකාශයට පැමිණවීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත යටතේ සාදන නව රෙගුලාසි ප්‍රකාරව විශේෂ කළමනාකරණ ප්‍රදේශ සම්බන්ධීකරණ කමිටු ස්ථාපනය කිරීම.
2. මෙම සැලැස්මේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ යටතේ 5.2 කොටසේ දක්වා ඇති මාර්ගෝපදේශ අනුගමනය කිරීම.
3. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී මුහුණපාන ප්‍රධාන බාධක හඳුනාගැනීම, ලැබූ අත්දැකීම් විශ්ලේෂණය කිරීම, තත්ත්ව විශ්ලේෂණයක් සිදුකිරීම සහ දැනට ක්‍රියාත්මක කෙරෙන සැලසුම්වල අඩුපාඩු නිවැරදි කිරීම සඳහා පිළියම් සොයා ගැනීම මගින් මෙම ක්‍රියාවලිය අඛණ්ඩව ඉදිරියට ගෙනයාම සඳහා පහසුකම් සැලසීම.
4. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ව්‍යාපෘති සුපරීක්ෂණය සහ ඇගයීම සඳහා වැඩසටහනක් ආයතනගත කිරීම සහ කළමනාකරණ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමට උපකාරී වන පසු විපරම් යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම.

**ප්‍රතිපත්තිය 1.3**

සියලු විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ජාතික මට්ටමේ නීතිවලට අනුකූලව සිදුකරනු ඇත.

**ක්‍රමෝපාය 1.3.1**

අදාළ අනෙකුත් ජාතික මට්ටමේ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල වන ලෙස විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්/ සැලසුම් කිරීමේ ක්‍රියාවලිය හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. අනෙකුත් ජාතික මට්ටමේ පවතින නීතිවලට අනුකූලව විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය පවත්වා ගැනීම සඳහා කාර්ය පටිපාටි, ක්‍රමවේදයන් විස්තර කරමින් මාර්ගෝපදේශ ලේඛනයක් පිළියෙල කිරීම.
2. ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා පළාත් මට්ටමේ පාර්ශ්වකරුවන් සඳහා විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

**ප්‍රතිපත්තිය 1.4**

විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් ක්‍රියාත්මක කිරීම,ශක්තිමත් කිරීම සඳහා පළාත් පාලන ආයතනවල සහ අනෙකුත් අදාළ රජයේ ආයතනවල ධාරිතාවයන් වර්ධනය කරනු ඇත.

**ක්‍රමෝපාය 1.4.1**

පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ඵලදායි නීති සම්පාදනය තුළින් අදාළ පළාත් පාලන ආයතනවල සහ රජයේ ආයතනවල විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ධාරිතාවය වැඩිදියුණු කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය පිළිබඳ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.
2. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණය සඳහා නීතිමය රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම.
3. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සම්බන්ධීකරණ කමිටු හරහා වෙරළබඩ සම්පත් සංරක්ෂණය කිරීමේ සහයෝගීතා කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම.
4. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රජාවන්, රජය/ අර්ධ රාජ්‍ය ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ විශේෂ කළමනාකරණ ප්‍රදේශ සම්බන්ධීකරණ කමිටුවල වගකීම් සඳහා මාර්ගෝපදේශ ඇතුළත් කිරීම.
5. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණය සඳහා ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන්ගේ ධාරිතාවයන් ශක්තිමත් කිරීම.

**ප්‍රතිපත්තිය 1.5**

ජාතික හා ප්‍රාදේශීය සංවර්ධන ප්‍රයත්නයන් සමග විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය අනුකූල වනු ඇත.

**ක්‍රමෝපාය 1.5.1**

යෝග්‍ය අවස්ථාවන් හි දී විශේෂ කළමනාකරණ ප්‍රදේශ ස්ථානවල සැලසුම්කරණය හා කළමනාකරණය කලාපීය/ ඒකාබද්ධ ජාතික සංවර්ධන ව්‍යාපෘති සඳහා අන්තර්ගත කිරීම සහ ඒකාබද්ධ කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. කලාපීය ව්‍යාපෘති/ ඒකාබද්ධ ජාතික ව්‍යාපෘතිවලට විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් අන්තර්ගත කිරීම සඳහා යාන්ත්‍රණයක් හඳුනා ගැනීමට ආර්ථික සංවර්ධනය සඳහා වගකීම දරන අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය පවත්වා ගැනීම.
2. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ ක්‍රියාකාරකම් සඳහා පුද්ගලික අංශයේ දායකත්වය සහ සහභාගිත්වය සඳහා පහසුකම් සැලසීමට යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම.

**ප්‍රතිපත්තිය 1.6**

පරිසර පද්ධතිවල හඳුනා නොගත් ආර්ථික සේවාවන්වල වටිනාකම් ඇතුළත් වන පරිදි පුළුල් ඇගයීමක් සිදු කර එය විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණයේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී උපයෝගී කර ගැනීම.

**ක්‍රමෝපාය 1.6.1**

සංවර්ධන අවශ්‍යතා සමග සංරක්ෂණ අරමුණු තුලනය කර ගනිමින් පරිසර සංරක්ෂණය, සංවර්ධනය හා ජීවනෝපාය මාර්ගවලට අදාළ තීරණ ගැනීමේ දී පරිසර පද්ධති සේවාවන්ගේ සැබෑ ආර්ථික වටිනාකම හඳුනා ගැනීම සහ ඒ සම්බන්ධයෙන් මනා අවධානයක් යොමු කරනු ලැබේ.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. හැකි සෑම අවස්ථාවකම ඵලදායී සහ සාර්ථක තීරණ ගැනීම පිණිස පරිසර පද්ධති සේවාවන්ට අදාළව පාරිසරික තක්සේරුවක් සිදු කිරීම.
2. වෙරළබඩ පරිසර පද්ධති හා සම්බන්ධ සැඟවුණ හෝ හඳුනා නොගත් සේවාවන්ගේ වැදගත්කම හා වටිනාකම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
3. පාරිසරික තක්සේරුවක් සිදුකිරීම සඳහා සහයෝගීතා ආයතනවල ධාරිතා වැඩිදියුණු කිරීම.

**ප්‍රතිපත්තිය 1.7**

වෙරළබඩ සම්පත් තිරසාර ලෙස උපයෝගීතාවය භාවිතා කිරීම සහතික කිරීම සඳහා විශේෂ කළමනාකරණ ප්‍රදේශ ස්ථානවල ප්‍රජාවන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් කිරීම.

**ක්‍රමෝපාය 1.7.1**

වෙරළබඩ සම්පත් කළමනාකරණය හා ජීවනෝපායන්ට අදාළ ගැටලු සවිස්තරාත්මකව විමර්ශනය කොට ප්‍රජාවන්ගේ ජීවනෝපායයන් තිරසර ලෙස වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය යාන්ත්‍රණය විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියට අන්තර්ගත කරනු ඇත.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. විශේෂ කළමනාකරණ ප්‍රදේශයන් හි වෙරළබඩ සම්පත් උපයෝජනය සහ ප්‍රජාවන්ගේ ජීවනෝපායට අදාළ ගැටලු විමර්ශනය කිරීම.
2. හඳුනාගත් ගැටලු අවම කිරීම සඳහා පසුගිය අත්දැකීම් පදනම් කොට තිරසර ලෙස ජීවනෝපායයන් සංවර්ධන වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
3. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ස්ථානවල ජීවනෝපාය සංවර්ධනය හා වැඩිදියුණු කිරීම සඳහා පුද්ගලික අංශයේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.
4. ක්‍රියාත්මක කරන ලද ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්වල ක්‍රියාවලිය, නිමැවුම් සහ ප්‍රතිඵල ඇගයීම සඳහා යෝග්‍ය සුපරීක්ෂණ යාන්ත්‍රණයක් ක්‍රියාවට නැංවීම.

**ප්‍රතිපත්තිය 1.8**

දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ ආධාර ප්‍රධාන ආයතන අතර නම් කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශයන් සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කෙරේ.

**ක්‍රමෝපාය 1.8.1**

නම් කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශ ස්ථානයන් සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීමට අදාළව ප්‍රධාන පාර්ශවකාර භූමිකාවක් ඉටු කිරීමට හැකිවන පරිද්දෙන් ජාත්‍යන්තර සහ දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ ආධාර ප්‍රදාන ආයතනවලට මෙම කටයුතුවල නිරතවීම සඳහා පහසුකම් සැලසීම.

**යෝජිත ක්‍රියාමාර්ග:**

1. නම් කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශවල සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීමට අදාළව ජාත්‍යන්තර සහ දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ ආධාර ප්‍රදාන ආයතනවලට ප්‍රධාන පාර්ශවකාර භූමිකාවක් ඉටු කිරීමට හැකිවන පරිද්දෙන් නව නියෝග සකස් කිරීම.
2. UNDP-GEF small grant programme වැනි ජාත්‍යන්තර සංවිධානවල වැඩසටහන් හරහා නම් කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශවල සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාළ නියෝජිතායතන සමග සම්බන්ධීකරණය පවත්වා ගැනීම.

**අරමුණ 2**

හඳුනාගත් ප්‍රමුඛතා ස්ථානවල විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම මගින් සංවේදී වෙරළ පරිසර පද්ධති තිරසර ආකාරයෙන් කළමනාකරණය කෙරේ.

**ප්‍රතිපත්තිය 2.1**

හඳුනාගත් ඉහළ ප්‍රමුඛතා ස්ථානවල විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධානවල හා පුද්ගලික අංශයේ ආයතනවල ඍජු මැදිහත්වීම සහ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.

**ක්‍රමෝපාය 2.1.1**

විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධානවල හා පුද්ගලික අංශයේ සහභාගීත්වය හා ඍජු නියැලීම සඳහා නෛතික සහ ආයතනික පසුබිමක් සකස් කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මග පෙන්වීම හා අධීක්ෂණය යටතේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දැරීමට හැකිවන පරිද්දෙන් නියෝග සැකසීම.

2. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම සඳහා බාහිර පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය සඳහා පහසුකම් සැලසීමට හැකිවන ලෙස නියමිත කාලරාමු සමග මෙහෙයුම් මාර්ගෝපදේශ සකස් කිරීම.
3. රාජ්‍ය නොවන සංවිධාන සහ පුද්ගලික අංශයේ ආයතනවල සහයෝගය ලබාගැනීමට සහ ඔවුන් අතර උනන්දුව වැඩිකිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

ආශ්‍රිත ග්‍රන්ථ:


1. Coast Conservation and Coastal Resource Management Department, (2014), Evaluation of Special Management Area (SMA) in Sri Lanka (unpublished).
2. Coast Conservation and Coastal Resource Management Department, (2004), Revised Coastal Zone Management Plan.
3. Government of Sri Lanka, (2012) Coast Conservation and Coastal Resource Management Act No.57 of 1981.
4. Government of Sri Lanka, (2011) Coast Conservation (Amendment) Act No. 49 of 2011.
5. Clemett, Alexandra; Senaratne, Sonali; and Banda, R; (2004) Can Coastal Zone management in Sri Lanka. Sustain Local livelihoods and Ecosystems? Policy Process Analysis Paper 2, Improving Policy Livelihood Relationship in South Asia, Stockholm Environmental Institute (SEI), York, UK.
6. De C, osse, P.J., and Jayawickrama, S.S. 1996. Co-management of resources in Sri Lanka: (Status, Issues and Opportunities. USAID/Sri Lanka Natural Resources and Environmental Policy Project, Colombo.
7. De Silva, Sanjiv; Senaratne, Sellamuttu, Sonali; Kodituwakku, Dekshika Charmini; Atapattu, Sitara S; (2011) Governance Performance in Integrated Coastal Management in Sri Lanka, Country Report, Colombo IUCN Sri Lanka.
8. CCD. 1997. Revised Coastal Zone Management Pan, Sri Lanka, 1997. Colombo : Coast Conservation Department. Ministry of Fisheries and Aquatic Resources Development.
9. Jayatilake, A; Pallewatta.,. N.,; and Wickramanayake, J. 1998. The practice of community based conservation in Sri Lanka. In Community and Conservation : Natural Resource Management in South and Central Asia. Ed. A. Kothari, N. Pathak, R.B. Anuradha, and B. Taneja, New Delhi : Sage Publication.
10. Landstorm Ingegerd (2006), Towards Collaborative Coastal Management in Sri Lanka? a study of Special Area Management in Sri Lanka's Coastal Region.
11. Lowry, K; Pallewatte, N; and Dainis.A.P. 1997. Special Area Management Projects at Hikkaduwa and Rekawa.A Preliminary Assessment. CRMP, Colombo.
12. Lowry, K., Pallewatte, N., and Dainis, A.P., 1999. Policy-relevant assessment of community-level coastal management projects in Sri Lanka. Ocean and Coastal Management 42 (8) : (717 - 745.
13. Wickramaratne, H.J.M. and A.T.White. 1992. Concept paper on Special Area Management for Sri Lankan Coasts. Working Paper No.10, 1992. CRMP Colombo.
14. Senaratna, S. 2003. Factors influencing the sustainability of livelihoods in rural coastal communities in Sri Lanka. PhD Upgrade Report. Imperial College London.

15. HSAMCC/CCD/NARA/Department of Wildlife Conservation/DWLC/CRMP, 1996. Special Area Management Plan for Hikkaduwa Marine Sanctuary and Environs. Sri Lanka. Hikkaduwa Special Area Management and Marine Sanctuary Coordinating Committee, Coast Conservation Department, National Aquatic Resources Agency, Department of Wildlife Conservation and Coastal Resources Management Project.

16. RSAMCC/CCD/NARA/CRMP. 1996. Special Area Management Plan for Rekawa Lagoon, Sri Lanka. Rekawa Special Area Management Coordinating Committee/ Coast Conservation Department/National Aquatic Resources Agency/ and Coastal Resources Management Project.

## 6 වැනි පරිච්ඡේදය - නියාමන යාන්ත්‍රණය

### 6.1 හැඳින්වීම

වෙරළ කලාපය තුළ ක්‍රියාකාරකම් හා සම්පත් කළමනාකරණය සඳහා 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ නියාමන රාමුව ඵලදායි කළමනාකරණ මෙවලමක් ලෙස වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් යොදා ගැනේ. ප්‍රධාන වෙරළබඩ ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ කළමනාකරණ පියවරවල තිරසරබව සහතික කිරීම සඳහා, විශේෂ කළමනාකරණ ප්‍රදේශ, අන්තර්-ආයතනික සම්බන්ධීකරණය, අනුකූලතා අධීක්ෂණය, පර්යේෂණ සහ විමර්ශන, සහ මහජනතාව දැනුවත් කිරීම මොවුන්ගේ අතිරේක කළමනාකරණ මෙවලම් යොදාගැනීම තුළින් ද වැදගත් කාර්යභාරයක් ඉටු වේ. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වෙරළබඩ සම්පත් කළමනාකරණ ක්‍රමෝපායේ නියාමන මෙවලම්වලට මේවා මෑත ඉතිහාසයේ අනුපූරකයක් වශයෙන් පැවතිණි.

**වෙරළ කලාපයට අදාළ නියාමන යාන්ත්‍රණය පහත අංගවලින් සමන්විත වේ:**

- බලපත්‍ර පටිපාටිය ක්‍රියාත්මක කිරීම
- බලපත්‍ර නිකුත් නොකරනු ලබන කාර්යයන් තහනම් කිරීම
- පස සිටුව ප්‍රමිත, විචලනයන් හා බැහැර කිරීම් නියම කිරීම
- සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අනුකූලතා අධීක්ෂණය
- සංවර්ධන ක්‍රියාකාරකම් පාලනය කිරීම
- අනවසර සංවර්ධන ක්‍රියාකාරකම් පාලනය කිරීම
- විශේෂිත සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ප්‍රමිතීන් හා මාර්ගෝපදේශ ලබාදීම
- පාරිසරික බලපෑම් තක්සේරුවෙහි (EIA) සහ මූලික පරිසර පරීක්ෂණ වාර්තාවෙහි(IEE) අවශ්‍යතාවය
- බලපෑමට යටත් වන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සහ පාලනය කිරීම
- සංරක්ෂණ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම
- විශේෂ කළමනාකරණ ප්‍රදේශ (SMAs) ප්‍රකාශයට පත් කිරීම හා කළමනාකරණය
- සංචාරක සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සහ කළමනාකරණය කිරීම

#### 6.1.1 වෙරළ කලාපය අර්ථ දැක්වීම

2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතින් සංශෝධන කරන ලද 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනත මඟින් "වෙරළ කලාපය" මෙසේ අර්ථ දක්වා තිබේ.

"වෙරළ කලාපය" යන්නෙන්, මධ්‍ය වඩදිය ඉම සිට ගොඩබිම දෙසට මීටර් තුන්සියයක සීමාවක් සහ මධ්‍ය බාදිය ඉම සිට මුහුද දෙසට කිලෝ මීටර් දෙකක සීමාවක් ඇතුළත පිහිටි ප්‍රදේශය අදහස් වන අතර ස්ථිර වශයෙන් හෝ කලින් කල මුහුදට සම්බන්ධ වූ ගංගා, දියපාරවල්, කලපු හෝ වෙනත් යම් ජල කඳක් සම්බන්ධයෙන් වනවිට, ගොඩබිම දෙසට මායිම් වූ, ඒවායේ ස්වාභාවික ඇතුළුවීමේ ලක්ෂ්‍ය අතර අඳින ලද සෘජු පාද රේඛාවකට ලම්බකව මනින ලද කිලෝ මීටර් දෙකක සීමාවකට ව්‍යාප්ත විය යුතු අතර, එසේ මුහුදට සම්බන්ධ වූ ඒ ගංගා, දිය පාරවල් සහ කලපු හෝ වෙනත් යම් ජල කඳක් සහ මායිම දිගේ ශුන්‍ය මධ්‍ය මුහුදු මට්ටමේ සිට ගොඩබිම දෙසට මීටර් සියයකින් දීර්ඝ කළ වැඩිදුර සීමාවක් ඇතුළත වූ ප්‍රදේශය ද ඇතුළත් වේ.

*(සෘජු පාද රේඛාවක් ස්ථාපනය වන අයුරින් ස්වාභාවික ඇතුළුවීමේ ලක්ෂ්‍යය පවතින ස්ථාන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නිර්ණය කළ යුතු ය.)*




**රූපය 6- 1: 2011 අංක 49 දරන පනතින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනත මගින් අර්ථ දක්වා ඇති වෙරළ කලාපය**

**6.2 අවසර පත්‍ර පිළිබඳ කාර්ය පටිපාටිය**

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් "වෙරළ කලාපයේ" සංවර්ධන ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම සඳහා භාවිතා කරන ප්‍රධාන නියාමන මෙවලම වනුයේ අවසර පත්‍ර පිළිබඳ කාර්ය පටිපාටිය යි. මෙම කාර්ය පටිපාටියේ ප්‍රධාන අරමුණ වනුයේ සංවර්ධන කාර්යයන්වල අහිතකර බලපෑම් වළක්වාගැනීම හෝ අවම කරගැනීම සිදුකරගත හැකි ආකාරයෙන් සංවර්ධන කටයුතු මෙහෙයවීම වේ. මෙම කාර්ය පටිපාටිය හරහා, වෙරළ පරිසරයට අහිතකර හෝ අනුකූල නොවන කාර්යයන් පාලනය කරන අතර වෙරළ කලාපයේ ගුණාත්මකබව, ස්ථායිතාවය හා ඵලදායිතාවය පවත්වා ගැනේ. එනිසා, වෙරළ කලාපය තුළ යම් සංවර්ධන කාර්යයක නිරතවීමට අපේක්ෂා කරන ඕනෑම තැනැත්තෙකු, පුද්ගලික හෝ රාජ්‍ය අංශය හෝ වේවා,( අවසර බලපත්‍ර අවශ්‍ය නොමැති බවට නිශ්චය කර දක්වා ඇති ක්‍රියාකාරකම් හැරුනවිට) වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන අවසර පත්‍රයක් ලබාගැනීම වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ අනිවාර්යය කර තිබේ. අවසර පත්‍රයක් රහිතව වෙරළ කලාපය තුළ සිදුකළ හැකි කාර්යයන් 1983 සැප්තැම්බර් 2 දිනැති අංක 260/22 ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත 1983 අංක 1 දරන වෙරළ සංරක්ෂණ නියෝගවල දක්වා තිබේ. අවසර පත්‍රයක් ලබාගත යුතු කාර්යයන් පහත දැක්වේ.

**6.2.1 අවසර බලපත්‍ර අවශ්‍ය වන "වෙරළ කලාපය" තුළ සිදුකරන සංවර්ධන කාර්යයන්**

වෙරළ කලාපය තුළ සිදුකරන බොහෝ සංවර්ධන කාර්යයන් සඳහා, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන බලපත්‍රයක් අවශ්‍ය කෙරේ. එවැනි කාර්යයවලට නිදසුන් පහත දැක්වේ:

- මායිම් තාප්ප වැනි නේවාසික කාර්යයන් සඳහා යටිතල පහසුකම් සහ එවැනි අදාළ ව්‍යුහ

- කර්මාන්ත හා අනෙකුත් වාණිජ ඉදිකිරීම්
- පිහිනුම් තටාක වැනි සංචාරක හා විනෝදාස්වාද කාර්යයන් සඳහා යටිතල පහසුකම්
- වාණිජ හා ධීවර වරාය ඉදිකිරීම් සහ ජලතරණ මාර්ග
- මහාමාර්ග, පාලම්, උමගවල් හා දුම්රිය මාර්ග
- පොදු හා ආගමික කාර්යයන් සඳහා යටිතල පහසුකම්
- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව හැර වෙනත් පුද්ගලික පාර්ශවයක් විසින් සිදුකරන වෙරළ තීරය ආරක්ෂණය කිරීමේ ඉදිකිරීම්
- අපජලය පිරියම් කිරීමේ යටිතල පහසුකම්, අපවහන නළ හා සමුද්‍රීය පිටවුම් නළ
- මුහුදු ජලයේ ලවණ හරණය, මුහුදු ජලය ලබාගැනීම හා ඉවතලන ජලය බැහැර කිරීම (සමුද්‍රීය පිටවුම් නළ) සඳහා යටිතල පහසුකම්
- ජලජීවී වගා පහසුකම් හා සමුද්‍රීය ගොවිපොළ සඳහා ඉදිකිරීම්
- ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම්
- වැලිපර කැණීම, පිරවීම, බැවුම් කිරීම හා බිඳුම්
- භූමි අලංකරණය හා වෙරළ උද්‍යාන සංවර්ධනය කිරීම
- කැණීම් සහ ඛනිජ ද්‍රව්‍ය නිස්සාරණය
- බලශක්ති උත්පාදන ව්‍යාපෘති
- වැලි, මුහුදු පැලැටි සහ සිප්පි කටු ඉවත් කිරීම
- දූපත් ගොඩකිරීම් හා නිර්මාණය සහ අතිරේක ආරක්ෂණ ව්‍යුහ ඉදිකිරීම
- අපවහන මාර්ග ඉදි කිරීම
- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව හැර වෙනත් ඕනෑම පුද්ගලික පාර්ශවයක් විසින් සිදුකරන ගංවතුර හෝ වෙනත් ආපදාවක් පාලනය කිරීමට අදාළව සිදුකරන ඉදි කිරීම්, කැණීම් හා බිඳ දැමීම්
- වෙරළ කලාපය තුළ යම් ජල ස්කන්ධයක ඉවුරු ඛාදනය වැළැක්වීම සඳහා ඉදිකිරීම් හෝ යම් ජල ප්‍රදේශයක් පිරවීම
- වෙරළ කලාපයෙහි භෞතික ස්වභාවය වෙනස් වීමට බලපාන වෙනත් ඕනෑම ක්‍රියාකාරකමක්

**6.2.2. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන අවසර පත්‍රයක් රහිතව වෙරළ කලාපය තුළ සිදුකළ හැකි නියම කර ඇති කාර්යයන්**

- මසුන් ඇල්ලීම
- වෙරළ අස්ථාවර නොකරන භෝග වගාව
- ශාක හා වෙනත් වෘක්ෂලතාදිය සිටුවීම (වෙරළෙහි හැර)
- මෙම සැලැස්ම තුළ 2 වැනි පරිච්ඡේදයේ දක්වා ඇති වෙරළ ඛාදන කළමනාකරණ ක්‍රමෝපාය සහ හදිසි අවස්ථා කාර්ය පටිපාටිවලට අනුකූලව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වෙරළ ආරක්ෂණ ව්‍යුහ ඉදිකිරීම හා නඩත්තු කිරීම.

**6.2.3 අවසර පත්‍ර වර්ගීකරණය**

1990, 1997, 2004 වර්ෂවල වෙරළ කලාප කළමනාකරණ සැලැස්මවල්වලින් කාණ්ඩ තුනක් යටතේ අවසර පත්‍ර හඳුන්වා දී තිබේ. එනම් ප්‍රධාන අවසර පත්‍ර, සුළු අවසර පත්‍ර සහ හදිසි අවස්ථා අවසර පත්‍ර වශයෙනි. වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2024 මගින් මෙය කාණ්ඩ දෙකකට පමණක් සීමා කර තිබේ. ඒ අනුව, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන අවසර පත්‍ර කාණ්ඩ දෙකකි, එනම් " A කාණ්ඩය" අවසර පත්‍ර සහ "B කාණ්ඩය" අවසර පත්‍ර වශයෙනි.

| "A" වර්ගය | "B" වර්ගය |
|---|---|
| සංවර්ධන හෝ වෙනත් කාර්යයකට නිකුත් කරන, ඒ සඳහා මූලික පරිසර පරීක්ෂණ වාර්තාවක් (IEE) හෝ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් (EIA) අවශ්‍ය කරන අවසර පත්‍රයක් " කාණ්ඩය" අවසර පත්‍රයක් ලෙස හැඳින්වේ. | සංවර්ධන හෝ වෙනත් කාර්යයකට නිකුත් කරන, ඒ සඳහා මූලික පරිසර පරීක්ෂණ වාර්තාවක් (IEE) හෝ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් (EIA) අවශ්‍ය නොකරන අවසර පත්‍රයක් "B කාණ්ඩය" අවසර පත්‍රයක් ලෙස හැඳින්වේ.<br><br>හදිසි අවස්ථා තත්ත්වයක දී ඇතිවන අහිතකර බලපෑම් අවම කර ගැනීම සඳහා නිකුත් කරන අවසර පත්‍රයක් ද "B කාණ්ඩය" යටතට ගැනේ. |

හදිසි තත්ත්වයක දී ඇතිවන අහිතකර බලපෑම් අවම කර ගැනීම සඳහා "B කාණ්ඩය"අවසර පත්‍රයක් නිකුත් කරන අවස්ථා පහත පරිදි වේ:

- ගං වතුර හෝ වෙනත් ඕනෑම ස්වභාවික ආපදාවක් පාලනය කිරීමේ පියවර වශයෙන්
- ගං වතුර වැළැක්වීම සඳහා වැලිපර ඉවත් කිරීම
- මුහුදු ජලය ඇතුළුවීම වැළැක්වීම සඳහා තාවකාලික පදනමින් ඉදිකරන ව්‍යුහ සඳහා
- "A කාණ්ඩය" හෝ "B කාණ්ඩය" අවසර පත්‍රයක් ලබාගැනීම සිදුකරන තුරු, මහජනතාවගේ ජීවිතවලට හෝ පොදු/පෞද්ගලික දේපළවලට හානියක්/ විනාශයක් සිදුවීමේ ප්‍රවණතාවයක් පවතින අවස්ථාවකදී සිදුකළ යුතු මැදිහත්වීම් සඳහා
- ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන්

හදිසි අවස්ථා තත්ත්වයක දී නිකුත් කරන අවසර පත්‍රයක වලංගු කාල සීමාව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

**6.2.4 අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් භාවිතා කළයුතු නිර්ණායක**

යෝජිත කාර්යය සම්බන්ධයෙන් පහත කරුණු සලකා බැලේ.

- මෙම සැලැස්මේ පරිච්ඡේද 2-5 දක්වා ඇති කළමනාකරණ ප්‍රතිපත්ති සහ යම් අතිරේක මාර්ගෝපදේශවල දක්වා ඇති කරුණු සමග අනුකූලතාවය
- මෙම සැලැස්ම යටතේ දක්වා ඇති තහනම් කාර්යයක් නොවන බව
- අදාළ මාර්ගෝපදේශවල වෙරළ පසසිටු ප්‍රමිතවල විචලන හා ඉවත් කිරීම් සඳහා අදාළ වීම
- මධ්‍යම පරිසර අධිකාරිය විසින් වායු/ජලයේ ගුණාත්මකබව, ශබ්ද හා කම්පන සම්බන්ධයෙන් නිකුත් කර ඇති ජාතික ප්‍රමිතවලට අනුකූලවීම
- පොදු මහජනතාවට වෙරළ වෙත හා වෙරළ ඔස්සේ ප්‍රවේශ වීමට ඇති අයිතිය උල්ලංඝනය නොවීම වෙරළ ඔස්සේ තිරස් හා සිරස් වෙරළ වෙත පොදු ප්‍රවේශය සහතික කිරීම
- දැනට කෙරීගෙන යමින් පවතින ධීවර කටයුතු වැළැක්වීම හෝ බාධා නොවන බව සහතික කිරීම.
- අදාළ නියෝජිතායතනවල කලාපීකරණ යෝජනා ක්‍රමවල අරමුණු සහ/හෝ වෙරළසංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නියම කරන මාර්ගෝපදේශවලට අනුකූලවීම.
- වගුව 6.3 හි දක්වා ඇති පරිදි වෙරළ කලාපයේ රක්ෂිත ප්‍රදේශ බල ප්‍රදේශවලට මායිම්ව පිහිටා නොතිබීම.
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නම් කරන ලද පුරාවිද්‍යාත්මක, ඓතිහාසික හෝ සංස්කෘතික ස්ථානයක සිට නිශ්චිත කර ඇති අරිය සීමාව තුළ පිහිටා නොතිබීම.
- වෙරළ සංරක්ෂණ පනතේ විධිවිධාන යටතේ ප්‍රකාශයට පත්කර ඇති බලපෑමට යටත්වන ප්‍රදේශයක හෝ සංරක්ෂණ ප්‍රදේශයක පිහිටා නොතිබීම.
- අනවසරයෙන් ගොඩ කරන ලද ස්ථානයක නොපිහිටීම.
- මහාමාර්ග, ඇළ මාර්ග, ගංගා, කලපු හෝ ස්ථිරව හෝ යම් කාල සීමාවල දී මුහුද සමග සම්බන්ධ වන වෙනත් ජල ස්කන්ධවලට අදාළව වෙන්කර ඇති ඉඩ සීමා සැලසුම්කිරීමේ අවශ්‍යතා සමග අනුකූල වීම.
- වෙරළ ඉදිරි කලාපයේ වෘක්ෂලතා වැස්ම ඉවත් නොකිරීම.

- මෙම යෝජිත කාර්යය තුළ අඩු පහසුකම් සහිත ප්‍රදේශ ආශ්‍රිතව, වාණිජ ඉදිකිරීම්, පදිංචිය සඳහා නිවාස සහ කර්මාන්ත ඉදි කිරීම වැනි කටයුතු තිබේ නම්, ද්‍රව හා ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා කාර්යක්ෂම හා ප්‍රමාණවත් ආකාරයෙන් ඉඩකඩ තිබීම.
- වැලි වැටි ආශ්‍රිතව සිදුවන ස්වාභාවික ක්‍රියාවලි සඳහා බාධාවක් වන ආකාරයෙන් යෝජිත කාර්යය සිදු නොවන බව.

## 6.2.5 වැලි ගොඩ දැමීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීමේ මාර්ගෝපදේශ

වාණිජ නොවන භාවිතය සඳහා වැලි ගොඩ දැමීම පිණිස අවසර පත්‍ර නිකුත් කිරීමේදී පහත සඳහන් මාර්ගෝපදේශ අදාළ වේ. එසේ වුවද, මෙම සැලැස්ම ක්‍රියාත්මක වන කාලසීමාව තුළ වෙරළ කලාපයේ පවතින ගතික තත්ත්වයන් සැලකිල්ලට ගෙන ස්ථානීය මාර්ගෝපදේශ කලින් කලට අවශ්‍යතානුකූලව නිකුත් කළ හැකිය.

- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නිශ්චය කරන ස්ථානවලින් පමණක් වැලි ඉවත් කර ගැනීම සඳහා අවසර ලැබේ. දෙපාර්තමේන්තුව විසින් නිශ්චය කරන පරිදි, මෙම නිශ්චිත ස්ථාන කාලයෙන් කාලයට වෙනස් විය හැකි ය.
- ගං මෝය, ඇළ මාර්ග, කලපු හෝ ස්ථිරව හෝ යම් කාල සීමාවල දී මුහුද සමග සම්බන්ධ වන වෙනත් ජල ස්කන්ධවල සිට මීටර් 500ක් දක්වා දුරකට පවතින ස්ථානවලින් වැලි ඉවත් කිරීම සඳහා අවසර නොලැබේ.
- "සීමාකළ සංවර්ධන කලාපයක" (එනම් ගං මෝය, ඇළ මාර්ග, කලපු හෝ ස්ථිරව හෝ යම් කාල සීමාවල දී මුහුද සමග සම්බන්ධ වන වෙනත් ජල ස්කන්ධවල සිට මීටර් 500ක් දක්වා දුරක් ඇතුළත පවතින ප්‍රදේශ) නාවික කටයුතු සඳහා පහසුකම් සැලසීමට හෝ ගංවතුර පාලනය සඳහා පමණක් වැලි ඉවත් කිරීමට අවසර ලැබේ.
- ගං වතුරෙන් ඇතිවන අහිතකර බලපෑම් වැළැක්වීම සඳහා පමණක් වැලිපර ඉවත් කිරීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම/ එකඟතාවය ලබාදීම සිදුකරන අතර අදාළ ප්‍රදේශවල දිස්ත්‍රික් ලේකම්වරු, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානවල සෘජු අධීක්ෂණ සීමා යටතේ පමණක් මෙය සිදු කෙරේ.
- වැලි ඉවත් කරන ස්ථානයට යාබදව පවතින වෘක්ෂලතා ආවරණයට හානිවන ආකාරයෙන් වැලි ඉවත් කිරීම නොකළ යුතු ය.
- මුහුදු ජලය ගොඩබිම වෙත ගලා ඒම වැනි අහිතකර බලපෑම් ඇතිවන ආකාරයෙන් වැලි ඉවත් කිරීම සිදු නොකළ යුතු ය.

**සුවිශේෂී වාතාවරණයන් යටතේ මිස, පහත කාර්යයන් සඳහා අවසර පත්‍ර නිකුත් නොකළ යුතු ය:**

- වෙරළ කලාපය තුළ යාන්ත්‍රික ආකාරවලින් වැලි කැණීම
- වැලි එකතු වීමක් සිදුනොවන වෙරළ, බාධක වෙරළ හා වැලි තුඩුවලින් වැලි ඉවත් කිරීම
- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අලුතින් හඳුනාගන්නා ලද වැලි එකතු වීමක් සිදුනොවන වෙරළ හෝ කෘත්‍රිම වැලි පෝෂණය සිදුකළ වෙරළවලින් වැලි ඉවත් කිරීම
- පසුගිය මාස විසිහතර තුළ ඛාදනයක් සිදුවී ඇති විශේෂිත ස්ථානවලින් වැලි ඉවත් කිරීම
- සාමාන්‍ය මුහුදු මට්ටමෙන් කි.මී. 2ක් මුහුද දෙසට සහ මීටර් 15ක් ගැඹුරට පවතින ස්ථානවලින් වාණිජමය කාර්යයන් සඳහා කැණීම් අවසර පත්‍ර නිකුත් නොකෙරේ.
- ගංගා, ඇල මාර්ග, කලපු හෝ ස්ථිරව හෝ යම් කාල සීමාවල දී මුහුද සමග සම්බන්ධ වන වෙනත් ජල ස්කන්ධවල ඉවුරුවල ඛාදනය දක්නට ලැබේනම් එවැනි ස්ථානවලින් වැලි ඉවත් කිරීම සිදු නොකෙරේ.
- වෙරළ කලාපය තුළ පවතින ජල ස්කන්ධවල ඉවුරුවලින් වැලි කැණීමට අවසර නොලැබේ.
- පොම්පාගාර, ජල පවිත්‍රාගාරවලට ජලය ඇතුළු වන ස්ථාන සහ පාලම් වැනි වැදගත් ජල ආශ්‍රිත ඉදිකිරීම් පවතින ස්ථානවල දී, එම ස්ථානවල සිට මීටර් 200 සිට 500 දක්වා දුරකට වැලි කැණීම සිදු නොකළ යුතු ය. අදාළ ස්ථානීය තත්ත්වයන් සලකා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නිශ්චිත කළ යුතු දුර තහවුරු කරනු ලැබේ.

**සුවිශේෂී වාතාවරණයන් යටතේ, පහත අවශ්‍යතා ඉටු වේ නම් පමණක් අවසර පත්‍ර නිකුත් කෙරේ:**

- පාරිසරික හානිපූරණ ක්‍රියාවලිය, එනම් වැලි ඉවත් කිරීම/ කැණීම සිදුකරන ප්‍රදේශයේ පාරිසරික තත්ත්වය ප්‍රතිස්ථාපනය හා වැඩිදියුණු කිරීම සමග අනුකූලවීම.
- වැලි කැණීම හා ප්‍රවාහනය ආශ්‍රිත බලපෑම් ද ඇතුළුව යෝජිත වැලි ඉවත් කිරීමේ කාර්යය සඳහා සහාය වීමේ හැකියාවක් වෙරළ සහ/හෝ වැලි වැටිවලට පැවතීම.
- ඇතිවිය හැකි ශබ්දය මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රමිත සමග අනුකූලවීම.
- භූගත ජල මට්ටම වෙනස් නොවීම සහ මතුපිය හා භූගත ජලයට අපද්‍රව්‍ය මුසු නොවිය යුතු ය.
- දැනට පවතින වනජීවී වාසස්ථාන හා කැස්බෑවන් බිත්තර දමන ස්ථානවලට බාධා එල්ල නොවිය යුතු ය.
- යෝජිත පරිද්දෙන් කැණීම්/ ඉවත් කිරීම් මගින් සමස්ත වැලි වැටි පද්ධතිය දුර්වල නොවිය යුතු ය.
- ආපදා අවස්ථාවක දී ජීවිත හා දේපළ ආරක්ෂා කරගැනීම සඳහා එවැනි ඉවත් කිරීමක් අවශ්‍ය වීම.

**6.2.6 වෙරළ කලාපය තුළ තහනම් කාර්යයන්**

වෙරළ සංරක්ෂණ පනතේ විධිවිධාන අනුව, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වෙරළ කලාපයක් තුළ තහනම් කර ඇති කාර්යයන් පහත පරිදි වේ:

- හිරිගල් ඉවත් කිරීම (*සටහන:* පර්යේෂණ කාර්යයන් සඳහා හෝ නැවත සිටුවීම සඳහා තවාන් පිහිටුවීමේ දී, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් වර්ගය, ප්‍රමාණය, ස්ථානය හා හිරිගල්පර ඉවත් කිරීම සඳහා කාලසීමාව නිශ්චිතව දක්වමින් අවසර පත්‍රයක් නිකුත් කළ හැකි ය).
- විශේෂිත ස්ථාන වශයෙන් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් හඳුනාගන්නා ලද ප්‍රදේශවලින් හැර අනෙක් ප්‍රදේශවලින් වැලි ඉවත් කිරීම.
- වෙරළ කලාපයේ සුවිශේෂී දර්ශනය සහ සංස්කෘතික වටිනාකම සැලකිය යුතු ආකාරයෙන් පහළ දමන යම් සංවර්ධන කාර්යයක්.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වන ජීවී දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කර ඇති ආරක්ෂිත ප්‍රදේශවල සිදුකරන සංවර්ධන කටයුතු.
- වෙරළ කලාපය තුළ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නම්කර ඇති පුරාවිද්‍යාත්මක, සංස්කෘතික, සහ ඓතිහාසික ස්ථානයක මායිමේ සිට නියම කරන ලද අරයක් දක්වා වන සීමාව ඇතුළත සංවර්ධන කටයුතු.
- නම් කරන ලද "බලපෑමට යටත්වන ප්‍රදේශ", "සංරක්ෂණ ප්‍රදේශ", සහ අනවසරයෙන් ගොඩකරනු ලැබූ ප්‍රදේශ සහ වැලි වැටි ප්‍රදේශවල සංවර්ධන කටයුතු.

**6.2.7 "බලපෑමට යටත්වන ප්‍රදේශ" තුළ තහනම් කාර්යයන්**

2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතින් සංශෝධන කරන ලද 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ නෛතික විධිවිධානවලට අනුව, වෙරළ කලාපය ඇතුළත හෝ වෙරළ කලාපයට යාබදව හෝ ඒ ප්‍රදේශ දෙකම ඇතුළත් වූ හෝ, යම් ජල ස්කන්ධයක් හෝ යම් ජල ස්කන්ධයක කොටසක් ඇතුළත හෝ යම් ජල කලපුවක හෝ යම් කලපුවක කොටසක හෝ කලපුවක යම් පර්යන්ත ප්‍රදේශයක් "බලපෑමට යටත්වන ප්‍රදේශයක්"වශයෙන් අවශ්‍ය පරිදි ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කළ හැකි ය.

ඒ අනුව, වෙරළ සංරක්ෂණ පනතේ 14 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ලබාගන්නා අවසර පත්‍රයක් යොදාගෙන බලපෑමට යටත්වන ප්‍රදේශයක සිදුකරන යම් සංවර්ධන කාර්යයක්, තහනම් කාර්යයක් ලෙස සැලකිය හැකි ය. තව ද, බලපෑමට යටත්වන ප්‍රදේශයක් තුළ ගොඩකිරීම්, ඉදි කිරීම්, බාධාවන්, දූෂණය හෝ අපද්‍රව්‍ය දැමීම, හෝ ජලජ හෝ සමුද්‍රීය ජීවීන්ට හානි සිදුවන ඕනෑම කටයුත්තක් තහනම් කර තිබේ.

**6.2.8 "සංරක්ෂණ ප්‍රදේශය" තුළ තහනම් කාර්යයන්**

2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතින් සංශෝධන කරන ලද 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනතේ නෛතික විධිවිධානවලට අනුව, වෙරළ හා ජලජ පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා යම් ප්‍රදේශයක් තුළ විශේෂ පියවරගත යුතු වන අවස්ථාවක දී එවැනි ප්‍රදේශයක් "සංරක්ෂණ ප්‍රදේශයක්" වශයෙන් ප්‍රකාශයට පත්කළ හැකි ය.

එම විධිවිධාන අනුව, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කළ අවසර පත්‍රයක් සහිතව එවැනි ප්‍රදේශයක විද්‍යාත්මක අධ්‍යයනයක හෝ පර්යේෂණයක නියැළීම හැර, සංරක්ෂණ ප්‍රදේශයක් තුළ කිසිදු සංවර්ධන කාර්යයක් හෝ ජලජීවී සම්පත් රැස්කිරීම හෝ නිස්සාරණය කිරීමක් සිදු නොකළ යුතු ය.

**6.2.9 ආරක්ෂිත ප්‍රදේශ සඳහා පසසිටු දුරවල්**

මෙම සැලැස්මේ වගුව 6.1 හි දක්වා ඇති පසසිටු දුරවල් ආරක්ෂිත ප්‍රදේශ සඳහා අදාළ නොවන අතර එම ප්‍රදේශ "කිසිදු ඉදිකිරීමක් රහිත කලාප" වශයෙන් සැලකිය යුතු ය.

රැම්සා තෙත් බිම්, ආරක්ෂිත කලාප, අභය භූමි, රක්ෂිත වනාන්තර, සංරක්ෂණය කළ වනාන්තර, ජාතික උරුමයන් ලෙස සැලකෙන වල් බිහිවූ ඉඩම්, දැඩි සංරක්ෂිත ප්‍රදේශ, ජාතික උද්‍යාන, කැලෑ මාර්ග, පදිකවරණ හා සමුද්‍රීය සංරක්ෂිත යනාදිය සංරක්ෂණ ප්‍රදේශ යටතට ඇතුළත් වේ. ධීවර කළමනාකරණ ප්‍රදේශ, ධීවර රක්ෂිත හෝ ශ්‍රී ලංකා රජය විසින් නම්කරන ලද ප්‍රදේශයක් හෝ ස්ථානයක සිට මීටර් 300ක පසසිටු දුරක් අදාළ විය යුතු ය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් වෙරළ කලාපය තුළ නම් කරන ලද පුරාවිද්‍යාත්මක ස්ථානවල සිට මීටර් 200ක පසසිටු දුරක් අදාළ විය යුතු ය.

**6.3 පසසිටු ප්‍රදේශ**

**6.3.1 සංශෝධිත නෛතික විධිවිධාන ප්‍රකාරව පසසිටු ප්‍රදේශ සංශෝධනය කිරීම**

2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත මගින් 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතට සිදු කරන ලද සංශෝධනයන් අනුව, ජල තලයන්හි දෙපස භූමියේ මීටර් 100ක් ද අයත් වන ලෙස "වෙරළ කලාපය" යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනස් කරන ලදී. මේ අනුව දෙපස භූමියේ සිදු කරනු ලබන සංවර්ධන කටයුතුවලින් සිදුවන බලපෑම් අවමකිරීම සඳහා එවැනි සංවර්ධන කටයුතු පාලනය කිරීමේ බලය ද නව සංශෝධන මගින් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. ප්‍රදේශ දෙක අතර ඉතා සමීප සබඳතාවක් තිබුනද එම ප්‍රදේශවල ජීව භෞතික ගති ලක්ෂණ සහ අවදානමට ලක්විය හැකි තත්ත්වය වෙනස් වේ. මේ නිසා පසසිටුව සහ ආරක්ෂිත ප්‍රදේශ වෙන්කිරීම තීරණය කිරීමේදී වෙනස් වූ නිර්ණායකයන් යොදා ගෙන තිබේ.

**6.3.2 පසසිටුව මගින් අපේක්ෂිත අරමුණු**

- වෙරළබඩ උපද්‍රවවලින් ජීවිත හා දේපළ ආරක්ෂා කිරීම.
- වෙරළ ආරක්ෂණ ඉදිකිරීම් සඳහා රජයේ ආයෝජන සිදුකිරීම අවම කිරීම.
- වෙරළබඩ පරිසරවල සෞන්දර්යාත්මක දර්ශනවල අගය ආරක්ෂා කිරීම හා වැඩිදියුණු කිරීම, අවදානමට මුහුණ දී ඇති වෙරළබඩ පරිසර පද්ධති සහ සුවිශේෂී ස්වභාවික ස්ථාන ආරක්ෂා කිරීම.
- වෙරළ කලාපය තුළ පිහිටි පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, සංස්කෘතික සහ ආගමික වැදගත්කමකින් යුතු ස්ථාන ආරක්ෂා කිරීම සඳහා ස්වාරක්ෂක කලාප ලෙස පැවතීම.
- වෙරළ කලාපය තුළ එකිනෙකින් වෙනස් විවිධ ක්‍රියාකාරකම්වලදී භාවිතාකරුවන් අතර ගැටුම් අවම කිරීම.
- වෙරළ ඔස්සේ සහ වෙරළ වෙත වූ මහජන පිවිසුම් සහතික කිරීම.
- ජාතික හා ප්‍රාදේශීය නීති හා සැලසුම් අතර අනුකූලතාවයක් පවත්වා ගැනීම.
- ජාතික සංවර්ධන අරමුණු සහ පාරිසරික අරමුණු අතර අනුකූලතාවය සහතික කිරීම.

### 6.4 වෙරළ පස සිටුව ප්‍රදේශය අර්ථ දැක්වීම

වෙරළ පස සිටුව ප්‍රදේශය යනු වෙරළ කලාපය තුළ පිහිටි භූගෝලීය තීරුවක් හෝ පටියක් වශයෙන් සැලකිය හැකි අතර ඒ තුළ ඇතැම් සංවර්ධන කාර්යයන් තහනම් කිරීම හෝ සැලකිය යුතු මට්ටමකට සීමාකර තිබේ. මෙම සැලැස්ම තුළ දක්වා ඇති පරිදි මෙය රක්ෂිත ප්‍රදේශය හා සීමාකළ ප්‍රදේශය යන ප්‍රදේශවලින් සමන්විත අතර එය පැතිර පවතිනුයේ වෙරළ ඛණ්ඩයක මුහුද දිසාවට යොමු ඉම සහ ගොඩබිම දෙසට යොමු ඉම අතර ය.

මුහුද දිසාවට යොමු ඉම සහ ගොඩබිම දෙසට යොමු ඉම 6.4.1 කොටසේ දී අර්ථ දක්වා තිබේ.

#### 6.4.1 මධ්‍යනය මුහුදු මට්ටමේ සිට මුහුද දිසාවට යොමු ඉම සහ ගොඩබිම දෙසට යොමු ඉම අතර සංවර්ධන කාර්යයන් සඳහා වෙරළ පසසිටු ප්‍රදේශ

**අ) මුහුද දිසාවට යොමු ඉම:**

වෙරළ ඔස්සේ පිහිටා ඇති බිම් තීරයේ ස්ථිර වෘක්ෂලතා සහිත ප්‍රදේශය වශයෙන් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් හඳුනාගන්නා පොල් (Cocosnucifera), වැටකෙයියා (Pandanusssp) හෝ මූදිල්ල(Barringtoniaspeciosa) හෝ වෙනත් මල් පිපෙන ශාක විශේෂ පවතින ප්‍රදේශයේ සිට පස සිටුව සලකුණු කිරීමේ අයිතිය එම දෙපාර්තමේන්තුව සතු වේ. එසේ වුව ද, වෙරළ ඔස්සේ ඇති බිම් තීරයේ ස්ථිර වෘක්ෂලතා පිහිටා නොමැති අවස්ථාවක දී මධ්‍යන්‍ය මුහුදු මට්ටමේ සිට යෝග්‍ය සමෝච්ඡ රේඛාවක් හෝ දඹයක/ පාෂාණ උද්ගතයක මුහුද දෙසට ඇති ඉම, පවතින වෙරළ ආරක්ෂණ ව්‍යුහයක් හෝ වැලි වැටියක් මුහුද දිසාවට යොමු ඉම ලෙස සලකුණු කිරීමේ අයිතිය වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සතු වේ.

**ආ) වැලි වැටි ප්‍රදේශ සඳහා මුහුද දෙසට යොමු ඉම:**

යෝජිත ඉඩම, වැලි වැටිවලින් සමන්විත වෙරළ කලාපයක පිහිටා ඇත්නම්, වැටියේ ගොඩබිම දෙසට වන පාමුල සිට පසසිටුවක මුහුද දෙසට යොමුඉම පැහැදිලිව පෙන්නුම් කෙරේ.

#### 6.4.2 පසසිටුවක රක්ෂිත ප්‍රදේශය සහ සීමාකළ ප්‍රදේශය

දිවයිනේ සමස්ත වෙරළ පසසිටු තීරය වෙරළ ඛණ්ඩ 105කට වෙන් කර තිබේ. සෑම ඛණ්ඩයක් සඳහාම, 1 සිට 92 දක්වා අංක වෙන්කර තිබේ (වගුව 6.1). ඒ සෑම වෙරළ ඛණ්ඩයක්ම ප්‍රදේශ දෙකකට වෙන් කෙරේ: එනම් වෙන්කළ ප්‍රදේශය හා සීමාකළ ප්‍රදේශය වශයෙනි (රූපය 6.2).




රූපය 6- 2: වෙරළ කලාපය තුළ පසසිටු ප්‍රදේශය, වෙන්කළ ප්‍රදේශය සහ සීමාකළ ප්‍රදේශය සාපේක්ෂ පිහිටීම

(i) වෙන්කළ ප්‍රදේශය යනු වෙරළ තීරයට ආසන්නතම පෙදෙස වන අතර "කිසිවක් ඉදි නොකරන කලාපයට" අනුරූපී වේ. නියත වශයෙන්ම අත්‍යවශ්‍ය භාවිතයන්/ ක්‍රියාකාරකම් සඳහා පමණක් මෙම ප්‍රදේශය තුළ අවසර හිමිවේ.

(ii.) සීමා කළ ප්‍රදේශය (හෝ මෘදු කලාපය) භාවිතා කළ හැක්කේ අඩු බලපෑමක් සහිත සීමිත කාර්යයන් කිහිපයක් සඳහා පමණි.

අවදානම් නැඹුරුතාවය, ආරක්ෂා කර ඇති මට්ටම, සහ ආන්තික සංසිද්ධි සඳහා නිරාවරණය සහ අනෙකුත් භූ භෞතික ලක්ෂණ යන යම් වෙරළ ඛණ්ඩයක් සඳහා වන නිර්ණායක පසසිටු ප්‍රදේශ සලකුණු කිරීම සඳහා යොදා ගැනේ.

**වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මුහුද දෙස යොමු ඉමේ සිට ගොඩබිම දෙසට වූ සංවර්ධන කාර්යයන් සඳහා පසසිටුව වෙන්කිරීමේ දී යොදා ගන්නා නිර්ණායක පහත පරිදි වේ:**

- වෙරළ ඛාදන ශීඝ්‍රතාවයන්.
- "වෙරළ කලාපයේ" ජල ස්කන්ධවල දෙපස ඉවුරු ඛාදන ශීඝ්‍රතා මට්ටම.
- උදම් රළ, සුනාමි, සුළි සුළං, කුණාටු රළ ඉපිලුම් වැනි ආන්තික ස්වභාවික උපද්‍රවවලට නිරාවරණය වීම.
- උදම් රළ විචලනය, සැලකිය යුතු රළ මට්ටම සහ මුහුදු මට්ටම ඉහළ යෑමේ අවදානමට නැඹුරුතාවය.
- භූ රූපවිද්‍යාත්මක ලක්ෂණ.
- වෙරළ වාසස්ථාන පරිසර පද්ධති අවදානම් තත්ත්වයන්ට මුහුණ පෑමේ නැඹුරුතාවය.
- ආරක්ෂිත ප්‍රදේශ.
- සිදුකර ඇති වෙරළ සංරක්ෂණ පියවරවල ප්‍රමාණය.
- ස්වාභාවික සුන්දරත්වය, ස්වාභාවික බව, විනෝදාස්වාද, සහ පාරිසරික සේවා අගය වැනි අනෙකුත් ස්වභාවික ලක්ෂණවල වැදගත්කම.
- සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක ස්ථානවල වැදගත්කම.
- සංවර්ධන මට්ටම.
- භාවිතාකරන පිරිස් අතර පවතින ගැටුම්වල මට්ටම.
- ව්‍යවස්ථාපිත සීමා.
- ස්ථානයේ නීතිමය තත්ත්වය.
- ජාතික ආරක්ෂාව පිළිබඳ අවධානිත කරුණු.
- වාණිජ වරාය, ධීවර වරාය සහ නැංගුරම් ස්ථාන.

### 6.4.3 වෙන්කළ ප්‍රදේශය තුළ අවසර දෙනු ලබන සංවර්ධන කටයුතු/ ක්‍රියාකාරකම්

සලකනු ලබන සංවර්ධන කාර්යය/ ක්‍රියාකාරකම තුළින් අදාළ වෙරළ ඛණ්ඩය හෝ ආසන්න වෙරළ ඛණ්ඩ වෙත සුවිශේෂී බලපෑමක් ඇති නොවන බවට සහ වෙරළ වෙත හෝ වෙරළ තීරය ඔස්සේ සිරස් හා තිරස් ප්‍රවේශවීම් සඳහා බාධාවක් නොවන බවට වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සෑහීමට පත්වන ආකාරයට ඔප්පු කළ හැකි නම්, පහත සඳහන් සංවර්ධන කටයුතු/ ක්‍රියාකාරකම්වල නියුතු තැනැත්තන් සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවසර පත්‍ර නිකුත් කරනු ලැබිය හැකිය:

- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වෙරළ ඛාදන කළමනාකරණ ක්‍රමෝපායවලට අනුකූල වෙරළ සංරක්ෂණ ව්‍යුහයන්.
- වරාය හා ධීවර වරාය පහසුකම්, ජැටි, දිය කඩනයන්, කේබල් මාර්ග හා යාත්‍රා දියත් කරන මාර්ග.
- පොළොව යටින් දිවෙන මුහුදු ජලය ලබාගන්නා ස්ථාන, නළ ළිං සහ ඒ ආශ්‍රිත ඉදිකිරීම්.
- නාවික කටයුතු බාධා ඉවත් කිරීම.
- වාණිජ වටිනාකමකින් යුතු ඛනිජ නිස්සාරණය.
- පොළොව යටින් දිවෙන සන්නිවේදන, අපද්‍රව්‍ය බැහැර කිරීම්, බලශක්ති උත්පාදන, වැලි පෝෂණ, වායු හා තෙල් බෙදා හැරීම හා වෙරළාසන්න අනෙකුත් පොදු පහසුකම්.
- වෙරළාසන්න මුහුදේ දියයට කිමිදීමේ නාවික කටයුතු පහසුකම්.

- වෙරළ ප්‍රදේශවල සෞන්දර්ය වටිනාකම සහ ස්ථායිකරණය වැඩිදියුණු කිරීම සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සංරක්ෂණ කටයුතු
- පහත සඳහන් නිර්ණායක සපුරාලීමට යටත්ව, 1985 පෙබරවාරි 21 දිනැති අංක 337/48 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත මාදැල් පාඩු ස්ථාන සඳහා මාස හය (6) ක් නොඉක්මවන කාල සීමාවකට ධීවර කාර්යයන් සඳහා පමණක් තාවකාලික ඉදිකිරීම් සඳහා

- වහල ද්‍රව්‍ය :පොල් අතු, ඉලුක්, කැන්වස්, රෙදි හෝ තාර ෂීට්
- බිත්ති සඳහා: පොල් අතු, ලෑලි, ශාක පත්‍ර, උණ බම්බු, කැන්වස්, ප්ලාස්ටික් හෝ කඩදාසි
- බිම් ඇතුරුම: වැලි, මඩ, මඩ (පිරිසැකසුම් නොකළ), හෝ දැව
- අත්තිවාරම: ස්ථිර අත්තිවාරමක් නොදැමිය යුතු ය (ලෑලි, කොන්ක්‍රීට් හෝ ගඩොල් අත්තිවාරම්) සහ

- ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හෝ ධීවර කටයුතු සඳහා රජයේ නියෝජිතායතනයක් විසින් සැලසුම් කරන මාදැල් පාඩු ස්ථාන සඳහා පහසුකම් ලබාදෙන, වෙරළේ පළලින් 30%ට අඩු සහ දිග මීටර් 10ට (අඩි 33) අඩු ප්‍රමාණයෙන් යුත් අනෙකුත් පරිසර හිතකාමී ඉදිකිරීම්
- අතිරේක ස්වාරක්ෂක සැපයීම සඳහා ගොඩකිරීම්
- යම් නිශ්චිත වෙරළ ඛණ්ඩ සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නියම කර ඇති මාර්ගෝපදේශ හා නිර්ණායකවලට අනුකූලව වෙරළ සීමාවේ පිහිටි නගරවල සංවර්ධන කටයුතු
- ජීවිතාරක්ෂක කුළුණු, නිරීක්ෂණ කුළුණු/ ඉදිකිරීම්, ආපදාවලින් ආවරණය සඳහා ස්ථාන
- වෙන් කළ ප්‍රදේශයක් තාවකාලික වශයෙන් භාවිතා කිරීම සඳහා පවතින මාර්ගෝපදේශවලට අනුකූල ක්‍රියාකාරකම්

### 6.4.4 සීමාකළ ප්‍රදේශය (මෘදු ප්‍රදේශය) තුළ අවසර දෙනු ලබන සංවර්ධන කටයුතු/ ක්‍රියාකාරකම්

සීමාකළ ප්‍රදේශය කිසිදු සංවර්ධන කටයුත්තක් සඳහා යොදා නොගෙන පවත්වා ගැනීම යහපත් කළමනාකරණ ක්‍රියාවලියක් වන නමුදු, වර්තමානයේ පවතින ඉඩම් පරිශීලන ආකාර, ඉතා ඉහළ ජනගහන ඝනත්වයන්, සංවර්ධන කාර්යය තුළින් ඇතිවන පීඩනය, වෙරළ කලාපය තුළ ඉඩම් කොටස් කුඩා වීම වැනි කරුණු සලකා බැලීමේ දී එසේ පවත්වා ගැනීම සෑම අවස්ථාවේම සමාජීය වශයෙන් පිළිගනු නොලැබේ. එබැවින්, දැඩි බවින් අඩු කළමනාකරණ ක්‍රමෝපායක් අවශ්‍ය වේ. නිවෙස් සහ සංචාරක කටයුතු සඳහා පමණක් සීමාකළ ප්‍රදේශයක ඉදිකිරීම් කටයුතු සීමා වෙන අතර, එවැනි නිවෙස් සහ සංචාරක කටයුතු ආශ්‍රිත සංවර්ධනයන්/ ක්‍රියාකාරකම් වුව ද, වෙරළ වෙත හෝ වෙරළ තීරය ඔස්සේ සිරස් හා තිරස් ප්‍රවේශවීම් සඳහා බාධාවක් නොවිය යුතු ය.

### 6.4.5 වෙරළ පසසිටුවෙන් නිදහස් කිරීම

මෙම සැලැස්ම තුළ දක්වා ඇති පසසිටු මාර්ගෝපදේශවලින් සැලකිය යුතු අපගමනයක් වෙරළ පසසිටුවෙන් නිදහස් කිරීම මගින් හැඟවේ. වෙරළ පසසිටුවෙන් නිදහස් කිරීම අනුමත කරනුයේ පොදු මහජන යහපත වෙනුවෙන් එසේ කිරීම අවශ්‍ය වන අවස්ථාවක දී පමණි. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ උපදේශක සභාව විසින් වෙරළ පසසිටුවෙන් නිදහස් කිරීම සිදුකළ යුතු බවට හේතු පවතින බවට නිර්ණය කර එය නිර්දේශ කළහොත් පමණක් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඒ සඳහා අවසර ලබාදිය හැකි ය. පසසිටුව ප්‍රදේශවල සීමාකළ කාර්යන්වල නිරතවීම සඳහා, අයදුම්කරු විසින් නිශ්චිත නිර්ණායක සපුරාලන්නේ නම් පමණක් පසසිටුව නිදහස් කිරීම් ලබාදේ. පසසිටුව නිදහස් කිරීම් ලබාදීම සඳහා පහත දැක්වෙන නිර්ණායක සපුරාලීම අවශ්‍ය වේ.

- යෝජිත කාර්යය පොදු අරමුණක් සපුරාලීම සඳහා වියයුතු අතර, තනි පුද්ගල හෝ ආයතනික අවශ්‍යතා සපුරාලීම වෙනුවට සමස්තයක් ලෙස පොදු මහජනතාවට ප්‍රතිලාභ ලැබිය යුතු අතර, අනිවාර්යෙන් පහත කරුණු එකක් හෝ කිහිපයක් විය යුතු ය:
  - √ උපයෝගිතා, බලශක්ති, සන්නිවේදන, සහ ප්‍රවාහන පහසුකම් වැනි පොදු යටිතල පහසුකම් හා සම්බන්ධිත විය යුතු ය.
  - √ ප්‍රජාව වෙත විශාල ප්‍රමාණයෙන් ආර්ථික ප්‍රතිලාභ ඇතිකරන හෝ වෙරළ වෙත මනා ප්‍රවේශයක් ඇති කරන ජලය මත පදනම් වූ කාර්යයක් විය යුතු ය.
  - √ ජාතික ආරක්ෂා හා සම්බන්ධිත කාර්යයක් වීම.
  - √ නාගරික/ නගර අලංකරණ හෝ භූමි සැකසුම් වැනි පරිසර තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා වන මැදිහත්වීමකට අදාළ වීම.
  - √ ජීවිත හා දේපළ ආරක්ෂා කරන උපද්‍රව අවම කිරීමේ පියවරක් වශයෙන්.

- දක්වා ඇති පොදු අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා වෙනත් සාධාරණ විකල්ප ස්ථානයක් නොමැති වීම.
- මෙසේ වෙරළ පසසිටුවක් නිදහස් කිරීමක් සඳහා අවසර ලැබෙන අවස්ථාවක දී, සෘණාත්මක පරිසර බලපෑම් අවම කිරීම සඳහා සඳහා/හෝ භාවිතා කරන්නන්ගේ ගැටුම් අවම කිරීම සඳහා හැකි සෑම පියවරක්ම ගනු ලැබේ.

### 6.4.6 පසසිටු විචල්‍යතාවයන්

මෙම සැලැස්ම තුළ දක්වා ඇති පසසිටු මාර්ගෝපදේශවලින් සැලකිය යුතු අඩු කිරීමක් වෙරළ පසසිටු විචල්‍යතාවය මගින් හැඟවේ. වෙරළ පසසිටුවෙන් නිදහස් කිරීමකදී මෙන් නොව, පසසිටු සීමා වෙනස් කිරීමක් සඳහා පුද්ගලික යහපත ද සලකා බලනු ලැබේ. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ උපදේශක සභාව විසින් වෙරළ පසසිටු සීමා වෙනස් කිරීමක් සිදුකළ යුතු හේතු පවතින බවට නිර්ණය කර එවැනි වෙනස් කිරීමක් නිර්දේශ කළහොත් පමණක් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඒ සඳහා අවසර ලබාදිය හැකි ය. පසසිටුව වෙනස් කිරීම් ලබාදීම සඳහා පහත දැක්වෙන නිර්ණායක සපුරාලීම අවශ්‍ය වේ.

- යෝජිත සංවර්ධන කාර්යය සීමාකළ ප්‍රදේශය තුළ සහ/හෝ සීමාකළ ප්‍රදේශයේ සිට ගොඩබිම දෙසට නිශ්චිත වශයෙන්ම යොමු වේ.
- යෝජිත වෙනස් කිරීම තුළින් සැලකිය යුතු පරිසර බලපෑමක් හෝ භාවිතා කරන්නන්ගේ ගැටුම් සඳහා පෙළඹවීමක් ඇති නොවිය යුතුය. පරිසර බලපෑමේ තත්ත්වය නිර්ණය කිරීම සඳහා වෙරළ සංරක්ෂණ උපදේශක සභාව විසින් පහත කරුණු සලකා බැලිය යුතු යः

  - යෝජිත වෙනස් කිරීම ඉල්ලා සිටින ප්‍රදේශය තුළ දැනට පවතින වෙරළ ඛාදන ශීඝ්‍රතාවයන්
  - යෝජිත වෙනස් කිරීම ඉල්ලා සිටින කාර්යය තුළින් වෙරළ ඛාදන ශීඝ්‍රතාවය වැඩිවනු ඇතැයි අපේක්ෂා කරන මට්ටම
  - යෝජිත වෙනස් කිරීම ඉල්ලා සිටින කාර්යය තුළින් වෙරළබඩ පරිසර පද්ධති අවට ප්‍රදේශය සඳහා අහිතකර අයුරින් එල්ලවන බලපෑම් ප්‍රමාණය
  - කඳු, වෘක්ෂලතාදිය හෝ වැලි වැටි වැනි භූ රූප ලක්ෂණ අඩුවීම හෝ ඒවා මත අහිතකර බලපෑම් එල්ලවිය හැකි ප්‍රමාණය
  - අදාළ ස්ථානයේ ස්ථාවරබව සහ භූමි සංයුතිය මත පදනම් ව යෝජිත වෙනස් කිරීම ඉල්ලා සිටින ස්ථානය මුහුදු මට්ටමේ සිට කොපමණ උසකින් පිහිටා තිබෙන්නේ ද යන්න.
  - යෝජිත කාර්යය තුළින් පවතින වෙරළ ආරක්ෂණ ඉදිකිරීම් මත ඇතිවිය හැකි පරස්පර බලපෑම්
  - මෙම වෙනස් කිරීම යොදා ගැනීම සම්බන්ධයෙන් අදාළ වන තීරණයක පූර්වාදර්ශය

- මතභේදයට යොමුවී ඇති ස්ථානයේ පවත්නා තත්ත්වය හේතු කොටගෙන, පසසිටුව මගින් අයදුම්කරු වෙත අනවශ්‍ය දුෂ්කරතා ඇතිවිය හැකි ය.
- අයදුම්කරු විසින් ඉල්ලා ඇති පසසිටු වෙනස්කිරීම යනු අනවශ්‍ය දුෂ්කරතාවලින් මිදීම සඳහා අවශ්‍ය අවම පිළියම වේ.
- අනවශ්‍ය දුෂ්කරතා යනු අයදුම්කරුගේ යම් පූර්ව ක්‍රියාවකින් උද්ගතවී ඇති ප්‍රතිඵලයක් නොවේ.
- අවසර ලබාදිය යුතු පසසිටු වෙනස් කිරීම, විද්‍යාත්මක පැහැදිලි කිරීමක් මත පදනම්ව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කළ යුතු ය.

### 6.4.7 මහජන ක්‍රියාකාරකම් පාලනය කිරීම/ පෙර වෙරළ භාවිතා කිරීම

පෙර වෙරළේ තහනම් කරන ලද කටයුතු

- වැටවල් ඉදි කිරීම
- ගස් සිටුවීම
- අප ජලය හා ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම
- බහාලුම් සහ භාවිතා නොකරන ධීවර යාත්‍රා හෝ ආම්පන්න භාවිතාකරමින් සිදුකරන ඉදිකිරීම් කටයුතු

**ජාතික සංවර්ධනයට අදාළව පොදු අවශ්‍යතා සහ විශේෂ අවශ්‍යතා සඳහා පමණක් පෙර වෙරළ සීමාව තුළ අවසර ලබාදිය හැකි භාවිතා කිරීම**

- වෙරළ දර්ශනය කිරීමට අදාළ කටයුතු හා එවැනි කාර්යයක් සඳහා වන ඉදිකිරීම්
- සාගර පියවාන්, මුහුදු ජලය ලබාගන්නා ස්ථාන
- වරායවල් සහ ධීවර වරායන්ට අදාළ ඉදිකිරීම්
- ජීවිතාරක්ෂක කුළුණු (ආපදා අවස්ථා සම්බන්ධයෙන් අනතුරු ඇඟවීම් කටයුතුවලට අදාළ කුළුණු, ජීවිතාරක්ෂක කුළුණු/ ඉදිකිරීම්, නිරීක්ෂණ කුළුණු/ ඉදිකිරීම්)
- දියයට කේබල් හා සන්නිවේදන මාර්ග
- ජාතික ආරක්ෂාව හා අදාළ කටයුතු
- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් තාවකාලික අවසර පත්‍ර කාර්ය පටිපාටිය යටතේ අනුමත කළ අනෙකුත් කටයුතු/ භාවිතයන්

**ආරක්ෂිත ඉදිකිරීම් සමග වාණිජ වරාය, ධීවර වරාය සහ නැංගුරම්වල ගොඩබිම ඉම සඳහා පසසිටු සීමාවන්**

වාණිජ වරාය, ධීවර වරාය සහ නැංගුරම්වලින් ගොඩබිම ඉම දෙසට ස්ථානගත වී ඇති පොදු සහ පුද්ගලික ගොඩබිම් ප්‍රදේශ සඳහා පසසිටු ප්‍රමිත අදාළ නොවේ. එක් එක් සිද්ධිය අනුව යන පදනමින් එවැනි යටිතල පහසුකම්වල සීමා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් තීරණය කරනු ලැබේ.

**6.4.8 පවත්නා ඉදිකිරීම් යළි සකස් කිරීම/ පුළුල් කිරීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීමේ මාර්ගෝපදේශ**

වෙරළ කලාපය තුළ නාගරික සංවර්ධනය හා පුළුල් කිරීම, ඓතිහාසික, සංස්කෘතිකමය හා භාවාත්මක වටිනාකම්, සහ පවත්නා ඉඩම් හිඟය හා ඉඩම්වල ඉහළ මිල ගණන් හේතුවෙන්, වෙරළ කලාපය තුළ දැනට පවතින ගොඩනැගිලි පුළුල් කිරීමේ හා යළි සකස් කිරීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් එවැනි කටයුතු සඳහා අවසර පත්‍ර නිකුත් කිරීමේ දී පවතින පසසිටු ප්‍රමිත සමග පරස්පරතාවයන් හෝ අවිනිශ්චිතතාවයන් ඇතිවීම වැළැක්විය නොහැක. එවැනි අවස්ථා මඟ හැරවීම සඳහා වෙරළ කලාපය තුළ දැනට පවතින ගොඩනැගිලි පුළුල් කිරීමේ හා යළි සකස් කිරීමේ පහත මර්ගෝපදේශ යොදා ගත යුතු ය.

- දැනට පවතින ගොඩනැගිල්ල වෙන්කළ ප්‍රදේශයක පිහිටා ඇති නම් එහි බිම් මහලේ ඉඩ ප්‍රමාණය වැඩි නොකළ යුතු අතර, එකී ගොඩනැගිල්ලේ බිම් මහලේ සැකැස්ම වෙනස් නොකළ යුතු ය.
- නැවත සකස් කළ යුතු දැනට පවතින ගොඩනැගිල්ලේ මුහුද ඉම සීමාව දෙසට අපද්‍රව්‍ය ටැංකි, පිහිනුම් තටාක, සමුද්‍ර බැම් හෝ අනෙකුත් ව්‍යුහයන් සඳහා අවසර දෙනු නොලැබේ.
- දැනට පවතින ගොඩනැගිල්ලේ ඓතිහාසික, ආගමික හෝ පුරාවිද්‍යාත්මක වටිනාකමක් පවතී නම්, යම් නවීකරණයක් සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් අවසර ලබා ගැනීම අවශ්‍ය කෙරේ.
- වෙරළබඩ නගර සැලසුම් සහ වෙරළ සංරක්ෂණ සැලසුම් පවතී නම්, දැනට පවතින ගොඩනැගිල්ල නැවත සකස් කිරීමේ සැලසුම් සඳහා වන අනුමැතිය පෙර සඳහන් කළ සැලසුම් සමග අනුකුල විය යුතු ය.
- වෙරළ සංරක්ෂණ පනත බලාත්මක වූ දිනය ලෙස සැලකෙන 1983 ඔක්තෝබර් මස 01 වැනි දිනෙන් පසු ඉදිකර ඇති ගොඩනැගිලි සඳහා අවසර නොලැබේ.
- 1983 ඔක්තෝබර් මස 01 වැනි දිනට පෙර ඉදිකර ඇති ගොඩනැගිලි සඳහා පමණක් අවසර ලැබෙන අතර එම ගොඩනැගිල්ලේ බිම් මහලේ පෙර පැවති සැකැස්ම තුළට සීමා විය යුතු ය.

**6.4.9 සංචාරක කටයුතු හා විනෝදාස්වාද ක්‍රියාකාරකම් සඳහා ජලාශ්‍රිත සංවර්ධන කටයුතු සහ දූපත් සංවර්ධන කටයුතු සඳහා මාර්ගෝපදේශ**

සංචාරක හා විනෝදාස්වාද කටයුතුවල මෑත කාලීන ප්‍රවණතා සමග, එම කටයුතු සඳහා පහසුකම් සැලසීම සඳහා දූපත් (වෙරළ කලාපය තුළ පිහිටි) සහ ජලාශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා ඉල්ලුමක් පවතී. මෑත කාලීන වශයෙන් ඉල්ලුම වැඩි වශයෙන් කේන්ද්‍රගතවී තිබෙනුයේ යාපනය අර්ධද්වීපයෙන් සහ කල්පිටියෙන් ඔබ්බට නොගැඹුරු මුහුදේ පිහිටි දූපත් රාශිය වෙත ය.

සංචාරක කටයුතු හා විනෝදාස්වාද ක්‍රියාකාරකම් සඳහා දූපත් සහ ජලාශ්‍රිත සංවර්ධන කටයුතුවලින් ප්‍රතිඵල වියහැකි ප්‍රධාන පාරිසරික සහ සමාජ-ආර්ථික ගැටලු විවිධ විය හැකි අතර පහත දැක්වෙන ජෛව-භෞතික ලක්ෂණ සහ බලපෑම් කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය කෙරේ:

- සංවර්ධන කටයුතු සිදුකරන ප්‍රදේශවල පාරිසරික සම්පත්වල දුබල ස්වභාවය හේතු කොටගෙන පාරිසරික පර්යන්ත අගය පහළ මට්ටමක පැවතීම (පීඩන සඳහා ඔරොත්තු දීමේ හැකියාව).
- වෙරළවල් ඇතුළුව වෙරළබඩ පරිසර පද්ධතිවල රඳවා ගැනීමේ ධාරිතාවය සීමා වීම.
- ජැටි, නැංගුරම් ස්ථාන, සහ අනෙකුත් සමුද්‍රීය ව්‍යුහ ඉදිකිරීම තුළින් ඇතිවිය හැකි විභව්‍ය බලපෑම් (මෙමඟින් දූපත්/ මුහුද ආසන්න නගර වටා වැලි ප්‍රවාහනයට බාධා ඇතිවීම, කැණීම් හේතුවෙන් තරංගවල ඇතිවිය හැකි වෙනස්කම්, හිරිගල්පර, මුහුදු තෘණ සහ අනෙකුත් සමුද්‍රීය පරිසර පද්ධති මත අවසාදිත තැන්පත්වීම, කැණීම් සහ ජල ස්කන්ධවල අනෙකුත් ඉදිකිරීම් හේතුවෙන් සමුද්‍රීය පරිසර පද්ධති විනාශ වීම).
- සිදුකරන සංවර්ධන කටයුතුවලින් සිදුවන හානිය අවම කිරීම සඳහා අතිරේක ආරක්ෂක ව්‍යුහ ඉදිකිරීම.
- ඛාදනය සහ වැලිතැන්පත් වීමේ රටාවන් වෙනස්වීමට හේතුවෙන වෘක්ෂලතාදිය ඉවත් කිරීම.
- ඝන හා ද්‍රව අපද්‍රව්‍ය රැස්වීම හේතුවෙන් පරිසර දූෂණය
- සාම්ප්‍රදායික ධීවර කටයුතු සහ සංචාරක හා විනෝදාස්වාද ක්‍රියාකාරකම් අතර ඇතිවන භාවිතා කරන්නන්ගේ ගැටුම්.
- දූපත්/ ස්ථානවල ගතික ස්වභාවය තක්සේරු කිරීම සඳහා වෙරළබඩ ක්‍රියාවලින්ට අදාළව පවතින ඓතිහාසික දත්ත හා තොරතුරු ප්‍රමාණවත් නොවීම.

සංචාරක කටයුතු හා විනෝදාස්වාද ක්‍රියාකාරකම් සඳහා දූපත් සහ ජලාශ්‍රිත සංවර්ධන කටයුතුවලට අදාළ සුවිශේෂී ලක්ෂණ සහ විභව්‍ය බලපෑම් සැලකිල්ලට ගෙන, සංවර්ධන කටයුතු සඳහා අවසර පත්‍ර නිකුත් කිරීමේ දී පහත මාර්ගෝපදේශ අදාළ කරගත යුතු ය.

1. දැනට බලාත්මක නෛතික විධිවිධානවලට (වෙරළ සංරක්ෂණ පනත, ජාතික පරිසර පනත සහ අනෙකුත් අදාළ පනත්) අනුකූලව සිදුකළ පාරිසරික බලපෑම් ඇගයීම් (EIA) හෝ මූලික පරිසර පරීක්ෂණ (IEE) කාර්යපටිපාටිවලින් අනාවරණය වූ කරුණු සිද්ධියෙන් සිද්ධිය වෙන් වෙන් වශයෙන් සලකා (case-by-case basis) වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අවසර පත්‍ර නිකුත් කළ හැකිය.
2. පාරිසරික බලපෑම් ඇගයීම් හෝ මූලික පරිසර පරීක්ෂණ කාර්ය පටිපාටිවලින් අනාවරණය වූ කරුණු මත පදනම්ව, වෙරළ පරිසරය තිරසර අයුරින් කළමනාකරණය සහතික කිරීම සඳහා සංවර්ධනකරු විසින් පාරිසරික කළමනාකරණ සැලසුමක් (EMP) පිළියෙල කර ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතු ය.
3. ජලාශ්‍රිත සංවර්ධන කටයුතු ජීව හිරිගල්පර ප්‍රදේශ සහ මුහුදු තෘණතලා ස්ථානවල/ හෝ ඊට ආසන්නව ස්ථානගත නොකළ යුතු ය.
4. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කර ඇති ජාතික වන උද්‍යානයක සිට පිටතට කි.මී. 1.6ක් දක්වා ප්‍රදේශය ඇතුළත ජලාශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා අවසර ලබා නොදිය යුතු ය.
5. අභයභූමි හෝ සමුද්‍රීය ආරක්ෂණ ප්‍රදේශවල ජලාශ්‍රිත සංවර්ධන ක්‍රියාකාරකම් ස්ථානගත කිරීම සඳහා සිද්ධියෙන් සිද්ධිය සඳහා වෙන් වෙන් වශයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින් අවසර ලබාගත යුතු ය.
6. ගංගා මෝය, කලපු හෝ ඇළ මුවදොරවල ජලතලය සහ දෙපස පිහිටි භූමියේ සිට මීටර් 500ක් දක්වා ජලාශ්‍රිත සංවර්ධන කටයුතු සිදුනොකළ යුතු ය.
7. ගංගා, ඇළ මාර්ග සහ අනෙකුත් ජල ස්කන්ධයෙ හි සිදුකරන සියලු ජලාශ්‍රිත සංවර්ධන කටයුතු ස්ථානගත කිරීම් සඳහා අවසර ලබාදීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත් වේ.
8. "පාරිසරික ආරක්ෂිත ප්‍රදේශ" ලෙස නම් කරන ලද ස්ථානයන් හි ජලාශ්‍රිත සංවර්ධන කටයුතු ස්ථානගත කිරීම් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබාගත යුතුය.
9. වෙරළ කලාපය තුළ ජලාශ්‍රිත සංවර්ධන කටයුතුවලින් ඇතිවන යම් අපද්‍රව්‍යයක් හෝ ඉවතලන ජලය බැහැර කිරීම හෝ තැන්පත් කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගත යුතු ය.
10. යෝජිත ජලාශ්‍රිත සංවර්ධන කටයුතුවලින් සාම්ප්‍රදායික ධීවර කටයුතු, ධීවර බිම් සහ මත්ස්‍ය සංක්‍රමණ මාර්ගවලට බාධාවක් නොවිය යුතු ය.

11. කුඩා දූපත් තුළ සිදුකරන ජලාශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා අවසර ලබාදිය යුත්තේ ප්‍රධාන භූමිය (ගොඩබිම ප්‍රදේශය) තුළ ප්‍රමාණවත් සේවා ප්‍රදේශයක් පවතී නම් පමණි.

12. ජාතික ආරක්ෂාව සඳහා ආරක්ෂක සීමා හෝ නිශ්චිත පියවර පනවා ඇති ප්‍රදේශවල ජලාශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා අවසර ලබා නොදේ.

13. රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධාන යටතේ අවශ්‍ය අනුමැතීන් ලබාගත යුතු ය.

14. 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ ප්‍රකාශයට පත්කළ "සංරක්ෂණ ප්‍රදේශ" සහ "බලපෑමට යටත් වන ප්‍රදේශ"තුළ කිසිදු සංවර්ධන කාර්යයක් සඳහා අවසර නොලැබේ.

15. දූපත් තුළ මහජන ප්‍රවේශය සහතික කිරීම සඳහා ඉඩකඩ තිබිය යුතු ය.

16. ස්වාභාවික ආපදාවල බලපෑම් අවම කිරීම සඳහා වන සියලුම පූර්ව ආරක්ෂණ පියවර/ ඉවත් කරගැනීමේ සැලසුම් සංවර්ධකයා විසින් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර එවැනි පියවර/ සැලසුම් සඳහා අනුමැතිය ලබාගැනීම අවශ්‍ය කෙරේ.

### 6.4.10 සංචාරක සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම් සඳහා පාවෙන ආකාරයේ වූ ජල පහසුකම් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ

ශ්‍රී ලංකාවේ වෙරළ කලාපය තුළ සංචාරක සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම් (පාවෙන අවන්හල්, විනෝදාත්මක කටයුතු සඳහා වූ පාවෙන උපාංග, බෝට්ටු නිවාස ආදිය) සඳහා මේ වනතුරු සැලකිය යුතු සුවිශේෂී තත්ත්වයක් නොමැත. නමුත් සංචාරක කර්මාන්තයට අදාළව පැනනැගී ඇති වර්තමාන සංවර්ධන ප්‍රවණතා සහ විවිධාංගිකරණ අවශ්‍යතා හේතුවෙන් නුදුරු අනාගතයේදී ම එවැනි පහසුකම් සකස් කිරීම සඳහා අවධානය යොමු කරනු ඇත. මෙවැනි පහසුකම් සංචාරක සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය වුව ද, මේ තුළින් සාම්ප්‍රදායික සමාජ-ආර්ථික ක්‍රියාකාරකම්, වෙරළ සීමාවේ පාරිසරික තත්ත්වය, සුන්දරත්වය සහ සංතරණ කටයුතු වැනි අංශ කෙරෙහි සෘණාත්මක බලපෑම් ඇතිවිය හැකි ය. එබැවින් වෙරළ කලාපය තුළ තිරසර ආකාරයෙන් සංචාරක සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම් සිදුකිරීම සහතික කිරීම සඳහා, සංචාරක සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම්වලට පාවෙන ආකාරයේ වූ ජල පහසුකම් ඉදිකිරීම හා ස්ථාපනය සඳහා පහත මාර්ගෝපදේශ අදාළ වේ.

1. වෙරළ කලාපය තුළ සංචාරක සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම්වලට පාවෙන ආකාරයේ වූ ජල පහසුකම් ඇති කිරීම සඳහා අවසර ලැබෙනුයේ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් හඳුනාගත් නිශ්චිත ස්ථානවල පමණකි.

2. අනුමැතිය ලබාදීමේ ක්‍රියාවලිය තුළ ඇතිවන ප්‍රමාදවීම් මග හරවා ගැනීම සඳහා විස්තරාත්මක ව්‍යාපෘති යෝජනාව සකස් කිරීමට පූර්වයෙන් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත මූලික ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කළ යුතු ය.

3. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මත පැවරී ඇති අභිමතානුසාරී බලය මත පදනම්ව, සිද්ධියෙන් සිද්ධිය වෙන් වෙන් වශයෙන් සලකා, සංචාරක සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම්වලට පාවෙන ආකාරයේ වූ ජල පහසුකම් සඳහා වූ ව්‍යාපෘති යෝජනා පාරිසරික බලපෑම් ඇගයීම් (EIA) හෝ මූලික පරිසර පරීක්ෂණ (IEE) ක්‍රියාවලියට යටත් වේ.

4. සංචාරක සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම්වලට පාවෙන ආකාරයේ වූ ජල පහසුකම් වෙරළ කලාපයේ ජලස්කන්ධවල උපස්තර මත ස්ථාපනය නොකළ යුතු ය.

5. හිරිගල්පර සහ මුහුදු තෘණතලා පිහිටා ඇති ස්ථාන හෝ කැස්බෑවුන් බිත්තර දමන ස්ථානවලට ආසන්නව විනෝදාස්වාදය සඳහා මසුන් ඇල්ලීම සහ පිහිනුම් කටයුතු සඳහා ස්ථාන ද ඇතුළුව සංචාරක සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම්වලට පාවෙන ආකාරයේ වූ ජල පහසුකම් සඳහා අවසර ලබා නොදේ.

6. සංරක්ෂණ ප්‍රදේශ, බලපෑමට යටත් වන ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති ස්ථාන සහ වැලි ද ඇතුළුව ඛනිජ කැණීම සඳහා හඳුනාගත් ස්ථානවල සංචාරක සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම්වලට පාවෙන ආකාරයේ වූ ජල පහසුකම් ස්ථාපනය සඳහා අවසර ලබා නොදේ.

7. වෙරළ දර්ශනය නැරඹිය හැකි ස්ථාන හෝ රිටි දැල් සහ බිලිපිත්ත වැනි ආම්පන්න භාවිතයෙන් සාම්ප්‍රදායික ධීවර කටයුතු සිදුකරන ස්ථානවලට ආසන්නයේ සංචාරක සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම්වලට පාවෙන ආකාරයේ වූ ජල පහසුකම් ස්ථාපනය සඳහා අවසර ලබා නොදේ.

8. සංචාරක සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම්වලට පාවෙන ආකාරයේ වූ ජල පහසුකම්වලින් වෙරළ කලාපයේ වෙරළ ජලය හෝ වෙනත් ජල ස්කන්ධ තුළට අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අවසර නොමැත.

9. බෝට්ටු ආදිය රැහැන්වලින් බැඳ තැබීමෙන් වෙරළ තීරය වෙත ඇති නීත්‍යානුකූල පොදු ප්‍රවේශය වෙරළ කලාපය භාවිතයන්ට අවහිර නොවිය යුතු ය.

10. සංචාරක සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම්වලට පාවෙන ආකාරයේ වූ ජල පහසුකම් ඉදි කිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී විෂ සහිත සංයෝගවලින් පිරියම් කළ දැව හෝ වෙනත් ද්‍රව්‍ය භාවිතා නොකළ යුතු ය.

11. පාවෙන ආකාරයේ වූ ජල පහසුකම් තුළ ආලෝකකරණ ව්‍යුහ නියමිත ස්ථානවලට කේන්ද්‍රීය කිරීම සහ ආලෝකකරණය අවම කරන ආවරණ යොදාගනිමින් රාත්‍රි කාලයේ දී යොදා ගන්නා කෘත්‍රිම විදුලි ආලෝකය අවට ප්‍රදේශය වෙත ව්‍යාප්තවීම හැකිතාක් දුරට වැළැක්විය යුතු ය.

12. අදාළ පහසුකමෙහි ව්‍යුහය පාවීම සඳහා හෝ ඊට අදාළ වෙනත් කාර්යයකට යොදා ගන්නා සියලු පෙණ සහිත ද්‍රව්‍ය පුපුරා යෑම හෝ ජලයට මුසුවීම වැළැක්වීම සඳහා ආරක්ෂිත වැස්මක් තිබිය යුතු අතර එය කෙළින්ම පාරජම්බුල විකිරණවලට හෝ ඝර්ෂණයකට භාජනය නොවිය යුතු ය.

13. දේශීය ජලජීවී වෘක්ෂලතාදිය පවතින ප්‍රදේශයෙන් අවම වශයෙන් මීටර 10ක දුරින් පිහිටිය යුතු ය.

14. වෙරළ ජලය භාවිතා කරන්නන්ගේ සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා සහ ආපදා වැළැක්වීම සඳහා පාවෙන ආකාරයේ වූ ජල පහසුකම් ප්‍රමාණවත් අයුරින් පරාවර්තක ආධාරයෙන් සලකුණු කළ යුතු ය.

15. ආරක්ෂක කාර්යයන් සඳහා ඇති ස්ථාපනය කිරීම්වලට ඉතා ආසන්නයෙන් මෙම පාවෙන ආකාරයේ වූ ජල පහසුකම් ස්ථාන ගත කිරීම සඳහා අවසර නොලැබේ.

**6.4.11 වාසය කළ හැකි ජලය මත ඉදි කිරීම් (ජල බංගලා) සඳහා මාර්ගෝපදේශ**

සාගර, කලපු, ගං මෝය හෝ ගංගා වැනි පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශවල සංචාරක කටයුතු සඳහා ජල බංගලා ඉදි කිරීමේ දී, පරිසර පද්ධති මත ඇතිවන අහිතකර බලපෑම් සහ මෙම ඉදිකිරීම් සමග මතුවීමේ සම්භාවිතාවයක් ඇති භාවිතාකරන්නන්ගේ ගැටුම් අවම කිරීම සඳහා පාරිසරික මාර්ගෝපදේශ අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ. එවැනි සංවර්ධන කටයුතුවලදී අදාළ වන පරිද්දෙන් පහත පොදු මාර්ගෝපදේශවලට අනුගත වීම අවශ්‍ය කෙරේ.

1. විභව්‍ය පරිසර බලපෑම් හඳුනාගැනීම සහ වැළැක්වීමේ පියවර යෝජනා කිරීම සඳහා ආරම්භ කිරීමට පෙර පරිපූර්ණ පාරිසරික බලපෑම් තක්සේරුව හෝ මූලික පරිසර පරීක්ෂණය සිදුකළ යුතු ය.

2. සංවේදී වාසස්ථාන (හිරිගල් පර, මුහුදු තෘණ තලා වැනි) මඟ හරිමින් සමුද්‍රීය ජීවීන් සහ රිටි දැල් සහ බිලිපිත්ත වැනි ආම්පන්න භාවිතයෙන් ධීවර කටයුතු සිදුකරන සාම්ප්‍රදායික ජීවනෝපාය මාර්ග මත අවම බලපෑමක් ඇතිකරවන අවම පාරිසරික අගයක් ඇති ස්ථානයක් තෝරා ගැනීම.

3. සම්පත් භාවිතා කිරීම සහ අපද්‍රව්‍ය උත්පාදනය අවම කිරීම සඳහා තිරසර ගොඩනැගිලි ද්‍රව්‍ය, බලශක්ති කාර්යක්ෂමතා සැලසුම්, අවම බලපෑමක් ඇති ඉදිකිරීමේ තාක්ෂණයන් යොදා ගැනීම.

4. ප්ලාස්ටික් සහ අනෙකුත් ජෛව-හායනය නොවන අපද්‍රව්‍ය අවම කිරීම සඳහා ඵලදායි අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.

5. සමුද්‍රීය ජීවය සහ ජලයේ ගුණාත්මකබව සහ අනෙකුත් ජලය මත පදනම් විනෝදාස්වාද ක්‍රියාකාරකම් සඳහා අපද්‍රව්‍ය බැහැර කිරීම් හානියක් නොවන බව සහතික කිරීම සඳහා දියුණුකළ අපජලය පිරියම් කිරීමේ ක්‍රමවේද උපයෝගී කරගැනීම.

6. හිරිගල්පර ප්‍රදේශයකට ආසන්නව පිහිටා තිබේ නම්, ඒවා ඉදිකිරීම් කටයුතු වලින් හා සංචාරකයන්ගෙන් ආරක්ෂා කරගැනීම සඳහා භෞතික ස්පර්ශවීම් අවම වන නැංගුරම්ලෑමෙන් වැළැක්වීම සඳහා බෝයාවන් ස්ථාපනය කිරීම මඟ පෙන්වීමක් යටතේ කිමිදුම් කටයුතු ක්‍රියාත්මක කිරීම.

7. දේශීය ශාක හා සතුන් ආරක්ෂා කිරීම සහ වන සතුන්ට ආහාර දීම හා ඔවුන්ට බාධා කිරීම් වැළැක්වීම සඳහා නීති ස්ථාපනය කිරීම.

8. ලවණහරණ ක්‍රියාවලියෙන් පසු වෙරළබඩ හෝ කලපු ජලයට ඉවතලන ජලය මුදාහැරීම වැළැක්වීම.

9. සමුද්‍ර ජීවීන්ට බාධාවීම වැළැක්වීම හා ප්‍රදේශයේ නොකැළඹුන සන්සුන් වාතාවරණය පවත්වා ගැනීම සඳහා ශබ්ද හා ආලෝක දූෂණයන් අවම කිරීම.

10. යෝජිත සංවර්ධන මැදිහත්වීම විශේෂ කළමනාකරණ ප්‍රදේශයකට ආසන්නව ස්ථානගත කෙරේ නම්, ඒ සඳහා ප්‍රාදේශීය ප්‍රජාවගේ දායකත්වය ලබාගැනීම සහ සංරක්ෂණය හා තිරසර සංවර්ධනය සඳහා ඔවුන්ගේ පවත්නා ක්‍රමවේද සඳහා සහාය වීම.

11. පහසුවෙන් විනාශ විය හැකි පරිසර පද්ධතිය පිළිබඳව හා සංරක්ෂණ ප්‍රයත්නයන්ගේ වැදගත්කම සම්බන්ධයෙන් දැනුවත්බව වැඩි කිරීම.

12. කාලානුරූපී ආකාරයෙන් ජල බංගලා මගින් ඇතිවිය හැකි පාරිසරික බලපෑම් තක්සේරු කිරීම සඳහා අධීක්ෂණ වැඩසටහනක් ස්ථාපනය කිරීම හා ඒ අනුව අවශ්‍ය ගැලපීම් සිදුකිරීම.

13. ජල බංගලා සහ ජලය මත ඉදිකරන අනෙකුත් ව්‍යුහයන් සඳහා නිකුත් කරන අවසර පත්‍ර පාරිසරික හානිපූරණ ක්‍රියාවලියට යටත් වේ.

**6.4.12 පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා මාර්ගෝපදේශ**

සුළං, සූර්ය බලය, සමුද්‍රීය තාපබලය පරිවර්තනය, තරංග ශක්තිය පරිවර්තනය ඇතුළුව වෙරළබඩ ප්‍රදේශයේ පුනර්ජනනීය බලශක්තිය දියුණු කිරීම සඳහා සුපරීක්ෂාකාරී සැලසුම්කරණයක් සහ පාරිසරික, සමාජ, සහ ආර්ථික සාධක කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය කෙරේ. වෙරළ කලාපය තුළ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවල තිරසර සංවර්ධනය සඳහා පහත මාර්ගෝපදේශ තුළින් පහසුකම් සැලසේ.

1. පහත කරුණු අවධානයට යොමුකර, විභව්‍ය සමාජ, පාරිසරික බලපෑම් හඳුනාගැනීම සඳහා පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) හෝ මූලික පරිසර පරීක්ෂණය (IEE) සිදුකිරීම

   - සංවේදී වෙරළබඩ වාසස්ථාන සහ වෙරළබඩ පරිසර පද්ධති
   - වනජීවී සංක්‍රමණ මාර්ග
   - සුවිශේෂී පුරාවිද්‍යා ස්ථාන/ සම්පත්
   - සාම්ප්‍රදායික ධීවර ක්‍රම
   - සංවේදී ආරක්ෂක ස්ථාපනය කිරීම්
   - ජලයේ ගුණාත්මක බව

2. අනෙකුත් දැනට ක්‍රියාත්මක හෝ යෝජිත වෙරළ සංවර්ධන කටයුතු ද සැලකූ විට එහි සමුච්චිත බලපෑම පාරිසරික බලපෑම් ඇගයීමේ දී අවධානය යොමු කළ යුතු ය.

3. ප්‍රකාශයට පත්කර ඇති හෝ නිශ්චය කරනු ලැබූ බලපෑමට යටත්වන ප්‍රදේශයක සහ/හෝ සංරක්ෂණ ප්‍රදේශයක මෙම යෝජිත ව්‍යාපෘති ස්ථාන පිහිටා නොතිබිය යුතු ය.

4. වෙරළබඩ භූමිය වර්ගීකරණය සිදුකළ යුත්තේ වෙරළ භූමිය සකස් වී ඇති භෞතික ස්වභාවයට වෙනස් නොකරමින් අවම මට්ටමකිනි.

5. පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ව්‍යාපෘති අනෙකුත් සංවර්ධන කටයුතු සමග ඒකාබද්ධ කිරීම සඳහා වෙනම අවසරයක් ලබාගත යුතු ය.

6. ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ නියැලීම තුළින් පාර්ශවකරුවන් තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා දායකවීම සහතික කරගැනීම. සැලසුම්කරණයේ මුල් අවධියේම ඔවුන් සහභාගී කරගැනීමෙන් ප්‍රාදේශීය වශයෙන් පවතින දැනුම, ඔවුන්ගේ ගැටලු විසඳීම, හා ඔවුන්ගේ යෙදවුම් ව්‍යාපෘති සැලසුම්කරණය හා ස්ථානය තීරණය කිරීමේ දී අවධානයට ගැනීම.

7. වෙරළභූමි දර්ශනය සඳහා ඇතිවන බලපෑම අවධානයට යොමුකරමින් සුළං ටර්බයින් හා සූර්ය කෝෂ ස්ථාපනය කිරීම් සිදුකළ යුතු ය. වෙරළ තීරයේ දර්ශනය මත ඇතිවන බලපෑම් අවම කිරීම සඳහා වෙරළෙන් ඔබ්බෙහි පිහිටි සුදුසු ස්ථාන සුළං බලාගාර සඳහා යොදා ගැනීම.

8. සුළං ටර්බයිනවලින් ඇතිවන ශබ්ද දූෂණය වැළැක්වීම සහ පක්ෂීන් හා සමුද්‍ර ජීවීන් මත ඇතිවන විභව්‍ය හානිය අවම කිරීම සඳහා පියවර ගැනීම. නිදසුනක් වශයෙන්, ශබ්දය අවම ටර්බයින් සැලසුම් භාවිතා කිරීම සහ වනජීවී සංක්‍රමණ කාලසීමා ආශ්‍රිතව ඍතුමය වශයෙන් භාවිතය සීමා කිරීම සලකා බැලීම.

9. යම් වැළැක්විය නොහැකි පරිසර බලපෑම් සම්බන්ධයෙන් හානි පූරණය සඳහා පරිසර පද්ධති ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ පාඩු හිලව් කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීම. නිදසුනක් වශයෙන්, ජෛව විවිධත්වය හා පරිසර පද්ධති පැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා ආසන්න ප්‍රදේශවල සිදුකරන වාසස්ථාන නැවත යථා තත්ත්වයට පත්කිරීමේ ව්‍යාපෘති සඳහා සහාය වීම.

10. වෙරළාසන්න ප්‍රදේශයෙන් පිටත ව්‍යාපෘතිවල දී, ආරක්ෂක ප්‍රමිතවලට අනුගතවීම සහ සංතරණ මුහුදු යාත්‍රා සඳහා උපද්‍රවයක් සිදු නොවන බවට සහතික කළ යුතු ය. සට්ටනය වීම් වළක්වා ගැනීම සඳහා විධිමත් පරිදි සවිකළ ආලෝකකරණ උපකරණ සවිකිරීම.

11. අදාළ අධිකාරීන් විසින් ව්‍යාපෘති ආරම්භ කළ කාලය ගතවීමේ දී ඒවායේ පාරිසරික හා සමාජ බලපෑම් හඳුනාගැනීම සඳහා සවිමත් අධීක්ෂණ වැඩසටහන් ස්ථාපනය කිරීම. ව්‍යාපෘති යෝජකයා විසින් එම අධීක්ෂණ දත්ත වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත භාරදිය යුතු ය.

12. යම්කිසි ව්‍යාපෘතියකට අදාළව එහි මෙහෙයුම් කාලය අවසන්වීමත් සමග ව්‍යාපෘති උපකරණ ඉවත් කිරීම හා අදාළ ස්ථානය නැවත යථා ස්ථානයට පත්කිරීම සඳහා පැහැදිලි සැලසුමක් සකස් කිරීම. යටිතල පහසුකම් ඉවත් කරන්නේ කෙසේ ද සහ එම ප්‍රදේශය ව්‍යාපෘතිය ආරම්භයට පෙර තිබූ තත්ත්වයට හෝ එකඟවන පරිදි වෙනත් වෛකල්පික භාවිතයක් සඳහා සකස් කිරීම සිදුකරන්නේ කෙසේද යන්න සැලැස්ම තුළින් අනාවරණය විය යුතු ය.

**6.4.13 සංචාරක සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම් සඳහා වෙරළ ප්‍රදේශ භාවිතා කිරීම සඳහා කොන්දේසි සහිත අවසර පත්‍ර (තාවකාලික අවසර පත්‍ර) නිකුත් කිරීම සඳහා මාර්ගෝපදේශ**

වෙරළ ප්‍රදේශය භාවිතයේ දී (හිමිකරුවන් සහිත වෙන් කළ ප්‍රදේශය සහ තෝරාගත් වෙරළ තීරු) තාවකාලික භාවිතය සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම සලකා බැලීමේ අරමුණ දෙවැදෑරුම් වේ. පළමු කරුණ වනුයේ, සංචාරක කටයුතු ආශ්‍රිත වැදගත් වෙරළ තීරවල දී අනවසර සංවර්ධන කටයුතු පාලනය කිරීම කරන අතරතුර මෙරට මූල්‍ය අර්බුදයකට මුහුණ පා සිටින අවස්ථාවේ දී වෙරළ සංරක්ෂණ කළමනාකරණය සඳහා තිරසර මූල්‍ය යාන්ත්‍රණ සහතික කිරීමයි. දෙවන කරුණ වනුයේ සංචාරක හා විනෝදාස්වාද කටයුතු සඳහා වෙරළ ප්‍රදේශ භාවිතා කිරීම සඳහා (හිමිකරුවන් සහිත වෙන් කළ ප්‍රදේශය සහ තෝරාගත් වෙරළ තීරු) තාවකාලික අවසර පත්‍ර නිකුත් කිරීම වනාහී වෙරළ පරිසරය ආරක්ෂා කරන අතරතුර මෙමෙ ක්‍රියාකාරකම් කළමනාකරණය හා නියාමනය කළහැකි ක්‍රමයක් වීම යි. කොන්දේසි සහිත තාවකාලික අවසර පත්‍ර නිකුත් කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

**අයදුම්කිරීමේ ක්‍රියාවලිය:**

හෝටල්කරුවන්, සංචාරක ගමන් සංවිධානකරුවන් සහ උත්සව අවස්ථා සංවිධානය කරන පිරිස් වැනි කොන්දේසි සහිත අවසර පත්‍රයක් (තාවකාලික අවසර පත්‍රය) ලබාගැනීමට උනන්දුවක් දක්වන පාර්ශව විසින් ඔවුන්ගේ යෝජිත ක්‍රියාකාරකම්, දිනයන් සහ ඔවුන් විසින් භාවිතා කිරීමට අපේක්ෂා කරන වෙරළ ප්‍රදේශය සඳහන් කරමින් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය.

**අවසර පත්‍රයක වලංගු කාලය:**

තාවකාලික අවසර පත්‍රයක වලංගු කාලය තීරණය වනුයේ ක්‍රියාකාරකමේ ස්වභාවය සහ වෙරළ ප්‍රදේශය කෙරෙහි එහි විභව්‍ය බලපෑම මතය. පහත සඳහන් කර ඇති පරිදි, නිශ්චිත උත්සවයක් සඳහා දින කිහිපයක සිට වසරේ නියමිත කාලසීමා තුළ පැවැත්වෙන ක්‍රියාකාරකම් සඳහා මාස කිහිපයක් දක්වා වශයෙන් වූ පරාසයක මෙමෙ කාණ්ඩයේ බලපත්‍ර නිකුත් කෙරේ;

**නිශ්චිත කලාප නම් කිරීම:**

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ඇතැම් තාවකාලික ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා අවසර ලබාදිය හැකි වෙන වෙරළ කලාපය තුළ නිශ්චිත කලාප හෝ නම් කළ ප්‍රදේශ හඳුනාගනු ලැබේ. යම් වෙරළ තීරයක ගතික ස්වභාවය මත පදනම්ව නම් කළ ප්‍රදේශ වරින්වර වෙනස් විය හැකි ය. වෙරළ තීරයේ විවිධ කොටස් තුළ සංචාරක හා විනෝදාස්වාද ක්‍රියාවල බලපෑම කළමනාකරණය සඳහා මෙය උපකාරී වේ.

- කෙටිකාලීන අවස්ථා/ උත්සව (දින හතක් නොඉක්මවන): සංගීත සංදර්ශන, නාට්‍ය, සහ වෘත්තීය ආයතන විසින් පවත්වන ප්‍රායෝගික පුහුණු වැනි අවස්ථා සඳහා තෝරාගත්/ නම්කළ පොදු වෙරළ ප්‍රදේශයක් භාවිතා කිරීම
  - වටදැල් හා බිලී පිති භාවිතයෙන් මසුන් ඇල්ලීම සිදුකරන සාම්ප්‍රදායික ධීවර කටයුතුවලින් එම තෝරාගත් වෙරළ තීරය නිදහස් වීම.
  - කැස්බෑවුන් බිත්තර දමන ප්‍රදේශවලින් එම තෝරාගත් වෙරළ තීරය නිදහස් විය යුතු ය.
  - අනෙකුත් යාබද ක්‍රියාකාරකම් සඳහා බාධාවක් ඇති නොකරන අයුරින් වාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් පහසුකම් පැවතීම සහතික කිරීම.

- පළාත් පාලන ආයතන, ආගමික හා ආසන්නව පිහිටා ඇති අනෙකුත් ආයතනවලින් අදාළ පරිදි අනෙකුත් අනුමැතීන් ලබාගත යුතු ය.

  ධාරිතා සීමාවඃ ප්‍රමාණය ඉක්මවා ජනගහණය රැස්වීම වැළැක්වීමට සහ වෙරළෙහි රඳවා ගත හැකි ධාරිතාවය ආරක්ෂා කිරීම සඳහා යම් නියමිත කාලසීමාවක් සඳහා නිකුත් කරන අවසර පත්‍ර සංඛ්‍යාව සම්බන්ධයෙන් සීමාවක් නිර්ණය කිරීම වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදුකරනු ඇත.

  වර්ෂය තුළ යම් කාල සීමා අනුව සීමා කිරීම්ඃ සංවේදී වෙරළ වාසස්ථාන, වනජීවීන් බිත්තර දමන ස්ථාන හෝ ඉහළ ඛාදන අවදානමක් සහිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා වර්ෂයේ යම් කාලසීමාවන් අනුව ඇතැම් ක්‍රියාකාරකම් සඳහා සීමා පැනවීම වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් දැනුම් දෙනු ඇත.

**වෙන්කළ ප්‍රදේශ භාවිතා කිරීම සඳහා කොන්දේසි**

- වෙන්කළ ප්‍රදේශය තුළ ස්ථිර ඉදිකිරීම් සිදු නොකළ යුතු ය.
- වෙන්කළ ප්‍රදේශයෙන් 75%ක් පමණක් තාවකාලික ඉදිකිරීම් සඳහා යොදා ගත යුතු ය.
- තාවකාලික ඉදිකිරීම්වල උස සීමාව බිම් මහලට පමණක් සීමා විය යුතුය.
- අදහස් කරන තාවකාලික ඉදිකිරීමේ ප්‍රමාණය හා අධිකත්වය අනෙකුත් සංවර්ධන කටයුතු සමග යෝග්‍ය හා අනුකූල විය යුතු ය.
- පවත්නා වෙරළ සංරක්ෂණ ව්‍යුහයන් මත කිසිදු තාවකාලික ව්‍යුහයක් ගොඩනැංවීම සිදු නොකළ යුතු ය (උදා. දිය කඩන, රිවට්මන්ට් බැම්, පනා බැම්, සමුද්‍ර පවුරු, ගැබියම් ආදිය)
- අපද්‍රව්‍ය රැස්වන ටැංකි හෝ අපජලය රැස්කරන ටැංකි ඉදිකිරීම හෝ රැඳවීම සඳහා අවසර නොලැබේ.
- පුළුල් ඇවිදින මාර්ගයක් හෝ වෙනත් යෝග්‍ය ආකාරයකින් වෙරළ ඔස්සේ ප්‍රමාණවත් පාර්ශවීය ප්‍රවේශයක් සහතික කළ යුතු ය.
  - **අවසර පත්‍ර කාල සීමාවඃ** වෙන්කළ ප්‍රදේශයක් භාවිතා කිරීම සඳහා තාවකාලික අවසර පත්‍රයක් මාස හයක කාලසීමාවක් සඳහා සීමා වන අතර වෙරළ පරිසරය සහ සංවර්ධන කටයුතු සලකා බැලීමේ ක්‍රියාවලිය මත නැවත අලුත් කෙරේ.
  - **පාරිසරික හානිපූරණයඃ** හානිවූ පරිසර පද්ධතිය නැවත ප්‍රතිෂ්ඨාපනය හා වැඩිදියුණු කිරීම සඳහා තාවකාලික අවසර පත්‍රය පාරිසරික හානිපූරණ ක්‍රියාවලියට යටත් වේ.
  - **අවදානම අවම කිරීමඃ** ස්වකීය ක්‍රියාකාරකම්වලින් ප්‍රතිඵල විය හැකි හානි හෝ අනතුරු ආවරණය කිරීම සඳහා අවසර පත්‍ර හිමියා විසින් වගකීම් රක්ෂණයක් දැරීම අවශ්‍ය වේ.
  - **දැනුවත්බව ඇති කිරීමඃ** අවසර පත්‍ර හිමියා විසින් වෙරළබඩ පාරිසරික සංරක්ෂණය සහ ආරක්ෂිත පියවර ක්‍රියාවට නැංවීම සඳහා සහ වගකීමැති වෙරළ භාවිතය හවුල් වගකීම සම්බන්ධයෙන් සංචාරකයන්, අමුත්තන් සහ අනෙකුත් වෙරළ භාවිතා කරන්නන් අතර දැනුවත්බවත් ඇතිකිරීම අවශ්‍ය කෙරේ.
  - **හදිසි ප්‍රතිචාර සැලසුම්ඃ** අනපේක්ෂිත අවස්ථා හෝ පීඩාකාරී කාලගුණික තත්ත්වවලදී (වෙරළ ඛාදනය, වෙරළ ජල මට්ටම ඉහළ යෑම, තෙල් දූෂණය) ඉවත් වීම සඳහා අවසර පත්‍ර හිමියන් සතුව හදිසි ප්‍රතිචාර සැලසුම් තිබිය යුතු ය.
  - **අත්හිටුවීම/ කෙටි නිවේදනයකින් පසුව ඉවත් කිරීමේ අයිතියඃ** අදාළ සංවර්ධකයා විසින් අවසරපත්‍ර කොන්දේසි කඩ කිරීම හෝ හදිසි අවස්ථා තත්ත්වයක දී, අවසර පත්‍රය අත්හිටුවීමේ අයිතිය වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවන අතර කිසිදු වන්දියක් ගෙවීමකින් තොරව වෙන්කළ ප්‍රදේශය තුළ ඉදිකර ඇති තාවකාලික ව්‍යුහයන් වහාම ඉවත්කරගන්නා ලෙස සංවර්ධකයා වෙතින් ඉල්ලීමක් සිදුකළ හැකි ය.
  - **භාවිතයෙන් ඉවත් කිරීමඃ** වෙන්කළ ප්‍රදේශය එහි මුල් තත්ත්වයට ගෙනඒම සඳහා තාවකාලික කොන්දේසි සහිත අවසර පත්‍රයක් නිකුත් කිරීමේ දී වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිර්ණය කරන සාධාරණීය නැවත ආපසු ගෙවන මුදල් තැන්පතුවක් පැනවිය යුතු ය.
  - **අනුකූලතා අධීක්ෂණය ඃ** අවසර පත්‍ර හිමියන් විසින් පාරිසරික රෙගුලාසි සහ වගකීමැති සංචාරක කටයුතු

ඇතුළුව සිය අවසර පත්‍රවල නියමයන් හා කොන්දේසි සමග අනුකූල වීම සහතික වීම සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අවසර පත්‍ර හිමියන්ගේ ක්‍රියාකාරකම් නියමිත කාලාන්තරවලදී අධීක්ෂණය කරනු ලැබේ.

**6.4.14. "පෙර වෙරළ" ප්‍රදේශයේ සර්ෆින් උපකරණ සැපයීමේ ස්ථාන පිහිටුවීම හා පවත්වාගෙන යාම සඳහා තාවකාලික බලපත්‍ර නිකුත් කිරීම සඳහා වන මාර්ගෝපදේශ**

වාණිජ පදනමින් විනෝදාත්මක අරමුණු සඳහා සර්ෆින් උපකරණ සැපයීමේ ස්ථාන පිහිටුවීම හා පවත්වාගෙන යාම සඳහා තාවකාලික බලපත්‍ර නිකුත් කිරීම සලකා බැලීමේ දී ජීවිතාරක්ෂාව, පාරිසරික ආරක්ෂාව හා පොදු ස්ථාන නිසි ලෙස භාවිතා කිරීම හා සහතික කිරීම උදෙසා මනාව සකස් කරන ලද මාර්ගෝපදේශ මාලාවක් අවශ්‍ය වේ. මේ අනුව, තාවකාලික බලපත්‍ර නිකුත් කිරීම සඳහා පහත සඳහන් සාමාන්‍ය හා විශේෂ මාර්ගෝපදේශ අනුගමනය කරනු ලැබේ.

**පොදු මාර්ගෝපදේශ**

1) සේවා සපයන්නා/අයදුම්කරු විසින් පෙර වෙරළ ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට යෝජිත සර්ෆින් උපකරණ සැපයීමේ ස්ථානවල ස්වභාවය, ප්‍රමාණය සහ රළ මත පැදීමේ ස්ථාන, කිමිදුම් උපකරණ ඇතුළු විනෝදාස්වාද උපකරණ භාවිතය පිළිබඳ විස්තර කළ යුතුය.

2) වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි සංචාරක සමය අනුව දකුණ, නිරිතදිග, බටහිර, උතුර හා නැගෙනහිර ප්‍රදේශයේ වෙරළ තීරය සඳහා සර්ෆින් උපකරණ අලෙවිසැල් පිහිටුවීම සහ පවත්වාගැනීම සඳහා බලපත්‍රවල වලංගු කාලසීමාව මාස හයකට සීමා වේ.

3) සර්ෆින් උපකරණ සැපයීමේ ස්ථාන පිහිටුවීම හා පවත්වාගෙන යාම සඳහා තාවකාලික බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් තීරණය කරන ලද වෙරළ ඛණ්ඩ සඳහා පමණි.

4) වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව තීරණය කරනු ලබන බලපත්‍ර ගාස්තුවක් අයදුම්කරු විසින් ගෙවිය යුතුය.

5) "පෙර වෙරළෙ" හි සර්ෆින් උපකරණ සැපයීමේ ස්ථාන පිහිටුවීම සහ පවත්වාගැනීම සඳහා නිකුත් කරන ලද තාවකාලික බලපත්‍රයක් අලුත් කිරීම, ප්‍රධාන වශයෙන් බලපත්‍ර කොන්දේසි අනුව කටයුතු කිරීම හා වෙරළේ ස්ථාවරත්වය මත රඳා පවතී.

6) වෙරළ ඛාදනය හෝ වෙනත් සැළකිය යුතු වෙරළ ව්‍යසන මත නිකුත් කරන ලද තාවකාලික බලපත්‍රයක් කෙටි දැනුම්දීමකින්, වන්දි ගෙවීමකින් තොරව අවලංගු කිරීමට වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට අභිමතානුසාරී බලය ඇත.

7) වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් කැස්බෑවන් වැනි සංවේදී වෙරළබඩ පරිසර පද්ධතිවල ස්වභාවය හා සංවේදීතාවයන් වෙනස්වීම සම්බන්ධයෙන් සීමා පැනවිය හැකිය.

**විශේෂිත මාර්ගෝපදේශ**

සර්ෆින් උපකරණ සැපයීමේ ස්ථාන සඳහා ස්ථිර ඉදිකිරීම් කිරීමට ඉඩ නොදෙන අතර විවෘත හා ජංගම රාක්ක පමණක් භාවිතා කිරීමට අවසර ඇත.

1) වෙරළ තීරයට සහ වෙරළ දිගේ පොදු සිරස් සහ පාර්ශවිය ප්‍රවේශයට බාධා නොකළ යුතුය.

2) සර්ෆින් උපකරණ අදාළ ආයතන විසින් නියම කරන ලද ආරක්ෂිත ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.

3) උපකරණ පාරිසරික බලපෑම අවමවන ආකාරයට සකස් කළ යුතුය. උදා. විෂ රහිත, ජෛව හායනයට ලක්විය හැකි ද්‍රව්‍ය භාවිතය දිරිමත් කරනු ලැබේ.

4) දැනට පවතින වෙරළ භාවිතයන් සැළකිල්ලට ගනිමින් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් එක් එක් කරුණු අනුව රළ පැදීමේ උපකරණ (සර්ෆින්)සැපයීමේ ස්ථාන සඳහා වෙන්කළ හැකි වෙරළ තීරයේ උපරිම ධාරිතාව තීරණය කරනු ලැබේ.

5) වෙරළට හෝ ජලජ පරිසරයට කිසිදු දූෂණයක් හෝ හානියක් සිදු නොවන බව සහතික කරමින් අපද්‍රව්‍ය බැහැර කිරීමේ සැලැස්ම ඉදිරිපත් කර අනුමත කළ යුතුය.

6) බලපත්‍රවල කාලය පිළිබඳ සීමාවන් හා පරිසර පද්ධති වෙනස්වීම්වලින් ආරක්ෂා කිරීම සඳහා වන කොන්දේසි ඇතුළත් විය යුතුය.

7) සැපයීමේ ස්ථාන පවත්වා ගැනීමට පිළිගත් සර්ෆින් හෝ ජල ක්‍රීඩා සංවිධානවලින් සහතික ලබාගැනීමට අවශ්‍ය වේ.

8) පහසුකම විසුරුවා හැරීම හා වෙරළ ප්‍රදේශය එහි යථා තත්ත්වයට ගෙන ඒම සඳහා පිරිසිදු කිරීම සහතික කිරීම සඳහා ආපසු ගෙවන මුදල් තැන්පතුවක් අවශ්‍ය වේ.

9) සර්ෆින් උපකරණ සැපයීමේ ස්ථාන ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම සඳහා නිකුත් කරන ලද තාවකාලික කොන්දේසි සහිත බලපත්‍රය අනුව සිදු කරන්නේ ද යන්න සහතික කිරීම වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වරින්වර පරීක්ෂා කිරීමකට යටත්වේ.

**6.4.15 කෘත්‍රිම දූපත්, ගොඩකරන ලද වෙරළබඩ ප්‍රදේශ සඳහා පසසිටුව**

මෙවැනි සංවර්ධන කටයුතු සඳහා පාරිසරික බලපෑම් ඇගයීම හෝ මූලික පරිසර පරීක්ෂණයක අවශ්‍යතාවය අනුව, සිද්ධිය වෙන් වෙන් වශයෙන් සලකා යෝග්‍ය පසසිටුව හෝ ස්වාරක්ෂක ප්‍රදේශය තීරණය කරනු ලැබේ.

ස්ථානය, සංවර්ධන කටයුත්තේ ආකාරය, සැලැස්මේ ලක්ෂණ සහ අනෙකුත් අදාළ තොරතුරු සලකා, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් කෘත්‍රිම දූපත් සහ ගොඩකරන ලද වෙරළබඩ ඉඩම් සඳහා පස සිටුව තීරණය කළ යුතු ය.

**6.5. වෙරළ කලාපයේ ජල ස්කන්ධවල ඉවුරුවල පිහිටි භූමියේ සංවර්ධන කාර්යයන් සඳහා පසසිටුව**

වෙරළ කලාපයේ ජල ස්කන්ධවල ඉවුරුවල පිහිටි භූමිය සැලකූවිට, ඇතැම් ක්‍රියාකාරකම් තහනම් කළ හෝ සීමාකළ ප්‍රදේශයක් වශයෙන් පසසිටුව ප්‍රදේශය අර්ථකථනය කළ හැකිය. වෙරළ කලාපයේ ජල ස්කන්ධවල ඉවුරුවල භූමියේ පසසිටුව පූර්ණ ජල සැපයුම් මට්ටම, මධ්‍ය වඩදිය ඉම හෝ ජල ස්කන්ධයේ ඉවුරේ කෙළවර හෝ ස්ථානීය ලක්ෂණ මත පදනම්ව තීරණය කරන ඕනෑම රේඛාවක් වැනි යෝග්‍ය යොමු රේඛාවක සිට ගොඩබිම ඉම දෙසට දිවේ.

වෙරළ කලාපයේ ජල ස්කන්ධවල ඉවුරුවල පිහිටි භූමිවල සංවර්ධන කටයුතු සඳහා ප්‍රමාණවත් පසසිටු ප්‍රදේශයක් පැවතිය යුතු ය. වෙරළ කලාපයේ ජල ස්කන්ධවල ඉවුරුවල පිහිටි භූමියේ සංවර්ධන කාර්යයන් සඳහා සාම්ප්‍රදායික වශයෙන් ජල ස්කන්ධවල රක්ෂිත ප්‍රදේශ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සලකුණු කෙරේ. ජල ස්කන්ධවල ජෛව-භෞතික ලක්ෂණ සැලකිල්ලට ගැනීමේ දී, පසසිටු ප්‍රදේශ පහත දැක්වෙන ප්‍රධාන කාණ්ඩ තුන යටතේ අර්ථ දැක්වේ.

- කලපු හා ගංගා මෝය
- ප්‍රධාන ගංගා
- මුහුදට සම්බන්ධ වූ අනෙකුත් ජල ස්කන්ධ

**6.5.1 වෙරළ කලාපයේ ජල ස්කන්ධවල ඉවුරුවල පිහිටි භූමිවල ස්වාරක්ෂක කලාප පසසිටු සීමා සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ සමග අනුකූලවන මාර්ගෝපදේශ**

වෙරළ කලාපයේ ජල ස්කන්ධවල ඉවුරුවල ප්‍රදේශවල පසසිටු සීමා පාලනය වනුයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන මාර්ගෝපදේශවල සංකලනයකිනි. ජල ස්කන්ධවල ජෛව-භෞතික ව්‍යුහය, ජලයේ ගුණාත්මක තත්ත්වය, ජලජ පාරිසරික පද්ධති සහ වෙරළ පරිසර පද්ධතිවල සමස්ත මනා පැවැත්ම ආරක්ෂා කිරීම මෙම මාර්ගෝපදේශවලින් අරමුණු කෙරේ. නිශ්චිත පසසිටු සීමා ජල ස්කන්ධයේ ස්ථානය සහ විශාලත්වය මත වෙනස්විය හැකි ය.

මෙම සැලැස්මේ දක්වා ඇති මාර්ගෝපදේශ අදාළ කරගත යුත්තේ 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ අර්ථ දක්වා ඇති "වෙරළ කලාපය" තුළ විහිදෙන ජල ස්කන්ධ සඳහා පමණි.

1. ජල ස්කන්ධයේ කෙළවරේ සිට ඉවුරු ස්වාරක්ෂක කලාපය සඳහා මිනුම් කළ යුතු ය.
2. වෙරළ කලාපය තුළ පවතින ගංගා, කලපු හෝ වෙනත් ජල ස්කන්ධවල දෙපස සඳහාම ඉවුරු ස්වාරක්ෂක කලාපය අදාළ වේ.

3. ජල ස්කන්ධයේ කෙළවර සිට ඉවුරු ආරක්ෂාව හැරුණවිට, සංවර්ධන කාර්යයන් සඳහා ඉවුරු ස්වාරක්ෂක කලාපය ලෙස අවම වශයෙන් මීටර් 10ක් විහිදේ.
4. දූෂක ද්‍රව්‍ය අවශෝෂණය, ජල ස්කන්ධවල ඉවුරු ස්ථාවර කිරීම සහ වනජීවීන් සඳහා වාසස්ථාන වශයෙන් ඉවුරු ස්වාරක්ෂක කලාපයේ ස්වාභාවික වෘක්ෂලතාදිය ආරක්ෂා කළ යුතු ය.
5. ගංවතුර සඳහා බඳුන් වෙන හෝ ගංවතුර ඇතිවීමේ නැඹුරුතාවයක් පවතින ස්ථානවල පිහිටා ඇති ජල ස්කන්ධ සඳහා ඉවුරු ආශ්‍රිත විශාල ස්වාරක්ෂක කලාපයක් දැක්විය යුතු ය.
6. වෘක්ෂලතාදිය මගින් ස්ථාවර කිරීම හැරුනවිට ඕනෑම ඉවුරු ආරක්ෂණ පියවරක් වන ඉදිකිරීමක් හෝ යෙදවුමක් සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු ය.
7. ජලයේ ගුණාත්මක තත්ත්වය සහ වාසස්ථාන අගය වැඩිදියුණු කරගැනීම සඳහා ඉවුරු ආශ්‍රිත ස්වාරක්ෂක කලාපය ඇතුළත ඊට ආවේණික දේශීය වෘක්ෂලතාදිය භාවිතා කිරීමට හා යෝග්‍ය භූමි සැකසුම් භාවිතා කිරීමට සංවර්ධකයන් දිරිමත් කරනු ලැබේ.

   වල ඉවුරු දිගේ පාවෙන පොදු ප්‍රවේශය සහ පාරම්පරික පැවති පටුමඟවල් (පාර්ශවීය හෝ සිරස්) අවහිර නොකළ යුතුය.
8. විනෝදාස්වාද ප්‍රදේශ සහ දිය නෑමේ ස්ථාන වෙත ජල ස්කන්ධ
9. ගොඩකිරීම් සඳහා අවසර ලබාදෙනු ලැබෙනුයේ කලපු ඉවුරේ සිට ජල ප්‍රදේශය දක්වා මීටර් 10 දක්වා පමණි.

**6.5.2 "සංවර්ධන කටයුතු තහනම් කලාපය" සහ "සංවර්ධන කටයුතු සීමා කළ කලාපය":**

ගංමෝය ජල ප්‍රදේශවල ඉහළ මට්ටමේ අවදානම් තත්ත්වය සහ ජෛව-භෞතික ලක්ෂණ හේතුවෙන්, වෙරළ කලාපයේ ගං මෝය, කලපු සහ අනෙකුත් ජල ස්කන්ධවලට ඉතා ආසන්නව පිහිටි ඉවුරු භූමිය "සංවර්ධන කටයුතු තහනම් කලාපය" හෝ "සංවර්ධන කටයුතු සීමා කළ ප්‍රදේශය" වශයෙන් නම් කෙරේ.

- කලපු සහ ප්‍රධාන ගංගාවන්ගේ මුවදොර සිට මීටර 500ක් දක්වා රට අභ්‍යන්තරය වෙත දිවෙන ජල ස්කන්ධය "සංවර්ධන කටයුතු සීමා කළ ප්‍රදේශය (RDZ)" ලෙස නම් කෙරේ.
- වෙරළ කලාපයේ සංරක්ෂණය කළ ප්‍රදේශවල සිහිටි සියලුම ගංගා, කලපු හා වෙනත් ජල ස්කන්ධයන් "සංවර්ධන කටයුතු තහනම් කලාපය(NDZ)" ලෙස නම් කෙරේ.
- ප්‍රධාන ගංගාවල ගං මෝය සිට රට අභ්‍යන්තරය වෙත දිවෙන මීටර 500ක පමණ රේඛීය බණ්ඩයක් වූ ඉවුරු භූමිය "සංවර්ධන කටයුතු සීමා කළ/ තහනම් කලාපය"ලෙස නම් කෙරේ.

**6.5.3 ප්‍රධාන ගංගා, කැපූ ඇළ මාර්ග සහ ස්වාභාවික ඇළ මාර්ගවල ඉවුරුවල පිහිටි භූමි සඳහා පසසිටු**

1948.10.15 දිනැති අංක 9912 දරන ගැසට් පත්‍රයේ පළ වූ රජයේ ඉඩම් රෙගුලාසි (1) සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් දක්වා ඇති භාවිතා කරන මාර්ගෝපදේශ/ප්‍රමිතිවලට අනුකූලව වෙරළ කලාපය තුළ පිහිටා ඇති ගංගාවල ඉවුරුවල පිහිටි භූමියේ සංවර්ධන කටයුතුවල දී පසසිටුව හෝ ඉදිකිරීම් රහිත රක්ෂිතය යොදා ගැනේ. ගංඉවුර, කැපූ ඇළ මාර්ග ඉවුර හෝ ස්වාභාවික ඇළ මාර්ග ඉවුර සැලකූවිට යොමු රේඛාව වනුයේ ගං ඉවුර මායිම සිට හෝ පූර්ණ සැපයුම් මට්ටම වේ. ගංගා වර්ගීකරණය පහත පරිදි වේ;

| **ගංගා කාණ්ඩය** | **පළල** |
|---|---|
| ප්‍රධාන ගංගා | මීටර් 15ට වැඩි |
| මධ්‍යම ප්‍රමාණයේ ගංගා | මීටර් 5- මීටර් 15 අතර |
| කුඩා ගංගා සහ අනෙකුත් ඇළ මාර්ග | පළල මීටර් 5ට අඩු |

ගංගා සහ ඇළ මාර්ගවල ඉවුරු භූමිවල සංවර්ධන කටයුතුවල දී වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් යොදා ගන්නා රක්ෂිත අදාළ කර ගනු ලැබේ.

1947 අංක 8 දරන රජයේ ඉඩම් ආඥාපනතේ 49,50,55,101 වගන්ති යටතේ සහ එම වගන්ති යටතේ 1948 ඔක්තෝබර් 15 දිනැති අංක 9912 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නියෝග 11,12 මගින් රක්ෂිතවලට අදාළ නෛතික අර්ථකථනය ආවරණය වේ. මෙම කරුණ රජයේ ඉඩම් සංග්‍රහයේ 227 වගන්තියේ සිට 230 වගන්තිය දක්වා තවදුරටත් පැහැදිලි කෙරේ. මීට අමතරව, සතුන් හා ශාක සංරක්ෂණය පිළිබඳ වූ 1937 අංක 2 දරන සත්ත්ව හා ශාක ආරක්ෂණ ආඥා පනත, පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක සංරක්ෂණය පිළිබඳ 1940 අංක 24 දරන ආඥාපනත, මහාමාර්ග හා මාර්ග පිළිබඳ 1861 අංක 10 දරන පනත, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත,

1962 අංක 12 දරන සුසාන භූමි භූමදාන ඉඩම් පිළිබඳ පනත, 1982 අංක 52 දරන පනතින් සංශෝධිත 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනත සහ 1976 අංක 27 දරන පනත යන පනත් මගින් ද මේ පිළිබඳව දැක්වේ.

එසේ වුව ද, ගංගා සහ ඇළ මාර්ගවල ඉවුරුවල පිහිටි භූමි සඳහා රක්ෂිත දක්වා තිබීමක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හෝ වෙනත් කිසිදු නීතියක් යටතේ නොමැති අවස්ථාවල දී, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වෙරළ කලාපය තුළ ගංගා සහ ඇළ මාර්ගවල ඉවුරුවල පිහිටි භූමි සඳහා රක්ෂිත තීරණය කිරීම සිදු කෙරේ.

### 6.5.4 කලපුවල ඉවුරුවල භූමි සඳහා පසසිටුව

වෙරළ කලාපය තුළ පිහිටි කලපුවල ඉවුරු භූමියේ සංවර්ධන කටයුතුවල දී අවම වශයෙන් මීටර 10 පසසිටුවක් අවශ්‍ය කෙරේ. එසේ වුව ද, වෙරළ කලාපයේ කලපු ඉවුරුවල පවතින සංකීර්ණ ස්වභාවය හා ජෛව-භෞතික විචලනයන් හේතුවෙන් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් යෝග්‍ය පරිදි මීටර් 10 ඉක්මවන පසසිටුවක් ද නිර්ණය කළ හැකි ය.

### 6.5.5 වෙරළ කලාපයේ ජල ස්කන්ධවල ඉවුරු භූමිවලට අදාළ යොමු රේඛාව

**කලපුවල යොමු ඉම රේඛාව:** කලපු ජලයේ පූර්ණ සැපයුම් මට්ටම හෝ මධ්‍ය ඉහළ වඩදිය රේඛාව

**ගංගා ඉවුරුවල යොමු ඉම රේඛාව:** ගඟ ඉවුර ඉම, ඉවුර ආරක්ෂා කිරීමේ ව්‍යුහය හෝ ගංගාවේ පූර්ණ සැපයුම් මට්ටම

**කැපූ ඇළවල හා අනෙකුත් ජල මාර්ග සඳහා යොමු ඉම රේඛාව:** කැපූ ඇළ මාර්ගයේ ඉම හෝ ස්වාභාවික ඇළවල වල ඉවුරු හෝ ඉවුරු ආරක්ෂිත බැම්

### 6.5.6 වෙරළ කලාපයේ ජල ස්කන්ධයන්ගේ ඉවුරුවල භූමි ගොඩ කිරීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම මාර්ගෝපදේශ

- ගං ඉවුරු, කලපු හා අනෙකුත් ජල ස්කන්ධවල මායිම් සංරක්ෂණය සහ ස්ථාවර කිරීම සඳහා හැර, වෙනත් කිසිදු ගොඩකිරීමේ ක්‍රියාවක් සිදු කිරීමට අවසර නොලැබේ.
- ජාතික ආරක්ෂාව සහ නාගරික අලංකරණ වැඩසටහන්වලදී එක් එක් සිද්ධියෙන් සිද්ධිය සලකා වෙරළ කලාපයේ ජලස්කන්ධවල ඉවුරුභූමි ගොඩකිරීම සඳහා අවසර ලබාදේ.
- ජලස්කන්ධවල ඉවුරුභූමිවල සිට මීටර් 20ක් දක්වා ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය හෝ ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය බැහැර කිරීම් ස්ථානගත කිරීම සඳහා අවසර නොලැබේ (වෙරළ කලාපය තුළ ජල ස්කන්ධ ආශ්‍රිත ඉවුරු භූමි තුළ අපද්‍රව්‍ය වැළලීමෙන් ඉඩම් ගොඩ කිරීම සඳහා අවසර හිමි නොවේ.)
- වෙරළ කලාපය තුළ ජල ස්කන්ධ ආශ්‍රිත ඉවුරු භූමිවල සිට මීටර් 20ක් තුළ ප්‍රදේශයක ගොඩ කිරීම් සඳහා අවසර හිමි නොවේ.

### 6.6 පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව (EIA) සහ මූලික පරිසර පරීක්ෂණ වාර්තාව(IEE)

2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතින් සංශෝධන කරන ලද 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ 16 වැනි වගන්තිය යටතේ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් පනවා ඇති නෛතික විධිවිධාන මෙසේය:

*"14 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් නියමිත පරිදි, වෙරළ කලාපය ඇතුළත සංවර්ධන කටයුත්තක නියුක්තවීම පිණිස අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම්පතක් ලැබුණ විට, අවස්ථාවෝචිත පරිදි, සංවර්ධන කටයුත්තට අදාළ මූලික පරිසර පරීක්ෂණ වාර්තාවක් හෝ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් හෝ ඒ වාර්තා දෙකම හෝ සපයන ලෙස අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි ය. ඒ නියමය අනුව ක්‍රියා කිරීම ඉල්ලුම්කරුගේ කාර්යය විය යුතු ය."*

ඉහත සඳහන් කළ නෛතික විධිවිධානයට අනුකූලව, වෙරළ කලාපය ඇතුළත සංවර්ධන කටයුත්තක නියුක්තවීම පිණිස අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම්පතක් ලැබුණ විට, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් එම කාර්යය සඳහා මූලික පරිසර පරීක්ෂණ වාර්තාවක් හෝ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් අවශ්‍ය වේ ද යන්න තීරණය කරනු ලැබේ. මූලික පරිසර පරීක්ෂණ වාර්තාව හෝ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව පිළිබඳ අවශ්‍යතාවය නිර්ණය කිරීමේ අභිමතානුසාරී බලය අධ්‍යක්ෂ ජනරාල් සතු වුව ද, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය වූ විට මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් හෝ වෙනත් අදාළ ආයතනවලින් ඒ සම්බන්ධයෙන් විමසන අතර ජාතික පාරිසරික පනත යටතේ නියම කර ඇති ව්‍යාපෘතිවල ලැයිස්තුව කෙරෙහි විධිමත් අවධානය යොමු කරනු ලැබේ. අදාළ අවශ්‍යතා සමග අනුකූල වීම ඉල්ලුම්කරුගේ වගකීම වේ.

### 6.6.1 පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව (EIA)

වෙරළ සංරක්ෂණ පනතේ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව අර්ථ දක්වා ඇත්තේ මෙසේය:

*"යෝජිත සංවර්ධන කාර්යයකින් ඇතිවිය හැකි පරිසරය හා සම්බන්ධ ප්‍රතිඵල පිළිබඳ ලිඛිත විශ්ලේෂණයක් අදහස් වන අතර, යෝජිත කාර්යය පිළිබඳ විස්තරයක් ද, යෝජිත සංවර්ධන කාර්යයෙන් පරිසර විෂයයෙහි ඇතිවන වැළැක්විය හැකි හා නොහැකි අනිෂ්ට ප්‍රතිඵල පිළිබඳ විස්තරයක්, වෙරළ කලාපයේ පරිසරයට අඩු හානිකර වූ ඒ කාර්යයට ඇති විකල්ප පිළිබඳ විස්තරයක් සමග ඒ විකල්ප ප්‍රතික්ෂේප කිරීමට හේතු ද සහ යෝජිත සංවර්ධන කාර්යය සඳහා අවශ්‍ය වෙනස් කළ නොහැකි හෝ ආපසු ලබාගත නොහැකි සම්පත් භාවිතය පිළිබඳ විස්තරයක් ද ඊට ඇතුළත් වේ."*

වෙරළබඩ පරිසරය කෙරෙහි සැලකිය යුතු බලපෑම් ඇතිවන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවධානයට ගනු ලබන ව්‍යාපෘති සඳහා හෝ මූලික පරිසර පරීක්ෂණ වාර්තාවක් ඔස්සේ ප්‍රමාණාත්මක බව මත තීරණය කරනු ලබන ව්‍යාපෘති වාර්තා සඳහා පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් අවශ්‍ය වේ. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අදාළ අනෙකුත් ආයතනවලින් ද විමසා ඒකාබද්ධ සමාලෝචන ක්‍රියාවලියක් පදනම් කරගෙන පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව සඳහා යොමු කිරීමේ අනුදේශ (TOR) පිළියෙල කරනු ලබන අතර එය ව්‍යාපෘති යෝජකයා වෙත ලබාදෙනු ලැබේ. අදාළ යොමු කිරීමේ අනුදේශවලට අනුකූලව සහ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තා පිළියෙල කිරීමේ පොදු මාර්ගෝපදේශවලට අනුව පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව පිළියෙල කිරීම ඉල්ලුම්කරුගේ වගකීම වේ. පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව සැලසුම් කිරීමේ සහ සකස් කිරීමේ කාල සීමාවේදී වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙතින් අවශ්‍ය විමසීම් කරන ලෙස සංවර්ධකයන් (එනම් ව්‍යාපෘති යෝජකයන්) වෙත උපදෙස් දෙනු ලැබේ. වඩාත් අදාළ ගැටලු කේන්ද්‍රීය කරගත් සංක්ෂේප, පිරිවැය ඵලදායි පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් පිළියෙල කරගැනීම සඳහා සංවර්ධකයා වෙත සහාය ලබාදීමට මෙමඟින් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට හැකි වේ.

සංවර්ධකයා වෙතින් පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව ලැබුණු පසුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම වාර්තාවේ පිටපතක් වෙරළ සංරක්ෂණ උපදේශක සභාව වෙත එහි අදහස් ලබාගැනීම සඳහා යොමු කළ යුතු ය. එමෙන්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව පිළිබඳ නිවේදනයක් රජයේ *ගැසට් පත්‍රයේ* සහ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාවලින් පළවන එක් පුවත්පතක බැගින් පළ කළ යුතු ය. එම නිවේදනයේ පොදු මහජනතාවට එකී පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව පරීක්ෂා කළ හැකි ස්ථානය හා දිනයන් සඳහන් කළ යුතු අතර ඒ සම්බන්ධයෙන් වන ඔවුන්ගේ අදහස් ද දින 30ක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස දැන්විය යුතු ය. වෙරළ සංරක්ෂණ උපදේශක සභාව විසින් සිය අදහස් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දින 60ක් ඇතුළත ලබාදිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලැබෙන සියලුම අදහස් එකී අදහස් ලැබූ දිනයේ සිට දින 60ක් ඇතුළත අවධානයට යොමුකර, අවසර බලපත්‍රය නිකුත් කළ හැකි ද සහ එහි කොන්දේසි සම්බන්ධයෙන් තීරණය කළ යුතු ය (රූපය 6.3).

### 6.6.2 මූලික පරිසර පරීක්ෂණය (IEE)

අවසර පත්‍රයක් නිකුත් කිරීමේ දී, සංවර්ධන කාර්යය තුළින් පරිසරයේ ගුණාත්මක බව සහ වෙරළබඩ සම්පත්වල තිරසරබව කෙරෙහි අහිතකර බලපෑමක් නොවන බව සහතික කරගැනීම අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවශ්‍ය විය හැකිය. මේ සඳහා, 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතින් සංශෝධන කරන ලද 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ 16 (1) වැනි වගන්තිය යටතේ මූලික පරිසර පරීක්ෂණ වාර්තාවක් අධ්‍යක්ෂ ජනරාල් විසින් සංවර්ධකයාගෙන් ඉල්ලා සිටිය හැකි ය. සංශෝධිත පනතේ මූලික පරිසර පරීක්ෂණ වාර්තාව අර්ථ දක්වා ඇත්තේ මෙසේය:

"මූලික පරිසර පරීක්ෂණ වාර්තාව යන්නෙන් පරිසරය පිළිබඳ සංවර්ධන කටයුත්තේ දී සිදුවිය හැකි ගැටුම් වැදගත් වේ ද යන්න ද, එසේ වේ නම් පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරු වාර්තාවක් පිළියෙල කිරීම අවශ්‍ය වන්නේ ද යන්න දැනගැනීමේ අදහසින් පිළියෙල කළ ලිඛිත වාර්තාවක් අදහස් වේ. ඒ වාර්තාවේ සංවර්ධන කටයුත්තට අදාළ සියලු විස්තර සහ විස්තරාර්ථ, දත්ත සිතියම්, දළ සටහන් සහ වෙනත් තොරතුරු ඇතුළත් විය යුතු ය."

මූලික පරිසර පරීක්ෂණ වාර්තාවක් අවශ්‍ය නොවන බව නම් කරන ලද සංවර්ධන කටයුතු හැර, "පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ" විස්තර කර ඇති පරිද්දෙන් වෙරළ පරිසරය හා එහි සම්පත් මත සැලකිය යුතු බලපෑමක් ඇතිවන බවට සැලකෙන ව්‍යාපෘති සඳහා මූලික පරිසර පරීක්ෂණ වාර්තාව අවශ්‍ය කෙරේ. මූලික පරිසර පරීක්ෂණ වාර්තාව පිළියෙල කිරීම ඉල්ලුම්කරුගේ වගකීමකි. එම වාර්තාව පිළියෙල කිරීමේ පොදු මාර්ගෝපදේශ පහත දැක්වේ. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අදාළ අනෙකුත් ආයතනවලින් ද විමසා මූලික පරිසර පරීක්ෂණ වාර්තාව සඳහා වන පිරික්සුම් ලැයිස්තුව (checklist) හා යොමු කිරීමේ අනුදේශ (TOR) පිළියෙල කරන අතර එය ඉල්ලුම්කරු වෙත ලබා දේ.

මූලික පරිසර පරීක්ෂණ වාර්තාව ලැබීමෙන් අනතුරුව, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වාර්තාව සමාලෝචනය කරන අතර, අවසර පත්‍රය නිකුත් කළ හැකි ද / නොහැකි ද යන්න තීරණය කිරීම සඳහා එකී වාර්තාව ප්‍රමාණවත් වේ නම්, එය වෙරළ සංරක්ෂණ උපදේශක සභාව වෙත එහි අදහස් ලබාගැනීම සඳහා යොමු කළ හැකිය. වෙරළ සංරක්ෂණ උපදේශක සභාව විසින් සිය අදහස් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දින තිහක් ඇතුළත යොමු කළ යුතු ය. තීරණයකට එළඹීම සඳහා මූලික පරිසර පරීක්ෂණ වාර්තාව ප්‍රමාණවත් නොවේ නම්, අධ්‍යක්ෂ ජනරාල් විසින් ව්‍යාපෘති යෝජකයා වෙතින් පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් ඉල්ලා සිටිය යුතු ය.




රූපය 6- 3: අවසර පත්‍ර සම්බන්ධයෙන් සමාලෝචනය කිරීමේ සහ නිකුත් කිරීමේ කාර්ය පටිපාටිය

**6.6.3 මූලික පරිසර පරීක්ෂණ වාර්තාව (IEE) සහ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව පිළියෙල කිරීමේ පොදු මාර්ගෝපදේශ**

මූලික පරීක්ෂණ වාර්තාවේ සහ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවේ ඇතුළත් විය යුතු ප්‍රධාන විස්තර පහත පරිදි වේ. ස්ථානය/ ව්‍යාපෘතියට නිශ්චිත කරුණු ඇතුළු මේ සම්බන්ධ වැඩිදුර විස්තර මූලික පරිසර පරීක්ෂණ වාර්තාව සහ පාරිසරික තක්සේරු වාර්තාව පිළියෙල කිරීමට අදාළව නිකුත් කරන යොමු කිරීමේ අනුදේශවල (TOR) අන්තර්ගත වේ.

(අ) යෝජිත කාර්යය පිළිබඳ විස්තරය

(i) යෝජිත කාර්යයයේ ස්වභාවය, අරමුණු සහ විෂය පථය
(ii) ඉදිකිරීම් හා ක්‍රියාත්මක කිරීමේ අවධියේ දී කාර්යය පිළිබඳ විස්තරය
(iii) ඉදිකිරීම් හා ක්‍රියාත්මක කිරීමේ අවධියේ අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳ විස්තරය
(iv) යෝජිත කාර්යයේ සමාජ-ආර්ථික සහ පාරිසරික ප්‍රතිලාභ/පිරිවැය පිළිබඳ විස්තරය
(v) යෝජිත කාර්යය සඳහා දිගු-කාලීන අධීක්ෂණ වැඩසටහන පිළිබඳ විස්තරය

(ආ) යෝජිත කාර්යය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනුමැතීන් සහ (අනෙකුත්) අවසර පත්‍ර පිළිබඳ විස්තර - ස්ථානය පිළිබඳ විස්තරය

(i) කාර්යය, සංවර්ධනය හෝ මෙහෙයුම ස්ථානගත කිරීමට යෝජිත ප්‍රදේශය හා එහි පරිසරය පිළිබඳ විස්තරය, මීට පහත කරුණු ඇතුළත් විය යුතු යː

- ශ්‍රී ලංකාවේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කරන සැතපුමට අඟලේ සිතියමක හෝ 1:50,000 පරිමාණයේ මෙට්‍රික් සිතියමක යෝජිත කාර්යය සිදුකරන ස්ථානය ලකුණු කළ යුතු ය.
- අදාළ ස්ථානයේ විස්තර දැක්වීම සඳහා එම සිතියමේ පිටපතක් Google Earth මෘදුකාංගය ඔස්සේ ඉදිරිපත් කළ යුතු ය.
- මෙම සැලැස්මේ 3 පරිච්ඡේදයේ විස්තර කර ඇති වෙරළබඩ පරිසර පද්ධති නිරූපණය හා ඒවායේ පාරිසරික තත්ත්වය
- ජල ස්කන්ධවලට පවතින ආසන්නතාවය
- දැනට පවතින භූමි භාවිතය සහ අනෙකුත් මානව ක්‍රියාකාරකම්
- මෙම සැලැස්මේ වගුව 6.4හි ලැයිස්තුගත කර ඇති වෙරළ කලාපය ඇතුළත පිහිටි ඉහළ ප්‍රමුඛතාගත පුරාවිද්‍යාත්මක, ඓතිහාසික සහ සංස්කෘතිකමය ස්ථාන සහ යම් ඉහළ ප්‍රමුඛතාගත විනෝදාස්වාද ස්ථාන තිබේද යන්න.
- අනෙකුත් අදාළ තොරතුරු

(ඇ) සිදුවිය හැකි බලපෑම් පිළිබඳ විස්තරය

(i) සිදුවිය හැකි බලපෑම් පිළිබඳ විස්තරයට, මෙම කාර්යය තුළින් වෙරළබඩ කලාපයට හා එහි සම්පත්වලට ඇතිවිය හැකි පූර්වේක්ෂණය කළ සෘජු හා වක්‍ර, දිගුකාලීන සහ කෙටිකාලීන බලපෑම් ඇතුළත් විය යුතු ය. මෙම සන්දර්භය තුළ, කෙටි කාලීන සහ දිගු කාලීන යන්නෙන් කිසිදු නිශ්චිත කාල සීමාවක් සම්බන්ධයෙන් අත්‍යවශ්‍යයෙන් යොමු නොවන නමුදු, යෝජිත කාර්යයේ පාරිසරික වශයෙන් සුවිශේෂී බලපෑම් සම්බන්ධයෙන් සැලකිය යුතු ය. සම්පත් ආශ්‍රිතව ආපසු තිබූ තත්ත්වයට ගෙන ගිය නොහැකි හෝ ආපසු ලබාගත නොහැකි බැඳීම් පිළිබඳව හඳුනාගත යුතු ය. පහත කරුණු සම්බන්ධයෙන් ඇතිවිය හැකි බලපෑම්, විස්තරය තුළ ඇතුළත් විය යුතු යː

- මෙම සැලැස්මේ 3 වැනි පරිච්ඡේදයේ විස්තර කර ඇති වෙරළබඩ වාසස්ථාන
- වෙරළබඩ ජලයේ ගුණාත්මකබව සහ ප්‍රමාණය
- අතීත සහ වර්තමාන ඉඩම් පරිහරණ රටා
- ශාක සහ සත්ත්ව බහුලත්වය හා විවිධත්වය

- වෙරළ තීරය ඔස්සේ ඛාදනය වීමේ සහ තැන්පත්වීමේ ක්‍රියාවලි
- ජල සංසරණය, සෝදා යෑම, බොර වූ ස්වභාවය සහ අවසාදනය
- මිරිදිය ජලය ගලායෑමේ රටා සහ/හෝ ලවණ ජලය ගොඩබිමට ගලාඒම
- පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, සංස්කෘතික සහ ස්වාභාවික සුන්දරත්වය යන ආකාරවලින් වැදගත් ප්‍රදේශ
- වෙරළ තීරය ඔස්සේ සහ වෙරළ වෙත හා වෙරළබඩ ජල ප්‍රදේශය වෙත පොදු ප්‍රවේශය
- ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් මතුවිය හැකි කරුණු

**(ඈ) බලපෑම් අවම කිරීම සඳහා යෝජිත පියවර**

බලපෑම් අවම කිරීම යෝජිත පියවර පිළිබඳ සවිස්තරාත්මක ප්‍රකාශයක් සහ යෝජිත පියවරවල ඵලදායීතාවය පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය. විකල්ප පියවර සලකා බලන්නේ නම්, ඒවා සඳහන් කළ යුතු අතර බලපෑම් අවම කිරීම සඳහා එම යෝජිත පියවර තෝරාගැනීම සම්බන්ධයෙන් හේතු ඉදිරිපත් කළ යුතු ය.

**(ඉ) අතිරේක අවශ්‍යතා**

අධ්‍යක්ෂ ජනරාල්/ කමිටුව විසින් සිද්ධියෙන් සිද්ධිය වෙන් වෙන් වශයෙන් සලකා මූලික පරිසර පරීක්ෂණ වාර්තාවට සහ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවේ ඇතුළත් විය යුතු අනෙකුත් විස්තර නියම කරනු ඇත. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අවසර පත්‍රයක් ලබාගැනීමේ ක්‍රියාවලිය රූපය 6.3හි සාරාංශ කර තිබේ. පාරිසරික තක්සේරු වාර්තාවක් අවශ්‍ය නොවන සංවර්ධන කාර්යයන් සඳහා, අයදුම්පත්‍රය සම්බන්ධයෙන් වූ තීරණය අදාළ සියලු තොරතුරු ලැබීමෙන් පසුව සති තුනක් ඇතුළත ලබා දෙනු ලැබේ. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙතින් විමසීමෙන්, මෙම සැලැස්ම භාවිතා කිරීමෙන් සහ ව්‍යාපෘති සැලසුම්කරණ අවධියේ දී අදාළ යොමුවීම් ලබාගැනීම ඔස්සේ අවසර බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලිය පහසුකරනු ඇත.

**(ඊ) අධීක්ෂණය**

ප්‍රධාන ප්‍රඥප්තිය වන වෙරළ සංරක්ෂණ පනත සඳහා සිදුකළ සංශෝධන ප්‍රකාරව, වෙරළ කලාපය ඇතුළත ජල ස්කන්ධවල ඉවුරුවල භූමියෙන් කොටසක් ද වෙරළ කලාපයට ඇතුළත් වීමෙන් වෙරළ කලාපයේ භූගෝලීය ව්‍යාප්තිය පුළුල් විය. එබැවින්, සංවර්ධන කාර්යයන් පාලනය කිරීම ද ඉහළ ගොස් තිබේ. මෙම වාතාවරණය තුළ, අනුකූලතාවය සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම වනාහී වෙරළ කලාපය හා එහි සම්පත් කළමනාකරණය කිරීමේ දී ඉතා වැදගත් අවශ්‍යතාවයකි. එම අවශ්‍යතාවය හේතුවෙන්, වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2024 තුලින් අනුකූලතා අධීක්ෂණය සඳහා පහසුකම් සැලසීම සඳහා වැඩිදියුණු කළ මාර්ගෝපදේශ ලබාදී ඇත. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන අනුකූලතා අධීක්ෂණයේ ප්‍රධාන අරමුණු වනුයේ:

- වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම තුළ දක්වා ඇති ප්‍රමිතීන් හා මාර්ගෝපදේශ අනුමත කළ අවසර පත්‍රවලින් සපුරා තිබේද යන්න නිර්ණය කිරීම.
- වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන්වල ප්‍රමාණාත්මකබව නිර්ණය කිරීම.
- වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මේ අරමුණු හා අවසර පත්‍ර ලබාදීමේ තීරණ අතර විභව්‍ය හෝ දැනට පවත්නා අනනුකූලතාවයක් තිබේද යන්න අනාවරණය කරගැනීම.
- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කලාපීය හා ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන්ගේ කාර්යසාධනය හා ප්‍රාදේශීය මට්ටමේ දී සම්පත්වල ප්‍රමාණාත්මකබව ඇගයීම
- වෙරළ කලාප කළමනාකරණය, වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී අනෙකුත් ආයතනවල ඵලදායීතාවය, ප්‍රමාණවත්බව හා සහාය නිර්ණය කිරීම.

**වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අවසර පත්‍ර කොන්දේසිවලට පවතින අනුකූලතාවය සහතික කිරීම සඳහා පහත දැක්වෙන අධීක්ෂණ මෙවලම් එකක් හෝ කිහිපයක් යොදා ගනී:**

- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සම්මත පිරික්සුම් ලැයිස්තුවක් යොදාගනිමින් සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ විවිධ අදියරවලදී නියමිත කාලාන්තරවලදී පරීක්ෂා කිරීම.

- අවසර පත්‍ර කොන්දේසි උල්ලංඝනය කරන පිරිස්වලට එරෙහිව කටයුතු කිරීම සඳහා එවැනි උල්ලංඝනය කිරීම් අනාවරණය කරගැනීම සඳහා විධිමත් සහ අවිධිමත් පැමිණිලි පදනම් කරගත් තොරතුරු ජාලය.

- මූලික පරිසර පරීක්ෂණ සහ පාරිසරික බලපෑම් තක්සේරු කාර්ය පටිපාටි ඔස්සේ පනවනු ලබන කොන්දේසි ද ඇතුළුව වාර්ෂික පදනමින් අවසර පත්‍ර අධීක්ෂණ අනුකූලතා සමීක්ෂණ පැවැත්වීම.

- සෑම වෙරළ ඛණ්ඩයකම කාලානුරූපීය හා අවකාශමය වශයෙන් ව්‍යාප්ත වී ඇති අවසර බලපත්‍ර සම්බන්ධිත විවිධ කේවල තීරණවල සාමූහික සහ ක්‍රමිකව වෙනස්වන බලපෑම් අවධාරණය කරමින් සිදුකරන සමුච්චිත බලපෑම් තක්සේරුව අධීක්ෂණය.

- සංවර්ධන කාර්යයට අදාළව මධ්‍යම පරිසර අධිකාරිය හෝ වෙනත් යම් ආයතන විසින් නියම කර ඇති සංවර්ධක විසින් ලබාදිය යුතු වාර්තා, සමීක්ෂණ, පරීක්ෂණ ආදිය සත්‍යාපනය කරගැනීම.

- අවසර පත්‍ර කොන්දේසිවලට අනුකූල බවට පළාත් පාලන ආයතන හෝ අනෙකුත් නම් කරන ලද ආයතන වෙතින් ලබාගත යුතු අනුකූලතා සහතික සත්‍යාපනය කරගැනීම.

වගුව **6- 1** වෙරළ කලාපය තුළ සංවර්ධන කාර්යයන් සඳහා පසසිටු – **2024**

| ඛණ්ඩ අංකය | වෙරළ ඛණ්ඩය | මූලාශ්‍ර සිතියම | අක්ෂාංශ | දේශාංශ | අවදානම් මට්ටම | යෝජිත පසසිටුව (මීටර්) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | රක්ෂිත ප්‍රදේශය | සීමාකළ ප්‍රදේශය | මුළු පසසිටු ප්‍රදේශය |
| 1 | වෙල්ලායි, පල්ලියමුල්ල, බත්තලන්ගුන්ඩුව සහ වෙනත් දූපත් (කල්පිටිය අර්ධද්වීපය අවට දූපත්) | පුත්තලම | 8°32'26.82"N | 79°46'56.70"E | මධ්‍යස්ථ (-) | 20 | 30 | 50 |
| | | | 8°24'19.50"N | 79°48'44.76"E | | | | |
| | | | | | | | | |
| 2 | උච්චමුනෙයි සිට | පුත්තලම | 8°23'01.20"N | 79°47'14.90"E | මධ්‍යස්ථ (+) | 25 | 35 | 60 |
| | මොහොත්තුවාරම් (මොහොත්තුවාරම් වැලි තුඩුවේ උතුරු මායිම) | | 8°15'00.60"N | 79°44'20.20"E | | | | |
| | | | | | | | | |
| 3 | මොහොත්තුවාරම් (මොහොත්තුවාරම් වැලි තුඩුවේ උතුරු මායිම) සිට | පුත්තලම | 8°15'00.60"N | 79°44'20.20"E | | සංවර්ධන කටයුතු තහනම් කලාපය | | සංවර්ධන කටයුතු තහනම් කලාපය |
| | මොහොත්තුවාරම්/කුඩාව වැලි තුඩුවේ දකුණු මායිම (රක්ෂිත/ඉදිකිරීම් තහනම් කලාපය) | | 8°13'41.50"N | 79°43'52.10"E | | | | |
| | | | | | | | | |
| 4 | මොහොත්තුවාරම්/කුඩාව වැලි තුඩුවේ දකුණු මායිම (කුඩාව ආරම්භක ස්ථානය) සිට | පුත්තලම | 8°13'41.50"N | 79°43'52.10"E | මධ්‍යස්ථ (+) | 25 | 35 | 60 |
| | උඩප්පුව මුවදොර දක්වා | | 7°44'55.98"N | 79°47'21.50"E | | | | |
| | | | | | | | | |
| 5 | උඩප්පුව මුවදොර සිට | පුත්තලම | 7°44'55.98"N | 79°47'21.50"E | මධ්‍යස්ථ | 20 | 35 | 55 |
| | දැදුරු ඔය මෝය උතුරු මායිම | | 7°37'6.70"N | 79°47'56.50"E | | | | |
| | | | | | | | | |
| 6 | දැදුරු ඔය මෝය උතුරු මායිම සිට | පුත්තලම | 7°37'06.70"N | 79°47'56.50"E | | සංවර්ධන කටයුතු තහනම් කලාපය | | සංවර්ධන කටයුතු තහනම් කලාපය |
| | හලාවත සුසාන භූමියේ අවසාන ඉම (සංරක්ෂණ කලාපය/තහනම් කලාපය) | | 7°35'48.90" N | 79°47'11.60"E | | | | |
| | | | | | | | | |
| 7 | හලාවත සුසාන භූමියේ අවසාන ඉම සිට | පුත්තලම | 7° 35'48.90" N | 79°47'11.60"E | පහළ (+) | 15 | 30 | 45 |
| | නයිනමඩම, වැල්ලමන්කරය ගිං ඔය මෝය | | 7°18' 08.39"N | 79°50'16.14"E | | | | |
| | | | | | | | | |
| 8 | නයිනමඩම, වැල්ලමන්කරය ගිං ඔය මෝය සිට | පුත්තලම/ ගම්පහ | 7°18' 08.39"N | 79°50'16.14"E | පහළ (-) | 10 | 25 | 35 |
| | දුව පිටිපන වීදිය මෝර වල | | 7°12'13.00"N | 79°49'02.50"E | | | | |

| | වෙරළ ඛණ්ඩය | මූලාශ්‍ර සිතියම | අක්ෂාංශ | දේශාංශ | අවදානම් මට්ටම | යෝජිත පසසිටුව (මීටර්) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | රක්ෂිත ප්‍රදේශය | සීමාකළ ප්‍රදේශය | මුළු පසසිටු ප්‍රදේශය |
| | | | | | | | | |
| 9 | දුව පිටිපන විදිය මෝර වල සිට | ගම්පහ/ කොළඹ | 7°12'13.00"N | 79°49'02.50"E | පහළ (+) | 15 | 30 | 45 |
| | කැළණි ගඟ මෝය | | 6°58'43.55"N | 79°52'10.09"E | | | | |
| | | | | | | | | |
| 10 | කැළණි ගඟ මෝය සිට | කොළඹ | 6°58'43.55"N | 79°52'10.09"E | පහළ (+) | 15 | 30 | 45 |
| | කොළඹ වරාය | | 6°56'19.34"N | 79°50'42.78"E | | | | |
| | | | | | | | | |
| 11 | කොළඹ වරාය සිට | කොළඹ | 6°56'19.34"N | 79°50'42.78"E | විශේෂ ඛණ්ඩය I | කොළඹ වරාය නගරය නියෝග අදාළ වේ | | |
| | බේරෙ වැව මෝය (වරාය නගර සංවර්ධන ඛණ්ඩය) | | 6°55'45.81"N | 79°50'33.75"E | | | | |
| | | | | | | | | |
| 12 | බේරෙ වැව මෝය සිට | කොළඹ | 6°55'45.81"N | 79°50'33.75"E | පහළ (-) | 10 | 25 | 35 |
| | ගල්කිස්ස හෝටලය | | 6°50'02.91"N | 79°51'44.83"E | | | | |
| | | | | | | | | |
| 13 | ගල්කිස්ස හෝටලය සිට | කොළඹ/ කළුතර | 6°50'02.91"N | 79°51'44.83"E | පහළ (-) | 10 | 25 | 35 |
| | පින්වත්ත තල්පිටිය මෝය | | 6°40'56.76"N | 79°55'02.46"E | | | | |
| | | | | | | | | |
| 14 | පින්වත්ත තල්පිටිය මෝය සිට | කළුතර | 6°40'56.76"N | 79°55'02.46"E | පහළ | 15 | 25 | 40 |
| | කළුතර ගං මෝය උතුරු ඉවුර | | 6°35'16.09"N | 79°57'19.92"E | | | | |
| | | | | | | | | |
| 15 | කළුතර ගං මෝය උතුරු ඉවුර සිට | කළුතර | 6°35'16.09"N | 79°57'19.92"E | | සංවර්ධන කටයුතු තහනම් කලාපය | | සංවර්ධන කටයුතු තහනම් කලාපය |
| | කටුකුරුන්ද අවානි හෝටලය (කළුතර ගංමෝය දකුණු දෙස සීමාව) (සංරක්ෂණ කලාපයක් ලෙස කැලිඩො තීරයට එක් කිරීමට යෝජනා කෙරේ) | | 6°34'14.95"N | 79°57'34.09"E | | | | |
| | | | | | | | | |
| 16 | කටුකුරුන්ද අවානි හෝටලය (කළුතර ගංමෝය දකුණු දෙස සීමාව) සිට | කළුතර | 6°34'14.95"N | 79°57'34.09"E | පහළ | 15 | 25 | 40 |
| | බේරුවල කෙච්චිමලේ මුස්ලිම් පල්ලිය | | 6°28'13.40"N | 79°58'24.47"E | | | | |

| ඛණ්ඩ අංකය | වෙරළ ඛණ්ඩය | මූලාශ්‍ර සිතියම | අක්ෂාංශ | දේශාංශ | අවදානම් මට්ටම | යෝජිත පසසිටුව (මීටර්) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | රක්ෂිත ප්‍රදේශය | සීමාකළ ප්‍රදේශය | මුළු පසසිටු ප්‍රදේශය |
| 17 | බේරුවල කෙච්චිමලේ මුස්ලිම් පල්ලිය සිට | කළුතර/ ගාල්ල | 6°28'13.40"N | 79°58'24.47"E | පහළ (+) | 15 | 30 | 45 |
| | ඉඳුරුව තුඩුව (සමන්විලා හෝටලය) | | 6°23'44.92"N | 80°00'15.33"E | | | | |
| | | | | | | | | |
| 18 | ඉඳුරුව තුඩුව (සමන්විලා හෝටලය) සිට | ගාල්ල | 6°23'44.92"N | 80°00'15.33"E | පහළ | 15 | 25 | 40 |
| | හික්කඩුව ගංමෝය | | 6°08'58.03"N | 80°05'57.27"E | | | | |
| | | | | | | | | |
| 19 | හික්කඩුව ගංමෝය සිට | ගාල්ල | 6°08'58.03"N | 80°05'57.27"E | පහළ (-) | 10 | 25 | 35 |
| | බඹගල ඇල | | 6°01'40.23"N | 80°14'32.42"E | | | | |
| | | | | | | | | |
| 20 | බඹගල ඇල සිට | ගාල්ල | 6°01'40.23"N | 80°14'32.42"E | පහළ | 15 | 25 | 40 |
| | උණවටුන වැල්ල දේවාලය | | 6°00'23.34"N | 80°14'39.16"E | | | | |
| | | | | | | | | |
| 21 | උණවටුන වැල්ල දේවාලය සිට | ගාල්ල/මාතර | 6°00'23.34"N | 80°14'39.16"E | පහළ (-) | 10 | 25 | 35 |
| | ගොයම්බොක්ක පීස් හෙවන් හෝටලය ආශ්‍රිත තුඩුව (ජුල්ගහ වැල්ල ධීවර තොටුපළ) දක්වා | | 6°00'51.30"N | 80°47'10.38"E | | | | |
| | | | | | | | | |
| 22 | ගොයම්බොක්ක පීස් හෙවන් හෝටලය ආශ්‍රිත තුඩුව (ජුල්ගහ වැල්ල ධීවර තොටුපළ) සිට | හම්බන්තොට | 6°00'51.30"N | 80°47'10.38"E | පහළ | 15 | 25 | 40 |
| | රැකව බටහිර | | 6°02'32.19"N | 80°51'38.27"E | | | | |
| | | | | | | | | |
| 23 | රැකව බටහිර සිට | හම්බන්තොට | 6°02'32.19"N | 80°51'38.27"E | මධ්‍යම (-) | 20 | 30 | 50 |
| | කලමැටිය හෙනගහපුගල | | 6°04'31.10"N | 80°56'10.44"E | | | | |
| | | | | | | | | |
| 24 | කලමැටිය හෙනගහපුගල සිට | හම්බන්තොට | 6°04'31.10"N | 80°56'10.44"E | මධ්‍යම (+) | 25 | 35 | 60 |
| | උස්සන්ගොඩ වනජීවී ජාතික උද්‍යානයේ දකුණු මායිම (ලුනම දිසාව) (කලමැටිය වන ජීවී අභය භූමි ප්‍රදේශය) | | 6°05'13.04"N | 80°58'37.61"E | | | | |
| | | | | | | | | |
| 25 | උස්සන්ගොඩ වනජීවී ජාතික උද්‍යානයේ දකුණු මායිම (ලුනම දිසාව සිට | හම්බන්තොට | 6°05'13.04"N | 80°58'37.61"E | | 300 | | 300 |
| | උස්සන්ගොඩ වනජීවී ජාතික උද්‍යානයේ උතුරු මායිම (උස්සන්ගොඩ ධීවර වරායට ආසන්න) ~~උස්සන්ගොඩ වනජීවී ජාතික උද්‍යානය~~ | | 6° 05'43.00"N | 80°59'23.90"E | | | | |
| | | | | | | | | |
| 26 | උස්සන්ගොඩ වනජීවී ජාතික උද්‍යානයේ උතුරු මායිම (උස්සන්ගොඩ ධීවර වරායට ආසන්න) සිට | හම්බන්තොට | 6° 05'43.00"N | 80°59'23.90"E | පහළ | 15 | 25 | 40 |
| | ගොඩවාය වලවේ ගං මෝය (වෙරළ සංරක්ෂණ කාර්යාලයට ආසන්නව) | | 6°06'24.48"N | 81°03'02.31"E | | | | |

| ඛණ්ඩ අංකය | වෙරළ ඛණ්ඩය | මූලාශ්‍ර සිතියම | අක්ෂාංශ | දේශාංශ | අවදානම් මට්ටම | යෝජිත පසසිටුව (මීටර්) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | රක්ෂිත ප්‍රදේශය | සීමාකළ ප්‍රදේශය | මුළු පසසිටු ප්‍රදේශය |
| 27 | ගොඩවාය වලවේ ගං මෝය (වෙරළ සංරක්ෂණ කාර්යාලයට ආසන්නව) සිට | හම්බන්තොට | 6°06'24.48"N | 81°03'02.31"E | මධ්‍යම (-) | 20 | 30 | 50 |
| | හම්බන්තොට වරායේ දකුණු මායිම (මිරිජ්ජවිල) | | 6°06'52.85"N | 81°05'46.64"E | | | | |
| | අලුතින් සකස්වුනු භූමියකි (ගොඩකරන ලද) | | | | | 10 | 0 | 10 |
| 28 | හම්බන්තොට වරායේ දකුණු මායිමේ සිට | හම්බන්තොට | 6°06'52.85"N | 81°05'46.64"E | මධ්‍යම (+) | 25 | 35 | 60 |
| | හම්බන්තොට ධීවර වරාය | | 6° 7'24.05"N | 81° 7'45.18"E | | | | |
| 29 | හම්බන්තොට ධීවර වරායේ සිට | හම්බන්තොට | 6° 7'24.05"N | 81° 7'45.18"E | මධ්‍යම | 20 | 35 | 55 |
| | බුන්දල ජාතික උද්‍යානයේ දකුණු මායිම | | 6° 08'01.51"N | 81°07'59.32"E | | | | |
| 30 | බුන්දල ජාතික උද්‍යානයේ දකුණු මායිම හම්බන්තොට සිට | හම්බන්තොට | 6° 08'01.51"N | 81°07'59.32"E | | 300 | | 300 |
| | කිරිඳි ඔය මෝය (බුන්දල ජාතික උද්‍යානය) | | 6°11'46.70"N | 81°17'44.90"E | | | | |
| 31 | කිරිඳි ඔය මෝය සිට | හම්බන්තොට | 6°11'46.70"N | 81°17'44.90"E | ඉතාමත් ඉහළ | 45 | 80 | 125 |
| | කිරින්ද අදගල තුඩුව ආරම්භක ස්ථානය (අදගල මෝදරට ආසන්නව) | | 6°11'55.94"N | 81°19'26.88"E | | | | |
| 32 | කිරින්ද අදගල තුඩුව ආරම්භක ස්ථානය (අදගල මෝදරට ආසන්නව) සිට | හම්බන්තොට | 6°11'55.94"N | 81°19'26.88"E | ඉහළ (-) | 25 | 40 | 65 |
| | කිරින්ද පන්සල කන්ද | | 6°12'50.15"N | 81°20'16.27"E | | | | |
| 33 | කිරින්ද පන්සල කන්ද සිට | හම්බන්තොට | 6°12'50.15"N | 81°20'16.27"E | ඉතාමත් ඉහළ | 45 | 80 | 125 |
| | යාල පලටුපාන SLTDA සංචාරක කලාපය අවසන් ස්ථානය (ගොඩේ (කලපුව) සීමාව) | | 6°16'26.67"N | 81°25'11.56"E | | | | |
| 34 | යාල පලටුපාන SLTDA සංචාරක කලාපය අවසන් ස්ථානය (ගොඩේ (කලපුව) සීමාව) සිට | හම්බන්තොට/ | 6°16'26.67"N | 81°25'11.56"E | | 300 | | 300 |
| | යාල ජාතික උද්‍යානය උතුරු මායිම (ඔකඳ) | අම්පාර | 6°21'46.50"N | 81°31'44.00"E | | | | |

| ඛණ්ඩ අංකය | වෙරළ ඛණ්ඩය | මූලාශ්‍ර සිතියම | අක්ෂාංශ | දේශාංශ | අවදානම් මට්ටම | යෝජිත පසුබැසීම (මීටර්) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | රක්ෂිත ප්‍රදේශය | සීමාකළ ප්‍රදේශය | මුළු පසුබැසීම ප්‍රදේශය |
| 35 | යාල ජාතික උද්‍යානය උතුරු මායිම (ඔකඳ) සිට | අම්පාර | 6°21'46.50"N | 81°31'44.00"E | ඉතාමත් ඉහළ | 45 | 80 | 125 |
| | පනාකාල කලපුව මෝය (පානම රක්ෂිත කලාපය ආරම්භක ස්ථානය) | | 6° 43'29.37" N | 81°48'06.97"E | | | | |
| | | | | | | | | |
| 36 | පනාකාල කලපුව මෝය (පානම රක්ෂිත කලාපය ආරම්භක ස්ථානය) සිට | අම්පාර | 6° 43'29.37" N | 81°48'06.97"E | | 10 | | 10 |
| | පානම කලපු මෝය බෙකන් ලැම්ප් රොක් (පානම රක්ෂිත කලාපය අවසන් සීමාව) | | 6° 46'02.61" N | 81°49'32.37"E | | | | |
| | | | | | | | | |
| 37 | පානම කලපු මෝය බෙකන් ලැම්ප් රොක් සිට | අම්පාර | 6° 46'02.61" N | 81°49'32.37"E | ඉහළ (+) | 35 | 60 | 95 |
| | කුඩාකල්ලි කිඹුලා කන්ද (හැඩ ඔය මෝය) | | 6° 48'35.38"N | 81°49'28.11"E | | | | |
| | | | | | | | | |
| 38 | කුඩාකල්ලි කිඹුලා කන්ද (හැඩ ඔය මෝය) සිට | අම්පාර | 6° 48'35.38"N | 81°49'28.11"E | ඉහළ (-) | 25 | 40 | 65 |
| | අරුගම් බේ උල්ල වැලි වැටිය ආරම්භක ස්ථානය | | 6°50'4.63"N | 81°50'14.24"E | | | | |
| | | | | | | | | |
| 39 | අරුගම් බේ උල්ල වැලි වැටිය ආරම්භක ස්ථානය සිට | අම්පාර | 6°50'4.63"N | 81°50'14.24"E | ඉතාමත් ඉහළ | 45 | 80 | 125 |
| | අරුගම් බේ උල්ල රළ පැදුම් ස්ථානය | | 6°50'21.76"N | 81°50'8.89"E | | | | |
| | | | | | | | | |
| 40 | අරුගම් බේ උල්ල රළ පැදුම් ස්ථානයේ සිට | අම්පාර | 6°50'21.76"N | 81°50'8.89"E | පහළ (+) | 10 | 30 | 40 |
| | අරුගම් බේ පාලම | | 6° 51'03.20"N | 81°49'55.10"E | | | | |
| | | | | | | | | |
| 41 | අරුගම් බේ පාලම සිට | අම්පාර | 6° 51'03.20"N | 81°49'55.10"E | මධ්‍යම (-) | 20 | 30 | 50 |
| | විස්කි තුඩුව වැලිවැටිය ආරම්භක ස්ථානය (කනහාර් ගම) 326 කි.මී.කණුව | | 6° 55'05.55"N | 81°50'51.78"E | | | | |
| | | | | | | | | |
| 42 | විස්කි තුඩුව වැලිවැටිය ආරම්භක ස්ථානය (කනහාර් ගම) 326 කි.මී.කණුව සිට | අම්පාර | 6° 55'05.55"N | 81°50'51.78"E | මධ්‍යම | 20 | 35 | 55 |
| | සංගමන් කන්ද තුඩුව | | 7° 01'21.39"N | 81°52'42.46"E | | | | |
| | | | | | | | | |
| 43 | සංගමන් කන්ද තුඩුව සිට | අම්පාර | 7° 01'21.39"N | 81°52'42.46"E | ඉහළ | 30 | 50 | 80 |
| | තම්බට්ටායි (තම්බට්ටායි කෝවිල සහ ගයාත්‍රි තාපොවනම්ට ආසන්නව කි.මී. 354.5 කණුව සිට | | 7°08'17.96"N | 81°51'27.50"E | | | | |

| ඛණ්ඩ අංකය | වෙරළ ඛණ්ඩය | මූලාශ්‍ර සිතියම | අක්ෂාංශ | දේශාංශ | අවදානම් මට්ටම | යෝජිත පසසිටුව (මීටර්) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | යෝජිත පසසිටුව (මීටර්) | සීමාකළ ප්‍රදේශය | මුළු පසසිටු ප්‍රදේශය |
| 44 | තම්බට්ටාය් (තම්බට්ටාය් කෝවිල සහ ගයාත්‍රි තාපොවනම්ට ආසන්නව කි.මී. 354.5 කණුව සිට | අම්පාර | 7°08'17.96"N | 81°51'27.50"E | ඉතා ඉහළ | 40 | 70 | 110 |
| | අලයාඩිවෙම්බු (පටු තීරය) | | 7°12'26.40"N | 81°51'43.75"E | | | | |
| 45 | අලයාඩිවෙම්බු සිට | අම්පාර | 7°12'26.40"N | 81°51'43.75"E | ඉහළ (-) | 25 | 40 | 65 |
| | ඔලුවිල් වරාය උතුරු මායිම (ප්‍රදීපාගාරයට ආසන්නව) | | 7°16' 48.18"N | 81°51'58.01"E | | | | |
| 46 | ඔලුවිල් වරාය උතුරු මායිම (ප්‍රදීපාගාරයට ආසන්නව) සිට | අම්පාර | 7°16' 48.18"N | 81°51'58.01"E | ඉහළ (-) | 25 | 40 | 65 |
| | වැලි ඇවුරුම ආරම්භක ස්ථානය | | 7°27'58.08"N | 81°48'58.66"E | | | | |
| 47 | වැලි ඇවුරුම ආරම්භක ස්ථානය සිට | අම්පාර /මඩකලපුව | 7°27' 58.08"N | 81°48'58.66"E | ඉහළ | 30 | 50 | 80 |
| | කාත්තන්කුඩි ඩින්පාර අල්තරීකා මුස්ලිම් පල්ලිය | | 7°41'40.26"N | 81°44'05.38"E | | | | |
| 48 | කාත්තන්කුඩි ඩින්පාර අල්තරීකා මුස්ලිම් පල්ලිය සිට | මඩකලපුව | 7°41'40.26"N | 81°44'05.38"E | ඉහළ (-) | 25 | 40 | 65 |
| | කල්ලාඩි වෙරළ උද්‍යානය (සරවනාඩි පාර) | | 7°43'04.71"N | 81°43'10.19"E | | | | |
| 49 | කල්ලාඩි වෙරළ උද්‍යානය (සරවනාඩි පාර) සිට | මඩකලපුව | 7°43'04.71"N | 81°43'10.19"E | ඉතා ඉහළ | 45 | 80 | 125 |
| | මඩකලපුව ප්‍රදීපාගාරය (පාල්මීන්මාඩු) | | 7°45'18.42"N | 81°41'07.46"E | | | | |
| 50 | මඩකලපුව ප්‍රදීපාගාරය (පාල්මීන්මාඩු) සිට | මඩකලපුව | 7°45'18.42"N | 81°41'07.46"E | ඉහළ | 30 | 50 | 80 |
| | පුන්නියකුඩා තුඩුව | | 7°49'40.60"N | 81°37'10.90"E | | | | |
| 51 | පුන්නියකුඩා තුඩුව සිට | මඩකලපුව | 7°49'40.60"N | 81°37'10.90"E | ඉහළ (-) | 25 | 40 | 65 |
| | පාසිකුඩා ධීවර තොටුපළ අසල පිටවුම් මාර්ගය | | 7°56'06.76"N | 81°33'38.13"E | | | | |
| 52 | පාසිකුඩා ධීවර තොටුපළ අසල පිටවුම් මාර්ගය සිට | මඩකලපුව | 7°56'06.76"N | 81°33'38.13"E | ඉතා ඉහළ | 40 | 70 | 110 |
| | නසිවාන්තිවු කලපුව මෝය | | 7°56'46.50"N | 81°32'42.80"E | | | | |

| ඛණ්ඩ අංකය | ඛණ්ඩ අංකය | මූලාශ්‍ර සිතියම | අක්ෂාංශ | දේශාංශ | අවදානම් මට්ටම | යෝජිත පසසිටුව (මීටර්) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | රක්ෂිත ප්‍රදේශය | සීමාකළ ප්‍රදේශය | මුළු පසසිටු ප්‍රදේශය |
| 53 | නයිවාන්තිවු කලපුව මෝය සිට | මඩකලපුව | 7°56'46.50"N | 81°32'42.80"E | ඉහළ | 30 | 50 | 80 |
| | වල්ලිතිවු මුනායි තුඩුව (වල්ලිතිවු දූපත අසල) | | 8°06'35.36"N | 81°27'33.88"E | | | | |
| | | | | | | | | |
| 54 | වල්ලිතිවු මුනායි තුඩුව (වල්ලිතිවු දූපත අසල) සිට | මඩකලපුව/ ත්‍රිකුණාමලය | 8°06'35.36"N | 81°27'33.88"E | ඉහළ | 30 | 50 | 80 |
| | ලංකා පටුන | | 8°21'24.60"N | 81°23'19.00"E | | | | |
| | | | | | | | | |
| 55 | ලංකා පටුන සිට | ත්‍රිකුණාමලය | 8°21'24.60"N | 81°23'19.00"E | ඉහළ (+) | 35 | 60 | 95 |
| | කෙවුලිය තුඩුව (තිරුකෝනාමලෙයි ප්‍රදීපාගාරය) | | 8°31'31.33"N | 81°19'07.15"E | | | | |
| | | | | | | | | |
| 56 | කෙවුලිය තුඩුව (තිරුකෝනාමලෙයි ප්‍රදීපාගාරය) සිට | ත්‍රිකුණාමලය | 8°31'31.33"N | 81°19'07.15"E | මධ්‍යම (-) | 20 | 30 | 50 |
| | මුතූර් නැගෙනහිර ගංමෝය (පොලිස් ස්ථානයට ආසන්නව) | | 8°27'42.54"N | 81°15'33.37"E | | | | |
| | | | | | | | | |
| 57 | මුතූර් නැගෙනහිර ගංමෝය (පොලිස් ස්ථානයට ආසන්නව) සිට | ත්‍රිකුණාමලය | 8°27'42.54"N | 81°15'33.37"E | ඉහළ | 30 | 50 | 80 |
| | ගංගෙයි පාලම | | 8°27'37.44"N | 81°13'44.08"E | | | | |
| | | | | | | | | |
| 58 | ගංගෙයි පාලම සිට | ත්‍රිකුණාමලය | 8°27'37.44"N | 81°13'44.08"E | මධ්‍යම (-) | 20 | 30 | 50 |
| | ඉරක්කන්ඩි පාලම (ගං මෝය) | | 8°43'55.40"N | 81°10'24.60"E | | | | |
| | තඹලගමුව බොක්ක උප කලාපය | | | | | | | |
| | තඹලගමුව පාලම දකුණු ඉම | ත්‍රිකුණාමලය | 8°30'19.49"N | 81°11'25.40"E | විශේෂ ඛණ්ඩය II | 10 | 20 | 30 |
| | උප කලාපයේ අතරමැදි ස්ථාන | | 8°29'16.91"N<br>8°30'37.60"N<br>8°32'41.94"N<br>8°31'34.01"N<br>8°30'47.61"N | 81°08'02.94"E<br>81°06'57.18"E<br>81°08'57.12"E<br>81°10'39.21"E<br>81°11'07.71"E | | | | |
| | තඹලගමුව පාලම උතුරු ඉම | | 8°30'32.00"N | 81°11'32.62"E | | | | |
| | | | | | | | | |

| ඛණ්ඩ අංකය | ඛණ්ඩය | මූලාශ්‍ර සිතියම | අක්ෂාංශ | දේශාංශ e | අවදානම් මට්ටම | යෝජිත පසසිටුව (මීටර්) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | රක්ෂිත ප්‍රදේශය | සීමාකළ ප්‍රදේශය | මුළු පසසිටු ප්‍රදේශය |
| 59 | ඉරක්කන්ඩි පාලම (මෝය සිට) | ත්‍රිකුණාමලය | 8°43'55.40"N | 81°10'24.60"E | ඉහළ | 30 | 50 | 80 |
| | සල්පයාරු පාලම | | 8°47'27.02"N | 81°07'13.03"E | | | | |
| | | | | | | | | |
| 60 | සල්පයාරු පාලම සිට | ත්‍රිකුණාමලය | 8°47'27.02"N | 81°07'13.03"E | මධ්‍යම (-) | 20 | 30 | 50 |
| | කුච්චවේලි පුඩුවකට්ටු | | 8° 51'33.28"N | 81°04'8.77"E | | | | |
| | | | | | | | | |
| 61 | කුච්චවේලි පුඩුවකට්ටු සිට | ත්‍රිකුණාමලය | 8° 51'33.28"N | 81°04'8.77"E | ඉහළ (-) | 25 | 40 | 65 |
| | පුල්මුඩේ අරිසිමලේ තුඩුව | | 8°56'17.05"N | 81°00'26.64"E | | | | |
| | | | | | | | | |
| 62 | පුල්මුඩේ අරිසිමලේ තුඩුව සිට | ත්‍රිකුණාමලය | 8°56'17.05"N | 81°00'26.64"E | ඉතා ඉහළ | 45 | 80 | 125 |
| | කෝකිලායි කලපුව දකුණු මායිම | | 8° 59'02.80"N | 80°58'00.20"E | | | | |
| | | | | | | | | |
| 63 | කෝකිලායි කලපුව දකුණු මායිම සිට | මුලතිවු | 8° 59'02.80"N | 80°58'00.20"E | ඉහළ මට්ටම | 40 | 70 | 110 |
| | මුලතිවු නගරය | | 9° 16'03.02"N | 80°49'15.96"E | | | | |
| | | | | | | | | |
| 64 | මුලතිවු නගරය සිට | මුලතිවු | 9° 16'03.02"N | 80°49'15.96"E | ඉහළ | 30 | 50 | 80 |
| | මුලතිවු මොහොට්ටුවාරම්/ වාට්ටුවාන් කලපුව | | 9°16'33.75"N | 80°49'0.39"E | | | | |
| | | | | | | | | |
| 65 | මුලතිවු මොහොට්ටුවාරම්/ වාට්ටුවාන් කලපුව සිට | මුලතිවු | 9°16'33.75"N | 80°49'0.39"E | ඉහළ මට්ටම | 40 | 70 | 110 |
| | නාලියාතන්නිතොඩුවේ (චුන්ඩිකුලම් ජාතික උද්‍යානය දකුණු මායිම) | කිලිනොච්චි | 9°27'28.40"N | 80°37'19.06"E | | | | |
| | | | | | | | | |

| ඛණ්ඩ අංකය | වෙරළ ඛණ්ඩය | මූලාශ්‍ර සිතියම | අක්ෂාංශ | දේශාංශ | අවදානම් මට්ටම | යෝජිත පසසිටුව (මීටර්) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | රක්ෂිත ප්‍රදේශය | සීමාකළ ප්‍රදේශය | මුළු පසසිටු ප්‍රදේශය |
| 66 | නාලියාතන්නිතොඩුවේ (වුන්ඩිකුලම් ජාතික උද්‍යානය දකුණු මායිම) සිට | කිලිනොච්චි | 9°27'28.40"N | 80°37'19.06"E | | 300 | | 300 |
| | වුන්ඩිකුලම් ජාතික උද්‍යානය උතුරු මායිම (කඩ්ඩායිකාඩුව) | | 9°33'43.45"N | 80°29'24.20"E | | | | |
| | | | | | | | | |
| 67 | වුන්ඩිකුලම් උතුරු මායිම (කඩ්ඩායිකාඩුව) සිට | යාපනය | 9°33'43.45"N | 80°29'24.20"E | ඉහළ මට්ටම | 40 | 70 | 110 |
| | තුම්පලායි (පේද්‍රු තුඩුව) | | 9°49'05.00"N | 80°15'16.60"E | | | | |
| | | | | | | | | |
| 68 | තුම්පලායි (පේද්‍රු තුඩුව) සිට | යාපනය | 9°49'05.00"N | 80°15'16.60"E | පහළ (-) | 10 | 25 | 35 |
| | පොන්නාලෙයි | | 9°46'31.54"N | 79°54'37.72"E | | | | |
| | | | | | | | | |
| 69 | පොන්නාලෙයි සිට | යාපනය | 9°46'31.54"N | 79°54'37.72"E | විශේෂ ඛණ්ඩය III | 10 | 0 | 10 |
| | අරියාලෙ | | 9°38'11.50"N | 80°4'25.40"E | | | | |
| | | | | | | | | |
| 70 | කරෙයිතිවු දූපතේ මුහුදට නිරාවරණය වූ 70 (a) සිට 70 (b) | යාපනය | 9°45'50.76"N | 79°53'30.99"E | ඉහළ | 30 | 50 | 80 |
| | | | 9°42'24.92"N | 79°51'55.53"E | | | | |
| | කරෙයිතිවු දූපතේ ගොඩබිමට නිරාවරණය වූ 70 (b) සිට 70 (a) | යාපනය | 9°42'24.92"N | 79°51'55.53"E | විශේෂ ඛණ්ඩය III | 10 | 0 | 10 |
| | | | 9°45'50.76"N | 79°53'30.99" E | | | | |
| | | | | | | | | |
| 71 | මන්ඩතිවු දූපත් | යාපනය | 9°35'58.20"N | 79°58'43.20"E | මධ්‍යම (-) | 20 | 30 | 50 |
| | | | 9°38'16.20"N | 79°59'19.56"E | | | | |
| | | | | | | | | |
| 72 | 72 (a) කයිට්ස් දූපත් 1 ඛණ්ඩය (අලපිඩ්ඩි සිට වෙලානායිලයනාර් කෝවිල) | යාපනය | 9°42'10.47"N | 79°51'49.14"E | මධ්‍යම (-) | 20 | 30 | 50 |
| | 72 (b) කයිට්ස් දූපත් II ඛණ්ඩය | | 9°37'14.33"N | 79°58'47.86"E | විශේෂ ඛණ්ඩය (III) | 10 | 0 | 10 |
| | | | | | | | | |

| ඛණ්ඩ අංකය | වෙරළ ඛණ්ඩය | මූලාශ්‍ර සිතියම | අක්ෂාංශ | දේශාංශ | අවදානම් මට්ටම | යෝජිත පසසිටුව (මීටර්) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | රක්ෂිත ප්‍රදේශය | සීමාකළ ප්‍රදේශය | මුළු පසසිටු ප්‍රදේශය |
| 73 | පුන්කුඩුතිවු දූපත් | යාපනය | 9°35'22.40"N<br>9°35'17.50"N | 79°48'26.60"E<br>79°48'07.50"E | ඉහළ (-) | 25 | 40 | 65 |
| 74 | නයිනතිවු දූපත් | යාපනය | 9°37'08.30"N<br>9°35'05.30"N | 79°46'30.70"E<br>79°46'23.30"E | ඉහළ (-) | 25 | 40 | 65 |
| 75 | ඩෙල්ෆ් දූපත් | යාපනය | | | ඉහළ | 30 | 50 | 80 |
| 76 | අනලායිතිවු, ඉලුවායිතිවු, කච්චතිවු සහ අනෙකුත් දූපත් | වෙනත් දූපත් යාපනය/ කිලිනොච්චි | | | ඉහළ (-) | 25 | 40 | 65 |
| 77 | ඉරණතිවු දූපත් | කිලිනොච්චි | | | ඉහළ | 30 | 50 | 80 |
| 78 | පුනරින් කල්මුණේ තුඩුව සිට<br>පල්ලිකුඩා | කිලිනොච්චි | 9°35'57.25"N<br>9°29'10.95"N | 80°03'07.56"E<br>80°11'09.71"E | මධ්‍යම (-) | 20 | 30 | 50 |
| 79 | පල්ලිකුඩා සිට<br>රාක්ෂ තුඩුව | කිලිනොච්චි | 9°29'10.95"N<br>9°23'19.50"N | 80°11'09.71"E<br>80°03'11.10"E | ඉහළ (-) | 25 | 40 | 65 |
| 80 | රාක්ෂ තුඩුව සිට<br>නච්චිකුඩා (නවන්තුරායි තුඩුව) | කිලිනොච්චි | 9°23'19.50"N<br>9°16'06.10"N | 80°03'11.10"E<br>80°06'46.80"E | ඉහළ | 30 | 50 | 80 |
| 81 | නච්චිකුඩා (නවන්තුරායි තුඩුව) සිට<br>පල්ලි ආරු උතුරු කොට්ඨාශ තුඩුව | කිලිනොච්චි/<br>මන්නාරම | 9°16'06.10"N<br>9°09'33.20"N | 80°06'46.80"E<br>80°05'57.92"E | ඉහළ (+) | 35 | 60 | 95 |
| 82 | පල්ලි ආරු උතුරු කොට්ඨාශ තුඩුව සිට<br>වන්කලායි තුඩුව | මන්නාරම | 9°09'33.20"N<br>8°56'36.55"N | 80°05'57.92"E<br>79°55'07.28"E | ඉතා ඉහළ | 45 | 80 | 125 |
| 83 | මන්නාරම දකුණු වැලි පරය සිට<br>ඉරුක්කලාම්පිඩ්ඩි දියමංකඩ සිට තෝන | මන්නාරම් දූපත් | 8°57'53.10"N<br>9°01'38.96"N | 79°53'08.55"E<br>79°53'35.76"E | මධ්‍යම (-) | 20 | 30 | 50 |

| ඛණ්ඩ අංකය | වෙරළ ඛණ්ඩය | මූලාශ්‍ර සිතියම | අක්ෂාංශ | දේශාංශ | අවදානම් මට්ටම | යෝජිත පසසිටුව (මීටර්) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | රක්ෂිත ප්‍රදේශය | සීමාකළ ප්‍රදේශය | මුළු පසසිටු ප්‍රදේශය |
| 84 | ඉරුක්කලාම්පිඩ්ඩි දියමංකඩ සිට තෝනා සිට | මන්නාරම් දූපත් | 9°01'38.96"N | 79°53'35.76"E | ඉහළ | 30 | 50 | 80 |
| | පේසාලෙ වන්කලායිපාඩු | | 9°04'46.49"N | 79°50'52.46"E | | | | |
| 85 | පේසාලෙ වන්කලායිපාඩු සිට | මන්නාරම් දූපත් | 9°04'46.49"N | 79°50'52.46"E | මධ්‍යම (-) | 20 | 30 | 50 |
| | තලෙයිමන්නාරම ප්‍රදීපාගාරය / කුළුණ | | 9°06'27.23"N | 79°43'49.12"E | | | | |
| 86 | තලෙයිමන්නාරම ප්‍රදීපාගාරය / කුළුණ සිට | මන්නාරම් දූපත් | 9°06'27.23"N | 79°43'49.12"E | ඉහළ | 30 | 50 | 80 |
| | මන්නාරම දූපත් දකුණු වැලි පරය | | 8°57'53.10"N | 79°53'08.55"E | | | | |
| 87 | මන්නාරම දූපත් දකුණු වැලි පරය සිට | මන්නාරම් දූපත් | 8°57'53.10"N | 79°53'08.55"E | | තහනම් කලාපය | | තහනම් කලාප |
| | වන්කලායි තුඩුව (යෝජිත රක්ෂිත/ඉදිකිරීම් තහනම් කලාපය) | | 8°55'50.40"N | 79°54'26.28"E | | | | |
| 88 | වන්කලායි තුඩුව සිට | මන්නාරම | 8°55'50.40"N | 79°54'26.28"E | ඉතා ඉහළ | 45 | 80 | 125 |
| | වන්කලායි අභය භූමියේ දකුණු මායිම | | 8°53'26.30"N | 79°55'44.70"E | | | | |
| 89 | වන්කලායි අභය භූමියේ දකුණු මායිම සිට | මන්නාරම | 8°53'26.30"N | 79°55'44.70"E | ඉහළ | 30 | 50 | 80 |
| | අරිප්පු නැගෙනහිර | | 8°47'44.63"N | 79°55'27.45"E | | | | |
| 90 | අරිප්පු නැගෙනහිර සිට | මන්නාරම | 8°47'44.63"N | 79°55'27.45"E | ඉහළ (-) | 25 | 40 | 65 |
| | පුක්කුලාම් මෝද්දරගම්ආරු | | 8°33'48.67"N | 79°55'12.80"E | | | | |
| 91 | පුක්කුලාම් මෝද්දරගම්ආරු සිට | පුත්තලම | 8°33'48.67"N | 79°55'12.80"E | | 300 | | 300 |
| | කලා ඔය මෝය (විල්පත්තු ජාතික උද්‍යානය) | | 8°17'43.80"N | 79°50'02.96"E | | | | |
| 92 | කලා ඔය මෝය (විල්පත්තු ජාතික උද්‍යානය) | පුත්තලම | 8°17'43.80"N | 79°50'02.96"E | ඉහළ | 30 | 50 | 80 |
| | පුත්තලම කලපුව ප්‍රවේශ ලක්ෂ්‍යය | | 8°13'58.04"N | 79°47'22.33"E | | | | |

වගුව 6 - 2 අවදානම් මට්ටම සහ පසසිටු දුර අනුව වෙරළ ඛණ්ඩ වර්ගීකරණය (මීටර්වලින්)

| | අවදානම් මට්ටම | රක්ෂිත ප්‍රදේශය | සීමාකළ ප්‍රදේශය | මුළු පසසිටුව |
|---|---|---|---|---|
| | පහළ (-) | 10 | 25 | 35 |
| | පහළ | 15 | 25 | 40 |
| | පහළ (+) | 15 | 30 | 45 |
| | මධ්‍යම (-) | 20 | 30 | 50 |
| | මධ්‍යම | 20 | 35 | 55 |
| | මධ්‍යම (+) | 25 | 35 | 60 |
| | ඉහළ (-) | 25 | 40 | 65 |
| | ඉහළ | 30 | 50 | 80 |
| | ඉහළ (+) | 35 | 60 | 95 |
| | ඉහළ මට්ටම | 40 | 70 | 110 |
| | ඉතා ඉහළ | 45 | 80 | 125 |

විශේෂ වෙරළඛණ්ඩ

| | ඛණ්ඩය | රක්ෂිත ප්‍රදේශය | සීමාකළ ප්‍රදේශය | මුළු පස සිටුව |
|---|---|---|---|---|
| | රක්ෂිත කලාප | 300 | | 300 |
| | රක්ෂිත ප්‍රදේශ | සංවර්ධන කටයුතු තහනම් කලාපය | | |
| | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කළ බලපෑමට ලක්වූ ප්‍රදේශයෙන් පිටත | 10 | 0 | 10 |
| | විශේෂ ඛණ්ඩය I (වරාය නගරය නියෝග) | වරාය නගරය නියෝග අදාළ වේ. | | |
| | විශේෂ ඛණ්ඩය II | 10 | 20 | 30 |
| | විශේෂ ඛණ්ඩය III | 10 | 0 | 10 |

*සටහන* - වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන පරිදි ධීවර වරායන් හි දියකඩනයෙන් ආවරණය වන ගොඩබිම් ප්‍රදේශයේ සිදුවන සංවර්ධන කටයුතු සඳහා පසසිටු ප්‍රමිතීන් අදාළ නොවේ.




රූපය 6 - 4 : ශ්‍රී ලංකාවේ වෙරළ අවදානම්තාවය පිළිබඳ සිතියම

**වගුව 6- 3: ශ්‍රී ලංකාවේ වෙරළ කලාපයට යාබද රක්ෂිත ප්‍රදේශ**

| නම | පිහිටීම/භූගෝලීය ඛණ්ඩාංක** අක්ෂාංශ (උ) දේශාංශ (නැ) | වෙරළ තීරයේ දිග (කි.මී) | විශාලත් වය (හෙක්ටයාර) | ස්ථාපිත කරන ලද වර්ෂය |
|---|---|---|---|---|
| 1. බාධක හිරිගපල්පර අභය භූමිය | 8°16'00 - 8°32'00" 79°40'75 - 79°49'70" | 75 | 30,670 | 1992.04.03 |
| 2. හොන්දුව දූපත අභය භූමිය | 6°27'17 - 6°23'55" 79°58'31 - 80°00'16" | | 9 | 1973.11.19 |
| 3.තෙල්වත්ත අභය භූමිය * | 6°16'00 - 6°08'55" 80°01'53 - 80°03'52" | | 1,425 | 1938.02.25 |
| 4.අම්බලන්ගොඩ – හික්කඩුව අභය භූමිය | 6°09'00 - 6°08'00" 80°08'00 - 80°05'00" | මීටර් 638 | 1 | 1940.10.25 |
| 5.හික්කඩුව ජාතික උද්‍යානය | | 04.8 | 102 | 2002.10.08 |
| 6.පරප්පඩුව දූපත සහ පොල්ගස්දූව අභය භූමිය* | සමස්ත දූපත සහ කලපුව 22 | | 1,988 | 1988.08.17 |
| 7.කලමැටිය කලපු අභය භූමිය* | 6°05'00 - 6°06'00" 80°56'00 - 80°59'00" | 4.72 | 2,525 | 1984.06.28 |
| 8.බුන්දල ජාතික උද්‍යානය | 6°07'00 - 6°14'00" 80°07'00 - 81°17'00" | 21.33 | 6,216 | 2004.07.28 |
| 9.නිමලව අභය භූමිය | 6°08'20 - 6°46'05 81°08'46 - 81°49'25" | 03.25 | 1,066 | 1993.02.18 |
| 10.රුහුණ (යාල) – ජාතික උද්‍යානය* | 6°16'00 - 6°42'00 81°15'00 - 81°41'30" | 45.4 | 97,881 | 1938.02.25 |
| 11.යාල දැඩි ස්වාභාවික රක්ෂිතය* | 6°16'00 - 6°42'00 81°15'00 - 81°41'30" | | 28,906 | 1938.03.01 |
| 12.කුමන ජාතික උද්‍යානය* | 6°16'00 - 6°42'00 81°04'00 - 81°45'00" | 15.4 | 35,665 | 2006.09.05 |
| 13.කුඩුම්බිගල අභය භූමිය* | 6°46'05 - 6°57'23 81°49'25 - 81°51'30" | 12.35 | 6,534 | 2006.02.20 |
| 14. සේරුවිල අභය භූමිය* | 8°20'00 - 8°25'00 81°20'00 - 81°23'00" | 15.8 | 15,540 | 1970.10.09 |
| 15.සෝබර් දූපත | සමස්ත දූපත | 03.91 | 65 | 1963.06.21 |
| 16.සෝබර් දූපත් අභය භූමිය* | සමස්ත දූපත | මීටර් 898 | 7 | 1963.06.21 |
| 17.පරෙවි දූපත ජාතික උද්‍යානය | සමස්ත දූපත | 08.34 | 471 | 2003.06.04 |
| 18.කෝකිලායි කලපුව අභය භූමිය* | 8°56'00 - 9°03'00 80°52'00 - 80°58'00" | 01.15 | 1,995 | 1951.05.18 |
| 19.වුන්ඩිකුලම ජාතික උද්‍යානය* | 9°26'00 - 9°32'00 80°24'00 - 80°37'00" | 32.56 | 19,565 | 2015.06.22 |
| 20.පරිතිවු දූපත් අභය භූමිය * | සමස්ත දූපත | 02.38 | 970 | 1973.05.18 |
| 21.විල්පත්තු ජාතික උද්‍යානය* | | 36.8 | 131,667 | 1938,1941,1 |

| | | | | |
|---|---|---|---|---|
| | | | | 973 |
| 22. මාදම්පවිල අභය භූමිය | | 01.2 | 1,217 | 2007.09.21 |
| 23.රැකව අභය භූමිය | | 3.58 | 271 | 2006.05.25 |
| 24.ගොඩවාය අභය භූමිය | | 4.15 | 232 | 2006.05.25 |
| 25. උස්සන්ගොඩ ජාතික උද්‍යානය | | 04.0 | 349 | 2010.05.06 |
| 26. රූමස්සල අභය භූමිය | | 5.0 | 171 | 2003.01.03 |
| 27. වන්කලායි අභය භූමිය | | 14.8 | 4,839 | 2008.09.08 |
| 28. ආදම්ගේ පාලම ජාතික උද්‍යානය | | 57 | 18,990 | 2015.06.22 |
| 29. ඩෙල්ෆ්ට් ජාතික උද්‍යානය | | | 1,846.28 | 2015.06.22 |
| 30. වෙඩුතලාතිවු ස්වභාව රක්ෂිතය | | 32.8 | 29,180 | 2016.03.01 |

*මූලාශ්‍රය:*

1. *IUCN Directory of South Asian Protected Areas 1989*
2. *වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (2016), සමුද්‍රීය රක්ෂිත ප්‍රදේශ සහ ආශ්‍රිත සමුද්‍රීය රක්ෂිත ප්‍රදේශ*

## 6. 7 සුවිශේෂී වැදගත්කමකින් යුතු ස්ථාන කළමනාකරණය සහ පොදු පිවිසුම්

1990, 1997 සහ 2004 වර්ෂවල දී ප්‍රකාශයට පත්කළ වෙරළ කලාප කළමනාකරණ සැලසුම්වල පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, ආගමික, සංස්කෘතික ස්ථාන සහ විශේෂ ස්වභාවික සුන්දරත්වයකින් යුතු ස්ථාන ඇතුළත් වන වෙරළ කලාපය තුළ සුවිශේෂී වැදගත්කමකින් යුතු ස්ථාන නැතිවී යෑමේ හා හානිවීමේ ගැටලුව වෙනම පරිච්ඡේදයක් වශයෙන් ඇතුළත් කර තිබුණි. මීට අමතරව, වෙරළ වෙත හා වෙරළ දිගේ තිරස් හා සිරස් ප්‍රවේශය වැඩිදියුණු කිරීම හා ආරක්ෂා කිරීම ද අවධාරණය කර තිබුණි. එසේ වුව ද, සංසතතාවය පවත්වා ගැනීමට සහ පරිශීලක හිතකාමී වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මක් පවත්වා ගැනීම සඳහා, වෙනම ගැටලුවක් ලෙස විසඳුම් සෙවීම වෙනුවට, 2024 වර්ෂයේ වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම තුළ ඊට පෙර 2018 වර්ෂයේ වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම තුළ මෙන්ම "නියාමන යාන්ත්‍රණය" නමින් හැඳින්වෙන පරිච්ඡේදයට මෙම කරුණු අන්තර්ගත කර තිබේ. මෙරට සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම සඳහා වෙරළ කලාපය තුළ පිහිටා ඇති සුවිශේෂී වැදගත්කමකින් යුතු ස්ථාන ඉතා වැදගත් වේ. මෙම ස්ථාන ඊට ආසන්න ප්‍රදේශවල පවතින ස්මාරකවලට වඩා විනාශ වීම සඳහා වැඩි නැඹුරුතාවයක් දරන අතර මීට හේතු වනුයේ වෙරළ ඛාදනය, අනෙකුත් වෙරළබඩ උපද්‍රව වැනි ස්වාභාවික හේතු සේම ශීඝ්‍ර සංවර්ධන ක්‍රියාකාරකම් ද වේ. එබැවින්, ප්‍රමාණවත් කළමනාකරණ මැදිහත්වීම් හරහා මෙම ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය කළමනාකරණ මැදිහත්වීම් සිදුකිරීම වැදගත් වේ.

### 6.7.1 පොදු පිවිසුම්

මහජනතාව විසින් භෞතික හෝ දෘශ්‍ය සංවේදනයක් ආකාරයෙන් වෙරළ වෙත හෝ වෙරළ දිගේ පිවිසීමට හෝ ළඟාවීමට ඇති අයිතිය වෙරළබඩ පිවිසුම ලෙස අර්ථකථනය කළ හැක.මෑත කාලීන අතීතයේ දී වෙරළ කලාපය තුළ සිදු වූ වේගවත් සංවර්ධනය හේතුවෙන්, වෙරළ වෙත සහ වෙරළ දිගේ පොදු පිවිසුම උග්‍ර ගැටලුවක් බවට පත් වී ඇත. විනෝදාස්වාද සහ ආර්ථික කටයුතු සඳහා මහජනතාවට වෙරළ වෙත පිවිසීමට ඇති අයිතිය අතීතයේ සිටම හඳුනාගෙන තිබුණි. එසේ වුව ද, මෑත කාලීනව ධීවර කටයුතු, ඉස්සන් හා ජලජීවී වගාව, සංචාරක,වරාය සංවර්ධන, වෙරළ සංරක්ෂණ, ජනාවාස සහ ජාතික ආරක්ෂාවට අදාළ අවශ්‍යතා ආදිය සම්බන්ධව ඇති වූ වේගවත් වර්ධනය හමුවේ වෙරළ පිවිසුම් මාර්ගයන් පිළිබඳ සීමාවන් විවිධාකාරයෙන් ඇති විය. උතුරු හා නැගෙනහිර වෙරළබඩ කලාපවල පැවති යුද්ධමය වාතාවරණය අවසන්වීමත් සමග වෙරළ කලාපයේ ආර්ථික සංවර්ධන කටයුතු වර්ධනය වීමේ පසුබිම හමුවේ, පොදු පිවිසුම්වලින් වැදගත් කාර්යභාරයක් ඉටු වේ. පෙර වෙරළ තීරය, වෙරළ, වෙරළබඩ ජලය සහ මුහුදු පත්ල ආදියේ අයිතිය රජය සතු වන බැවින් මහජනතාවට ඔවුන්ගේ නීත්‍යානුකූල කටයුතු කරගැනීම සඳහා මෙම සම්පත් වෙත නිදහස් ප්‍රවේශය සහතික කිරීම රජයට වගකීමක් සේ පැවරී තිබේ.

වෙරළ වෙත හා වෙරළ තීරය ඔස්සේ පොදු ප්‍රවේශය සහතික කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගෙන, 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතේ III ඇ කොටසේ 22 වැනි වගන්තිය යටතේ "වෙරළ ප්‍රවේශ සැලැස්ම" ඔස්සේ නව නෛතික විධිවිධාන හඳුන්වා දී තිබේ. එබැවින් එම නෛතික විධිවිධානවලට අනුකූලව, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් "ජාතික වෙරළ ප්‍රවේශ සැලැස්ම" සම්පාදනය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කර තිබේ. මඩකලපුව දිස්ත්‍රික්කයේ වෙරළ ප්‍රවේශය සිතියම්කරණය 2021 වර්ෂයේ දී සිදුකළ අතර, මන්නාරම, කිලිනොච්චිය, යාපනය හා මුලිතිව් දිස්ත්‍රික්කවල වෙරළ ප්‍රවේශය සිතියම්කරණය වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.

### 6.7.2 පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, ආගමික සහ සංස්කෘතික වටිනාකමින් යුතු ස්ථාන

1989 ක්ෂේත්‍ර සමීක්ෂණයක් හරහා ඉහළ ප්‍රමුඛතාවයක් සහිත පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, ආගමික සහ සංස්කෘතික වටිනාකමින් යුතු ස්ථාන හඳුනාගන්නා ලද අතර, එය 2002 වර්ෂයේ දී යාවත්කාලීන කරන ලදී. ඉහළ ප්‍රමුඛතාවයක් සහිත ස්ථාන වගුව 6.4 හි දැක්වේ. එම ක්ෂේත්‍ර සමීක්ෂණයට අනුව, පහත කළමනාකරණ ගැටලු හඳුනාගන්නා ලදී:

- විධිමත් කළමනාකරණ මාර්ගෝපදේශ නොමැතිවීම හේතුවෙන් සැලසුම් නොකළ සහ අනවසර සංවර්ධන කාර්යයන් හේතුවෙන් වෙරළ කලාපය තුළ ඉහළ ප්‍රමුඛතාවයකින් යුතු ස්ථානවල ගුණාත්මක තත්ත්වය හානිවී ඇත,
- එම ස්ථානවල වැදගත්කම සම්බන්ධයෙන් පොදු ජනතාවට හා ආංශික නියෝජිතායතනවලට දැනුවත්භාවයක් නොමැතිවීම හේතුවෙන් එම ස්ථාන බලහත්කාරයෙන් අල්ලා ගැනීම හා සංවර්ධන කටයුතු කිරීමෙන් ඒවායේ ගුණාත්මක තත්ත්වය හානිවී ඇත,

- සංරක්ෂණ සැලැසුම් දියත් කිරීම සඳහා අදාළ ආයතනවලින් මූල්‍යමය දායකත්වයක් නොමැතිවීමෙන් එම ස්ථානවල ගුණාත්මක තත්ත්වය හානිවී ඇත,
- 2009 වර්ෂය දක්වා දශක තුනක් තිස්සේ උතුරු හා නැගෙනහිර පළාත්වල පැවති සිවිල් අර්බුදය හේතුවෙන් ඉහළ ප්‍රමුඛතාවයකින් යුතු ඇතැම් ස්ථාන විනාශ වී තිබේ,
- එම ස්ථානවල වටිනාකම හා සුවිශේෂීබව සම්බන්ධයෙන් නිසි අවධානයක් නොමැතිවීම එම ස්ථානවල ගුණාත්මක තත්ත්වය හානිවීමට දායක වී ඇති අතර අදාළ අධිකාරින්ගේ ප්‍රමාණවත් අවධානයක් ද මේ සම්බන්ධයෙන් යොමු වී නොමැත.

ඉහත දක්වා ඇති කළමනාකරණ ගැටලු හේතුවෙන්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 1990, 1997, 2004 සහ 2018 වර්ෂවල දී ප්‍රකාශයට පත්කළ වෙරළ කලාප කළමනාකරණ සැලැසුම් තුළින් අවශ්‍ය ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ, කළමනාකරණ ක්‍රමෝපාය සහ ක්‍රියාමාර්ග හඳුන්වා දී තිබේ. පූර්ව කළමනාකරණ ක්‍රමෝපාය හා පියවරවල ඵලදායීතාවය සංඛ්‍යාත්මක ආකාරයෙන් ඉදිරිපත් කළ නොහැකි වුව ද, මහජන දැනුවත්බව වැඩිදියුණු කරන අතරම, අවසර පත්‍ර ක්‍රමවේදය, මූලික පරීක්ෂණ වාර්තාව සහ පාරිසරික බලපෑම් තක්සේරු කාර්ය පටිපාටි ඔස්සේ එවැනි ස්ථානවලට සමීපව සිදුකරන සංවර්ධන කාර්යයන් ඵලදායී ආකාරයෙන් පාලනය කර තිබේ.

ඉහත කරුණු සැලකිල්ලට ගැනීමේ දී මෙම වටිනා ස්මාරක ආරක්ෂා කරගැනීම සඳහා අවසර පත්‍ර ක්‍රමවේදය සහ 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ සංශෝධන තුළින් හඳුන්වා දී ඇති නව නෛතික විධිවිධාන ඔස්සේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ. තවද, ඵලදායී කළමනාකරණයක් සහතික කිරීම සඳහා අන්තර් ආයතනික සම්බන්ධීකරණ ප්‍රවර්ධනය කරනු ලැබේ.

**වගුව 6- 4: වෙරළ කලාපය ඇතුළත පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, ආගමික සහ සංස්කෘතික ඉහළ වටිනාකමින් යුතු ස්ථාන**

| | *ස්ථානය* | *Type* | *ග්‍රාම නිලධාරි කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය* |
|---|---|---|---|---|
| **පුත්තලම දිස්ත්‍රික්කය** | | | | |
| 1 | කුදිරමාලෙයි ප්‍රාග් ඓතිහාසික ස්ථානය | A/H/C | පුකුලාම් | 634 |
| 2 | කෝලාන් කනත්ත ප්‍රාග් ඓතිහාසික ස්ථානය | A/H/C | පුකුලාම් | 634 |
| 3 | ලන්දේසි පල්ලිය | H/C | සින්නාකුඩිරිප්පු | 631 |
| 4 | ලන්දේසි කොටුව | H/C | සින්නාකුඩිරිප්පු | 631 |
| 5 | ලන්දේසි නිවස | A/H | සින්නාකුඩිරිප්පු | 631 |
| 6 | ශාන්ත ආනා දේවස්ථානය | H/R/C | මුදලායිපාළි | 625/626 |
| 7 | ශ්‍රී මාරි අම්මාන් කෝවිල | H/R/C | උඩප්පුව | 594 |
| 8 | කාලි අම්මාන් කෝවිල | H/R/C | උඩප්පුව | 594 |
| 9 | මොහිදීන් ජුම්මා පල්ලිය | H/R/C | උඩප්පුව | 594 |
| 10 | ශ්‍රී පාදර්ස්දි ද්‍රොපදී කෝවිල | H/R/C | උඩප්පුව | 594 |
| 11 | අයියනාර් කෝවිල | H/R/C | කරුක්කපොනායි | 582 |
| 12 | වනවාස ශාන්ත අන්තෝනි දේවස්ථානය | H/R/C | කරුක්කපොනායි | 582 |
| 13 | ශාන්ත අන්තෝනි දේවස්ථානය තොඩුවාව දකුණ | H/R/C | තොඩුවාව දකුණ | 531 |
| 14 | ශාන්ත අන්තෝනි දේවස්ථානය | H/C/R | උල්හිටියාව උතුර | 294 |

| | ස්ථානය | Type | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාස අංකය |
|---|---|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික්කය | | | | |
| 15 | කුඩාපාඩුව දේවස්ථානය | H/C/R | එට්ටුකාල | 73 |
| 16 | ශාන්ත සෙබස්තියන් දේවස්ථානය | H/C/R | වේවැල්දෙණිය | 158 |
| 17 | කෙළින් වීදිය පල්ලිය | H/C/R | මුන්නක්කරේ | 156 |
| 18 | දිසා අධිකරණ ගොඩනැගිල්ල | A/H | මුන්නක්කරේ | 156 |
| 19 | මීගමුව කොටුව | A/H | මුන්නක්කරේ | 156 |
| 20 | සින්දාත්‍රි අප ස්වාමිදූගේ දේවස්ථානය | H/C/R | දූව | 162 a |
| 21 | නැව විනාශ වූ ස්ථානය | A(M) | දූව | 162 a |
| 22 | ශාන්ත ආනා පල්ලිය | H/C/R | පිටිපන | 162 |
| 23 | ශාන්ත මරියා මැග්ඩලීන් දේවස්ථානය | H/C/R | තලාහේන | 163 |
| 24 | ශාන්ත බාබරා දේවස්ථානය | H/C/R | තලාහේන | 163 |
| 25 | ශාන්ත අන්තෝනි දේවස්ථානය | H/C/R | කැපුන්ගොඩ | 163 a |
| 26 | ශාන්ත ජෝශප් දේවස්ථානය | H/C/R | පමුණුගම | 164 |
| 27 | නැව විනාශ වූ ස්ථානය | A(M) | උස්වැටකෙයියාව | 167 |
| 28 | කර්මෙල් කන්දේ අප ස්වාමිදූගේ දේවස්ථානය | H/C/R | පල්ලියවත්ත | 168 |
| කොළඹ දිස්ත්‍රික්කය | | | | |
| 29 | විස් බංගලාව | A/H/C | මෝදර | 2 |
| 30 | සිවා කෝවිල | H/C/R | මෝදර | 2 |
| 31 | ශාන්ත ජේම්ස් දේවස්ථානය | H/C/R | අලුත් මාවත | 4 |
| 32 | ජුම්මා පල්ලිය | H/C/R | අලුත් මාවත | 4 |
| 33 | ශ්‍රී පොන්නම්බලමේස්වර් කෝවිල | H/C/R | කොච්චිකඩේ | 9 |
| 34 | ශාන්ත තෝමස් දේවස්ථානය | H/C/R | කොච්චිකඩේ | 9 |
| 35 | ශාන්ත අන්තෝනි දේවස්ථානය | H/C/R | කොච්චිකඩේ | 9 |
| 36 | කොළඹ කොටුව | A/H/C | කොටුව | 20 |
| 37 | කොළඹ වරාය | A/H/C | කොටුව | 20 |
| 38 | ජැමි වුල්-අල්ෆාර් පල්ලිය | H/C/R | කොටුව | 20 |
| 39 | ගෝර්ඩන් උද්‍යානය | H/C | කොටුව | 20 |
| 40 | ශාන්ත පීතර දේවස්ථානය | H/C | කොටුව | 20 |
| 41 | තැප්‍රොබේන් හෝටලය | H/C | කොටුව | 20 |
| 42 | ඛාන් ඔරලෝසු කණුව | H/C | කොටුව | 20 |
| 43 | නාවික හමුදා මූලස්ථානය | H/C | කොටුව | 20 |
| 44 | ගල්බොක්කෙ ප්‍රදීපාගාරය | H/C | කොටුව | 20 |

| | ස්ථානය | Type | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය |
|---|---|---|---|---|
| 45 | කාගිල්ස් ආයතනික ගබඩාව | H/C | කොටුව | 20 |
| 46 | ජනාධිපති මන්දිරය | H/C | කොටුව | 20 |
| 47 | පැරණි තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ල | H/C | කොටුව | 20 |
| 48 | චැතැම් වීදිය ඔරලෝසු කණුව | H/C | කොටුව | 20 |
| 49 | ලන්දේසි රෝහල | H/C | කොටුව | 20 |
| 50 | ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා සිරගත කළ ස්ථානය | H/C | කොටුව | 20 |
| 51 | පැරණි පාර්ලිමේන්තු ගොඩනැගිල්ල | H/C | කොටුව | 20 |
| 52 | මහ ලේකම් කාර්යාලය | H/C | කොටුව | 20 |
| 53 | ගාලු මුවදොර | H/C | කොම්පඤ්ඤවීදිය | 21 |
| 54 | බේරෙ වැව | H/C | කොම්පඤ්ඤවීදිය | 21 |
| 55 | ටාජ් සමුද්‍ර හෝටලය | H/C | කොම්පඤ්ඤවීදිය | 21 |
| 56 | ගාලු මුවදොර පිටිය | H/C | කොල්ලුපිටිය | 37 |
| 57 | ගෝල්ෆේස් හෝටලය | H/C | කොල්ලුපිටිය | 37 |
| 58 | අරලියගහ මන්දිරය | H/C | කොල්ලුපිටිය | 37 |
| 59 | ශාන්ත ඇන්ඩෲ ස්කොට්ස් කර්ක් | R/H/C | කොල්ලුපිටිය | 37 |
| 60 | ශ්‍රී ධර්මකීර්තියාරාමය | R/H/C | කොල්ලුපිටිය | 37 |
| 61 | ලන්දේසි ප්‍රතිසංස්කරණ කළ දේවස්ථානය | R/H/C | බම්බලපිටිය | 38 |
| 62 | බෝරාහ් පල්ලිය | R/H/C | වැල්ලවත්ත | 38 |
| 63 | රාමක්‍රිෂ්ණ මිසම | R/H/C | ගල්කිස්ස | 47 |
| 64 | ලන්දේසි දේවස්ථානය | R/H/C | ගල්කිස්ස | 541 |
| 65 | ශාන්ත තෝමස් දේවස්ථානය | H/C | ගල්කිස්ස | 541 |
| 66 | ග්‍රෑන්ඩ් හෝටලය | H/C | ගල්කිස්ස | 541 |
| 67 | ශාන්ත ෆ්‍රැන්සිස් සේවියර් දේවස්ථානය | H/C | අඟුලාන | 547 |
| 68 | දූවේ දේවාලේ දේවස්ථානය | H/C | අඟුලාන | 547 |
| 69 | ලුනාව දේවාලය | R/H/C | උයන | 552 |
| 70 | මෙතෝදිස්ත දේවස්ථානය | R/H/C | උයන | 552 |
| 71 | ශාන්ත ජෝශප් දේවස්ථානය | R/H/C | උයන | 552 |
| 72 | තාලරුක්ඛාරාමය | R/H/C | කටුකුරුන්ද | 555 |
| 73 | බෝධිරාජාරාමය | R/H/C | එගොඩ උයන | 556 |
| **කළුතර දිස්ත්‍රික්කය** | | | | |
| 74 | රන්කොත් විහාරය | R/H/C | පට්ටිය උතුර | 685 |
| 75 | ශ්‍රී ශුද්ධාරාමාරාමය | R/H/C | නල්ලූරුව | 692 |

| | ස්ථානය | Type | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාස අංකය |
|---|---|---|---|---|
| 76 | සමුද්‍රාරාමය | R/H/C | තල්පිටිය | 697 |
| 77 | පරණ වලව්ව | H/C | මොල්ලිගොඩ | 704 |
| 78 | ශ්‍රී සුධර්ම ධර්ම ශාලාව | R/H/C | මහවස්කඩුව | 714 |
| 79 | අශෝකාරාමය | R/H/C | කළුතර උතුර | 717 |
| 80 | පුලිනතලාරාමය | R/H/C | කළුතර උතුර | 717 |
| 81 | කළුතර කොටුව | R/H | කළුතර දකුණ | 725 |
| 82 | කළුතර බෝධිය(ගංගාතිලක විහාර) | R/H/C | කළුතර දකුණ | 725 |
| 83 | ක්‍රිස්තු මුනිඳු දේවස්ථානය | R/H/C | කලාමුල්ල | 731 |
| 84 | ශාන්ත ජෝශප් දේවස්ථානය | R/H/C | කුඩා පායියාගල | 734 |
| 85 | රාජේශ්වරී දේවස්ථානය | R/H/C | කුඩා පායියාගල | 734 |
| 86 | ශාන්ත ජෝශප් දේවස්ථානය | R/H/C | මහා පායියාගල | 735 |
| 87 | ෆ්‍රැන්සිස් සේවියර් දේවස්ථානය | R/H/C | මහා පායියාගල | 735 |
| 88 | පුරාණ චෛතියාරාමය | R/H/C | මාගල්කන්ද | 746 |
| 89 | කෙච්චිමලේ පල්ලිය | R/H/C | පරණකඩේ | 753/757 |
| 90 | බේරුවල ප්‍රදීපාගාරය | H/C | පරණකඩේ | 753/757 |
| 91 | මරදාන පල්ලිය | R/H/C | මරදාන | 754 |
| 92 | දූවේ විහාරය | R/H/C | මොරගල්ල | 760/761 |
| **ගාල්ල දිස්ත්‍රික්කය** | | | | |
| 93 | බෙන්තොට තානායම | H/C | පහුරුමුල්ල | 1 |
| 94 | බෙන්තොට රජමහා විහාරය | R/H/C | පහුරුමුල්ල | 1 |
| 95 | ගම් සහා ගොඩනැගිල්ල | H/C | අන්ගාගොඩ | 2 |
| 96 | ශ්‍රී ඥානවිමල පුරාණ විහාරය | R/H/C | අහුන්ගල්ල | 18 |
| 97 | සමුද්‍රාරාමය | R/H/C | අහුන්ගල්ල | 18 |
| 98 | සුමනාරාමය | R/H/C | අහුන්ගල්ල | 89 |
| 99 | ජුම්මා මුස්ලිම් පල්ලිය | R/H/C | බලපිටිය | 89 |
| 100 | ශ්‍රී සුභද්‍රාරාමය | R/H/C | බලපිටිය | 89 |
| 101 | අම්බලන්ගොඩ තානායම සහ ලන්දේසි දේවස්ථාන පාසැල | H/C | බලපිටිය | 82 |
| 102 | මෝදර දේවාලය | R/H/C | මහ අම්බලන්ගොඩ | 82 |
| 103 | චෛතියගිරි පුරාණ විහාරය | R/H/C | මහ අම්බලන්ගොඩ | 80 |
| 104 | නැව විනාශ වූ ස්ථානය | A(M) | අකුරල | 76 |
| 105 | සීනිගම දේවාලය | R/H/C | සීනිගම | 64 |
| 106 | සුභද්‍රාරාමය | R/H/C | තොටගමුව | 61 |

| | *ස්ථානය* | *Type* | *ග්‍රාම නිලධාරි කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය* |
|---|---|---|---|---|
| 107 | ශෛලබිම්බාරාමය | R/H/C | දොඩන්දූව | 51 |
| 108 | නසීර් මොහමඩ් පල්ලිය | R/H/C | ගින්තොට | 103 |
| 109 | මිනාර් පල්ලිය | R/H/C | ගින්තොට | 103 |
| 110 | හුසේන් පල්ලිය | R/H/C | ගින්තොට | 103 |
| 111 | දෙවොල් දේවාලය | R/H/C | ගින්තොට | 103 |
| 112 | නැව විනාශ වූ ස්ථානය | A(M) | ගින්තොට | 103 |
| 113 | වෙහෙරගල | R/H/C | ගින්තොට | 103 |
| 114 | ගාල්ල කොටුව | H/C | ගාල්ල කොටුව | 96 |
| 115 | අහංගම මහා විහාරය | R/H/C | අහංගම මධ්‍යම නැගෙනහිර | 157, 156 |
| 116 | ශාන්ත මරියා දේවස්ථානය | R/H/C | දංගෙදර දකුණ, කළුවැල්ල | 97a<br>98c |
| 117 | ශ්‍රී මීනාච්චි සුන්දනේස්වර් කෝවිල | R/H/C | දංගෙදර දකුණ, කළුවැල්ල | 97a<br>98c |
| 118 | ශ්‍රී කදිර වේලායුද ස්වාමි කෝවිල | R/H/C | දංගෙදර දකුණ, කළුවැල්ල | 97a<br>98c |
| 119 | ද ක්ලෝසෙන්බර්ග් | H/C | මග්ගල | 99 |
| 120 | නැව විනාශ වූ ස්ථානය | M.A | මග්ගල | 99 |
| 121 | වැල්ලේ දේවාලය | R/H/C | උණවුටන බටහිර | 137 |
| 122 | ආරියකර විහාරය | R/H/C | තල්පෙ දකුණ | 132 |
| 123 | ශ්‍රී සුභද්‍රාරාමය | R/H/C | කොග්ගල | 144A |
| 124 | මාටින් වික්‍රමසිංහ ශූරීන් උපන් ස්ථානය හා ජන-කලා කෞතුකාගාරය | H/C | කොග්ගල | 144A |
| 125 | දේවගිරි විහාර (හිරුගල් දේවාලය) | R/H/C | කොග්ගල | 144A |
| 126 | ගුවන් හමුදා කඳවුර | H | කොග්ගල | 144A |
| 127 | අලුත් වලව්ව | H/C | කතලුව බටහිර | 162 |
| මාතර දිස්ත්‍රික්කය | | | | |
| 128 | රජකුලවඩන රජමහා විහාරය | R/H/C | මහ වීදිය | 382 |
| 129 | තෙරුවිල කෝවිල | R/H/C | මහ වීදිය | 382 |
| 130 | වේළුවනාරාමය | R/H/C | මිරිස්ස දකුණ | 406 |
| 131 | බෝධි වෘක්ෂය සහ දේවාලය | R/H/C | මිරිස්ස දකුණ | 406 |
| 132 | ශ්‍රී සුභද්‍රාරාමය | R/H/C | මිරිස්ස දකුණ | 406 |
| 133 | සමුද්‍රගිරි විහාරය | R/H/C | මිරිස්ස දකුණ | 406 |
| 134 | ශ්‍රී සුභද්‍රාරාමය | R/H/C | කඹුරුගමුව | 408 |
| 135 | සමුද්‍රතීර විහාරය | R/H/C | කඹුරුගමුව | 408 |

| | ස්ථානය | Type | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය |
|---|---|---|---|---|
| 136 | කොම්පන්නවත්ත කෝවිල | R/H/C | මඩිහේ | 411 |
| 137 | පූජිත නිවස | H/C | මඩිහේ | 411 |
| 138 | ජයමහා විහාරය | R/H/C | පොල්හේන | 412 |
| 139 | ගලගෙඩියාව විහාරය | R/H/C | පොල්හේන | 412 |
| 140 | මාතර කොටුව | R/H/C | කඩ වීදිය | 417B,C |
| 141 | අප ස්වාමිදුවගේ දේවස්ථානය, මාතර | R/H/C | ගනිගස්මුල්ල | 416 |
| 142 | වෙලමැද්දම අම්බලම | H/C | මැදවත්ත | 425 |
| 143 | කිහිරැලි විහාරය | R/H/C | දෙවිනුවර බටහිර | 433a |
| 144 | විෂ්ණු දේවාලය | R/H/C | දෙවිනුවර බටහිර | 433a |
| 145 | මුහන්දිරම් වලව්ව | H/C | දෙවිනුවර බටහිර | 433a |
| 146 | ප්‍රදීපාගාරය | H/C | දෙවිනුවර බටහිර | 433a |
| 147 | සින්හස්සන කෝවිල | R/H/C | දෙවිනුවර බටහිර | 433a |
| 148 | වනවාස රජමහා විහාරය | R/H/C | දෙවිනුවර බටහිර | 433a |
| 149 | තල්ගස්හේන විහාරය | A/R/H/C | ගන්දර නැගෙනහිර හා බටහිර | 473/47 3a |
| 150 | සිරි සුමනාරාමය | R/H/C | කෝට්ටේගොඩ | 440 |
| 151 | අභයධීර වලව්ව | H/C | කෝට්ටේගොඩ | 440 |
| 152 | ගුරුකන්ද විහාරය | R/H/C | බටිගම | 451 |
| 153 | මාලිගාතැන්න රජමහා විහාරය | R/H/C | දොඩම්පහල නැගෙනහිර | 453a |
| 154 | වෙහෙරහේන මිනිකිරුළ රජමහා විහාරය | R/H/C | දොඩම්පහල නැගෙනහිර | 453a |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | | | | |
| 155 | වඩුකරාමය | R/H/C | කඩුවෙල බටහිර හා නැගෙනහිර | 464G, B |
| 156 | තංගල්ල කොටුව | H/C | කොටුවේගොඩ | 458 |
| 157 | තංගල්ල බෝධිය | R/H/C | කොටුවේගොඩ | 458 |
| 158 | ගිරිබන්දු විහාරය | R/H/C | කොටුවේගොඩ | 458 |
| 159 | සුසාන භූමිය | H/C | කොටුවේගොඩ | 458 |
| 160 | තානායම (පැරණි කොටස) | H/C | කොටුවේගොඩ | 458 |
| 161 | වෙහෙර නවය | R/H/C | බටඅත | 562 |
| 162 | උස්සන්ගොඩ | A | ලුනාම | 555 |
| 163 | ගෝටපබත්ත විහාරය | A/R/H/C | වලව | 586 |
| 164 | ගොඩවාය වරාය | A/H | වලව | 586 |
| 165 | මාර්ටෙලෝ කුළුණ | H/C | හම්බන්තොට | 584 |

| | ස්ථානය | Type | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය |
|---|---|---|---|---|
| 166 | නව මුස්ලිම් පල්ලිය | R/H/C | හම්බන්තොට | 584 |
| 167 | බූන්දල පුරාවිද්‍යා රක්ෂිතය | A | බූන්දල | 604 |
| 168 | තෙලුල්ල බෞද්ධ නටඹුන් | A/H | බූන්දල | 604 |
| 169 | කිරින්ද විහාරය | R/H/C | කිරින්ද | 601 |
| 170 | පලටුපාන වරාය | H/C | කිරින්ද | 601 |
| 171 | නැව විනාශ වූ ස්ථානය ඊජිප්තුව (1922) | A(M) | කිරින්ද | 601 |
| 172 | නැව විනාශ වූ ස්ථානය (1961) | A(M) | කිරින්ද | 601 |
| 173 | පටානගල | A/H/C | මාගම | 602 |
| 174 | මිනිහාගල්කන්ද | A/H | මාගම | 602 |
| අම්පාර දිස්ත්‍රික්කය | | | | |
| 175 | මෙගලිතික යුගයට අයත් ස්ථානය, කුමන | A | කුමන | 1 |
| 176 | සමුද්‍ර විහාරය | R/H/C | කුමන | 1 |
| 177 | මෙගලිතික යුගයට අයත් ස්ථානය, පානම | A | පානම | 2 |
| 178 | ඔකඳමලායි | A/R/H/C | පානම | 2 |
| 179 | වේලායුද ස්වාමි කෝවිල | R/H/C | පානම | 2 |
| 180 | මුහුදු මහා විහාරය | R/H/C | පොතුවිල් | 3 |
| 181 | අරුගම් බේ වරාය | A/H | පොතුවිල් | 3 |
| 182 | කෝමාරි ප්‍රදීපාගාරය | H/C | කෝමාරි | 9 |
| 183 | සංගමන්කන්ද | A/H/C | කෝමාරි | 9 |
| 184 | කෝමාරි | A/H/C | කෝමාරි | 9 |
| 185 | තිරිච්චිපුලවායි ශ්‍රී මුරුගන් කෝවිල | R/H/C | කෝමාරි | 96 |
| 186 | චිත්‍ර වේලායුධ කන්දස්වාමි කෝවිල | R/H/C | තිරුක්කෝවිල් | 10 |
| 187 | කිරුලේගම ආශ්‍රම ස්ථානය | A/R/H/C | තිරුක්කෝවිල් | 10 |
| 188 | කන්නාකි අම්මාන් ආලායම් | R/H/C | තඹවිල් කොට්ඨාසය.එල් | 12 |
| 189 | පාලුකාමම් කෝවිල | R/H/C | පදිරුප්පු කොට්ඨාශසය.එල්2 | 66 |
| 190 | ද්‍රව්පති අම්මාන් කෝවිල | R/H/C | පදිරුප්පු කොට්ඨාසය.එල්2 | 66 |
| 191 | කුඩිකඩකරායි පල්ලිය | R/H/C | කල්මුනායි කොට්ඨාසය 3 | 59 |
| මඩකලපුව දිස්ත්‍රික්කය | | | | |
| 192 | ලන්දේසි කොටුව | H/C | කොඩ්ඩායිකල්ලාර් කොට්ඨාසය -එල් 2 | 113 |
| 193 | අම්පාර විලිප්පිල්ලෙයාර් කෝවිල | R/H/C | කොඩ්ඩායිකල්ලාර් කොට්ඨාසය -එල් 2 | 113 |
| 194 | කන්නාකි අම්මාන් කෝවිල | R/H/C | එරුවිල් | 115 |

| | ස්ථානය | Type | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය |
|---|---|---|---|---|
| 195 | ජම් උල්ලෆ්රීන් පල්ලිය | R/H/C | කාත්තන්කුඩි කොට්ඨාශය -එල් | 167 |
| 196 | මඩකලපුව කොටුව | H/C | පුලියන්තිවු | 179 |
| 197 | නැව විනාශ වූ ස්ථානය | A(M) | පුලියන්තිවු | 179 |
| 198 | ජීසස් දේවස්ථානය | R/H/C | කල්කුඩා | 204 |
| 199 | සිත්තන්ඩි | H/C | වාලච්චෙනේ දෙමළ කොට්ඨාසය | 205 |
| 200 | පෙරියකාඩුවීකාරායි | H/C | වාලච්චෙනේ දෙමළ කොට්ඨාසය | 205 |
| 201 | නැව විනාශ වූ ස්ථානය | A(M) | කායාන්ඩර්නි | 211a |
| 202 | පන්නිච්චාන්කර්නි | H/C | මාන්කර්නි | 211 |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය | | | | |
| 203 | ඉලන්ගතුරෙයි වරාය | A/H | ඉච්චිලාම්පට්ටායි | 214 |
| 204 | ආශ්‍රම ස්ථානය | A/H/C | නවාත්කනිකාඩු | 215 |
| 205 | තම්පලාකාමම් | A/H/C | තම්පලාකාමම් දකුණ | 228a |
| 206 | ගල්මැටියාන ටැංකිය | A/H | තම්පලාකාමම් දකුණ | 228a |
| 207 | තිරුකෝනේෂ්වරම් කෝවිල | R/H/C | ත්‍රිකුණාමලය නගරය | 244B |
| 208 | ෆෙඩ්රික් බලකොටුව | H/C | ත්‍රිකුණාමලය නගරය | 244B |
| 209 | ගෝකණ්ණ විහාරය | R/H/C | ත්‍රිකුණාමලය නගරය | 244B |
| 210 | ස්මාරක කුළුණ, ස්වාමි කන්ද | H/C | ත්‍රිකුණාමලය නගරය | 244B |
| 211 | ත්‍රිකුණාමලය වරාය | A/H | ත්‍රිකුණාමලය නගරය | 244B |
| 212 | නැව විනාශ වූ ස්ථානය, ත්‍රිකුණාමලය වරාය | A(M) | ත්‍රිකුණාමලය නගරය | 244B |
| 213 | ඔස්ටෙන්බර්ග් කොටුව | H/C | ත්‍රිකුණාමලය නගරය | 244B |
| 214 | පාවෙන තටාකය | A(M) | ත්‍රිකුණාමලය නගරය | 244B |
| 215 | කුච්චවේලි ආශ්‍රම ස්ථානය | AH/C | කුච්චවේලි | 239 |
| 216 | පල්වක්කි | H/C | කුච්චවේලි | 239 |
| මුලතිවු දිස්ත්‍රික්කය | | | | |
| 217 | මුලතිවු බලකොටුව | H/C | මුලතිවු නගරය | 233 |
| 218 | ආශ්‍රම ස්ථානය කුරුන්දන්මලායි, | A/H/C | මුලතිවු නගරය | 233 |
| යාපනය දිස්ත්‍රික්කය | | | | |
| 219 | පස්පායාල් වරාය | A/H | මුල්ලියන් | 149 |
| 220 | නකාර් කෝයිල් | R/H/C | නකර් කොයොයිල් | 145 |
| 221 | වල්ලිපුරම් සුසාන භූමිය | A/H | තුන්නලායි | 131 |

| | ස්ථානය | Type | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය |
|---|---|---|---|---|
| 222 | පේදුරුතුඩුව ප්‍රදීපාගාරය | H/C | තුම්පලායි | 140 |
| 223 | හාට්ලි විද්‍යාලය | H/C | පේදුරු තුඩුව | 137 |
| 224 | කන්කසන්තුරේ ප්‍රදීපාගාරය | H/C | කන්කසන්තුරේ | 67 |
| 225 | කන්කසන්තුරේ බලකොටුව | H/C | කන්කසන්තුරේ | 67 |
| 226 | සම්බල්තුරෙයි වරාය (ජම්බුකෝලපට්ටන) | A/H/C | කීරමලායි | 64A |
| 227 | කීරමලායි උල්පත් | H/C | කීරමලායි | 64A |
| 228 | නගුලේස්වරම් සිවම් කෝවිල | R/H/C | කීරමලායි | 64A |
| 229 | විෂ්ණු කෝවිල | A/H/C | කීරමලායි | 64A |
| 230 | ආශ්‍රම ස්ථානය කීරමලායි | A/H/C | කීරමලායි | 64A |
| 231 | තිරුවඩි නිලායි | A/H/C | චූලිපුරම් | 49 |
| 232 | මෙගලිතික යුගයට අයත් ස්ථානය ඈන්නායි-කොට්ටායි | A/H/C | ඈන්නායිකොට්ටායි | 40 |
| 233 | යාපනය කොටුව | H/C | කොලොම්බුතුරේ | 8 |
| 234 | කරෙයිනගර් ප්‍රදීපාගාරය | H/C | කරෙයිනගර් උතුර | 9 |
| 235 | හැම්මෙන්හේල් කොටුව | H/C | කරෙයිනගර් උතුර | 9 |
| 236 | මෙගලිතිකයුගයටඅයත්ස්ථානය | A/H | කරෙයිනගර්වීට් උතුර | 9 |
| 237 | කයිට්ස් වරාය(ඌරතොට) | A/H | අලායිපිඩ්ඩි | 19 |
| 238 | පෘතුගීසි බලකොටුව(උරින්දි කෝට්ටායි) | H/C | අලායිපිඩ්ඩි | 19 |
| 239 | අයිරි කොටුව | H/C | අලායිපිඩ්ඩි | 19 |
| 240 | ලායිපිඩ්ඩි | A/H/C | අලායිපිඩ්ඩි | 19 |
| 241 | නාගදීප විහාරය | R/H/C | නයිනතිවු | 04 |
| 242 | නාගපූෂානි අම්මාන් කෝවිල | R/H/C | නයිනතිවු | 04 |
| 243 | පුන්ගුඩුතිවු | R/H/C | පුන්ගුඩුතිවු | 05 |
| 244 | ලන්දේසි කොටුව | H/C | ඩෙල්ෆ්ට් මධ්‍යම | 02 |
| 245 | නෝලාන් බංගලාව | H/C | ඩෙල්ෆ්ට් මධ්‍යම | 02 |
| 246 | පෘතුගිසි කොටුව | H/C | ඩෙල්ෆ්ට් බටහිර | 01 |
| 247 | තාරපිටි | H/C | ඩෙල්ෆ්ට් බටහිර | 01 |
| 248 | ආශ්‍රම ස්ථානය, වදිරේසන්කොට්ටායි | A/H/C | ඩෙල්ෆ්ට් බටහිර | 01 |
| 249 | ලන්දේසි කුළුණ, කුවින්දන් | H/C | ඩෙල්ෆ්ට් නැගෙනහිර | 03 |
| 250 | අලිමංකඩ කොටුව | H/C | මුකවිල් | 153 |
| **මන්නාරම දිස්ත්‍රික්කය** | | | | |
| 251 | මන්නාරම | H/C | තොඩ්ඩවේලි | 194 |
| 252 | මන්නාරම ලන්දේසි බලකොටුව | H/C | තොඩ්ඩවේලි | 194 |

| | ස්ථානය | Type | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය |
|---|---|---|---|---|
| 253 | තලේමන්නාරම ප්‍රදීපාගාරය (02) | H/C | තලේමන්නාරම | 192 |
| 254 | වන්කලායි වාසස්ථාන | A/H/C | වන්කලායි | 195 |
| 255 | තම්බපණ්නි වරාය | A/H | අරිප්පු | 198 |
| 256 | දෝන කැතරිනාගේ විවේක ස්ථානය (අල්ලි රාණි කෝට්ටායි) | H/C | අරිප්පු | 198 |
| 257 | ඕලන්ද කොටුව | H/C | අරිප්පු | 198 |
| 258 | උරුවෙල | A/H/C | කොක්කුපාඩායන් | 202 |
| 259 | මෙගලිතික යුගයට අයත් ස්ථානය මරික්වුකඩ්ඩි | A | මරික්වුකඩ්ඩි | 203 |

**ආරක්ෂා කළ ස්මාරක සහ පුරාවිද්‍යා සංරක්ෂිත**

A ආකාරය - **පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු** C - **සංස්කෘතික වටිනාකමකින් යුතු** H - **ඓතිහාසික වටිනාකමකින් යුතු** R - **ආගමික වටිනාකමකින් යුතු**

ආශ්‍රිත ග්‍රන්ථ:


1. Government of Sri Lanka 1981. Coast Conservation and Coastal Resources Management Act, (No. 57).

2. Government of Sri Lanka 1981. Coast Conservation (Amendment) Act, (No. 64).

3. Government of Sri Lanka 2011. Coast Conservation (Amendment) Act, (No. 49).

4. Government of Sri Lanka 1980. National Environment Act (No. 47).

5. CCD : "Coastal 2000 : Recommendations for a Resource Management Strategy for Sri Lanka's Coastal Region".

6. CCD : Coastal Zone Management Plan 2004.

7. Government of Sri Lanka : 1940. Archaeological Ordinance and the subsequent revisions of 1956' 1998 and 2000.

8. Ministry of Public Administration : Circular No. 21/92 of 21st May, 1992.

9. Government of Sri Lanka : 1985. Gazette Notification No. 337/48 of Feb 21st.

10. IUCN, 1989, Directory of SA Protected areas